# පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය

# හා

# භූ දර්ශනය

**(පුරා භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් සිදු කෙරෙන විමර්ශනයකි)**

**කතෘගේ වෙනත් කෘති**

- මූලික කැනීම් ක්‍රම
- ශ්‍රී ලංකා සංස්කෘතියේ මුල් පියසටහන්
- පුරාවිද්‍යා ගවේෂණ, කැණීම් හා කාල නිර්ණක්‍රම
- උරුම කළමනාකරණ ප්‍රවේශය
- අනුරාධපුර සංස්කෘතිය හා භූ දර්ශනය
- අනුරාධපුර උරුමය නරඹමු
- පුරාණ මැටි බඳුන් නිර්මාණ තාක්ෂණය හා ජේතවන විහාරය ආශ්‍රිත හමු වූ මැටි බඳුන් වර්ගීකරණය



# පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය

# හා

# භූ දර්ශනය

**(පුරා භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් සිදු කෙරෙන විමර්ශනයකි)**

**ඩී. තුසිත මැන්දිස්**

ප්‍රථම මුද්‍රණය: 2017
පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය
(පුරා භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් සිදු කෙරෙන විමර්ශනයකි)

© ඩී. තුසිත මැන්දිස්

ISBN

කවර නිර්මාණය:
නදීර හර්ෂජිත්

පරිගණක පිටු සැකසුම:
මහේෂිකා මධුභාෂිණී

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

xxxxx/xxxxx/xxxx



## පිදුම

පුරාවිද්‍යා විෂය දැනුම, දැක්ම හා යථාර්ථවාදී ලෙස
තර්කානුකූලව පුරාවිද්‍යා විෂය ඉගෙනීම සඳහා මඟ පෙන්වූ
සම්මානිත පුරාවිද්‍යා මහාචාර්ය
සුදර්ශන් සෙනෙවිරත්න ඇඳුරුතුමාට
ඉමහත් බැතියෙන් මෙම ග්‍රන්ථය පිළිගන්වමි...

# පටුන

පිටු අංක


**01 වැනි පරිච්ඡේදය** **17**

**හැඳින්වීම** 17

1. හැඳින්වීම 17

1.1 අධ්‍යයන ක්ෂේත්‍රයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම 18

1.2 පර්යේෂණ ඉතිහාසය 21

1.3 පර්යේෂණ අරමුණු 27

1.4 අධ්‍යයන පරාසය 29

1.5 මූලාශ්‍ර පරිහරණය 31

1.6 පාරිසරික පසුබිම 38

1.6.1 ශ්‍රී ලංකාවේ භූගෝලීය හා පාරිසරික පසුබිම 38

1.6.2 අධ්‍යයන ක්ෂේත්‍රයේ පාරිසරික පසුබිම 42

1.6.2.1 පස හා භූමි සැකැස්ම 42

1.6.2.2 වර්ෂාපතනය සහ උෂ්ණත්වය 44

1.6.2.3 ජලවහන පද්ධතිය 44

1.6.2.4 ශාකායනය 47

1.6.2.5 සත්ත්ව ප්‍රජාව 50

1.7 භූමි පරිභෝජනය 55

**02 වැනි පරිච්ඡේදය** **59**

**සංස්කෘතික භූ දර්ශන සංකල්පය හැඳින්වීම** 59

2.1 සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ නෛතික, සංකල්පමය හා පුරාවිද්‍යාත්මක උපයෝගීතාවය 59

2.2 සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයන්හි ආරම්භය 67

2.3 සංස්කෘතික භූ දර්ශනය හා පුරාවිද්‍යාව 69

**03 වැනි පරිච්ඡේදය** **78**

**අනුරාධපුර සංස්කෘතික විකාශනය භූ දර්ශනය අධ්‍යයනය** 78

3.1 ලේඛනගත ප්‍රභවයන් අනුව අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය 78

3.2 අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය හා එහි ව්‍යාප්තිය අනුරාධපුර ඇතුළුපුරය ඇසුරෙන් හඳුනාගැනීම. 126

3.2.1 ඇතුළුපුරයේ පූර්ව පර්යේෂණ ඉතිහාසය 126

3.2.2 ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනයේ ව්‍යාප්තිය 134

3.2.2.1 ඇතුළුපුර ප්‍රාග් ඓතිහාසික සංස්කෘතිය හා භූ දර්ශනය 135

3.2.2.2 ප්‍රාථමික යකඩ යුගයේ සිට පදනම් මුල් ඓතිහාසික අවධිය දක්වා ඇතුළුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය 144

3.2.2.3 පහළ මුල් ඓතිහාසික අවධියේ සිට මධ්‍ය මුල් ඓතිහාසික දක්වා ඇතුළුපුර සංස්කෘතික විකානය හා භූ දර්ශනය 170

3.2.3 අනුරාධපුර නාගකරීකරණය 184

**04 වැනි පරිච්ඡේදය 202**

**පුරා භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් ජේතවන හා වෙස්සගිරිය ආංශුක භූමිය ආශ්‍රිත ජනාවාස රටාව හඳුනාගැනීම** 202

4.1 හැඳින්වීම 202

4.1.1 ජේතවන ආංශුක භූමියේ ස්තරායනය ඇසුරින් ජනාවාස රටාව 203

4.1.2 ජේතවන ක්ෂුද්‍ර භූමිය ආශ්‍රිත පුරා භෞතික සංස්කෘතිය 243

4.1.2.1 ශිලාමය පුරාවස්තු 243

4.1.2.2 මැටි පෙති 245

4.1.2.3 මැටි බෝල 246

4.1.2.4 ලෝහ කාර්මික කටයුතු හා ලෝහ ආශ්‍රිත නිර්මාණ 247

4.1.2.5 අස්ථි නිර්මාණ 248

4.1.2.6 කාසි 249

4.1.2.7 මුද්‍රා 254

4.1.2.8 පබළු 254

4.1.2.8.1 ජේතවන ආංශුක ක්ෂේත්‍රය ආශ්‍රිත ව වාර්තා වූ පබළු ඇසුරෙන් සිදු කෙරෙන වර්ගීකරණය 255

4.1.2.9 මැටි බඳුන් 266

4.1.2.9.1 ජේතවන මැටි බඳුන් වර්ගීකරණය 269

4.2 භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් වෙස්සගිරිය ආංශුක භූමිය ආශ්‍රිත පුරා ජනාවාස රටාව අධ්‍යයනය හා භූ දර්ශනය 322

4.2.1 හැඳින්වීම 322

4.2.2 වෙස්සගිරියේ පූර්ව අධ්‍යයන 323

4.2.3 වෙස්සගිරියේ පුරා ජනාවාස රටාව පිළිබඳ අධ්‍යයනය 324

**05 වැනි පරිච්ඡේදය 351**

5.1 අනුරාධපුර කේන්ද්‍රය හා පර්යන්තය අතර පුළුල් භූ දර්ශනයේ 351
අවකාශය ගොඩනැගීම 351

5.1.1 ශිලා මෙවලම් වර්ගීකරණය 364

5.1.2 වෙස්සගිරියෙන් වාර්තා වූ ශිලා මෙවලම් වර්ගීකරණය 365

5.1.3 ජේතවනයෙන් වාර්තා වී ඇති ශිලා මෙවලම් වර්ගීකරණය 366





5.2 පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීම 376

5.3 මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීම 399

**06 වැනි පරිච්ඡේදය 452**

**සමාලෝචනය** 452

6.1 ප්‍රාරම්භක අවධියේ සිට වර්ධිත අවධිය දක්වා පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ අවකාශය ගොඩනැංවීම සම්බන්ධ සංකල්පීය ආකෘතිය 452

6.1.1 ආකෘති අංක 1 ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික භූ දර්ශනය 453

6.1.2 ආකෘති අංක 2 පූර්ව ඓතිහාසික අවධියේ සංස්කෘතික භූ දර්ශනය 454

6.1.3 ආකෘති අංක 3 මුල් ඓතිහාසික අවධියේ භූ දර්ශනය 455

6.1.4 ආකෘති අංක 4 මධ්‍ය ඓතිහාසික භූ දර්ශනය 457

6.1.5 ආකෘති අංක 5 පශ්චාත් ඓතිහාසික අවධියේ භූ දර්ශනය 458

**පරිශීලනය කරන ලද ග්‍රන්ථ හා ලිපි නාමාවලිය 459**

## සංක්ෂිප්තාර්ථ සංකේතාර්ථය (හැකිලුම්)

| | | |
|---|---|---|
| ASCAR | - | Archaeological Survey of Ceylon Annual Report |
| AC | - | Ancient Ceylon |
| AIC | - | Ancient Inscriptions of Ceylon |
| ACAP | - | Anuradhapura Citadel Archaeology Project |
| AG | - | Anuradhapura Gedige |
| ARW | - | Anuradhapura Rawatta |
| ADB | - | Anuradhapura Dingiri Banda Watta |
| AMP | - | Anuradhapura Mahapali Danasalawa |
| AEG | - | Anuradhapura Eastern Gate |
| ASM | - | Anuradhapura Sangamitta mawata |
| AGW | - | Anuradhapura Gedigewatta |
| ASW | - | Anuradhapura Salgahawatta |
| AWP | - | Anuradhapura Wijayaba Palace |
| ADM | - | Anuradhapura Dalada Maligawa |
| BRW | - | Black and red ware |
| BW | - | Black Ware |
| CV | - | Chulavamsa |
| EZ | - | Epigraphia Zelanica |
| EP.Nots | - | Epigraphical Notes |
| IUCN | - | International Union of Conservation Nature |
| JCBRAS | - | The Jounal of the Ceylon Branch of Royal Asaitic Society |



| | | |
|---|---|---|
| JOCV | - | Japan Overses Coperation Vollunteers |
| JSMP | - | Jethavana Salapathala Maluwa Pit |
| JSOWP | - | Jethavana Outer Wall Pit |
| JSWMP | - | Jethavana Welimaluwa Pit |
| JSP | - | Jethavana Suddhage watta Pit |
| JCP | - | Jethavana Cheak Pit |
| JRP | - | Jethavana Reaserch Pit |
| MV | - | Mhawamsa |
| MVS | - | Manjusri Wasthu Vidya Sastra |
| MSCC | - | Munsal Soil Colour Chart |
| PGW | - | Painted Gray Ware |
| RW | - | Red Ware |
| RLW | - | Rulated Ware |
| UCR | - | University of Ceylon Review |
| UNESCO | - | United Nations Education Science and Cultural Organization |
| VG Cave | - | Vessagiri Cave |
| VGHL Ex | - | Vessagiri Hillock Excavation |
| VGFR | - | Vessagiri Exploration |
| ථූව | - | ථූපවංසය |
| නිස | - | නිකාය සංග්‍රහය |
| මව | - | මහාවංසය |
| මබෝව | - | මහාබෝධිවංසය |
| රවා | - | රසවාහිනිය |
| වංසපකා | - | වංසත්ථප්පකාසිනී |
| පුවිදෙඉ | - | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය |
| ප්‍රපුලිලේ | - | ප්‍රධාන පුරාවස්තු ලියාපදිංචි ලේඛනය |

ශ්‍රීසුමශකෝ - ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය

සද්රක - සද්ධර්මරත්නාකරය

සද්ලංකා - සද්ධර්මාලංකාරය

සිබෝව - සිංහල බෝධිවංසය

ඡායාරූප අනුග්‍රහය

මෙම ග්‍රන්ථය තුළ අඩංගු අංක 1.2, 1.3, 1.4, 1.5, 1.6 යන ඡායාරූප සඳහා අනුග්‍රහය කැළුම් මනමේන්ද්‍රආරච්චි විසින් ද, 3.1, 3.2 ඡායාරූප සඳහා අනුග්‍රහය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ද, 3.4 ඡායාරූපය අනුග්‍රහය සුදර්ශන් සෙනෙවිරත්න ද, 3.6 ඡායාරූප අනුග්‍රහය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශය විසින් ද දක්වා ඇත.



# උපකාරානුස්මෘතිය

මෙම ග්‍රන්ථය රචනා කිරීම සඳහා මා හට නන් අයුරින් උපකාර කරන ලද විද්වතුන්, හිතෛෂීන් හා කළ්‍යාණ මිත්‍රයන් බොහෝ දෙනකු විය. ඔවුහු සියලු දෙනා ම මාගේ මෙම ග්‍රන්ථය සාර්ථක කර ගැනීම සඳහා තම වටිනා දැනුම, කාලය, ශ්‍රමය විවිධ අංශවලින් මා වෙත ලබා දෙනු ලැබූහ. සියල්ලන්ගෙන් ම පළමු ව මා කෘතවේදී වන්නේ සම්මානිත පුරා විද්‍යා මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න මාගේ ගුරු දේවයන්ට ය. 1992 වර්ෂයේ දී මා උපාධි අපේක්ෂක විද්‍යාර්ථියකු ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පිවිස තැන් පටන් පුරාවිද්‍යා විශේෂවේදී උපාධිය හදාරණ සමයේ සිට ම ආචාර්ය උපාධිය හදාරණ කාලය දක්වා ම මාගේ විෂයීය කුසලතාවය වර්ධනය කර ගැනීමට එතුමා ලබා දෙනු ලැබූ විෂය පිළිබඳ දැක්ම, දර්ශනය, වෘත්තිය කුසලතාවය මෙන් ම ඒ සියල්ලට ම වඩා වෘත්තියවේදියකු සතු ව තිබිය යුතු මානව ගුණධර්ම මෙන් ම සතර අගතියෙන් තොර ව කටයුතු කිරීමේ ඇති වැදගත්කම පෙන්වා දෙමින් මා නිසි මඟට යොමු කිරීම සිහිපත් කරනු ලබන්නේ ඉමහත් බැතියෙනි.

මෙම ග්‍රන්ථය තුළ අන්තර්ගත බොහෝ අදහස් එතුමා මා වෙත ලබා දී ඇති නිදහස් චින්තනය තුළ වැඩ කිරීමේ අවාකාශය මත ගොඩනගන ලද අදහස් වේ. එම අවකාශීය තත්ත්වයන් නිර්මාණය කර ගැනීමට ක්ෂේත්‍ර කළමනාකරණය, පර්යේෂණ කටයුතු මෙහෙයවීම මෙන් ම පර්යේෂණ දත්ත පරිහරණයේ දී භෞතික දත්ත සංස්කෘතික අවධි තුළට ද්‍රවගත කිරීමේ ඇති වැදගත්කම පෙන්වා දෙමින් සංස්කෘතික භූ දර්ශනය යන සංකල්පය සඳහා මා තුළ කුහුලක් ඇති කර මෙ වැනි පර්යේෂණයක් කිරීමට මා පෙළොඹවනු ලැබුවේ මහ ඇඳුරු සෙනෙවිරත්නයන් ය. එ

බැවින් එතුමාගෙන් මා ලබා ගත් දැනුම හා දැක්ම වෙනුවෙන් වන්නා වූ කෘතවේදී බව මා නැවතත් එතුමාට පුද කරමි.

පර්යේෂණ කටයුතු සිදු කිරීමේ දී එය සාර්ථක කර ගැනීමට දායකත්වය ලබා දුන් ජේතවන ව්‍යාපෘති පුරාවිද්‍යා අධ්‍යක්ෂවරයා මෙන් ම මාගේ ඇඳුරුතුමකු වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පියතිස්ස සේනානායක ගුරුතුමා ද මා ගෞරවයෙන් සිහිපත් කරමි. එතුමා විසින් ජේතවන ව්‍යාපෘතියේ පර්යේෂණ දත්ත මෙම ග්‍රන්ථය සඳහා භාවිත කිරීමට අවසර දෙමින් ලබා දුන් සහයෝගය නොවන්නට මෙ වැනි කටයුත්තක් සිදු කිරීම ලෙහෙසි පහසු නොවේ. විශ්වවිද්‍යාල සමයේ සිට මේ දක්වා ම එතුමා මා වෙත ලබා දෙනු ලැබූ විවිධ ගුරුහරුකම්, උපදෙස් හා පර්යේෂණ කටයුතු සිදු කිරීමට මා යොමු කිරීම නිසා මෙ වැනි ග්‍රන්ථයක් රචනා කිරීමට මා හට හැකි විය. එ බැවින් ආචාර්ය පියතිස්ස සේනානයක ගුරුතුමාට ද මාගේ භක්ති ප්‍රණාම ස්තුතිය මෙහි දී පුදකර සිටිමි. 1996 වර්ෂයේ දී මා ජේතවන ව්‍යාපෘතියට පුහුණුවන පර්යේෂකයකු වශයෙන් පැමිණි සමයේ දී පුරාවිද්‍යා කැණීම් හා ගවේෂණ ක්ෂේත්‍රය සඳහා මා යොමු කර එම කටයුතු කෙරෙහි මා උනන්දු කරමින් ක්ෂේත්‍ර පුරාවිද්‍යා විෂය සම්බන්ධ නිපුණතාවයන් ඇති කර ගැනීමට අතදීම මෙන් ම, මාගේ දර්ශනපති උපාධියේ උපදේශකතුමා වෙමින් එම කටයුත්ත සාර්ථක ව නිමකර ගැනීමට මග පෙන්වනු ලැබූ ආචාර්ය හේම රත්නායකගුරුතුමා ද මා මෙම අවස්ථාවේ දී බැති සිතින් සිහි කරමි.

මෙම කටයුතු සාර්ථක කර ගැනීමේදී සහයෝගය ලබාදුන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චන්දන රෝහණ විතානච්චි මහතාට ද ග්‍රන්ථය පරිගණක ගතකර ගැනීමට සහයෝගය දැක්වූ සරෝජනී, මධුවන්ති, චම්පා යන සහෝදරියන්ට ද, සැලසුම් සකස්කර ගැනීමේ දී සහයෝගය දැක්වූ නුවන්, මනෝජා, ලංකා, සහෝදරියන්ට ද පරිගණක පිටු සැකසුම කරදුන් මහේෂිකා මෙනවියට ද මාගේ ස්තුතිය පුද කරමි. මෙ වැනි පර්යේෂණ කාර්යයක් කිරීමේ දී මාගේ කුටුම්බ ජීවිතයේ පැවති සුවහස් දුක් කම්කටොළු මා වෙනුවෙන් විඳ දරා ගෙන



මාගේ අධ්‍යාපන ජීවිතය පරිපූර්ණ කර ගැනීමට හැම නිමේෂයක දී ම මා හට ආශිර්වාදයක් වූ මා ප්‍රිය බිරිඳ ශ්‍යාමලී හා මාගේ දරු දෙදෙනාට ද ස්තුතිය පුද කරමි. එසේ ම මෙම ග්‍රන්ථය සාර්ථක කර ගැනීමට සහාය වූ හිතෛෂී කල්‍යාණ මිත්‍රයන්ට ද ග්‍රන්ථය අගනා ලෙස මුද්‍රණය කරදුන් ඇස්. ගොඩගේ මහතා ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුදකරමි.


**ආචාර්ය ඩී. තුසිත මැන්දිස්**
අංධ්‍යනාංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.
2017.........

01
වැනි
පරිච්ඡේදය

# හැඳින්වීම

## 1. හැඳින්වීම

"පුචඡාපෙත්වාන නෙමිතතකං වත්‍ථුවිජ්ජාවිදුං තථා
නගරං පවරං තසමිං ගාමං යෙව අමාපසි
නිවාසතතානුරාධනං අනුරාපුරං අහු
නකඛ තෙනානුරාධෙන පතිටඨාපිතතායච"(*මව* x:75-76; *වංසපකා* 75-76)

**"ඒ ආර්යය තෙමේ තම රජගේ කුමරුට දී අන් තැනක වාසය කළේ ය. නිමිත්ත ශාස්ත්‍ර දන්නන් ද, වාස්තුවිද්‍යා දන්නන් ද, විචාරවා ඒ ගම් හි උතුම් නුවරක් ඉදිකරවීය. අනුරාධයන් දෙදෙනකු නිවාස වූ හෙයින් ද අනුරේ නැකතින් පටන් ගත් හෙයින් ද එම නුවර අනුරාධපුර නම් විය."**

සාහිත්‍යමය ප්‍රභවයන්ට අනුව අනුරාධපුර නගරයේ බිහිවීම හා එහි භූ දර්ශනයේ සමාරම්භය පිළිබඳ ව දැක්වෙනුයේ එසේ ය. ක්‍රි.පූ. 5 - 4 වැනි ශත වර්ෂයේ දී සිදු වූ බව සැලකෙන මෙම කතා පුවත අනුරාධපුර ශිෂ්ටාචාරයේ ආරම්භය ලෙස බොහෝ දෙනකු සලකනු ලබයි. නමුත් වසර සියයකයට වඩා වැඩි කාලයක් සිදු කර ඇති පුරාවිද්‍යා කටයුතු දෙස විමසා බැලීමේ දී මේ තත්ත්වය ලිඛිත ඉතිහාසයේ සඳහන් වනවාට වඩා බොහෝ සේ වෙනස් වන බව හඳුනාගෙන තිබේ. පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය පිළිබඳ ව සිදු කෙරෙන පුරාවිද්‍යා අධ්‍යයනයක් වන මෙම පර්යේෂණ තුළ දී පුරාණ අනුරාධපුර සංස්කෘතික

විකාශනයේ සමාරම්භය, වර්ධනය හා විකාශනය සම්බන්ධ තොරතුරු සාකච්ඡා කිරීම සඳහා පුරා භෞතික සංස්කෘතික තොරතුරු (Material Culture) හා ලිඛිත පුරාවිද්‍යා සාධක මෙන් ම සාහිත්‍යමය තොරතුරු උපයෝගී කර ගෙන ඇත.

සංස්කෘතිය යන වචනය විභේදනය කළ විට එය වඩා පුළුල් පරාසයක් තුළ ස්ථානගත වේ. එහි ප්‍රධාන උප බෙදීම් දෙකක් ලෙස ස්පර්ශිත සංස්කෘතික උරුමය (Tangible Heritage) නස්පර්ශිත සංස්කෘතික උරුමය (Intangible Heritage) ප්‍රධාන වන අතර මෙම අධ්‍යයනය සඳහා ස්පර්ශිත සංස්කෘතික උරුමය පදනම් ව ඇති භෞතික සංස්කෘතික තොරතුරු උපයෝගී කර ගෙන පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය හැදෑරීම සිදු කර තිබේ. නමුත් පර්යේෂණය තුළ දී නස්පර්ශිත සංස්කෘතික උරුමය පිළිබඳ ව අවශ්‍ය අවස්ථාවන්හි දී පමණක් සාකච්ඡා කරනු ලැබේ.

## 1.1 අධ්‍යයන ක්ෂේත්‍රයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම

අධ්‍යයන ක්ෂේත්‍රය සම්බන්ධ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තතු විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ මෙම ප්‍රදේශයේ මානව ජනාවාසකරණය මධ්‍ය ශිලා අවධියේ දී (Mesolithic Period) සිදු වී ඇති බවය. (Deraniyagala 1992:709). දැරණියගල විසින් අනුරාධපුර ඇතුළුපුරයේ (Citadel) AG 85 ස්ථාන නාමය යටතේ සිදු කරනු ලැබූ පර්යේෂණ කැණීමේ දී යථෝක්ත භූමිය අදින් වසර 5850 කට පූර්වයේ දී ජනාවාස වූ බවට සැලකෙන මධ්‍ය ශිලා අවධියට අයත් මයික්‍රොලිතික ශිලා මෙවලම් (Microlithic Stone Implements) රතු දුඹුරු පාංශු කලාපයෙන් (Reddish Brown Earth, Basal Gravel) හමු වූ බව වාර්තා කර ඇත(එම).

සත්ත්ව දඩයම හා වන මුල් එකතු කිරීම පදනම් කරගත් සරල ආර්ථිකය ක්‍රියාත්මක කළ මධ්‍ය ශිලා අවධිය ක්‍රි.පූ. 900 පමණ දී ලෝහ තාක්ෂණය පදනම් කරගත් පූර්ව ඓතිහාසික සංස්කෘතිය (Early Iron Age) මඟින් යටපත් කර ඇත (Deraniyagal 1992:709). පූර්ව ඓතිහාසික සංස්කෘතිය අර්ධද්වීපික ඉන්දියාවේ සිට විශේෂයෙන් ම එහි දකුණු දිගින් ශ්‍රී ලංකාවට හඳුන්වා දී





තිබේ (Seneviratne 1984:237-292; Begly 1981:49-142). මෙම සංස්කෘතිය ක්‍රි.පූ.250 දක්වා කාලයක් අනුරාධපුරයේ ක්‍රියාත්මක බව තහවුරු කර ගෙන තිබේ (Deraniyagala 1992:711-712 ; සෙනෙවිරත්න 1996:12). භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් අනුරාධපුර පුරාණ නාගරික ප්‍රදේශය ආශ්‍රිත ඉතිහාසය එසේ හඳුනාගත හැකි වුව ද ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලේඛනගත කර ඇති මධ්‍ය ඓතිහාසික අවධියේ සාහිත්‍ය මූලාශ්‍රයවල අනුරාධපුර ප්‍රදේශයේ ජනයා පදිංචි වීමේ රටාව සහ ප්‍රවණතාවය ඉන්දියාවේ ලාට දේශයේ සිට ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූ විජයගෙන් ඇරඹෙන බව දක්වා තිබේ (*මව.*vii:3-4 ;Dv i:01). ක්‍රි.පූ. හය වැනි සියවස පමණ දී සිදුවන මෙම ජන සංක්‍රමණය මඟින් විජය ඇතුළු පිරිස සිය ජනාවාස පිහිටුවා ගෙන ඇත්තේ මල්වතු ඔය, කලා ඔය, මහවැලි යන ගංගා නිම්නවල ය. මෙම ආරම්භක ජනපද මාතොට, තම්බපණ්ණි, අනුරාධ, උදේනි, උරුවේල සහ විජිත ග්‍රාම යන ස්ථානයන්හි පිහිටුවා තිබුණු බව වංසකතාවල සඳහන් වේ (*මව.* vii :43-46 ; සිරිවීර 2001:41). වංසකතා විස්තරවලට අනුව විජයට පසු උපතිස්ස ග්‍රාමය මුල්කර ගෙන ඇමතිවරු එක් වසරක් රජකු නැති ව රට පාලනය කර ඇත. ඉක්බිති පණ්ඩුවාසුදේව, අභය, පණ්ඩුකාභය, මුටසීව යන රජවරු දේවානම් පියතිස්ස රජවන තෙක් රට පාලනය කළහ (*මව.*x,xi). ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනය වූයේ දේවානම්පියතිස්ස රාජ යුගයේ නිසා ඊට පෙර කාල පරිච්ඡේදයේ තොරතුරු ගළපා නිර්මාණයේ දී විවිධාකාරයේ ජනප්‍රවාද සහ වෘත්තාන්ත එම තොරතුරු කෙරෙහි බලපා තිබේ (සිරිවීර 2001:42).

සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව අනුරාධ ග්‍රාමය නගරයක් දක්වා සංවර්ධනය කරන ලද්දේ පණ්ඩුකාභය රජු විසිනි (*මව.* x:103; *දීව.* xi:03). මහාවංස විස්තරවලට අනුව අනුරාධපුර නගරය විවිධ කොටස්වලට බෙදා සකස් කළ පණ්ඩුකාභය රජ නගරවාසීන්ගේ අවශ්‍යතාවයට සරිලන පරිදි වැවක්, සුසාන භූමියක්, ආගමික ස්ථානයක් තැන වූ බව සඳහන් වේ (*මව.* x:88-102). ඉන් අනතුරු ව දේවානම්පියතිස්ස රජ යුගයේ දී ලක්දිවට මිහිඳු හිමියන් පැමිණි බැවින් ඒ සමග ම සංස්කෘතික, ආගමික

හා දේශපාලන ඉතිහාසය තුළ අනුරාධපුරය වැදගත් බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ (ලියනගමගේ සහ ගුණවර්ධන 1965 :64).

අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ එ නම් අභයගිරියේ හා වෙස්සගිරියේ කටාර සහිත ගුහා ලිපිවලින් පෙනෙන පරිදි එම ස්ථාන ක්‍රි.පූ.3 වැනි සියවසින් පසු සංඝාවාස වූ බවට සාධක තිබේ. මෙම මුල් බ්‍රාහ්මී ලෙන් ලිපිවලට අනුව ඒවායින් කියවෙන සමස්ත අර්ථය වන්නේ භික්ෂූන් සඳහා ඒවා පූජාකර ඇති බව ය (*Ic*. Vol. i :6-8). මේ අනුව මුල් ඓතිහාසික (Early Historic) සමයේ දී අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශය සම්බන්ධ මෙම පුරාවිද්‍යාත්මක තොරතුරු අතිශයින් වැදගත් වන අතර ඉන්පසු අගනුවරක් වශයෙන් ක්‍රි.ව. 10 වැනි සියවස අවසාන භාගය දක්වා අනුරාධපුරය රාජධානියක් ලෙස පැවති බව මූලාශ්‍රය සාධක අනුව හඳුනාගත හැකි ය (*මව*. lxxvii :73).

පොළොන්නරුව රාජධානි සමයේ දී අනුරාධපුරයේ වල්බිහි ව තිබූ ස්තූප ඇතුළු විහාරාරාම අංග මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කර ඇත (*මව*. lxxvii:100-110; Cv.lxxviii:96-108). මින් අනතුරු ව අනුරාධපුරය වල්බිහි වූ නරගයක් ව පැවති බව විදේශීයන් විසින් තබන ලද සටහන් අනුව ද පැහැදිලි වේ (Ratnayake 1984:17 19). හෙන්රි ඩබ්. කේව් විසින් රචනා කර ඇති ලංකාවේ නටබුන් නගර නම් කෘතිය තුළින් ද අනුරාධපුරයේ පැවති වල්බිහිවීම් පිළිබඳ ව තතු දත හැකි ය (Cave 1928 :41- 121). යටත්විජිත සමයේ දී විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී අනුරාධපුරය ආශ්‍රිත පරිපාලන කටයුතු සඳහා ඔවුන් විසින් රජයේ ගොඩනැගිලි, රෝහල් ආදිය ඉදිකර ඇති අතර ම පුරාවිද්‍යා කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය ද අනුරාධපුර ආශ්‍රිත ව සිදු කර ඇත. එච්. සී.පී. බෙල්ගේ මෙහෙයවීම යටතේ සිදු කර ඇති මෙම පුරාවිද්‍යා කටයුතු මඟින් අනුරාධපුර නගරයේ ඉතිහාසය අධ්‍යයනය සඳහා ඉමහත් පිටුවහලක් ලබාගත හැකි ය (*ASCAR* 1890-1910).

අනුරාධපුර සමාරම්භක ඉතිහාසය සම්බන්ධ සංෂිප්ත සටහනක් තබන දැරණියගල "වසර හත්දහසකට පමණ ඉහත දී





නූතන වැදි පරපුරේ මී මුත්තා වූ ඔස්ට්‍රොලොයිඩ් වර්ගයට අයත් මධ්‍ය ගල් යුගයේ බලන්ගොඩ මානවයා විසින් අනුරාධපුරය ජනාවාස කරන ලද බවත්, ඔහුගෙන් පසු ව ක්‍රි.පූ. 900--400 පමණ දී අශ්වයින් හා යකඩ කර්මාන්තය පිළිබඳ දැනුම සතු ව සිටි ශිෂ්ටාචාරවත් මිනිසුන් ඉන්දියාවෙන් පැමිණ මේ ප්‍රදේශයේ ව්‍යාප්ත වී වාරිමාර්ග උපයෝගී කර ගෙන වී වගා කළ බවත්, ඔවුන් සංස්කෘතික ලක්ෂණ අතින් උතුරු ඉන්දියාවට සමාන වෙතත් සංස්කෘතික වශයෙන් ඉතාම සමීප වන්නේ මධ්‍යම හා දකුණු ඉන්දියාවේ පැවති ඇත යකඩ යුගයට අයත් මෙගලිතික සංස්කෘතියට බව පෙන්වා දී ඇත" (Deraniyagala 1972:50).

අනුරාධපුරයේ මී ළඟ තාක්ෂණික සංස්කෘතික අවධිය මෞර්ය යුගය ප්‍රභව කොට ඇති වූවකි. ක්‍රි.පූ. 250 දී පමණ අශෝක අධිරාජ්‍යයාගේ කාලයේ දී බුදු දහම ලංකාවට හඳුන්වා දීමෙන් අනතුරු ව ඇටකටුවලින් නිමකළ පන්හිඳෙන් බ්‍රාහ්මී අක්ෂර ලිවීම, මුදල් ක්‍රමය, උසස් වර්ගයේ මැටි මෙවලම්, වීදුරු භාණ්ඩ සහ ආභරණ කර්මාන්තය මේ යුගයේ දක්නට ලැබුණි. අනුරාධපුරයේ පැවති මෙම ලක්ෂණයන් වඩාත් ම සමානකම් දක්වනුයේ උතුරු ඉන්දියානු මෞර්ය ආභාෂයෙන් පැවත ආ මධ්‍ය හා දකුණු ඉන්දියානු ආන්ද්‍ර සම්ප්‍රදායට අයත් සංස්කෘතියට ය (එම).

මෞර්ය අවධියෙන් අනතුරු ව ක්‍රි.ව.700 දක්වා කාලය ගඩොළු ගොඩනැගිලි බැඳීමේ වර්ධනය හා වීදුරුවලින් ඔප දමන ලද වහළ උළු භාවිතය දක්නට ලැබෙන අතර (එම). මේවා බොහෝ විට අනුරාධපුර පැරණි විහාරාරම ආශ්‍රිත ව ද වර්ධනය විම හඳුනාගත හැකි ය.

## 1.2 පර්යේෂණ ඉතිහාසය

අනුරාධපුර පුරාණ නගරය ආශ්‍රිත අධ්‍යයන කුතුහලය පදනම් කර ගත් පුරාවිද්‍යා කටයුතුවලින් ආරම්භ වනුනේ යටත්විජිත පාලන යුගයේ දී ය. යටත්විජිත යුගය තුළ ආරම්භ වන මෙම ක්‍රියාවලිය අනුරාධපුර සංස්කෘතියේ ආරම්භය, හැඩ ගැසීම හා වර්ධනය සම්බන්ධ භූ දර්ශන අධ්‍යයනයේ දී ඉතා ම වැදගත් වේ.

විශේෂයෙන් ම පූර්ව අධ්‍යයනයන් වශයෙන් මෙම කාල පරාසය හා ඊට පසු කාල පරාසය පිළිබඳ ව හැදෑරීමේ දී පැහැදිලි වන්නේ යම් යම් වැදගත් කරුණු 1866 වසරින් පසු අනුරාධපුරය ඇසුරෙහි සිදු වී ඇති බවය. ඒ ඔස්සේ පූර්ව පර්යේෂණ ඉතිහාසය තුළ අනුරාධපුරය සම්බන්ධ අධ්‍යයනයන් ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයක් යටතේ පෙළ ගැස්විය හැකි ය.

i යටත්විජිත යුගය තුළ සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයන

ii පශ්චාද් යටත්විජිත යුගය තුළ සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයන හා පර්යේෂණ

iii යටත්විජිත යුගයෙන් අනතුරු ව සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයන හා පර්යේෂණ

අනුරාධපුර ඉතිහාසය මෙන් ම ශ්‍රී ලංකාවේ ඉතිහාස අධ්‍යයනයන් සම්බන්ධ ගැඹුරු නම්‍යතාවයන් දක්නට ලැබෙන්නේ දහ නව වැනි සියවස අග භාගයේ හා විසි වැනි සියවස තුළ දී ය. අතීතය සොයා ගෙන අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය තුළ යටත්විජිත සමයේ දී හා පශ්චාද් යටත්විජිත සමයේ දී සාහිත්‍ය ප්‍රභවයන් වෙත නැඹුරු වෙමින් මහා වාරිකර්ම හා ඓතිහාසික ස්මාරක අධ්‍යයනය කිරීම කැපී පෙනේ. මෙහි දී අපගේ පරිකල්පනයට ගෝචර වන කාරණයක් ලෙස කැපී පෙනෙන්නේ යටත්විජිත සමය තුළ දී ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතුවලට යොමු වූ විද්වතුන්ගේ පරිකල්පනය සැකසී තිබූ අන්දමයි. යුරෝපයේ කලාවේ සම්භව්‍ය ගුරුකුල තුළ හා අධිරාජ්‍යවාදී දේශපාලන සංස්කෘතීන් තුළ හැදී වැඩුණු යටත් විජිතවාදී පාලකයන් හා ප්‍රාචීනවේදීන් අතීතය කියවා තේරුම් ගැනීමේ දී මහාජාතිය, රාජකීය අගනුවරවල්, ආගමික ප්‍රාසාද, මාළිගා හා කලා කෘතීන් මෙන් ම යෝධ වාරි ක්‍රම ඇතුළු දැවැන්ත ඉදි කිරීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කර ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ස්වර්ණමය යුගය සොයා අධ්‍යයනයන් සිදු කිරීම කැපී පෙනේ (සෙනෙවිරත්න 1996:1-2).

මෙම කාරණා තහවුරු කර ගැනීම සඳහා ඔවුන් විසින් ද්‍රව්‍යමය නෂ්ටාවශේෂත්, සම්භව්‍ය ලේඛනවල ඇතුළත් ආගමික





දේශපාලන ඉතිහාසයත්, අධ්‍යයනය කිරීමට අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශයේ පුරාවිද්‍යා කටයුතුවල නියැළුනු බව පෙනේ. 1828 වර්ෂයේ දී මේජර් ෆෝර්බර්ස් විසින් අනුරාධපුරයේ සංචාරය කිරීමෙන් අනතුරුව ජේ.එෆ්.ඩික්සන්, එස්. එම්. බරෝස්, ෆිෂර්, ආතර් ගෝඩන්, ජේ. ජී. ස්මිදර්, ආර්. ඩබ්. ලීවර්ස් හා එච්. සී. පී. බෙල් ආදී පරිපාලන නිලධාරීන් අනුරාධපුරයේ පැවති විවිධ ස්මාරක සම්බන්ධ අධ්‍යයන කිරීම් සිදු කර ඇත (Ratnayake 1984 18-25).

යටත්විජිත සමයේ පර්යේෂකයන් උනන්දු වූයේ ඔවුන්ගේ දර්ශන පථයට ගෝචරවන්නා වූ විවිධ ස්මාරකය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ය. විශේෂයෙන් ම මේ අතරින්ස්මිදර් කැපී පෙනෙන අතර ඔහු විසින් අනුරාධපුරයේ නටබුන් ව පැවති දාගැබ් ඇතුළුපැරණි ගොඩනැගිලි වාර්තාගත කර තිබේ. ඒ අතර ථූපාරාමය, ලංකාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනාරාමය, කුජ්ජතිස්ස දාගැබ, දළදා මාළිගාව, මහසෙන්මාළිගය, බිසෝ මාළිගය, කුට්ටම් පොකුණ ආදී ස්මාරක ඉන් කැපී පෙනේ (Smither 1894:1-86). මෙම වාර්තාගත කිරීම් තුළින් පිළිබිඹුවන්නේ ප්‍රභූ සමාජ ආශ්‍රිත රාජකීය ස්මාරක ඇතුළත් භූ දර්ශනය කෙරෙහි ඔහුගේ අවධානය යොමු වී තිබුණ බව ය.

අනුරාධපුර පුරාණ නාගරික ප්‍රදේශය ඇතුළත් භූමියේ පුරාවිද්‍යා අධ්‍යයන හා පර්යේෂණ බෙල් විසින් සිදු කර ඇත. 1890 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වූ බෙල් අනුරාධපුර ප්‍රදේශයේ ඓතිහාසික යුගයේ සංස්කෘතික විකාශනය හඳුනාගැනීම සඳහා වැදගත් පරීක්ෂණ ගණනාවක් සිදු කර ඇත. ඒ අතර ගවේෂණ, කැණීම් හා තහුවරු කිරීම් ප්‍රමුඛ වන අතර, ඔහු මෙම සේවාව 1910 දක්වා සිදු කර ඇත. බෙල් විසින් අනුරාධපුර ආංශුක ස්ථාන හා තදාශ්‍රිත ප්‍රදේශයේ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා අධ්‍යයන තුළින් එම ස්ථානවල පැවති සමාරක සැලසුම්ගත කිරීම, ඡායාරූපගත කිරිම සිදු කර තිබේ (*ASCAR* 1891-1910).

යටත්විජිත පාලකයන් පුරාණ අනුරාධපුරයේ නෂ්ටාශේෂ වූ ගොඩනැගිලි ආශ්‍රිත අධ්‍යයනයන් සිදු කරමින් ආරම්භ කරන

ලද මෙම කටයුතු ශ්‍රී ලංකාවේ පර්යේෂණාත්මක පුරාවිද්‍යාවේ ආරම්භක යුගය වශයෙන් හැඳින්වීම යුක්ති සහගතය. මෙම කාලවකවානුව තුළ දී ම අනුරාධපුරයේ පුරාවිද්‍යා කටයුතු සඳහා ශ්‍රී ලාංකික උගතුන්ගේ දායකත්වය ද ලැබීම 1910 වසරින් පසු ව සිදු ව ඇත. ඩී.එම්.ඩී.ඉසෙඩ් වික්‍රමසිංහ හා සෙනරත් පරණවිතාන වැනි වියතුන් විසින් අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ශිලා ලේඛන අධ්‍යයන ඇරඹීම සමඟ පුරාණ ආගමික, දේශපාලන, ආර්ථික හා සමාජ පසුබිම පිළිබඳ ව අධ්‍යනය කිරීමට එම අධ්‍යයන මහඟු පිටුවහලක් විය.

ඩී. එම්. ඩී. ඉසෙඩ් වික්‍රමසිංහ අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශය තුළ තිබූ අභිලේඛන අධ්‍යයනය ආරම්භ කර 1912 දී ඒවා ප්‍රකාශයට පත්කර ඇත. එහි දී වෙස්සගිරිය ආංශුක ස්ථානයේ ලෙන් ලිපි, පර්වත ලිපි, පුවරු ලිපි මෙන් ම ජේතවන සංස්කෘත ශිලා ලිපිය, පෙරුමියන්කුලම ශිලා ලිපිය, ජේතවන පුවරු ලිපිය හා අභයගිරි තඹ තහඩු ලිපිය මෙන් ම කිරිබත් වෙහෙර ස්ථම්භ ලිපිය ආදිය කියවා ප්‍රකාශයට පත්කිරීම තුළින් පුරාණ අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ සමාජ පුරාවිද්‍යාව හඳුනාගැනීමට අවකාශ සැලසී තිබේ (*Ez*.Vol.i:1912). ඔහු විසින් 1933 ප්‍රකාශයට පත්කරනු ලැබූ ැවසටර්වයස් ’ැහක්බසජ් දෙ වැනි වෙළුම තුළ ථූපාරාමය පුවරු ලිපිය, රුවන්වැලි සෑ ස්ථම්භ ලිපිය, ඇතුළුපුර මහාපාලි දාන ශාලාවේ බත් ඔරුවේ ඇති ලිපිය ආදී ලිපි අන්තර්ගත වී ඇත (*Ez*.Vol.iii :1933).

මින්පසු අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශය සම්බන්ධ පුරාවිද්‍යා අධ්‍යයන හා පර්යේෂණ සෙනරත් පරණවිතාන සිදු කරනු ලබන අතර ඔහු වික්‍රමසිංහ සිදු කරනු ලැබූ ශිලා ලේඛන අධ්‍යයන තවදුරටත් පුළුල් ව හැදෑරීම් කර තිබේ (*Ez*.Vol.iv:1943). පරණවිතාන විසින් අනුරාධපුර පුරාණ නගරය හා තදාශ්‍රිත ප්‍රදේශය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ පුරාවිද්‍යා අධ්‍යයන කටයුතු සම්බන්ධ වැදගත් ම ප්‍රකාශනය 1970දී ප්‍රකාශයට පත් කරනු ලැබූ Inscriptions of Ceylon Vol.i තුළින් එළි දැක්වා ඇත. එහි වෙස්සගිරිය හා අභයගිරිය ආදී ස්ථානවල ඇති ලෙන් ලිපි අධ්‍යයනය තුළින් නාගරික ප්‍රදේශයේ ජන කණ්ඩායම් හා ඔවුන්ගේ





කාර්යවලිය භූ දර්ශන අධ්‍යයනයට දායකත්වයක් සපයන ආකාරය හඳුනාගැනීමට අවකාශ සැලසේ (*Ic*.Vol.i1970:1-25).

පුරාණ අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශය සම්බන්ධ පශ්චාද් යටත්විජිත යුගය තුළ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා අධ්‍යයනයන් යටත්විජිත සමය තුළ දී සිදු කළ සංකල්ප රාමුවට වඩා පරිබාහිර රාමුවක් තුළ ක්‍රියාත්මක කර තිබේ. මානව විද්‍යාව තුළින් ඉතිහාසය කියවීමට නැඹුරු වී ඇති විද්වතුන් ගණනාවක් විසින් සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයනවල දී ඓතිහාසික ග්‍රන්ථ මත පදනම් වන්නා වූ ඉතිහාසය සුළු වශයෙන් ද ද්‍රව්‍යමය සාක්ෂි මත පදනම් වන්නා වූ ඉතිහාසය සාර්ව වශයෙන් ද අධ්‍යයනට බඳුන් කිරීම කැපී පෙනේ. විද්වත් භික්ෂූන් විසින් සංග්‍රහ කරනු ලැබූ සාහිත්‍ය ප්‍රභවයන් මත පිහිටා සිදු කරනු ලැබූ ඉතිහාසය පිළිබඳු අධ්‍යයන තාක්ෂණික සංස්කෘතික අවස්ථා පදනමින් (Techno Cultural phase) නියතිවාදී නැඹුරුවකින් තොර ව ඔවුන් සිදු කර ඇත. එහි දී ගවේෂණ, කැණීම් මඟින් අනාවරණය කර ගනු ලැබූ අභිලේඛන, කාසි, මානව කෘතී හා පාරිසරික තොරතුරු සමූහය කෙරෙහි අවධානය යොමු කර අනුරාධපුර සංස්කෘතික විකාශනය එතෙක් පැවති ඒකජ හා සමමිතික මතයන්ගෙන් වෙනස් වන බව පෙන්වා දී ඇත.

1968 වසරින් පසු සිරාන් දැරණියගල අනුරාධපුරයේ ආරම්භ කරනු ලැබූ නව දෘෂ්ටි කෝණයකින් ඉතිහාසය අධ්‍යයනය කිරීමේ පර්යේෂණ ඔස්සේ මුල් කාලින සමාජයන් ඒවායේ ස්වභාවික පරිසරය අතර වූ අන්‍යෝන්‍ය පැවැත්ම, තාක්ෂණ ශිල්පය, යැපුම් රටාව, සම්පත් පරිහරණය හා පදිංචිවීමේ රටාව තුළින් හඳුනාගැනීමට උත්සාහ ගෙන තිබේ (Deraniyagala 1972). එම පර්යේෂණයන්ට සමගාමී ව සුදර්ශන් සෙනෙවිරත්න විසින් කේන්ද්‍රය හා පර්යන්ත ප්‍රදේශයේ සිදු වූ සම්පත් පරිහරණය හා ඒ ආශ්‍රිත සමාජ ක්‍රියාත්මක වීම පිළිබඳ සිදු කරන ලද පුරාවිද්‍යා අධ්‍යයන තුළින් සම්භවන යුගයන් තුළ ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරයේ (අනුරාධපුරයේ) ඉස්මතු වීම සම්බන්ධ සමහර ඓතිහාසික උපකල්පනයක් නිවැරදිදැයි ප්‍රශ්න කිරීමට ලක්කර ඇත. එහි දී කේන්ද්‍රය හා පර්යන්තය අතර සම්බන්ධයකින් තොර ව ශිෂ්ටාචාරය රේඛීය ව වර්ධනය නොවන බව ඔහු පෙන්වා දී ඇති

අතර ඒ සඳහා පාරිසරික පද්ධතිය, භූ නිර්මාණ හා ද්‍රව්‍යමය සමාජ තත්ත්වයන් බලපාන බව ඔහු පැහැදිලි කර තිබේ (සෙනෙවිරත්න 1996:8-10).

අනුරාධපුර තාක්ෂණික සංස්කෘතික අවධි හඳුනාගැනීමේ දී ඇතුළුපුරයේ සිදු කර ඇති ස්තර විද්‍යානුකූල පුරාවිද්‍යා කැණීම් ද ඉතා ම වැදගත් වේ. අක්කර 250ක් පමණ භූමියක ව්‍යාප්ත ව ඇති ඇතුළුපුරය තුළ දැරණියගල විසින් පර්යේෂණ කැණීම් 13 ක් සිදු කර ඇත (Deraniyagala 1992:708). එ මඟින් ඇතුළුපුරයේ සංස්කෘතික සන්දර්භගත වීමේ ප්‍රාරම්භක අවධිය හඳුනාගැනීම හා (එම:709) ඉන් පසු තාක්ෂණය පදනම් කර ගනිමින් සංස්කෘතික අවධි විකාශනය සිදු වන ආකාරය ද්‍රව්‍යමය සාක්ෂි සමූහය පදනම් කර ගනිමින් හඳුනාගැනීමට උත්සාහ ගෙන ඇත (එම :709-715). දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට අනුරාධපුරයේ ආදිත ම සංස්කෘතික අවධිය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියෙන් ආරම්භ වී මධ්‍ය ඓතිහාසික අවධිය දක්වා විකාශනය වී තිබේ.

අනුරාධපුර සංස්කෘතික විකාශනය හා එහි භූ දර්ශනය අධ්‍යයනයේ දී සේනක බණ්ඩරනායක විසින් සිදු කර ඇති පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන් ද වැදගත් වේ. ඔහු විසින් පුරාණ අනුරාධපුරය ආශ්‍රිත ව දැකගත හැකි විහාරාරාම ආරම්භය, වර්ධනය හා විකාශනය සම්බන්ධ ව සිදු කර ඇති අධ්‍යයන තුළින් මුල් ඓතිහාසික අවධියේ (Early Historic) සිට මධ්‍ය ඓතිහාසික අවධිය (Middle Historic) දක්වා බෞද්ධ ආරාම ආරම්භය හා විකාශනය Sinhalese Monastic Architecture කෘතිය තුළින් එළි දක්වා ඇත (Bandaranayake 1974).

මීට අමතර ව රෝලන්ඩ් සිල්වා විසින් ද අනුරාධපුර නගරය බිහිවීම හා එහි වර්ධනය සිදු වූ ආකාරය අධ්‍යයනය කර Development of Ancient Cities : Urban Sri lanka with Special Reference to Anuradhapura යන පර්යේෂණය තුළින් මල්වතු ඔය ගංගා නිම්නය ආශ්‍රයෙන් බිහි වූ ප්‍රාථමික ජනාවාස නගරයක් දක්වා වර්ධනය වීම හා ඉන් පසු ව නගරය වටා වූ විහාර පද්ධතිය සියවස් කිහිපයක් තුළ වර්ධනය වන ආකාරය සාකච්ඡා කර තිබේ (Silva 2000:49-81). එසේ ම අනුරාධ සෙනෙවිරත්න විසින් Ancient Anuradhapura : the Monastic City යනුවෙන්





අනුරාධපුර නගරයේ ව්‍යාප්තිය පිළිබඳ ව අධ්‍යයනය සිදු කර ඇත (Seneviratna 1994).

ගාමිණී විජේසූරිය විසින් ද අනුරාධපුර සංස්කෘතික විකාශනය විහාර ආරාම බිහිවීම හා වර්ධනය තුළින් හඳුනාග ැනීමට උත්සාහ ගෙන තිබේ. ඔහු වැඩි අවධානය පධානඝර ආශ්‍රිත භූ දර්ශනය කෙරෙහි යොමුකර Buddhist Meditation Monasteries of Ancient Sri Lanka යනුවෙන් අධ්‍යයනය සිදු කර ඇත (Wijesuriya:1998). මෙම පූර්ව පර්යේෂණ අතරට ඉන්ද්‍රකීර්ති සිරිවීරගේ රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි (සිරිවීර 2001), ආදී පර්යේෂණ මඟින් අනුරාධපුර භූ දර්ශනය, ඉතිහාසය හා ශිෂ්ටාචාරයේ බිහිවීම මෙන් ම වර්ධනයන් හඳුනාගැනීමට උත්සාහ දරා තිබේ.

## 1.3 පර්යේෂණ අරමුණු

වර්ෂ 100 කට වැඩි කාලයක් තිස්සේ (යටත්විජිත යුගයේ සිට මේ දක්වා ම) අනුරාධපුරය පුරාවිද්‍යා අධ්‍යයනයන්ට භාජනය වූ සංස්කෘතික මර්මස්ථානයකි. විශේෂයෙන් ම යටතවිජිත පාලන සමයේ දී අනුරාධපුරය ග්‍රහණය කරගනු ලැබූවේ ඓතිහාසික යුගය තුළ සන්දර්භගත කරමිනි. නමුත් පශ්චාද් යටත්විජිත යුගය තුළ සිරාන් දැරණියගල විසින් ප්‍රථම ස්තර විද්‍යානුකූල කැණීම ඇතුළුපුරය (ක්‍ෂජ්ාැක) ඇසුරින් සිදුකර ස්තරායනය අධ්‍යයනය තුළින් අනුරාධපුරය පුළුල් කාල හා අවකාශ පරාසයක් තුළ ස්ථානගත කරන ලදි. ඔහු පෙන්වා දී ආකාරයට ඇතුළුපුරයේ සංස්කෘතික සන්දර්භගත වීම ආරම්භ වන්නේ ක්‍රි.පූ. 3900 ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතික අවධියෙනි. ඉන්පසු ක්‍රි.පූ. 1000 න් පසු ප්‍රාථමික යකඩ යුගයේ සංස්කෘතිය අනුරාධපුරයට වී ගොවිතැන ඇතුළු සරල කෘෂිකර්මාන්තය, ශාක හා සත්ත්ව ගෘහකරණය, මැටි මෙවලම් නිෂ්පාදනය, පබළු, ලෝහ හා ප්‍රාථමික ජල කළමනාකරණය හඳුන්වා දී තිබේ (Deraniyagala 1992:707-709). ඇතුළුපුරය කේන්ද්‍ර කර සිදු කර තිබෙන අධ්‍යයන තුළින් මෙම යුගයේ සම්පත් පරිහරණය හා වානිජ කටයුතු සම්බන්ධ රටාවන් අනුරාධපුරය, අර්ධද්වීපික ඉන්දියාව හා ඉන්දියානු

සාගර කවයේ රටවල් සමඟ මෙන් ම අනුරාධපුරයෙන් ඔබ්බට පිහිටි තාක්ෂණික සංස්කෘතික කලාපයන්ට ද ඓන්ද්‍රීය ලෙස සම්බන්ධ කිරීමට සුදර්ශන් සෙනෙවිරත්න උත්සාහ ගෙන තිබේ. (Senviratne 1984:237-292). ඒ අනුව මුල් ඓතිහාසික අවධියේ දී සමාජ ක්‍රියාකාරිත්වය ඉතා පැහැදිලි ලෙස අනුරාධපුර සංස්කෘතික විකාශනය සඳහා තාක්ෂණය, සම්පත් පරිහරණය හා සමාජ ආයතන ඔස්සේ දැක් වූ දායකත්වය තුළින් වර්ධනය වූ ආකාරය ඔහු හඳුනාගෙන තිබේ (එම).

ඇතුළුපුරය කේන්ද්‍රගත කර ඇරඹුණු මෙම ස්තර විද්‍යානුකූල අධ්‍යයනයන් එම ක්ෂුද්‍ර භූමියෙන් ඔබ්බට විහිදුවා මධ්‍යම සංස්කෘතික අරමුදල ජේතවන ව්‍යාපෘතිය යටතේ 2000 වර්ෂයේ මුල් දශකය තුළ ආරම්භ කරන ලද ස්තර විද්‍යානුකූල පුරාවිද්‍යා කැණීම්, ගවේෂණ, පුරාවස්තු වර්ගීකරණ හා විශ්ලේෂණ මඟින් ඇතුළුපුරය හා එයට පිටතින් වන සාර්ව කලාපය තෝරා එ නම් ජේතවන, වෙස්සගිරිය දක්වා ප්‍රදේශ වඩා පුළුල් ආකාරයට තිරස් හා සිරස් සන්දර්භයක් තුළ ස්ථානගත කිරීමට උත්සාහ දරා ඇත (මැන්දිස් 2003:2004:8- 12). ඒ අනුව අනුරාධපුර ඇතුළුපුරයට පිටත කලාපය තුළ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණ මඟින් අනුරාධපුර භූ දර්ශනය ගොඩනැඟීමේ පුළුල් සංස්කෘතික සන්දර්භය හඳුනාගැනීමට අවකාශ සැලසී ඇත (එබාසි 2007:16-18). එම පුළුල් සංස්කෘතික භූ දර්ශනය අධ්‍යයනය කිරීම තුළින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම පර්යේෂණයේ දී බලාපොරොත්තු වේ.

1. පුරාණ අනුරාධපුරයේ ජනාවාස රටාව (Settlement Pattern) හඳුනාගැනීමේ දී කේන්ද්‍රයට පිටත ආංශුක කලාපය (Micro Region) අනුරාධපුර තදාශ්‍රිත විස්තෘත කලාපය (Macro Region), ඇසුරින් සිරස් සම්බන්ධය මුඛ්‍ය වශයෙන් අනුරාධපුර ඇතුළුපුර ස්තරායනය සමඟ තිරස් ආකාරයෙන් සම්බන්ධ කර ජනාවාස බිහිවීමේ ස්වරූපය අධ්‍යයනය කිරීම හා ස්තරානුකූල කැණීම් මඟින් අනෙක් භෞමික ඛණ්ඩ සමඟ ද සම්බන්ධ කිරීම.





2. පුරාණ අනුරාධපුර තාක්ෂණික සංස්කෘතික අවස්ථා (Techno Cultural Phase) ඇතුළුපුරයට පිටතින් වර්ධනය වී ඇති ආකාරය පර්යන්ත ප්‍රදේශ ඇසුරින් හඳුනාගැනීම හා ඒ සඳහා භූ ගර්භ පද්ධතිය ඍජු ව හා වක්‍රව සංස්කෘතික විකාශනයට හා භූ දර්ශනය නිර්මාණයට පාදක වී ඇති අන්දම අධ්‍යයනය
3. අධ්‍යයනයට ලක්කරන්නා වූ ආංශුක පුරාවිද්‍යා ක්ෂේත්‍ර ආශ්‍රිත භෞතික භූ දර්ශනය සූක්ෂම ලෙස අධ්‍යයනයට ලක් කිරීම සඳහා ජල මාර්ග පද්ධතිය (හාල්පානු ඇළ හා මල්වතු ඔය) සාපේක්ෂ ව පිහිටීම අධ්‍යයනය, ඇතුළුපුරය කෙන්ද්‍රගත කර ක්‍රියාත්මක වූ පැරණි මාර්ග පද්ධතිය අධ්‍යයනය කිරීම තුළින් තිරස් මානය තවදුරටත් වර්ධනය කිරීම.
4. අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ දේශපාලන, ආගමික, ආර්ථික හා සමාජ ක්‍රියාකාරිත්වය සමාජ පුරාවිද්‍යාව ඔස්සේ අධ්‍යයනය කර ලේඛනගත ප්‍රභවයන් හා පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් මඟින් සංස්කෘතික විකාශනය විශ්ලේෂණයට බඳුන් කිරීම.
5. වර්ධිත නගරායනයට පාදක වූ ආරාමීය සංකීර්ණ හා ඒවායේ සමාජ පුරාවිද්‍යාව හඳුනාගැනීම.
6. අනුරාධපුර පැරණි නාගරික ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ශිල්ප කටයුතු හා නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ භෞතික සංස්කෘතික තොරතුරු උපයෝගී කර ගෙන ඒ සම්බන්ධ ව අධ්‍යයනය කිරීම.


## 1.4 අධ්‍යයන පරාසය

අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබුවේ පුරාණ අනුරාධපුර නගරයේ මධ්‍ය ලක්ෂයේ සිට අරය කි.මී. 5 ක භූමිය වේ. ඒ අනුව මධ්‍ය ලක්ෂය ලෙස අනුරාධපුර ඇතුළුපුරය තෝරා ගෙන එතැන සිට කි.මී. 5 ක අරය සහිත භූමිය ඇතුළත් වන්නා වූ භූ

කලාපය අධ්‍යයන කලාපය ලෙස තෝරා ගන්නා ලදී. නමුත් එම අධ්‍යයන ප්‍රදේශයට පිටත මධ්‍ය හා පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව සිදු වූ සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලිය ද අධ්‍යයනය සඳහා අදාළ කර ගෙන තිබේ (බලන්න සිතියම් අංක 1:1).

ඒ අනුව අධ්‍යයනයට යටත් වන භූමියේ සිදු කර ඇති ස්තර විද්‍යානුකූල පුරාවිද්‍යා කැණීම් හා ක්‍රමික ගවේෂණ මඟින් ප්‍රදේශයේ පාංශු විහිදීම, ජලවහනය හා ශාකායනය පිළිබඳ ව ද භෞතික සංස්කෘතික තොරතුරු (Material Cultural) තුළින් එක් එක් කාල වකවානුවල සංස්කෘතීන්ගේ සන්දර්භගතවීම හඳුනාගැනීම තුළින් සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය ගොඩනැඟීම සම්බන්ධ අවකාශය ද අධ්‍යයනය කර ඇත.

Micro Area




සිතියම් අංක 1.1
අධ්‍යාපන පරාසය දැක්වෙන සිතියම





## 1.5 මූලාශ්‍ර පරිහරණය

පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය පිළිබඳ ව සිදු කෙරෙන පුරාවිද්‍යා අධ්‍යයනයක් යන පර්යේෂණය සඳහා ප්‍රාථමික මෙන් ම ද්විතියික මූලාශ්‍ර පරිහරණය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර පරිහරණය කිරීම මඟින් එම තොරතුරු විචාරාත්මක ලෙස ඇගයීමකට ලක් කිරීමට හැකියාව ලැබුණි. පර්යේෂණ කාර්ය තුළ දී සාහිත්‍ය මූලාශ්‍ර ය ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය ලෙස කොටස් දෙකකින් ද පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර භෞතික සංස්කෘතික තොරතුරු (Metirial Cultural), අභිලේඛන හා නාණක යන කොටස් තුනකින් යුක්ත ව පරිහරණය කිරීම සිදු කර ඇත.

පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය අධ්‍යයනයේ දී ඉතිහාසයේ මුල් තාක්ෂණික සංස්කෘතික අවධිවලට අයත් ප්‍රාග් ඓතිහාසික (Pre Historic), පූර්ව ඓතිහාසික (Proto Historic) හා මුල් ඓතිහාසික (Early historic) යන යුග පිළිබඳ අධ්‍යයනයේ දී භෞතික සංස්කෘතික තොරතුරු වැදගත් වේ. අධ්‍යයනය තුළ දී භෞතික සංස්කෘතික තොරතුරු මූලාශ්‍රයන් ලෙස පරිහරණයේ දී ඒවා කාලය හා අවකාශය මත ස්ථානගත කිරීම තුළින් විවිධ කාල පරිච්ඡේදවලට අදාළ මානව කෘතිවල භෞතිකමය ස්වරූපය අධ්‍යයනය කිරීමට හැකි වේ. එසේ ම එම තොරතුරු තුළින් සාපේක්ෂ ලෙස කාල නිගමන ලබා ගනිමින් පර්යේෂණය සාර්ථක කර ගැනීමට ද අවකාශ සැලසිණ. සාපේක්ෂ ලෙස ද්‍රව්‍යාත්මක තොරතුරු සඳහා කාල නිගමන එළඹුම් ලබා ගැනීමේ දී කේන්ද්‍රය වශයෙන් සලකන ඇතුළුපුරය තුළින් ලබාගෙන ඇති විද්‍යාත්මක කාල නිගමන පර්යේෂණයට අදළ ව භාවිත කරන ලද සංස්කෘතික තොරතුරු සමඟ සංසන්දනය කරමින් අධ්‍යයනය තුළ දී භාවිත කිරීමට අවකාශ සලසා ගනු ලැබී ය.

භෞතික ද්‍රව්‍යමය වශයෙන් වැදගත් වන පුරාවිද්‍යා මූලාශ්‍රයන් ලෙස මැටි මෙවලම් පෙන්වාදිය හැකි ය. අධ්‍යයනයට භාවිත කරනු ලැබූ මැටි මෙවලම් නිෂ්පාදන තාක්ෂණයෙන්, හැඩයෙන්, උපයෝගීතාවයෙන් විවිධ වර්ගයන්ට අයත් වේ.

දැනට අනුරාධපුර කේන්ද්‍රීය ප්‍රදේශය වන ඇතුළුපුරය තුළින් හමු වී ඇති මැටි මෙවලම් උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය මෙන් ම වෙනත් විදේශීය මැටි මෙවලම්වලට සමාන අසමානතා පෙන්වන අතර සංස්කෘතික ගති ස්වභාවයන් හඳුනාගැනීමේ දී ඒවා එක් ගණයකට අයත් කර පුළුල් කාල පරාසයකට මෙන් ම පුළුල් භෞමික ක්ෂේත්‍රයකට ස්ථානගත කළ හැකි ය. ඒ අනුව පර්යේෂණය සඳහා අධ්‍යයනය කිරීමට තෝරා ගත් මැටි මෙවලම් ඒවා හමුවන ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ආශ්‍රිත මුල් සංස්කෘතීන් නියෝජනය කරන පස් ස්තර තුළින් හමු වි තිබෙන නිසා කේන්ද්‍රයෙන් පිටත ජනාවාස ව්‍යාප්ත වීමේ රටාව හඳුනාගැනීමේ දී මැටි මෙවලම් පුරාවිද්‍යා මූලාශ්‍ර ලෙස බෙහෙවින් ම වැදගත් විය. ඒ අනුව පුරාවිද්‍යා මූලාශ්‍රයක් ලෙස අධ්‍යයනය තුළ දී මැටි මෙවලම් භාවිත කර තිබෙන අතර ජේතවන ආංශුක ක්ෂේත්‍රයෙන් හමුවන මැටි මෙවලම් උපයෝගී කර ගෙන මැටි බඳුන් වර්ගීකරණ සටහනක් (Typology) හඳුන්වා දීමට හැකියාව ලැබුණි.

පර්යේෂණ කාර්යයෙහි දී පුරාවිද්‍යා මූලාශ්‍රයන් ලෙස පබළු උපයෝගී කරගනු ලැබී ය. ප්‍රාග් සමාජ ආශ්‍රිත සම්පත් පරිහරණය පිළිබඳ ව සාකච්ඡා කරන විට පබළු වැදගත් මූලාශ්‍රයකි. ප්‍රාරම්භක අවධියේ සිට ඇරඹෙන ප්‍රාථමික ජනාවාසවල සිට වර්ධිත තත්ත්වයක් දක්වා වර්ධනය වන ජනාවාස හඳුනාගැනීමේ දී ඒ ඒ ක්ෂේත්‍රයන් ආශ්‍රිත ව හමුවන පබළු ලක්ෂ ගණනාව තුළින් අමුද්‍රව්‍යයේ සිට නිමි භාණ්ඩය දක්වා වන ක්‍රියාවලියට අදාළ තොරතුරු සමුදායක් අධ්‍යයනය තුළ දී ක්ෂුද්‍ර ක්ෂේත්‍ර තුළින් හඳුනාගෙන තිබේ. ඒ අතරින් ලක්ෂ තුනහාමාරකට ආසන්න පබළු එකතුවක් ප්‍රාග් ජේතවන හා ජේතවන අවධිවලට අයත් පස් ස්තර තුළින් වාර්තා වී තිබේ. ප්‍රාග් ජේතවන, ජේතවන අවධියට අයත් පස් ස්තර තුළින් හමුවී ඇති පබළු උපයෝගී කර ගෙන ඒවායේ හැඩ අනුව මූලික පබළු වර්ගීකරණ සටහනක් (Typology) ගොඩනගා ගැනීමට ද හැකි විය.

අනුරාධපුර සංස්කෘතික විකාශනය තේරුම් ගැනීමේ දී ප්‍රාරම්භක ජනාවාස තත්ත්වයන් හඳුනාගැනීම සඳහා බෙහෙවින් ම ඉවහල් වනුයේ ශිලා මෙවලම් ය. විශේෂයෙන් ම ප්‍රාග් ඓතිහාසික





සංස්කෘතික අවධියේ ගති ලක්ෂණයන් හා එම සංස්කෘතියේ මුල් බැස ගැනීම් හඳුනාගැනීමට ශිලා මෙවලම් ප්‍රබල පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වේ. අනුරාධපුර තුළ කේන්ද්‍රය වශයෙන් හඳුන්වන ඇතුළුපුරය ආශ්‍රිත ව මධ්‍ය ශිලා අවධියට අයත් ශිලා මෙවලම් වාර්තා වී තිබේ. එසේ ම කේන්ද්‍රයට පිටතින් මධ්‍ය ප්‍රදේශය හා පර්යන්තය (ඇතුළුපුරය, ජේතවනය, වෙස්සගිරිය) තුළින් හමුවන ශිලා මෙවලම් අනුව ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියේ ව්‍යාප්තිය ආංශුක ක්ෂේත්‍ර වන වෙස්සගිරිය හා ජේතවනය තුළින් හඳුනාගත හැකි ය. එම නිසා ද්‍රව්‍යයමය මූලාශ්‍රයක් ලෙස ශිලා මෙවලම් වැදගත් වේ. එසේ ම අස්ථි, ලෝහ, ඛනිජ, පාෂාණ ආදී භෞතික සංස්කෘතික තොරතුරු රාශියක් ද පුරාවිද්‍යා මූලාශ්‍ර වශයෙන් පරිහරණය කර පුරා භෞතික සංස්කෘතිය ඔස්සේ පුරණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හඳුනාගැනීමට මෙහිදී උත්සහා ගෙන ඇත..

අනුරාධපුර සංස්කෘතික විකාශනය හඳුනා ගැනීමේ දී කාල පරිච්ඡේද කිහිපයකට අයත් අභිලේඛන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් භාවිත කරනු ලැබී ය. ඒ අතර ක්‍රි.පූ. යුගයට අයත් මැටි මෙවලම් මත සටහන් කරනු ලැබූ අභිලේඛන හා සංකේත ද, ශිලා මත සටහන් කරන ලද මුල් බ්‍රාහ්මී අභිලේඛන හා අපර බ්‍රාහ්මී අභිලේඛන උපයෝගී කරගනු ලැබී ය. අනුරාධපුර සංස්කෘතික විකාශනය හඳුනාගැනීමේ දී ක්‍රි.පූ. යුගයේ මැටි මෙවලම් මත සටහන් කර ඇති අභිලේඛන හා ශිලා මත සටහන් කර ඇති අභිලේඛන මඟින් ජන කණ්ඩායම්, පදවි, සමාජ ස්තරායනය ආදී කරුණු හඳුනාගැනීමට අවකාශ සැලසිණ. මෙම අභිලේඛන ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු කාලයට අයත් දේශපාලන, සමාජ හා ආර්ථික තත්ත්වයන් ග්‍රහණය කර ගැනීමට හැකි වඩා විශ්වාසනීය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වේ. විශේෂයෙන් ම මුල් බ්‍රාහ්මී අභිලේඛනවල අලංකාරාදියෙන් තොර ව විවිධ කාර්යයට සම්බන්ධ පුද්ගලයා, ජන කණ්ඩායම සඳහන් කිරීම නිසා එම කාල පරිච්ඡේදයට අදාළ තොරතුරු නිවැරදි ව ග්‍රහණය කර ගැනීමට හැකි වේ. විශේෂයෙන් අනුරාධපුර නාගරික ප්‍රදේශයේ පමණක් නොව ඉන් පිටත පර්යන්ත ප්‍රදේශවල පවතින මුල් බ්‍රාහ්මී අභිලේඛන ද උපයෝගී කර ගෙන සිදු කරන ලද විමර්ශනයේ

දී සාර්ව සංස්කෘතික භූ දර්ශනයේ ගතිකත්වය හඳුනාගැනීමට මූලාශ්‍රය අභිලේඛන ලෙස ඉවහල් කරගනු ලැබී ය. එ මඟින් පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව ස්ථානගත ව තිබූ ප්‍රාදේශීය පාලන ව්‍යුහය, පාලන ඒකක හා ජන කණ්ඩායම් මෙන් ම විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් සහිත ශිල්ප ශ්‍රේණි පිළිබඳ ව වටිනා තොරතුරු රාශියක් හඳුනාගැනීමට හැකි විය.

පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය පිළිබඳ විමර්ශනය කිරීමේ දී විදෙස් වානිජ සම්බන්ධතා මෙන් ම දේශීය වානිජ සම්බන්ධතා හඳුනාගැනීමට හැකි ප්‍රබල පුරාවිද්‍යා මූලාශ්‍රයක් වශයෙන් නාණක මූලාශ්‍රයන්ය. මධ්‍යගත සැලසුම් මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය වර්ධනය වීමේ දී බාහිර ලෝකය හා පැවති සබඳතාවය හඳුනා ගැනීමට එ මඟින් ලැබෙන දායකත්වය අතිමහත් ය. අධ්‍යයනයට තෝරාගත් අනුරාධපුර ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ඇසුරින් හමු වී ඇති දහස් ගණනක් ඉ පැරණි කාසි වර්ග මඟින් සාපේක්ෂ වශයෙන් කාල නිගමන ලබා ගත හැකි අතර එ මඟින් භූ දර්ශනයේ වර්ධනය සිරස් හා තිරස් මානය ඔස්සේ විකාශනය වීම හඳුනාගැනීමට හැකි ය.

පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන මූලාශ්‍රය අතර නටබුන් ව පවතින ස්මාරක ආදිය ද වැදගත් වේ. බෞද්ධාගම මෙ රට ප්‍රතිෂ්ඨාපනය වීමට ප්‍රථම හා ඊට පසු ව වර්ධනය වූ වාස්තුවිද්‍යාත්මක අංග අනුරාධපුර නගරය ඇසුරෙන් බහුල ව ස්ථානගත ව තිබේ. එම වාස්තුවිද්‍යා අංග පුළුල් භූ දර්ශනය වෙත එක්වීමේ දී ලෙන් විහාර, මහා විහාර, පබ්බත විහාර, පධානඝර විහාර වශයෙන් විකාශනය එක් වී තිබේ. මෙම විහාර සඳහා පාලකකාරකාදීන් ලබා දී ඇති අනුග්‍රහය තුළින් සමකාලීන සමාජ, ආගමික, ආර්ථික හා දේශපාලන තොරතුරු අවබෝධ කර ගැනීමට ඓතිහාසික වශයෙන් ඒවායේ වැදගත්කම තේරුම් ගැනීමට ස්මාරක ඇතුළු නටබුන් අධ්‍යයනය කිරීම තුළින් හැකියාව ලැබේ.

අධ්‍යයන හා පර්යේෂණ කාර්ය සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිහරණය ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර වශයෙන් කොටස් දෙකක් යටතේ අදාළ කර ගන්නා ලදි. ප්‍රාථමික මූලාශ්‍රය ක්‍රමවත් ලෙස ලේඛනගත කර ඇත්තේ ක්‍රි.ව. සිව් වැනි සියවසින් පසු ව





බව ප්‍රකට කරුණකි. ලංකාවේ ඉතිහාසය රචනා වී ඇති බොහෝ සාහිත්‍ය මූලාශ්‍රය බෞද්ධ ආගමික දෘෂ්ටියෙන් රචනා කර තිබේ. එම නිසා අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී එම මූලාශ්‍රයෝ පරිස්සමින් පරිශීලනය කළ යුතු වේ.

සාහිත්‍ය මූලාශ්‍රය අතරින් වඩා පැරණිත ම මූලාශ්‍රය වශයෙන් සළකනු ලබන්නේ දීපවංසයයි. එය ලංකා ඉතිහාසය ලිවීමට ගත් ප්‍රථම පියවර වශයෙන් සැළකිය හැකි ය. එහි අන්තර්ගත කර තිබෙන කරුණු බුදුන් වහන්සේගේ කාලයේ සිට මහසෙන් රජ සමය දක්වා වූ විස්තරවලින් යුක්ත ය. දීපවංසයේ සඳහන් වන තොරතුරු තුලනාත්මක අයුරින් අධ්‍යයනය කිරීම තුළින් අනුරාධපුර සංස්කෘතික විකාශනය බෞද්ධ ආගම මෙ රට සාම්ප්‍රාප්ත වීමට ප්‍රථම ව පැවති අයුරු හා ඉන්පසු වර්ධනය වන අයුරු හඳුනාගැනීමට හැකියාව ලැබේ.

ක්‍රි.ව. පස් වැනි සියවසින් පසු මහානාම නම් යතිවරයන් විසින් රචිත මහාවංසය බුදුන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රජු දක්වා කාලයට අයත් සංස්කෘතික, දේශපාලන, සමාජ, ආර්ථික ඉතිහාසය විස්තරාත්මක ඇතුළත් ව ඇති මූලාශ්‍රයයි. අනුරාධපුරය ජනාවාස වීම, බෞද්ධාගම මුල්බැස ගැනීම හා විහාරාරාම ඇතුළත් භූ දර්ශනය නිර්මාණය සම්බන්ධ ව වඩා පුළුල් තොරතුරු පරිච්ඡේද තිස් හතක් තුළ මහාවංසයේ විස්තර කර තිබේ. පර්යේෂණයට අදාළ ව මහාවංසය මූලාශ්‍රයක් වශයෙන් පරිශීලනය කිරීමේ දී එහි අන්තර්ගත කරුණු වඩා විස්තරාත්මක ලෙස හා තුලනාත්මක ලෙස අධ්‍යයනය කිරීම තුළින් අනුරාධපුර බෞද්ධ විහාරාරාම බිහිවීමට ප්‍රථම එම භූමියේ ස්ථාපිත ව තිබූ පුරාණ ජනාවාස තත්ත්වයන්, අනුරාධපුර හා පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව ක්‍රියාත්මක සම්පත් පරිහරණ ක්‍රියාදාමය, තාක්ෂණික කටයුතු, විහාරාරාම සැලසුම් හා ඒවා ගොඩනැංවීම මඟින් ඇතිවන භූ දර්ශනයේ නව විශේෂතාවයන් ග්‍රහණය කර ගැනීමට අවකාශ සැලසින.

මහාවංසයේ ටීකා ග්‍රන්ථය වන වංසත්ථප්පකාසිනිය තුළ අන්තර්ගත බොහෝ කරුණු ද පර්යේෂණ කාර්යයට අදාළ කර ගනු

ලැබී ය. මහාවංස කතුවරයාගෙන් ගිලිහී ගිය ඇතැම් ඓතිහාසික තොරතුරු ග්‍රහණය කර ගැනීමට හා මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුරයේ ජනාවාස වර්ධනය වූ ආකාරය පිළිබඳ ටීකාකරු දක්වා ඇති තොරතරු වංසත්ථප්පකාසිනියේ විස්තරාත්මක ලෙස ඉදිරිපත් කර තිබේ. ටීකාකරු සිය රචනාව සඳහා සීහලට්ඨකතාව හා තවත් මූලාශ්‍රය සමූහයක් පරිශීලනය කර තිබීම නිසා අනුරාධපුර සංස්කෘතික විකාශනය අධ්‍යයනයේ දී කාල පරිච්ඡේද විචාරාත්මක ලෙස විමර්ශනය කිරීමටත්, අභිලේඛන ආශ්‍රිත ව පවතින යම් යම් තොරතුරුවල සත්‍යතාවය තවදුරටත් තහවුරු කර ගැනීමටත් වංසත්තප්පකාසිනිය වැනි මූලාශ්‍රය මඟින් ලැබෙන පිටුවහල අධ්‍යයනය තුළ දී බෙහෙවින් ම වැදගත් විය.

සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස අධ්‍යයනයට වැදගත් වූ තවත් මූලාශ්‍රයක් ලෙස ධාතුවංසය හැඳින්විය හැකි ය. ධාතුවංසය බුදුන් වහන්සේගේ ලලාට ධාතුව සම්බන්ධ ඉතිහාසය පදනම් කර ගනිමින් රචිත මූලාශ්‍රය ග්‍රන්ථයක් වේ. එහි ශෛලි ද අනෙකුත් මූලාශ්‍රයන්ට බෙහෙවින් ම සමාන වන අතර ධාතුවංසයේ සේරුනුවර දාගැබ හා ඒ අවට පරිසරය පිළිබඳ විස්තරය ඇතුළත් වේ. එහි විස්තර වන ප්‍රවෘත්තිවලට අනුව අනුරාධපුරය හා සේරුනුවර අතර පැවති අඛණ්ඩ සමාජ සම්බන්ධතාවය හඳුනාගත හැක්කේ සම්පත් පරිහරණය ක්‍රියාදාමය තුළිනි. විශේෂයෙන් ම සේරුවිල පිහිටන ස්වභාවික තඹ නිධිය පිළිබඳ අන්තර්ගත තොරතුරු සමුදාය මඟින් අනුරාධපුර සාර්ව සංස්කෘතික විකාශනයේ අධ්‍යයනයේ දී නැගෙනහිර පර්යන්ත ප්‍රදේශවලින් ඒ සඳහා ලබාදුන් දායකත්වය හඳුනාගත හැකි ය.

බෝධිවංසය හා මහාබෝධිවංසය ද තවත් වැදගත් මූලාශ්‍රයෝ දෙකක් වශයෙන් අධ්‍යයනය තුළ දී භාවිත කරන ලදි. දේවානම්පියතිස්ස රාජ යුගයේ ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම, බෝධියෙන් හටගත් අංකුර ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම, බෝධිය සමඟ විවිධ ශිල්ප කටයුතුවලට අදාළ ශිල්පීන්ගේ ආගමනය හා මහා විහාර සැලැස්ම නිර්මාණය පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත ය. සිංහල බෝධිවංසය හා මහාබොධිවංසය, දීපවංසය වැනි මූලාශ්‍ර ග්‍රන්ථවලට පසු කාලීන ග්‍රන්ථ වුව ද මුල්





ඓතිහාසික හා මධ්‍ය ඓතිහාසික අවධියේ අනුරාධපුර සංස්කෘතික විකාශනය විචාරාත්මක ලෙස අධ්‍යයනයට ඉන් විශාල පිටුවහලක් ලබා ගත හැකි ය. ඉන්දීය ශිල්ප පරපුරවල ආගමනය සමඟ තාක්ෂණික වශයෙන් සමාජයේ ඇතිවන වෙනස්කම් හඳුනාග ැනීමටත්, මහා විහාර වින්‍යාස සැලසුම අනුරාධපුර භූ දර්ශනයට එක්වීම පිළිබඳවත් තොරතුරු අධ්‍යයනයට බෝධිවංසය වැදගත් මූලාශ්‍රයක් වේ.

ක්‍රි.ව. පස් වැනි සියවසේ දී ප්‍රාග් සිංහලෙන් පැවති පසු ව පරිවර්තනය කරනු ලැබූ අට්ඨකතා ද මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් භාවිත කරනු ලැබීය. ඒ අතර සමන්තපාසාදිකාව වැනි මූලාශ්‍රය මඟින් පැරණි ලාංකික සමාජය සම්බන්ධ තොරතුරු හඳුනාගැනීමටත්, එමෙන් ම රසවාහිනිය වැනි කෘතිවල අන්තර්ගත කතා වස්තුවලින් පුරාණ ලාංකීය සමාජයේ පාලකයන්ගේ හා භික්ෂූන්ගේ ක්‍රියාකාරිත්වය හා සමාජ සංස්කෘතික තත්ත්වය හඳුනාගැනීමට මෙන් ම විදෙස් සංස්කෘතික සම්බන්ධතා තේරුම් ගැනීමට එම මූලාශ්‍රයෝ ද අධ්‍යයනයේ දී ප්‍රයෝජනවත් විය.

අධ්‍යයන සඳහා වැදගත් වූ ප්‍රාථමික මූලාශ්‍ර ලෙස විදේශීය වාර්තාකරුවන් තබන ලද සටහන් ද වේ. ඒ අතර මෙගස්තීන්ගේ Indic වාර්තාව ද ප්ලීනිගේ Natural History කෘතිය ද පුරාණ අනුරාධපුරයේ මෙන් ම ලංකාවේ වාණිජ සම්බන්ධතා අධ්‍යනයේ දී වැදගත් වේ. එම මූලාශ්‍රවලට අමතර ව ක්‍රි.ව. පස් වැනි සියවසේ දී ලක්දිවට පැමිණි චීන ජාතික භික්ෂුවක් වන ෆාහියන් රචිත Recoad of Buddhist Kingdom : An Account of Chinese Monk of Fa- Hien and his Travels in India and Ceylon කෘතිය ද අධ්‍යයනයේ දී වැදගත් වූ විදේශීය වාර්තාවකි.

ෆාහියන් දේශාටන වාර්තාවේ සඳහන් තොරතුරු අනුව එම භික්ෂුව ලංකාවට පැමිණෙන සමය වන විට අනුරාධපුරයේ පැවති විහාර හා මුල් ජනාවාස තත්ත්වයන් පිළිබඳ ව තේරුම් ගැනීමට එම වාර්තාව වැදගත් වේ. එසේ ම හියුංසාං භික්ෂුව ශ්‍රී ලංකාවට නොපැමිණිය ද ලංකාව පිළිබඳ ව ඔහු අසා දැනගත්

තොරතුරු පදනම් කර ගනිමින් ලියා ඇති Buddist Records of the Western World යන වාර්තාවෙන් ශ්‍රී ලංකාව පිළිබඳ ව දක්වන තොරතුරු ඔස්සේ සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් අනුරාධපුර සංස්කෘතික විකාශනය හඳුනාගැනීමට හැකි වේ.

පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය පිළිබඳ ව සිදු කෙරෙන මෙම අධ්‍යයනයේ දී න්‍යායාත්මක ලෙස පසුබිමක් සකස් කර ගැනීම සඳහා අනුරාධපුරය ඇසුරින් හා එහි පර්යන්ත ප්‍රදේශ ඇසුරින් සිදු කර ඇති පර්යේෂණ තොරතුරු ද ද්විතියික මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලැබීය. එහි දී පී.ඊ.පී, දැරණියගල, සෙස්තියරි, සෙනරත් පරණවිතාන, හොර්කාට්, සී.ඩබ්. නිකලස්, සිරාන් දැරණියගල, සුදර්ශන් සෙනෙවිරත්න, රොබින් කනිංහැම්, ඩී.ඇම්.ඩී. ඉසෙඩ් වික්‍රමසිංහ, රාජ් සෝමදේව, සේනක බණ්ඩාරනායක, රෝලන්ඩ් සිල්වා, ටී. ජී. කුලතුංග, ගාමිණී විජේසූරිය, වැනි ශාස්ත්‍රඥයින්ගේ ප්‍රත්‍යෙක අධ්‍යයනයන් (Case Studies) හා ඒවාගෙන් ලබාගත් නිරපේක්ෂ හා සාපේක්ෂ කාල නිගමන මෙම අධ්‍යයනයේ දී ක්‍රමවේද වර්ධනය කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ලදි. මේ ආකාරයට ප්‍රාථමික හා ද්විතියික යන මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මත මූලාශ්‍ර පරිහරණය කරමින් සන්සන්දනාත්මක ලෙස පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය සිදු වූ ආකාරය හඳුනාගැනීම සිදු කර තිබේ.

## 1.6 පාරිසරික පසුබිම

### 1.6.1 ශ්‍රී ලංකාවේ භූගෝලීය හා පාරිසරික පසුබිම

කවර ප්‍රදේශයක වුව ද සංස්කෘතික විකාශනයේ එ නම්, මිනිසුන්ගේ වාසභූමි හා ක්‍රියාකාරකම් තේරුම් ගැනීමටත්, විස්තර කිරීමටත් පළමු කොට ම ස්වභාවික භූ දර්ශනයන්ගේ (Natural Landscape) තත්ත්වය හා විකාශය පිළිබඳ ව නිවැරදි දැනීමක් ලබාගැනීම අත්‍යාවශ්‍ය ය (*ලංවිලංඉ.*1964:01). මානව ඉතිහාසයේ ප්‍රගමනය සඳහා බලපාන මූලික ම සාධකවලින් එකක් නම් භූ තලයේ ස්වරූපයයි. භූ තලයේ ස්වරූපය වනාහි, ඒ ප්‍රදේශයේ






භූ විද්‍යාත්මක ඉතිහාසයේ ප්‍රතිඵලයකි. කවර හෙයින් ද යත්, භූ තලයේ තත්ත්වය එහි ප්‍රභවයේ තත්ත්වය මුල් කර ඇති හෙයිනි (එම). විශේෂයෙන් ම ප්‍රාරම්භක යුගයේ දී ප්‍රාථමික ජීවිතයක් ගත කළ මානවයා සිය වාසභූමි පිහිටුවා ගැනීමේ දී අනිවාර්යයෙන් ම භූමියේ උපයෝගීතාවය පිළිබඳ ව සොයා බලා ඇති ආකාරය ප්‍රාථමික ජනාවාස ස්ථානගතවීම සම්බන්ධ පර්යේෂණවලින් තහවුරු වී තිබේ. ශ්‍රී ලංකාව ගත් කළ ද අනාදිමත් කාලයක සිට මානව ජනාවාසකරණය වූ කොදෙව්වකි. ඉන්දීය අර්ධද්වීපයේ පිහිටන ශ්‍රී ලංකාව මුල් මානව ජනාවාස පිහිටුවා ගැනීමේ සිට, විකාශනය දක්වා කාලය තුළ භූගෝලීය හා පාරිසරික වශයෙන් එහි පිහිටීමේ වැදගත්කම බලපා ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දිවයිනකි (Cooray 1984:49). වර්තමානයේ දී සැතපුම් 22ක පටු සමුද්‍ර මායිමකින් ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පවතී (එම).

ප්ලයිස්ටෝසීන අවධියේ සිදු වූ ග්ලැසියර් හා අන්තර් ග්ලැසියර් ක්‍රියාකාරකම් නිසා ඉන්දු ලංකා දෙ රට අතර ගොඩබිම් සබඳතා කිහිපවිටක් ඇති වී නැති වී ගොස් තිබෙන අතර අවසන් වරට මෙම දෙ රට අතර ගොඩබිම් සබඳතා ඇණහිට තිබෙන්නේ මීට වසර 10,000කට පමණ පෙර බව භූ විද්‍යාඥයින් පෙන්වා දී ඇත (BÈsuyt et.al. 2004:479-481). විටින් විට ඉන්දියාව හා ලංකාව ගොඩබිමක් ලෙස භාවීම හා වෙන්වීම නිසා ඇති වූ ගොඩබිම් සබඳතාවල ප්‍රතිඵලයන් කරණ කොට ගෙන ආදිත ම අවධියෙහි දී ජීවීන්ගේ සංක්‍රමණ ඉන්දියාව හා ලංකාව අතර සිදු වූ බව ප්ලයිස්ටෝසීන අවධියට සම්බන්ධ පාෂාණීභූත සත්ත්ව ශේෂ මගින් පැහැදිලි වන බව පී.ඊ.පී. දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1958:164). කෙසේ වෙතත් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අදින් වසර 10,000කට පෙර වූ ජීවී සංක්‍රමණවලින් අනතුරු ව අද දක්වා ම ගොඩබිම සම්බන්ධ වීම සිදු වී නොමැති බැවින් ශ්‍රී ලංකාවේ භූ තලය එතැන් සිට ස්වාධීන ව ගොඩනැගී ඇති බව පෙනේ.



සිතියම් අංක 1.2

ඉන්දියාව, ශ්‍රී ලංකාව හා ආසියානු කලාපයේ භූ පිහිටීම, තද කළු පැහැයෙන් පාෂාණීභූත සත්ත්ව ශේෂ වාර්තාවන ස්ථාන දැක්වෙන සිතියම

*(Deraniyagala 1958 : Fig 09)*




ඡායාරූප අංක 1.1

ශ්‍රී ලංකාව හා ඉන්දියානු භූ ස්කන්ධය දැක්වෙන චන්ද්‍රිකා ඡායාරූපය





ඓතිහාසික කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පුරාණයේ මෙම ද්වීපය විවිධ සංචාරකයින් දේශාටකයින් විවිධ නම්වලින් හඳුන්වා ඇත. ඇලෙක්සැන්ඩර් රජුගේ (ක්‍රි.පූ.336-303) අද්මිරාල් කෙනෙකු වූ ඔනිසික්‍රිටස්ගේ වාර්තාවේ හා චන්ද්‍රගුප්ත රජුගේ (ක්‍රි.පූ.324-300) රාජ සභාවේ ග්‍රීක තානාපතියකු වූ මෙගස්තිනීස්ගේ **ඉන්ඩිකාවේත් තැප්‍රොබේන්** යනුවෙන් ලංකාව හඳුන්වා ඇත (ලියනගමගේ සහ ගුණවර්ධන 1965:49). **තැප්‍රොබේන්** යන්න **තාම්‍රපර්ණී** යන වචනයෙන් තත්සම වූ ග්‍රීක වචනයකි (එම). එසේ ම අශෝක රජුගේ දෙ වැනි හා දහතුන් වැනි ගිරි ලිපි දෙකෙහි ම ලංකාව හඳුන්වා ඇත්තේ **තම්බපණ්ණි** යනුවෙනි (එම 50). ටොලමි විසින් ද ලංකාව හඳුන්වා ඇත්තේ **තැප්‍රොබේන්** යනුවෙනි (එම). ලියනගමගේ හා ගුණවර්ධන පෙන්වාදෙන ආකාරයට අතීතයේ දී **සිමොන්දු** හා **පලෙයි සිමොන්දු** (පාර සමුද්‍ර) ලෙස ද ලංකාව හඳුන්වා ඇත (එම). එසේ ම විවිධ දේශ සංචාරකයින් මෙම ද්වීපය **සීලන්, සෙරන්ඩිබ්** හා **සීහල දීප** ආදී නාමයන්ගෙන් ද හඳුන්වා තිබේ (කෑදර්හ 1984 :49). කිලෝමීටර් 434 ක් (සැතපුම් 270) ක් දිගින් ද, කිලෝමීටර් 227ඉ (සැතපුම් 140)) ක් පළලින් ද යුත් ශ්‍රී ලංකා ද්වීපය භූ විෂමතා ලක්ෂණ අනුව වෙරළබඩ තැන්න, අඩතැන්න, මධ්‍යම කඳුකරය වශයෙන් ප්‍රධාන තැනි තුනකට බෙදේ (Cooray 1984:49 ; ප්‍රනාන්දු 1997:6-7). ඉහත ප්‍රධාන තැනි තුනට අයත් දේශගුණික කලාප වශයෙන් පහතරට තෙත් (Low land wet), පහතරට වියළි (Low land Dry), උඩරට තෙත් (High land wet), උඩරට වියළි (High land Dry), ශුෂ්ක (Dry) යන කලාපයන් පවතින බව පෙන්වාදිය හැකි ය (ප්‍රනාන්දු 1997:6-7).

ශ්‍රී ලංකාවේ භූ ගර්භය තුළ දහයෙන් නව කොටසක් තුළ ම දැකගත හැකි වන්නේ ප්‍රාග් කේම්බ්‍රීය යුගයට අයත් ආග්නේය හා විපරිත පාෂාණ වේ (*ලංවිවිලංඉ.*1964:03). ඒ අනුව ප්‍රාග් කේම්බ්‍රීය යුගයට අයත් පාෂාණ සංස්ථාව වන විජයානු ශ්‍රේණිය (Vijayan Group), උස්බිම් ශ්‍රේණිය (Highland Group), දකුණු බටහිර ශ්‍රේණිය (South Western Group) ශ්‍රී ලංකාවේ භූ ස්කන්ධයේ බහුතර කලාපයක ව්‍යාප්ත ව පවතී (Cooray 1984 :79).


## 1.6.2 අධ්‍යයන ක්ෂේත්‍රයේ පාරිසරික පසුබිම

### 1.6.2.1 පස හා භූමි සැකැස්ම


අධ්‍යයන ක්ෂේත්‍රයට ලක් වූ අරය කිලෝමීටර 5 ක් වන භූමි කලාපය මුහුදු මට්ටමින් මීටර් 70-100 ක් පමණ වූ පහත් ම තැන්න තුළ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විද්‍යාත්මක කලාප පිළිබඳ ව විමර්ශනය කරන විට අධ්‍යයන කලාපය විජයානු ශ්‍රේණිය නියෝජනය කරන (Vijayan Complex) ප්‍රදේශය තුළ පිහිටයි (Cooray 1984 :79). අධ්‍යයන කලාපයට සමීප නොවූව ද ඊට බටහිරින් මයෝසීන (Miocene) තැන්පතු ද නිරිත දිගට වන්නට ජුරාසික (Jurassic) තැන්පතු ද පිහිටා තිබේ. විජයානු ශ්‍රේණිය හෝන් බ්ලෙන්ඩ් නයිස් (Honebland Knise), චානොකයිට් (Charnokite), මිග්මටයිට් (Migmatite) සහ ඇම්පිබෝලයිට් (Amphybolight) ගණයට අයත් පාෂාණවලින් සැදී තිබේ (Cooray 1984:104; Wadi 1943 :20). කාලාන්තරයක් මුළුල්ලේ අධික ඛාදනයට භාජනය වූ ස්ඵටික පාෂාණ මණ්ඩලයක් මෙම කලාපය තුළ පිහිටන බැවින් ඛාදනයට ඔරොත්තු දෙන ගල්කුළු සහිත කඳුගැට කිහිපයක් ද දක්නට ලැබේ (හෙට්ටිආරච්චි 1970 :368). භූ විද්‍යාඥයින්ගේ විග්‍රහ කිරීම්වලට අනුව ශ්‍රී ලංකා භූමිය ස්ථායී භූමි ස්කන්ධයක් සේ පවතිමින් දිගින් දිගට ම නග්නීකරණය වූ බැවින් උතුරුමැද පළාතේ සහ සෙසු ප්‍රදේශවල දක්නට ලැබෙන්නේ නග්නීකරණ නිර්මාණ ලක්ෂණයන් ය.








සිතියම් අංක 1.3 ශ්‍රී ලංකාවේ පාංශු පිහිටීම




සිතියම් අංක 1.4

අධ්‍යයන ක්ෂේත්‍රයේ පාංශු පිහිටීම දැක්වෙන සිතියම

වන්නේ රතුවන් දුඹුරු පස හා ඒවායේ දියබස්නා සබැඳියෝ වේ (Reddish Brown Earth and their drainage associates) (ඤදර්හ 1984 :104-105). එසේ ම මල්වතු ඔය පිටාර නිම්න කලාපයේ දියළු පස් (Aluvial Soils) හා සමහර කලාප තුළ රතුවන් බොරළු මිශ්‍ර පස් (Reddish Brown Earths with high amount of gravel) පාංශුවලින් සැකසී ඇත (එම) (බලන්න සිතියම් අංක 1.3, 1.4).

### 1.6.2.2 වර්ෂාපතනය සහ උෂ්ණත්වය

උතුරුමැද පළාත පහතරට වියළි කලාපීය තැනිතලා ගණයට අයත්වන බැවින් සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1000 - 1500 ත් අතර අගයක් ගනී. අධ්‍යයන ක්ෂේත්‍රයට හා අනුරාධපුර ප්‍රදේශයට ප්‍රධාන වශයෙන් ම වර්ෂාව ලැබෙනුයේ සැප්තැම්බර් හා පෙබරවාරි යන මාස අතර මැද ඇද හැලෙන ඊසාන දිග මෝසම් වැස්සෙනි. එය මිලිමීටර් 250 - 500 දක්වා වූ වර්ෂාපතනයකි (තම්බයියා 1963:19). එසේ ම මැයි හා සැප්තැම්බර් මාස අතර ඇද හැලෙන නිරිත දිග මෝසම් වැස්සෙන් ලැබෙන්නේ මිලිමීටර් 250 කට අඩු වර්ෂාපතනයකි (එම). සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 25.0- 27.5 (ෆැරන්හයිට් අංශක 80) අතර අගයක් ගනී.

### 1.6.2.3 ජලවහන පද්ධතිය

අධ්‍යයන ප්‍රදේශය පෙර සිට වර්තමානය දක්වා ම මානව ක්‍රියාකාරකම් සිදු වූ භූමියකි. ඒ අනුව වී ගොවිතැන පදනම් කර ගත් ජන ජීවිතයක් මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වී ඇති අතර වත්මන් තත්ත්වය අනුව මීට වසර 200 ක සිට අඛණ්ඩ ව ක්‍රියාත්මක කෘෂිකාර්මික පරිසරයක් මේ ප්‍රදේශයෙන් දැකගත හැකි ය. එ බැවින් පුරාණයේ සිට ම මෙම ප්‍රදේශයේ ජල අවශ්‍යතා මානව ක්‍රියාකාරකම් සඳහා බෙහෙවින් ම අවශ්‍ය වන්නට ඇත. මූලික ලෙස ජල අවශ්‍යතා ප්‍රධාන වශයෙන් සපයා ගනු ලැබූ ක්‍රමවේද දෙකක් අධ්‍යයන ක්ෂේත්‍රය ඇසුරින් දැකගත හැකි ය.

i මල්වතු ඔය ආශ්‍රයෙන් ජලය සපයා ගැනීම.






ii වාරි කටයුතු ආශ්‍රයෙන් ජල අවශ්‍යතා සපයා ගැනීම.

මල්වතු ඔය (කදම්බ නදිය) පුරාණයේ සිට ම අනුරාධපුරයේ ජනාවාස ගොඩ නැංවීම සඳහා තීරණාත්මක සාධකය වූ බව වංසකතාවල සඳහන් වී ඇත (*මව*.vii:43). විශේෂයෙන් ම කෘෂිකාර්මික කටයුතුවලදී මෙන් ම පරිභෝජන කටයුතුවල දී මෙම ජල මූලාශ්‍රය බෙහෙවින් වැදගත් වන්නට ඇති අතර අවුරුද්දේ මැයි සිට සැප්තැම්බර් දක්වා මල්වතු ඔය තුළ පවතින්නේ අඩු ජල ධාරිතාවයකි. එ බැවින් පැරැණ්නන් විසින් පුරාණයේ සිට ම පුරාණ අනුරාධපුර නාගරික ප්‍රදේශය අළලා වැව් පද්ධතියක් ස්ථාපිත කර ඇත. එම වැව් පද්ධතිය අතර ගාමිණී වාපි (පෙරිමියන්කුලම වැව), ජය වාපි (බුලන්කුලම), අභයවාපි (බසවක්කුලම), තිසා වාපි (තිසා වැව), නකර වාපි (නුවර වැව) ප්‍රධාන වැව් ප්‍රධාන වන අතර ඊට අමතර ව කඩපනහ වැව, කුබිච්චන්කුලම වැව, තම්මැන්නාව වැව, සියඹලා වැව, පැරණි අනුරාධපුරයේ දැකගත හැකි ජලවහන පද්ධතියට අයත් අනෙක් වැව් වේ. මෙම වාරි පද්ධතිය තුළට ජලය ගබඩා කිරීම ඊසාන දිග මෝසම් සමයේ ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව තුළින් සිදු කරන අතර කෘෂි කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට අමුණක් මඟින් හරවා ඇති හාල්පානු ඇළ (දෙවැනි කොලොම්හොය) (*මව*.xv:206-208). පැරණි අනුරාධපුර ජලවහන පද්ධතිය අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගන්නා මිනිසුන් ඉදි කර ඇති පුරාණ ඇළක් වේ.

මෙම ජලවහන පද්ධතිය තුළින් මල්වතු ඔය නිම්න ප්‍රදේශයේ හා හාල්පානු ඇළ නිම්න ප්‍රදේශයේ දැකගත හැකි දියළු පස් (කකමඩස්ක් දසක) වී ගොවිතැනට ඉතා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇත. එසේ ම වාරි මාර්ගවලින් සපයන අමතර ජලය ඔස්සේ ප්‍රදේශයේ පවතින සාරවත් පස නිසා කෘෂි කටයුතු වර්ෂය පුරා ම පවත්වා ගෙන යාමට අවකාශ ලැබී තිබේ.

අප්‍රිකානු හා ආසියාතික ශිෂ්ටාචාර වැඩිමනක් ගංගා නිම්වල ආරම්භ වූවා මෙන් ම ඒවා වියළි කලාපයන්ට සීමා වූ බැව් පෙනේ (ලියනගමගේ ; ගුණවර්ධන 1965 :41). අනුරාධපුර ශිෂ්ටාචාරය ද පැන නැගුනේ වියළි තැනිතලා ප්‍රදේශය කේන්ද්‍රගත

කර ගෙන ය (එම). තිස්සමහාරාමය ආශ්‍රිත ජනාවාස රටාව ද මේ ආකාරයට ම වියළි පරිසරයක ස්ථානගත වී ඇත(Somadeva 2006:71-79). අනුරාධපුරය බිහිවන්නේ කදම්බ නදිය (මල්වතු ඔය) ආසන්නයේ ය. නගරයේ පජින පසින් ගංගාවේ පිහිටීමත්, අවරගිරින් ස්වභාවික ශේෂ කඳුගැට පන්තියක් (දීඝ පාෂාණය) පිහිටීම නිසා ස්වභාවයෙන් ම භූ පතන (Hollow) නිර්මාණය වීමත් දැකගත හැකි ය. එසේ ම සුවිශේෂ භූ විෂමතාවය ඔස්සේ මාතොට ප්‍රධාන වරායට සම්බන්ධ වීමට හැකියාව වැඩිවීම නිසාත්, ජලවහන පද්ධතිය ද අනුරාධපුරයේ දියුණු ශිෂ්ටාචාරයක් වර්ධනයට රුකුලක් ලබා දෙනු ලැබී ය (බලන්න සිතියම් අංක 1: 5, 1:6).





සිතියම් අංක 1.5

අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ ජලවහන පද්ධතියේ පිහිටීම දැක්වෙන සිතියම








සිතියම් අංක 1.6

උතුරුමැද පළාතේ වැව් පද්ධතියේ පිහිටීම දැක්වෙන සිතියම

### 1.6.2.4 ශාකායනය

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ දැකගත හැකි ශාකායනය අයත් වන්නේ මෝසම් වනාන්තර (Monsoonal forest) ගණයට ය. මෙම වනාන්තර වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (Dry mixed evergreen forest) වශයෙන් ද හඳුන්වන අතර මෙහි නිහාලි හෙවත් පතනශීලී ගස් කොළන් පැවතිය ද එයින් සදාහරිත ලක්ෂණ පවත්වා ගෙන යනු ලබන්නේ ගස් වර්ග විශේෂ කිහිපයක් පමණි. මේ නිසා ම මෙම වනාන්තර අර්ධ සදාහරිත වනාන්තර (Semi evergreen forest) යනුවෙන් ද හැඳින්වේ (Ashton et.al. 1997:432). අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කුඹුරු, හේන්, ගෙවතු, තෘණ බිම්, ළඳු කැලෑ, වැව් තාවුළු, ගඟබඩ වනාන්තර, ද්විතියික වනාන්තර වැව් හා පොකුණුවල වූ ජලජ ශාක ආදී බොහෝ පරාසයක වන ශාක පද්ධතියක් දක්නට ඇත.

ශතවර්ෂ ගණනාවක සිට පැවත එන වැව් පොකුණුවල ඉතා ස්ථාවර පරිසරයන් නිර්මාණය වී ඇත. ඊසානදිග මෝසමෙන් හා

අන්තර් මෝසම් මඟින් වර්ෂාව ලැබුණ ද ඉතිරි මාස කිහිපය අතිශය වියළි තත්ත්වයන් යටතේ වුව ද අඛණ්ඩ ව පවතින ජලජ ශාක ප්‍රජාවක් මේ කලාපය තුළ දැකගත හැකි ය. කෘෂිකාර්මික කටයුතු මූලික කර ඉදි කර ඇති වැව් පද්ධතිය හා විවිධ ජල අවශ්‍යතා සඳහා තැනුණු පොකුණු තුළින් හමුවන සුලභ ශාක අතරින් ලුනුවිල (*Bacopa monnieril*), දිය පත් (*Blyxa Echinosper*), කරඩු පෙති (*Caldesiao ligococea*), ගෝන පරඬැල් (Cyeriadesa), ජපන් ජබර (*Hydroceratriflora*), දිය සර්ප (*Eichhorniacrassipes*), හීන් මුකුණුවැන්න (*Hygrophila polysperma*), කහට පාසි (*Lim nophila indika*), නිල් කරාඹු (*myo sotisscorpiodes*), රයිදපාසි (*Limnophilaheterophylla*), දිය ඇබිලිය (*Maßilea Quadrifolia*), ගිරා පිහාටු (*Myriophylumindicum*), නෙළුම් (*Nelumbium nucifera*), හීන්පරඬැල් (*Naiasminor*), දිය පොකුණුවැන්න (*Nochmandraultemifolia*), කුරු සුදු ඕලු (*Nymphoides panifolium*), මානෙල් (*Nymphaea pubescens*), දිය කොළපත් (Otteliaalismodis), දියගැට පලා (*Peplidiummaritimum*), දිය ගෝවා (*Pistiastratiotes*), හීන් දියකරණ (*Potamogonpectinatas*), පට්ට තණ (*Vallisneria spiralis*), ජපන් පාසි (*Salvinia cuculata*) දැක්විය හැකි ය (මනමේන්ද්‍ර ආරච්චි 2008:109-110).

මේ කලාපය තුළ අද විස්තර කළ හැකි පඳුරු, ගස් හා වැල් අතර ආහාර, දැව ඇතුළු තවත් අවශ්‍යතාවයන් සඳහා විදේශ රටවලින් ගෙනෙන ඒවා ද බොහෝ ඇත. එසේ ම විසිතුරු පැළ ද අද වන විට බොහෝ සේ පරිසරයේ ව්‍යාප්ත ව ඇත (එම 111). අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ඇති බොහෝ ගස් අතර බෝ (*Ficus religiosa*), නුග (*Ficusbenghalensis*), අට්ටික්කා (*Ficusracemosa*), මයිල (*Bauhinaia racemsa*), වල්ඇහැටු (*Ficustinctoria*), කුඹුක් (*Terminaliagrjana*), කොබෝලීල (*Buahinia variegata*), රණවරා (*Cassiaauriculata*), කහපෙතන් (*Baahinatomentosa*), ඇහැළ (*cassiafistula*), වා (*CassiaSiamea*), මැයි (*Delonixregia*), කොහොඹ (*Azadirachtaindica*), දිවුල් (*Limoniaacidissima*), හික් (*chakrasiatabularis*), තල් (*Borassusflabellifer*), කටුකරද (*Burleriaprionitis*), තේක්ක (*Tectonagrandis*),





කළුවර (*Diospyroseberu*), තිඹිරි (*Diospyrosmalabarica*), කඩුකම්බෙරිය (*Diosphyrosmelanokylon*), කොට්ටම්බ (*Terminaliacatuppa*), අන්දර (*Pithecellobiumduke*), බුරුත (*Chloroxylon swietenia*), හල්මිල්ල (*Berryacordifolia*), පළු (*Manilkarahexandra*), වීර (*Drypetessepiaria*), අඹ (*Mangiferaindica*), මොර (*Dimocarpnslongan*), ආඩතෝඩා (*adhatodavasica*), මී (*Madhncalongifolia*), රුක්අත්තන (*Alstonia scholaris*) ආදී ශාක දැකගත හැකි ය(එම).

මෙහි ජීවත්වන බොහෝ පදිංචිකරුවන් කෘෂිකර්මාන්තයේ යෙදෙන අය බැවින් ශාක ප්‍රජාව අතිශය ලෙස මානව ක්‍රියාකාරකම්වලට ලක් වී තිබේ. බොහෝ විට මානව ක්‍රියාකාරකම්වලින් තොර මල්වතු ඔය ගඟබඩ වනාන්තර තුළින් අතීත ශාක ප්‍රජාවේ ස්වභාවය පිළිබඳ මනා අවබොධයක් ලබා ගත හැකි ය.



ඡයාරූප අංක 1.2

ප්‍රදේශයට අවේනික නෙළුම් සහිත වාපි පරිසර පද්ධතිය

### 1.6.2.5 සත්ත්ව ප්‍රජාව

අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කලාපයේ තැනිතලා බිම්වල ජීවත්වන අපෘෂ්ඨවංශීන්, මිරිදිය මත්ස්‍යයන්, උභයජීවීන්, උරගයින්, කුරුල්ලන් හා ක්ෂීරපායීන් ආදී ගණයට අයත් සත්ත්ව ප්‍රජාවක් දැකගත හැකි ය.

#### I **අපෘෂ්ඨවංශීන්**

ප්‍රදේශය තුළ දැකගත හැකි වැව් පොකුණු, ඇළවේලි හා මල්වතු ඔය තුළ ජීවත්වන අපෘෂ්ඨවංශීන් විශාල ප්‍රමාණයක් වේ. ඒ අතර මිරිදියේ වසන තනි කටුවක් සහිත ගොළු බෙල්ලන් හෙවත් ගැස්ට්‍රොපෝඩාවන් (ඨ්ඵරදචද්‍) ඇතුළු පහත සඳහන් ගොළු බෙලි වර්ග දැකගත හැකි ය. *Paludomus (p) tanschaurious, Puludomus (p) chilinodfies, Bellamyadissimilisvar, ceylanica, Bulimusstenothyroides, Bulimusinconspicua, gyraulusconvexiusculus, Thiara (plotia)Scabra, Indoplanorbisexust, Mysorellacostiyera, Melaroides (M) tuuberculata (Stramublner 1974:97-98).*

මෙයට අමතර ව මිරිදිය දෙපියන් බෙල්ලන් හෙවත් බයිවැල්වියාවන් (Bivalvi) වර්ග ද ඒ අතරින් *Lamelidenslamellatns, Lamellidenstestndinrius, Parreysiacorrugata, polymesoda, Ceylonica* විශේෂ ද වේ (එම).

මෙම ජලජ ගොළුබෙලි වර්ගවලට අමතර ව ගොඩ ගොළුබෙලි විශේෂ කිහිපයක් ද අධ්‍යයන ප්‍රදේශ තුළ දැකගත හැකි ය. Aulopomahofmelsteri, Cryptozonabistralis, Beddomeatrifasciatas, Euplectasp, Eurychlamysvilipensa, Indoartemon layardianas, micraulax Coeloconus, Miruspanos, Pterocyclassp, Rhachistapulcher, Theobaldinssp (මනමේන්ද්‍ර ආරච්චි 2008:115).

#### II **මිරිදිය මත්ස්‍යයින්**

පූර්ව ඓතිහාසික අවධියේ සිට ඇරඹි සුළු වාරි කර්මාන්ත මහා පරිමාණ ව ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර





නගරය වටා වැව් පද්ධතියක් ස්ථානගත වීම දැකගත හැකි වේ. ශ්‍රී ලංකාවේ වාරි කටයුතු සම්බන්ධ අධ්‍යයනයක් කළ ආර්.ඇල්.බ්‍රෝහියර් අනුරාධපුරය හා උතුරුමැද පළාතේ වූ විවිධ ප්‍රමාණවල වැව් 11200 වාර්තාකර තිබීම තුළින් උතුරුමැද පළාත තුළ වූ ජල කළමනාකරණය මැනවින් පෙන්වා දී ඇත (Brohier 1934 1955:43). මෙම වාරි පද්ධතිය මත්ස්‍ය ව්‍යාප්තිය සඳහා ඍජු ව බලපා ඇති අතර ඓතිහාසික යුගයේ සිට ම උතුරුමැද පළාතේ ජනතාව තම ප්‍රෝටීන් අවශ්‍යතාවයන් මූලික වශයෙන් මසුන්ගෙන් සපුරා ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. කෘෂිකර්මාන්තය සඳහා ඉදි කළ වාරි පද්ධතිය හා අලංකරණය සඳහා ඉදිකළ පොකුණු තුළ ද අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ ව මිරිදිය මත්ස්‍ය විශේෂ ගණනාවක් දැකගත හැකි ය (*Deraniyagala* 1952:101; *Senanayake* 1980:390; *Pethiyagoda* 1991:362; *Goonathilake* 2007:134). එම මත්ස්‍ය ප්‍රජාව අතර වයිරන් ආදා (*Anguilla nebulosa*), මඩආදා (*Anguill abicolour*), රැවුල් දණ්ඩියා (*Escomasthermoicos*), හිරිකනයා (*Cabeodassumieri*), කොට පෙතියා (*Puntiuschola*), මස් පෙතියා (*Puntiussarana*), දම් කොළ පෙතියා (*Puntiussinghala*), බණ්ඩි තිත්තයා (*Puntinsuittatus*), දණ්ඩියා (*Rasboradaniconius*), ඉරි අංකුට්ටා (*Mystnsvittatus*), මඟුරා (*Clariasbrachysoma*), හුංගා (*Heteropneustesfossilis*), කහ කොරලියා (*Etroplusmaculatus*), කොරලියා (*Etroplussuratensis*), කාවයියා (*Anabustestndihen*), ලූලා (*Channastriata*), ගංකෙලියා (*Mastacemblus armatus*) ආදී මසුන් වේ. මේ අතරින් හිරි කනයා 1950 දශකයේ අනුරාධපුරය හා රඹෑව ප්‍රදේශයේ සුලභ මිරිදිය මත්ස්‍ය විශේෂයෙකි (*Deraniyagala* 1950 :101). නමුත් මිරිදිය මත්ස්‍යයින් පිළිබඳ ව ක්ෂේත්‍ර ගවේෂිත මත්ස්‍ය විද්‍යාඥයින්ට මෙම මත්ස්‍යයා හමු වී නැත (*Pethiyagoda* 1991:372).

මීට ශතවර්ෂයකට පමණ පෙර සිට උතුරුමැද පළාතේ ප්‍රෝටීන් අවශ්‍යතා සපුරා ගැනීමට හඳුන්වා දුන් මිරිදිය මත්ස්‍යයන් වර්ග කිහිපයක් ද වර්තමානයේ වැව්වල ජීවත් වේ. කාප් (*Carassiusauratns*), කැට්ලා (*Catlacatta*), තිලාපියා

(*Oreochromismossambicns*), රොහු (*Cabeo rohita*) එම මත්ස්‍යයා මේ අතර හඳුනාගත හැකි ය (මනමේන්ද්‍ර ආරච්චි 2008:120).



ඡායාරූප අංක 1.3

දම් කොළ පෙතියා *(Puntiñsinghala)*

## III **උභයජීවීන්**

අධ්‍යයන ප්‍රදේශයට අදාළ ව ගඟබඩ පරිසරයේ පඳුරු මැඩියන් වාසය කරන අතර වැව් පොකුණු ඇතුළු ජලජ පරිසරයේ හා ළඳු කැලෑවල හා ගෙවතුවල ගෙඹි විශේෂ ජීවත් වේ. ඒ අතර පහත දැක්වෙන උභයජීවීන් දැකගත හැකි ය. ග්නයිඩර්ගේ ගෙම්බා *(Bufo Scaber)*, විසිතුරු රතු මැඩියා *(Kaloula taprobanica)*, රතු මුව පටු මැඩියා *(Microhyla rubra)*, බඩ සුදු මොට හොඬු මැඩියා *(rumanella variegata)*, බැලූන් මැඩියා *(Uperodonsystoma)*, උත්පතන මැඩියා *(Euphlyctiscyarophryctis)*, සයගිලි පලා මැඩියා *(Euphlyctishexadactylas)*, වෙල් මැඩියා *(Fejeriaralimnocharis)*, ශ්‍රී ලංකා දිය මැඩියා *(Rana gracilis)*, ළපවන් වැලි දිය මැඩියා *(Sphoerothecarolandae)*, පුල්ලි ගස් මැඩියා *(Polypedates maculates)* (Manamendra-arachchi 2005:163-303 ; Pethiyagoda 2006 :103-112).







ඡායාරූප අංක 1.4

රතුමුව පටු මැඩියා *(Microhyla rubra)*

## IV **උරගයින්**

අනුරාධපුර පැරණි නගර ප්‍රදේශය තුළ භෞමික මෙන් ම ජලචර උරගයින් ද දැකගත හැකි ය. එම සත්ත්ව විශේෂ අතර ගල් ඉබ්බා *(Melarochelys trijuga)*, කිරිඉබ්බා *(Lissemyspunctata)*, තරු ඉබ්බා *(Goecheloneelegans)*, හුබස් හූනා *(Hemidactylnstriedrns)*, කිඹුල් හූනා *(Hemidactylnsleschenaltil)*, හිකනලා *(Lygosomapunctatu)*, බෝදිලිමා *(Chamaeloeo Zeylonicons)*, තලගොයා *(Varanusbengalensis)*, කබරගොයා *(Aranussalvator)*, හැල කිඹුලා *(Crocodgluspalastris)* ආදී උරගයෝ වේ *(Somaweera 2006:297)*.

මෙම උරග විශේෂවලට අමතර ව අධ්‍යයන කලාපය තුළ ජීවත්වන සර්පයින් විශාල ප්‍රමාණයක් ද ඇත. ඇහැටුල්ලා *(Ahaetalla nasuta)*, නිදි මාපිලා *(Boiga eylone)*, ලේ මාපිලා *(Boiga foßteri)*, පොල්මල් කරවලා *(Chrysopelelaornata)*, කට කළුවා *(Coelognathushelena)*, තුරු හාල්දණ්ඩා *(Dendrelaphistristis)*, කුරන් කරවලා *(Haplocercusceylonensis)*, ගැරඩියා *(Dtyusmacosa)*, තෙල් කරවලා *(Bungarausceruleus)*, නයා *(Najanaja)*, දැති ගෝමරයා

*(Sibynophissubpunctatns)* දිය නයා *(Xenochrophispiscator)*, පිඹුරා *(Pythonmolußi)*, තිත් පොළගා *(Puboiarusselii)*, කුණකටුවා *(Hypnalehypnale)*, පලා පොළඟා *(Trimeresurustrigonocephalus)*, වැලි පිඹුරා *(Gongglophis conicas)* ආදී විවිධ සර්ප විශේෂ වේ.



ඡායාරූප අංක 1.5
මඟ මරුවා හෙවත් තෙල් කරවලා *(Haplonathashetena)*

## V පක්ෂීන්

අධ්‍යයනයට ලක් කරනු ලැබූ කලාපය තුළ වගුරු, වැව්, මඩතලා, තෘණබිම්, කුඹුරු, ගඟබඩ ප්‍රදේශ ආශ්‍රිත ව කුරුල්ලන් රැසක් දැකගත හැකි ය. මේ අතර ආවේණික කුරුල්ලන් හා සංචාරක කුරුල්ලන් බොහෝ වේ. මෝසම් වන ආවරණය අතින් ඉතා පොහොසත් ප්‍රදේශයක් නිසා විවිධ කුරුල්ලන් වාසය කරන අතර අගෝස්තු මාසයේ සිට ඊළඟ වසරේ අප්‍රේල් දක්වා උණුසුම සොයා පැමිණෙන පර්යමන කුරුල්ලන් හෙවත් නිහාරියන් ද මේ කලාපයේ බහුල ව ඇත (Kotagma and Wijayasinh 1998:394 ; kotagama et.al 2006:164-203). කලාපයේ දැකිය හැකි කුරුල්ලන් අතර ශ්‍රී ලංකාවේ වළිකුකුළා (Galluslafayetil), මොණරා *(Parocristatus)*, හීන් තඹ තේරුවා *(Dendrocygnajavanica)*, බොර ඉසැති ගෝමර කෑරලා *(Dendrrocoposnanus)*, රත්කෑරලා *(Dinopiumbenghaleße)*, පෝරු කෑදැත්තා *(AnthracocerÈcorohaths)*,





දුම් බොන්නා *(Coraciusbenghaleßis)*, මල් පිලිහුඩුවා *(Alcedaatthis)*, ළය සුදු පිලිහුඩුවා *(Ltakyonsmyrnesis)*, වන නිල්මල් කොහා *(DhaenicopheusviridirÈtris)*, ඇටිකුකුළා *(Centropussinenis)*, උලමා *(Bubonipalensis)*, බොරවන බකමූණා *(Strixleptogrammica)*, නීලකොබෙයියා *(Chalcophapsindic*, ළය සුදු කොරවක්කා *(Amauronisphoericarus)*, කහයම් මල්කිරලා *(Vanellasindcus)*, කුසඇලි සයුරු උකුස්සා *(Haliaeetusleucoyaster)*, උකුස්සා *(Accipitertriviryutus)*, දියකාවා *(Phalacrocoraxniger)*, ලතුවැකියා *(Mycteriaeucocephal)*, කරමල් කොකා *(Ardeacinerea)*, කවුඩා *(dicruruscaerulescens)*, පොල්කිච්චා *(Copsychassaularis)*, මයිනා *(acridotherestristis)*, රුක් වඩු කුරුල්ලා *(Plolens philippinus)*, හීන් කලු වී කුරුල්ලා *(Lonchara malacca)* ආදී කුරුළු විශේෂ දැකගත හැකි ය (එම).



ඡායාරූප අංක 1.6
වළිකුකුළා (*Gallus lafayetil*)

## 1.7 භූමි පරිභෝජනය

අනුරාධපුර පැරණි නගරය ඇතුළත් අධ්‍යයන ප්‍රදේශය තුළ මානව ජනාවාසකරණය ප්‍රාග් ඓතිහාසික අවධියේ ආරම්භ වී

ඇත (Deraniyagal 1992:729). ඉන් අනතුරු ව පූර්ව ඓතිහාසික අවධියෙහි දී ග්‍රාමීය ජනාවාසවල වර්ධනය (එම) හා මුල් ඓතිහාසික අවධිය තුළ දී ලෙන් විහාර හා මහා විහාර බිහි වීම මෙන් ම පශ්චාත් ඓතිහාසික අවධිය තුළ දී පබ්බත විහාර බිහි වී, පධානඝර බිහිවීම දක්වා සිදුවන වර්ධනය පුරාණ භූමි පරිභෝජනය හා සම්බන්ධ වේ (Silva.2000:pl 4.4) (බලන්න සිතියම් අංක 1.7).


අධ්‍යයන ප්‍රදේශයේ භූමි පරිභෝජන රටාවේ දී, යටත්විජිත පාලන සමය තුළ විවිධ රාජ්‍ය ආයතනවල ස්ථානගත වීම දැකගත හැකි ය. ඒ අතරින් ජේතවනාරාම භූමියේ නගරාසභා ගොඩනැගිල්ලත්, ශ්‍රී මහා බෝධි භූමියේ වෙළඳපොළත්, රුවන්වැලි සෑය අවට භූමියේ රජයේ රෝහලත්, බසවක්කුලම වැව් බැම්ම ඉස්මත්තේ කච්චේරි ගොඩනැගිල්ලත්, මිරිසවැටිය භූමියේ බන්ධනාගාරයත් ස්ථානගත වී තිබේ. මෙම නව ගොඩනැගිලි බ්‍රිතාන්‍ය යුගයේ ඉදිවීම සමඟ ම ඒ ඒ පුරාවිද්‍යාත්මක ස්ථාන ආශ්‍රිත ව පැවති බොහෝ පෞරාණික ස්ථාන විනාශවීම සිදු ව ඇත. ඒ සමඟ ම නව මාර්ග පද්ධති ඉදිවීම ද පුරාවිද්‍යාත්මක ස්මාරක හා භූමි හානිවීමට ඍජු ව බලපා ඇත. නගර සභා ගොඩනැගිල්ල ඉදිවීම නිසා ජේතවන බෝධිඝරය හා ඒ අවට බොහෝ ස්මාරකවලට හානි වී ඇත. එසේ ම නව මාර්ග පද්ධති ඉදි කිරීමේ දී හා පාලම් ඉදි කිරීමේ දී ජේතවන විහාරයේ ගොඩනැගිලි ආශ්‍රිත පාෂාණ පුවරු, පාෂාණ කණු සඳහා භාවිත කර ඇති ආකාරය මල්වතු ඔය හරහා යාපනය හන්දියට ගමන් කිරීම සඳහා සකසා ඇති පාලම තුළින් පැහැදිලි වේ. එසේ ම අභයගිරි විහාරයේ දාන ශාලාව, ධර්මශාලාව, රත්නප්‍රාසාදය යන ගොඩනැගිලි මතින් ගමන් මාර්ග සකස් කිරීම නිසා ඒවා බෙහෝ සෙයින් විනාශ වී ඇත්තේ අදාළ භූමි තුළ නව සංවර්ධන යෝජනා ක්‍රම හා ජනාවාස සඳහා පරිභෝජනය කිරීම නිසා ය.

මෙහි වත්මන් භූමි පරිභෝජන තත්ත්වය සඳහන් කරන විට ග්‍රාම නිලධාරී වසම් 16 ක් තුළ දළ වශයෙන් 5000 කට වැඩි ජනතාවක් ජීවත් වේ. ජනාවාස හා ඒ අවට පුරාවිද්‍යා භූමි විශාල ප්‍රමාණයක් තිබෙන අතර, මෙම ජනගහණය අතරින් සමහර







ජනපදිකයන් අදාළ භූමිවල පැළපදියම් වීම 1948 පසු ව සිදු ව තිබේ. වත්මන් භූමි පරිභෝජනය යටතේ මුළු අධ්‍යයන ප්‍රදේශය පුරා ම වී ගොවිතැන සිදු කරන අතර ස්ථාන කිහිපයක පමණක් හේන් ගොවිතැන් කටයුතු සිදුවීම ද දැකගත හැකි ය (බලන්න සිතියම් අංක 1 : 8, 1 : 9).




සිතියම් අංක 1.7
පුරාණ අනුරාධපුර නගරය තුළ වැව්, ගංගා හා ඇළ මාර්ග ඇතුළත් ජලවහන පද්ධතිය දැක්වෙන සිතියම




සිතියම් අංක 1.8
පුරාණ අනුරාධපුර නගරයේ භූමි පරිභෝජන රටාව දැක්වෙන සිතියම




සිතියම් අංක 1.9
අධ්‍යයන ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරී වසම් ප්‍රමාණය දැක්වෙන සිතියම



02
වැනි
පරිච්ඡේදය

# සංස්කෘතික භූ දර්ශන සංකල්පය හැඳින්වීම

## 2.1 සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ නෛතික, සංකල්පමය හා පුරාවිද්‍යාත්මක උපයෝගීතාවය

1972 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධාන (UNESCO) මඟින් එහි දාහත් වැනි සමුළුවේ දී ලෝක උරුම ප්‍රඥප්තිය (The Convention Concerning the Protection of the Worlds Cultural and Natural Heritage) ඇති කර ගන්නා ලදි. එහි දී මූලිකත්වය දෙනු ලැබුවේ කැපීපෙනෙන විශ්වීය අගයන්ගෙන් (Outstanding Universal Values) යුතු ස්වභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ ව ලේඛනයක් සකස් කිරීම, ඒවා ලෝක උරුම ලෙස නම් කිරීම සහ ඒකාබද්ධ රාමුවක් තුළ ඒවා ආරක්ෂා කිරීම පිළිබඳ කරුණු වේ (Fairclough and Rippon 2002:26). මෙම ලේඛනය තුළ අන්තර්ගත සංස්කෘතික උරුමයන් බොහෝ දුරට ස්මාරක හා ස්වභාවික උරුම ලෙස නම් කරන ලදි. මෙහි අනිත් අතින් ස්වභාවික උරුම ලෙස නම් වූ අංග මානව මැදිහත්වීම් වලින් සම්පූර්ණ වශයෙන් දුරස්ථ වූ ප්‍රාථමික ස්වභාවික ප්‍රදේශ විය. මෙම ද්විත්ව අංගයන්හි ධ්‍රැවලි අතර කැපීපෙනෙන විශ්වීය අගයන් (OUV) වාර්තා කිරීමක් සිදු නොවී ය. මේ නිසා සාම්ප්‍රදායික හා ස්වභාවික උරුමයන් අතර වන රික්තකය පූර්ණය කරමින් සංස්කෘතික භූ දර්ශනය සංකල්පය (Cultural Landscape Concept)

වර්ධනය වීම සහ ආකර්ශනය වීම ඇරඹීම මඟින් මානව වර්ගයා සහ ස්වභාව ධර්මය අතර පැවති භෞතික හා අධ්‍යාත්මික සබඳතාවයන් විශද කිරිමට හැකි විය (එම).

1992 වර්ෂයේ පැවති ලෝක උරුම කමිටුවේ දහසය වැනි සැසිවාරයේ දී සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ සංකල්පයට නෛතික පදනමක් ලබා දීමට තීරණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්කෘතික භූ දර්ශනය හා අනුබද්ධ උරුමයන් (Cultural Landscape Heritage) ලෝක උරුම ලැයිස්තුවට අන්තර්ගත කරනු වස් අවශ්‍ය නිර්දේශ සැපයීම සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලදි (Operational Guidelinese for the Implimentation of the world Heritage Convention). එහි දී සංස්කෘතික භූ දර්ශනයේ නිරූපිත ස්වභාවික හා මානව මැදිහත්වීම්වල ප්‍රතිශතය අනුව ප්‍රධාන කාණ්ඩ තුනකට බෙදන ලදි (*SCAJ*.2003:45).

සංස්කෘතික (ක්‍ෂමකඵමර්ක) හා ස්වභාවික (Natural) ලෙස කොටස් එක් කරන ලද භූ දර්ශනය (Landscape) යන වචන ජාත්‍යන්තර වශයෙන් අතිශයින් ජනප්‍රිය වීම සමඟ සංස්කෘතික භූ දර්ශනය (Cultural Landscape) යන සංකල්පය ලෝක පරිමාණ වශයෙන් වර්ධනය වීම කැපීපෙනේ. ලෝක උරුම සංකල්පය (World Heritage Concept) වර්ධනය වීම සමඟ ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් වූ පළමු වැනි සංස්කෘතික භූ දර්ශනය වූයේ පිලිපීනයේ හෙල්මළු කුඹුරු ය (Rice terraces of the Phililpine). ඉන් පසු තවත් භූ දර්ශන කිහිපයක් ලෝක උරුම ලැයිස්තුවට අන්තර්ග්‍රහණය වී ඇත(එම :05).මෙම තත්ත්වයන් මත මානවයා හා ස්වභාව ධර්මය අතර සහජීවනය පෙන්නුම් කරන සුවිශේෂී භූමි පරිභෝජන රටාවන් නිරූපිත උරුමයන් පිළිබඳ ව සංස්කෘතික භූ දර්ශනය මඟින් සාකච්ඡා කිරීමට අවකාශ සැලසී ඇත (අබේවර්ධන 2007:144).

ලෝක උරුම ප්‍රඥප්ති හැරුණු විට සංස්කෘතික භූ දර්ශනය සම්බන්ධ ව ක්‍රියාත්මක වැදගත් සම්මුතීන් කිහිපයක් හඳුනාග ැනීමට හැකියාව තිබේ. ඒ අතර මිනිසා හා ජෛව ගෝලය පිළිබඳ ව වැඩසටහන (Man and Bioshere Programme) කැපීපෙනේ (එම





:10). මෙම සංකල්පය ද යුනෙස්කෝව මඟින් 1968 වර්ෂයේ සිට වර්ධනය කරන ලද්දකි. එහි දී ඍජු පාරිසරික රක්ෂිත ප්‍රදේශ මධ්‍යගත ලෙස ස්ථානගත කරයි (එම). එහි දී මානව මැදිහත් වීමේ ස්වභාවය හා ප්‍රමාණය අනුව ස්වභාවික ප්‍රදේශයට වෙනස් ප්‍රමාණයක ආරක්ෂාවක් ලබා දීමට බලාපොරොත්තු වෙයි. අතරමැදි හා සංක්‍රමණ කලාප (Buffer Zone and Transition areas) තුළ විවිධ සංස්කෘතික භූ දර්ශනයන් ආරක්ෂාවීම සිදු වේ. මෙම සම්මුතියට අමතර ව සංස්කෘතික භූ දර්ශනය සම්බන්ධ ව වැදගත් ජාත්‍යන්තර සම්මුතියක් ලෙස තෙත් බිම් පිළිබඳ ව සම්මුතිය (Convention of the Wetlands of International Importance Especially as water fowl Hahitat) ද හැඳින්විය හැකි ය (එම). මෙම ප්‍රඥප්තිය 1971 වසරේ දී ඉරානයේ රම්සර්වල දී (Ramsar) සම්මත වූ නිසා රම්සර් ප්‍රඥප්තිය ලෙස ද හඳුන්වනු ලැබේ. මේ මඟින් ජාත්‍යන්තර වැදගත්කමක් සහිත ස්වභාවික හා කෘත්‍රිම තෙත්බිම් ආරක්ෂා කිරීමට අවධානය යොමු කරනු ලබයි. බොහෝ විට මේවා ධීවර කර්මාන්තය හා සම්බන්ධ සංස්කෘතික භූ දර්ශනයට සම්බන්ධ වේ (එම).

සංස්කෘතික භූ දර්ශනය සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අමතර ව කලාපීය වශයෙන් එකඟත්වයක් ඇතිකර ගැනීම සඳහා සංස්කෘතික භූ දර්ශනය සම්බන්ධ ව යුරෝපීය නිර්දේශ සභාව (Concil of Europe Recommendation on Cultural Landscape Areas) බිහිවීම ද අතිශයින් වැදගත් වේ. මෙම නිර්දේශ සභාව මඟින් භූ දර්ශනයේ හොඳ ම කොටස තෝරාගැනීම නිසා වැදගත් සේ සළකන කොටසට පරිබාහිර ව ඇති කොටස තක්සේරුවක් වීම සිදු නොවේ. එසේ ම කාර්මික භූ දර්ශන (Indstrial Landscape) හා භූ දර්ශනයන් දිගු කාලීන වෙනස්වීම්වලට ලක් වී ඇති භූ දර්ශනය බැහැර කර තිබීම මඟින් පූර්ණ වශයෙන් අධ්‍යයන කිරීමේ හැකියාව අඩු කිරීමක් වී තිබේ. මෙහි මූලික කෙටුම්පත 1990 දශකයේ මුල භාගයේ එළි දැක් වූ අතර 1995 නිර්දේශ සහිත ව සම්මත වි තිබේ (Faircolugh and Rippon 2002:26). මේ නිසා සංස්කෘතික භූ දර්ශන (Cuttare Landscape site) හඳුනාග ැනීමට මෙයින් අවකාශ සැළසුණි. භූ දර්ශනය එසේ හඳුනාගත්ත

ද එය උසස් තලයකට පැමිණවීමට නොහැකි වූ බැවින් මෙම නිර්දේශයන්හි අවසන් පිටපත යුරෝපා සභාවට (Council of Europe 2000) ඉදිරිපත් කිරීම සමඟ සංස්කෘතික භූ දර්ශනය සම්බන්ධ සංකල්පයේ යම් වර්ධනයක් දැකගත හැකි විය. මෙම තත්ත්වය යුරෝපා භූ දර්ශන ප්‍රඥප්තිය (European Landscape Convention) තුළින් සම්පූර්ණත්වයට පත්වන අතර එ මඟින් යුරෝපා භූ දර්ශනය පිළිබඳ ව මූලධර්ම කිහිපයක් ස්ථාපිත කරනු ලැබීය (එම). ඒ ඔස්සේ පහත සඳහන් වන්නා වූ කාරණා පිළිබඳ ව අවධානය යොමු කිරීම සිදු කරනු ලැබීය.

i. යුරෝපයේ සමස්ත භූ දර්ශනය පොදු සංස්කෘතික සම්පතක් බව

ii. ප්‍රාදේශීය හා කලාපීය අනන්‍යතාවන් සඳහා මෙන් ම ආර්ථික සමාජීය නිරෝගීතාව උදෙසා භූ දර්ශනයේ විවිධතාව ආරක්ෂා කළ යුතු බව (එම:27)

මෙම කාරණාවලට අමතර ව ප්‍රඥප්තියේ දර්ශනය අනුව ප්‍රබල අන්තර් සම්බන්ධිත අදහස් දෙකක් කැපීපෙනේ.

i. සෑම පුරවැසියෙක් ම සංස්කෘතික උරුමයේ කොටස් ලෙස භූ දර්ශනය එදිනෙදා ජීවිතයට සම්බන්ධ කර ගනියි. එසේ ම එය ප්‍රයෝජනවත් වන්නේ ඇයි ? යන කාරණය හැඳිනගැනීම සහ එය යොදාගත යුතු ආකාරය තීරණය කිරීම.

ii. තේරුම් ගැනීමේ හා අගය කිරීමේ විවිධ ආකාරයන් කිහිපයක් ඇසුරින් බිහි වූ සංස්කෘතික නිර්මාණයක් ලෙස භූ දර්ශනය හැඳින්විය හැකි වෙයි. මෙම සියලු ම මාර්ග විද්‍යාත්මක විෂය මූලික හෝ ද්‍රව්‍යාත්මක නොවිය හැකි වෙයි. ඇතැම් ඒවා කේවල හා ආත්මගත වෙයි. එසේත් නැතහොත් පාර්ශවයන් ඇති ස්පර්ෂ කළ නොහැකි (Intangible) පාර්ශවයන් නියෝජනය කරයි (එම).





ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රඥප්තිය තුළින් සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව පුළුල් විග්‍රහයක් හා විවිධ මට්ටම්වල කොටස් භූ දර්ශනය සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු ආකාරය නිර්වචනය කිරීමක් ද වේ (එම).

සංස්කෘතික භූ දර්ශන සංකල්පය වර්ධනය සඳහා පදනම සැකසෙනුයේ දැනට සියවස් දෙකකට පමණ පෙර සිට ය. ඇලෙක්සැන්ඩර් වොන් හම්බෝල්ට් (Alexander Von Humbolt 1796-1859) විසින් භූ දර්ශනය යන්න විස්තර කර ඇත්තේ කිසියම් කලාපයක මිනිසුන් දක්න ආකාරයට සියලු දෘෂ්ටීන්ගේ සමස්තයක් ලෙස ය (Wagner and Mikesell 1962:9-13). මෙම නිර්වචනය මඟින් මානව දෘෂ්ටිය පොළඹවනු ලබන ස්වභාවික, සංස්කෘතික, භූගෝලීය භූ විද්‍යාත්මක, ජෛවීය, කලාත්මක ඕනෑ ම ආකාරයක ප්‍රපංචයක් ලෙස හඳුනාගත හැකි වේ. නමුත් සංස්කෘතික භූ දර්ශනය මානවයා හෝ මානව වර්ගයා විසින් වෙන් කරන ලද හෝ නිර්මාණය කරන ලද ප්‍රපංචයක් ලෙස සළකයි. එසේ ම එ මඟින් මානව වර්ගයා හා පරිසරය අතර ඇතිවන්නා වූ සහසම්බන්ධතාවය මත පරිසරය භූ දර්ශනයන් බවට පරිවර්තනය වන අතර ඒ අනුව යම් ප්‍රදේශයක මූර්තිමත් භූගෝලීය අංගයන් හි නියම ඒකරාශී වීමක් නැතහොත් පෘථිවියේ වෙනයම් අතුරු බෙදීමක් ලෙස භූ දර්ශනය හඳුනාගත හැකිවෙයි (එම : 09). සංස්කෘතික භූ දර්ශනය මඟින් කිසියම් නිශ්චිත කරන ලද ප්‍රදේශයක භූගෝලීය අන්තර්ගතය විශද කරයි. නමුත් මෙහි දී සංස්කෘතීන් ජන කොටසක් ලෙස මිනිසා විසින් ක්‍රියාත්මක කිරීමට හා වෙනස් කිරීමට යෙදුණු කිසියම් භූගෝලීය සංකීර්ණ නිරූපිත බව පැහැදිලි කරයි (එම : 10).

සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ සංකල්පය පළමුවරට හඳුන්වා දෙනු ලැබුවේ 1925 වසරේ දී කාල් ඕ සවර් (Karle O Sawer) විසිනි. එය ඇමෙරිකානු භූගෝල විද්‍යාවට හඳුන්වා දීමෙන් අනතුරු ව මේ වන විට මෙම අධ්‍යයන ක්ෂේත්‍රය සමකාලීන හා වෙන් කළ නොහැකි ලෙස විවිධ පැතිවලට යොමු ව ඇත (එම). වර්තමානය වන විට මෙම සංකල්පය ඔස්සේ ප්‍රාදේශීය වර්ගීකරණයන් පිළිබඳ ව ක්‍රමානුකූල විස්තරයක් සැලසීමේ

කාර්යයට අමතර ව භූගෝලීය විපරිණාමයන් සම්බන්ධ මානව වර්ගයාගේ භූමිකාව පිළිබඳ ව කිසියම් දෘෂ්ටියක් සැපයීම ද සිදු කරන බැවින් සංස්කෘතික හා ජන කොටස්වල සුවිශේෂී තත්ත්වයන් හඳුනාගැනීමක් ද සිදු කරනු ලැබේ (එම).

මේ ආකාරයට ස්වභාවික බලපෑම් කෙරෙහි ආරූඪ කර දක්වන භූ දර්ශනයේ විවිධ අංග සමඟ මානවයා නිදහස් ලෙස අන්තර් සබඳතා දැක්වීම මෙහි දී විශේෂ අවධානයට ලක්වීම නිසා විෂයයේ මූලිකත්වය නියත වශයෙන් ම පාරිසරික නියතිවාදය පහත හෙළීමක් සිදු කළ බව ප්‍රකට ව පෙනෙනන්නට විය. ඒ අනුව විශේෂිත වූ ස්වභාවික තත්ත්වයන් ගොනුවක් සමඟ යම් සංස්කෘතික රුචිකත්ව හා ශක්‍යතාවයන් මූර්තිමත් කරන මානව ජන සමාජය සංකීර්ණ ක්‍රියාකාරිත්වයක් පැවැත්වීම තුළින් බිහිවන නිර්මාණයන් ලෙස සංස්කෘතික භූ දර්ශනය හැඳින්විය හැකි ය (එම). ඒ අනුව සංස්කෘතික භූ දර්ශනය ස්වභාවික පරිණාමයේ අවධි කිහිපයක් හා මානව ක්‍රියාකාරිත්වයේ පරම්පරා කිහිපයක් නිරූපණය කරන උරුමයක් ලෙස සැලකීම සාධාරණ වේ (එම :11).

මිනිසා හා සංස්කෘතියේ බලපෑම් යටතේ වුව ද ඇතැම් භූ දර්ශනයන් ස්වභාවික බලපෑම් මත වර්ධනය වන අංගයන්ට ආසන්න වශයෙන් සමාන දළ වින්‍යාසයක් දක්වයි. නමුත් මෙම ප්‍රධාන භෞතික වින්‍යාසයන් අතර මානව බලපෑම් පැහැදිලි ව විශද කරයි. ඒ අතරින් කෘෂිකර්මාන්තය ප්‍රබල මාධ්‍යයන් වේ. මෙයට අමතර ව ජීවන රටාව ඔස්සේ ස්වභාවික සැකැස්ම සමඟ අන්තර් සබඳතාව වර්ධනය කර ගැනීමට ඕනෑම සංස්කෘතියක භූ දර්ශනයක පෙළ ගැස්ම රටාව සහ අමුද්‍රව්‍ය මඟින් පෙළඹවීමක් ඇති කරයි (අබේවර්ධන 2007:147). මේවා අතර ඉංජිනේරු කාර්යයන්, වාස්තුවිද්‍යාත්මක අංග, කෘෂිකර්මය, ගෘහාශ්‍රිත සතුන්, විවිධ උපකරණ, යානවාහන, චාරිත්‍රවිධි ප්‍රයෝජනවත් වේ (wagner : Milkesell 1962 :11). භූ දර්ශනය කිසිවිටෙක ස්ථිතික තත්ත්වයේ නොපවතින අතර එය නිරන්තරයෙන් වෙනස් වෙයි. එ බැවින් භූ දර්ශනය යනු ජීවයෙන් තොර වස්තුවක් නෙවන අතර සක්‍රීය ලෙස වේගවත් වෙනස් වීමක් පෙන්වන ක්‍රියාවලියකි (Changing





dynamic process). මානව හා ස්වභාවික ක්‍රියා හේතුවෙන් නිර්මාණය හා විනාශවීම එහි ආවේනික ලක්ෂණයන් ය (Made and Unmade).

මෙම නිසා භූ දර්ශනය ත්‍රිමාණ රූපී ව හඳුනාගැනීමට ප්‍රමාණවත් නොවෙයි. ඒ තුළ චතුර්මානයක් ද ඇත. එහි සිව් වැනි මානය කාලය වශයෙන් හැඳින්විය හැකි ය. විශේෂයෙන් ම භූ දර්ශනය කාලය හරහා වෙනස් වේ (Rippon 2002:27). ඇතැම්විට භූ දර්ශනයේ ගතිකත්වය ඉතා සුළු වන අතර භූ විද්‍යාත්මක බලපෑම කාලය එය වෙනස් කිරීමට බලපානු ලබයි. එ වැනි විටෙක භූ විද්‍යාත්මක කාලය හරහා එය අධ්‍යයනය කිරීම අතිශයින් ම වැදගත් වේ (එම). මෙ වැනි අවස්ථාවන්හිදී භූ දර්ශනයේ ගතිකත්වය ඉතා සුළුවන අතර භූ විද්‍යාත්මක කාලරාමු යටතේ පමණක් හඳුනාගැනීමට හැකියාව ලැබේ (එම). නමුත් එය මානව ක්‍රියාවන් හා වෙනස් කිරීම මත සිදු කරනු ලබන්නක් වෙයි. මෙය කැපීපෙනෙන ලෙස හඳුනාගැනීමේ දී නියොලිතික විප්ලවය (Neolithic Revolution) ඇරඹුණු කාලයට සාපේක්ෂ ව වර්තමානය වන විට බොහෝ වෙනස්කම්වලට භූ දර්ශනය ලක්වීමට මානව ක්‍රියා බලපා ඇති ආකාරය පෙන්වාදිය හැකි ය.

මානවයා සිය භූ දර්ශනය සිතා මතා ම හෝ නොදැනුවත් ව ම වෙනස් කිරීම සිදු කරනු ලබයි. එ බැවින් මානවයා භූ දර්ශනයට සළකන ආකාරය පිළිබඳ සැලකීමේ දී මිනිස් චින්තනය ඒ සඳහා ඇති කරන බලපෑම පැහැදිලි වෙයි. භූ දර්ශනය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී **සංස්කෘතික භූ දර්ශනය යනු සම්පූර්ණ වශයෙන් ම මානව සංකල්පයක් ලෙස හැඳිනගත යුතු ය.** මෙය සරල ව විග්‍රහ කළහොත් පරිසරය තුළ ජීවත්වන වෙනත් සත්ත්වයන් පරිසරයට ප්‍රතිචාර දැක්වුව ද ඔවුන්ට භූ දර්ශනය පිළිබඳ ව සංකල්පයකට අවතීර්ණ වීමට නොහැකි ය. එම නිසා සංස්කෘතික භූ දර්ශනය පිරිසිදු ලෙස මානව සංකල්පයක් වන අතර භූ දර්ශනය පිළිබඳ වෘත්තීය ක්‍රියාකාරකම් මිනිස් චින්තනයේ පදනම් අංගයක් ලෙස සැලකිය යුතු ය (Fairclough and Rippon 2002:27). මේ අනුව භූ දර්ශනය තේරුම් ගැනීමට එහි ප්‍රභවය හඳුනාගැනීම පමණක් නොව අනාගත සංවර්ධනය සැලසුම්

කිරීමට ද වෙනස්කම් ක්‍රියාවලි කළමනාකරණයට මානසික භූ දර්ශනය (Mental Landscape) දිගින් දිගට නඩත්තු කිරීම අතිශයන් ම වැදගත් වේ (එම).

යුරෝපා භූ දර්ශන ප්‍රඥප්තිය අනුව මිනිසා විසින් දර්ශනය කරන මානව සහ ස්වභාවික සාධක අතර ක්‍රියාකාරිත්වයන් සහ අන්තර් ක්‍රියාකාරිත්වයන් මත ස්වභාවය තීරණය වන යම් ප්‍රදේශයක් සංස්කෘතික භූ දර්ශනය ලෙස විස්තර කරයි (එම). මෙම නිර්වචනය මඟින් පෙන්වා දෙනුයේ භූ දර්ශනය නිර්මාණයේ දී අතීත මානව සාධක හා පුද්ගල ඓතිහාසික, සමාජ හා ආර්ථික ක්‍රියාවලින්හි කාර්යභාරය වැදගත් වන බව ය. මෙමඟින් ග්‍රාමීය හා ස්වභාවික ප්‍රදේශවල පමණක් නොව නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ප්‍රකට ව පෙනෙන මානව ක්‍රියාකාරකම් මත ඇති වූ වෙනස්කම් සහිත ප්‍රදේශවලට ද මෙම සංකල්පය අදාළ වේ. එසේ ම මෙම ප්‍රඥප්තියට අනුව භූ දර්ශනය වෙත ස්වභාවිකව හෝ කලාත්මක දෘෂ්ටිකෝණයකින් පමණක් බැලීම පටු දෘෂ්ටියක් බව අවධාරණය කරන අතර මේ සඳහා භූමිය පමණක් නොව ජලය ද අයත් වීම වැදගත් බව පෙන්වා දී ඇත (එම). මෙම ප්‍රඥප්තියේ අනෙක් වැදගත්කම නම් භූ දර්ශනය තුළ අන්තර්ගත පුරාවිද්‍යාත්මක අගය පිළිබඳ අවධානය යොමු කර තිබීම ය. ඉහතින් විස්තර කරන ලද කරුණු සියල්ල සංෂිප්ත ව විග්‍රහයකට ලක් කළ විට සංස්කෘතික භූ දර්ශනය යන්න නිර්වචනය කළ හැක්කේ ස්වභාවික පරිසරය සමඟ මානව ක්‍රියාකාරකම්වල සහ සම්බන්ධතාවය වශයෙනි. විශේෂයෙන් ම සංස්කෘතික භූ දර්ශනය සඳහා මිනිස් චින්තනය හා විශ්වාසයන් පදනම සකසන බව ද මේ අනුව පෙන්වාදිය හැකි ය.





## 2.2 සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයන්හි ආරම්භය

සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයන්හි ආරම්භය පිළිබඳ විමසීමක් කළහොත් පැහැදැලි වන්නේ ජෛව විවධත්වය (Bio diveßity) එ නම් ස්වභාවික හා සංස්කෘතික සම්පත මත එය ගොඩනැගෙන බව ය. නමුත් මෙයින් සංස්කෘතිකමය හා පුරාවිද්‍යාත්මක යොමු වීමක් පිළිබඳ පැහැදිලි වන්නේ නැත (එම:29). ඒ නිසා භූ දර්ශනය වෙත කාලමානය එක් කිරීම සමඟ සංස්කෘතික භූ දර්ශනය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට හැකි ය.

භූ දර්ශනය පිළිබඳ විෂය ක්ෂේත්‍රය යුරෝපයේ හැදී වර්ධනය වූයේ පරිසර ආරක්ෂකයින් (Natural Conservationists), භූගෝල විද්‍යාඥයින් (Geographers) හා භූ දර්ශන වාස්තුවිද්‍යාඥයින් (Landscape Architects) තුළ ය. මොවුන් විසින් භූ දර්ශනයේ අන්තර්ගත ස්වභාවික තත්ත්වයන් වෙත පමණක් අවධානය යොමු කරන ලදි (එම). ඒ සඳහා හොඳ ම උදාහරණය වශයෙන් 1995 දී සොෆියා (Sofia) හිදී සම්මත කරගනු ලැබූ ලේඛනය වන (Council of European Biological and Landscapes Divrsity Strategy) පෙන්වාදිය හැකි ය (එම). එසේ ම ලෝක සංරක්ෂණ සංගමය (World Conservation Union) මඟින් සුවිශේෂ වනජීවී කලාප හා ආරක්ෂිත කලාප හඳුනාගැනීමේ දී ස්වභාවික පරිසර පද්ධති (Natural Ecosystems) ආරක්ෂා කිරීම සම්බන්ධ කටයුතු ද සිදු කිරීම පෙන්වාදිය හැකි ය (IUCN:1994). නමුත් ස්වභාවික සම්පත් හා ජෛව විවිධත්වය හා අනුද්ධ සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳව ද ඔවුන්ගේ නිර්වචනවල සඳහන් වෙයි. මේ අනුව මෙම නිර්වචනය මඟින් භූ දර්ශනය තුළ සංස්කෘතික සාධකයට හිමි වූ ස්ථානය පැහැදිලි වෙයි (එම:29). නමුත් කිසිදු නිර්වචනයක හෝ වර්ගීකරණයක සංස්කෘතිකමය හෝ පුරාවිද්‍යාත්මක යොමු වීමක් පිළිබඳ ව පැහැදිලි ව සඳහන් නොකරයි (එම). මෙම තත්ත්වයන් තුළ භූ දර්ශනයේ ක්‍රියාවලිය හඳුනාගැනීමට උත්සාහ දරා නැත. එසේ ම භූ දර්ශනය වෙත

කාලමානය ද සහිත ව චතුර්මානික යොමුවීමක් මුල් කාලීන ව හඳුනාගැනීම ද සිදු වී නොමැත. නමුත් පසුගිය දශක කිහිපය තුළ පරිසර විද්‍යාත්මක අංග භූ දර්ශනය පිළිබඳ ව සැලසුම් කරණය වුව ද සංස්කෘතික අංග අඩු තක්සේරුවක හසුරුවා තිබේ. මෙහි දී වැදගත් කාරණය වන්නේ භූ දර්ශනය වෙනස්වන සුළු ක්‍රියාවලියක් නම් එය කළමනාකරණය කිරීමේ දී සිදු වී ඇති ක්‍රියාවලිය හඳුනාගැනීමේ වැදගත්කම ද විමසා බැලිය යුතු ය (එම). වර්තමානයේ විවිධ ප්‍රවනතා මත භූ දර්ශනය ඒකාබද්ධ බවට පත්වීමේ නැඹුරුතාවයක් ඇත. ඒ අනුව විවිධ භූ දර්ශන තුළ අන්තර්ගත සුවිශේෂ ලක්ෂණයන් සහ අනන්‍යතාවයන් අහිමි වීමේ අවධානමක් ඇත. මෙසේ අදාළ භූමි ප්‍රදේශයේ වසන ජනතාව සහ ඉන් පිටත ජනතාව භූ දර්ශනය වෙත තිබූ සියලු ආකර්ෂණයන් අහිමි ව විනාශකර දමන තත්ත්වයක් හඳුනාගත හැකි වෙයි (එම). ආර්ථිකම ය හා සමාජ ගැටලු මේ ක්‍රියාවලියේ නියත ප්‍රතිඵල වේ.

විවිධත්වයෙන් පරිපූර්ණ භූ දර්ශනයක් සතු ව විශාල සමාජ ආර්ථික අගයන් තිබේ. එය සංචාරකයින් ඇද ගැනීමේ ප්‍රබල මාධ්‍යයකි. භූ දර්ශනය සංස්කෘතික හා ස්වභාවික විවිධත්වය මත සුවිශේෂ ආකර්ෂණීය බවට පත් කිරීමේ හැකියාව ඇත (එම). එම නිසා භූ දර්ශනය නිවැරදි ලෙස කළමනාකරණය කළ යුතු අතර එහි නිවැරදි අනන්‍යතාව රැකීම ද ඉතා වැදගත් කොට සැළකිය හැකි ය. ඒ නිසා භූ දර්ශනය කළමනාකරණය සඳහා ඉංජිනේරුවන්, වාස්තුවිද්‍යාඥයින්, පුරාවිද්‍යාඥයින්, ඉතිහාසඥයින්, පරිසරවේදීන් යන කොටස්වල සහභාගිත්වය අතිශයින් ම වැදගත් වේ.






## 2.3 සංස්කෘතික භූ දර්ශනය හා පුරාවිද්‍යාව

භූ දර්ශනය යන්න පුරාවිද්‍යාත්මක භාවිතය තුළ ඉතා දිගු ඉතිහාසයක් සහිත සංකීර්ණ ප්‍රපංචයක් වේ. මෙය සංකීර්ණ පුරාවස්තුවක් සමඟ බැඳුණු දිගු ඉතිහාසයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. පුරාවිද්‍යාඥයා සාමාන්‍යයෙන් භූ දර්ශනය පිළිබඳ ව මානයෙන් යුතු ව සිය අධ්‍යයන හා පර්යේෂණ දියත් කරයි. ඔහුගේ උනන්දුව අතීත භූ දර්ශනය පාරිසරික නියතිවාදී සංකල්පයකින් තොර ව ගොඩනැගීම වේ. ඒ සඳහා භෞතික සංස්කෘතිය සමඟ සනදර්භගත වීමට පුරාවිද්‍යාඥයා උනන්දු වේ. ඒ ඔස්සේ පුරාවිද්‍යාඥයා විසින් සංස්කෘතික භූ දර්ශනය යන සංකල්පය තුළින් සියලු දෙනා වර්තමාන භූ දර්ශනය පිළිබඳ සිතීම සඳහා පොළඹවනු ලබයි.

සංස්කෘතික භූ දර්ශනය පුරාවිද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කිරීමට විවිධ තත්ත්වයන් හා අනුබද්ධවීමට පුරාවිද්‍යාඥයාට සිදු වේ. විශේෂයෙන් පුරාවිද්‍යාව අන්තර් විෂයමය (Inter-disciplinary) සහ බහුවිෂයාත්මක (Multi disciplinary) සම්බන්ධතාවයක් සහිත විෂයක් බැවින් පරිසරය හා මිනිසා අතර අන්‍යෝන්‍යතාවය පිළිබඳ ව කතා කිරීමට වැඩි ප්‍රවනතාවයක් දක්වයි. පුරාවිද්‍යාඥයා භූ දර්ශනය පමණක් නොව විවිධ තත්ත්වයන් තේරුම් ගැනීමේ දී පරිසරයේ විවිධ පාර්ශව අතර අන්තර් ක්‍රියාකාරිත්වය පහසුවෙන් හඳුනාගනී. ඒ අතර ප්‍රධාන වශයෙන් සම්පත් පරිහරණය, තාක්ෂණය, ජීවනෝපාය ක්‍රමය, හා ජනාවාස රටාව ප්‍රමුඛ වන අතර ඒවා ප්‍රධාන වශයෙන් දේශපාලන, සමාජ, ආර්ථික හා ආගමික ආයතන ඔස්සේ ගොඩනැගෙන ආකාරය පිළිබඳ අවබෝධය පුරාවිද්‍යාඥයා සතු ව තිබේ. එ බැවින් සංස්කෘතික භූ දර්ශන න්‍යාය හා දෘෂ්ටීන් තම ක්‍රියාවලිය සඳහා උකහා ගැනීමට පුරාවිද්‍යාඥයාට පළපුරුද්දක් තිබේ. ඒ නිසා පුරාවිද්‍යාඥයාට මිනිසා හා පරිසරය අතර සබැඳියාව මනාව තේරුම් ගත හැකි අතර එය වෘත්තීයවේදී තත්ත්වය මත ඇති ව තිබෙන්නක් බව පෙන්වාදිය හැකි ය.




රූප සටහන් අංක 2.1
පූර්ණ පාරිසරික ව්‍යුහය (Total Eco System)
(Seneviratne 1996:276)

එසේ පුරාවිද්‍යාඥයා ලබා ඇති පළපුරුද්ද අනුව භූ දර්ශනය හා සම්බන්ධ වැදගත්

අංශ කිහිපයක් කෙරෙහි ඔහුගේ මැදිහත් වීම කැපීපෙනේ.

i. කැපීපෙනෙන ලෙස දීර්ඝ කාලයක් තිස්සේ කාලය හරහා වන වෙනස්වීම් හඳුනාගැනීම (IUCN 1994:27-28).

ii. භූ දර්ශනය සම්බන්ධ මානව සාධකයේ භූමිකාව හඳුනාගැනීම (එම).

iii. අවකාශීය රටාවන් සහ සම්බන්ධතාවය හඳුනාගැනීම (එම).





මෙම තත්ත්වයන් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී භූ දර්ශනය යන සංකල්පයට පුරාවිද්‍යාඥයාගේ අධ්‍යයන ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය හිමිවන බව පැහැදිලි වේ. වර්තමානය වන විට සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව ප්‍රවනතාවය පුරාවිද්‍යාත්මක අගයන් (Archeology values) සමඟ සංරක්ෂණය කිරීමේ නැඹුරුතාවයක් පවතියි. දෘෂ්‍යමාන වන පුරාවිද්‍යාත්මක අවශේෂයන් පමණක් වර්තමාන භූ දර්ශනයේ කොටස් නොවන අතර පෙළොව අභ්‍යන්තර තැන්පතු, සමුද්‍රගත තැන්පතු හෝ අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත තැන්පතු පවා භූ දර්ශනයේ කොටස් ලෙස අවධානයට යොමු කරයි. මෙම සංකල්පමය පසුබිම යටතේ පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමට මනා පිටුබලයක් ලැබේ (අබේවර්ධන 2007:152). ඒ අනුව භූ දර්ශනය සමඟ බහුවිෂයීමය පදනමකින් යොමුවීමේ වැදගත්කම මඟින් අවධාරණය කරන්නේ වර්තමාන භූ දර්ශනය තුළ ආරක්ෂා වී පවතින පසුගිය වසර දහස් ගණනකට අයත් ද්‍රව්‍යමය සංස්කෘතික සාධක හඳුනාගැනීමේ වැදගත්කම ය (එම). එම නිසා ස්වභාවික පරිමාණයන් මත පමණක් එල්බ නොගෙන භූ දර්ශනය පිළිබඳ සංස්කෘතික මානයකින් විමසා බැලීම ද වැදගත් වේ. මෙහි දී පුරාවිද්‍යාඥයාගේ තාර්කික දෘෂ්ටියට නතුවන කරුණු වන්නේ වර්තමාන භූ දර්ශනයේ අන්තර්ගත අතීත තත්ත්වයන් ආරක්ෂා කරන්නේ කෙසේ ද? එය අනාගත පරපුර වෙත දායාද කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳවයි. එහි දී භූ දර්ශනය පිළිබඳ ව තීරණ ගැනීමේ දී **පුරාවිද්‍යා උරුම කළමනාකරණය** පිළිබඳ ව අවබෝධයකින් පුරාවිද්‍යාඥයා කටයුතු කිරීම ද අතිශය වැදගත් වෙයි.

භූ දර්ශනයන් ආරක්ෂා කිරීම තුළින් ඒ තුළ අන්තර්ගත පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා වීම නිරායාසයෙන් සිදු වෙයි. එයට හේතුව පරිසරයේ අන්තර්ගත උරුමයේ සියලු අගයන් ආරක්ෂා වීමට එයින් ඉඩ සැලසෙන බැවිනි. විශේෂයෙන් භූ කලාපයක් තුළ විවිධ කාල පරාස තුළ ක්‍රියාත්මක වූ සංස්කෘතීන්ගේ සන්දර්භගත වීම එම සංස්කෘතීන් යථෝක්ත භූ කලාපවල සන්දර්භගත වීමට බලපෑ පාරිසරික සාධක පිළිබඳ අධ්‍යයනයට මනා පිටුවහලක්

ලැබේ. සංස්කෘතික භූ දර්ශනය තුළ අන්තර්ගත පුරාවිද්‍යාත්මක විශේෂිතාවයන් හඳුනාගැනීම කාල මානය තුළ ක්‍රියාත්මක වූ සහ ක්‍රියාත්මක වන දීර්ඝ කාලීන වෙනස්වීම් සොයා ගැනීම සහ විස්තර කිරීම පුරාවිද්‍යාත්මක කාර්යයකි (*IUCN* 1994:28).

දීර්ඝ කාලීන වෘත්තාන්ත හා පැහැදිලි කිරීම් හරහා පුරාවිද්‍යාඥයා වර්තමාන භූ දර්ශනය අවබෝධ කර ගනියි. භූ දර්ශනයේ තිරසාර ආරක්ෂණය කළමනාකරණය හා සැලසුම්කරණය සඳහා එ වැනි කාල මානය මත පදනම් වූ අවබෝධයක් වැදගත් වෙයි (අබේවර්ධන 2007:153). ඒ සඳහා පුරාවිද්‍යාඥයාගේ මැදිහත්වීම තීරණාත්මක සාධකයක් වෙයි (එම). එසේ ම යටගිය සංස්කෘතික භූ දර්ශනය යථාර්ථවාදී ලෙස තේරුම් ගත හැකි එක ම වෘත්තිකයින් පුරාවිද්‍යාඥයින් විය හැකි ය (එම). විශේෂයෙන් ම පුරාවිද්‍යාඥයා විසින් මෙම ක්ෂේත්‍ර සම්බන්ධ ව දිගු කාලීන ව අවබෝධය ලබා ගෙන ඇති බැවින් සහ මානවවංශ විද්‍යා අධ්‍යයන ඔස්සේ ඔහු ලබා ඇති පරිචය නිසා පුරාවිද්‍යාඥයාට මෙය ඉතා ලෙහෙසියෙන් ග්‍රහණය කරගත හැකි වේ.

**සංස්කෘතික භූ දර්ශනය යනු පරිසරය නොවේ. එය චිත්ත රූප මවා ගැනීමෙන් හෝ විස්තර කිරීමෙන් පමණක් පවතියි. කිසියම් ක්ෂේත්‍රයකට, තැන්පතුවකට හෝ වෙනත් ඕනෑම නිර්මිත අංගයකට වටිනාකම්, සුවිශේෂිතාවන් සහ අර්ථයන් එක්වීමෙන් එය සිදු වෙයි** (*IUCN* 1994:29). මෙම ප්‍රකාශනය අනුව භූ දර්ශනය වෙත පුරාවිද්‍යාත්මක යොමුවීමක අවශ්‍යතාවය පැහැදිලි වෙයි. ඊට හේතුව ආකෘති නිර්මාණය සහ වෘත්තාන්ත නිර්මාණ සමඟ පුරාවිද්‍යාඥයා යම් හුරු බවක් දැක්වීමයි. භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් අතීතය අර්ථකථනය කිරීමේ දී දිගුකාලීන අත්දැකීම් හා භූ දර්ශනය තුළ වන පුරාවිද්‍යාත්මක උරුමය නිවැරදි ලෙස තිරසාර සංවර්ධනය සහ සැලසුම්කරණය සමඟ අත්වැල් බැඳ ගැනීම ඒ මඟින් සිදු වේ. භූ දර්ශනයේ ගතික ස්වභාවය හඳුනාගැනීම තුළින් මානව වෙනස් කිරීම්වල පැරණි ස්වරූපයන් අධ්‍යයනය කිරීමට ද හැකියාව ලැබේ.සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව සිතීමේ දී වඩාත් තර්කානුකූල ව එය සිදු කිරීමෙන් මූලාශ්‍රය තොරතුරුවල අන්තර්ගත ඉතිහාසයට වඩා පැරණි





ඉතිහාසයක් භූ දර්ශනය තුළ අන්තර්ගත වන බව සොයාගත හැකි ය.

භූ දර්ශනය ඇතැම් විට ස්වභාවික ලෙස හඳුනාගත හැකි ය. නමුත් සෑම තැන ම පාහේ එය සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මිනිසා විසින් විපර්යාස කර ඇත. ජෛව විවිධත්වය පවා ස්වභාවික මෙන් ම සංස්කෘතික සංසිද්ධියක් ලෙස සැළකිය හැකි වෙයි. ඊට හේතුව විවිධත්වය තීරණය වීමේ දී මිනිසාගේ මැදිහත්වීම කේන්ද්‍රීය සාධකයක් වීමයි. භූ දර්ශනයේ වන මෙම සම්පූර්ණ සංස්කෘතිය තවමත් දැකීමට හෝ අගය කිරීමට හැකිවන අතර එය භෞතික සංස්කෘතිය තුළ විවිධ ආකාරයෙන් ආරක්ෂා වී පවතී. එය උරුමයක් හෝ මානව පාරිසරික වෙනස්කම් ලෙස විය හැකි වෙයි. මෙම තත්ත්වයන් මහජනයාට ඒත්තු ගැන්වීමට උත්සාහ කිරීම පුරාවිද්‍යාඥයා සතු වගකීමකි (අබේවර්ධන 2007:154).

සංස්කෘතික භූ දර්ශනය තුළ වන ප්‍රධාන ගුණාංග සහ සුවිශේෂතාවයන් මෙන් ම වෙනස්කම් පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. භූ දර්ශනය නිර්මාණය වීමේ දී භූ විද්‍යාත්මක හෝ දේශගුණික සාධකයන්ට වඩා මානව මැදිහත්වීම් ප්‍රබල වූ බව පෙනේ. භූ විද්‍යාව සහ දේශගුණය මඟින් පරිසරය නිශ්චය කරයි. නමුත් ඒ මඟින් භූ දර්ශනය නිශ්චය නොකරයි. විශේෂයෙන් ම මේ සඳහා බලපානුයේ සමාජ සහ සංස්කෘතික නිර්මාණයන් භූ දර්ශනයේ සංකල්පමය හා දෘෂ්ටිමය රාමුවක් මත පමණක් ගොඩනැගෙන්නක් වීමයි. භූ දර්ශනය සංස්කෘතිකමය (පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික) සහ ස්වභාවික (පරිසර විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක) යොමුවීම් සමඟ මුසු වී පවතී. භූ දර්ශනය සම්බන්ධ ව පරිසර විද්‍යා ශික්ෂණයක් දැකිය හැකි ය. නමුත් අතීත මානවයාගෙන් එයට ලැබුණු දායකත්වය මත මානව සංස්කෘතික නිර්මාණ උපත ලබා ඇත. ක්ෂේත්‍ර පදනම් වූ පුරාවිද්‍යාත්මක කර්තව්‍යයන් බොහෝ විට සම්පූර්ණයෙන් ම පාහේ සංස්කෘතිය වෙත නාභිගත කිරීමට පොළඹවයි.

සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ සංකල්පයෙන් ස්වභාවික හා මානව සාධක කැටි ව ගෙන මිනිසා ඇසුරු කරන පරිසරය

අතර අන්තර්ගත සබඳතාවය වර්ධනය කරයි. මීට අමතර ව විවිධ අංග අතර ජීවී කොටස් හා භූ ගත තැන්පතු හෝ පුරාකෘති ආදි දේ අයත් වේ. පොළොව අභ්‍යන්තරයේ තැන්පත් වූ සහ මතුපිට පුරාවිද්‍යාත්මක අවශේෂ පවා වර්තමාන භූ දර්ශනයට ඓතිහාසික මානයක් ලබා දෙන අතර එහි තත්ත්වයන් හඳුනාගැනීමට දායක වෙයි. ඒ අනුව සංස්කෘතික භූ දර්ශනය පුරාවිද්‍යාත්මක ව හඳුනාගැනීම තුළ ඒ සඳහා යොමු විය යුතු අංග පහත දැක්වේ.

i. යම් ප්‍රදේශයක ඉතිහාසය අවබෝධ කර ගැනීම
ii. එහි පුරාවිද්‍යාවේ ප්‍රමාණය අගය කිරීම
iii. එහි පවත්නා අංග වර්ග හඳුනාගැනීම
iv. එම අංගයන්හි තිරස් හා සිරස් ව්‍යාප්තිය හඳුනාගැනීම
v. සන්දර්භගත වීම හඳුනාගැනීම

මෙහි දී ස්වභාවික ගති ලක්ෂණ හඳුනාගැනීමේ කටයුතුවල දී විවිධ භූ දර්ශන වර්ග සහ ඒවායේ ව්‍යාප්තිය හඳුනාගැනීම හා එහි පරිණාමීය ක්‍රියාවලිය හඳුනාගැනීම් ද වැදගත් වේ. මෙම තත්ත්වයන්ට අනුව පැහැදිලි වන්නේ සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව සංකල්පය පුරාවිද්‍යාත්මක ව උපයෝගී කර ගැනීම තුළින් මානවයා වටා වන පූර්ණ පරිසරය පිළිබඳ ව ඉතා පුළුල් ආකාරයෙන් සාකච්ඡා කිරීමට පසුබිම සැලසෙන බවයි. ඒ අනුව සංස්කෘතික භූ දර්ශන සංකල්පය සඳහා ලොව මේ වන විට නෛතික පසුබිමක් නිර්මාණය වී තිබෙන අතර එය පුරාවිද්‍යා කටයුතුවලට උපයෝගී කර ගැනීමේ දී අන්තර් විෂයමය හා බහු විෂයමය තත්ත්වයන් යටතේ අධ්‍යයනය කිරීම වැදගත් බව ඉතා පැහැදිලි වේ. එ මඟින් පාරිසරික නියතිවාදයකට ගමන් කරනවා වෙනුවට මනුෂ්‍යයා විසින් භූ දර්ශනය සකස් කරමින් ඒ සඳහා ඔවුන්ගේ සන්දර්භගත වීම සිදු වූ ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට අවකාශ සලසා ගත හැකි ය.

සංස්කෘතික භූ දර්ශනය හඳුනාගැනීමේ දී පුරාවිද්‍යාඥයාට නැගෙන ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ පොළොව යට වැළලී ඇති භෞතික සංස්කෘතික තොරතුරු ස්වභාවික පරිසරය හා බද්ධ





කොට මානව ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳවයි (Mclntosh 1999:37). විශේෂයෙන් ම ස්වභාවික බලපෑම් ඔස්සේ විපරිණාමයට පත්වන මානවයා පරිහරණය කරනු ලැබූ ද්‍රව්‍යයන් එම ස්වභාවික හා සංස්කෘතික තොරතුරු සමග ම තැන්පතු ලෙස නිර්මාණය වේ. උදාහරණ වශයෙන් ඉතාලියේ විසූවියස් ගිනි කන්ද මඟින් විනාශ වූ පොම්පෙ නගරය එහි අළු හා ලාවාවලින් යටවීම පෙන්වාදිය හැකි ය. එසේ ම භූ කම්පන මඟින් යම් යම් ජනාවාස සුන්බුන් බවට පත් කිරීම සුළඟ මඟින් ජනාවාස වැලිවලින් වසා දැමීම මුහුදු හෝ ගංවතුර ගැලීමෙන් ජනාවාස විනාශ විම පෙන්වාදිය හැකි ය (එම). මෙම තත්ත්වයන් අවබෝධ කර ගැනීමට පාරිසරික පුරාවිද්‍යාව (Enviornmental Archaelogy) බිහිවීම තුළින් මිනිසා සත්ත්වයා ස්වභාවික ලෝකය හා බැඳී පැවැති ආකාරය හඳුනාගැනීමට හැකි වී ඇත (Renfrew and Bahn 1991:195). ඒ ඔස්සේ මිනිසාගේ ජීවිතයේ හැඩ ගැසීම, දේශගුණික විපර්යාස, ශාකායනය සතුන්ගේ ජීවිතයේ නිශ්චයන් හඳුනාගැනීමට පහසු කාර්යයක් වී තිබේ (එම). එසේ ම ස්වභාවික පරිසරය මත තිබූ වස්තූන් ඔස්සේ ඒවා එම පරිසරයේ සිදු වූ සංසිද්ධීන් සම්බන්ධ මූලාශ්‍ර වශයෙන් භූ දර්ශනය අධ්‍යයනයේ දී වැදගත් වේ (එම).

ස්වභාවික පරිසරය මත යැපීම මිනිසා ඉතා ඈත කාලයේ දීම අත හරින ලද්දකි. ඔහු පරිසරය සමඟ සටන් කොට පරිසරය මෙල්ල කොට පරිසරය තුළ යම් දෙයක් නිර්මාණය කිරීම කැපීපෙනන සිද්ධියකි. විශේෂයෙන් ම එහි දී ඔහු මුල්කාලීන ව කර තිබූ ඉදි කිරීම් ඉවත් කර ඒ මත නව ඉදි කිරිම් සිදු කිරීම කැපීපෙනෙන අතර එහි දී පැරණි ඉදි කිරීම් හා මැදිහත්වීම්වල ශේෂිත කොටස් භූමිය තුළ ස්ථාපනය වී තිබේ. ඒ ඒ කාල වකවානුවල මානවයා භාවිත කරනු ලැබූ ද්‍රව්‍යයන් නිර්මිත පරිසරයට එකතු වී තිබෙන අතර ඒවායේ වෙනස්කම් හඳුනාගැනීමට පුරාවිද්‍යාඥයාට හැකි විය යුතු ය (Mintosh 1999 :36-37). ඒ අනුව පැරණි පරිසරය නැවත ගොඩනැංවීමේ දී ඒවායේ කාල නිර්ණයන් ලබාගැනීම හා මානව ක්‍රියාකාරකම් අධ්‍යයන තුළින් (Renfrew and Bahn 1991:195). සංස්කෘතික භූ දර්ශනය මානවයා විසින් ගොඩනඟාගත් ආකාරය

අධ්‍යයනය කළ හැකි වේ. භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී ශාක හා සත්ත්ව ද්‍රව්‍යයන් අතිශයින් වැදගත් අංශයකි. විශේෂයෙන් ම දේශගුණික විපර්යාස සඳහා ප්‍රතිචාර දැක්වීම හා අනුවර්තනය එ මඟින් හඳුනාගත හැකි ය. ඒ ඔස්සේ මානවයාගේ ප්‍රතිචාර දැක්වීම කෙබඳු ආකාරයට සිද්ධ වූවා දැයි අධ්‍යනය කිරීමට ද එය පහසු කාර්යයන් වේ (එම). මිනිසා විසින් විවිධ කාල පරාසවල දී භූමිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කර ඇත. ඒ ඔස්සේ තැන්පත් වූ සංස්කෘතික තැන්පතු ආශ්‍රිත ව භෞතික ද්‍රව්‍යය නිධිගත වී තිබීම කැපීපෙනේ (එම :201). එම නිධිගත වී ඇති සංස්කෘතික තැන්පතුවල පවතින භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් ඒවායේ කාලරාමු හඳුනාගනිමින් ඒවා විකාශනය වීම පිළිබඳ ව අධ්‍යයනය සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව අවබෝධයක් ලැබීමට බෙහෙවින් ම ඉවහල් වේ. භෞතික සංස්කෘතික තොරතුරු අධ්‍යයනයේ දී එම තැන්පතුවේ ස්වරූපයන් පිළිබඳ ව අවබෝධයක් පුරාවිද්‍යාඥයාට තිබීම ද වැදගත් වේ. ගුහා තැන්පතු හා සාමාන්‍ය තැන්පතු මෙන් ම ගංගා නිම්න ප්‍රදේශ ආශ්‍රිත තැන්පතු පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබීම ද වැදගත් වේ. භූ ලක්ෂණ (Geomorphology) යම් යම් ස්ථානයන්හි දී පාරිසරික හේතු සාධක පදනමින් විතැන්වීම හා තැන්පත්වීම සිදුවීම එයට ප්‍රධාන හේතුවයි. උදාහරණ වශයෙන් ඇළක් ගලා ගිය දිශාවක් හරහා තැන්පත් වන පෙබළු (pebbles) ඔස්සේ ගංගාව ගලා ගිය දිශාව තීරණය කිරීමටත් එම ගලා යාම ඔස්සේ තැන්පත් වන ද්‍රව්‍යය සමඟ තැන්පත් ව ඇති සංස්කෘතික ද්‍රව්‍යයන් අධ්‍යයනයේ දී ඒවා ගලපා ගැනීමටත් ඉතා පහසු වේ. එසේ ම ගංගා නිම්නයක පිහිටන ජනාවාසයක එහි පැරණි තොරතුරු පවතිනුයේ පහළ ස්තරවල වන අතර නිම්නය තුළ පවතින මතුපිට පස් හායනය වූ විට එය භූමියේ පහළින් ම තැන්පත් වන පස් ස්තරය බවට පත්වේ. පැරණිත ම ඒවා ගරා වැටීමෙන් ඊට ඉහළින් තැන්පත් වීම ඉන් පසු සිදු වේ. එම නිසා ස්තරායනය ඇසුරින් ගොඩනැගී ඇති සංස්කෘතික තොරතුරු අධ්‍යයනය කිරීමේ දී පුරාවිද්‍යාඥයා විසින් පාරිසරික දේශගුණික විපර්යාස පිළිබඳ අවබෝධයකින් කටයුතු කිරීම ද නිවැරදි ලෙස භූ දර්ශනයට අදාළ සන්දර්භයන් තුළ සන්දර්භගත කිරීමට පහසුවනු ඇත (එම :203-206). මේ අනුව





සංස්කෘතික භූ දර්ශනය වඩා නිවැරදි ආකාරයට ග්‍රහණය කරගත් විට එ මඟින් ඈත අතීතයේ සිට මිනිසා යම් යම් භූමි ප්‍රදේශවල සිදු කරන ලද මානව ක්‍රියාකාරකම්හි විකාශනය හඳුනාගැනීමට හා භෞතික සංස්කෘතික තොරතුරු මඟින් තාක්ෂණික සංස්කෘතික අවධි හඳුනාගැනීමට පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන බව පෙන්වාදිය හැකි ය. එසේ ම සංස්කෘතික තැන්පතුවල තැන්පත් ව ඇති පරාග, ඩයටම, පයිටොලිත ආදියෙන් පැරණි පරිසරය හා පුරාණ ශාකායනය නැවත ගොඩනැගීමට ද එම තැන්පතුවල තැන්පත් ව ඇති පුරාණ අස්ථි පොසිල කොටස් මඟින් පුරාණ සත්ත්ව පරිසරය නැවත ගොඩනැංවීමට ද හැකියාව ලැබේ (එම :207-217).

පරිසර පුරාවිද්‍යාව ඊට ආවේනික අංග ලක්ෂණ සහිත ව දැන් වර්ධනය වී තිබේ. මිනිසා ස්වභාවික ලෝකය තුළ ඊට අයත් කොටසක් ලෙස මෙහි දී සැලකිල්ලට ගෙන තිබේ. පරිසර පද්ධතිය තුළ සෙසු සත්ත්ව විශේෂ සමඟ අන්‍යෝන්‍ය වශයෙන් විවිධ ක්‍රියාවලට මනුෂ්‍යයා සහභාගී වෙයි. මේ අතර විටෙක පරිසරය මිනිසා පාලනය කරන අතර විටෙක මිනිසා පරිසරය පාලනය කිරීමට පොළඹවෙයි. මෙහි දෙ වැනි කාරණාවේ දී පුරාවිද්‍යාඥයා විසින් මානව කෘති (artifacts) පිළිබඳ ව අවධානය යොමු කරමින් ඒවා අයත් භූමි දර්ශන කෙරෙහි අවධානය යොමු කිරීම පුරාවිද්‍යාත්මක භූමිවල සැකැස්ම, ක්ෂේත්‍ර හා ඒ අවට භූ ව්‍යුහය ජෛවීය ක්‍රියාදාමය කාලය හා අවකාශය තුළ ස්ථානගත කිරීම තුළින් නියත සජාතීය ප්‍රපංචයක් ලෙස භූ දර්ශනය සැකසීම, පරිණාමය තේරුම් ගැනීම කැපීපෙනේ. ඒ ඔස්සේ කිසියම් තැනක භූමි දර්ශන වෙනස් වූයේ කෙසේ ද? ඒ සඳහා මානවයා දක්වා ඇති දායකත්වය මඟින් සංස්කෘතික භූ දර්ශනය ගොඩනැගුනේ කෙසේ ද? යන්න පිළිබඳ ව අධ්‍යයනය කරනු ලබයි. ඒ අනුව සංස්කාතික භූ දර්ශනය යනු යම් ප්‍රදේශයක මානවයා වටා වූ පූර්ණ පරිසරය අධ්‍යයනයත්, මානවයාගේ කාර්යාවලිය කෙබඳු ආකාරයෙන් සිදු වූවා ද යන්න තේරුම් ගැනීමක් බව පෙන්වාදිය හැකි ය.

03

වැනි

පරිච්ඡේදය

# අනුරාධපුර සංස්කෘතික විකාශනය භූ දර්ශනය අධ්‍යයනය

## 3.1 ලේඛනගත ප්‍රභවයන් අනුව අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලේඛනගත වී ඇති සාහිත්‍ය මූලාශ්‍රයන්ට අනුව ලංකාවේ ආදිත ම ජනාවාස පිහිටවනු ලබන්නේ ඉන්දියාවේ ලාට දේශයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි විජය කුමරු විසිනි (*මව*.vii: 34 *තදිව*. i:1). විජය පුවතින් පිළිඹිබු වන විවිධ සංක්‍රමණික ජන කණ්ඩායම් ජනාවාස ව්‍යාප්ත කරන ල්දදේ මල්වතු ඔය, කලා ඔය සහ මහවැලි ගඟ ඔස්සේ ය. මෙම ආරම්භක ජනපද මාන්තොට, තම්බපණ්ණී, උදේනි, අනුරාධ ග්‍රාම, උරුවේල සහ විජිත ග්‍රාම යන ස්ථානයන්හි පිහිටුවා තිබුණි (*මව*. xxxix:38-46). අනුරාධ නම් ඇමති කොලෙම්හොය ඉවුරෙහි (වත්මන් මල්වතු ඔය) පිහිටුවනු ලැබූ ග්‍රාමය **අනුරාධ ග්‍රාම** නම් විය (*මව*. vii :44). අනුරාධ නම් ඇමති පිහිටු වූ මෙම අනුරාධ ග්‍රාමය පසු ව ලංකාවේ අගනුවරක් දක්වා ව්‍යාප්ත වූ ආකාරය සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක ප්‍රභවයන්ට අනුව අවබෝධ කරගත හැකි ය.

වංසකතා විස්තරවලට අනුව පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී ක්‍රි.පූ. හතර වැනි සියවස පමණ වන විට අනුරාධපුරය නගරයක් දක්වා වර්ධනය වී තිබේ. පණ්ඩුකාභය කුමාරයා විසින් අනුරාධ නම් මුත්තණුවන්ගේ





ගමට පැමිණ වාස්තුවිද්‍යාව දන්නවුන්ගෙන් අසා එහි නුවරක් ඉදි කළ බව මූලාශ්‍රයවල සඳහන් වේ (*මව*.vii:73-76). **අනුරාධයන්** දෙදෙනෙකුට හා **අනුරේ** නම් නැකතකින් මෙම නුවර ඉදි කිරීම ආරම්භ කළ හෙයින් **අනුරාධපුර** යනුවෙන් එය නාමකරණය වූ බව මහාවංසයේ සඳහන් වේ (එම:77). එහි විස්තර වන ආකාරයට අනුරාධපුර භූ දර්ශනය සකස් කිරීමේ මුල් ම ගෞරවය හිමි වනුයේ පණ්ඩුකාභය රජතුමාට ය. ඒ රජ විසින් අනුරාධපුර නගරය විවිධ කොටස්වලට බෙදා නගරවාසීන්ගේ අවශ්‍යතාවන්ට සරිලන පිරිදි නගර පාලනය සඳහා නගර ගුත්තික තනතුර ඇති කර (එම:81) වැවක්, සුසාන භූමියක් හා ආගමික සිද්ධස්ථාන ඉදි කළ බව විස්තරකර ඇත (එම : 88-102).[1]

1. ''මෙසේ දිනූ සංග්‍රාම ඇති පණ්ඩුකාභය කුමර එතැනින් අනුරාධ නම් මුත්තණුවන් වසන තැනට ගියේය. ඒ ආර්යය තෙමේ තම රජ ගේ කුමරු ට දී අන්තැනක වාසය කළේ ය. කුමරු ඒ රජ ගෙහි විසී ය. නිමිති ශාස්ත්‍ර දන්නන් ද එසේ ම වාස්තුවිද්‍යා දන්නන්ද විචාර ඒ ගම් බිම් උතුම් නුවරක් ඉදි කරවී ය. විජය කුමර ඇමති වූ ද භද්‍රකත්‍යායනා බිසවුන් බෑයා වූ ද අනුරාධයන් දෙදෙනාගේ නිවාස හෙයින් ද අනුරේ නැකතින් පටන්ගත් බැවින් ද අනුරාධපුර නම් වී ය. එතැන් පටන් නුවර නගර ගුත්තිකයෝ වූහ. එසේ ම ඒ විළඳ කණවා දිය ඇති කළේ ය. ජය ලක් කළ දිය නෑ හෙයින් එය ජයවැව යැයි නම් වී ය. නුවරට නැගෙනහිර කාලවේල යක්ෂයා සඳහා දෙවොල ඉදි කළේ ය. ඒ චිත්‍රරාජයකු අභයවාපී යට භාගයෙහි වාසය කරවී ය. යක්ෂ යෝනියෙහි උපන්නා වූ පූර්වෝපකාරී ඒ දාසිය නුවර දකුණු දිග් දොර කෙළෙහිගුණ දන්නා ඒ තෙම වාසය කරවී ය. වළවාමුඛී යකිනි රජගෙවුයන් ඇතුළත වැස්සවීය. උන්ට ද අන්‍යයන්ට ද අවුරුදුපතා බලි දානය කරවී ය. නැකැත් කෙළි දවස්හි ඒ පණ්ඩුකාභය රජ තෙමේ චිත්‍ර රාජ හා සමඟ සම අස්නෙහි හිඳගෙන දෙව් මිනිස් නැටුම් කරවමින් රතී ක්‍රීඩාවෙන් යුක්ත ව සිත් ඇලවී ය. දෙරගම් සතර ද අබා වැව ද, එසේ ම මහත් වූ සොහොන් භූමිය හා දම්ගෙඩිය හෝ වධක ස්ථානය ද බටහිරින් රැජින ද වෙසමුනියා නුග දෙවොල ද වැදි දෙවියා තල් දෙවොල ද සභාග වස්තුව ද ප්‍රභේද ගෙය ද යන මෙතෙක් ද බටහිර දොර දිසා භාගයෙහි ඒ රජ තෙමේ පිහිටවී ය.

   නගර ශෝධක පන්සියයක් සැඩොල් මිනිසුන් ද වච්ශ්ශෝධක දෙසීයයක් සැඩොල් පුරුෂයන් ද මළමිනී බැහැර ගෙන යන්නා වූ එකසිය පණහක් සැඩොලුන් ද එතෙ-න් ම එකසිය පණසක් සොහොන් ගොවි සැඩොලුන් ද සොහොනින් වයඹ දිග උන්ගේ ගම් ද පිහිටවීය. ඒ සැඩොල් ගමට ඊසාන දික්හි නීච සුසානයයි නම්ලත් සැඩොලුන්ගේ සොහොන කරවී ය. ඒ සොහොනින් උතුරු දිග පහන් පව් අතර වැද්දන්ගේ ගෙවල් පෙළ එ කල පිහිටුවන ලද්දේ ය. රට උතුරු දික්හි ගැමුණු වැව දක්වා නොයෙක් තවුසන්ගේ අසපුව කරන ලද්දේ වී. එම සොහොනට පෙරදිග රජ තෙමේ ජෝතිය නිගණ්ඨයාගේ ගෙය කරවී ය. එම පෙදෙස ගිරි නම් නිගණ්ඨ තෙමේ ද නානා පාණ්ඩයෝ ද බොහෝ ශ්‍රමණයෝ ද විසූහ. එසේ ම රජ තෙමේ කුම්භාණ්ඩ නම් නිගන්ඨයා සඳහා දෙවොලක් කරවී ය. ඒ දෙවොල බටහිර ව්‍යාධ පාලියෙන් පෙරදිග මිථ්‍යාදෘෂ්ටික කුලයන් පන්සියයක් විසී ය. එසේ ම ඒ රජ තෙමේ ජෝතිය

පණ්ඩුකාභය රජ යුගයේ දී අනුරාධපුර නගරය සම්බන්ධ ව වංසකතාව විස්තර කරන මෙම අතිශයෝක්තිගත ප්‍රවෘත්තිය තුළින් උකහාගත හැකි යමක් තිබේ. එ නම් ක්‍රි.පූ. හතර වැනි සියවස පමණ වන විට අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ භූ දර්ශනය මනසින් මවා ගත හැකි ය. නගරයේ ද්වාරවල දොරගම් තිබූ බවත්, විමසීම. නගරයට බටහිර පස වධකස්ථානය හා සොහොන් භූමිය ද ගාමිණී වාපී අසළ තවුස් ආරාම ද පෙරදිග නිගණ්ඨාරාම ද, නගරයේ කැළි කසළ ඉවත් කරන්නන් බොහෝ දෙනෙකු සඳහා ගෙවල් පෙළ හා සොහොන් භූමිය වයඹ දික් භාගයේ පිහිටි බව සඳහන් කර තිබීම තුළින් අනුරාධපුර නගරයේ එවකට භූ දර්ශනය නගරය වටා එක්තරා ආකාරයට ජනාවාස ස්ථානගත කිරීමේ පිළිවෙලක් ලෙස හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාවේ පුරාණ නගර හා ඉන්දියාවේ ආදී ජනාවාස අතරත් එක සමාන ලක්ෂණයන් ඇත (Silva 2000:49). ඒ සඳහා බලපා ඇත්තේ ක්‍රි.පූ. හය වැනි හා හත් වැනි ශතවර්ෂවල ආදී ඉන්දීය ජනාවාසවල සිට සංක්‍රමණිකයන් මුහුදු මාර්ග ඔස්සේ මෙ රටට පැමිණීමයි (එම). වංසකතාවන්හි විස්තර වන ආකාරයට ලංකාවේ මුලින් ක්‍රියාත්මක වී ඇත්තේ ග්‍රාමයන් ය. ඒවා ගංගා නිම්නවල ක්‍රියාත්මක වූ බව මහාවංසයේ සඳහන් වේ[2] (*මව.* vii:43-46). මෙගස්තිනීස්ගේ වාර්තාවල ද ලංකාවේ එවකට පැවති ග්‍රාම පිළිබඳ විස්තර ලියා ඇත. ඔහු පෙන්වාදෙන ආකාරයට තැප්‍රොබේන්හි නගර නොමැති බවත් ඇත්තේ හැත්තෑවක් පමණ ගම් බවත් දක්වා තිබේ (Maccrindle 1877:169).

අනුරාධපුරයේ පැරණි භූ දර්ශනය ගොඩනැංවීම පිළිබඳ ව අදහස් දක්වා ඇති රෝලන්ඩ් සිල්වා අනුරාධපුරයේ පැවති

ගෙයින් ඔබ ගැමුණු මැවිනි මොබ පරිබ්‍රාජකාරාමයක් කරවී ය. ආජීවකයන් ගෙයක් ද බමුණන්ට ආධාර ගෙයක් ද සිවි ගෙයක් හා ආශිර්වාද ශාලාවක් ද ඒ ඒ තැන කරවී ය. පණ්ඩුකාභය රජ තෙමේ අභිෂේක වන් දසවස් ඇත්තේ මුලු ලක්දිව්හි ග්‍රාම සීමා නියම කළේ ය'' (*මව*:73-104).


2 ''අනුරාධ නම් ඇමති තෙමේ කොළොම්හෝ ඉවුරෙහි අනුරාධ නම් ගම පිහිටවී ය. පෙරවි උපතිස්ස තෙමේ අනුරාධපුරයෙන් උතුරු දිග ගම්භීර නදී තීරයෙහි උපතිස්ස ග්‍රාමය ඉදි කළේ ය. අනික් ඇමතියෝ තුන් දෙනෙක් උදේනිය, උරුවේලාය, එසේ ම විජිත නගරයයි යන වෙන වෙන ගම් ඉදි කළෝ ය. ජනපද පිහිටුවා සියලු ඇමතියෝ රැස් ව ඒ කුමරුහට ස්වාමිනී රාජ්‍යයෙහි අභිෂේක කරවයැයි කීහ''






පුරාණ ජනාවාසය පිළිබඳ ව අනුමාන වශයෙන් කරුණු රැස්කරන්නේ නම් වර්තමානයේ එම ප්‍රදේශයන්හි දක්නට ඇති භූමිගත සැලැස්ම වැදගත් බව පෙන්වා දෙයි (Silva 2000 : 44). ඒ අනුව දකුණු කඳුවැටිවලින් පටන්ගෙන උතුරේ තැන්න දක්වා ගලා බසින මල්වතු ඔය ආශ්‍රිත පිටාර ජලයෙන් යටවන තැනිතලා භූමිවලින් මදක් ඇත නිම්නවල සහ කුඩා දිය මංවලින් ජලය ලැබෙන ප්‍රදේශවල වාසය සඳහා සුදුසු භූමි ජනපදිකයින් තෝරාගත් බවත්, මෙම පුරෝගාමී ජනපදිකයන් කෘෂිකර්මාන්තය සඳහා ජලය ගබඩාකර තැබීමට පහළ ඇති කුඹුරුවලට වුවමනා අවස්ථාවල ගුරුත්ව - ශෝෂක පද්ධතියක් මඟින් ජලය ලබා ගැනීමට කටයුතු කළ බැවින් ඒ සඳහා අනුරාධපුරයේ බටහිර අභයවාපි, ගාමිණීවාපී, තිසාවාපී යන වැව් හා නැගෙනහිර නකර වාපී (නුවර වැව) හා පුලියන්කුලම වැව නිර්මාණය කළ බවත්, නිසැකව ම ඔවුන්ගේ ජනාවාස කුඹුරු ආසන්නයේ උස් බිමක තනා ගන්නට ඇති බව ද පෙන්වා දෙයි (එම).

අනුරාධපුර නගර සැලැස්ම පිළිබඳ අධ්‍යයනයේ දී මූලාශ්‍රය විස්තරවලට සමාන විස්තරයක් කෞටිල්‍යය අර්ථ ශාස්ත්‍රයෙහි මිලින්ද ප්‍රශ්නය හා සම්බන්ධ ප්‍රවෘත්තිය තුළින් මිථිලා නුවර නගර සැලැස්ම අනුරාධපුර නගර සැලැස්මට සමාන වන බව පරණවිතාන පෙන්වා දී ඇත (*Ez. Vol* iii:181).ඒ අනුව මහාවංස කතුවරයා අනුරාධපුර නගර සැලැස්ම විස්තර කිරීම සඳහා කෞටිල්‍යය අර්ථ ශාස්ත්‍රයෙහි අඩංගු විස්තර උකහා ගත්තේදැයි යම් ආකාරයක මතභේදයක් පවතී.




සිතියම් අංක 3.1

අනුරාධපුර පැරණි නාගරික ව්‍යුහය දැක්වෙන වර්තමාන භූමි සිතියම




සැලසුම් අංක 3.1

අනුරාධපුරයෙහි පැරණි භූ දර්ශනය සම්බන්ධ රෝලන්ඩ් සිල්වාගේ සැලැස්ම





ග්‍රාම හා නගර සැලසුම්කරණය පිළිබඳ ව අධ්‍යයනයේ දී වීර කාව්‍යවල අන්තර්ගත තොරතුරු ද අතිශයින්ම වැදගත්කමක් උසුලන බව සිල්වා පෙන්වා දී ඇත. වාස්තුවිද්‍යාව පිළිබඳ ව ප්‍රතිපත්ති හා විස්තර ඇතුළත් පැරණිත ම ග්‍රන්ථය වන්නේ **මානසාරයයි** (එම :50). ක්‍රි.ව. පස් වැනි හා හත් වැනි ශතවර්ෂ අතර කාලයේ රචිත මෙම ග්‍රන්ථය තුළින් දීර්ඝ කාලීන සම්ප්‍රදායික වාස්තුවිද්‍යාත්මක ප්‍රයෝගයන්ගේ එකතුවක් දැකගත හැකි ය. එය මුළු ඉන්දියාවේ ම ගම් නියම් ගම්වල පැතිර තිබූ බව සිල්වා පෙන්වාදෙයි (එම). නගර නිර්මාණය සහ වාස්තුවිද්‍යාව ගැන ලියැවුණු මූලික ශබ්ද කෝෂයක් වූ මානසාර මුල් කරගෙන රචිත වැදගත් කෘතියක් නම් **මයමත ශිල්ප ශාස්ත්‍රයයි**. මෙය පසු කලකදී සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදි (එම). චාර්ල්ස් ගොඩකුඹුර පෙන්වාදෙන ආකාරයට බොහෝ බෞද්ධ ග්‍රන්ථවලින් ගත් කරුණු මානසාරයෙහි ඇතුළත්ව ඇත (Godakumbura 1955:541). විශේෂයෙන් ම මිලින්ද පඤ්හ නම් කෘතියෙහි ඇතුළත් කරුණු මයමතයට ආශ්‍රය වී ඇත. ඒ අනුව නගර නිර්මාණ සැලසුම්කරණය හා වාස්තුවිද්‍යාව සම්බන්ධ මෙම සම්ප්‍රදායේ බලපෑම ශ්‍රී ලංකාවට තිබී ඇත (එම).

මානසාරයෙහි දැක්වෙන අන්දමට නගරයක පෘථුල ලක්ෂණ සහ අංගෝපාංග විස්තර වී තිබේ.[3]

අනුරාධපුර නගරය හා ග්‍රාම බිහිවීම පිළිබඳ ව ලේඛනගත ප්‍රභවයන් ඔස්සේ අදහස් දක්වන සිල්වා තවදුරටත් පෙන්වා දෙන්නේ **මානසාරයෙහි** හා **මයමතයෙහි** විස්තර කර ඇති ක්‍රි.පූ.

3 "රජු (රජ මාළිගාව සහිත) මධ්‍ය කේන්ද්‍ර කොට ගෙන විවිධ ධනවත් පින්වත් ජනතාව වාසය කරන නගරය රාජ්‍ය ඇතුළත් ගං තෙරක සැලසුම් කළ යුතු ය. ප්‍රවේශයකින් හෝ මධ්‍යයෙහි විෂ්ණු දෙවොලක් ගොඩනගා ඇත්නම් එයට උගතුන් දෙන නම රාජධධානිය (අගනුවර) යන්න ය. ප්‍රධාන දිශා හතරට මුහුණ ලා දොරටු හතරක් තිබිය යුතු ය. ඒවා ගෝපුරවලින් සමන්විත විය යුතු ය. තැනින් තැන මුර ගෙවල්වලින් ද හැම තැන ම බැරැක්කවලින් ද වෙළෙඳුන්ගෙන් ද වෙළඳ පොළවලින් ද සැදුම් ලද මෙහි මහජනයා ගැවසෙති. විවිධ ආගම්වලට අයත් සිද්ධස්ථාන එහි වෙයි. ඇතුළත පිටත ඇති එවැනි ස්ථානයකට තන්ත්‍ර (වාස්තුවිද්‍යා ශාස්ත්‍ර) ප්‍රවීනයෝ කේවල නගරයයි කියති. එම නගරයට පුරයයි කියති. ගෙවතුවලින් සහ උයනින් සැදුණු මෙම පුරයෙහි වසිවාරන්න ජනතාවගේ නිවෙස් වෙයි. එම පුරයෙහි වෙළෙන්දෝ ද මිලට ගන්නෝ ද වෙති. වෙළෙඳුන්ගේ ඝෝෂා මත්තෙන් ඇළලී ඇත. දෙවිවරු සත්දෙනා හමුවන දේවාලයෙහි අලංකාර වෙයි. එම පුරය තුළ ම රජමාළිගය වේ නම් එයට නගරී යයි කියති (Silva 2000:51).

හය වැනි හෝ හත් වැනි ශතවර්ෂවල නගරවල ආකෘතිය සිත්හි තබාගෙන භාරතයේ සිට පැමිණියවුන් විසින් අනුරාධපුර මල්වතු ඔය ඉවුරේ ජනාවාස පිහිට වූ බව ය. අනුරාධපුරයේ මූලික ලක්ෂණ ගැන විමසීමක් කිරීමේ දී පැහැදිලි වන්නේ වාරිමාර්ග සම්පාදනය හඳුන්වා දෙමින් ජලය පාලනය ක්‍රමවත් සැලසුමක් ඔස්සේ කළමනාකණය වූ නිසා ආහාර භෝග හා අස්වැන්න නියමිත කාලවලට වුවමනාවට වඩා ලැබුණු බැවින්, සිදු වූ නිෂ්පාදන අතිරික්ත ජනපද අතර හුවමාරු කර ගැනීම නිතර නිතර ඇති වූ නිසා ගැමියන්ට එක් මධ්‍යස්ථානයකට රැස් වී තම තමන්ගේ භාණ්ඩ හුවමාරු කර ගැනීම සිදු විය. ඒ අනුව හුවමාරුව පුළුල් වීම සමඟ වානිජ කටයුතු සාර්ථක ව පවත්වා ගෙන යාමට පරිපාලනය ද අවශ්‍ය වී තිබුණු බැවින් වෙළඳ මධ්‍යස්ථාන ප්‍රධාන කේන්ද්‍රය වටා ඇතිවීම සිදු විය (එම). මහාවංසයේ ක්‍රි.පූ. පස් වැනි හා හතර වැනි ශතවර්ෂයන්හි පණ්ඩුකාභය රජු බලයට පත් වී තිබුණ කාලයේ නගරයෙහි සැලසුම ප්‍රධාන වශයෙන් කේන්ද්‍රය වටා සකස් වී තිබූ යේ මෙලෙස ය,

i. නගරය පවුරකින් වටකර තිබීම.

ii. නගරය වටා සිව් දිසාවට දොරටු ස්ථානගත වී තීබීම.

iii. දොරටුව වටා ද්වාර ගම් පිහිටා තිබීම.

iv. උතුරින් හා නැගෙනහිරින් ජනාවාස ස්ථානගත වී තිබීම.

v. කේන්ද්‍රය හා සම්බන්ධ ද්වාර සඳහා මාර්ග ප්‍රවේශයන් සැකසී තිබීම තුළින් පැහැදිලි වේ (*මව.* x:73-90).

කේන්ද්‍රය ඇතුළත කඩ සාප්පු හෝ වෙළඳපොළවල් තිබුණු බව සඳහන් නොවන අතර අනුරාධපුර නගරයේ බටහිර දොරටුවට පිටතින් යෝන වෙළෙඳුන් පදිංචි ව සිටි බව මහාවංසයේ සඳහන් වේ (*Mv*.x:09). ඒ අනුව නගරය ආසන්නයේ සාප්පු හෝ වෙළඳපොළවල් ක්‍රියාත්මක වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. කේන්ද්‍රය වටා වූ වෙළඳපොළ සම්බන්ධ තොරතුරු විමර්ශනය කිරීමේ දී වංසකතාවල සඳහන් තොරතුරු හා





පුරාවිද්‍යාත්මක තොරතුරු අතිශය වැදගත් වේ. වෙළඳපොළක් නිර්මාණය වන්නේ අතිරික්ත භාණ්ඩ අලෙවි කිරීම සඳහා ය. එසේත් නොමැති නම් හුවමාරු කර ගැනීම සඳහා ය. මෙ වැනි අතිරික්ත භාණ්ඩ හුවමාරු කරගත් ස්ථාන දීපවංසය විස්තර කර ඇත්තේ **අන්තරාපාන** ලෙස ය (දීව.ix:36). අන්තරාපාන පිළිබඳ වැඩි විස්තර සපයන දීපවංසය එය ජනාවාස පහකට කේන්ද්‍රීය ව පිහිටි පොදු බිමක් බව දක්වා තිබේ (එම). වෙළඳපොළ ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා භාණ්ඩ හුවමාරු කරගත් මධ්‍යස්ථාන වශයෙන් වෙනත් ජනාවාස අතර ද ක්‍රියාත්මක වීමට ඇතැයි උපකල්පනය කළ හැකි ය. අනුරාධපුරයේ ක්‍රියාත්මක වෙළඳපොළ පිළිබඳ ව සිව් වැනි සියවසට අයත් විස්තරයකින් මේ ස්ථානය හා සම්බන්ධතා පැවතියා වූ විදේශීය වෙළෙඳුන් ගැන ද සඳහන් වේ (*Mv*.x:88-93). මෙබඳු වෙළඳ බිමක බලවත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් වෙළඳ ජනයා උදෙසා නීතිය හා ආරක්ෂා සංවිධාන සැලැස්වූවා වූ හා එම සේවාව වෙනුවෙන් අයබදු ලබා ගත් පුද්ගලයා වර්ග නායකයා හෝ රජු වශයෙන් තම වාස භූමිය තුළ මාළිගාවක් හෝ මන්දිරයක් ගොඩ නඟා ඇත (සිල්වා 1998:296). පැරණි වංසකතා ග්‍රන්ථ මේ ඉතිහාසය පණ්ඩුකාභය රාජ්‍ය යුගය වන ක්‍රි.පූ. හතර වැනි සියවසෙහි ලා සලකනු ලබයි (එම). තව ද වෙළෙඳුන් උදෙසා නගර ප්‍රාකාර, දිය අගල් හා නුවරෙන් බැහැර යාමට ද්වාර මාර්ග සහිත ආරක්ෂිත කොටු පවුරු ඉදිකර තිබීමත්, විදෙස් වෙළෙඳුන් සඳහා නගරයේ පිටත ස්ථාන වෙන්කර තිබීමත්තුළින් (*Mv*.x:88-93). අනුරාධපුර නගරය ක්‍රමවත් ලෙස ගොඩනැගී තිබූ බව මූලාශ්‍රය කරුණුවලට අනුව පැහැදිලි වේ.

ක්‍රි. පූ. හතර වැනි සියවස පමණ වන විට ලේඛනගත මූලාශ්‍රයවල සඳහන් තොරතුරුවලට අනුව නගරය වටා ප්‍රධාන ප්‍රවේශ ද්වාර හතරක් හා එම ප්‍රවේශ ද්වාර සමීපයෙහි ද්වාර ග්‍රාම (දොරගම්) පිහිට වූ බව විස්තර වේ (*මව*.x:88). එසේ ම මෙම ද්වාර ග්‍රාම පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී දොරගම් යනු මොනවාදැයි අර්ථ නිරූපනය කළ හැක්කේ සාහිත්‍ය හා අභිලේඛනවල සඳහන් තොරතුරු ද අන්තර්ගතය ලෙස ගෙන ය. මහාවංස විස්තරයේ දොරගම් යන්න පිළිබඳ ව අර්ථ නිරූපණය කර නොමැත.

නමුත් එය පිහිටුවා ඇත්තේ නගරයේ ප්‍රධාන දොරටුවල බව එම විස්තරයට අනුව උපකල්පනය කළ හැකි ය. ක්‍රි.ව. හතර වැනි සියවසට අයත් මේඝවර්ණ රජු (මහසෙන් රජුගේ පුත්) විසින් කළ තෝනිගල ශිලා ලේඛනයේ අනුරාධපුර නගරයෙහි උතුරුපස වූ නියමතන ගැන විස්තර කර ඇත (*Ez.* Vol.iii:No.17). එහි විස්තර වන අකාරයට **කළහුමනක නියමතනින්** එකතු කරන ලද බදු අරමුදල් **යහිසපවය** විහාරයේ විසූ භික්ෂූන්ට ප්‍රදානය කර තිබේ (එම).[4]

මෙම ශිලා ලිපියේ නගරයේ උතුරු ප්‍රදේශයේ වෙළඳ පොළ **කලහුමනක** නමින් ව්‍යවහාර වූ බවත් නැගෙනහිර වෙළඳපොළ මහාතබක නියමතන වශයෙන් ව්‍යවහාර වූ බවත් පැහැදිලි වේ. නියමතන පිළිබඳ ව විග්‍රහ කරන පරණවිතාන **නියම** යන්න නිගම වශයෙන් ව්‍යවහාරයට පැමිණෙන බැවින් එයින් වෙළඳපොළ ගම්‍ය වන බවත් සිංහලයෙන් නියම් දෙටු පාලියෙන් **නිගම ජෙත්තක** සහ **නියම්ගම** හෝ නිගමගම වශයෙන් ව්‍යවහාරයට පැමිණි බව ද පෙන්වා දී තිබේ (එම). පුරාණ ඉන්දියාවේ ප්‍රධාන නගරය වටා මෙ වැනි නිගමස්ථාන හතරක් ප්‍රධාන දොරටු අසල තිබූ බව විස්තර කර ඇති පරණවිතාන (එම) මහා උම්මග්ග ජාතකයේ විග්‍රහ කිරීම්වලට අනුව මිථිලා නුවර ප්‍රධාන දොරටු හතරෙහි මෙ වැනි වෙළඳපොළවල් තිබූ බව ප්‍රකාශ කර ඇත (එම). ඒ අනුව මහාවංසයේ දස වැනි පරිච්ඡේදයේ සඳහන් **ද්වාරග්‍රාම මිථිලා** නුවර නගරය වටා වූ වෙළඳ පොළවල්වලට සමාන වූ බව උපකල්පනය කළ හැකි ය (එම). මේ අනුව පශ්චාත්කාලීන අභිලේඛනවල සඳහන් වන **නිගම** එසේත් නැතහොත් **නියමතන** අනුරාධපුර නගරය වටා ක්‍රියාත්මක වූ වෙළඳපොළවල් වන අතර මහාවංසයේ දොරගම් වශයෙන් සඳහන් වන්නේ ක්‍රි.පූ. හතර වැනි සියවස පමණ දී අනුරාධපුර නගරය වටා ක්‍රියාත්මක වූ මුල් වෙළඳ පොළවල් බව උපකල්පනය කළ හැකි ය.

4 1. සිරි පුවිය මහාසේන - මහරජහ පුත සිරි මේඝවණ අබ රජහ කට ලෙගි
2. තත තිනවනක වසහි නකරහි උතරපසහි කලහුමනක නියම තනහි සියියය
3. විය කිනියෙනි නිකට කඩුබලගමකෙහි වසනක අමෙති පහෙජ සිවයහ
4. පුත දේවයහ යහිසපවය - නාම - වහෙර කෙහි දින (එම).





මධ්‍ය ඓතිහාසික අවධියේ රචිත තවත් සාහිත්‍ය මූලාශ්‍රයක් වන දීපවංසයේ ද නගරය වටා වූ වෙළඳපොළ පිළිබඳ ව විග්‍රහ වේ (*Dv*.ix:36). දීපවංසයේ වෙළඳපොළ විග්‍රහ කරනුයේ අන්තරාපණ ලෙස ය (එම). **අන්තරාපණ** යනු නිෂ්පාදකයා හා පාරිභෝගිකයා හමු වී භාණ්ඩ හුවමාරු කර ගන්නා ස්ථානය වශයෙන් එහි හඳුන්වා ඇත (එම :36). ඒ අනුව **ද්වා රග්‍රාම** භාණ්ඩ හුවමාරු කරන වෙළඳපොළ බව මූලාශ්‍රය හා අභිලේඛන තොරතුරුවලින් හඳුනාගත හැකි ය. බ්‍රාහ්මී ශිලා ලිපිවල හා ඉ පැරණි වංසකතා හා සාහිත්‍ය මූලාශ්‍රයවල **කඩ, කඩක, කට, කණ්ඩ, ග්‍රාම** වැනි පද සඳහන් වේ. පණ්ඩුකාභය රාජ යුගයේ දී ඔහුගේ සංග්‍රාම ආශ්‍රිත ව **ගිරිකණ්ඩ** (*මව*.x:29). වට්ටගාමිනී රජු අනුරාධපුරයේ සිට පලායාම දක්වන විස්තරයේ **ශිලා සොබ්බකටක** (එම :xxxiii:52). ශිලා ලිපි ගණනාවක ම කඩගිරික (*Ic*.Vol. i 284), **කඩපි වපිහම්** (එම :No.1151), **කඩහලක** (එම :No.1122), **උපරිකඩ** (එම :හදග841) පිළිබඳ සඳහන් වේ. එසේ ම විවිධ ග්‍රාම පිළිබඳ ව අභිලේඛන රාශියක සඳහන් වී ඇත. ඒ අතර **උපලිගම** (එම :හදග792), **වඩ්ඩමානකගම** (එම :No.1216), **රකතිගම** (එම :No.840), **පාසානදාරියගම** (එම :හදග619), **පරකාවගම** (එම :No.1013), **නිලගම** (එම :No.884), **මතුකගාම** (එම:No.837), **කනියුටගම** (එම :No.530,534), **ගරද්දියගම** (එම :No.873) ආදී ලෙස මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් මෙම **ග්‍රාම, කඩ, කට, කණ්ඩ, කඩක** යන පැරණි වචනාර්ථ ගත් කළ එයින් **සීමාව, ප්‍රවිෂ්ට වන ස්ථානය, හුවමාරු ස්ථානය, සුළු වෙළඳපොළ** අර්ථවත් කෙරෙන බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (සෙනෙවිරත්න 1996:192).

තතු එසේ නම් පණ්ඩුකාභය රාජ යුගයේ දී ඔහුගේ සංග්‍රාම ආශ්‍රිත ව අනුරාධපුර නගරය ආසන්නයේ විස්තර වන **ගිරිකණ්ඩ** නගරයෙන් පිටත ක්‍රියාත්මක වූ භාණ්ඩ හුවමාරු කරන සුළු වොළඳපොළක් පැවති ස්ථානයක් වීමට ඉඩ තිබෙන බව උපකල්පනය කළ හැකි අතර, බ්‍රාහ්මී ශිලා ලිපිවල සඳහන් වන ග්‍රාම යම්කිසි නිෂ්පාදන කාර්යයක් සිදු කළ ස්ථානවීමට හෝ භාණ්ඩ බෙදා හැරි ස්ථාන වීමට ඉඩ ඇත. ඒ අර්ථයෙන් බැලීමේ

දී අපට පැහැදිලි වන්නේ ක්‍රි.පූ. හතර වැනි සියවස පණ්ඩුකාභය රාජ්‍ය යුගයේ දී නගරයේ පිටත ක්‍රියාත්මක වූ **දොරගම්** එවකට නගරය වටා වූ වෙළඳපොළ ක්‍රියාත්මක වූ ස්ථාන ලෙස හැඳිනගැනීමට අවකාශ සැලසේ.

ලේඛනගත ප්‍රභවයන්ට අනුව අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී පුදපූජා පැවැත් වූ ස්ථාන පිළිබඳ ව විස්තරයක් මහාවංසයේ විස්තර කර තිබේ. ඒ අනුව රජතුමා නිතිපතා පුද පූජා කටයුතු සිදු කිරීම සඳහා මාළිගය ආසන්නයේ ම දෙවොලක් තනා වළවාමුඛී යකිනි එහි නැවැත් වූ බව සඳහන් වේ (මව.ං:85). එසේ ම නගරයෙන් පිටත කාලවේල යක්ෂයා සඳහා දොවොලක් ද (එම:84) නගරයෙන් බටහිර දිග් භාගයේ අභයවාපී අසළ චිත්‍රරාජ යක්ෂයා සඳහා දොවොලක් ද (එම :85), පශ්චිම රාජිණිය වෙනුවෙන් දොවොලක් ද (එම :89), කුවේර දේවයන් සඳහා නුග දේවාලයක් ද, ව්‍යාධ දේවයන් සඳහා තල් අරමක් ද, ජෛන පූජයකු වූ කුම්භාණ්ඩ සඳහා දේවාලයක් ද නගරයෙන් පිටත පිහිටුවා තිබේ (එම :88-90).

සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන කරුණුවලට අනුව අනුරාධපුර නගරයෙන් පිටත ප්‍රදේශය ඒ ඒ කාර්යයන්ට අයත් වන ලෙස කලාපවලට බෙදා භෞමික දර්ශනය නිර්මාණය කර තිබූ බව පෙනේ. වාරි ජලය සම්පාදනය කෙරෙන ජලාශ පිහිටුවීම සඳහා භෞමික සාධක වැදගත් වූ බැවින් වගා කරන කුඹුරු ඉඩම් පිහිටා තිබුණේ වැව්වලට පහළිනි (Silva 1982:08). මුල් ජානපදිකයන්ගේ නිවාස කුඹුරුවලට ආසන්නයේ උස් භූමිවල තනා තිබෙන්නට ඇත (එම). අභයවාපි (බසවක්කුලම), ගාමිණීවාපි (බුලංකුලම), ජයවාපි (තිසා වැව) ජලය ගබඩා කර තැබූ ස්ථාන වූ අතර එයින් පහත් බිම් කෘෂිකර්මාන්තයේ නියැලුණු ජනතාවගේ නිවාස පිහිටුවා ගත් සථාන ලෙස භාවිත කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය (එම). ක්‍රි.පූ. හතර වැනි සියවසේ පණ්ඩුකාභය රජ දවස කෘෂිකර්මාන්තයට අමතර ව යෝනයන්ගේ මෙන් ම වෙළෙන්දන්ගේ ගෙවල් පිහිටා තිබූ බව විස්තර වන්නේ නගරයේ පවුරුවලින් පිටත භූමියේ බව පෙනේ (*මව*.x:90). නගරයේ පවිත්‍රතාවයන් මෙන් ම වෙනත් ප්‍රායෝගික





කාර්යයන් සිදු කළ මංමාවත් පිරිසිදු කරන්නන්, මළමිනී බැහැර කරන්නන්, කානු පිරිසිදු කරන්නන්, නගරයට මස් සැපයූ දඩයම් කරුවන් සඳහා වූ ජනාවාස ස්ථානගත කර තිබුණේ නගරයේ වයඹ දිසාවේ බව මහාවංසයේ විස්තර වේ (එම:91-95). නගරයේ උතුරු දෙසින් රෝහල, ආජීවක තවුසන්ගේ ආගමික ස්ථාන ද බටහිර පසින් සුසානය ද එහි ආසන්නයේ ම චණ්ඩාලයින්ගේ ගෙවල් ද පිහිටා තිබූ බව මහාවංසයේ සඳහන් වේ (එම:89-90).

අනුරාධපුර නගරය හා ඒ වටා ක්‍රියාත්මක වූ සමාජ, ආර්ථික ආගමික ක්‍රියාවලිය ඇතුළත් භූ දර්ශනය ක්‍රි.පූ.හතර වැනි සියවස පමණදී පහත දැක්වෙන ආකාරයේ කලාපවලට බෙදී සැකසී තිබුණු අයුරු සිල්වා පෙන්වා දී ඇත.

1. මාළිගා ප්‍රදේශ
2. දේවාල
   - අ. මාලිගාවේ සිද්ධස්ථාන
   - ආ පශ්චිම රාජනී දේවාලය
   - ඇ. කුවේර සඳහා නුග දේවාලය
   - ඈ. ව්‍යාධ දෙවියන්ගේ තල්ගස් අරම
   - ඉ. කුම්භාණ්ඩ නම් ජෛන නිගණ්ඨයාගේ පන්සල
3. සතර ද්වාර හා පවුරු ද්වාරගාම
4. වෙළෙන්දන්ගේ ආපනශාලා
5. රෝහල සහ මෘත ශරීරාගාරය
6. සුසාන භූමි

7, වෙළෙන්දන්ගේ ජනාවාස

8. කෘෂිකාර්මික ජනාවාස
   - අ. අභයවාපි (බසවක්කුලම)
   - ආ. ගාමිණීවාපි (බුලංකුලම)
   - ඇ. ජයවාපි (තිසාවැව)

ඈ. නගරවාපි (නුවර වැව)

ඉ. පුලියංකුලම

9. කම්කරු ජනාවාස

10. දඩයක්කරුවන්ගේ ජනාවාස

11. නිගණ්ඨ ජනාවාස

අ. ගාමිණී වාපියට උතුරු ප්‍රදේශය

ආ. ජෝතිය ප්‍රමුඛ ජෛන නිගණ්ඨයෝ

ඇ. ගිරි ප්‍රමුඛ ජෛන නිගණ්ඨයෝ

ඈ. මිථ්‍යා දෘෂ්ටික පූජකවරු

ඉ. පරිබ්‍රාජක තාපසයෝ

ඊ. ආජීවකයෝ

උ. බ්‍රාහ්මණයෝ

12. වංශවතුන්ට හා කාන්තාවන්ට මන්දිර

අ. රජුගේ කිරි මව

ආ. කාලවේල නම් වංශාධිපතියා

ඇ. චිත්තරාජ නම් වංශාධිපතියා

13. මහාමාර්ග

14. අපද්‍රව්‍ය ගෙන යන කාණු

15. නගරයට සහ කෘෂිකර්මය සඳහා ජලය සපයන ජලාශ

අ. ජයවාපි

ආ, අභයවාපි

ඇ, ගාමිණීවාපි (Silva 2000 :53-54).

ඒ අනුව පණ්ඩුකාභය රාජ යුගයේ දී අනුරාධපුර භූ දර්ශනය නගරය, වෙළඳාමට වෙන් කෙරුණු මධ්‍ය ප්‍රදේශය, නගරයට පිටත ජලාශ හා ගොවිජනපද මෙන් ම කෘෂිකාර්මික භූමිය හා නගරයේ කුදු මහත් කටයුතු සිදු කළ දැසි දස්සන් සඳහා





වෙන් කෙරුණු ජනාවාසවලින් යුක්ත කවවල පිහිටි බව මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය.

ලේඛනගත ප්‍රභවයන්ට අනුව අනුරාධපුර සංස්කෘතික විකාශනයේ හා භූ දර්ශනයේ මී ළඟ සමය වන්නේ මුටසීව රජුගේ රාජ්‍ය කාලයයි. මූලාශ්‍රයගත තොරතුරු අනුව පණ්ඩුකාභයගේ සැත්තෑ අවුරුදු පාලනයෙන් පසු ව (*මව*.x:106) රජ බවට පත්වන මුටසීව රජු (එම:01). අනුරාධපුර නගරයේ මහාමේඝ වන උද්‍යාන නමින් උයනක් කර වූ බව සඳහන් වේ (එම :2-3). උයන බිම් ගන්නා දවස නොකල් මහවැයි වැස්ස බැවින් **මහාමේඝවන** නමින් අර්ථ දැක් වූ බව එහි විස්තර කර ඇත (එම :3-4). මුටසීවගේ රාජ්‍ය පාලන කාලය සැට වසක් බව ද (එම). ඒ රජුගේ අභාවයෙන් පසු ඔහුගේ පුතුන් දස දෙනා අතරින් දෙ වැනි පුත්‍රයා වූ දෙවනපෑතිස් පිය රජු මරණයෙන් පසු ව අනුරාධපුරයේ රජ වූ බව ද මූලාශ්‍රයවල සඳහන් වේ (එම :5-6). ලේඛනගත ප්‍රභවයන්ට අනුව අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව අධ්‍යයනයේ දී දෙවනපෑතිස් රජුගේ රාජ්‍ය කාලය අතිශයින් ම වැදගත් වේ. ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී අශෝක අධිරාජ්‍යයා විසින් බුදු දහමේ දැනුම මෙ රට ජනතාවට බෙදා දීම සඳහා තම පුතණුවන් එවීමෙන් අනතුරු ව අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ පැවති නගර සැලසුම තුළ ප්‍රබල වෙනස් කමක් සිදු වූ බව පෙනේ (*මව*.xiii:20). ක්‍රිස්තු පූර්ව තුන් වැනි සියවසේ දී බුදු දහම හඳුන්වාදීමත් සමඟ ම සිදු වූ නගර වර්ධනයට පූර්වයෙහි නගර සැලසුම්කරණය පිළිබඳ ව ප්‍රධාන සම්මුති කිහිපයක් මතු වී තිබුණ බව අවධාරණය කිරීම වැදගත් වන අතර එහි දී පවුරින් වට වූ නගරයේ රජ මාළිගාව, පරිපාලන සහ වෙළඳ මධ්‍යස්ථාන පමණක් ස්ථානගත ව තිබී ඇත. අනිකුත් සියලු ම ජනාවාස ආගමික වුවත් නැතත්, භික්ෂූන් වහන්සේලා හෝ නිගණ්ඨයින් සඳහා වුවත්, වංශාධිපතීන්ට හෝ වහලුන්ට වුවත් ඒවා පිහිටා තිබුනේ පවුරින් පිටත ය. නගරය ඇතුළත තිබුයේ තෝරාගත් ආගමික සිද්ධස්ථාන කිහිපයක් හා රජුගේ ආරක්ෂාව, පුදපූජා කටයුතු සඳහා වෙන් කෙරුණු ගොඩනැගිලි ස්ථානගත වී තිබිණ (Silva 2000:54).

ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ වන විට අනුරාධපුර නගරයේ ස්ථානගතවන බෞද්ධ විහාරාරාම නගරයේ දොරටුවලින් දුනු 500 ක් දුරින් පිහිටි බව සිල්වා පෙන්වා දී තිබේ (එම). අශෝක අධිරාජ්‍යයාගේ පුත් මහින්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන්ට දේවානම්පියතිස්ස රජතුමා විසින් විහාරාරාම ඉදි කිරීම සඳහා නගරයේ දකුණු දිග දොරටුවේ සිට දුනු 500 ක් දුරින් භූමි භාගය වෙන් කර දී ඇත (එම :51). දුනු 500 ක් යනු කොපමණ දුරක්දැයි විග්‍රහ කරන බෂාම් එය විතස්ති එකකට (අඟල් 09)කට හෝ දණ්ඩ 1 කට (අඩි 6 කට) සමාන වන බැවින් දුනු 500 අඩි 3000කට සමාන බව ප්‍රකාශ කර ඇත (Basham 1956 :503). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයට අනුව දුනු එකක් රියන් 4 කට (අඩි 6 කට) සමාන කරන අතර දුනු 500 අඩි 3000 කට සමාන කරයි (ශ්‍රිසුශබ්කෝ :462). මෝනියර් විලියම් ද දුනු 1 ක් රියන් 4 කට (අඩි 6 කට) සමාන කරන අතර දුනු 500 අඩි 3000 කට සමාන කර දක්වයි (Wiliams 1964:509).

ථූපවංසයේ විස්තර කරන ආකාරයට බුදු දහම මෙ රටට විධිමත් ලෙස හඳුන්වාදීමෙන් පසු සංඝමිත්තා තෙරණිය විසින් බුද්ධගයාවේ සිට ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් මෙ රටට රැගෙන ආ අවස්ථාවේ එය රෝපණය කරනු ලැබුවේ ද පුරයේ දකුණු දොරටුවේ සිට දුනු 500 ක් දුරිනි (ථුව.72). ප්‍රාකාරයෙන් හෝ නුවර දොරටුවෙන් පිටත ආරාමයන් ඉදි කිරීම විනය නීතියක් බව විසුද්ධිමග්ගයේ සඳහන් වේ (ශ්‍රීසුමශබ්කෝ :462). මෙ රට පළමු වැනි ආරාමය ඉදි කිරීමේ දී අනුරාධපුරයේ භාවිත කළ මෙම මිනුම විදේශීය පාලනයට ශ්‍රී ලංකාව නතු වීමට පෙර අන්තිම අගනුවරෙහි අස්ගිරි විහාරය ආරම්භ කිරීමේ දී සිරිතක් වශයෙන් භාවිත කර ඇත (සිල්වා 1998 :297). මෙසේ ආරම්භ වන බෞද්ධ ආරාම හා නුවර ප්‍රාකාරයෙන් පිටත පිහිටි උද්‍යාන සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් සමන්විත ව ශත වර්ෂ ගණනාවක් තුළ මුල් බැසගන්නා ආකාරය හඳුනාගත හැකි අතර ඒ ඔස්සේ අනුරාධපුර නගරය වටා ගොඩනැඟෙන්නා වූ භූ දර්ශනය පුරාවිද්‍යාත්මක සාධක තුළින් ද හඳුනාගත හැකි ය.





අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ භූ දර්ශනයේ පුළුල් වෙනසක් සිදු වන්නේ දෙවනපැතිස් රජු දවස මිහිඳු මාහිමි (*මව*..xiv:20) අනුරාධපුරයට සැපත් වීමෙන් අනතුරු ව ය (එම .xiii 42-45). මහරහතන් වහන්සේ අනුරාධපුරයට සැපත් වූ මුල් දිනයේ දී රජ මාළිගයේ පිරිසට ධර්මය දේශනා කොට (එම xiv:50-64). ඉන් පසු උන්වහන්සේ නන්දන උයනට පැමිණ තිබේ (එම xv:1-3).

ලේඛනගත තොරතුරුවලට අනුව නගරය ආසන්නයේ උද්‍යාන දෙකක් තිබී ඇත. ඉන් පළමු වැන්න මහාමේඝ උයනයි (එම. xi:03). දෙ වැන්න නන්දන උයනයයි (එම. xv:1-3).[5]

නන්දන උයන අනුරාධපුර නගරයට දකුණු පසින් මහාමේඝ වනයේ පැදුම් දොර (නැගෙනහිර දොරටුව) ආසන්නයේ පිහිටුවා තිබූ බව මහාවංසයේ සඳහන් වේ. මහාවංසයට අනුව ධර්මය දේශනා කරන ලද මිහිඳු මහරහතන් වහන්සේ නන්දන උයනේ දකුණු දොරින් නික්ම මහාමේඝ වනයේ පැදුම් දොරටුවෙන් එම උයනට ප්‍රවිෂ්ට වී ඇත (*මව*..xv:11-12). නන්දන උයන තුළ විසීමට රජතුමා මහතෙරුන්ට ආරාධනා කළ විට මහරහතන් වහන්සේ එය ප්‍රතික්ෂේප කර ඇත්තේ නන්දන උයන නුවරට ඉතා ආසන්න ව පිහිටන බැවින් ඝෝෂාකාරී බවින් යුක්ත නිසා එහි වාසය කළ නොහැකි බව ප්‍රකාශ කරමිනි (එම xv:8-10). මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව අනුරාධපුර දක්ෂිණ ප්‍රදේශයේ භූ දර්ශනය පිළිබඳ ව විමසීමේ දී පැහැදිලි වන්නේ නන්දන උයන නගරයේ දකුණු දිග දොරටුවෙන් දකුණින් පිහිටි උයනක් බව ය. (*මව*.xv:01*තදීව*.xv:11*තසපා*.83:71), පණ්ඩුකාභය රජ යුගයේ දී එ නම් ක්‍රි.පූ. හතර වැනි සියවසේ දී වර්ධනය වූ අනුරාධපුරය (*මව*. x:83-102) ක්‍රි.පූ තුන් වැනි සියවස පමණ වන විට දී තවත් වර්ධනය වූ බව නගරය හා සම්බන්ධ මාර්ග ජාලය පිළිබඳ ව සඳහන් වන්නා වූ තොරතුරු තුළින් ද පැහැදිලි වේ. එහි භූ දර්ශනය ගොඩනැඟී පැවති ආකාරය අධ්‍යයනය කිරීමේ

5 මහා නන්දන නාම උයානං දක්ෂිණ පුරෙ (*දීව*. xiii:11).
දක්ෂිණ දවාරෙ දවාරතො බහි *මව*. xv:01)
දක්ෂිණ දවාරයෙ නනදන වන උයජානෙ (*සපා*. 83:71).

දී ඇතුළුනුවර දකුණු දොරටුවේ සිට දකුණට දිව ගිය මාර්ගය තිසාවැව, ඉසුරුමුණිය හා වෙස්සගිරිය ඔස්සේ මලය රටට ගමන් කර තිබේ (සද්ධර්මාලං.539). පසු කලක දී දුටුගැමුණු රජතුමා ද මෙම ගමන් මාර්ගය රාජ චාරිත්‍ර සඳහා තිසාවැවට යාමට භාවිත කර ඇත (*මව*..xxvi:07). එසේ ම වේළුසුමන යෝධයා සම්බන්ධ කතා පුවතකට අනුව ඔහු දකුණු දොරටුවෙන් දකුණින් පිහිටි කුඹල් ගමෙන් කලයක් රැගෙන තිසා වැවට ගොස් තිබේ (Ratnayake 1984:06). මෙම කතා පුවත අනුව පැහැදිලි වන්නේ අනුරාධපුර නගරයේ සිට දකුණට දිව ගිය මාර්ගය මහාමේඝ වනය හා නන්දන උයන අතරින් ගමන් කළ මාර්ගයක් බව ය.

මහාවංසයේ සඳහන් නගරයේ මාර්ග පිළිබඳ ව වන පුවතකට අනුව රජ වීදිය පිළිබඳසඳහන් වේ. මිහිඳු මහරහතන් වහන්සේ පිරිනිවන් පෑමෙන් අනතුරු ව සෑගිරියේ සිට ශ්‍රී දේහය අනුරාධපුරයට වැඩමවා අලංකාර කරන ලද රජ වීථිය දිගේ ගෙන ගිය බව එහි විස්තර කර ඇත.[6] රජ වීථිය ඔස්සේ ගෙන ගිය ශ්‍රී දේහය මහා විහාර සීමාව තුළ උපෝසථ ශාලාව හා දාන ශාලාව අතර ස්ථානයක් වූ **පන්හම්බ මාලකයේ** තැන්පත් කර උපහාර දක්වා තිබේ (*මව*.xx:36-41). අවසන් ගෞරව දැක්වීමෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී දේහය රැගත් රන්සිවි ගෙය මහාථූපය එ නම් ථූපාරාමය පැදකුණු කිරීමට සලස්වා අනතුරු ව තිස්සාරාමයට නැගෙනහිර ස්ථානයක දී ආදාහනය කර ඇත (එම:41-50). තිස්සාරාමය යනු මිහිඳු මහරහතන් වහන්සේ වැඩවිසූ අරාමයයි. ආදාහන උත්සවයට සහභාගී වූ නගරවාසීන් නගරයේ නැගෙනහිර දොරටුවෙන් පැමිණුණහ. අනුරාධපුර නගරයේ නැගෙ නහිර දොරටුව හා සම්බන්ධ වූ මාර්ගය කඩක චෛතිය හරහා කොළොම්හොය එතෙර කොට නැගනෙහිර ද්වාරයට සම්බන්ධ වූ බව වංසකතාවේ සඳහන් වේ (*මව*.xvii:24-29). මේ මාර්ගය සුමන සාමණේර හිමි දකුණු අකු ධාතුව රැගෙන ඒමට ද භාවිත කර ඇත (එම:6-29). මහා සීමාව සලකුණු කරන විස්තරයේ ද මල්වතු ඔය බටහිර ඉවුරට සමීප ව දිව ගිය තවත් මාර්ගයක් ගැන සඳහන් වේ (එමxv:188-209). එම මාර්ගය කුම්බකාර ග්‍රාමය

6 අලඞ්කතෙන මගගෙන බහුධාඞ් ලකතං පුරං
ආනයිත්වාන නගරෙ චාරෙත්වා රජවීථියා (*මව*.xx:38).





අසළින් බටහිරට පැමිණි අතර එය ප්‍රධාන මාර්ගයකට සම්බන්ධ වී ඇත (එම). මෙම විස්තරයන්ට අනුව ක්‍රි.පූ.තුන් වැනි සියවස පමණ විට නගරය හා සම්බන්ධ වූ පුළුල් මාර්ග පද්ධතිය පිළිබඳ ව තොරතුරු මූලාශ්‍රයවල සඳහන් වන බැවින් එය ඍජුව ම නාගරික භූ දර්ශනය ගොඩනැගීමට මඟ පාදන්නට ඇතැයි ලේඛනගත තොරතුරු අනුව උපකල්පනය කළ හැකි ය.

පුරාණ අනුරාධපුර භූ දර්ශනය පිළිබඳ ව සාකච්ඡා කිරිමේ දි මහාසීමාව සම්මත කිරීම පිළිබඳ ව දක්වා ඇති විස්තර ඔස්සේ ද එහි භූ දර්ශනය ගොඩනැගී තිබූ ආකාරය හඳුනාගැනීමට අවකාශ සැලසේ. මහාමේඝ වනය මහින්ද මහරහතන් වහන්සේට පිළිගැන් වූ රජතුමා ලංකාවේ බුදුසසුන පිහිටියේ දැයි විචාරන ලදි(*මව*..xv:17-18). එවිට උන්වහන්සේ විසින් උපෝසථ, උපසම්පදා ආදී සංඝකර්ම කිරීමට බුදු අණින් සීමාවක් බැන්ද වූ පසු සාසනය පිහිටන්නේ යැයි රජුට පවසා ඇත (එම. xv:178-181). මහා සීමාව බැඳිය යුත්තේ පුරය ද ඇතුළු කොට බව මහතෙරුන් රජතුමාට ප්‍රකාශ කර තිබේ (එම.xv:183-184). ඒ අනුව රජතුමා විසින් සතර වැනි දිනයේ දී උත්සව ශ්‍රියෙන් සීමාව බැඳීම සඳහා නුවර සහ වීථි සරසා සිව්රඟ සෙනඟ සමඟ තිස්සාරාමයට ගොස් මිහිඳු මාහිමියන් වැඩමවා ගෙන සීමා මග සළකුණු කිරීමට තෝරාගත් ආරම්භක ස්ථානය වන ගංතොට වෙත ගොස් මහා පදුම හා කුඤ්ජර යන ඇතුන් දෙදෙනා බැඳි රන් නගුලක් උපයෝගී කර සීමාව බඳවා ඇත (එම.xv:83-191). මහාසීමාව සම්බන්ධ තොරතුරු මහාවංසය. සිංහල බෝධිවංසය. දීපවංසය වංසත්ථපකාසිනිය, මහාබෝධිවංස ගැටපදය ආදී ග්‍රන්ථවල අන්තර්ගත ව ඇත. මහාවංසයේ සඳහන් වන ආකාරයට හා ගැටපදයේ සඳහන් වන ආකාරයට මිහිඳු මහරහතන් වහන්සේ මුලින් ම පිහිට වූ සීමාව **මහාසීමාව** යනුවෙන් හැඳින්වේ.[7]

7 මහාසීමාව කදම්භ නදියේ පාෂාණ තිත්ථයෙන් ආරම්භ කොට, කුම්භකාර ආවාට, මහ දූව, කුඹුක් පෙළ, මහ මළුව, කුඳුමීරුක, මුරුත පොකුණ, විජයාරාම නම් උයනේ උතුරු දොර කොටුව, ගජකුම්බ ගල, කොග්ගල, මහාසෝන මැදට, දිගු පහණට ගොස් කම්මාර දේවතාවගේ බඩහැලට වටින් නුග මළුවට, දියවස් බමුණාගේ දෙවොළට, එතනින් නෙලුම් පොළට, තාල චතුස්තකයට, අස් මඬුල්ලට, එයට වමින් සස වනයට එතනින් බොරළු තොටට එතනින් පහණ තොටට නැවත පැමිණ සීමා නිමිති ගලපා ඇත (එම xv:200-210).

මහාසීමා ගමන් මග ආරම්භ කරන්නේ පාෂාණ තිත්ථයෙනි. එය මූලාශ්‍රයවල විග්‍රහ කර ඇත්තේ **පහණ තොට** ලෙස ය (එම xv:200). පහණ තොට කොළාම්හොයේ පිහිටි තොටුපලකි. අනුරාධපුර නගරයට නැගෙනහිර පසින් ගංගාවෙන් එතෙර විය යුතු ස්ථානයක පාෂාණ තිත්ථය (පාෂාණවලින් යුත් තොටුපලක්) තිබිය යුතු ය. මහාවංසයේ හා මහාවංස ටීකාවේ විස්තර වන ආකාරයට පුරයේ නැගෙනහිරින් වූ මාර්ගය මල්වතු ඔය එතෙර කර පැමිණ තිබේ. එම මාර්ගය සුමන සාමණේර හිමි විසින් දකුණු අකු ධාතුව රැගෙන ඒමට ද භාවිත කර ඇත (*මව*.xvii:24-29). මහින්ද මහරහතන් වහන්සේ අනුරාධපුරයට වැඩම වූ පළමු දිනයේ දී නැවත සැගිරියට (මිහින්තලයට) යාමට භාවිත කරනු ලැබුවේ ද මෙම මාර්ගයයි (එම xv :11). ඒ අනුව පහණ තොට යනු ගඟින් නැගෙනහිර ප්‍රධාන ප්‍රවේශය හා සම්බන්ධ වූ ස්ථානය වන අතර එම ස්ථානය සීමා සළකුණු කිරීමේ දී ප්‍රධාන ස්ථානය වශයෙන් සඳහන් වී තිබීමෙන් පුරාණ භූ දර්ශනයේ වැදගත් ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි ය.

මින් පසු මහා සීමාව ගමන් කර ඇත්තේ කුම්භකාරාවාට නම් ස්ථානයට ය (එම xv:201) මහාබෝධිවංසයේ මෙය විග්‍රහ කර ඇත්තේ කුඹල් වල ලෙස ය (*මබෝව* :101). කුඹල් වල යනුවෙන් විග්‍රහ වන්නේ මැටි මෙවලම් කර්මාන්තයේ නියැලුනු පිරිස මැටි හාරා ගත් ස්ථානය ය. මහබෝධිවංස ගැටපදයේ සඳහන් තොරතුරු විමර්ශනය කරන හෙට්ටිආරච්චි මෙම පෙදෙස ශ්‍රී මහා බෝධි ශාඛාව ලංකාවට රැගෙන ඒමේ දී මෙ රටට පැමිණි බෝධිගුණ කුමාරයාට ජයමහලේනා තනතුර ලබා දී පදිංචි කළ ස්ථානයට නුදුරු තැනක පිහිටන බව පෙන්වා දී තිබේ (*Ac*.No.06:23). ඒ අනුව කුඹල් බොහොරුවේ පිහිටීම තිස්සාරාමයටත්, මහමෙව්නාවේ නැගෙනහිර දොරටුවත්, ශ්‍රී මහා බෝධියටත් නැගෙ නහිරින් පිහිටි බව හෙට්ටිආරච්චිගේ මතයයි. වංසකතාවල හා එහි ටීකාවල සඳහන් වන විස්තරයන්ට අනුව කුඹල් ගමට දකුණු පසින් නන්දන උයන පිහිටා තිබේ (වංසපකා. xv:01). මෙය ඉතා ම වැදගත් වන්නේ ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ දී නගරය අවට ජනාවාස රටාව හා එහි ස්ථානගත ව පැවති





ශිල්ප නිෂ්පාදන ජනපද පිළිබඳ ව අදහසක් ලබාගත හැකිවන බැවිනි. විශේෂයෙන් ම කුඹල් ගම යනු මැටි මෙවලම් නිෂ්පාදන කර්මාන්තයේ නියැළුනු පිරිස් ජීවත් වූ ගම වේ. එ වැනි ගමක් ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ දී නගරයේ දකුණු දිග ක්‍රියාත්මක වූ බව සඳහන් වීමෙන් ඔවුන්ගේ ක්‍රියාවලිය මැටි මෙවලම් තැනීම සිදු කිරීම බව කුම්භකාර ආවාට, කුඹල් බොහොරුව, කුම්භකාරගම ආදී වචනවලින් පැහැදිලි වේ.

කුඹල් බෙහොරුවේ සිට සීමාව මී ළගට ගමන් කර ඇත්තේ මහානීපපාදපයට ය. මෙය මහානිපරුඛ ලෙස සිංහල බෝධිවංසයේ විස්තර වේ (*මබෝව*.180). මහානිපරුඛ බෝධිවංසය විස්තර කරනුයේ මහ බක් මී රුක ලෙස ය (එම). සිංහල බෝධිවංසය රචනාකරන සමයේ දී මෙම ස්ථානය **මහපියන්ගල් තොට** එ නම් කොළොම් වනයේ වූ පධානඝර අසළ වූ තොට වශයෙන් ව්‍යවහාර කර තිබේ (*Ac*.No.06:24). එහි කොළොම්හොයට සමාන්තර ව ගලාගිය ඇළ මාර්ගයක් පිළිබඳ ද සඳහන් වේ (එම). මහාවංසයේ සේන ගුත්තික සමයේ දී නිර්මාණය කරන ලද ඇළක් පිළිබඳ ව සඳහන් වන බැවින් මුල් කාලීනව ද ජලය ලබා ගැනීම සඳහා එ වැනි ඇළක් ක්‍රියාත්මක වූවා යැයි උපකල්පනය කළ හැකි ය.[8]

එසේ ම **කොළොම් ඇළ** නම් වාරි ඇළක් පිළිබඳ ව සාධක සඩ වැනි මිහිඳු රජුගේ වෙස්සගිරියේ ශිලා ලේඛනයක ද එයි. එහි සඳහන් වන ආකාරයට තිසා වැවෙන් ඉසුරුමුණියේ පිහිටි කුඹුරුවලට දෙන ජලය නිකරුණේ කොළොම් ඇළට මුදා නොහරින ලෙස දක්වා ඇත (*Ez*.Vol.i :32). I වැනි පරාක්‍රමබාහු රජුට අයත් ශිලා ලිපියක ද මෙම කොළොම් ඇළ පිළිබඳ ව සඳහන් වේ (*Ep.Nots*. No. 13). මෙම තත්ත්වයන් අනුව බක් මී රුක ලෙස මහා සීමා ගමන් මග තුළ හඳුන්වන්නා වූ ස්ථානය පසු කාලීන ව විවිධ කර්තව්‍යයන් සඳහා භාවිත වූ ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි අතර මහාසීමාව බඳවන සමයේ දී එය වැදගත් ස්ථානයක් වශයෙන් පැවති බව උපකල්පනය කළ හැකි ය.

8 සෙනිඥගුතත රජජ මහි දමිළා දකසුදධිකං
නදිං දූරනති බනධිතවා නගරාසනනමකංසු ත තං (*මව*..xv:206-207).

මහා සීමා විස්තරයේ මීළඟට සඳහන් වන්නේ **කකුධපාලිය** නම් ස්ථානයයි. එයින් විග්‍රහ වන්නේ කුඹුක් පෙළ යන්නය. කුඹුක් පෙළින් අනතුරු ව මහා අංගරුක්ඛ නම් ස්ථානයට ද ඉන් පසු මරුත්තපොක්ඛරනි (මුරුත පොකුණට ද) සීමා ව ගිය බව සඳහන් වේ. මුරුත පොකුණ යනු මෙත්ගිරි වෙහෙරේ වූ පොකුණ බව විග්‍රහ කරන හෙට්ටිආරච්චි එයින් ගල් පර්වතයක පිහිටි වෙහෙර යන්න ගම්‍ය වන බැවින් මෙම ස්ථානය වර්තමාන ඉසුරුමුණිය පිහිටන ස්ථානය විය හැකි බව පෙන්වා දී තිබේ (*Ac*.No.06:26).

මුරුත පොකුණේ සිට මහා සීමාව විජයාරාම උයනේ උතුරු දොරකොටුවට ද (*මව.* xv:201) එතනින් ගජකුම්භ පාෂාණයට ගිය බව විස්තර වේ. ගජකුම්භ යන්නෙන් ඇත් හිසක හැඩය ඇති ගල්තලාවක් ගම්‍ය වන බව හෙට්ටිආරච්චිගේ මතයයි (*Ac*. No.06:27). මින් පසු සීමාව අභය වැවේ බාලක පාෂාණය හෙවත් කොග්ගලට ගොස් ඇත (*මව.* xv:202). එතැනින් මහා සුසානයට ද ගමන් කර ඇත (එම). අනුරාධපුර නගරය නිර්මාණය කළ පණ්ඩුකාභය රජු සුසානය නගරයෙන් බටහිර පිහිට වූ බව මහාවංසයේ ද සඳහන් වේ (*මව.* x:88).

මහාසීමා විස්තරයට අන්තර්ගත භූ දර්ශනය පිළිබඳ ව අධ්‍යයනය කිරිමේ දී දීඝ පාෂාණය පිළිබඳ ව සඳහන් කිරිම ද වැදගත් වේ (*මව*..xv:203). බෝධිවංස ගැටපදයේ මෙය විස්තර වන්නේ **දිගුගල්විල** යනුවෙනි (බෝවංගැ.114). වර්තමානයේ වෙස්සගිරියේ සිට අභයගිරි විහාරය මැදින් දැකගත හැකි පාෂාණය දීඝ පාෂාණය නමින් ව්‍යවහාර වේ. දිඝ පාෂාණයට සමාන්තර ව පිහිටන වැව වන්නේ අභය වැවයි. එයට බටහිරින් ගාමිණී වැව පිහිට යි. මහාවංසයේ පණ්ඩුකාභය රාජ යුගයේදී එ රජු විසින් විල කනවා බොහෝ දිය ඇතිකර ජයවැව ඉදි කළ බව සඳහන් වේ (*මව*.x:84). ජය වැව යනු අභය වැව බව උපකල්පනය කළහොත් මහා සීමාවේ බටහිර සීමාව බොහෝ විට දීඝ පාෂාණය වූ බවට අදහසක් මෙ මඟින් ඇති කරගත හැකි ය.

මින්පසු සීමාව ගමන් කර ඇත්තේ **කම්මාර දේවතාවාගේ විමානයට** පිටුපසින් ය. කම්මාර දේවතා යනු ලෝකුරුවන්ගේ





දේවතාව ලෙස හඳුන්වනු ලැබේ (*Ac*.No.06 :31). එම තොරතුරු අනුව ලෝකුරුවන් පිළිබඳ සඳහන් වන බැවින් ලෝහ කර්මාන්තයට සම්බන්ධ ජනාවාස තොරතුරු භූ දර්ශනයට ඇතුළත් වී තිබීම ද සැලකිය යුතු ය. කම්මාර දේවතා විමානයට පසු මහා සීමාව නීච සුසානයට ගිය බව සඳහන් වේ. පණ්ඩුකාභය රජ දවස නීච සුසානය සැඩොල්ගමට ඊසාන දිගින් පිහිට වූ බව විස්තර වේ (*මව*..x:93-95). මෙය වැදගත් වන්නේ අනුරාධපුර පැරණි නගරයේ ජනාවාස ස්ථානගත කිරිමේ දී අවමඟුල් සඳහා වෙන ම භූමි පිහිටුවා තිබීම හඳුනාගත හැකි වන බැවිනි.

මහාසීමා ගමන් මගේ මීළඟ වැදගත් ස්ථානය වී ඇත්තේ සීමා නිග්‍රෝධයයි (මව.ං:89). මහාබෝධිවංස ගැටපදය විග්‍රහ කර ඇති ආකාරයට සීමා නිග්‍රෝධය පිහිටන්නේ මස්තොට පිරිවෙන නම් ස්ථානයේ ය (*Ac*.No.32). මාස්තොට පිරිවෙන පිළිබඳ ව ශිලා ලේඛනවල ද සටහන් වී ඇත (*Ez*.Vol.i:218). මින්පසු තිස්සාරාමය වෙත සීමා මඟ ගොස් ඇත්තේ නීච සුසානයට නැගෙනහිරින් බව සඳහන් වේ (*මව*.x:91). හෙට්ටිආරච්චි විස්තර කර ඇති ආකාරයට මස්තොට පොකුණට නැගෙනහිරින් ඇති ස්ථානය තුළ වර්තමාන ලංකාරාමය පිහිටන බැවින් මෙම වෙහෙර පුරාණයේ දී **මණිසෝමාරාමය** (*මව.* xxxvi:8-9) වශයෙන් හඳුන්වා ඇත. ඒ අනුව වර්තමාන ලංකාරාමය පිහිටන තැන **ජෝතිය නිගණ්ඨාරාමය** මුලින් පිහිටා තිබූ බව ඔහු පෙන්වා දී ඇත (*Ac*. No.06:35).

මහාසිමා විස්තරයේ මින්පසු **අස්මඬල, මරුම්භතිත්ථනම් තොටුපල, ද්විකදම්භ නම් මල කොලොම්හොය** ආදී විස්තර සඳහන් වන අතර ඉන් පසු නැවතත් කොලොම්හොයට පැමිණ සීමාව අවසන් කළ බව සඳහන් වේ (*මව*.xv:203-210). මහාසීමා විස්තරයට අදාළ ව ස්වභාවික වස්තූන් වන පාෂාණ, රුක්ඛ මෙන් ම සංස්කෘතික වැදගත්කම් ඇති විවිධ ආරාම, වැව්, ජනපද ආදිය පිළිබඳ ව වැදගත් විස්තරයක් අතිශයෝක්තිය ඉවත් කළ විට අනුරාධපුර නගරයේ පිහිටි බව හඳුනාගත හැකි ය. ඒ අනුව පුරාණ අනුරාධපුරය තුළ ක්‍රි.පූ. තුන් වැනි සියවස වනවිට භූ දර්ශනය යම් කිසි හැඩ ගැසීමකට ලක් වූ ප්‍රදේශයක් වශයෙන්

වංසකතා දක්වන විස්තර අනුව ද අවබෝධ කර ගත හැකි ය. අනුරාධපුර නගර සැලැස්මේ මේ සමය තුළ රජමාළිගය සහ වෙළඳ මධ්‍යස්ථානය මහා සීමාව මධ්‍යයේ පිහිටා තිබී ඇත (Silva 2000:54). අනෙක් සියලු ම ජනාවාස හා ආගමික ස්ථාන පිහිටා තිබුණේ පවුරින් පිටත ය (එම :55). නගරය ඇතුළත තිබුණේ තෝරාගත් ආගමික සිද්ධස්ථාන කිහිපයක් පමණි (එම). සියලු ම බෞද්ධ විහාරාරාම පිහිටා තිබුණේ නගරයේ දොරටුවලින් දුනු 500 ක් ඈතිනි (එම). මහාසීමාව සළකුණු කිරීමෙන් අනතුරු ව මහා විහාරයේ අභ්‍යන්තර සැලැස්ම මාලක 32කට බෙදා දැක්වීම ද මහින්ද මහරහතන් වහන්සේ විසින් සිදු කර ඇත (*Mv*..xv:132-144).

පණ්ඩුකාභය රජතුමා නගරයට ජලාශ ද ගොවි ජනපද සහිත භූමි වළල්ලක් ද වෙළඳ මට වෙන් කෙරෙනු මධ්‍ය ප්‍රදේශයත් නිර්මාණය කිරීමෙන් පසු ව බුද්ධාගම පැමිණීමත් සමඟ නගරයෙන් පිටත උද්‍යාන භූමියේ සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් සමන්විත ප්‍රධාන විහාරාරාම වළල්ලක් ගොඩනැගී ස්ථානගත විය (Silva 2000: 55). මෙම විහාරාරාම පද්ධති දියුණු වන්නට ශත වර්ෂ ගණනාවක් ගත වූ නමුදු එක්තරා සැලැස්මක් අනුව ඒවා වර්ධනය වූ ආකාරය හඳුනාගත හැකි වේ. විශේෂයෙන් ම අනුරාධපුර නගරයේ දැකගත හැකි මෙ වැනි විහාර පද්ධති

i. ලෙන් විහාර

ii. මහා විහාර

iii. පබ්බත විහාර (පංචාවාස ආරාම සැලසුම්)

iv. පධානඝර විහාර (වනවාස ආරාම සැලසුම්) වශයෙන් භූ දර්ශනයට එක් වී ඇත (සිල්වා 1998:298-310).

පුරාණ අනුරාධපුර නගරයේ භූ දර්ශනය මූලාශ්‍රයගත තොරතුරු ඔස්සේ අධ්‍යයනයේ දී එහි ස්ථානගත වන පුරාණතම විහාර වර්ගය ලෙස ලෙන් විහාර හැඳින්විය හැකි ය. සාහිත්‍ය මූලාශ්‍රය කිසිවක ලෙන් විහාර පද්ධති මුලින් ම ආරම්භ වූ බව සඳහන් නොවේ. නමුත් අභිලේඛනමය සාධක අනුව පුරාණ





අනුරාධපුර නගරය ආශ්‍රිත ව ආරම්භ වූ මුල් ම විහාර වර්ගය ලෙස ලෙන් විහාර හැඳින්විය හැකි ය. දැනට සිදු කෙරී ඇති අභිලේඛනමය අධ්‍යයනයන්ට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු මෙම විහාර වර්ගය අනුරාධපුර පැරණි නගරයේ ආරම්භ වන බව පෙනේ. ඒ අතර වෙස්සගිරිය, ඉසුරුමුණිය, අභයගිරිය ආශ්‍රිත ව පැරණිත ම ලෙන් විහාර වේ. දැනට සිදු කර ඇති අභිලේඛන අධ්‍යයනයන්ට අනුව වෙස්සගිරියේ හා අභයගිරියේ දැකගත හැකි ගුහා කටාරයට යටින් ඇති ක්‍රි.පූ. තුන් වැනි සියවසට පසු කාලයට අයත් බ්‍රාහ්මී ලිපිවලින් බෞද්ධ භික්ෂූන්ට සිදු කරන ලද ලෙන් ප්‍රදාන පිළිබඳ ව සඳහන් වේ (*Ic*.Vol.i 76-93; *ASCAR*. 1909;05). ජලය ගුහාව තුළට ඒම වැළැක්වීමට සකස් කරන ලද කටාරය මුල් ගුහාවල දැකගත හැකි අතර මධ්‍ය ඓතිහාසික අවධිය වන විට ගුහාවට බිත්තිය සහිත පියැස්සක් එක් වී ඇති බව හඳුනාගත හැකි ය.

තතු එසේ වුව ද අනුරාධපුර නගරයේ බෞද්ධ ආරාම අතර පැරණිත ම ආරාම විශේෂය වශයෙන් මූලාශ්‍රයවල සඳහන් වන්නේ මහා විහාර සම්ප්‍රදායේ විහාරයන් ය. නගරයට දකුණු දිගින් මහා විහාරයත්, නැගෙනහිරින් ජේතවනයත්, උතුරින් අභයගිරියත්, බටහිරින් මිරිසවැටියත්, නිරිතදිගින් දක්ෂිණ විහාරයත් පිහිටා තිබේ (Silva 2000:55). මේ එක් එක් විහාර ගොඩනංවන ලද්දේ එක ම කාලයක නොව ශත වර්ෂ ගණනාවක් තුළ දී බව මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මහාවංසයේ දක්වා ඇති විස්තරවලට අනුව අනුරාධපුරයේ මුලින් ම ඉදිවන ආරාමය තිස්සාරාමය බව සඳහන් වේ (*මව*. xv:223). තිස්සාරාමය ඇතුළත් මහමෙව්නා උයන රජතුමා මහින්ද මහරහතන් වහන්සේට පිළිගැන්වීමෙන් අනතුරු ව එහි ඉදි වූ මුල් ම විහාරය **මහා විහාරය** වශයෙන් පසු ව ව්‍යවහාරයට පත් වී ඇත (කුලතුංග 2001:01). මහින්ද මහරහතන් වහන්සේට දේවානම් පියතිස්ස රජතුමා විසින් පූජාකරන ලද මහාමෙව්නා උයන පුරයට දකුණු දිගින් පිහිටි බව මහාවංසයේ හා දීපවංසයේ සඳහන් වේ (*මව*. xv :11-12 ; *දීව*.xiii:15). මහමෙව්නා උයන වැටකින් මනාව සුරක්ෂිත කරන ලදු ව දොරටුවලින් සමන්විත වූ බව ක්‍රි.ව. 4 වැනි ශත

වර්ෂයේ ලියැවුණු දිපවංසයේ සඳහන් වේ (දිව. xiii:15-20). එසේ ම දෙ වැනි භාතිකාභය තිස්ස රජු මහා විහාරය වටා ප්‍රාකාරයක් ඉදි කළ බව ද සඳහන් වේ (මව..xxxv:02).

මහා විහාරයේ භූ දර්ශනය අධ්‍යයනයේ දී එහි සීමා මායිම්වල පිහිටීම පිළිබඳ ව අධ්‍යයනය කිරීම ද වැදගත් වේ. එහි උතුරු සීමාව ථූපාරාමයට ආසන්න ව රුවන්වැලි සෑය දෙසට වූ බවට සාක්ෂි ඇත. මහා විහාරයත්, ථූපාරාමයත් විහාර දෙකක් බව මහාවංසයේ සඳහන් වන බැවින් (*මව.* xv:17) ථූපාරාම දාගැබේ සිට තවත් දකුණු දෙසට වන්නට මහා විහාර උතුරු සීමාව පිහිටුවා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මහා විහාරයේ බටහිර සිමාව වූයේ අභයවාපි (බසවක්කුලම) හා දකුණු සීමාව ශ්‍රී මහා බෝධියටත් දක්ෂිණ ථූපයටත් අතර බව පෙනේ. ශ්‍රී මහා බෝධියට දකුණින් යාර 150 ක් පමණ දුරින් ඇති ප්‍රාකාරය එහි සීමාව බව විශ්වාස කළ හැකි අතර ක්‍රි.ව. දෙ වැනි ශත වර්ෂයේ මළුතිස් (කනිට්ඨතිස්ස) රජතුමා මෙම ප්‍රාකාරයේ කොටසක් ඉවත් කර දක්ෂිණ ථූපයට යාමට මාර්ගයක් සකස් කළ බව මහාවංසයේ සඳහන් වේ (*මව.* xxxvi:13-14). එසේ ම මහා විහාරයේ නැගෙනහිර සීමාව ජේතවන විහාරයේ සීමාව වෙන් කෙරෙන වර්තමාන හාල්පානු ඇළට බටහිරින් පිහිටන මාර්ගය දෙසින් වන සීමාව බව හඳුනාගත හැකි ය.

පසුගිය වසර කිහිපය තුළ මහා විහාරයේ නැගෙනහිර පවුර ආශ්‍රිත ව සිදු කරන ලද කැණීම්වල දී හමුවූ ප්‍රාකාරය ඉදි කිරීමට භාවිත කර තිබූ ගල් පුවරුවක ක්‍රි.ව.6 වැනි ශත වර්ෂයට පමණ අයත් අක්ෂරයෙන් රචනා කර ඇති ලිපියක් හමුවී ඇති අතර එම ලිපියේ **දෙවනවිහරසිමි** (ජේතවනාරාමයේ සීමාව) වශයෙන් සඳහන් කර තිබීම තුළින් මහා විහාරය හා ජේතවනය නැගෙනහිර සීමාව නිර්ණය කළ හැකි ය. එසේ ම මහාවංසයේ සඳහන් වන සේන ගුත්තික විසින් නගරයට ජලය ලබා ගැනීමට ඉදිකළ දෙ වැනි කොලොම්හොය මෙම උභය විහාරවල සීමා නිර්ණයට ද බලපාන්නට ඇත (*මව.* xv:206-207). වර්තමාන හාල්පානු ඇළ වශයෙන් හැඳිනගත හැකි මෙම ඇළ ආශ්‍රිත ව ජේතවන සීමාවේ වයඹ දෙසින් ඇළ හරහා වූ පැරණි ගල් පාලමක සළකුණු දක්නට





ලැබේ (*පුවිදෙඉ.* 1890-1900:08). එම පුරාවිද්‍යා සාධක අනුව මෙම ඇළ පුරාණයේ සිට ක්‍රියාත්මක වූ බව පැහැදිලි වන බැවින් දෙ වැනි කොළොම්හොය මෙම ඇළ විය හැකි බව උපකල්පනය කළ හැකි ය. මහාවංසයේ සඳහන් වන තවත් පුවතක් අනුව ද මහසිළු මහතිස් රජු දවස **වණ්ණක මහමොවු ඇළ ද**, නුවර සත් රියනක් උස් පවුර ද, පරිඛාව ද කළ බව සඳහන් වේ (*මව.*xxxiv:33). **වණ්ණක** යන්න මගින් **වෙළඳ** යන්න ගම්‍ය වන බැවින් සේන සහ ගුත්තික සමයේ ඉදි කරන ලද මෙම ඇළ පසු ව අනුරාධපුර නගරයේ වෙළඳ කටයුතු සමඟ බද්ධ වී වණ්ණක ඇළ වශයෙන් ව්‍යවහාරයට පැමිණීමට ඇතැයි ද උපකල්පනය කළ හැකි ය. එසේ ම නගරයේ ජලය ඉවතට ගැනීමට පරිඛාව ඉදි කළ බව සඳහන් වීමෙන් නගරයේ අතිරික්ත ජලය පිට කිරිමට යෙදූ මාර්ග යක් පිළිබඳ ව ද සඳහන් වේ. වැසි සමයේ දී හෝ දෛනික නාගරික කටයුතුවල දී අතිරික්ත ජලය පිටතට යැවීමේ දී මෙ වැනි ඇළක් (වර්තමාන හාල්පානු ඇළ) නාගරික භූ දර්ශනයට අත්‍යවශ්‍ය අංගයක් වී ඇති බව පෙන්වාදිය හැකි ය.

පුරාණ අනුරාධපුර භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී වර්තමාන වෙස්සගිරිය හා ජේතවන භූමියේ ස්ථානගත වීම ද ඉතා ම වැදගත් වේ. මූලාශ්‍රයගත තොරතුරු අනුව පුරයට දකුණු දෙසින් නන්දන උයන ස්ථානගත තිබූ බව පෙනේ (*මව.* xv:1-3).[9] නන්දන උයන හා මහාමේඝ උයන අතරින් පුරය දක්වා විහිදුනු පැරණි ගමන් මාර්ගය තිසා වැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය හරහා මලය රටට ගමන් කර තිබේ (*සද්ලංකා.* 539). තිසාවැව ආසන්නයේ ඇති පැරණි බෞද්ධ ආරාමය වෙස්සගිරිය ලෙස වර්තමානයේ ව්‍යවහාර කරනු ලබයි. වර්තමාන වෙස්සගිරිය වශයෙන් හඳුන්වන ස්ථානයෙන් ලැබී ඇති ඪ වැනි දප්පුල රජුගේ ක්‍රි.ව.940-955 කාල සීමාවට අයත් ශිලා ලිපිය (*Ez*.Vol. iv :23) හා ෂඩ වැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව. 941-975) ශිලා ලිපිය අනුව ක්‍රි.ව. දස වැනි ශත වර්ෂය පමණ වන විට මෙම ස්ථානය **ඉසිරමෙනු බෝ උපුල්වන්**

9 ''මහා විහාර සීමනතො
උය්‍යානෙ ජොති නාමතො
ජෙතවන විහාරං
සො වාරියනතොපි කාරයි'' (*වංසපකා.*xxxviii:33: *මව.*xxxviii :33-34).

**කසුප්ගිරි රද්මහ වෙහෙර** ලෙස හඳුන්වා ඇත (එම). ඒ අනුව අප වර්තමානයේ වෙස්සගිරිය වශයෙන් හඳුන්වන ස්ථානය පුරාණයේ දී ඉසුරුමුණි විහාරය වශයෙන් හඳුන්වා ඇති බව පැහැදිලි වේ.

එසේ නම් වෙස්සගිරිය යන්නේ ව්‍යවහාර වන ස්ථානය කුමක් ද යන්න පිළිබඳ ව ප්‍රශ්නාර්ථයක් මෙහි දී මතු වේ. මේ පිළිබඳ ව අදහස් දක්වා ඇති පරණවිතාන මෙසේ ප්‍රකාශ කොට ඇත. **"පුරාණයේ විශ්වගිරි නමින් හැඳින්වූයේ යවකොළ නම් ස්ථානයයි. යවකොළ යන්න අද දඹුල්ල වී තිබෙන්නේ ජබකොළ, ජබෝල, දඹුල්ල වශයෙන් බිඳී ඊමෙනි. පුරාතන යුගයේ විශ්වගිරි නමින් ප්‍රකට ව පැවති එම පර්වතය මුදුනේ මාළිගාවක් ඉදි කළ හැකි නම් අන් තැනකට වඩා එතැන සුදුසු බව මහ බ්‍රාහ්මණ තවදුරටත් කීය. විශ්වගිරි යන්නෙහි අදහස් මහමෙර යනුයි** (පරණවිතාන 1969 :3-4). විශ්වගිරි යන්නෙන් වෙස්සගිරිය යන පාලි නමේ සංස්කෘත රූපය ගම්‍ය වේ. මහාවංසය අනුව මෙ නමින් ආරාමයක් දෙවනපෑතිස් රජු ඉදි කළ බව සඳහන් වුව ද එහි පිහිටීම ගැන සඳහන් නොවේ (*මව*.xx:15-20). පරණවිතාන වැඩි දුරටත් පෙන්වාදෙන ආකාරයට මිහිඳු හිමියන් අභිමුඛයේ දී සසුන්ගත වූ පන්සියයක් භික්ෂූන් වහන්සේලා එම ස්ථානයේ විසූ බැවින් වෙස්සගිරි නාමය ඉතිහාසය විසින් ව්‍යවහාර කළ ද, එය පුරාණ බෞද්ධාචාර්යයන් විසින් ඕනෑ කමින් සිදු කර ඇති දෙයක් ලෙස පෙන්වා දී තිබේ (පරණවිතාන 1969:04). වෙස්සගිරිය යන නම පිළිබඳ ව මහාවංසයේ දක්වන විස්තරයේ පාලියේ **වෙස්ස** සංස්කෘත **වෛශ්‍ය** යන්නට සමාන බවත් එහෙත් සංස්කෘත විශ්ව යන්නට සමාන ව යෙදුණ **වෙස්ස** යන පදය ද පාළියෙහි දුර්ලභ නොවන බැවින් සකු **විශ්ව මිත්‍ර** පාලි **වෙස්සමිත්ත** සමඟ ද, **වස්තු විශ්ව භූ** පාලියෙහි **වෙස්සභූ** සමඟ ද උදාහරණ වශයෙන් සැසඳිය හැකි ය. දඹුල්ල විහාරය පෞරාණික වෙස්සගිරිය හෙවත් විශ්වගිරිය යයි හත් වැනි සියවසේ ව්‍යාප්ත ව පැවති ජනප්‍රවාදය අප පිළිගතහොත්, මේ ආරාමය කරවන ලද්දේ දේවානම්පියතිස්ස රජු විසිනැයි ද අප විසින් පිළිගත යුතු වේ. දඹුල්ලේ විහාරය පෞරාණික වෙස්සගිරිය හැටියට පිළිගතහොත්, වට්ටගාමිණී අභය හා සම්බන්ධ ස්ථානය පිළිබඳ ව පවත්නා ජනප්‍රවාදය ඓතිහාසික ඒවාවලින් ගොඩනගා ගත් ඒවා ලෙස





පෙනී යයි (එම). දමිළ ආක්‍රමණිකයෝ විසින් පරාජය කරන ලද වට්ටගාමිණී අභය රජතුමා අඹුදරුවන් සමඟ වෙස්සගිරියේ සැඟ වී ගත කළ බව මහාවංසයේ සඳහන් වේ (*මව*.xxxiii:49-50).

දඹුල්ල වෙස්සගිරිය ලෙස හැඳිනගැනීමෙන් හඟවන තවත් වැදගත් කාරණයක් වන්නේ වට්ටගාමිණිගේ ඊළඟ වාසස්ථානය ලෙස සඳහන් වන සිලා සොබ්භ ඛණ්ඩය හඳුනාගැනීමට පහසු වීමයි. මහාවංසය හා මහාවංස ටීකාවේ සඳහන් වන පරිදි එය වෙස්ගිරියට දකුණින් පිහිටා තිබේ[10] (වංසපකා. xxxiii:51;මව. xxxiii:50-53). වට්ඨගාමිණී **සිලා සොබ්බ ඛණ්ඩයෙන්** ඉවත් ව ගොස් වාසස්ථානය කර ගත්තේ සාමගල්ල අසල **මාතුවේලංගය** යන ස්ථානය බව සඳහන් වේ(පරණවිතාන 1969:04). සාමගල්ල තව කාලයක දී **මොරගල්ල** ලෙස ප්‍රකට ව තිබූ බව ටීකාවේ විස්තර කර ඇත (වංසපකා. xxxi:51). මෙය මාතලේ දිස්ත්‍රික්කයේ කන්දෙ පල්ලේ කෝරලේ මොරගල්ල ලෙස හඳුනාගතහොත් (පරණවිතාන 1969 :05). සාමගල්ල මලය කඳු වැටියෙහි මිටි කඳු පෙදෙසෙහි පිහිටා ඇති ස්ථානයක් ලෙස හඳුනාගත හැකි ය(එම). දඹුල්ල වෙස්සගිරිය හැටියට හඳුනාගැනීම නිසා, එම ස්ථානයේ ඇති ලිපියක සඳහන් වන **ගමණි අබය මහරජ** වට්ඨගාමිණී අභය මිස අනෙකක් නොවන බව ද පෙනේ (එම). පරණවිතාන ප්‍රකාශ කර ඇති පරිදි විශ්වගිරි යනුවෙන් හැඳින් වූ පුරාණ නාමය දොළොස් වැනි සියවසේ දී නිශ්ශංකමල්ල **සුවණ්ණගිරි ගුහා** නමින් හඳුන්වන ලද බවත්, **සවණගිරි** ගුහා යනු **සර්වත පර්වතත්**, එ නම් **මහමේරුව** හෙවත් **විශ්ව පර්වතයේ ගුහාව** යන්න ගම්‍ය වන බැවින් පැරණි වෙස්සගිරිය දඹුල්ල වන බව පරණවිතාන පෙන්වා දී ඇත (එම).

මෙම කරුණු අනුව අනුරාධපුර නගරයේ දකුණු දිග භූ දර්ශනය ගොඩනැගීමේ දී මහාමේඝ වනය, නන්දන වනය හා දක්ෂිණ ගමන් මාර්ගය සුවිශේෂ වූ බවත්, ස්ථාන හැඳිනග ැනීමේ දී ලිඛිත මූලාශ්‍රය කරුණු අනුව පැහැදිලි වේ. මේ අනුව අනුරාධපුර දකෂිණ ප්‍රදේශයේ භූ දර්ශනය සැකසීමේ දී මුල්

10 "තන්තා ගනත්වා සිලා සොබහකටකකමහි වසී තතො
ගනත්වාන මාතුවෙලඩගෙ සාමගලලසමීපහො" (වංසපකා.xxxiii:51).

ඓතිහාසික අවධියේ (Early Historic) සිට මහා මේඝවනය, නන්දන වනය හා වෙස්සගිරියේ පිහිටීමත්, දක්ෂිණ ගමන් මාර්ග යේ පිහිටීමත් අතිශයින් ම වැදගත් වී තිබේ. මෙම පිහිටීම ඉන් පසු කාල වකවානුවල අනුරාධපුර නගරයට දක්ෂිණ දෙසින් ඉදිවන මිරිසවැටිය, දක්ෂිණ විහාරය, ජේතවන විහාරය, රන්මසු උයන ආදී ස්ථානවල සංස්කෘතික භූ දර්ශනය ගොඩනැගීමට බෙහෙවින් ම ඉවහල් වී ඇති බවත් මූලාශ්‍රය කරුණු අනුව පෙන්වාදිය හැකි ය.

දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී මහින්ද මහරහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේ බෞද්ධාගම ස්ථාපිත කිරීමේ දී භූ දර්ශනයට එක්කළ ප්‍රථම විහාරය ආරම්භයේ දී **තිස්සාරාමය** වශයෙන් හැඳින් වුව ද පසු ව එය **මහා විහාරය** නමින් ප්‍රකට විය (කුලතුංග 2001:01). මහින්ද මහරහතන් වහන්සේ විසින් ඉසින ලද මල් පතිත වීමෙන් මහා විහාරයේ පූජනීය ස්ථානගත වීම සමඟ මහා විහාර භූ දර්ශනය ගොඩනැගේ. මේ පිළිබඳ ව මූලාශ්‍රයවල අන්ගතර්ගත විස්තරවලින් පූජනීය ස්ථාන අටක් මහා විහාරයට අයත් වූ බව වංසකතාව විස්තර කර තිබේ. තිස්සාරාමය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, ජන්තාඝර පොකුණ, ලෝවාමහාපාය, ලහබත්ගෙය, දානශාලාව (චතු-ශාලව), කම්මාලකය එම පූජනීය ස්ථානයන් ය (එම:1-2).

මූලාශ්‍රයන්හි මහා විහාරයට අයත් විහාර අංග ඇතුළත් ස්ථාන දක්වා ඇත්තේ මෙසේ ය.

- පිචුල මාලක (පුලිල මළුව) - සංඝකර්ම මාලකය රජගෙට දකුණින් (*මව*.xv:29; *දීව*.xiii:35-36)
- චාරු (චාරුත්න) පොක්ඛරනී - ගිනිහල් පොකුණ (*මව*.xv:30-31;*දීව*.xiii :39-42) රජගෙයි දොරකොටුව
- (මහ මිදෙල් මළුව), ජය ශ්‍රී මහා බෝධිය උපෝසථඝරය සඳහා (*මව*. xv :36-37 හ *දීව*. xiv :60-61)
- පන්හම්භමාලකය (පැනඹු මළුව) පිරිකර ලාභ බෙදා ගන්නා ස්ථානය සඳහා (*මව* xv : 38-46 ; *දීව* xiv : 63-64)





- චතුස්ශාලාව (දන්ගෙය) (*මව*.xv :47-50).
- කකුධවාපි (කුඹුක්කනම් කදු බද ඉස්මත්ත) මහාථූපය සඳහා (මව.ංඩ :52-57).

මහින්ද මහරහතන් වහන්සේ දේවානම් පියතිස්ස රජතුමා කැටුව මල් ඉසිමින් පොළොව කම්පාවන ස්ථානයන්හි විහාරයකට අයත් ප්‍රධාන ගොඩනැගිලි ස්ථානගතවීම පිළිබඳ ව කරුණු කාරණා මෙසේ පෙන්වා දී ඇති බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. මෙම ස්ථාන තෝරා ගැනිමෙන් අනතුරු ව මුලින් ම ඉදිවන මහා විහාරයේ සැලැස්ම හා එහි ස්ථානගත වන ගොඩනැගිලි හා ගොඩනැගෙන භූ දර්ශනය මූලාශ්‍රයගත තොරතුරුවලින් මැනවින් විස්තර කර තිබේ. මිහිඳු මහ හිමියන් දේවානම්පියතිස්ස රජුට ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය ස්ථාන පෙන්වා දීමෙන් හා ඉදිවන ගොඩනැගිලි පිළිබඳ ව පහදා දීම මඟින් පසු කලෙක අනුරාධපුර ශුද්ධ නගරය හැටියට සැළකුණු මුල් ම කොටසෙහි මුල් ම සැලැස්ම හා වින්‍යාසය කරන ලද්දේ මිහිඳු හිමියන් විසින් බව පෙනේ (රාහුල 1989 :57). වංසකතාවල සඳහන් වන ප්‍රාතිහාර්යය පිළිබඳ ව විස්තර ද, මිථ්‍යා කතා ද කාව්‍යාලංකාර හා අතිශයෝක්තිය ද පැත්තකට කළ විට පැහැදිලි වන්නේ සංඝකර්ම සඳහා මාලකයක්, උණුදිය නෑම සඳහා පොකුණක්, ශ්‍රී මහා බෝධියට ස්ථානයක්, සංඝයාගේ උපෝසථ ශාලාවට ස්ථානයක්, බත්හලට සුදුසු ස්ථානයක් හා මහාථූපය සඳහා සුදුසු ස්ථානයක් පෙන්වමින් මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් රජුට පැහැදිලි කර දෙන ආකාරයයි. මෙ මඟින් අපට මහා විහාර මූලික සැලැස්ම හා එහි භූ දර්ශනය හඳුනාගත හැකි ය (එම:58).

මහා විහාරයේ ගෙඩනැගිලි ස්ථානගත වීම හා එහි භූ දර්ශනය පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන සේනක බණ්ඩාරනායක එම සැලැස්මේ සමහර ගොඩනැගිලි ස්ථානගතවීම පිළිගත හැකි බවත්, මහාථූපය, ලෝහ ප්‍රාසාදය යන ගොඩනැගිලි පිහිටීම පිළිබඳ ව ඓතිහාසික තොරතුරු එකිනෙකට සම්බන්ධතාවයක් නොදක්වන බවත් සඳහන් කර තිබේ (Bandaranayake 1974 :47-48). දස වැනි සියවසේ රචිත මහබෝධි වංසයේ මහා විහාරයේ

භූ දර්ශනය ගොඩනැංවීම පිළිබඳ ව විස්තර සඳහන් ව තිබේ. එහි විස්තර වන ආකාරයට මහා විහාරයේ සැලැස්ම හා භූ දර්ශනය සිංහ වික්‍රාන්ත නම් සැලැස්මකට අනුව ඉදි කරන ලද බව විස්තරකර ඇත. මහායාන වාස්තුවිද්‍යා ශිල්ප ග්‍රන්ථයක් වූ මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන විහාරාරාම වර්ග විසි හතරින් එකක් ලෙස සිංහාරාම විහාර සැලැස්ම මහා විහාරයට අයත් බව පෙන්වාදිය හැකි ය (*Mvs.* 230-232).

සිංහ වික්‍රාන්ත ශෛලිය දාහතර වැනි සියවසේ රචිත ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරයේ හා බෝධිවංසයේ විස්තර කර තිබේ.[11] සිංහ වික්‍රාන්ති සැලැස්ම අනුව ගොඩ නැඟී ඇති මහා විහාරයේ භූ දර්ශනය පිළිබඳ ව එකිනෙකට පරස්පර මතවාද ගොඩනැගී තිබීම දැකගත හැකි ය. මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ දැක්වෙන විහාරාරාම වර්ග 24 න් එකක් වන සිංහ වික්‍රාන්ත විහාර වින්‍යාසය සම අසමභාවයන් පිළිඹිමු කරන බව විජයසූරිය ප්‍රකාශ කර ඇත. ඔහු පෙන්වාදෙන ආකාරයට සිංහාරාම වින්‍යාසයේ ද්වාරය බටහිරිනුත් මහා විහාරයේ නැගෙනහිරිනුත් පිහිටා තිබීම පරස්පර ය. එසේ ම මහා විහාරයේ ගොඩනැගිලි නවයෙන් බෝධිඝරය, සන්නිපාත ශාලා, ධාතුඝර, රංසිමාලක, භක්ත ශාලා, මහාථූපය මෙන් ම ප්‍රතිමාඝරය ද වැදහොත් සිංහයකුගේ අවයව පිහිටි තැන්වලට එක්කිරීම සිංහාරාම ක්‍රමය හා ගැළපෙන නමුත් පිළිමගෙය වැනි විහාර අංග එයට සම්බන්ධ කළ නොහැකි බව ද ඒවා පසු ව මහා විහාර සැලැස්මට අයත් වන අංග බව ද පෙන්වා දී ඇත. පිළිමගෙය මහායානය මෙ රට ව්‍යාප්ත වූවාට පසු ව තිවන අංගයකි (විජයසූරිය 1995:87).

මහා විහාරයේ මෙම ගොඩනැගිලි ඉදි කෙරුණේ කිසියම් සැලැස්මකට අනුව නොවන බව අප දන්නා නමුදු එම ගොඩනැගිලි පිහිටා ඇති ආකාරය මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ

11 සිංහ වික්‍රාන්ති ශෛලිය සිංහල බෝධිවංශය විස්තර කර ඇත්තේ යම් සේ සිංහයාගේ වාලාධි කෙළවර වැදහොත් තෙන මහාබෝධිගෙය වේ, දකුණුපය පිහිටි තෙන මහාප්‍රාසාදය වේ, වම්පය පිහිටි තෙන සන්නිපාත ශාලාව පිහිටි ගේ ද, නාබි ස්ථානයෙහි ධාතු ගෙය ද, වම් ඇලයේ රංසිමාලකය ද, දකුණත පිහිටි තෙනෙන චෛත්‍යය ද, ශ්‍රීවය පිහිටි තෙන කණ්ඨ නම් පුෂ්කරණිය ද, පෙරළා දකුණැලයෙන් බලන්නාහු ඒ දෘෂ්ටිය හුනු තැන පිදිමංගය ද, එපරිද්දෙන් සිංහ වික්‍රීඩිත යනුවෙනි (සිංබෝව. 209-210).





විස්තර වන සිංහ වික්‍රාන්ත සැලැස්මට බොහෝ දුරට සමාන වීම අහඹු සිදුවීමක් බව පිළිගැනීමට සිදු ව තිබේ (මාරසිංහ 1993:15). තවත් සිංහල සම්භාව්‍ය ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරය මහා විහාරය සිංහ වික්‍රාන්ත සැලැස්මට අනුව නිර්මාණය කරන ලද්දේ දුටුගැමුණු රජතුමා බව දක්වයි (*සද්ර*.409). සද්ධර්මාරත්නාකරය දක්වා ඇති අදහස් අනුව බොහෝ විට මහා විහාරයට අයත් පැරණි ගොඩනැගිලිවලින් මහාථූපය, ලෝහ ප්‍රාසාදය ආදී ගොඩනැගිලි ඉදි කරනු ලබන්නේ දුටුගැමුණු රජතුමා විසිනි (*මව*.xxxii:8-9). මෙ වැනි මුල් ජනශ්‍රැතින් පිළිබඳ ව දෙවනපෑතිස් රජු හෝ දුටුගැමුණු රජු දැන සිටියේ ද යන්න සැක සහිත බැවින් බෝධිවංස විස්තරය මඟින් ඒ වන විට ස්ථාපිත ව තිබුණු නිර්මාණයන් සම්බන්ධ සැලැස්මකට විද්‍යාත්මක පදනමක් ආරෝපණය කිරීම දැරූ උත්සාහයක් ලෙස සිංහ වික්‍රාන්ත සැලැස්ම හඳුන්වාදිය හැකි ය (මාරසිංහ 1993:15).

අනුරාධපුරය හා ඒ අවට බිහි වී අට වැනි සියවසේ දී පමණ පූර්ණ වර්ධනයට පත් වූ ආරාම ප්‍රභේද අතරින් මහා විහාරය පැරණි ම ආරාමය ලෙස මූලාශ්‍රයවල සඳහන් වේ. ක්‍රි.පූ. තුන් වැනි සියවස තරම් ඈත කාලයට බිහිවන මහා විහාරය තුළ ස්තූප, බෝධි, බෝධිඝර, උපෝසථඝර හා තරමක් පමා වී එම ගොඩට එකතු වූ පටිමාඝර යන ගොඩනැගිලි ඇතුළත් වීමෙන් ඒවා ද කලින් සකස් කරන ලද සැලැස්මක් අනුව නිර්මාණය වූ ඒවා දැයි කීමට විද්වතුන්ට හා පුරාවිද්‍යාඥයින්ට දුෂ්කර වී ඇත (එම). මහාබෝධිවංසය නම් පාලි කෘතියෙහි හා සද්ධර්මාලංකාරය නම් සම්භාව්‍ය සිංහල කෘතියේ මහා විහාරය නිර්මාණය කරන ලද්දේ දෙවනපෑතිස් රජුගේ අණ පරිදි සිංහ වික්‍රාන්ත සැලැස්මට යයි සඳහන් වේ (එම:14-15).

සිංහ වික්‍රාන්ත සැලැස්ම තුළ මිහිඳු හිමියන් පෙන්වා දුන් ස්ථාන හතෙන් සමහර ඒවා ඇතුළත් ව නැති අතර මෙය අවුල් සහගත කරුණක් බව මාරසිංහ ප්‍රකාශ කර ඇත (එම). එ බැවින් පසු කාලීන ගත්කතුවරුන් මහා විහාරයේ සැලැස්මට සිංහ යන නම ඈදා ගැනීම සිංහලයා සිංහයාගෙන් උපන් බව පෙන්වීමට සිංහ කොඩිය නිර්මාණය කිරීම වැනි කරුණක් ලෙස හැඳින්විය

හැකි බව හෙට්ටිආරච්චිගේ මතය වේ (හෙට්ටිආරච්චි 1996:56). මෙ වැනි මූලාශ්‍රයගත තොරතුරුවල අන්තර්ගත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ ලක්දිව බිහි වූ ප්‍රථම ආරාමය වශයෙන් මූලාශ්‍රයවල සඳහන් වන මහා විහාරය එහි භූ දර්ශනය පුළුල් වීම සමඟ විවිධ සැලැස්මවල් තුළට අන්තර්ගත කර දැක්වීමට විවිධ කාලවලදී උත්සාහ දරා ඇති සෙයකි. කෙසේ වෙතත් විහාර සැලැස්ම සංවර්ධනය වීම සමඟ අනුරාධපුර රාජධානි සමය තුළ දී එහි භූ දර්ශනය වඩා පුළුල් වී යම්කිසි රටාවකට මහා විහාරය හැඩගැසී ඇති ආකාරය මෙම කරුණු අනුව හඳුනාගත හැකි ය.

ලේඛනගත ප්‍රභවයන්ට අනුව අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව හැදෑරීමේ දී මී ළඟට වැදගත් වන ස්ථානයක් වන්නේ මිරිසවැටිය විහාරයයි. මහා විහාරය ගොඩනැංවීමෙන් අවුරුදු සියයකට පසු දුට්ඨගාමිණී අභය මහරජතුමා (ක්‍රි.ව.161-137) විසින් එහි භූ දර්ශනය ගොඩනගන ලද බව මහාවංසයේ සඳහන් වේ (*මව.*xxvi:6-26).12 [12]මහා විහාරයෙහි මෙන් නොව මිරිසවැටිය සංකීර්ණයෙහි නාභිගත ලක්ෂය වූයේ ස්තූපයයි (Silva 2000:56). ඒ අනුව ස්තූපය වටා එක්තරා පිළිවෙලකට පෙහොයගෙය, පිළිමගෙය, උපෝසථඝරය, දානශාලාව, ප්‍රතිමාඝරය හා ලැගුම් ගෙවල් ස්ථානගත වන අතර මෙම සමය වන විට අනුරාධපුර

12 "සේසත් ඔප් නංවන ලද මඟුලින් යුත් සන්දවය ගිය කල්හි භයානිකාන්ත කළා වූ අභය නම් ඒ රජ තෙම කරන ලද රාජ අභිෂේකය ඇත්තෙන් ම ක්‍රීඩා කරනු පිණිස ද, අභිෂේක කරන ලද ක්ෂත්‍රියන්ගේ චාරිත්‍රය පාලනය කරනු පිණිස ද, මහා ක්‍රීඩා විධියෙන් මොනවට සරසන ලද්දා වූ තිසාවැවට සම්ප්‍රාප්ත වූයේ රජුගේ සියලු පරිභෝග භාණ්ඩ ද ජනයා ද ගෙනෙන ලද සිය ගණන් පවුරු ද, මිරිසවැටි වෙහෙර පිහිටන තැන්හි තැබූ හ. එහි ම ථූපය පිහිටන තැන්හි කුන්තායුධය උසුලන්නා වූ රාජ ආරක්ෂකයෝ ධාතු සහිත වූ කුන්තායුධය ඍජු කොට නැංවූ හ. මහරජ තෙම අන්තඃපුරවාසීන් සහිත වූයේ දිවා භාගයේ ජලයෙහි ක්‍රීඩා කොට සවස් වේලෙහි, භවන්ති ඔහු කුන්තායුධය වඩව් යයි කීයේ ය. රාජ පුරුෂයෝ ඒ කුන්තායුධය සොලවනු නොහැකි වූහ. මහත් ආශ්චර්යයක් දැක සතුටු සිත් ඇත්තේ කුන්තායුධය මැදිකොට දාගැබක් කරවූයේ ය. තුන් අවුරුද්දකින් නිම වූ වෙහෙර තෙමේ විහාර පූජා කාරණයෙන් සංඝයා රැස් කරවූයේ ය. එදවස රැස් වූ භිකෂූන් ලක්ෂයක් වූහ. භික්ෂුණීහු ද අනූදහසක් වූහ. මිහිපති තෙමේ ඒ සමාග මයෙහි සංඝයාට මගේ සලාකදෙමි සංඝයා සිහි නොකොට මිරිස් වැටියක් අනුභව කළෙමි. ඊට දඬුවම් වේවයි චෛත්‍ය සහිත වූ අතිශයින් සිත්කළු වූ මිරිසවැටිය වෙහෙර කරමියි එය සංඝ තෙමේ පිළිගන්නා සේක්වා යි කියා සතුටු සිත් ඇත්තා වූ හෙතෙම දක්ෂිණෝදකය වගුරුවා ඒ විහාරය භික්ෂු සංඝයාට පවරා දුන්නේ ය (එම:6-18).





දක්ෂිණ ප්‍රදේශය තුළ විහාර ආරාම සහිත පුළුල් භූ දර්ශනය ගොඩනැගී තිබෙනු දැකගත හැකි වේ.

මහා විහාරය බිහි වී අවුරුදු 217 මාස 10 ක් දින 10 ක් ගිය තැන අභයගිරි විහාරය පිහිටුවන ලදි (වික්‍රමගමගේ 1995:111). එම විහාරයේ නිර්මාතෘවරයා වශයෙන් මහාවංසයේ සඳහන් වන්නේ ක්‍රි.පූ. 89 දී ලංකාවේ රජ පැමිණි වට්ටගාමිණී අභය රජු ය (*මව.* xxxiixxxv). වංසකතාවන්ට අනුව අභයරාම (*දීව.*xxii:14) අභයුත්තර (*මව.* 35:119) යනුවෙන් ද ශිලා ලේඛනයන්හි අභයගිරි විහර (*Ez*.Vol.i 154) යනුවෙන් ද මෙම විහාරය හඳුන්වා ඇත. වට්ටගාමිණී අබය රජු ගිරි නම් නිගණ්ඨයා විසූ ආරාමය කඩා බිඳ දමා එහි ඉදි කළ විහාරය අභයගිරිය නම් වූ බව වංසකතාවල සඳහන් වේ (*මව.* xxxiii:45;*දීව.* xxii:83). අභයගිරි විහාරය ආරම්භ කරනු ලබන්නේ නගරයේ උතුරු ප්‍රදේශයේ වන අතර මීට පෙර ඉදි වූ බෞද්ධ විහාරයන් මෙන් නොව මෙම විහාරය ආගමික හා පෞද්ගලික හේතු මත මහා විහාරයෙන් වෙන් ව ගිය භික්ෂූන් කණ්ඩායමක් විසින් ආරම්භ කරනු ලැබේ. විශේෂයෙන් ම ක්‍රි.පූ හතර වැනි ශත වර්ෂයේ දී පණ්ඩුකාභය රජතුමා නිගණ්ඨ පූජකයින් සඳහා සාදා දුන් ජෛන ආරාම පැවති භූමියේ අභයගිරි ස්තූපය හා ආරාම සංකීර්ණය ඉදි කරන බැවින් වෙනත් ආගමික සිද්ධස්ථානයක් සඳහා වෙන් කෙරුණු භූමියක් බෞද්ධ ආගමික සිද්ධස්ථානයක් ගොඩනැංවීම සඳහා භාවිත කිරීම තුළින් එම භූමිය එතෙක් ක්‍රියාත්මක භූ දර්ශනය වෙනස් කිරීමට හේතු වී ඇති බව පෙනේ.

අනුරාධපුර නගරයෙන් උතුරෙහි ක්‍රි.පූ. පළමු වැනි සියවසේ දී ආරම්භ වන මෙම විහාරය පසු ව අනුරාධපුර රාජධානි සමය අවසන දක්වා වර්ධනය වී අක්කර 500 ක් දක්වා ව්‍යාප්ත ව ඇත (කුලතුංග 1998:313). අභයගිරි විහාරයේ භූ දර්ශනය වේගවත් ලෙස සංවර්ධනය වූයේ එයට රාජ අනුග්‍රහය ලැබුණ නිසා ය. අභයගිරියේ භික්ෂු සංඛ්‍යාව වැඩිවත් ම ඇමතිවරුන් අභයගිරි විහාරයට පුදන ලද සංඝාරාම නගරයට දකුණු දෙසට වන්නට පිහිටා තිබුණි (වික්‍රමගමගේ 1995:112). අමණ්ඩගාමිණී අභය (ක්‍රි.ව. 22-31) රජු මාගම දකුණු දිග වැව කරවා දක්ෂිණ විහාරයට පිදූ බව

සඳහන් වේ. දක්ෂිණගිරි විහාරය වට්ටගාමිනී අභය රජුගේ උත්තිය නැමති යෝධයා විසින් කරවා මහාතිස්ස හිමිට පූජා කරන ලද බව මහාවංසටීකාවේ සඳහන් වේ.[13]

අභයගිරි විහාරයේ භූ දර්ශනය සැකසීමේ දී එය මූල ක්‍රමයක් මත වර්ධනය වූ බවට සාක්ෂි ඇත. දහස් සංඛ්‍යාත භික්ෂු ගහණයක් එක් එක් මූල තුළ අභිප්‍රේත වූ බව බලගල්ලේ පෙන්වා දී ඇත (බලගල්ලේ 1995:445). අභයගිරියේ මූල හතරක් ක්‍රියාත්මක වූ බව මූලාශ්‍රයවල ද සඳහන් වේ. **උත්තර මූල හා වාදු මූල** මානවම්ම රජු විසින් සිය සෙහොයුරා සඳහා අභයගිරි විහාරයේ ඉඳි කළ මූලය බව සඳහන් වේ (*මව* lv :20: *පූජා* :20). ඩ වැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව.956-972) අභයගිරි පුවරු ලිපියේ **උතුරු මූල** පිළිබඳ ව සඳහන් ව ඇත (*Ez*.Vol.i:21). II වැනි සේන රජු විසින් උත්තරොළ්හ පිරිවෙනෙහි ප්‍රාසාදයක් කළ බව සඳහන් වේ (*මව.* xlix:75). **මහනෙත් ප්‍රාසාද මූලය** IV වැනි අක්බෝ (ක්‍රි.ව.18-24) ඉඳි කරවා අභයගිරි ධම්මරුචි භික්ෂූන්ට ප්‍රදානය කර තිබේ (*මව.* xlvi:02). ඪවැනි කසුප් රජුගේ අභයගිරි ලිපියෙහි ද **මහනෙත්ප්‍රාසාද මූල හා වාදු මූලය** සඳහා සම්මත කළ චාරිත්‍ර පිළිබඳ ව සඳහන් වීම තුළින් එම මූලවල ක්‍රියාකාරිත්වය අවබෝධ කරගත හැකි ය (*Ez*.Vol.i :21) මූලාශ්‍රයවල සඳහන් වන කරුණු අනුව අභයගිරි විහාරය හා ඒ ආශ්‍රිත භූ දර්ශනය නගරයේ උතුරු අක්ෂයේදී මූල පදනම් කර ගනිමින් වර්ධනය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය.

නගරයේ දකුණු අක්ෂයට බටහිර දෙසින් දක්ෂිණ විහාරය නිර්මාණය කෙරුණේ මීළඟ ප්‍රධාන ආරාමය ලෙස ය (Silva 2000:57). මූලාශ්‍රයවල සඳහන් වන ආකරයට මහා විහාරය සමඟ ඇති වූ වෙනස්කම්වලට විරෝධය දැක් වූ අභයගිරිය විහාරික භික්ෂු කණ්ඩායමක් දෙ වැනි වරට එතැනින් වෙන් ව ගිය අතර ඔවුන් සඳහා රජතුමා දක්ෂිණ විහාරයේ ස්තූපයක් හා ආරාමය ගොඩනැගී ය. මේ අනුව මහා විහාරයටත්, අභයගිරියටත් යන අන්ත දෙකට ම සම්බන්ධ නොවී මධ්‍යම මාර්ගයන් ගත් තුන් වැනි කණ්ඩායමක් ද ඇති විය (එම).

13 තෙසු සතතසු යොධෙසු උතතියො නාම කාරයි.
නගරමහා දකඛිණතො විහාරං දකඛිණ විහයං (වංසපකා.: xxxiii:88)





පුරාණ අනුරාධපුර නගරයේ භූ දර්ශනය සඳහා එක්වන්නා වූ මහා විහාරවලින් අවසාන විහාරය වූයේ ජේතවනයයි. ක්‍රි.ව. 276-303 අතර කාලයේ දී මහසෙන් රජතුමා විසින් මෙම විහාරය ඉඳි කරන ලද බව මහාවංසය, නිකාය සංග්‍රහය හා සද්ධර්මරත්නාකරයේ සඳහන් වේ. එම විහාරය මහා විහාර සීමාව ඇතුළත වූ බව ද මූලාශ්‍රයවල සඳහන් වේ[14] (සද්රඵ 30- 37 ත නිස ඵ15) ජේතවන විහාරය ඉඳි කරන ලද්දේ ද පණ්ඩුකාභය රජු කාලවේල නම් යක්ෂයා සඳහා දෙවොල තැන වූ ස්ථානය බව රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර තිබේ (Silva 2000:57). නමුත් හේම රත්නායක පෙන්වා දී ඇත්තේ ජේතවන විහාරය මිහිඳු මහරහතන් වහන්සේ ධර්මය දේශනා කළ ස්ථානය වන **ජෝරානම්බන්ධ** මාලක වශයෙන් ව්‍යවහාර වූ පසු ව මිහිඳු මහරහතන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරු ව **ඉසිභූමංගන** යනුවෙන් හැඳින්වූ භූමියේ ඉඳි කරන ලද විහාරය බවයි (රත්නායක 1998:331).

කෙසේ වුවත් ඓතිහාසික වශයෙන් සලකන කළ ථේරවාදී නිකායත්‍රයේ වර්ධනයේ දී ජේතවනාරාමය වැදගත් තැනක් උසුලයි. ඉන්දියානු ලේඛනවල **සාගලීය** හෝ ජේතවන වාසීන් යනුවෙන් ද සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවල සහ සෙල්ලිපිවල දෙනානක යනුවෙන් ද මෙම විහාරය හඳුන්වා ඇත (එම). ක්‍රි.පූ. තුන් වැනි සියවසේ සිට ක්‍රි.ව. තුන් වැනි සියවස අවසාන දක්වා සියවස් හයක් තුළ වර්ධනය වන මහා විහාර සැලසුමට අයත් විහාර පහත සඳහන් භූ දර්ශනය මත ගොඩනැගී තිබුණ බව බණ්ඩාරනායක පෙන්වා දී ඇත.


i. ස්තූපය (කේන්ද්‍රය)

ii. විවෘත භූමිය

iii. පූජනීය අංගනය (පොහොය ගෙය, පඨිමාඝරය, ධර්මශාලාව, සභා ශාලාව, සන්නිපාත ශාලාව, බෝධිඝරය)

14 එකළ මහසෙන් රජ ............සීමාව ඇතුළත දෙනා වෙහෙර කරවා කොහොන්තිස්ස මහතෙරුන්ට දන්දිනි (සද්ර:30-37;ksi :15).

iv. නේවාසික අංගනය (ලැගුම් ගෙවල්, දාන ශාලා, කැසිකිළි වැසිකිළි, දිය පොකුණු, නාන පොකුණු)




*(Bandaranayake 1974:30-57)*

සැලසුම් අංක 3.2

මහා විහාර සැලසුම් ආරෙහි වාස්තුවිද්‍යාත්මක අංග ස්ථානගත වීම සම්බන්ධ ව බණ්ඩාරනායක දක්වා ඇති භූ දර්ශනයෙහි සැලසුම

මහා විහාර තුළ අන්තර්ගත මෙම සැලසුම් ආරට අයත් භූ දර්ශනය නිර්මාණය වි ඇත්තේ ඒ ඒ විහාරාරාම තුළ අන්තර්ගත ඉඩ සැලසුම්කරණය පදනමින් බව විහාර ආශ්‍රිත භූමි ප්‍රමාණ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

පුරාණ අනුරාධපුර භූ දර්ශනය පිළිබඳ ලේඛනගත ප්‍රභවයන් ඔස්සේ අධ්‍යයනය කිරීමේ දී අවසාන අවස්ථාව එළඹෙන්නේ ක්‍රිස්තු වර්ෂයෙන් පස් වැනි ශත වර්ෂයේ සිට දහ වැනි ශතවර්ෂය





දක්වා කාලය තුළිණි. මහා විහාරවලින් කැඩී ගිය කුඩා භික්ෂු කණ්ඩායම් නගරයේ ඇත වටපිටාව තුළ කුඩා විහාර සමූහයක් ගොඩනගා ගැනීම මීළගට සිදුවේ (silva 2000:58). මෙම විහාර නගර සැලැස්මෙහි ස්ථානගත වූයේ වනයට ආසන්න ව පිහිටි උප නගර පරිධිය තුළ ය. මෙහි වාසය කළ භික්ෂූන් තමන්ගේ යැපීම් මධ්‍යම වටපිටාවේ වාසය කළ ප්‍රජාවගෙන් අපේක්ෂා කළ අතර නගර සැලැස්මේ උප නගර පරිධිය තුළ වැඩ විසූ මෙම භික්ෂූන්ගේ ආරාම පබ්බත විහාර වශයෙන් භූ දර්ශනයට එක් වී තිබේ. උප නගර පරිධිය තුළ පිහිටන්නා වූ විහාර ලෙස පාචීනතිස්ස පබ්බත, තොළුවිල, පන්කුලිය, විජයාරාම, පුලියන්කුලම, වෙස්සගිරිය පෙන්වාදිය හැකි ය. රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර ඇති ආකාරයට පාචීනතිස්ස පබ්බත විහාරය ක්‍රි.ව. දෙ වැනි සියවසේ දී ආරම්භ වුව ද දැනට දැකගත හැකි නටබුන් ක්‍රි.ව. හය වැනි ශත වර්ෂයටත්, පන්කුලිය ක්‍රිස්තු වර්ෂ අට වැනි ශත වර්ෂයටත්, පුලියංකුලම නව වැනි ශත වර්ෂයටත් විජයාරාම දහ වැනි ශත වර්ෂයටත් අයත් වේ (එම).

මෙම විහාර අනුරාධපුර නගර සැලැස්මේ පිටත වටයෙහි භූමි ප්‍රමාණයෙන් හතරෙන් තුනක් අයත් වන භූමියෙහි පිහිටන අතර මෙහි විශේෂ ලක්ෂණය වන්නේ භූ දර්ශනය කෙටි භූමියක් තුළ ගොඩනගා තිබීමයි. ඒ සඳහා දිය අගල, වට පවුර, නේවාසික අංගනය හා පූජනීය අංගනය ඇතුළත් කර තිබෙන අතර පූජනීය අංගනය තුළ ථූපය, පොහොයගෙය,ල බෝධිඝරය, පඨිමාඝරය, උස් වේදිකාවක ස්ථානගත කර තිබේ. එයට පහළින් නේවාසික අංගනයට අයත් ආවාස කුටි කැසිකිළි පද්ධතිය හා එයටත් පිටතින් ජන්තාඝරය, දාන ශාලාව ස්ථානගත කර තිබේ. පබ්බත විහාර (සංස්කෘත පර්වත විහාර) නමින් මෙම විහාර වර්ගය හඳුන්වන්නේ ඉහතින් විස්තර කරන ලද ආකාරයේ භූ දර්ශනය උපයෝගී කර නිර්මාණය කර තිබෙන නිසා ය (මාරසිංහ 1993:xii).

මංජු ශ්‍රී භාෂිත වාස්තුශාස්ත්‍රයට අනුව නිර්මාණය කර ඇති පබ්බත විහාර වාස්තු මණ්ඩලය නමින් හැඳින්වෙන ගුප්ත භූමි සටහනක් මත නිර්මාණය කරන ලද්දකි. මෙහි භූමි දර්ශනය කෝෂ්ඨ වශයෙන් හැඳින්වෙන් කොටස්වලට බෙදා තිබෙන අතර

කෝෂ්ඨ **නවයකින් යුත් වාස්තු මණ්ඩල පීඨ** වශයෙන් ද **කෝෂ්ඨ 25 කින් යුත් වාස්තු මණ්ඩල උප පීඨ** නමින් ද හඳුන්වා ඇත (එම:30). වාස්තුවිද්‍යා ශාස්ත්‍රය අනුව එහි සඳහන් සැලසුම් අතරින් මහා විහාර සැලසුම කෝෂ්ඨ නවයකින් යුත් පීඨ සැලසුමට ද පබ්බත විහාර කෝෂ්ඨ 25 කින් යුත් උප පීඨ සැලසුමට ද අයත් වේ.

| | | |
|---|---|---|
| වායු | සෝම | ඉන්ද්‍ර |
| වරුණ | බ්‍රහ්ම | ආදිත්‍ය |
| නිරිත | යම | අග්නි |

වගු අංක 31
පීඨ සැලසුම

*(Mvs. 215-216)*

| | | | | |
|---|---|---|---|---|
| වායු | මුඛ්‍ය | සෝම | අදිති | ඉස |
| සෝස | රුහුණු | බහුමින්ද | අපවත්ස | ජයන්ත |
| වරුණ | මිත්‍ර | බ්‍රහ්ම | ආර්ය | බර්ස |
| සුග්‍රීව | ඉන්දු | විවස්වත් | සාමිකර් | ආදිත්‍ය |
| නිරිත | බරන්ත රාජ | යම | විතත | අග්නි |

වගු අංක 3.2
උපපීඨ සැලසුම

*(Mvs. 215-216)*

මෙම භූමි දර්ශනය සැකසීම අනුව වාස්තු ශාස්ත්‍රය පෙන්වා දෙන්නේ ආරාමයක ගොඩනැගිලි හා කෝෂ්ඨ වෙන් කිරීමේ දී එක් කෝෂ්ඨයකට එක් ගොඩනැගිල්ලක් සීමා විය යුතු බව ය. ඒ අනුව උප පීඨ සැලැස්මකට නිර්මාණය කර ඇති පබ්බත විහාර තුළ එක් කෝෂ්ඨයක් තුළ එක් ප්‍රධාන ගොඩනැගිල්ලක් තැනිය යුතු වේ (මාරසිංහ 1993:30). පබ්බත විහාර භූ දර්ශනය අධ්‍යයනයක දී ඇතැම් ආරාමවල පවතින අක්‍රමවත් සැලැස්ම කෙරෙහි මුලින් ම





අවධානය යොමු කරන ලද්දේ හෝර්කාර්ට් විසිනි. ඔහු මෙය විස්තර කර ඇත්තේ දිශාව පිළිබඳ ව සිංහලයන් දක්වන නොසැලකිලිමත් බවක් ලෙස ය (Hocart 1933:11). පබ්බත විහාරවල සැලැස්මේ දක්නට ලැබෙන කැපීපෙනන රටාව මහායාන බලපෑමක් නිසා සිදු වූ බව ප්‍රේමතිලක හා සිල්වා පෙන්වා දී ඇත (Premathilake and Silva 1968:61-84). මෙම සැලැස්මේ ඇති වලංගුභාවය පිළිබඳ ව සේනක බණ්ඩාරනායක ප්‍රශ්න කර ඇත (Bandaranayake 1974:25). නමුත් පබ්බත විහාරවල දක්නට ලැබෙන සැලසුම හා භූ දර්ශනය දෙස බැලීමේ දී දැනට පවත්නා ස්ථානයට පත්වීමට පොරොත්තුව ඉතාමත් විධිමත් පිළිවෙලකට එය සැකසී තිබුණ බව මාරසිංහගේ මතය වී තිබේ (මාරසිංහ 1993:xiii).

ලේඛනගත ප්‍රභවයන්ට අනුව පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ විකාශනය හඳුනාගැනීමේ දී මීළඟට වැදගත් වන්නේ පිටතින් ම ඇති කවයේ පිහිටන හත් වැනි ශත වර්ෂයේ දී අභයගිරි නිකායෙන් කැඩී ගිය භික්ෂු පිරිසක් පිහිටුවා ගත් පාංශුකූලික නිකාය සතු වනාශ්‍රමයන් ය (Silva 2000:62). සුවිශේෂ වූ සැලසුම් ආරක් පදනම් කර ගෙන නිර්මාණය කර ඇති මෙම විහාර තුළ වේදිකා දෙකක් මත ඉදි කර ඇති ගෘහ හා ඊට අයත් ජලකාණු පද්ධතිය මෙන් ම වැසිකිළි කැසිකිළි පද්ධතිය ද මහා විහාර හා පබ්බත විහාර සැලසුමින් මෙන් ම එය නිර්මාණය කර ඇති භූ දර්ශනයෙන් ද වෙනස් කර තිබේ. ලැගුම් ගෙවල් නිර්මාණය කිරීමේ දී එකක් තව එකකින් දුරස්වන පරිද්දෙන් ආරාම භූමියේ විසිරී පැවතුණ අතර සම්පූර්ණ ආරාම පද්ධතිය දිගේ විහිදී ගිය මංපෙත් කුටිවලට යොමු කර ඇත (සිල්වා 1998:308-309). අනුරාධපුර භූ දර්ශනයේ සුවිශේෂ අංශයන් වූ මෙ වැනි ආරාම පද්ධති වර්තමානයේ බටහිර ආරාම ප්‍රදේශය ඇසුරින් ව්‍යාප්ත වී ඇති බව අයර්ටන් විසින් හඳුනාගනු ලැබීය (*ASCM*. i :46-47). මෙම ආරාම ප්‍රභේදය වනය කේන්ද්‍ර කර ගනිමින් නිර්මාණය කර තිබෙන සුවිශේෂ ආරාම ප්‍රභේදයක් බව විජේසූරිය ද පෙන්වා දී ඇත (Wijesuriya 1998:37).

මෙ වැනි ආකාරයේ වනවාසී ආරාම අභයගිරි විහාරයේ ද දැකගත හැකි බව කුලතුංග පෙන්වා දී තිබේ (කුලතුංග 1998:316).

අභයගිරි වනවාසී ආරාමයෙන් බිඳී ගිය පිරිස් බටහිරාරාම වනවාසය පිහිටුවා ගත් බව ඔහු පැහැදිලි කර ඇත (එම). දෙ වැනි සේන රජතුමාගේ (ක්‍රි.ව.831-853) විසි වැනි රාජ වර්ෂයේ දී පාංශුකූලික (ධූතාංගධාරී) භික්ෂූන් අභයගිරියෙන් බිඳී ගිය බව මහාවංසය සඳහන් කරයි (*මව* 51:52). එසේ ම අභයගිරියේ වූ වසභ රජුගේ සෙල්ලිපියක **සුදස්සන නම් පධානඝරයක්** පිළිබඳ ව සඳහන් වේ (*Ic*.Vol. i:45). ඒ අනුව අභයගිරිය හා බටහිර ආරාමය යන ප්‍රදේශ අතර පවතින සමීප භාවය අනුව ක්‍රි.ව. හත් වැනි ශත වර්ෂයෙන් පසු නව වැනි ශත වර්ෂය දක්වා දියුණුවන තපෝවන අනුරාධපුර භූ දර්ශනයට එක් වී ඇති බව පෙන්වාදිය හැකි ය.

අනුරාධපුර නගරයේ භූ දර්ශනයේ සුවිශේෂ කැපීපෙනෙන ස්ථානයක් වන්නේ ඇතුළුපුරයයි. ඇතුළුපුරය මුල් කාලීන ව අනුරාධගම ලෙස තිබී පසු ව අනුරාධපුර වශයෙන් වර්ධනය වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. රෝලන්ඩ් සිල්වා පෙන්වා දී ඇති ආකාරයට අනුරාධපුර හෙවත් අනුරාධගම ආසන්න වශයෙන් වර්ග සැතපුම් භාගයක් පමණ ප්‍රදේශයක් වසා සිටියි (Silva 2000:58). නගරය වටා කොටු බැම්ම හා ප්‍රධාන දිශාවන්ට මුහුණ දමා සකස් කරන ලද දොරටු හතරක් එහි තිබූ බව මහාවංසයේ සඳහන් වේ (*මව.* 19:39-40) නැගෙනහිර ප්‍රාකාරය අසළින් සොයා ගත් ශිලා ලිපියට අනුව (*Ez*.Vol.i:327). ප්‍රධාන වීදි හෙවත් මඟුල් මහංවය නගරයේ දොරටු හතරට ආබද්ධ වී පිහිටා මධ්‍ය ක්ෂේත්‍රයේ දී ඍජු කෝණාකාර ව සන්ධි වී ඇත (*Ez*.Vol.ii:25). මෙම වීදි හා සම්බන්ධ ව උතුරෙන් හා නැගෙනහිරින් නගරයට පිටතින් විහිදෙන්නා වූ මාර්ග පද්ධතිය මල්වතු ඔය එතෙර කර ගමන් කරයි. උතුරින් විහිදෙන්නා වූ ගමන් මාර්ගය තුළ එක් පාලමක් මල්වතු ඔය හරහා ද ඊට ලම්භක ව කනදරා ඔය හරහා වර්තමාන තුලාවෙල්ලිය ග්‍රාමය මැදින් උතුරට ගමන් කරනු ලබයි. මෙහි නැගෙනහිර ගමන් මාර්ගය නැගෙනහිරින් මල්වතු ඔය එතෙර කර ඇති ගල්පාලම ඔස්සේ කනදරා ඔය පසුකර යාන් ඔය ඔස්සේ වැටී ඇති ගල්පාලම් ඔස්සේ පුරාණ සේරුනුවර දෙසට ගමන් කරන බව පුරාවිද්‍යා සාධක අනුව හඳුනාගත හැකි ය. මෙම මාර්ගය පිළිබඳ ව තොරතුරු ඊත්සිංද වාර්තා කර තිබේ (ITSing 1896:235).





අනුරාධපුර ඇතුළුපුරයේ ක්‍රියාත්මක වූ භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී මූලාශ්‍රයගත තොරතුරු හා දේශාටන වාර්තා මෙන් ම ලේඛනගත පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් ද අතිශය වැදගත් කරුණු රාශියක් ගෙන හැර දක්වයි. චූලවංසයේ සඳහන් වන ආකාරයට දළදා මාළිගාව ඇතුළු පූජනීය ස්ථානවල පිහිටීම නගරයේ මධ්‍ය ප්‍රදේශයක තිබී ඇත (*Cv.* xli:37- 40). එම විස්තරවල රජමාළිගය අසළ තිබූ පිළිම ගෙයක් පිළිබඳ ව ද (එම:xxxvii:200-201) තවත් ස්ථානයක නගරය තුළ වූ පොත් ගුලක් පිළිබඳ ව සඳහන් වේ. අනුරාධපුර නගරයේ නැගෙනහිර ප්‍රදේශය රජ මාළිගා සඳහා වෙන් ව පැවතී ඇත (Silva 2000:59). නගරයේ භූ දර්ශනය ක්‍රමයෙන් පුළුල්වත් ම එහි ඇතුළත බෞද්ධ භික්ෂූන් සඳහා දාන ශාලා නිර්මාණය වීම ද මහාපාලි දාන ශාලාව ඇසුරෙන් හඳුනාගත හැකි ය (*Ez*.Vol.iii:132-137). ක්‍රි.ව.දහ වැනි සියවසට අයත් මහාපාලි දාන ශාලාවේ ශිලා ලිපිය මඟින් ඕනෑම භික්ෂුවකට දවල් දානය ලබා ගැනීමට අවකාශ සැලසී ඇති බව හියුං-සාං සඳහන් කර ඇත (Hiuen Tsang 1885:250). ෆාහියන් දේශාටන වාර්තාව අනුව අනුරාධපුර නගරයේ අරාබි වෙළෙන්දන් වාසය කර තිබෙන අතර ඔවුන්ගේ නිවාස ඉතා අලංකාර ඒවා වූ බවත් විස්තර කර ඇත. එසේ ම මාර්ග සන්ධිස්ථානයන් හි ධර්මශාලා තනවා තිබූ බව ද ෆාහියන් සඳහන් කර ලිබේ (Fa–Hien 1928:25). පුරාණ අනුරධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශය පිළිබඳ ව සද්ධර්මරත්නාකරයේ විස්තර කර තිබේ.[15] නගරයේ ස්වභාවය හා එහි භූ දර්ශනය පිළිබඳ ව මහාවංසයේ හා වංසත්තප්පකාසිනියේ වසභ රජ කාලයට අයත් විස්තරවලින් ද විචිත්‍රවත් විස්තරයක් ඉදිරිපත් කරයි. එහි නගරයේ ආරක්ෂාව පිණිස ප්‍රාකාරය ද සතර දොරටුයෙහි මහවතු ද උයන් ද රජතුමා කර වූ බව සඳහන් වේ.[16]

15 රන් කෙසඟ අහසෙහි දිදුලන පන්සල් හා මාළිගා ඇත්තේ ය. ආරුක්කුවෙන් සැදුණු වීදිවල ලෙලෙන නන් දද පෙළ ය. වීදි දෙපස සුදු වැලි ඉස ඇත්තේ ය. මඟ දෙපස මල් බඳුන් ය. කඩු දුනු ඊ අතැති බොහෝ මිනිසුන් ය. ඇත්තු, අශ්වයෝ මෙන් ම දස දහසින් සැදුණු ජනයා ය. මහාකරුවෝ ද, නැට්ටුවෝ ද, සංගීතඥයෝ ද අතෙහි හක්ගෙඩි සහ ස්වර්ණාලංකෘත වෙනත් භාණ්ඩ ඇති ව එහි මෙහි යති. ඔවුහු විවිධ විහාරවලට අයත් වේ. ප්‍රධාන දොරටුවේ සිට දකුණු දොරටුවට දුර ගව් හතරකි. මහාමාවත් අතර චන්ද්‍ර වීදිය, මහාරාජ වීදිය, හිඟුරුවන් වීදිය සහ මහවැලි වීදි ද වේ (සද්රක.11).

16 දවාදසමාතිකා චෙව සුභිකඛතතං ආකාරයි
ගුතතඨං පුරපාකාරං එවං උචචං ආකාරයි
ගොපුරංච චතුදවාරෙ මහාවතතුංච ආකාරයි

නගරයේ තිබූ තත්ත්වය පිළිබඳ ව විස්තර කරන රසවාහිනිය වෙළඳ සැලකින් සුවදැති බෙහෙත් ගැනීමට පැමිණි සුරනිමල යෝධයා අනුරාධපුර නගරයේ උතුරු දොරටුවෙන් පිට වී ගිය බව විස්තර කර තිබේ (රවා.84). ක්වේරෝස් කරන විස්තරය තුළින් ද එවකට අනුරාධපුර නගරයේ පැවති විචිත්‍රත්වය මනාව පැහැදිලි වෙයි. ඔහු පෙන්වාදෙන ආකාරයට නගරය ලීග දොළහක් වට ප්‍රමාණයක් හා ලීග හතරක් පළලින් යුත් බව සඳහන් කරන අතර පවුරුවලින් ද අට්ටාලවලින් ද ගඩොලින් කළ බැම්වලින් ද සමන්විත වූ බවත්, නුවර තුළ තනිමහල් නිවාස තිබූ බවත් පෙන්වා දී ඇත (Queyroz 1930:11 in Silva 2000:58).

මේ ආකාරයට ගොඩනැගී තිබූ නගරය මධ්‍ය ලෙස තබා ගනිමින් එහි භූ දර්ශනය නගරය වටා විකාශනය වීම සිදු වී ඇත. ඒ අනුව නගරය වටකර ප්‍රධාන විහාරාරාම සම්බන්ධ අභ්‍යන්තර වටය සෑදුනේ විහාර පහකිනි (Silva 2000:59). මෙම විහාර ඔරලෝසු කටු ගමන් කරන පිළිවෙලකට බැලුවහොත් උතුරේ සිට පිහිටා ඇත්තේ අභයගිරිය, ජේතවනය, මහා විහාරය, දක්ෂිණ සහ මිරිසවැටිය යන පිළිවෙලට ය (එම). මෙම සෑම විහාරයක ම නිර්මිත පරිසරය දෙස බැලීමේ දී විශාල ස්තූපයක් එහි ප්‍රධාන ගොඩනැඟිල්ල ලෙස පිහිටා තිබෙන අතර එයට නුදුරින් බෝධිඝරයක්, ප්‍රතිමා ගෘහයක්, උපෝසථඝරයක්, අනෙක් පොදු ගොඩනැඟිලි ලෙස සන්නිපාත ශාලාව, ධම්මශාලාව, දාන ශාලාව, ජන්තාඝර පොකුණු ආදිය ද පිහිටා ඇත (එම). ක්‍රි.ව. පස් වැනි ශත වර්ෂය පමණ වනවිට අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය ගොඩනැඟිමේ දී නිර්මිත පරිසරයට එකතු වූ විහාර තුළ විසූ භික්ෂු සංඛ්‍යාත්වය ගැන ෆාහියන් දක්වන විස්තරය තුළින් මෙම විහාරවල තත්ත්වය අවබෝධ කරගත හැකි ය. ඔහු පෙන්වාදෙන ආකාරයට අභයගිරි විහාරයේ භික්ෂූන් 5000ක් ද මහා විහාරයේ භික්ෂූන් 3000 ක් ද මිහින්තලයේ භික්ෂූන් 2000 ක් ද වාසයකර

සරං කාරෙයි උය්‍යානෙ හංසෙ කත්‍ථ විසජ්ජයි
සුරෙ බහු පොකඛරනී කාරපෙත්‍වා කනිං තාහිං
උමමගෙගන ජලං තත්‍ථ පවෙසෙසි මහිපති
එවං නානාවිධං පුඤ්ඤං කත්‍වා වසභ භූපති
හතනතරායො පුඤ්ඤං සො භුතදවා පුඤ්ඤකමෙම සදාරංතා
(*මව*:xxxv:96-98: *වංසපකා.* xxxv :96-99).





ඇත (Fa–Hien 1928:104). මෙම භික්ෂු සංඛ්‍යාත්වය කොපමණ විය හැකි දැයි යන්න සත්‍ය වශයෙන් ම දැන ගැනීමට විහාරවල ඇති බත් ඔරුවල ප්‍රමාණය හා ඒවාට අල්ලන බත් ප්‍රමාණය සම්මත දන් පාත්‍රයක අල්ලන ප්‍රමාණය හා සසඳ බැලීමෙන් අවබෝධ කර ගත හැකි බව සිල්වා පෙන්වා දී තිබේ (Silva 2000:60-61).


අනුරාධපුර භූ දර්ශනයේ මැද කවය කෘෂිකාර්මික ජනාවාසවලින් යුක්ත වූ බව සිල්වා පෙන්වා දී ඇත. විශේෂයෙන් ම නගරය වටා පිහිටන්නා වූ වැව් ඔරලෝසු කටු ගමන් කරන දිශාවට ගතහොත් නුවර වැව, තිසාවැව, බසවක්කුලම හා බුලංකුලම යන ජලාශ අතරින් අක්කර අඩි 31250 ක ධාරිතාවක් ඇති නුවර වැව විශාලත ම ජලාශයයි. මෙම ජලාශ තුළින් නියමිත කුඹුරු අක්කර ප්‍රමාණයට ජලය සැපයිය හැකි වුවහොත් අවුරුදු දෙකකට ලැබෙන අස්වැන්නෙන් (හාල්) මිනිසුන් 123,000 කට ආහාර සැපයීමට ප්‍රමාණවත් වන බව සිල්වා උපකල්පනය කර ඇත (එම:61). අද අනුරාධපුරයේ වාසයකරන 35,000 ජනගහනය සලකා බලන විට එ කල ජනගහනය ඊටත් වඩා වැඩිවිය හැකි බව ඔහුගේ මතය වේ. එසේ වුවත් එම විග්‍රහයෙන් අතීත අනුරාධපුරයේ වාසය කළ ජනතාවගේ සංඛ්‍යාව කොතෙක්දැයි හරියට කිව නොහැකි නමුත් එ මඟින් ඓතිහාසික අවධියේ දී යහපත් අස්වැන්නක් ලබාගන්නා පරිසරයක ස්වයං පෝෂිත ප්‍රජාවක උපරිම සංඛ්‍යාව හැඟෙතැයි උපකල්පනය කළ හැකි ය (එම : 61). ඒ අනුව කෘෂි ආර්ථිකයක් මත පදනම් වූ භූ දර්ශනයේ පරිවර්තනයන් සිල්වා විසින් විස්තර කර ඇත.[17]

17 වැව්වලට පහළින් ඇති බිම් ප්‍රමාණය කොටස් දෙකකට බෙදිය හැකි ය. එහි පළමු වැන්න ජලය සම්පාදනය කළ හැකි බිම් ය. දෙ වැනිව ජලය සම්පාදනය කළ නොහැකි උස් බිම් ය. දෙ වැනි ව සකස්කරන ලද බිම් අදත් භාවිත කරන්නේ ගොවියන්ගේ ජනාවාස සකස් කරගනු සඳහා ය. මෙ වැනි කෘෂි කාර්මික සමාජයක ගොවිතැන මධ්‍යගත වූයේ කමත වටා ය. බොහෝ මංමාවත් ආරම්භ වූයේ එතැනිනි. මෙ වැනි මහමාවත්වලින් කෘෂි ජනපදත්, නගර හා රටේ අනෙකුත් ප්‍රදේශත් එකිනෙකට සම්බන්ධ කෙරිණි. මෙම ප්‍රජාවන් සමාජ හා සංස්කෘතික කටයුතු ද කමත කේන්ද්‍රගත කර පැවති අතර උත්සව සඳහා අවශ්‍ය කරන තාවකාලික ගොඩනැඟිලි නිර්මාණය කරන ලදී. අද වුව ද පිටිසරකදී දැකිය හැකි වරිච්චි බැම්මෙන් යුත් පිදුරු සෙවිලි කරන ලද නිවාසවලට වඩා ආදී ගොවියන්ගේ නිවාස වල ද එතරම් වෙනසක් නොතිබෙන්නට ඇත. කුඩා විහාරවලින් තැනූ බාහිර වටය පිහිටියේ නගරයේ හාත්පස ප්‍රදේශයක ය. ඉන් එහා වූයේ වනරොදයි. අනුරාධපුරයේ තිබුණු කුඩා විහාර වර්ග දෙකකට අයත් වේ. ඒවා නම් පංචාවාස හා වනවාසයි. උතුරින් පටන් ගතහොත් එම පංචාවාස විහාර නම් විජයාරාම,

අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය ගොඩනැඟීම සම්බන්ධ ව අදහස් ඉදිරිපත් කර ඇති අනුරාධ සෙනෙවිරත්න ඔහුගේ සංකල්පය ද මූලාශ්‍රයගත තොරතුරු ඇසුරෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන තිබේ.

i. නගරය (ඇතුළුපුරය)
ii. විහාරාරාම පද්ධතිය (මහා විහාර,පබ්බත විහාර, පධානඝර).
iii. ගම් හා වැව්
iv. වනය හා තාපසාරාමය

වශයෙන් හඳුනාගත හැකි බව පෙන්වා දී තිබේ (Seneviratne 1994:198-202).





සැලසුම් අංක 3.3
අනුරාධපුර පුරාණ නගරයෙහි භූ දර්ශනයෙහි විකාශනය සම්බන්ධ අනුරාධ සෙනෙවිරත්නගේ සැලැස්ම

අසෝකාරාම (පන්කුලිය) පුලියංකුලම, පාචීනතිස්ස පබ්බත, තොළුවිල සහ වෙස්සගිරියයි. කුඩා වනවාස විහාර දාහතරක් අනුරාධපුරයට නිරිත දිග හා වයඹ දිග පිහිටා ඇත. පවත්නා කුටි සංඛ්‍යාව සලකන විට පංචාවාස ගණයට වැටෙන විහාරයක වාසය කළ භික්ෂූන්ගේ සංඛ්‍යාව සිය ගණනක් විය හැකි ය. ඒ අනුව විශාල විහාරවල වාසය කළ සංඝයාගේ ගණන දහස් ගණනාවක් විය හැකි ය. ඒ සමඟ ම තපෝවනය තුළ භාවනාවට හා තවුස් ජීවිතයට ප්‍රමුඛත්වයක් දුන් තවත් භික්ෂු ගනයන් ජීවත් වී ඇත (එම :61-62),








සිතියම් අංක 3.2
පුරාණ අනුරාධපුර පූජා නගරය ආශ්‍රිත විහාරාරාමවල ස්ථානගවීම දැක්වෙන සිතියම

පුරාණ අනුරාධපුර නගර සැලසුම්කරණය හා එහි භූ දර්ශනය සැකසීම යම්කිසි විධිමත් ක්‍රමවේදයකට අනුව ක්‍රි.පූ. පස් වැනි සියවසින් පසු ක්‍රි.ව. දහ වැනි ශත වර්ෂය දක්වා කාලයක් තුළ ගොඩනැගී ඇති ආකාරය ලේඛනගත ප්‍රභවයන්ට අනුව පැහැදිලි වන අතර විශේෂයෙන් ම නගරය වටා ගොඩනැඟෙන්නා වූ ලෙන් විහාර, මහා විහාර, පබ්බත විහාර හා පධානඝර යන විහාර ඒ ඒ විහාරවලට වෙන් වූ සැලසුම් මත නිර්මාණය වූ භූමි දර්ශන මත ගොඩනගා තිබූ බව අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය (බලන්න සිතියම් අංක 3.2).



සැලසුම් අංක 3.4
වෙස්සගිරියේ ලෙන් විහාරාරාම සැලැස්ම



සැලසුම් අංක 3.5
ජේතවනයේ මහා විහාරාරාම සැලැස්ම







සැලසුම් අංක 3.6
වෙස්සගිරිය පබ්බත විහාරාරාම සැලැස්ම



සැලසුම් අංක 3.7
බටහිරාරාම පධානඝර සැලැස්ම

## 3.2 අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය හා එහි ව්‍යාප්තිය අනුරාධපුර ඇතුළුපුරය ඇසුරෙන් හඳුනාගැනීම.

ශත වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණ අතර වැඩි ම පර්යේෂණ ප්‍රමාණයක් සිදු කර ඇති ස්ථානයක් ලෙස අනුරාධපුරය හැඳින්විය හැකි ය. අනුරාධපුර පුරාණ නගරය ඇසුරෙන් සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයනයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

i කේන්ද්‍රීය අධ්‍යයනයන් (Micro Studies)

ii පර්යන්තය තුළ සිදු කරන ලද අධ්‍යයනයන් (Macro Studies)

මෙහි දී කේන්ද්‍රීය අධ්‍යයනයන් වශයෙන් අප සැලකිල්ලට ගනු ලබන්නේ අනුරාධපුර ඇතුළුපුරය ඇසුරෙන් සිදු කර ඇති අධ්‍යයනයන් ය. ඒ අනුව මෙම පරිච්ඡේදය තුළින් සාකච්ඡාවට බඳුන්කරනු ලබන්නේ ඇතුළුපුරයේ භූ දර්ශනය හා එහි ව්‍යාප්තිය සිදු වී ඇති ආකාරය හඳුනාගැනීමය. ඇතුළුපුරයේ ස්ථානගත වීම පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී එහි පිහිටීම පුරාණ නගර සැලසුම තුළ දැකගත හැක්කේ මල්වතු ඔය බටහිර ඉවුරේ සිට සැතපුම් 0.3 දුරින් පිහිටන ස්ථානයක් ලෙස ය (Deraniyagal 1972:57). මුල් යුගවල සිට ම මෙම ස්ථානය කේන්ද්‍රීය ලෙස වර්ධනය වෙමින් ජනාවාස ව්‍යාප්තවීම සිදුවී තිබේ. (Seneviratne 1995:82).

### 3.2.1 ඇතුළුපුරයේ පූර්ව පර්යේෂණ ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ ඉතිහාසය දෙස බැලිමේදී පශ්චාද් යටත්විජිත සමය තුළ පුරාවිද්‍යා කටයුතුවල මුල් යුගය හැඩගැසෙන ආකරය හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම හෙන්රි පාකර් විසින් ලංකාවේ පැරණි ගඩොළු උපයෝගී කර ගෙන කාල රාමුවක් ගොඩනැගීමට උත්සාහ කිරීම මුල් කාලීන පුරාවිද්‍යා පර්යේෂණ තුළ වැදගත් වේ (Parker 1909:209-220). ඉන් අනතුරු ව එච්.ඩබ්.කොඩ්රින්ටන් විසින් පැරණි කාසි උපයෝගී කර ගෙන





අනු පිළිවෙලකට කාල රාමුවක් ගොඩනැගීමට උත්සාහ කිරීම ද පුරාවිද්‍යා පර්යේෂණ ශ්‍රී ලංකාව තුළ ක්‍රමවත් ව හැඩ ගැසීමට මංසළකුණු විවරකර දීමක් විය (Codrington :1924).

දහනම වැනි සියවස තුළ සිට ම අනුරාධපුර ඇතුළුපුරය සම්බන්ධ විවිධ පර්යේෂණයන් සිදු කිරීම දැකගත හැකි වේ. ඒ අනුව අනුරාධපුර ඇතුළුපුරය හා එහි භූ විෂමතාවය සිතියම්ගත කිරීමේ මුල් ම ගෞරවය හිමි වන්නේ එච්.සී.පී.බෙල්ට ය. ඔහු විසින් 1893 දී මෙම කාර්යය සිදු කර ඇති බව පුරාවිද්‍යා පාලන වාර්තාවල සඳහන් වේ (*ASCAR*. 1904). බෙල් විසින් ගෙඩිගෙය සංරක්ෂණය කිරීම උදෙසා එම ස්ථානය කැණීම් කිරීම ද කැපීපෙනන අතර මෙය ඇතුළුපුරයේ සිදු කර ඇති මුල් ම කැණීම වශයෙන් ද හඳුන්වාදිය හැකි ය (එම). මින් පසු හෙන්රි පාකර් ඇතුළුපුරයේ පර්යේෂණ සඳහා අවධානය යොමු කර දකුණු ප්‍රාකාරය සිතියම් ගතකර තිබේ (Parker 1909:274). 1913 වර්ෂයේ දී අයර්ටන් විසින් ඇතුළුපුරයේ උතුරුදිග ප්‍රදේශයේ කැණීම් කටයුතු සිදු කර තිබෙන අතර අදාළ කැණීම් සම්බන්ධ තොරතුරු එළි දැක්වෙන්නේ ඒ.එම් හොකාර්ට්ගේ සමයේ දී ය (Hocart 1924:48- 49;1928-1929). උතුරුදිග ප්‍රදේශයේ අයර්ටන් විසින් සිදු කරන ලද කැණීම්වල දී පැරණි නිවාසයක පාදමක් අනාවරණය කර ගෙන ඇත (එම).

ඇතුළුපුරය ආශ්‍රයෙන් හොකාර්ට් විසින් සිදු කරන ලද පර්යේෂණ වංසකතා හා ශිලා ලේඛන සාධක පදනම් කර ගනිමින් නගර සැලසුම පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයන් ලෙස සැළකිය හැකි ය (Hocart 1928:150). ඔහු ප්‍රකාශ කර ඇති ආකාරයට නගර සැලැස්මේ උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර දෙසට දිශානුගත ව ගමන් ගන්නා වූ මාර්ග තිබූ බව පෙන්වා දී ඇත (එම:151). හතරැස් හැඩ ගන්නා නගරය කොටස් හතරකට බෙදා එහි නැගෙනහිර අන්තයේ රජ මාළිගය ස්ථානගත ව තිබූ බව ප්‍රකාශ කර තිබේ (එම : 156). අනුරාධපුර නගරයේ නාගරික සැලසුම අධ්‍යනයේ දී හොකාර්ට් විසින් කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ වූ යම් යම් කාරණා කෙරෙහි සැලකිල්ල දක්වමින් නගර සැලසුම අධ්‍යයනය කළ බව පෙනේ (Horcart 1930:86). එම සැලසුම ලංකාවේ නාගරික

ව්‍යුහයක් තුළ දැකගත හැකි සත්‍ය සැලසුමක් ලෙස ඔහු අර්ථ දක්වා ඇත (එම:88). හොකාර්ට් විසින් ඉදිරිපත් කරනු ලැබූ මෙම මතවාදය ඊට පසු අඩු වැඩි වශයෙන් දියුණු කිරීම ශ්‍රී ලාංකික පර්යේෂකයන් අතින් ද සිදු වි ඇත (Wheatley 1971:256 ; Hettiarchi 1988:190). නමුත් ජගත් විෂයීය ලෙස වර්ධනය වූ නාගරික සැලැස්මක් ශ්‍රී ලංකාවේ නොතිබූ බව වික්‍රමරත්න පෙන්වා දී ඇත (Wickramaratne 1987:45). එසේ ම කොටස්වලට බෙදීගිය නාගරික ව්‍යුහයක් අනුරාධපුරයේ නොතිබූ බව ද ඔහු ගේ මතය වී තිබේ (එම:45).

ඇතුළුපුරයේ සිදු කර තිබෙන පර්යේෂණ අතර සෙනරත් පරණවිතානගේ පර්යේෂණ කටයුතු ද වැදගත් වේ. ඔහු විසින් විශාල ස්මාරක හයක් නිරාවරණය කරන ලද අතර ඒ සඳහා කැණීම් කටයුතු සිදු කරනු ලැබ ඇත. ඒ අතර අයර්ටන් විසින් හඳුනාගනු ලැබූ මහාපාලි දාන ශාලාව මතුපිට කොටස් ඉවත් කර මතුකර ගැනීම කැපීපෙනේ (Paranavithana 1936:25). එසේ ම ඔහු දළදා ගෙය ආශ්‍රිත කැණීම් සිදු කර එම ප්‍රදේශය ද අනාවරණය කිරීම අතිශයින් ම වැදගත් වේ (එම:14-20). එහි දී හමු වූ සියලු ම වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ක්‍රි.ව. හතර හා දහ වැනි සියවස දක්වා කාලයට අයත් ඒවා බව ප්‍රකාශ කර ඇත (එම:19). ගෙඩිගෙය උතුරු ද්වාරය කැණීම් කිරීම ද පරණවිතාන විසින් සිදු කර ඇත (එම:4-8). මේ ආකාරයට අනුරාධපුරය ඇසුරෙන් ආරම්භ කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණයන්ගේ පළමු වැනි අදියර වාස්තුවිද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනන කිරීමේ යොමුවකින් යුතු ව සිදු කරන ලද බව පෙනෙන අතර මින්පසු එළඹෙන අදියර මතුපිට දත්ත මත නොව පොළොව අභ්‍යන්තරයේ පවතින දත්ත පදනමින් ඉතිහාසය ගොඩනැඟීමේ යොමුවකින් යුතු ව ඇරඹීම හඳුනාගත හැකි ය.

ඇතුළුපුරය ආශ්‍රිත පර්යේෂණ වෙත යොමු වීමේ දෙ වැනි අවධිය කළ එළි බසිනු ලබන්නේ 1957 වර්ෂයෙන් පසුව ය. පී.ඊ.පී. දැරණියගල හා පී.සී.සෙස්තියරි විසින් පුරාවිද්‍යා කැණීම් ඇතුළුපුරය ඇසුරෙන් ආරම්භ කිරීම අතිශයින් වැදගත් වේ. ඇතුළුපුරයේ ස්ථාන කිහිපයක මොවුන් විසින් සිදු කරනු ලැබූ





පුරාවිද්‍යා කැණීම් සඳහා වීලරියානු පෙට්ටි ක්‍රමවේදය පදනම් කරගත් අතර ගැටලු අභිමුඛ තත්ත්වයන් ඔස්සේ කැණීම් දියත් කිරීම ද කැපීපෙනේ. විශේෂයෙන් ම දැරණියගල හා සෙස්තියරි විසින් පොළොව මතුපිට දැකගත හැකි ස්මාරක හා කැණීම් තුළින් හමුවන්නා වූ භෞතික සංස්කෘතික තොරතුරු ප්‍රධාන අවධි දෙකකට හා අභ්‍යන්තර තැන්පත්වීම් තවත් උප අවධිවලට අයත් බව තේරුම් ගැනීමට උත්සාහකර ඇත (Deraniyagala 1957 ; Sestieri 1958). මෙහි තවත් වැදගත් කරුණක් වන්නේ සෙස්තියරි විසින් ඇතුළුපුරයේ ගෙඩිගේ අසළ සිදු කරනු ලැබූ කැණීමේ දී මතු වූ මැටි මෙවලම් මූලික වර්ගීකරණයකට ලක්කොට අනුපිළිවෙලක් ගොඩනගා ගැනීමට උත්සාහ කිරීමයි (Sestirei : 1958).

ඉන් අනතුරු ව අනුරාධපුර ඇතුළුපුරයේ සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණ අතර නගරයේ ද්වාර පිළිබඳ ව අධ්‍යයනයන් ආරම්භ කිරීම චාර්ල්ස් ගොඩකුඹුර විසින් 1960 වර්ෂයේ දී අරඹා ඇත. ඔහු විසින් දකුණු ද්වාරය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ කැණීම්වල දී ඇතුළුපුරයෙන් ඇතුළතට හා පිටතට විහිදෙන්නා වූ අඩි 57 ක් පමණ පළල මාර්ගයක් සොයා ගත් බව සඳහන් කර ඇත. එම මාර්ගය මැද කළුගලින් තැනූ අත්තිවාරමක් මතඅඩි 26 x 16 ප්‍රමාණයේ ගඩොළු ඉදිකිරීමක් දැකගත හැකි වූ බව ඔහු දක්වා තිබේ. එම ගඩොළු ඉදිකිරීම යම්කිසි මුරකපොල්ලක ස්වරූපයක් ගන්නා නිර්මාණයන් විය හැකි බව ඔහු පෙන්වා දී තිබේ (Godakubura 1960:64). ඉන්පසු රාජා ද සිල්වා විසින් නැගෙනහිර ද්වාරය ආශ්‍රිත ව කැණීම් සිදු කර එම ද්වාරය හඳුනාගෙන ඇත (Coningham 1993:111-122 හ එම 1994:179-184).

පී.ඊ.පී.දැරණියගල ආරම්භ කරනු ලැබූ ගැටලු අභිමුඛ තත්ත්වයන්හි වඩා වර්ධනාත්මක අවධිය ලෙස සළකනු ලබන්නේ 1969 වසරේ සිට ඇතුළුපුරයේ ආරම්භ කරනු ලැබූ පර්යේෂණයන් ය. 1969 වර්ෂයේ සිරාන් දැරණියගල හා කොඩ්රිංටන් විසින් මෙම කැණීම් ආරම්භ කරනු ලැබ තිබේ (Codrigton 1969:32-34;Deraniyagala 1972:48- 169). පී.ඊ.පී.දැරණියගල හා සෙස්තියරි විසින් සිදු කරනු ලැබූ කැණීම් කිහිපයක් නැවත විවෘත

කිරීම මොවුන් විසින් සිදු කරනු ලැබූ අතර එයින් ස්ථාන හතරක් මව් පාෂාණය දක්වා කැණීම් කිරීම කැපීපෙනේ. ඒ අනුව මතුපිට පොළොව මට්ටමේ සිට මව් පාෂාණය දක්වා මීටර් 7 සෙ.මී. 60 ක් දක්වා 1969 වර්ෂයේ දී ගෙඩිගෙය අසළ කැණීම් සිදු කර ඇත. මෙම කැණීම් තුළින් භූමියේ මතුපිට පවතින්නා වූ ස්මාරක හා පොළොව අභ්‍යන්තරයේ මතුකරගත් භෞතික සංස්කෘතික තොරතුරු අතර විශාල කාල පරාසයක් පවතින බවත්, එම කාල පරාසය ඇතිවීම සඳහා දිගු සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලියක් යථෝක්ත භූමියේ සිදු වී ඇති බව ඔවුන් හඳුනාගනු ලැබී ය (Deraniyagala 1972:48-169). 1969 දී සිදු කරනු ලැබූ මෙම කැණීම මඟින් සිරාන් දැරණියගල විසින් ඇතුළුපුරයේ ජනාවාස සම්බන්ධ පර්යේෂණ සඳහා ප්‍රශ්නාවලියක් ගොඩනගනු ලැබූ අතර එම පර්යේෂණ ප්‍රශ්නාවලිය තුළ,

i. ඇතුළුපුරයේ මුල් මානව ජනාවාස ආරම්භ වන්නේ කවදා ද?

ii. ඇතුළුපුරයේ ජනාවාස නාගරීකරණයට පත්වන්නේ කවදා ද?


iii. එහි ජීවත් වූ ජනතාවගේ ජීවනෝපාය ක්‍රමය කුමක් ද?

iv. ඇතුළුපුර නාගරික ක්‍රියාවලිය උතුරු ඉන්දීය නාගරික ක්‍රියාවලියට පූර්ව සිදු වූවා ද ? යන ප්‍රශ්න නගා ඇත (එම).

මෙ වැනි ප්‍රශ්නාවලියක් නැගීම සඳහා ගෙඩිගෙය අසළ සිදු කරනු ලැබූ කැණීමේ දී ඔහු හඳුනාගනු ලැබූ පුරාණ ජනාවාස රටාව වැදගත් වූ අතර අදාළ පස් තැන්පතු ව තුළ ක්‍රමානුකූල ව විකාශනය වූ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතික අවධිය (Mesolithic Culture), පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධිය (ඡරදඑද ායසිඑදරසජ ඡැරසදා), මුල් ඓතිහාසික අවධිය (Early historic Period) හා ඓතිහාසික සංස්කෘතික අවධිය (Historic Period) වශයෙන් ඔවුහු හඳුනාගැනීම අතිශයින් ම වැදගත් ය (එම : 56) (බලන්න සැලසුම් අංක 3.10).









(*Deraniyagala* 1972)
සැලසුම් අංක 3.8
1969 වර්ෂයේ දී අනුරාධපුර ඇතුළුපුරයෙහි ගෙඩිගෙය අසළ දී සිදු කරන ලද කැණීමෙහි පාංශු පැතිකඩ දැක්වෙන සැලසුම


1984 වසරේ සිට නැවතත් සිරාන් දැරණියගල විසින් ඇතුළුපුර පුරාවිද්‍යා ව්‍යාපෘතිය (*ACP*) ආරම්භ කිරීම කේන්ද්‍රීය භූ දර්ශනය ව්‍යාප්තිය හඳුනාගැනීමෙහිලා බෙහෙවින් වැදගත් වේ. මෙම ව්‍යාපෘතිය 1969 දී කොඩ්රිංටන් හා දැරණියගල නගනු ලැබූ පර්යේෂණ ප්‍රශ්නාවලියට පිළිතුරු සෙවීමට ද මුල් වූ අතර ඒ සඳහා ඔහු විසින් විවිධ විෂමතාවයන් සහිත භූමියේ ස්ථාන දාහතර පර්යේෂණ කැණීම් ආරම්භ කරනු ලැබීය. එම පර්යේෂණ කැණීම් සිදු කළ ස්ථානයන්හි ස්ථාන නාම (Site Code) AG, ARW, ADB, AEG, AMP, ASM, AGW, A3BW, A2BW, A1BW, ASW, AWP, AMG වශයෙන් විය (බලන්න සිතියම් අංක 3.3 , 3.4).




සිතියම් අංක 3.3
ඇතුළුපුරයෙහි කැණීම් සිදු කළ ස්ථාන දැක්වෙන සිතියම








සිතියම් අංක 3.4
ඇතුළුපුරයෙහි භූ භෞතික පිහිටීම දැක්වෙන සිතියම

1989 වර්ෂයේ දී (*ACP*) ව්‍යාපෘතියේ උප ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස බ්‍රිතාන්‍ය අනුරාධපුර ඇතුළුපුර ව්‍යාපෘතිය *(ACAP)* (The British Anuradapura Citadel Archaeology project) පෙන්වාදිය හැකි ය. මෙම ව්‍යාපෘතිය යටතේ විවෘත කැණීම් ක්‍රමවේදයට අනුගත වෙමින් වර්ග මීටර් 100 (10m x 10m) ප්‍රදේශය පර්යේෂණ කැණීමකට භාජනය කරන ලදි. එය පිළිවෙලින් 1989, 1990, 1991 යන වර්ෂ තුළ ක්‍රියාත්මක විය (Coningham 1990,1991 ; Coningham and Allchin 1992). මෙම කාලය තුළ ම 1989 - 1992 ඇතුළුපුර නාගරික ප්‍රදේශයේ ජපාන *JOCV* (Japan Overseas Copperation Volunteers) විසින් ප්‍රාකාරය අධ්‍යයනය සඳහා ගවේෂණයක් දියත් කර එම ගවේෂණ තුළින් ප්‍රාකාරයේ පිහිටීම හඳුනාගෙන ඇත. එයට අමතර ව ප්‍රාකාරයේ තෝරාගත් ස්ථාන කිහිපයක් කැණීම් සිදු කිරීම ද *JOCV* ආයතනය මඟින් සිදු කර තිබේ (Yoshiko and Nozaki : 1993). ඇතුළුපුරයේ භූ දර්ශනය හඳුනාගැනීමේ වත්මන් පර්යේෂණ 2007 වර්ෂයේ සිට බර්ලින්හි Free විශ්වවිද්‍යාලයේ හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ ව ආරම්භ කර *ADM* (Anuradhapura Dalada Maligawa) යන ස්ථාන නාමය යටතේ කැණීම් සිදු කර ඇත. එම පර්යේෂණ ක්‍රියාවලිය ද ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය හඳුනාගැනීමට බෙහෙවින් ම උපකාරවන පර්යේෂණයක් බව පෙන්වාදිය හැකි ය.

### 3.2.2 ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනයේ ව්‍යාප්තිය

අනුරාධපුර ඇතුළුපුරය පුරාණයේ දී වටපවුරකින් හා දිය අගලකින් වට වී පැවති භූමියකි (Seneviratne 1995:198-202). මහාවංසයේ සඳහන් පුවත් සැලකිල්ලට ගනිමින් හෙන්රි පාකර් විසින් පැරණි නගරය සැලසුමකට නගා ඇත (Parker 1909:274). මූලාශ්‍රය හා අභිලේඛන දත්ත උපයෝගී කර ගනිමින් හොකාර්ට් විසින් අනුරධපුර නගරය කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ විස්තර කරන්නා වූ නාගරික සැලසුමට සමාන බව පෙන්වා දීමට උත්සාහ ගෙන තිබේ (Hocart 1930:86). අනුරාධපුර ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය අධ්‍යයනයේ දී එහි ඉතිහාසය කාල වකවානු





තුනක් තුළ සිදු වී ඇති බව සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරු අනුව හඳුනාගත හැකි ය. ඉන් පළමු වැනි අවස්ථාව ලෙස විජය රජු සමඟ පැමිණි ඔහුගේ ඇමතියකු වන අනුරාධ නැමැත්තා අනුරාධග්‍රාම නමින් ගමක් පිහිටුවීමත්, (*Mv*.Viii:43) දෙ වැනි අවස්ථාව භද්දකච්ඡායනා කුමරියගේ සම්ප්‍රාප්තිය සමඟ, අනුරාධ නැමැත්තා වැවක් හා රජ ගෙයක් ඉදිකිරීමත්, (එම : ix :11-12) තෙ වැනි අවස්ථාව පණ්ඩුකාභය රජු විසින් අගනුවර වශයෙන් අනුරාධපුරය නගරයක් දක්වා සංවර්ධනය කිරීමත් පෙන්වාදිය හැකි ය (එම : ix :77).

ක්‍රි.පූ. පස් වැනි ශත වර්ෂය පමණ සිට සිදු වූ බව සඳහන් වන මෙම ක්‍රියාවලිය අධ්‍යයනයේ දී මූලාශ්‍රයගත තොරතුරු අනුව පමණක් අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය අධ්‍යයනය කිරීම ප්‍රමාණවත් නොවේ. අනුරාධපුර නාගරික ප්‍රදේශයේ සංස්කෘතික විකාශනය භූ දර්ශනය යථාර්ථවාදී ලෙස අධ්‍යයනය සඳහා ලේඛනගත ප්‍රභවයන් හා පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් යන අංශ දෙක කෙරෙහි ම අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ අනුව ඇතුළුපුරය ආශ්‍රිත සංස්කෘතික භූ දර්ශනය ආරම්භ වී විකාශනය වීම සම්බන්ධ තොරතුරු භෞතික සංස්කෘති ද්‍රව්‍යය (Material Culture) ඇසුරෙන් හඳුනාගැනීමට උත්සාහ කිරීමේ දී ලේඛනගත ප්‍රභවයන්හි අන්තර්ගත වන්නා වූ භූ දර්ශනයට වඩා විකල්ප ආකාරයට ඇතුළුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනයේ හැඩගැසීම හඳුනාගැනීමට අවකාශ සැලසේ (Deraniygala - 1992:207-730).

#### 3.2.2.1 ඇතුළුපුර ප්‍රාග් ඓතිහාසික සංස්කෘතිය හා භූ දර්ශනය

1969 වසරේ සිට මේ දක්වා විවිධ අදියර යටතේ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැණීම්වලට අනුව මතුපිට පොළොව මට්ටමේ සිට අඩි 40 ක් ගැඹුරට විහිදෙන්නා වූ ඇතුළුපුර ජනාවාසයේ පස් තැන්පතු ව තුළ මුල් ම මානව ජනාවාස පිළිබඳ ව තොරතුරු වාර්තා වන්නේ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධිය ඇසුරෙනි. අනුරාධපුර ගෙඩිගේ 1969 (AG 69), 1985 (AG 85) කැණීම් දත්තවලට අනුව මධ්‍ය ශිලා සංස්කෘතිය අදින් වසර 5850කට

පූර්ව (ක්‍රි.පූ.3900) දී පමණ යථෝක්ත භූමියේ ස්ථානගත ව තිබී ඇත (එම:729).

ශ්‍රී ලංකාවේ මෙතෙක් ලැබී ඇති ආදිත ම ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිළිබඳ ව සාධක අදින් වසර 125,000 කාලයට අයත් කළ හැකි ය. අග්නිදිග ශ්‍රී ලංකාවේ බූන්දල අසල ඉපැරණි වැලිකඳු ආශ්‍රිත තැන්පතුවල සිදු කරනු ලැබූ පර්යේෂණ කැණීම්වලින් මධ්‍යතන පුරාශිලා අවධියට (Middle Pelaeolithic) අයත් කළ හැකි ප්‍රාග් ඓතිහාසික සාධක හමුවන බව බව දැරණියගල ප්‍රකාශ කර තිබේ (එම :252-254, 458, 688).

මෙම කාල වකවානුවට පසු අදින් වසර 34000කට පෙර සිට ශ්‍රී ලංකාවේ **මධ්‍ය ශිලා අවධිය** (Mesolithic) සම්බන්ධ අංග සම්පූර්ණ සාධක බොහොමයක් ලැබී ඇත (එම : 458- 461). ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා අවධිය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී දකුණු ආසියාවේ ආදිත ම කාය ව්‍යවච්ඡේදීය මානවයා පිළිබඳ ව ආදිත ම සාධක ශ්‍රී ලංකාවෙන් සන්තර්පණය කරන අතර එසේ හමු වූ බලන්ගොඩ මානව සාධක පෞරාණිකත්වයෙන් ලොව කවර තැනකින් වුවද රැස් කර ගනු ලැබූ සමූහ තුනකට පමණක් සමාන ව තිබේ (දැරණියගල 1990:225). ඒවා ප්‍රංශයේ ලෙස්කොටෙස් (නූතන අවධියට 31000), ඊජිප්තුවේ නස්ලෙට් බෙට්ස් (නූතන අවධියට 30000) සහ චෙකොස්ලෝවැකියාවේ දොල්නි වෙස්ටෝනි (නූතන අවධියට 29000) යන ස්ථානවලින් හමුවී ඇති දත්තයන්ට වඩා පැරණි වේ (Kennedy and Deraniyagala 1989:394-399).

මෙසේ ශ්‍රී ලංකාවේ ආරම්භ ව තිබූ මෙසොලිතික සංස්කෘතිය අනුරාධපුර ඇතුළුපුරයේ ස්ථානගත වන්නේ අදින් වසර 5850කට පෙරදී බව පෙනේ. අනුරාධපුර ගෙඩිගේ (AG 69) හා (AG 85) යන කැණීම් සාධකවලට අනුව ස්තර ලිඛිත කාර්යාවලිය තුළින් මධ්‍ය ශිලා සංස්කෘතිය අනුරාධපුරයේ දී තහවුරු කර ඇත (Deraniyagala 1992:729; Deraniyagala 1972:48-65). ඇතුළුපුරයෙන් හමු වී ඇති මධ්‍ය ශිලා අවධියට සම්බන්ධ මානව කෘතක සාධක රතු දුඹුරු පාංශු කලාපයෙන් (Reddish Brown Earths) (Panabokke 1967:68-69) වාර්තා වී





තිබේ (Deraniyagala 1992:700). එසේ ලැබී ඇති ද්‍රව්‍යයමය සාධක අතර ශිලා මෙවලම් සුවිශේෂ වන අතර ඒවා කැපීමේ උපකරණ (cutter), සීරුම් මෙවලම් (scraper), තැලුම් උපකරණ (chopper), උල් උපකරණ (point), මිටි (hammer) මෙන් ම පතුරු (waste) වශයෙන් හඳුනාගෙන ඇත (Deraniyagala 1972:61). තිරුවානා පාෂාණ භාවිත කර නිර්මාණය කර තිබෙන ශිලා මෙවලම් හා ඉන් ඉවත් වූ පතුරු කොටස් එක ම ස්ථානයෙන් හමුවන බැවින් අනුරාධපුර ඇතුළුපුර ප්‍රාග් ඓතිහාසික ජනාවාසය, ජනාවාසයක් පමණක් නොව ශිලා මෙවලම් නිෂ්පාදනය කරන ලද ස්ථානයක් ව පැවති ඇති බව පෙනේ (එම:64). එසේ ම මෙම ජනාවාසය බෙල්ලන් බැඳි පැලැස්ස මානව වාසස්ථානයේ මෙන් බලන්ගොඩ මානවයා නමින් ව්‍යවහාර කරන මධ්‍ය ශිලා මානවයා වාසයකරන ලද ස්ථානයක් වශයෙන් ඔහු හඳුන්වා දී ඇත (එම:64).


අනුරාධපුර ඇතුළුපුරයේ මධ්‍ය ශිලා ජනාවාසයේ ස්ථානගත වීම දෙස බැලීමේ දී යථෝක්ත ස්ථානයේ භූ දර්ශනයේ පිහිටීම ද ප්‍රාථමික දඩයම් යුගයේ ජනාවාසයක් ගොඩනැගීමට ඍජු ව බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන් ම අනුරාධපුර ඇතුළුපුර ජනාවාසයේ මතුපිට මුහුදු මට්ටම් දෙස අවධානය යොමු කිරිමේ දී එය එම ප්‍රදේශයට හාත්පස භූමි ප්‍රදේශයට වඩා උස ස්ථානයක ස්ථානගත වී ඇති බව හඳුනාගත හැකි ය. ඇතුළුපුර මතුපිට මුහුදු මට්ටම මීටර් 86.16 ක් වන විට (Deraniyagala 1992:725) එයට දකුණු පසින් ඇති මහා විහාර භූමියේ රුවන්වැලිසෑයට උතුරු පසින් මතුපිට මුහුදු මට්ටම් උස මීටර් 80.30 ක් ද, ජේතවනාරාම විහාර භූමියේ මතුපිට මුහුදු මට්ටම් මීටර් 76.80 ක් ද, (මැන්දිස් 2001:10) අභයගිරි විහාරයේ සන්නිපාත ශාලාව හා දානශාලාව අතර භූමියේ මතුපිට මුහුදු මට්ටමේ උස මිටර් 81.42 ක්ද, (කුලතුංග 1998:14), ඇතුළුපුරයෙන් නැගෙනහිර මල්වතු ඔය සීමාවේ මුහුදු මට්ටමේ උස මීටර් 75.53ක් ද වේ. මේ අනුව ඇතුළුපුර භූමිය එහි හාත්පස කලාපයට වඩා උච්ච ස්ථානයක පිහිටා ඇති බව පැහැදිලි වේ. එසේ ම ජේතවන භූමිය හා ඇතුළුපුර භූමිය දෙස අවධානය යොමු කිරීමේ දී ජේතවන භූමියේ මතුපිට මට්ටමේ දී (surface Leval) මුහුදු මට්ටම් උස

හා ඇතුළුපුරයේ මව් පාෂාණයේ (Bed Rock) හි මුහුදු මට්ටම් උස යම් සමාන උසකින් පිහිටීම දැකගත හැකි ය. මේ නිසා ප්‍රාථමික ජන සමාජයකට ස්වභාවික උවදුරුවලින් ලෙහෙසියෙන් බේරී සිටීමට හැකි ස්ථානයක් ලෙස යථෝක්ත භූමියේ පිහිටීම වැදගත් වේ.

මල්වතු ඔයේ සිට සැතපුම් 0.3 ක් පමණ දුරකින් ඔයට ඉතා ළංව පිහිටන මෙම ස්ථානය මල්වතු ඔයේ බටහිර නිම්නය තුළට වන ජල ගැලීම්වලින් වැළකී සිටීමට ද ස්වභාවික ආරක්ෂක ස්ථානයක් වශයෙන් එක් අතකින් භාවිත කළ හැකි ය. මෙවන් ස්වභාවික ආරක්ෂිත ස්ථාන ප්‍රාථමික යුගයක ජීවත්වන ජනයා තෝරාග ැනීම කාලෝචිත වන්නේ අනුරාධපුර නගරයේ බටහිර පසින් විහිදෙන්නා වූ (වෙස්සගිරියේ සිට අභයගිරිය දක්වා) ස්වභාවික පාෂාණ ඛණ්ඩය විශේෂයෙන් ම ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ දඩයම් තිත්පොළ සඳහා වැඩි උපයෝගීතාවයක් දැක්වීමට සුදුසු භූමියක් වන බැවිනි (බලන්න සිතියම් අංක 3.4). දීඝ පාෂාණයට බටහිර දෙසින් පිහිටන භූමිය ස්වභාවිකව ම උච්ච වන අතර ඒ නිසා ම ස්වභාවික භූ පතන එහි බටහිර දෙස නිර්මාණය වී ජලය එක්රැස් වන ස්වභාවික පතහක් ලෙස පුරාණයේ දී පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. එවැනි ස්ථාන වෙත ජලය සොයා පැමිණෙන සතුන් දඩයම් කිරීමටත් මත්ස්‍ය දඩයම සිදු කිරීමටත් ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ට හැකියාව ලැබේ. ඒ අනුව මෙ වැනි භූ දර්ශනයක් සහිත ස්ථානයත් ප්‍රාථමික ජන සමාජය තෝරාගැනීම ඔවුන්ගේ ජීවනෝපාය ක්‍රමයට ගැලපෙන බව පෙන්වාදිය හැකි ය.







සිතියම් අංක 3.5
දීඝ පාෂාණයේ පිහිටීම දැක්වෙන සිතියම
(දීඝ පාෂාණයේ පිහිටීම ඊතලයෙන් දක්වා ඇති දිශාවට ගමන් කරයි)

එසේම ඇතුළුපුරයට උතුරන් අභයගිරිය ආශ්‍රිත ව දීඝ පාෂාණය තුළ පිහිටන ස්වභාවික ලෙන් පද්ධතිය ද මැද ශිලා යුගයේ ජීවත් වූ මිනිසුන්ගේ වාසස්ථානවලට සුදුසු ස්ථාන වන්නට ඇත. මුල් ඓතිහාසික අවධියේ දී එ නම් ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු සංඝයා සඳහා කටාර කොටා එම ලෙන් පූජා කිරීමෙන් පසු මධ්‍ය ඓතිහාසික අවධියේ ලෙන් ආවරණ ඉදි කිරීම සමඟ එතෙක් පැවති ප්‍රාග් ඓතිහාසික තැන්පතු එම ස්ථානවලින් ඉවත් වීමට ඉඩ ඇති බැවින්, ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා සාධක එම ස්ථානවලින් මේවන විට හඳුනාගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් ඇතුළුපුර කේන්ද්‍රීය ජනාවාසය තුළ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා ජනාවාසයක් ස්ථානගත වීමට මල්වතු ඔය බටහිර නිම්නයේ පිහිටීමත් දීඝ පාෂාණයේ ගල් ගුහාවල පිහිටීමත් බලපාන්නට ඇති අතර මෙයට අමතර ව දඩයමට අවශ්‍ය කරන ගල් අවි නිර්මාණය කර ගැනීම සඳහා අවැසි තිරුවානා ඇතුළු පාෂාණ මල්වතු ඔය තුළ දැකගත හැකි ය.

තිරුවාණා ඇතුළු පාෂාණ ඉහළ ගංගා නිම්නයේ සිට ජලය සමඟ පහළට ගලා විත් ගං දගර සහිත ස්ථානයක් වන පැරණි අනුරාධපුර නාගරික ප්‍රදේශයේ දී තැන්පත්වීමේ වැඩි ප්‍රවණතාවයක් පවතී. ඒ නිසා එවැනි ඛනිජ හා පාෂාණ ආයුධ නිර්මාණයට ප්‍රයෝජනයට ගැනීමට ද, මෙම මිනිසුන්ට පහසුව සලසන්නට ඇත. එසේම මල්වතු ඔය නිම්නයේ ඇති සාරවත් පස තුළ ඇති ශාක පද්ධතියෙන් අල, ඵල, මුල් ආහාරයට ගැනීමේ හැකියාව ද මධ්‍ය ශිලා මිනිසාගේ ජනාවාස ඇතුළුපුර වැනි උස් ප්‍රදේශයක ස්ථානගතවීමට බලපා ඇත. දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට චාතුර්තික අවධියේ අවසන් භාගයේ ජීවත් වූ බලන්ගොඩ මානවයා ලංකාවේ සෑම භූගෝලීය කලාපයක ම ජීවත් වී තිබේ (Deraniyagala 1992:351). ඔහු ජීවත්වූ ස්ථාන අතර මහඑළිය වගුරු බිම් හා සීතල උස් සානු ප්‍රදේශත්, විල්පත්තුව මන්නාරම අනුරාධපුර වැනි ශුෂ්ක ප්‍රදේශත් සබරගමුව වැනි ඝර්ම කලාපීය වනාන්තරත් පෙන්වාදිය හැකි ය (එම). දැරණියගලගේ විග්‍රහ කිරීම්වලට අනුව මධ්‍ය ශිලා ජනාවාසයක් වර්ග මීටර් 50 කට වැඩි වන්නේ ඉතා ම කලාතුරකිනි (එම). ඒ අනුව අනුරාධපුර





ඇතුළුපුර මධ්‍ය ශිලා වාසස්ථානයේ ස්ථානගතවීම හඳුනාගැනීමේ දී දැරණියගල පෙන්වා දී ඇති වාසස්ථාන ව්‍යාප්තියට ද එම භූමියේ පිහිටීම බලපා ඇති බව පෙන්වාදිය හැකි ය.

ඇතුළුපුර ජීවත් වූ මධ්‍ය ශිලා මානවයාගේ ජීවනෝපාය ක්‍රමය කෙසේ වීමට ඇත්දැයි විමසීමේ දී මොවුන්ගේ ජීවන ක්‍රමය ශ්‍රී ලංකාවේ වැදිජනයාටත් ඉන්දියාවේ කදාර් මලපත්තරම් හා චෙන්චූ වැනි ආදි වාසීන්ටත්, අන්දමන් දූපත් වාසීන්ට හා මැලේසියාවේ සෙමැන් වැනි ආදී වාසීන්ගේ ජීවන ක්‍රමත් අතර දැඩි වෙනස් කමක් නොවන්නට ඇති බව විශ්වාස කරනු ලැබේ (එම:412-421,451-457). විශේෂයෙන් ම අනුරාධපුරයේ පවතින කාලගුණික හා දේශගුණික තත්ත්වයන්ට අනුව මොවුන් බොහෝ විට වාර්ෂික ව වෙනස්වන ආහාර චක්‍රයක් ක්‍රියාත්මක කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි අතර සමහර විට මුල් ජනාවාසයට ආසන්න ප්‍රදේශයේ තවත් ස්ථාන ගණනාවක සත්ත්ව දඩයම හා එලවැල රැස් කිරීමට මොවුන් සංක්‍රමණය වීමට බොහෝ ඉඩ තිබේ. ජේතවනය හා වෙස්සගිරියේ සිදු කරනු ලැබූ කැණීම් තුළින් සොයා ගනු ලැබූ ගල් අවි සාධකවලට අනුව සංක්‍රමණික ජන කණ්ඩායමක දඩයම් තිප්පොළක් හෝ වාසස්ථානයක් එම භූමියේ තිබූ බව හඳුනාගත හැකි ය (Mendis 2008ඵ18). මෑතදී කැණීම් සිදු කරන ලද ප්‍රාග් ඓතිහාසික ගල්ලෙන්වලින් හා බෙල්ලන්බැඳි පැළැස්සෙන් මනාව ආරක්ෂා වී තිබූ ශාක හා සත්තව ආහාර තුළින් මධ්‍ය ශිලා මානවයා පරිභෝජනය කර ඇති ආහාර හඳුනාගෙන ඇත. ඒ අතර කැකුණ (Canarium Dioscorea Spikata Depentaphylla) සහ වල් අල වර්ග (Dopposilifolia) ද ප්‍රමුඛස්ථානයක් ගන්නා ශාක ආහාර වන අතර, අලියාගේ සිට උරග වර්ග, මීයන්, බෙල්ලන් සහ කුඩා මිරිදිය මාළුන් දක්වා සෑම සත්ත්වයෙක් ම ඔවුහු ආහාරයට ගෙන තිබේ (Deraniyagala 1992:451-452). මෙ වැනි ආහාර දාමයක් බලන්ගොඩ මානවයාගේ ආහාර ගොනුවේ පැවතිය ද අනුරාධපුරය වැනි ප්‍රදේශවල කැකුණ හා වල් දෙල් වැනි ශාක ආහාරවල හිඟතාවයන් තිබේ. නමුත් ඒ වෙනුවට වෙනත් අල, ඵල හා මුල් මෙම කලාපයේ බහුල වන අතර සත්ත්ව දඩයම සඳහා අවශ්‍ය කරන ලොකු කුඩා සතුන් විශාල ප්‍රමාණයක්

මෙම ප්‍රදේශයේ ජීවත් වීම තුළින් විකල්ප ශාක හා සත්ත්ව ආහාර ලබා ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය (Deraniyagala 1972:64). මෙවැනි භෞතික සංස්කෘතික තොරතුරු හා පාරිසරික තත්ත්වයන්ට අනුව අනුරාධපුර ඇතුළුපුරයේ ගොඩනගන මුල් ම සංස්කෘතික භූ දර්ශනය සඳහා දායකත්වය මධ්‍ය ශිලා සංස්කෘතිය ඇසුරෙන් සිදුවීම හඳුනාගැනීමට හැකියාව ලැබෙන අතර පරිසර පද්ධතියේ පිහිටීම ඍජුව බලපා ඇති බව පෙන්වාදිය හැකි ය.

ශ්‍රී ලංකාවේ ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම්වලින් (Microlithic Stone implement) සමන්විත මධ්‍ය ශිලා අවධියේ අවසන් සීමාව ක්‍රි.පූ. 1800 පමණ කාලයට අයත් බෙලිලෙන හා මාතොට සන්දර්භවලින් වාර්තා වී තිබේ (Deraniyagala 1992:688-709). බෙලිලෙන මධ්‍ය ශිලා යුගයේ අවසන් සීමාවට අයත් පාංශු ස්තරවල ශාක ගෘහකරණය පිළිබඳ ව සාධක සමඟ මැටි මෙවලම් භාවිත කළ බවට සාධක හමුවීම හා මාතොට මධ්‍ය ශිලා යුගයට අයත් සන්දර්භවලින් තඹ නිෂ්පාදන කර්මාන්තය ට අදාළ සාධක වශයෙන් යබොර කැබලි කිහිපයක් හමු වී තිබේ. (Deraniyagala 2004:11) මෙම යබොර අදින් වසර 3800 ට අයත් ස්තරවලින් හමුවීම නිසා අර්ධද්වීපික ඉන්දියාවේ කැල්කොලිතික (Chalcolithic) අවධිය සමඟ සමකාලීන ව පැවති ජනාවාස වීමක් ශ්‍රී ලංකාවෙන් පළමු වැනි වරට හඳුනාගැනීම සනිටුහන් කළ ද දකුණු ඉන්දියාවේ විද්‍යාත්මක කාලනීර්ණ අනුව අදින් වසර 4000කට පූර්වයෙන් කැල්කොලිතික සංස්කෘතිය ක්‍රියාත්මක වූ බව හඳුනාගෙන ඇත. (එම).

මාතොට යබොර හමු වූ ජනාවාස ස්තර ඉතා සුපරික්ෂාකාරී ලෙස කැණීම් කර තිබුණ ද ඉහතින් විස්තර කරන ලද යබොර සාම්පල වෙනත් ස්තරයකින් පැමිණ මෙම ස්තරයට මිශ්‍ර වීමට බොහෝ දුරට ඉඩ තිබෙන බව දැරණියගල විශ්වාස කරනු ලැබේ (දැරණියගල 2000:87). එම නිසා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කැල්කොලිතික සංස්කෘතිය පිළිබඳ ව හෝ නවශිලා (Neolithic) සංස්කෘතිය සම්බන්ධ සාධක සොයනු වස් කෑගල්ල දිස්ත්‍රික්කයේ දොරවකකන්ද ප්‍රාග් ඓතිහාසික වාසස්ථානයේ හා මහඑළිය (හෝර්ටන් තැන්න) ප්‍රදේශයේ පර්යේෂණ දියත්කරන ලදී.





හෝර්ටන් තැන්න ප්‍රදේශයේ සිදු කරනු ලැබූ පරාග විශ්ලේෂණ ක්‍රමවේදයන්ට අනුව යව හා බාර්ලි අදින් වසර 13,000 කට පෙර කාලය තුළ එම භූමියේ වගා කළ බව හඳුනාගෙන තිබේ (Premathilake and Epitawatta 2001 : 1-13). එමෙන් ම දොරවකකන්ද ගල්ලෙන තුළ සිදු කරනු ලැබූ කැණීම්වලින් අදින් වසර 7,300 කට පෙර ස්තරවල මැටි මෙවලම් පිළිබඳ ව සාධක හමුවී තිබේ. (Deraniyagala 2004:10-11). හෝර්ටන් තැන්න ප්‍රදේශයෙන් ලැබී ඇති (Ghar – I mar) සහ (AQ Kupruk) යන ධාන්‍ය පිළිබඳ සාධක ඇෆ්ගනිස්ථානයෙන් හා පාකිස්ථානයේ නවශිලා සන්දර්භවලින් අදින් වසර 9,000-6,000 අතර කාලයේ දි ලැබී තිබේ (Deraniyagala 2004:12 ; Premathilake and Epitawatta 2001:12-13). ඉන්දියාවේ රාජස්ථාන් ප්‍රදේශයෙන් ද අදින් වසර 9,000 කට පෙර වගා කරන ලද වී පිළිබඳ ව හා නිෂ්පාදනය කරන ලද මැටි මෙවලම් සාධක ද ලැබී තිබෙන අතර. අදින් වසර 10,000 කට පෙර දකුණු ඉන්දියාවේ නිල්ගිරි කඳුකර ප්‍රදේශයේ සිදු කළ වගා කටයුතු පිළිබඳ ව සාධක ද ලැබී ඇති බැවින් දකුණු ආසියාවේ නව ශිලා යුගය සම්බන්ධ සාධක හඳුනාගෙන තිබේ (Deraniyagala 2004:10-11).

තත්ත්වය එසේ වුවද ශ්‍රී ලංකාවේ නව ශිලා යුගය පැවති බව ඔප්පු කිරීමට එම යුගයේ තාක්ෂණය පිළිඹිබු කරන ඔප මට්ටම් කරන ලද ගල් පොරෝ පිළිබඳ ව හා මැටි මෙවලම් මෙන් ම ධාන්‍ය පිළිබඳ ව සාධක තවදුරටත් ලැබිය යුතු බව දැරණියගලගේ විශ්වාසයයි (එම). එම නිසා ශ්‍රී ලංකාව ඇසුරෙන් නියොලිතික (නව ශිලා හෝ කැල්කොලිතික, තාමු ශිලා) සංස්කෘතියක් පැවති බවට තීරණාත්මක සාක්ෂි සහිත ව තව ම ඔප්පුකර නොමැත (Seneviratne 1996:279). නමුත් බෙග්ලි විසින් පොම්පරිප්පුහි සිදු කරනු ලැබූ කැණීම්වල දී යකඩ යුගයේ සුසානයක් තුළින් ශිලා මෙවලම් වාර්තා කර තිබේ (Begley et.al.1981:51-132). එම ශිලා මෙවලම් සුසාන තුළට දෙ වැනි වර පැමිණි සන්දර්භයන් විය හැකි බව දැරණියගල පෙන්වා දී ඇත. (Deraniyagala 1992:709). ඒ අනුව දැනට පිළිග නු ලබන ආකාරයට ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයෙන් ඉක්බිති මුල් යකඩ යුගය මෙ රට මුල්බැස තිබේ.

මුල් යකඩ යුගය වඩා බහුල වශයෙන් හැඳින්වෙන්නේ පූර්ව ඓතිහාසික අවධිය වශයෙනි (සෙනෙවිරත්න 1996:12).

### 3.2.2.2 ප්‍රාථමික යකඩ යුගයේ සිට පදනම් මුල් ඓතිහාසික අවධිය දක්වා ඇතුළුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය

**වසර 5,000 කට පමණ පෙර නූතන වැදි පරපුරේ මී මුත්තා වූ ඔස්ට්‍රෝලොයිඩ් වර්ගයට අයත් මධ්‍ය ශිලා යුගයේ බලන්ගොඩ මානවයා විසින් අනුරාධපුරය ජනාවාස කිරීමෙන් අනතුරුව අශ්වයින් හා යකඩ කර්මාන්තය පිළිබඳ දැනුම සතු ව සිටි මිනිසා ඉන්දියාවේ සිට පැමිණ අනුරාධපුරයේ පැළපදියම් විය (Deraniyagala 1972:50).**

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය (Early Iron Age) ක්‍රි.පූ. 1000-500 අතර කාලයේ ක්‍රියාත්මක වූ බව දැරණියගල ප්‍රකාශ කර ඇත (Deraniyagala 2004:17). නමුත් රංචාමඩම ප්‍රදේශයේ සෝමදේව විසින් සිදු කරනු ලැබූ කැණීම් දත්ත අනුව එම ප්‍රදේශයේ පූර්ව ඓතිහාසික අවධියේ සන්දර්භගත වීම ක්‍රි.පූ. 1359 කාලයේ සිදුවී ඇති බව පෙන්වා දී තිබේ (Somadeva et.al 2008:13). අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය අධ්‍යයනයෙහිලා මෙම සංස්කෘතියේ ක්‍රියාකාරිත්වය හඳුනාගැනීම අතිශයින් ම වැදගත් වන අතර දැරණියගල පෙන්වාදෙන ආකාරයට ක්‍රි.පූ. 900 - 600 කාලයේ දී ඇතුළුපුර ඇසුරෙන් මෙම සංස්කෘතිය බලපවත්වා තිබේ (Deraniyagala 1992:709). ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික වාසභූමි හා වළලැම් ස්ථානවල කරන ලද පුරාවිද්‍යාත්මක ගවේෂණ තුළින් පෙනීගොස් ඇත්තේ ප්‍රාථමික යකඩ යුගය වඩා පුළුල් ඉන්දීය තාක්ෂණ-සංස්කෘතියක ප්‍රභිච්ඡින්න පැතිකඩක් බව ය (Seneviratne 1984:28). දැනට සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයනයන්ට අනුව ප්‍රාථමික යකඩ යුගය දකුණු ඉන්දියාවේ ක්‍රි.පූ.1200 (අදින් වසර 3200) පමණ පෙර ආරම්භ ව තිබේ (Posshel 1990 Dearaniyagala in 1992:734 ; Rao 1972 :55). කාබන් දින 14 කාල නියමයන්ට අනුව ශ්‍රී ලංකාවේ අනුරාධපුර ඇතුළුපුර,





කොක්එබේ, සීගිරිය අසළ අලිගල, හා ඉබ්බන්කටුව තුළින් මෙම සංස්කෘතිය ක්‍රි.පූ.1000-700 අතර කාලයේ දී ක්‍රියාත්මක වූ බව හඳුනාගෙන තිබේ (Dearaniyagala 1992:709-729 ; Karunaratne and Adikari 1994:58 ; Morgen 1994:39 ; Seneviratne 1990:123 ; uekaÈia: 2016). අනුරාධපුර ඇතුළුපුරයේ ප්‍රාථමික යකඩ යුගය සම්බන්ධ ව දැරණියගල විසින් ඔප්පුකර ඇති කාල නිර්ණ නිගමන (ACAP)ව්‍යාපෘතිය යටතේ රොබින් කනිංහැම් විසින් ද යම් තරමකට තහවුරු කර ඇත (Coningham 1999:130). කනිංහැම් පෙන්වා දී ඇති ආකාරයට ප්‍රාථමික යකඩ යුගය ක්‍රි.පූ. 840-460 දක්වා කාලයක් ඇතුළුපුරයේ බල පවත්වා තිබේ (එම:124-131). අනුරාධපුර භූ දර්ශනය විකාශනය සඳහා ප්‍රාථමික යකඩ යුගය තුළින් දමා ඇති පදනම ඉතා ම වැදගත් වේ. ක්‍රි.පූ. 900 පමණ දී ඇරඹෙන ඇතුළුපුර ප්‍රාථමික යකඩ යුගයේ ජනාවාසය ක්‍රි.පූ.900-800 කාලයේ දී හෙක්ටයාර 10 ක ප්‍රමාණයකින් යුක්ත වූ බව දැරණියගල පෙන්වා දී ඇත (Dearaniyagala 1992:709,729 ; එම 2004:13). ප්‍රාථමික යකඩ යුගයේ සිදු වූ ඇතුළුපුර ජනාවාස ව්‍යාප්තිය හඳුනාගැනීම සඳහා දැරණියගල විසින් පර්යේෂණ කැණීම් 13ක් සිදු කර තිබේ (Dearaniyagala 1992:709) (බලන්න සිතියම් අංක 3.3). එම පර්යේෂණ කැණීම් තොරතුරු අනුව අනුරාධපුර ඇතුළුපුරයේ ප්‍රාථමික යකඩ යුගය මුල්බැස ගැනීම සම්බන්ධ කාල නිර්ණ මෙසේ ලැබී තිබේ. අනුරාධපුර ගෙඩිගේ (AG 85) ක්‍රි.පූ. 800- 500, අනුරාධපුර මහාපාලි දාන ශාලාව (AMP88) ක්‍රි.පූ.900-800, අනුරාධපුර සල්ගහවත්ත (ASW 87/88) ක්‍රි.පූ. 900-750, අනුරාධපුර සංඝමිත්ත මාවත(ASM 89) ක්‍රි.පූ. 850-800 කාලවලදී ක්‍රියාත්මක වී ඇති බව විකිරණමාන දින නියම කිරීම් ඔස්සේ තහවුරු කර ගෙන තිබේ (Dearaniyagala 1929:715-729; Coningham 1999:126-130).

කාබන් දින 14 කාල නිර්ණයන් ඔස්සේ ලබා ගත් මෙම කාලානුක්‍රම පසුබිම තවදුරටත් තහවුරු කිරීම උදෙසා දැරණියගල හා අබේරත්න එම සන්දර්භයන්ගෙන් හමු වූ දත්ත නැවත තාපසංදීප්තතා කාලනිර්ණ ක්‍රමයට දින නිර්ණය කිරීමෙන් ඉහත කාල නිගමන ක්‍රි.පූ.1000 තරම් කාලයක් දක්වා ඉදිරියට


ගමන්කරන බව පෙන්වා දී ඇත (Dearaniyagala and Abeyratne 2000:763). ඒ අනුව නවත ම දින නිර්ණය කිරීම් තුළින් අනුරාධපුර ඇතුළුපුර ජනාවාසය තුළ ප්‍රාථමික යකඩ යුගයේ සමාරම්භක අවස්ථාව ක්‍රි.පූ. 1000 තරම් (අදින් වසර 3000) දක්වා ඈතට දිව යන බව හඳුනාගත හැකි ය. දැරණියගල හා සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට ඇතුළුපුර ජනාවාසයේ සිදු කර ඇති පර්යේෂණ කැණීම් ඔස්සේ රැස් කරගනු ලැබූ ජීවී පරිසර (ප්‍රකෘති) ද්‍රව්‍යය හා මානව කෘතීන් මඟින් **වී ගොවිතැන, සතුන් හීලෑ කිරීම, අශ්වයින්, යකඩ හා තඹ මුල් කොටගත් කුඩා පරිමාණ ලෝහ වැඩ, පබළු නිෂ්පාදනය, ගැමි ජනපද, කළු හා රතු භාණ්ඩ ද, කළු භාණ්ඩ නිපදවීම හා සම්බන්ධ පිඟන් මැටි කර්මාන්තය පිළිස්සීමෙන් පසු මැටි බඳුන්වල කුරුටු සළකුණු දැමීම මෙම සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ ලෙස හඳුනාගෙන ඇත**(Dearaniyagala 1992:709; Seneviratne1996 :279).

මෙ වැනි මූලික ලක්ෂණ සහිත ව ඇරඹි ඇතුළුපුර ජනාවාසය ක්‍රි.පූ.700 -600 කාලය වනවිට හෙක්ටයාර 50 ක පමණ වපසරියක් දක්වා භූ දර්ශනය ව්‍යාප්ත වී තිබේ (Dearaniyagala 1992:710 ; එම 2004:13). දැරණියගලගේ මත පදනම් කර ගෙන ඕල්චින් විසින් පෙන්වා දී ඇත්තේ මෙම අවධිය වන විට ඇතුළුපුරය අංග සම්පූර්ණ නගරයක් බවට පත් ව තිබූ බව ය (Allchin 1989:03). මෙය ඉන්දියාවේ ගංගා නිම්නයේ ඇතිව තිබූ දෙ වැනි නාගරායනයට පූර්වයෙන් ශ්‍රී ලංකාවේ ඇතිවන තත්ත්වයක් බව දැරණියගලගේ පෙන්වා දී ඇත. (Dearaniyagala 2004:15). ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගයට සම්බන්ධ වෙනත් ජනාවාස රංචාමඩම, සීගිරිය අසළ අලිගල ගල්ලෙන තුළ පැවති බවට පිළිගත හැකි සාධක ලැබුණ ද ඒ හැරෙන්නට ප්‍රාථමික යකඩ යුගයට අයත් වෙනත් එවැනි කුඩා ජනාවාස කිසිවක් පිළිබඳ ප්‍රමාණවත් සාධක ශ්‍රී ලංකාවෙන් මෙතෙක් ලැබී නැත. කන්තරොදේ, මාන්තායි, කැළණිය අසළ පිලපිටිය සහ තිස්සමාහාරාමය යන ස්ථානවල අනුරාධපුරයේ මෙන් ම විශාල ජනාවාස පැවති බවට පුරාවිද්‍යා සාධක ලැබී තිබේ (Dearaniyagala 1992:730,735).





අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය ගොඩනැඟීමේ දී ක්‍රි. පූ. 700-600 වකවානුව තුළ තාක්ෂණික සංස්කෘතික කලාපත් භෞමික කලාපත් අතර සමපාතය ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ ක්ෂුද්‍ර ජීවී පරිසර කලාප සමඟ ය. මෙම සමයේ දී වාසභූමි පිහිටුවා ගෙන ඇත්තේ තීරණාත්මක වැදගත්කමක් සහිත සම්පත් ප්‍රදේශ තුළ ය. ඒවා භෞමික වශයෙන් සම්පත් අත්පත්කර ගැනීමටත්, එම සම්පත් හුවමාරු කරගත හැකි මධ්‍යගත ස්ථානයක පිහිටි බව පෙනේ. විශේෂයෙන් ම අනුරාධපුරයේ කරන ලද පූර්ව ඓතිහාසික මට්ටමේ පුරා-සත්ත්වවිද්‍යා හා පුරා-උද්භිදවිද්‍යා අධ්‍යයන තුළින් වී ගොවිතැන සමඟ දඩයම් කටයුතු හා එඬේර කටයුතු ද පැවති බව හඳුනාගෙන ඇත (Seneviratne 1996:280). එසේ ම මෙම අවධියේ නේවාසික ප්‍රජාවන් අතර වූ කාර්යබද්ධ තාක්ෂණ ශිල්ප ක්‍රමය සමඟ අනේක විධ යැපුම් රටා ද සමපාත විය (එම). ප්‍රාථමික යකඩ යුගයට සම්බන්ධ නුරාධපුර ජනාවාසය ක්‍රි.පූ. 700-600 සමය වන විට මූලික වශයෙන් නාගරීකරණයට අවශ්‍ය බහු සම්පත් යැපුම් රටාව, ක්‍රමානුකූල ව දියුණුකර ගත් ආකාරය පෙන්නුම් කරයි. විවිධ උපයෝගීතාවන්ට අනුව බහුවිධ සම්පත් පරිහරණය ආරම්භ කිරීම නිසා මධ්‍යගත සැලසුම ස්ථානයක් ලෙස අනුරාධපුර වර්ධනය වන අතර ඒ සඳහා නගරයට පිටත පර්යන්ත ප්‍රදේශවල ස්ථානගත ව තිබූ මුල් යකඩ යුගයට අයත් ජනාවාස තුළින් බහුවිධ සම්පත් ඇතුළුපුරය සමඟ හුවමාරුකර ගැනීම කැපීපෙනේ. මෙසේ ඇතිවන හුවමාරුව තුළදී කැපීපෙනෙන ජනාවාසය ලෙස අනුරාධපුරය ඉස්මතුවීම සමඟ මධ්‍යගත සැලසුම් මධ්‍යස්ථානයක් ලෙස හැඩ ගැසීම මෙම අවධිය තුළ දී සිදුවේ (බලන්න සිතියම් අංක 3.6).





සිතියම් අංක 3.6
ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියට සම්බන්ධ ජනාවාස, සුසාන හා කාල රක්ත වර්ණ මැටි මෙවලම් හමුවන ස්ථාන දැක්වෙන සිතියම





| | | | |
|---|---|---|---|
| 01. Vetyaracankottai | වෙට්ටියාර්කුන් කොට්ටායි | 32. Kadiraweli | කදිරවේලි |
| 02. Tikali | ටිකලායි | 33. Ibbankatuwa | ඉබ්බන්කටුව |
| 03. Verappitti | වේරපිට්ටි | 34. Pinwewa-Galsohonkanatta | පිං වැව - ගල්සොහොන් කනත්ත |
| 04. Cattirantai | කට්ටිරන්තායි | 35. Manthai | මාන්තායි |
| 05. Kumpuruppitti | කුඹුරුපිටිය | 36. Galatara | ගල්අතර |
| 06. Allaippitti | අල්ලායිපිට්ටි | 37. makevita | මාක්විට |
| 07. Manavitalai | මනවිමලායි | 38. Rotawewa | රොටවැව |
| 08. Anaiviluntan | ආනයිවිලුන්තන් | 39. Anakatawa | ආනකටාව |
| 09. Tiruvatinilai | තිරුවටිනිලායි | 40. Duwegama | දූවේගම |
| 10. Kalaikotai | කලායිකොට්ටායි | 41. Kataragama | තරගම |
| 11. Mulli | මුල්ලි | 42. wattakkawadiya | වට්ටක්කාවාඩිය |
| 12. Kantarotai | කන්නරෝදෙ | 43. Rajangane | රාජාංගනේ |
| 13. Anaikkottai | ආනයිකොට්ටායි | 44. Kalegama | කැලේගම |
| 14. Vallipuram | වල්ලිපුරම් | 45. Padavigampola | විදවිගම්පොළ |
| 15. Valikanti | වල්ලිකන්ටි | 46. Yatigalpotta | යටිගල්පොත්ත |
| 16.Nakarkoyil | නගරකොවිල් | 47. Mahagalwewa | මහගල්වැව |
| 17. Talaiyati-Cempiyanparru | තලායියට්ටි | 48. Mahapalessa | මහපැලැස්ස |
| 18. Vettilaikkarni | වෙට්ටිලයිකර්ති | 49. Unalugala | උනළුගම |
| 19. Tekkam | තෙක්කම් | 50. Sevanagala | සෙවනගල |
| 20. Pomparippu | පොම්පරිප්පු | 51. Mukkarugoda | මුක්කරුගොඩ |
| 21. Mamamaduwa | මාමඩුව | 52. Akurugoda | අකුරුගොඩ |
| 22. Aluthbombuwa | අලුත්බෝඹුව | 53. Nagoda | නාගොඩ |
| 23. Karambankulam | කරබන්කුලම | 54. Batuyaya | බටුයාය |

| | | | |
|---|---|---|---|
| 24. Tammanagodella | තම්මැන්නාගොඩැල්ල | 55. Digampataha | දිගම්පතහ |
| 25. Wadigawewa | වඩිගවැව | 56. Ellegala | ඇල්ලේගල |
| 26. Gurugalhinna | ගුරුගල්හින්න | 57. Tamarava | තමරවැව |
| 27. Kok-ebe | කොක්එබේ | 58. Bambava | බම්බාව |
| 28. Diwulwewa | දිවුල්වැව | 59. Aligala | අලිගල |
| 29. Rambewa | රබෑව | 60. Habarattavala | හබරත්තවල |
| 30. Machchagama | මාච්චාගම | 61. Siyambalagaswewa | සියබලාගස්වැව |
| 31. Anuradapura Citadel | අනුරුධපුර - ඇතුළුපුර | | |




සිතියම් අංක 3.7
ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සථානගත වීම දැක්වෙන සිතියම





එහිදී කේන්ද්‍රීය ලෙස අනුරාධපුර ජනාවාසය වර්ධනය වීම උදෙසා අනුරාධපුරයෙන් වයඹ දිගින් පිහිටන මාන්තායි ආශ්‍රිත වරාය හා ඊසාන දිගින් පිහිටන ගෝකණ්ණ යන ස්වභාවික වරායන්හි පිහිටීම ද සෘජුව බල පා ඇත (Dearaniyagala 1992:710). එයට අමතර ව අනුරාධපුරය පර්යන්තයෙහි මධ්‍ය යාන් ඔය නිම්නය හා අනෙක් ප්‍රදේශ තුළ පිහිටන්නා වූ සමස්ත ග්‍රාම ජාලයේ ක්‍රියාකාරිත්වය හා ඒ ආශ්‍රිත සම්පත් හැසිරවීම ක්‍රි.පූ. 800-600 වන විට අනුරාධපුර නාගරික තත්ත්වය ඇති වීමට මගපාදා තිබේ (Dearaniyagala 1992:710). විශේෂයෙන් ම අනුරාධපුරයට උතුරින් රත්තරන්, මැණික් ආදී සම්පත් ද, නැගෙ නහිරින් තඹ හා කොරල් ආදී සම්පත් ද, වයඹ දිගින් මුතුපර හා හක් බෙල්ලන් ආදී සම්පත් ද, දකුණින් තඹ හා වෙනත් ඛනිජ පාෂාණවල පිහිටීම ද සෘජු ව බලපා ඇත.

විශේෂයෙන් ම උතුරුමැද අනුරාධපුරය වටා පිහිටන්නා වූ ප්‍රාථමික යකඩ යුගයට අයත් ජනාවාස සහ අග්නිදිග කලාපයේ තිස්සමහාරාමය වටා වූ යකඩ යුගයේ ජනාවාස මූලික වශයෙන් අනුරාධපුර හා මාගම යන ප්‍රධාන ස්ථාන කේන්ද්‍ර කර ගෙන නාගරීකරණයට පත් වූ ස්ථාන වේ (Bandaranayake 2000:05). මෙම තත්ත්වය කන්තරෝදය තුළින් ද එලෙසින් ම හඳුනාගත හැකි ය (Ragupathy 1987:181). කල්ගතවත් ම මෙම ප්‍රධාන මධ්‍යස්ථාන වටා උප ප්‍රාදේශීය මධ්‍යස්ථාන වර්ධනය වීම කැපීපෙනෙන අතර එම උප ප්‍රාදේශීය මධ්‍යස්ථානවල බිහිවීම සමඟ ආර්ථික හා වානිජ පරමාර්ථ පෙරදැරි කරගත් ගම්‍යාර්ථයන්හි වර්ධනයක් උතුරුමැද හා අග්නිදිග මෙන් ම උතුරු ප්‍රදේශයේ නාගරික කටයුතු සඳහා පදනම සපයන බව පෙනේ (Bandaranayake 2000:06 ; Ragupathy 1987:179-182). අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනය වීම මල්වතු ඔය නිම්නයේ සිදු වූවා මෙන් ම මාගම කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනය කිරිඳිඔය මුල් කර ගෙන සිදු වී ඇත (Somadeva 2006:113-114).

ක්‍රි.පූ.700-600 සමය වන විට අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනය සඳහා අනුරාධපුරය හා බද්ධ ව තිබූ තාක්ෂණ ශිල්පය, යැපුම් රටාව හා සම්පත් පරිහරණය පදිංචිවීමේ

මෝස්තරය යන කාරණාවල කැපීපෙනෙන වර්ධනයක් ඇති වී තිබූ බව පෙනේ. ප්‍රාථමික යකඩ යුගය තුළ තාක්ෂණික වශයෙන් ලෝහ තාක්ෂණයේ කැපීපෙනෙන වර්ධනය මෙම අවස්ථාවේ දී හඳුනාගත හැකි ය. මෙම තත්ත්වය ඉන්දීය ප්‍රාථමික යකඩ යුගය තුළ ද පොදු කරුණක් වී තිබේ. ශ්‍රී ලංකාවේ මේ අවධියට සම්බන්ධ ව භාවිත කර ඇති ලෝහ උපකරණ මගින් ලෝහ තාක්ෂණයේ වර්ධනය හඳුනාගෙන තිබේ.(Begley 1981:77-78 ; Dearaniyagala 1972:152 ; Seneviratne 1984 : 272). හැඩග ැසෙමින් පවතින සමාජ ලෝහ තාක්ෂණය උපයෝගී කරගනු ලබන්නේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික තත්ත්ව අනුව විය හැකි ය. විශේෂයෙන් ලෝහ මෙවලම් අනෙකුත් මෙවලම් වර්ගවලට වඩා ශක්තිමත්, දැඩි තියුණු හා කැපීම්වලට ඔරොත්තු දෙන මෙවලම් වර්ගයකි (Seneviratne 1994:13).

මෙසොලිතික අවධියෙන් අනතුරු ව ප්‍රාථමික යකඩ යුගයට අවතීර්ණ වන අනුරාධපුරයේ ජීවත් වූ මිනිසා ක්‍රමානුකූල ව ලෝහ තාක්ෂණයේ දියුණුව කරා ළඟා වීම ක්‍රි.පූ.900-800 කාලයට අයත් ස්තරවලින් හඳුනාගෙන තිබේ (Deraniyagala 1992:709 ; Seneviratne 1995:134-136). ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය ලෝහ තාක්ෂණයේ සමාරම්භක අවධිය වශයෙන් හඳුනාගත හැකි වුව ද (Seneviratne 1995:134-136; මැන්දිස් 2000:26) ක්‍රි .පූ 1000 න් පසු ශ්‍රී ලංකාවට ඇතුළු වූ ලෝහ තාක්ෂණය ඉතා කෙටි කලකින් මුළු දිවයින පුරා පැතිර කඩිනම් සංවර්ධනයක් තාක්ෂණයේ හෝ එය පරිහරණය කරන ලද සමාජ ව්‍යුහයේ ඇති නොකළේ ය (seneviratne 1984:14). තාක්ෂණයේ එවැනි රේඛීය වර්ධනයක් දැකිය නොහැකි ය. එහි ගුණාත්මක බව හා ප්‍රාමාණික වර්ධනය අප තක්සේරු කළ යුත්තේ ඒ ආශ්‍රිත සම්පත් පරිහරණයේ උපයෝගීතාවය මතත්, ලෝහ මෙවලම්වලට ඇතිවන ඉල්ලුමේ උපයෝගීතාවයත් මත ය (එම). ලෝහ භාණ්ඩයක් පරිහරණයේ දී ඇතිවන ඉල්ලුමට අවශ්‍ය බිහි කිරීම සඳහා සමාජ ව්‍යුහයන් ලබා ඇති සාපේක්ෂ වර්ධනය, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ සිට නිමි භාණ්ඩය දක්වා වූ නිෂ්පාදන ව්‍යවසාය පරාසයයක් තුළ රඳා පවතී (එම). ඒ අනුව ශ්‍රී ලංකාවට ක්‍රි.පූ. 1000





දී හඳුන්වා දුන් ලෝහ තාක්ෂණය හා එහි ක්‍රමවිධි වඩා සුවිශේෂ අන්දමකට කළ එළි බසිනු ලබන්නේ තවත් ශත වර්ෂ දෙකක් හෝ තුනක් ගතවීමෙන් පසු ව බව පෙනේ (එම). ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක මෙන් ම බහුල වශයෙන් වැඩි උපයෝගීතාවයක් ආරම්භ වන කාලය ක්‍රි.පූ. 700න් පසු ව ඇතිවන බව අනුරාධපුරය හා පොම්පරිප්පු තුළින් හමු වී ඇති ලෝහ පරිහරණය සම්බන්ධ සාධක තුළින් මැනවින් තහවුරු වේ (Seneviratne 1984:272 ත Dearaniyagala 1992:710).

ඇතුළුපුර ජනාවාසය කේන්ද්‍රීය ජනාවාසයක් ලෙස වර්ධනය වීමට ඇතුළුපුරයට ආසන්න ම ප්‍රදේශවල ප්‍රාථමික යකඩ යුගයේ ජනාවාස සාපේක්ෂ ලෙස වැඩි වශයෙන් ස්ථානගත ව තිබීම බලපා තිබෙන බව පෙන්වා දී ඇත. (Coningham 1999 : 143 ; seneviratne and Jayaratnැ 2006 : 10-11). අනෙක් කලාපවලට සාපේක්ෂ ව උතුරුමැද වියළි තැනිතලා ප්‍රදේශවල ප්‍රාථමික යකඩ යුගයේ ජනාවාස විශාල ප්‍රමාණයක් ස්ථානගත වීම සඳහා ස්වභාවික පරිසරය ද බලපා ඇත. මෙම පළාතේ ස්වභාවික පරිසරය, ඛනිජ සම්පත් හා ස්වභාවික ඉන්ධන ව්‍යාප්තිය වඩා ඍජු ලෙස පැරණි යකඩ කර්මාන්තයට බල පා තිබේ. පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස හා ජීවනෝපාය ක්‍රමය වඩාත් සමීප වූයේ වියළි හා ශුෂ්ක කලාපවලට ය (Seneviratne 1994:15). ශ්‍රී ලංකාවේ ඛනිජ ආශ්‍රිත සිතියමක් ගෙන හැර දැක්වුවහොත් අනුරාධපුරය හා පර්යන්ත ප්‍රදේශය තුළ විවිධ ඛනිජ වර්ග ස්ථානගත වන බව පෙනේ (බලන්න සිතියම් අංක 3.7).

ඒ අනුව උතුරුමැද ප්‍රදේශය පුරා ම පහසුවෙන් නිධිගත වී ඇති යපස් හා තෙල්ගල් පුළුල් ව්‍යාප්තියක් ගෙනහැර දක්වයි (එම). මේවා අතරින් 60% පමණ යකඩ ප්‍රතිශතයක් ඇති හෙමටයිට් (Hematite) හා ඊට අඩු ප්‍රතිශතයන් ඇති ලිමොනයිට් (Limonite) යපස් වේ (Bandaranayake and Jayawardana 1979 :433-440). උතුරුමැද පහත් වියළි තැනිතලා ප්‍රදේශවල හෙමටයිට් ($Fe_2O_3$), ලිමොනයිට් ($Fe_2O_3n\ H_2O$) හා මැග්නටයිට් ($Fe_3O_4$) මතුපිටින් පහසුවෙන් සොයාගත හැකි ඛණිජ වේ. (Seneviratne 1992:03). විශේෂයෙන් ම ඇතුළුපුර ආංශුක

පුරාවිද්‍යා ස්ථානයේ සිදු කර ඇති අධ්‍යයනවල දී එම ප්‍රදේශයේ භූමි ව්‍යුහය තුළ වැඩි ප්‍රතිශතයකින් යුත් තිරුවානා (Quartz), බොරළු (Gravel), යකඩ ගල් (Iron stone) ව්‍යාප්ත වන බව හඳුනාගෙන ඇත (Seneviratne 1984:272). ගෙඩිගේ කැණීමේ 3 A හා 3 B පස් ස්තරවලින් හමු වූ ලිමොනයිට් (Limonite), යකඩ කැටිති (Iron nodules) යකඩ නිෂ්පාදනය කිරීමට භාවිතා කර ඇති බව හමු වූ යබොරවලින් සනාථ වී තිබේ (එම : 273). මෙම නිෂ්පාදනවලට සමාන නිෂ්පාදන කරෙයිනගර් හා ආනෙයිකොණ්ඩායිවලින් ද හමුවී වී ඇත (එම).

මූලාරම්භක යුගයේ දි ග්‍රාමීය ජනාවාසවල ලිමොනයිට් හා හෙමටයිට් යන ඛනිජ ද්‍රව්‍යයන් භාවිත කළ බවට පුරාවිද්‍යා සාධක ලැබී තිබේ (Seneviratne 1994:15). විශේෂයෙන් ම වියළි තැනිතලා ප්‍රදේශවල 70%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇති මැග්නයිට් (Magnatite) යපස් අඩුවෙන් භාවිත කර ඇත (එම). ප්‍රාථමික යකඩ යුගයේ දී ඉන්දියාවේ දී ද හෙමටයිට් හා ලිමොනයිට් යන යපස් භාවිතය අතිශයින් ම සුලභ ව පැවතී ඇත. එ බැවින් අනුරාධපුරය හා උතුරු මැද වියළි තැනිතලා භූමිවල හෙමටයිට් හා ලිමොනයිට් ප්‍රබල ව්‍යාප්තියකින් ස්ථානගත වී තිබීම එහි භාවිතය සඳහා බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය (එම). හෙමටයිට් හා ලිමොනයිට් එකට ඝන වූ යපස් නොවේ. එම යපස් වර්ග බොහෝ විට ගෙන්දගම් සහ පොස්පරස් අඩංගු සංයුතියකින් යුක්ත වන බැවින් උණු කිරීමේ දී තාක්ෂණික වශයෙන් සහනයක් ගෙන දෙයි (එම). එවැනි යපස් ප්‍රාරම්භක සමාජ යකඩ නිෂ්පාදන සඳහා තෝරාගැනීම එතරම් ගැටලුවක් නොවේ. උතුරුමැද පළාතට සමීප ව ඉතා විශාල මැග්නමයිට් නිධි විලගෙදර, පනිරෙණ්ඩාව ආශ්‍රිත ව පිහිටා තිබේ (එම). ප්‍රාරම්භක සමාජ ඛනිජ පරිහරණය කළ මුල් යුගයේ දී මතුපිටින් ඔක්සිකරණය වූ යපස් ලබාගැනීමට මිස පොළොව අභ්‍යන්තරයේ විශාල ලෙස නිධිගත වූ මැග්නටයිට් යපස් ලබාග ැනීම සඳහා යොමු නොවී ය (එම). මෙයට ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැක්කේ එම යුගයේ උඳුන්වල නිර්මාණ තාක්ෂණය අධිතාප උත්පාදනයකට සකස් කර නොතිබීම යැයි උපකල්පනය





කළ හැකි ය (එම). ඉතා ඝන ඛනිජයක් වන මැග්නටයිට් ද්‍රව බවට පත්කිරීමට අවම වශයෙන් 1200°ජ තාපයකින් යුක්ත උඳුනක් අවශ්‍යය ය. පූර්ව ඓතිහාසික යුගයේ එ වැනි උඳුන් ලංකාවේ හෝ ඉන්දියාවේ නිර්මාණය කර නොතිබිණ (එම). එ බැවින් මැග්නටයිට් යපස්වල උපයෝගීතාවය ප්‍රාථමික යකඩ යුගයේ ප්‍රාරම්භක අවස්ථාවේ දී වැදගත් නොවූ අතර ලිමොනයිට් හා හෙමටයිට් වැනි ඛනිජයන්හි උපයෝගීතාවය යකඩ නිෂ්පාදනයේ දී වැදගත් වී තිබේ (එම).

යකඩ තාක්ෂණයේ වර්ධනයක් ලෙස ප්‍රාථමික යකඩ යුගයේ මැද භාගයේ දී වානේ තාක්ෂණයේ දියුණුව හැඳින්විය හැකි ය. මෙම තාක්ෂණික ක්‍රමය ශ්‍රී ලංකාවේත්, අර්ධද්වීපික ඉන්දියාවේත් එක හා සමාන ක්‍රමවිධි භාවිත කර නිෂ්පාදනය කිරීමෙන් පෙනෙන්නේ එහි මූලය එකක් බව ය (එම). විශේෂයෙන් ම වඩා සංවර්ධනය කරා ළඟා වන ග්‍රාමීය සංස්කෘති එහි උච්ච භාවයට පැමිණීමේ දී තාක්ෂණය උසස් කීරීම සිදු කර තිබේ. අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය තුළ ද මෙම තත්ත්වයන් හඳුනාගත හැකි ය (Dearaniyagala 1992:710). ලංකාවේ හා ඉන්දියාවේ මුල් කාලීන මූලාශ්‍රයවල වුට්ස් (Wootz) නමින් හැඳින්වෙන්නේ වානේ තාක්ෂණය උපයෝගී කර ගෙන නිර්මාණය කර ඇති සුවිශේෂ නිර්මාණයන්ය (Juleff 1988:10 ; Seneviratne 1994:15). අනුරාධපුර ඇතුළුපුර කැණීම්වලින් ද පූර්ව ඓතිහාසික යුගයේ පස් ස්තරවලින් හමු වූ සමහර යකඩ මෙවලම් විශ්ලේෂණයට බඳුන් කිරීමෙන් එහි 80% සිට 50 % දක්වා පිරිසිදු වානේ අන්තර්ගතව තිබූ බව විද්‍යාත්මක පර්යේෂණයන්ගෙ න් හඳුනාගෙන තිබේ (Seneviratne 1994:15-16). ඉන්දියාවේ සමහර වානේ මෙවලම්වල 99.9% දක්වා සුපිරිසිදු වානේ අන්තර්ගත ව තිබූ බව හඳුනාගත හැකි ය (Seneviratne 1985:153). මෙම තත්ත්වය අනුව යකඩ තාක්ෂණයේ දියුණුව විශේෂයෙන් ම අනුරාධපුරය කේන්ද්‍රීය ලෙස වර්ධනය වීමට බලපා තිබේ.

අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනය වීමේ දී යකඩ තාක්ෂණය මෙන් ම තඹ ආශ්‍රිත තාක්ෂණික ක්‍රියාවලිය වැදගත් වී ඇත. මෑත දී සිදු කරන ලද භූ ගර්භ විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක

සමීක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ තඹ නිධිගත වී ඇති ප්‍රදේශ ලෙස සේරුවිල හා මධ්‍ය කඳුකරයේ උතුරු බෑවුමේ නාලන්ද ප්‍රදේශය හඳුනාගෙන ඇත (Seneviratne 1995:114-138). සේරුවිල භූ විද්‍යාත්මක පිහිටීම හා එහි අන්තර්ගත මැග්නටයිට් තඹ නිධිය (Copper magnatite Deposit) උස්භූමි හා විජයානු ශ්‍රේණියට අයත් ව පිහිටා තිබේ (Cooray 1984:212). පූර්ව ඓතිහාසික අවධියේ සිට පරිහරණය කරන ලද මෙම තඹ නිධියේ ටොන් මිලියන 7ක තඹ ධාරිතාවය මතුපිට පොළොවේ සිට අඩි 200 ක් පොළොව අභ්‍යන්තරයට විහිදෙන බව භූ විද්‍යා දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත (Seneviratne 1995:114). සේරුවිල භූ විෂමතාවය අනුව පොළොව මතුපිටින් ඉතා පහසුවෙන් තඹ ලබා ගත හැකි ය. අඩි 03 සිට 45 දක්වා විවිධත්වයකින් යුත් රැළි භූමියක මතුපිට මෙම ඛනිජ ශේෂ වී ඇත (Seneviratne 1995:16). ක්‍රි.පූ. පළමු වැනි සියවසට අයත් කතා පුවතක් දක්වන මහාවංසය මෙම ප්‍රදේශය තම්බපිට්ඨ (*මව*.xxviii:16) යනුවෙන් සඳහන් කර ඇත්තේ මතුපිටට නෙරා උස් වී ඇති තඹ නිධි යන අර්ථයෙන් ය (Seneviratne 1994:16). සේරුවිල ප්‍රදේශයෙන් ලැබෙන පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව එම ප්‍රදේශය ක්‍රි.පූ. හය වැනි සියවසට පෙර සිට ජනාවාස වී තිබේ. මේ බව අනුරාධපුර ඇතුළුපුරයේ ක්‍රි.පූ. හය වැනි සියවසට පෙර ජනාවාස ස්තරවල තඹ භාවිත කළ බවට සාධක හමු වීමෙන් පැහැදිලි වේ (Seneviratne 1995:122). ඇතුළුපුරයේ AG 69 ගෙඩිගේ කැණීමෙන් 3A පස් ස්තරයෙන් හමු වූ තඹ බොරවල හා කෝව කොටස් තුළ තඹ සමඟ යකඩ මිශ්‍ර ව තිබූ බව හඳුනාගෙන ඇත (Dearaniyagala 1972:145 ; Seneviratne 1995:123). සේරුවිල තඹවල ඉහළ මැග්නයිට් ප්‍රතිශතයක් අඩංගු වන බැවින් එහි යම් ආකාරයකට යකඩ අන්තර්ගතව තිබෙන බවට විද්‍යාත්මක විශ්ලේෂණයන්ට අනුව හඳුනාගෙන ඇත (Seneviratne 1995:122).

මෙම තත්ත්වය අනුව අනුරාධපුර ඇතුළුපුරයේ 3 A හා 3 B පූර්ව ඓතිහාසික පස් ස්තරවල හමු වූ ලෝහ මෙවලම් හා ලෝහ බොර තුළින් ඇතුළුපුරයේ විසූ සමාජ තමන්ට අවශ්‍ය තඹ අමුද්‍රව්‍ය ලෙස නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි සේරුවිල ප්‍රදේශයෙන්





ලබාගත් බව පැහැදිලි වේ. එසේ ම ඇතුළුපුර ගෙඩිගේ 3 A, 3 B පූර්ව ඓතිහාසික පස් ස්තර හා 4 A, 4 B මුල් ඓතිහාසික අවධියට අයත් සන්දර්භවලින් ලැබුණු ලෝහ මෙවලම් ආශ්‍රිත ව සිදු කළ සූක්ෂම මූලද්‍රව්‍ය විශ්ලේෂණයන්ට අනුව හෙළි වී ඇත්තේ එම මෙවලම්වල අඩංගු ලෝහ සංයුතිය ඉතා ම සමාන වන්නේ සේරුනුවර ලෝහ නිධියේ සංයුතියට බව ය(එම). එම රසායනික විශ්ලේෂණයන්ට අනුව අනුරාධපුර ඇතුළුපුර 3 A පූර්ව ඓතිහාසික අවධියට අයත් සන්දර්භයන්ගෙන් හමු වූ ලෝහවල සංයුතිය මෙසේ වන බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත.

| | | |
|---|---|---|
| තඹ | (Copper) | 94.10% |
| රිදී | (Silver) | 1.61% |
| යකඩ | (Iron) | 0.84% |
| නිකල් | (Nickel) | 0.13% |
| ඊයම් | (Lead) | Trace |
| සින්ක් | (Zink) | 0.41% (එම:123). |

ඒ අනුව ඇතුළුපුරයේ ලෝහ නිෂ්පාදනය ආශ්‍රිත කර්මාන්තය තාක්ෂණික ලෙස දියුණුවට පත් වූ බවට සාධක තිබේ (Dearaniyagala 1990:253 ; Coningham 1999:126).

ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය ක්‍රි.පූ. 700-600 වර්ධනය සඳහා බහුවිධ සම්පත් පරිහරණය ද සෘජු ව බලපා ඇති ආකාරය ද හඳුනාගත හැකි ය. ඒ අතරින් මැටි බඳුන් සඳහා සුවිශේෂ තැනක් හිමි වේ. අනුරාධපුර ගෙඩිගේ (AG 69) 3 A පස් ස්තරයෙන් හමු වූ කාල රක්ත වර්ණ මැටි භාණ්ඩ, සරල රතු දුඹුරු භාණ්ඩ හා කාල වර්ණ මැටි භාණ්ඩ ක්‍රි.පූ. 10 වැනි හා 9 වැනි ශත වර්ෂයන්ට අයත් ස්තරයන් තුළින් වාර්තා වේ (Deraniyagala 1972:85-88,106-120).නමුත් ක්‍රි.පූ. 700-500 අතර ASW 1 89 වැනි සංසිද්ධි හා AMP 75 වන සංසිද්ධිය තුළින් හමු වන්නා වූ මධ්‍යම ප්‍රමාණයේ මැටි බඳුන් දීප්තියෙන් අඩු අළු පැහැ බඳුන් වේ. මේවා බොහෝ විට උතුරු ඉන්දියාවෙන් ආනයනය කරන්නට

ඇති බවට දැරණියගල උපකල්පනය කර ඇත (Deraniyagala 1990:257-275). කෙසේ වෙතත් AG 69 3 A ස්තරයෙන් හමුවන වටකුරු හැඩය ගත් අළු පැහැ පිඟන් භාණ්ඩ ක්‍රි.පූ. 700-500 දක්වා අනුරාධපුර සංස්කෘතියේ සුවිශේෂතාවයන් පෙන්වන සාධක වශයෙන් දැරණියගල හඳුනාගෙන තිබේ (Deraniyagala 1972:20).

ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය ආශ්‍රිත සංස්කෘතික විකාශනය හඳුනාගැනීමේ දී මැටි මෙවලම් ආශ්‍රයෙන් ද සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලීන් හඳුනාගැනීමට අවකාශ සැලසේ. ඒ අතර කාල රක්ත වර්ණ මැටි බඳුන්වල මෙන් ම අනෙකුත් මැටි බඳුන් ආශ්‍රිත ව හමුවන කුරුටු සංකේත (Graffiti Symbol) ඔස්සේ සමාජ සංස්කෘතික පරිවර්තනයන් ග්‍රහණය කර ගැනීමට අවකාශ සැලසේ. විශේෂයෙන් ම මැටි මෙවලම් ආශ්‍රිත ව හමුවන මෙගලතික සංකේත (Deraniyagala 1972:125-129 ; Coningham 1999:126). අනුරාධපුරයේ මෙන් ම කන්තරෝදය, පොම්පරිප්පු ආදී ස්ථානවලින් ද වාර්තා වී තිබේ (Seneviratne 1984:296). ඇතුළුපුරයට සමානතා ඇති සංකේත පොම්පරිප්පුවෙන් වාර්තා වී තිබීම (Begley 1981:85) තුළින් මෙම සංස්කෘතීන් අතර සම්පත් භාවිතය තුළ යම්කිසි සමානතාවයක් තිබූ බවට සාධක සපයන බව උපතල්පනය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගයට අදාළ සුසාන සංකීර්ණ සම්බන්ධ විද්‍යාත්මක කාලනිර්ණ ලබාගෙන තිබෙන ස්ථානයක් වන්නේ ඉබ්බන්කටුව, කොක්එබේ තම්මැන්නාගොඩැල්ල හා රංචාමඩමයි. කාබන් කාල නිර්ණ නිගමන අනුව ඉබ්බන්කට්ටුව ක්‍රි.පූ. 750-400 දක්වා කාලයට ද කොක්එබේ ක්‍රි.පූ 790-540 කාලයට අයත් වී ඇත (Deraniyagala 1992:734; uekaosia : 2016). රංචාමඩම ක්‍රි.පූ. 1359 කාලයට අයත් ලෙස කාල නිර්ණය වී තිබේ (Somadeva et.al.2008:13). එසේම තම්මා ගොඩැල්ල ක්‍රි. පූ. 490 කාලයට අයත්වේ. (දිසානායක : 2013 සම්මුක සාකච්ඡාවන් ඇසුරෙන්.)

සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පැවති ප්‍රාථමික යකඩ යුගයට අයත් සුසානයන්හි සංස්කෘතික ගති ලක්ෂණ තවමත් නිසි ලෙස අධ්‍යයනයට ලක්කර නොමැත. ශ්‍රී ලංකාවෙන් මෙම යුගයේ සුසාන භූමි හා සම්බන්ධ ව පිහිටි සමකාලීන ජනාවාස





සඳහන් කිරීම යුක්ති යුක්ත ය. උදාහරණ වශයෙන් ඉබ්බන්කටුව දැක්විය හැකි ය (Karunaratne 1994:105-112). අනෙක් අතට දුරස්ථ ප්‍රදේශයකට පවා සම්බන්ධ කළහැකි මහා ශිලා සුසාන භූමි අනුරාධපුර ප්‍රාථමික යකඩ යුගයට සම්බන්ධ ජනාවාසයේ හෝ එහි ආසන්නයේ පිටත පිහිටා නොමැත (Deraniyagala 2004:14). අනුරාධපුර පැරණි නගරයේ තදාසන්න ප්‍රදේශවල විශේෂ යැපුම් කටයුතුවල යෙදුණු එඬේරුන් වැනි විශේෂිත මානව කණ්ඩායමක් මෙගලතික සුසාන සංකීර්ණයන් හා සම්බන්ධ කිරීමට බොහෝ සෙයින් ඉඩ තිබේ (එම). කෙටියෙන් ගතහොත් මෙගලිතික සුසාන සංකීර්ණයන්ගේ විශේෂත්වය වන්නේ එය විවිධාකාර ප්‍රාදේශීය විෂමතාවයන්ගෙන් යුක්ත ව ඉන්දියාවේ ගංගා නිම්න මිටියාවතේ සිට ශ්‍රී ලංකා ව දක්වා ව්‍යාප්ත ව තිබීමයි (Sundara 1975 :125-126 ; Rao 1971 :11 ; Deraniyagala at el 1995:35-36 ; Begley 1981 :85 ; Deraniyagala et.al.1992:709-711 ; Seneviratne 1984:237-298). ඒ අනුව ලංකාවේ හා ඉන්දියාවේ කාලරක්ත වර්ණ මෙවලම් සංකීර්ණයන් අතර ඇති අන්තර් සබඳතාව නිවැරදි ව ග්‍රහණය කර ගත යුතු ය (Deraniyagala 1992:734). මේ තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය අර්ථ නිරූපණය කිරීමේ දී අර්ධද්වීපික ඉන්දියාවේ ප්‍රාථමික යකඩ යුගය හා සම්බන්ධ ව කරුණු සැළකිල්ලට ගෙන අධ්‍යයනය කරීම අතිශයින් ම වැදගත් වේ. එසේ ම අනුරාධපුර ප්‍රාථමික යකඩ යුගයේ සංස්කෘතික අවධි අධ්‍යයනයේ දී අනුරාධපුරය හා පර්යන්ත ප්‍රදේශ අතර ගොඩනැගුණා වූ කරුණු ද සැලකිල්ලට ගැනීම වැදගත් බව පෙන්වාදිය හැකි ය.

අනුරාධපුර ඇතුළුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනයේ වඩාත් කැපීපෙනෙන අවධිය වන්නේ පදනම් මුල් ඓතිහාසික අවධිය (Basal Early Historic) ක්‍රි.පූ. 600-500 බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:711). ඔහු විග්‍රහ කර ඇති ආකාරයට පදනම් මුල් ඓතිහාසික අවධිය සම්බන්ධ කරුණු ASW 1 සංසිද්ධි අංක 88, 75, තුළින් ග්‍රහණය කර ගෙන තිබේ (එම). නමුත් රොබින් කනිංන්හැම්ගේ ගොඩනැඟිලි අවධි K (Structural period K) තුළින් ක්‍රි.පූ. 840-460 ලෙස ලැබී ඇති

කාලනීර්ණ මගින් ව්‍යුහාත්මක ලෙස අවධි අතරේ අසමානතාවක් ඇති බව පෙනේ(Coningham et.al.1996:78). දැරණියගල පෙන්වා දී ඇති පරිදි ක්‍රි.පූ.600-500 කාලයේ දී අනුරාධපුර ඇතුළුපුර ජනාවාසය තුළ බ්‍රාහ්මී අක්ෂර භාවිතය හා විදෙස් මැටි බඳුන් ආනයනය කළ බවට සාධක හඳුනාගෙන ඇත (Deraniyagala 1992:711). විශේෂයෙන් ම මේ යුගයට අයත් ASW 1 සංසිද්ධි අංක 89 හා AMP සංසිද්ධි අංක 75 අදාළ සන්දර්භ තුළින් මධ්‍යම ප්‍රමාණයේ අඩු දීප්තියකින් යුත් අළු පැහැති මැටි බඳුන් උතුරු ඉන්දියාවේ සිට ආනයනය කර ඇති බව උපකල්පනය කර තිබේ (Deraniyagala 1990:257 හ එම 1992:721-728) මෙම බඳුන් පශ්චාත් කාලයට අයත් රූලේටඩ් භාණ්ඩවලට සමානවන බව දැරණියගල පෙන්වා දී තිබේ. AG 69 13 A (i) ශෛලියෙහි කැපීපෙනන පිගන් භාණ්ඩ හස්ටීනාපුර්හි උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (NBPW) මට්ටම්වල 44 වැනි ශෛලියට සහසම්බන්ධතාවයක් පෙන්වන බව දැරණියගලගේ මතයයි (Deraniyagala 1972:106-122). AG 69 3 a (ii) වටකුරු පිගන් භාණ්ඩ ක්‍රි.පූ. 700-500 දක්වා අනුරාධපුර සංස්කෘතියෙහි වෙනස්වීමක් පෙන්නුම් කරයි (එම: 120).

පදනම් මුල් ඓතිහාසික අවධියේ දී ලේඛන කලාව පිළිබඳ ව දැනගැනීමට හැකි සාධක අනුරාධපුර ඇතුළුපුරයෙන් වාර්තාවීම ද සැලකිය යුතු ය. ඇතුළුපුර ජනාවාසය මේ වන විට හෙක්ටයාර 50 ක් දක්වා ව්‍යාප්ත වී තිබූ බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 2004:15 හ එම 1992:72). මෙම සමය වන විට ලේඛන කලාව ආරම්භ කරතිබූ බව කාබන් දින 14 කාල නිර්ණයන්ගෙන් හා තාප සංදිප්තතා කාල නිර්ණයන් තුළින් ද තහවුරු කර තිබේ (Deraniyagala 1992:736-750). මෙසේ හමු වී ඇති මැටි බඳුන් කැබලිවල හිමිකාරිත්වය සඳහන් වන අතර එයින් විජය කුමරුගේ අමාත්‍යවරයකු ලෙස වංසකතාවල සඳහන් වන අනුරාධ නැමති නාමයට සමාන බිය අනුරද යන ප්‍රාකෘත පාඨය වාර්තා වී ඇති බව දැරණියගල ප්‍රකාශ කර ඇත (එම :711). ඒ අනුව ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දියාවේ පූර්ව හා මුල් ඓතිහාසික යුගයන්ට අයත් කාල නිර්ණයන් නැවත සලකා බැලිය යුතු බව





දැරණියගල ගේ මතය වී ඇත. ඉන්දියාවේ යකඩ යුගයේ ආදිත ම වකවානු අශෝක අධිරාජ්‍යයාට බොහෝ කලකට පෙර **උජ්ජෙයින්, නාග් සහ හස්ටීනාපූර්හි** ආරම්භ ව තිබූ බව දැරණියගලගේ පිළිග ැනීම වේ (Deraniyagala 1972:132-133 ; 1992:711).

ඇතුළුපුරය තුළින් ලේඛන කලාව බිහිවීම පිළිබඳ ව දැනට ලැබී ඇති නව කාලනිර්ණ නිගමන නිසා ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ කාල සීමාව පිළිබඳ ව දැනට අප සතු ව ඇති මතයන් වෙනස් කිරීමට සිදු ව තිබෙන බව දැරණියගලගේ අදහසයි. එසේ ම ලේඛන කලාව සමඟ ඊට සමකාලීන ලෙස නව මැටි බඳුන් හැඩයන් නිර්මාණය විය. ඒවා අතර මධ්‍යම ප්‍රමාණයේ මට සිළුටු අළු පැහැ මැටි මෙවලම් (BRW) මෙන් ම මුට්සලා රතු වීදුරු පබළු ද ක්‍රි.පූ. 600- 400 කාලයේ දී ඉන්දියාවේ ද භාවිත කර තිබේ. එසේම ලිවීමට උපයෝගී කොටගත් ඇටකටුවලින් සැකසූ පන්හිඳ වැනි නිර්මාණයන් ද මෙම අවධියේ බිහි වීම තුළින් ද්‍රව්‍යමය විපර්යාසයන් සහ ඉන්දියාවේ ඇති වූ සංස්කෘතික ආවේගයන් එ මඟින් පිළිඹිබු වන බව දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1992:714). එය උතුරු ඉන්දියාවේ සිට විජය කුමරුගේ පැමිණීමේ පුරාවෘත්තය මඟින් ද ඔප්පුකර පෙන්වන පරිදි දූරස්ථ වෙළඳ හුවමාරුව එයින් ගම්‍ය වන බව දැරණියගල ප්‍රකාශ කර තිබේ. ඔහුගේ අදහස්වලට අනුව දකුණු ඉන්දියාවේ කොඩුමනල්වලින් ලැබුණු අභිලේඛන තුළින් හා අරිකමේඩුවලින් ලැබුණු අභිලේඛන තුළින් ද ඒ බව සනාථ වේ (Deraniyagala 1992:745- 746 ; Rao 1990 90-102). රොබින් කනිංන්හැම් විසින් ගොඩනැගිලි අවධි (Structural Period K හා J) තුළින් ක්‍රි.පූ. 450 දී බ්‍රාහ්මී අක්ෂර වාර්තා වූ බව පෙන්වා දී ඇත (Coningham 1999:126-127).

මෙම කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින් දැරණියගල පෙන්වා දී ඇත්තේ ඇතුළුපුරයෙන් මෙතෙක් හමු වී ඇති බ්‍රාහ්මී අක්ෂර ද්‍රවිඩ පවුලට අයත් නොවන ඒවා බවයි. ඒ අනුව අඩු තරමින් ක්‍රි.පූ. 500ට පෙර කාලයේ දී ඉන්දු ආර්ය භාෂාව ලංකාවේ පැවති බව ඔහු පෙන්වා දී ඇත (Deraniyagala 1992:739-745). මහාවංසයේ සඳහන්වන විජය රජුගේ අමාත්‍යවරයකු වූ අනුරාධ

නැමැත්තා (*Mv*. vii:43-45) පිළිබඳ සඳහන් තොරතුරුවලට සමාන තොරතුරු *ASW* 88 සංසිද්ධි 88 න් හමු වූ බිය අනුරද යන නාමය තුළින් අනුරාධ අමාත්‍යවරයාගේ ඓතිහාසික කතා පුවත සනාථ වන බවත් එම නිසා දැනට ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂරවල සම්මිත කාලය වශයෙන් දැක්වෙන ක්‍රි.පූ. තුන් වැනි ශත වර්ෂය අශෝක කාලයට වඩා තවත් සියවස් දෙකක් දක්වා ඈතට රැගෙන යා යුතු බව ඔහුගේ මතය වී තිබේ ( Deraniyagala 1992:747; Deraniyagala 2004:17).

දැරණියගලගේ මතයට අභියෝග කරමින් විමලසේන හැලෝගම ඇතුළුපුරයෙන් හමු වූ මැටි මෙවලම්වල අන්තර්ගත අක්ෂරවල හැඩයන් පරීක්ෂා කර අක්ෂර විකාශනයේ දී ඒවා ක්‍රි.පූ. දෙ වැනි ශත වර්ෂයේ අක්ෂරවලට සමාන බව පෙන්වා දී ඇත (හැලෝගම 2002:122-154). නමුත් දැරණියගල පෙන්වා දී ඇති පරිදි මෙම මැටි මෙවලම් හමුවන ස්තර කාබන් කාලනිර්ණයන් මෙන් ම තාපසංදිප්තතා කාලනිර්ණයනට ලක්කර ඇති බැවින් එම කාල වකවානු නිවැරදි බව පෙන්වා දී තිබේ (Deraniyagala 2004; Deraniyagala and Abeyratne 2000:759-789). ඇතුළුපුරයෙන් හමුවී ඇති බ්‍රාහ්මී ලේඛන පිළිබඳ ව අදහස් දක්වා අති බොහෝ උගතුන්ගේ මතය වී ඇත්තේ ඒ සඳහා දැඩි අවධානයක් යොමු කළ යුතු බවයි (Sithrampalam 1980:92). අනුරාධපුරයට අමතර ව තිස්සමහාරාමය කන්තරෝදය ආදී ප්‍රදේශවලින් ද බ්‍රාහ්මී අක්ෂර සහිත මැටි මෙවලම් පුරාවිද්‍යාඥයින්ට හමු වී තිබේ (Parker 1885:67-68). අනුරාධපුරයේ හා අනෙක් ස්ථානවල හමුවන ලේඛන පිළිබඳ ව අවධානය යොමුකර ඇති දැරණියගල ඒවා ක්‍රි.පූ 600-300 කාලයට අයත් බව පෙන්වා දී තිබේ (Deraniyagala 1992:711). එසේ ම බ්‍රාහ්මී අක්ෂර ලිවීම සඳහා භාවිත කරන ලදැයි අනුමාන කරන සත්ත්ව අස්ථිවලින් නිර්මාණය කරන ලද පන්හිඳක් ද ඇතුළුපුරයෙන් හමු වී ඇති බව ඔහු පෙන්වා දී තිබේ (එම:*fig* 66). මෙ වැනි පන්හිඳට සමාන පන්හිඳවල් ඉන්දියාවේ **අලගම්ගිර්පූර්, චිරාන්ච්, හස්තිනාපූර්** සහ **උජ්ජේන්** යන ස්ථානවලින් ද ක්‍රි.පූ. 300 කාලයේ දී භාවිත වී ඇත (එම :111).





අනුරාධපුර ඇතුළුපුර බ්‍රාහ්මී අක්ෂර සම්බන්ධව අදහස් දක්වන පියතිස්ස සේනානායක දැරණියගල විසින් AG 69 Bowl Type 226 Rim Type 8 වර්ගයට මැටි බඳුන් වර්ගය ක්‍රිස්තු පූර්ව යුගයේ දී මෙන් ම ක්‍රිස්තු වර්ෂ යුගයේ දී භාවිත වූ බව පෙන්වා දී ඇත (සේනානායක 2002:57-58). එසේ ම දැරණියගල ඉදිරිපත් කර ඇති තාරම හෝ තාරච යන වචන ඇති මැටි බඳුන් කැබැල්ල ද **තයාකුටෙ** යන අක්ෂර දීර්ඝ ස්වර ඇසුරුකර ගන්නා බැවින් එම මැටි බඳුන්වල අක්ෂර නිර්දේශ කරන කාලයට වඩා තවත් සංවර්ධනය වූ අවධියකට අයත් බව පෙන්වා දී ඇත (එම:59). දැරණියගල ලබාදී ඇති දින නිර්ණයන් අනුව එම මැටි බඳුන්වල ඉහළ සීමාව ක්‍රිස්තු පූර්ව හත් වැනි සියවස ද, පහළ සීමාව ක්‍රි.පූ. තුන් වැනි සියවස අතර සියවස් හතරක පරතරයක් පෙන්වන බැවින් මෙම පරතරය සැලකිල්ලට ගතහොත් එම අක්ෂරවල කාලය පහළ සීමාවකට ගමන් කළහැකි බව ඔහු පෙන්වා දී තිබේ (එම). එසේම කනින්හැම් හා ඕල්චින් පෙන්වා දී ඇති පරිදි මෙම බ්‍රාහ්මී අක්ෂර ක්‍රි පූ හය හා හත් වැනි සියවස්වලට අයත් පාංශු ස්තරවලින් ලැබුණ ද ඇතැම් විට එම ස්තර අවුල් වී තිබෙන්නට ඇතැයි යන මතය ඔහු ද ඉදිරිපත් කර තිබේ (Coningham and Allchin 1995:152-183). නමුත් දැරණිගයල වඩා ස්ථිර ලෙස ප්‍රකාශ කර ඇත්තේ ඔහු දක්වන කාල නිර්ණයන් නිවැරදි බව ය (Deraniyagala and Abeyratne 2000:759-789).

ලේඛන කලාව බිහිවීම පිළිබඳ ව දැනට ලැබී ඇති නව කාල නීර්ණ මඟින් දකුණු ඉන්දියාවේ ඓතිහාසික යුගයේ ඉහළ කාල සීමාව පිළිබඳ ව දැනට අප සතු ඇතිප මත වෙනස් කිරීමට එය හේතු වනු ඇත. ඒ අනුව අවසන් කාල නීර්ණ නිගමන තුළින්පබුදුන් වහන්සේගේ කාලයට දක්වා අඩු තරමින් ශත වර්ෂ දෙකක්වත් ඓතිහාසික යුගය ඈතට තල්ලුවන බව පෙනෙන අතර ලේඛන කලාව සමඟ විවිධ මැටි බඳුන් හැඩයන් හා කාල වර්ණ මැටි මෙවලම් සමහර විට උතුරු ඉන්දියාවෙන් මේ සමයේ දී ආනයනය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය (Deraniyagala 1992:17 Deraniyagala and Abeyratne 2000 :776). අක්ෂර කලාව ආරම්භ වීම සමඟ ම ක්‍රි. පූ.600 න්


පසු මුට්සලා රතු වීදුරු පබළු හා ලිවීමට උපයෝගී කරගත් ඇටකටුවලින් නිර්මාණය කරන ලද පන්හිඳ වැනි නිර්මාණ බිහි වී තිබේ (Deraniyagala 1992:714) මෙතෙක් ඇතුළුපුරයෙන් ලැබී ඇති සෑම අභිලේඛනයක් ම ඉන්දු ආර්ය ප්‍රකෘත ලේඛන ලෙස හඳුනාගෙන ඇත. මෙම අකුරු කොඩුමනල් හා අරිකමේඩු අක්ෂරවලට යම් සමානත්වයක් තිබෙන නමුත් (Rajan 1990:93-102) භාෂාව ද්‍රවිඩ පවුලට අයත් නොවේ. එ බැවින් ක්‍රි.පූ.500 න් පසු කාලයේ උතුරු ඉන්දියාවේ ආර්ය ප්‍රභූවරුන් දකුණු දෙසට ගමන් කළ බවට සඳහන් පපෝලාගේ මතය මෙ මඟින් තහවුරු වන බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:445-448).



ඡායාරූප අංක 3.1
අනුරාධපුර ඇතුළුපුරයෙන් හමු වී ඇති අක්ෂර ලිවීම සඳහා භාවිත කර තිබෙන අස්ථිවලින් තැනූ පන්හිඳ
ඡායාරූපය: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරයෙනි.








ඡායාරූප අංක 3.2
අනුරාධපුර ඇතුළුපුරයේ පූර්ව ඓතිහාසික ජනාවාස ස්තරවලින් හමු වූ මැටි බඳුන්වල දැකගත හැකි අක්ෂර නොවන සංකේත
ඡායාරූපය: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරයෙනි

පදනම් මුල් ඓතිහාසික අවධියේ ඇතුළුපුරයේ තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ ග්‍රාමීය ජනාවාස ක්‍රියාත්මක වීම සම්බන්ධ ව ලැබී ඇති සාධක වේ. ASW 88 ගොඩනැගිලි අවධිවලින් (Stuctural phase *J1,J2*) මෙම සාධක ලැබී ඇත. *J1* කණු වලවල් (Postholes) 59 ක් හා *J2* කණුවලවල් 10 ක් ද වාර්තා වී තිබේ (Coningham 1999:73) . ජ2 වලින් ලැබී ඇති කණු වලවල් රවුම් ආකාර හැඩ ගන්නා අතර එයින් භාගයක් කැණීම් තුළින් නිරාවරණය කරගෙන ඇත. ඉන් ඉතිරි භාගය කැණීම් වළෙන් බටහිර දෙසට විහිදී තිබේ (එම). නැගෙ නහිර දෙසින් හමු වූ තවත් කණු වළවල් 9 ක් මගින් රවුම් ආකාර නිවාස සැලසුමක් ASW 2 කැණීම තුළින් අනාවරණය කරගෙන ඇත (එම).



*Coniogham 1999 Pla.vb*

ඡායාරූප අංක 3.3

ASW 88 කැණීමෙහි දී මතු වූ රවුම් ආකාර ගෙවල් ආකෘති

මෙම තොරතුරුවලට අනුව පදනම් පූර්ව ඓතිහාසික අවධියේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය නිවාස කටුමැටි වරිච්චි යොදා රවුම් ආකාර හැඩයට සකස්කර තිබේ. මෙ වැනි නිවාස ගණනාවක් එක්





ව ග්‍රාමයක් නිර්මාණය වන්නට ඇති අතර අදටත් ඉන්දියාවේ මෙ වැනි හැඩ ලක්ෂණ සහිත නිවාස පැවතීම තුළින් මේ තත්ත්වය මැනවින් තහවුරු වේ.



ඡායාරූප අංක 3.4

වර්තමාන ඉන්දියාවේ දැකගත හැකි රවුම් ආකාරයේ නිවාස

ඡායාරූපය : සුදර්ශන් සෙනෙවිරත්න

කනින්හැම් පෙන්වා දී ඇති ආකාරයට ගොඩනැගිලි අවධි *J3* උප අවධිය වන විට ගොඩනැගිලි ඉදි කිරීම් සම්බන්ධ කණු වලවල් විශාල ප්‍රමාණයක් ලැබෙන අතර ඒ සමඟ ම ලෝහ නිෂ්පාදනය කළ බවට සාධක ලැබී තිබේ (Coningham 1999:73). එහි දී ලෝහ නිෂ්පාදන ලෙස උඳුන්, ඊතල හිස්, තඹ කැබලි බහුල ව වාර්තා වී තිබේ. ඒ සමඟ ම කාල රක්ත වර්ණ මැටි මෙවලම් අඛණ්ඩව වාර්තා වීම ද කැපීපෙනේ (එම :127). කනිංහැම්ගේ ගොඩනැගිලි අවධි ජ හි හමුවන්නා වූ බ්‍රාහ්මී අක්ෂර දැරණියගලගේ හතර වැනි අවධිය (පදනම් මුල් ඓතිහාසික අවධිය) අයත් වේ (Deraniyagala 1990:256). ASW 2 කැණීමේ ගොඩනැගිලි අවධි *J3, J4, J5* තුළින් ද බ්‍රාහ්මීය අක්ෂර වාර්තා වන අතර වඩා පැරණි අවධි වශයෙන් ජ1 හා ජ2 පෙන්වාදිය හැකි ය (Coningham 1999:127).

පදනම් මුල් ඓතිහාසික අවධියේ තවත් සුවිශේෂතාවයක් වන්නේ සත්ත්ව ගෘහකරණය හා වී වගා කළ බවට ලැබෙන සාධකයි. *ASW 2* කැණීමේ දී බල්ලා, මුවා ආදී සත්ත්වයින්ට අයත් සත්ත්ව ශේෂ ද (එම). **ඔරිසා සැටයිවා** (*Oryza sativa*) වර්ගයේ දහයියා ද හමු වී තිබේ (එම). එ තුළින් මෙම මිනිසුන් කෘෂි කටයුතුවල නියැලි බවට සාධක සපයයි. විශේෂයෙන් ම වී ගොවිතැන මෙම යුගයේ අතිශයින් වැදගත් වන බැවින් මේ සමය වන විට මෙම මිනිසුන් ස්වභාවික භූ පතනයන් ක්‍රමානුකූල ව වැව් දක්වා සංවර්ධනය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. වර්තමාන බසවක්කුලම (අභය වැව) එ වැනි භූ පතනයක පිහිටා තිබෙන වැවකි. යකඩ යුගයේ මිනිසුන් මෙම ස්ථානය වැවක් දක්වා පරිවර්තනය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

ප්‍රාථමික යකඩ යුගයේ (Early Iron Age) සිට පදනම් මුල් ඓතිහාසික යුගය (Basal Early Historic) දක්වා ඇතුළුපුර භූ දර්ශනය සැකසීමේ දී එහි බහු සම්පත් යැපුම් රටාවේ වර්ධනය වීමක් දැකගත හැකි ය. ඒ අතර බහුවිධ සම්පත් භාවිතාවේ සුවිශේෂී අංගයන් ලෙස විවිධ පබළු වර්ග හඳුනාගත හැකි ය. AG 69 3A ස්තරයෙන් 5*b* වර්ගයේ බැරල් හැඩ පබළු ද 3B ස්තරයෙන් 3*b* වර්ගයේ රවුම් හැඩ වීදුරු පබළු ද හමු වී තිබේ (Deraniyagala 1972 :136). එයට අමතර 3B ස්තරයෙන් හමුවන 10*b* වර්ගයේ රවුම් හැඩ (glass paste bead) පබළු කන්තරෝදයෙන් ද වාර්තා වී තිබේ (එම). බෙග්ලි පෙන්වා දී ඇති ආකාරයට පොම්පරිප්පුවෙන් ද මෙ වැනි හැඩ පබළු හමු වේ (Begley 1981:66). මෙහි තවත් සුවිශේෂතාවයක් වන්නේ කානීලියන් වර්ගයේ පබළු 3B ස්තරයේ වාර්තා වීමයි (Deraniyagala 1972:132). කානීලියන් පබළු නිෂ්පාදනය ඉන්දීය අර්ධද්වීපය තුළ සිදු වී ඇත.

ක්‍රි. පූ. 800 පමණ කාලයට අයත් මාස්කි (ඊනස) සහ පෝකලම්වලින් (ඡදරන්ක්ප) කානීලියන් පබළු වාර්තා වේ (Thapar 1952 :15). පොම්පරිප්පු සුසානය හා කොක්එබේ හා ඉබ්බන්කටුව සුසානය තුළින් ද මෙ වැනි පබළු ලැබී ඇත (Deraniyagala 1958 :17; මැන්දිස් : 2016). කානීලියන් අමුද්‍රව්‍යය ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරන්නට ඇතැයි පාකර් පෙන්වා දී තිබේ





(Parker 1885 :83) කානීලියන් පාෂාණය සුලභ ලෙස ගුජරාට් (Gugarat) හා ගුන්ටූර් (Guntur) යන ප්‍රදේශවල දැකගත හැකි ය (Wheeler 1946:123). AG 69 ගෙඩිගේ කැණීමෙන් කානීලියන් පබළු නිෂ්පාදනය කර ඉතිරි වූ න්‍යෂ්ටීන් (Core) හා පතුරු (waste) කැබලි හමුවීම තුළින් ඒ ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් අදාළ කාලවල දී ඇතුළුපුරයේ ක්‍රියාත්මක වී ඇති බව දැරණියගල ප්‍රකාශ කර තිබේ (Deraniyagala 1972 :139). අනුරාධපුරයේ පැවති නිමි පබළු නිෂ්පාදන මධ්‍යස්ථානය ක්‍රියාත්මක සමයේ ක්‍රි.පූ. 800-400 පමණ වන විට යකඩ යුගයේ ප්‍රජාව මධ්‍යම යාන් ඔය නිම්නය දෙසට හා මධ්‍ය කඳුකරයේ කුඩා කඳු ප්‍රදේශයට සංක්‍රමණය වීම දැකගත හැකි ය. ඉබ්බන්කටුවේ භූමදාන කුටිවල ඉන්ද්‍රගෝප පබළු (කානීලියන්) විශාල ප්‍රමාණයක් තිබීමෙන් පෙන්නුම් කරන්නේ එම පබළු බාහිර ප්‍රදේශයකින් ආනයනය කර ඇති බවය (සෙනෙවිරත්න 1996:18).

ඉබ්බන්කටුවේ තිබී සොයා ගත් ඉන්ද්‍රගෝප පබළු උතුරු මැද තැනිතලාවල සම්භවය ලැබූ ඒවායැයි සිතීමට බොහෝ විට ඉඩ තිබෙනුයේ ඒවා පරිසර කලාප දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර හුවමාරු කෙරුණු ද්‍රව්‍යයක් වී ඇති බැවිනි (එම). අනුරාධපුර ඇතුළුපුර ජනාවාසය ආශ්‍රිත ව කරන ලද කැණීම්වල දී ක්‍රි. පූ. 600 ට පසු ඇති ක්‍රි. පූ. යුගයේ ජනාවාස ස්තරවල එයට පෙර පැවති යුගයට වඩා පුළුල් තේරීමක් ඇති මැණික් ගල් වර්ග ද, මැණික් කර්මාන්තය ආශ්‍රිත ශේෂ ද, තඹ රත්තුං ඇතුළු ඛනිජ වර්ගවල ද සාපේක්ෂ ලෙස බහුල පරිහරණයක් දක්නට ඇත (සෙනෙවිරත්න 1996:190). කානීලියන් සහ ඇගේට් නොහොත් අගස්ති යන ඛනිජ වර්ගය ශ්‍රී ලංකාවට ගෙන එන ලද්දේ අර්ධද්වීපික ඉන්දියාවේ බටහිර සහ නිරිතදිග දෙ දිශාවෙනි. බහිර ප්‍රදේශයකින් අමුද්‍රව්‍යය ලෙස අනුරධපුරයට ආයාත කළ මෙම පාෂාණ එහි දී පබළු ලෙස නිමකර යකඩ යුගයේ සමාජ ආශ්‍රිත ව බෙදා හැර ඇත (එම). මේ තත්ත්වය අනුව අනුරාධපුරය පදනම් මුල් ඓතිහාසික සමය (Basal Early Historic) වන විට සම්පත් හැසිරවීමේ හා නිෂ්පාදනය කිරීමේ වැදගත් මධ්‍යස්ථානයක් බවට පත් ව ඇත.

පදනම් මුල් ඓතිහාසික අවධීයේ දී ඇතුළුපුර ජනාවාසය තුළ දේශීය මෙන් ම විදේශීය ඛනිජ සම්පත් ඇතුළු අනෙකුත්

අමුද්‍රව්‍යය භාවිත වූ බව පෙනේ. කනිංන්හැම් පෙන්වාදෙන ආකාරයට ලැපිස් ලැසුලි, මුහුදු සිප්පි, හක්, කානීලියන්, කැස්බෑ ලෙළි, තිරුවානා වර්ග ඒ අතරින් කැපීපෙනේ (Coningham 2006 :05). එසේ ම එම අවධියේ දී රුලේටඩ් වර්ගයේ විදේශීය මැටි මෙවලම්, හතරැස් හැඩ ගොඩනැගිලි හා රවුම් ආකාර ගොඩනැගිලි ද සංකේත හා බ්‍රාහ්මී අක්ෂර, වී වගාව, අශ්වයා සහ යකඩ උපකරණ ආදිය හඳුනාගත හැකි බව පෙන්වා දී ඇත (Coningham 2006 :05 ; Deraniyagala 1992:710-711). මේ අනුව අනුරාධපුරය එක්තරා ආකාරයට නාගරික ලක්ෂණයන්ට පැමිණීම සිදු වී තිබෙන බව හඳුනාගත හැකි අතර (එම 711 ; Coningham 2006:05). ඒ සමඟ ම විවධ නිෂ්පාදන හා හුවමාරුව ආරම්භ කර තිබූ බව ද කැපීපෙනේ. මෙම පුරාවිද්‍යාත්මක තොරතුරුවලට අනුව අනුරාධපුර කේන්ද්‍රීය භූ දර්ශනය පදනම් මුල් ඓතිහාසික අවධිය තුළදී කැපීපෙනෙන ලෙස සංවර්ධනයට ලක්වී තිබේ. ඒ බව සාහිත්‍ය මූලාශ්‍රය තුළින් ද යම් පමණකට සනාථ වී තිබේ (*Mv*, vii:43: x 75-76)

### 3.2.2.3 පහළ මුල් ඓතිහාසික අවධියේ සිට මධ්‍ය මුල් ඓතිහාසික දක්වා ඇතුළුපුර සංස්කෘතික විකානය හා භූ දර්ශනය

ඇතුළුපුර සංස්කෘතික විකාශනයේ හා භූ දර්ශනයේ මීළඟට හඳුනාගත හැකි අවස්ථාව වන්නේ පහළ මුල් ඓතිහාසික අවධියයි (Lower Early Historic). මෙම කාලය ක්‍රි.පූ. 500-250 කාලයට අයත් වේ (Deraniyagala 1992:711). ASW 2 කැණීම් සාධකවලට අනුව මෙම කාල වකවානුව ගොඩනැගිලි අවධි *J* හා *I* යන අවධි දෙක ම නියෝජනය කරන බව කනින්හැම් පෙන්වා දී ඇත (Coningham 1999:127). වංසකතා විස්තර කරන ආකාරයට මෙම සමය අනුරාධපුර මුල් ම නගරය ගොඩනැඟෙන කාලය හා සමතාවයක් දක්වයි. මහාවංසයේ සඳහන් ආකාරයට පණ්ඩුකාභය රජු මුල් ම නගරය සැලසුම් කිරීම මෙම කාලයට අයත්ව සිදුකර තිබේ (*මව.* x 83-90). දැරණියගල ප්‍රකාශ කර ඇති පරිදි මෙම කාලයේ දී ඇතුළුපුර ජනාවාසය හෙක්ටයාර 50 ක වපසරියෙන් යුක්ත වී තිබේ (Deraniyagala 1992:711).





කනිංන්හැම්ගේ කාලනිර්ණ සමඟ මෙම කාල වකවානුව අතර වෙනස්කමක් තිබෙන අතර ඔහු විසින් පෙන්වා දී ඇත්තේ ක්‍රි.පූ. 360-190 කාලය තුළ ඇතුළුපුර ජනාවාසයේ ව්‍යාප්තිය හෙක්ටයාර 60 ක් දක්වා වර්ධනය වී තිබූ බවයි (Coningham 1999:127). කනිංන්හැම්ගේ විග්‍රහ කිරීම් අනුව මේ සමය තුළ ඇතුළුපුර ජනාවාසයේ නිවාස රවුම් හැඩ ආකාරයේ සිට හතරැස් හැඩ ආකාර දක්වා පරිණාමය වීම සිදු වී තිබේ (එම). මෙම නිවාස මඩ මැටි භාවිත කර නිර්මාණය කර තිබෙන අතර සමහර ඒවා තුළ කාමර වෙන් කර තිබී ඇත (එම). මුල් නිවාස ආකෘතිවල වහළ තණ කොළ හෝ වෙනත් කොළ විශේෂයක් භාවිතයෙන් සෙවිලි කොට තිබූ බව පෙන්වාදෙන කනිංහැම් පසුව සෑදූ නිවාසවල පුළුස්සන ලද උළු සෙවිලිකර තිබූ බව ප්‍රකාශ කර ඇත (එම). කෙසේ වෙතත් මුල් ඓතිහාසික සමය වන විට ඇතුළුපුරය වටා කොටු පවුරු ඉදිවන අතර එයට ඇතුළත් වන භූමිය හෙක්ටයාර 100 දක්වා වර්ධනය වී තිබූ බව කනිංන්හැම්ගේ මතය වී තිබේ (Coningham 1999:111-122).

ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනය පිළිබඳ ව අධ්‍යයනයේ දී විශේෂයෙන් ම ක්‍රි.පූ.500-250 කාලයට අයත් නිවාස සැලසුම් තුළ වහළ සඳහා භාවිත කරන ලද උළු 35*b* (i) වර්ගයෙන් හමු වී තිබේ. එම උළුවල ස්වරූපය අනුව ඇතුළුපුර ජනාවාසය යම් මට්ටමකට වර්ධනය වී තිබූ බව පැහැදිලි වී තිබේ (Deraniyagala 1992:711;1972:82). පහළ මුල් ඓතිහාසික සමය වන විට උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (NBPW) හා රුලේටඩ් වර්ගයේ මැටි මෙවලම් (RLW) මෙම කාලයට අදාළ ව වාර්තා වීම ද සැලකිය යුතු ය (Deraniyagala 1992:712;1990:256-257 ; Coningham 1999:127).

කෙන්ද්‍රීය ජනාවාසයන් ලෙස ඇතුළුපුරය වර්ධනය වීමේ දී මධ්‍ය මුල් ඓතිහාසික අවධිය (Middle Early historic) ක්‍රි.පූ. 250 ක්‍රි.ව.100 ඇතුළුපුර ජනාවාසය හෙක්ටයාර 100 දක්වා වර්ධනය වී තිබූ බව දැරණියගලගේ උපකල්පනය වේ (Deraniyagala 1992:712). එම කාලය වන විට අනුරාධපුර ජනාවාසය දකුණු ආසියාවේ විශාලත ම නගර 5 න් ඒකක් වූ බව ඔහු පෙන්වා

දී ඇත (එම). ASW 2 කැණීම් සාධකවලට අනුව ගොඩනැගිලි අවධි I අවධියට මෙම කාලය අයත් වේ(Coningham 1999:127). රූලේටඩ් වර්ගයේ මැටි මෙවලම්, බ්‍රාහ්මී ලේඛන, මුද්‍රා, හස් එබූ කාසි හා ඇතා සහ ස්වස්තික කාසි මෙන් ම පිළිස්සූ ගඩොළු මෙම වකවානුව තුළ භාවිත වූ බවත්, එයට අමතර ව හෙලනිස්ටික් මැටි මෙවලම් හා නඟුල් කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය මෙන් ම වාරි තාක්ෂණයේ දියුණුව ද දැකගත හැකි බව ඔවුන් පෙන්වා දී ඇත (Deraniyagala 1992:712 ; Coningham 1999 :127-128). කොඩ්රිංටන් හා පාකර් පෙන්වා දී ඇති ආකාරයට හස් එබූ කාසි, ඇතා සහ ස්වස්තික කාසි ක්‍රි. පූ. තුන් වැනි සියවසින් පසු ලංකාවේ භාවිත වී තිබේ (Codrington 1924 ; Parker 1909:471). ASW 2 කැණීම් සාධක අනුව හස් එබූ කාසි, ඇතා සහ ස්වස්තික කාසි හමු වූ ස්තර ක්‍රි. පූ. තුන් වැනි සියවසේ මැද භාගයට අයත් බව කනිංන්හැම් පෙන්වා දී ඇත (Coningham 1999:128).

ඇතුළුපුරයේ කේන්ද්‍රීය සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය අධ්‍යයනයේ දී පහළ මුල් ඓතිහාසික අවධිය (Lower Early historic 500- 250 BC) හා මධ්‍ය මුල් ඓතිහාසික අවධිය (Middle Early Historic 250 BC – 100 AD) ( Deraniyagala 1992:711-713). ඇතුළුපුර ජනාවාසය ඊට පෙර පැවති අවධියට වඩා වර්ධිතභාවයකට පත් වූ අවධිය බව පෙන්වාදිය හැකි ය (එම:712). කේන්ද්‍රීය භූ දර්ශනය වර්ධනයේ දී මෙම කාලයට සමකාලීන ව තාක්ෂණය හා සම්පත් පරිහරණයේ බහුල භාවිතයක් ඇති වී තිබූ බව පෙනේ. විශේෂයෙන් ම මේ සමයේ නඟුල් කෘෂිකර්මාන්තය හා වාරි තාක්ෂණයේ දියුණුව සඳහා බෙහවින් ම ලෝහ තාක්ෂණයේ බලපෑම පුළුල් ලෙස වර්ධනය වී තිබීම පෙන්වාදිය හැකි ය. සාහිත්‍ය මූලාශ්‍රය හා අභිලේඛන සාධක අධ්‍යයනයේ දී මේ සම්බන්ධ විශාල තොරතුරු ප්‍රමාණයක් ඒකරාශී කරගත හැකි අතර අතුළුපුර භූ දර්ශනය වර්ධනය සඳහා පර්යන්ත ප්‍රදේශ තුළ සිදු වූ වර්ධනයන ද ඒ සඳහා සෘජු ලෙස බලපා ඇති බව හඳුනාගත හැකි ය.

සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන කරුණු අනුව මේ කාලයේ අනුරාධපුරයේ සිට සේරුනුවර දක්වා වූ මහා ප්‍රදේශය ආශ්‍රයෙන් ලෝහ කර්මාන්තය සම්බන්ධ වැදගත් තෙරොතුරු හඳුනාගත





හැකි ය (*මව*.xxviii:16-18). ඇතුළුපුරයේ AG 69 4 A ස්තරය තුළින් බහුල වශයෙන් ලෝහ නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු ලැබී තිබේ (Deraniyagala 1972:155). විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් සහිත ශිල්ප ශ්‍රේණිවල මැදිහත් වීම මත ලෝහ නිෂ්පාදනය පැවති බව ක්‍රි.ව. 350 ට අයත් ලබුඇටබැඳිගල ශිලා ලිපියේ සඳහන් අනුරාධපුර නගරයේ පජිනපස (නැගෙනහිර) ක්‍රියාත්මක වූ මහා තබක නිගම පිළිබඳ විස්තරවලින් පැහැදිලි වේ (Ez.Vol. iii:247-250). එම වෙළඳපොළෙහි තඹ නිෂ්පාදන අලෙවි කිරීම සිදු වූ බව පරණවිතාන ප්‍රකාශ කර ඇත (එම :250). මේ අනුව නගරයේ නැගෙනහිර පිහිටි තඹ නිෂ්පාදන ක්‍රියාවලිය හා අලෙවි කටයුතු සඳහා මුල් ඓතිහාසික සමයේ අනුරාධපුර නගරය හා සේරුවිල ප්‍රදේශය අතර ලෝහ සම්පත් පරිහරණය පිළිබඳ වටිනා තොරතුරු ඉන් හඳුනාගත හැකි ය (Seneviratne 1995:133). මෙහි දී විශේෂයෙන් ම තඹ කර්මාන්තය ආශ්‍රිත වෙළඳ කටයුතු සිදු ව ඇති බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne 1995:133). මධ්‍ය යාන් ඔය නිම්නයේ පෙරියපුලියකුලම් මුල් බ්‍රාහ්මී ලිපිවල **තඹකර හා තොපශ** යනුවෙන් සඳහන් වී තිබේ. එයින් තඹ හා බෙලෙක් කර්මාන්තයේ යෙදුණු ජන පිරිස් පිළිබඳ යම් ආකාරයකට තොරතුරු අන්තර්ගත වී තිබේ (Seneviratne 1984:246-247; *Ic*.Vol.i No.350,351,370). මෙම ක්‍රියාවලිය වෙළඳ ජාලයක් ඔස්සේ ක්‍රියාත්මක වීමට බෙහෙවින් ඉඩකඩ ඇති අතර බෙලෙක් කර්මාන්තය සම්බන්ධ කටයුතුවල දී ගහපතිවරුන්ගේ මැදිහත්වීම හා යකඩ හා තඹ නිෂ්පාදන කටයුතුවල දී පරුමකවරුන්ගේ මැදිහත්වීම මෙම ප්‍රදේශය ආශ්‍රිත ව කැපීපෙනේ (Seneviratne 1995:134).

ඉහතින් විස්තර කරනු ලැබූ ලෝහ කර්මාන්තය සම්බන්ධ කටයුතු අනුරාධපුරය හා සේරුවිල අතර පූර්ව ඓතිහාසික සමයේ සිට ම ගොඩනැගී තිබූ තත්ත්වයක් බව මේ අනුව පැහැදිලි වේ. එම නිසා මුල් ඓතිහාසික සමය වන විට ඇතුළුපුරයේ ලෝහ නිෂ්පාදන කටයුතු හා බෙදා හැරීම් දියුණු වී ඇති බව AG 69 කැණීමෙන් මෙන් ම ASW 2 කැණීමෙන් ලැබී ඇති සාධක තුළින් ද මැනවින් පැහැදිලි වේ (Coningham 1999:*fig*.66,7022; Deraniyagala 1972:152-154).



*Conningham 1999 pl.vii a*

ඡායාරූප අංක 3.5

ඇතුළුපුර ASW 88 කැණීමෙන් හමු වූ ලෝහ උණු කිරීමට භාවිත කරනු ලැබූ උඳුනක්




ඡායාරූප අංක 3.6

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෞතුකාගාරය තුළ තැන්පත් කර ඇති පූර්ව ඓතිහාසික යුගයට අයත් ඇතුළුපුරයෙන් හමු වූ ලෝහ උපකරණ, ලෝහ බොර සහ කෝව කොටස්





පූර්ව ඓතිහාසික සමාජ තම වාසභූමි පිහිටුවා ගැනීමේ රටාව දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ ඒවා පිහිටුවා ඇත්තේ තීරණාත්මක වැදගත්කමකින් යුත් සම්පත් තිබූ ප්‍රදේශවල ය. මෙම වාසභූමිවල ජීවි පරිසර පදනම පිළිබඳ විමසීමේ දී පැහැදිලි වන්නේ ඒ ඒ කලාප තුළ දක්නට ලැබෙන සම්පත්වල ස්ථානගතවීම ඒ සඳහා බලපා ඇත. යාන් ඔය නිම්නයේ, කලා ඔය නිම්නයේ, මල්වතු ඔය නිම්නයේ හා පහළ මහවැලි නිම්නයේ පිහිටි ස්ථාන ගණනාවක ම වාසභූමි පිහිටුවා ඇත්තේ ඒ ඒ පරිසර කලාපවල දක්නට ලැබෙන සුවිශේෂ වූ සමාජ හා ජීවනෝපාය ක්‍රමයට හසුවන පාරිසරික සාධක පදනම් ව බව පෙනේ (Seneviratne 1984:237-293).

ඉහළ කලා ඔය පද්ධතිය ගත් කළ ප්‍රධාන වශයෙන් ම ඛනිජ සම්පත්, මැණික් ගල්, තලාතු මිනිරන් හා ලෝහ සම්පත් අන්තර්ගත ප්‍රදේශයක් වේ (සෙනෙවේරත්න 1996:14). ඊසාන දිග පිහිටි සේරුනුවර මහවැලි ගඟේ පිටාර තැන්නට ඇතුළත් ලෝහ සම්පත් පිහිටි කලාපයකි (Seneviratne 1995:116-120). එසේ ම උත්තර මලය රට්ඨයේ පහත් තැනිතලා ප්‍රදේශ වෙනත් දේශගුණික හා භෞතික ලක්ෂණ අතින් වෙනස් ම කලාපයක් වේ (සෙනෙවිරත්න 1996:14-19). අනුරාධපුරය ගතහොත් කෘෂිකර්මාන්තයට ඉතා හිතකර රතු දුඹුරු පාංශු කලාපය අයත් ප්‍රදේශයක් වේ (Cooray 1984:140). මෙම කරුණු අධ්‍යයනය කිරීමේ දී උතුරුමැද කලාපය තුළ ස්ථානගත වී ඇති පූර්ව ඓතිහාසික වාසභූමි හා සුසාන සංකීර්ණ පද්ධති ගත්කළ අනුරාධපුර මධ්‍යගත ස්ථානයක පිහිටා තිබීම නිසා බාහිර කාලපවල පවතින්නා වූ සම්පත් ලබා ගැනීම, පරිහරණය හා බෙදාහැරීම සඳහා ප්‍රධාන මධ්‍යස්ථානයක් වී ඇති බවට උපකල්පනය කළ හැකි ය. ද්වීපික සංස්කෘතියේ සම්භවය අප හඳුනාගනු ලබන්නේ උතුරුමැද පළාත සහ අග්නිදිග ලංකාව තුළිනි. නමුත් පර්යන්තයේ පිහිටන අනෙකුත් භෞමික සහ පාරිසරික කරුණු එම නිසා අවතක්සේරු කිරීමට නොහැකි ය. විශේෂයෙන් ම වංසකතා සාහිත්‍යයේ හුදෙකලා පර්යන්ත ප්‍රදේශ ලෙස හැඳින් වූ බොහෝ ප්‍රදේශ ද්වීපික සංස්කෘතියේ වර්ධනයට ද්‍රව්‍යාත්මක පිටුවහලක් ලබා දුන් ප්‍රදේශ ලෙස මෑතක දී සිදු කරන ලද පුරාවිද්‍යා පර්යේෂණවලින් පැහැදිලි කරගනු ලැබීය.

ප්‍රාථමික යකඩ යුගයේ සිට විවිධ භෞමික කලාපවල විවිධ පරිසර ක්ෂේත්‍ර තුළ වර්ධනය වූ ජනාවාස බොහෝ විට විෂම ලෙස පැවති සම්පත් ක්ෂේත්‍ර හඳුනාගැනීම, ජන රේඛනයේ ප්‍රසාරණය, සමාජ ආයෝජන වර්ධනය, හුවමාරු පද්ධතිය පුළුල්වීම, ශිල්ප නිෂ්පාදනයේ විශේෂ ප්‍රාගුණ්‍යතාවය, සමාජ ස්තරායනය යන කාරණා පදනමින් ක්‍රි.පූ. දහ වැනි සියවසේ සිට ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ දක්වා විවිධ පරිවර්තනයන්ට ලක්වීම හඳුනාගත හැකි ය. මෙම තත්ත්වයන් කරණ කොට ගෙන යම් යම් ජනාවාස ඉස්මතු වන අතර එයින් අනුරාධපුරය හා මාගම ප්‍රධාන නාගරික ස්ථාන බවට පත් වේ. මෙම නාගරීකරණ ක්‍රියාවලිය තුළ දී අනුරාධපුරය ඉස්මතු වීම සඳහා පර්යන්ත ප්‍රදේශවල වර්ධනය වූ පූර්ව ඓතිහාසික ජනාවාස දක්වා ඇති දායකත්වය බෙහෙවින් ම වැදගත් වේ.

අනුරාධපුර ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනයේ වර්ධනය සඳහා පර්යන්ත ප්‍රදේශවල සිට ජනාවාස අතර සිදු වූ ද්‍රව්‍යමය හුවමාරු ජාලයේ ක්‍රියාත්මක වීම සමඟ පාලන සංවිධාන බිහි වී මුල් ඓතිහාසික අවධිය වන විට විධිමත් අකාරයට හැඩ ගැසීම මුල් බ්‍රාහ්මී අභිලේඛන ස්ථානගත වීම මගින් දළ වශයෙන් හඳුනාගත හැකි ය.

| පළාත | පිහිටි ප්‍රදේශය | පවතින ස්වභාවික සම්පත් |
|---|---|---|
| උතුර | පෙරියපුලියංකුලම | රත්තරං, යකඩ, ඛනිජ වැලි |
| උතුරුමැද | මුතුගල,නුවරකන්ද, උච්චප්පුකල්ලු | යකඩ, මුතු |
| වයඹ | රනගිරමඩ, නුවරකන්ද, තිත්තවෙල, මාන්තායි | යකඩ, මයිකා, මුතු |
| නැගෙනහිර | සේරුවිල, කුසලාන්කන්ද, කවුඩුලුපොතාන, මොට්ටයාක්කලු | තඹ, යකඩ, ඛනිජ වැලි |
| මධ්‍යම | ගෝනවත්ත, බඹරගල, ඇඹුල්අඹේ, පිදුරංගල, නාලන්ද | රත්තරං, යකඩ, මිනිරන්, තිරුවානා වර්ග, කහඳ, |
| ඌව | කොටාදැමූහෙල, කොල්ලදෙනිය | මැණික්, තිරුවානා, කහඳ |
| සබරගමුව | කොටාදැමූහෙල, කොල්ලදෙනිය | මැණික්, තිරුවානා |





(Cooray 1984 167,178-224; Jayawardana 1975:135-138;*Ic*.Vol.i) 1970).

වගු අංක 3.1

ඛනිජ සම්පත්වල පිහිටීම හා මුල් ඓතිහාසික අභිලේඛනවල ස්ථානගතවීම

අනුරාධපුරය කේන්ද්‍රීය ලෙස වර්ධනය වීමේ දී පර්යන්ත ප්‍රදේශය තුළ පැවති සම්පත් පරිහරණය සම්බන්ධ සමාජ සැකැස්ම, සම්පත් හැසිරවීම හා සම්පත් අත්පත් කර ගැනීම සම්බන්ධ ශිල්පීය කණ්ඩායම් පිළිබඳ තොරතුරු ද වැදගත් වේ. මුල් බ්‍රාහ්මී අභිලේඛනවල මැණික් කර්මාන්තය ආශ්‍රයෙන් සිටි කණ්ඩායම් **මණිකරුවන්** වශයෙන් සඳහන් වී ඇත. එවැනි ශිලා ලේඛන පාණික්කුලම, ඇඹුල් අඹේ, ගල්ගේ, නාලන්ද, වේගිරිය, මිහින්තලය, ගල්ගමුව ආදී ප්‍රදේශවලින් වාර්තා වේ (*Ic*.Vol.i.No.830,831,832,833,1033,1035). මේ ප්‍රදේශ අදටත් මැණික් ලැබෙන ප්‍රදේශ වේ. පුරාණයේ දී මේ ප්‍රදේශවල මැණික් කර්මාන්තයේ නියැලි ජන පිරිස් ස්ථානගත ව සිටින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මධ්‍යම පළාතේ නාලන්ද ප්‍රදේශයේ දෙමැද ඔයෙන් ලැබෙන ශිලා ලිපියක **මචූඩික** රජු පිළිබඳවත් ඔහුගේ මැණික් කරුවන් මැණික් ලබා ගැනීමට එම ස්ථානයට සැපැත් වූ අන්දම පැහැදිලි කර තිබේ (*Ic*.Vol.i No. 830 ; සෙනෙවිරත්න 1996:193). මචූඩික යන්න විග්‍රහ කරන සෙනෙවිරත්න එ මඟින් **මහා මැණික් භාරකරු** යන්න ගම්‍ය වන බව පෙන්වා දී ඇත


(සෙනෙවිරත්න 1996:193). මේ පිරිස නාලන්ද ප්‍රදේශයට සැපත් වී ඇත්තේ මැණික් සම්පත් අත්පත් කර ගැනීමට බව පැහැදිලි වන අතර දැනට ශ්‍රී ලංකාවේ සිදු කර ඇති භූ සමීක්ෂණ වාර්තාවලට අනුව ද මේ ප්‍රදේශය මැණික් නිධිගත ව ඇති ප්‍රදේශයක් බව හඳුනාගෙන ඇත (Cooray 1984:fig.11). මැණික් සම්පතට අමතර ව රත්තොට, මාතලේ, ඇළහැර, මඩුමාන, තලංගොඩ ආදී ප්‍රදේශ ආශ්‍රිත ව තලාතු මිනිරන් ස්ථානගත වී ඇති බව භූ විද්‍යා වාර්තා පෙන්වාදෙයි (tu:fig 13). වංසකතා සාහිත්‍යවල ද ප්ලිනි, ටොලමි හා ෆාහියන් යන විදේශීය දේශාටකයින්ගේ වාර්තාවල ද මෙම සම්පත් පිළිබඳ ව සඳහන් වන අතර ප්ලිනිගේ වාර්තාවේ ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලැබූ කැස්බෑ ලෙළිවන් පාෂාණ ගැන විග්‍රහ කර තිබේ. කැස්බෑ ලෙලිවලින් පාෂාණ වශයෙන් හැඳින්වෙන්නේ තලාතු මිනිරන් බව සෙනෙවිරත්න ප්‍රකාශ කර ඇත (සෙනෙවිරත්න 1996:193).

මේ ආකාරයට තාක්ෂණික සංස්කෘතික වශයෙන් ඇති වන්නා වූ ප්‍රගමනය සමාජ ව්‍යුහයන් සංවිධානය සඳහා බලපාන අතර එම සමාජ සැකැස්ම තුළ සම්පත් අත්පත් කර ගැනීම, ඒවා නිෂ්කරණය හා නිෂ්පාදනය කරන පිරිස ද බෙදා හැරීම සිදු කළ කණ්ඩායම් පිළිබඳ ව ද මුල් ඓතිහාසික අවධියේ දී හඳුනාගත හැකි ය. එම කණ්ඩායම් අතර **පරුමක ගහපති, ගමික, රජ** යන පදවි නාම භාවිත කළ පිරිස් පාලන කටයුතු හා නිෂ්පාදන බෙදා හැරීම් සම්බන්ධ ව ද **අචරිය, අචිරිය, අජරිය** ආදී ශිල්ප නායකයින් නිෂ්පාදන කටයුතු සම්බන්ධව ද ක්‍රියා කළ ආකාරය හඳුනාගත හැකි ය (*Ic*.Vol.No 229,604,749,753,803, 991). ඛනිජ සම්පත් පරිහරණය මෙන් ම වෙළඳපොළ බෙදා හැරීම් මධ්‍යස්ථාන පිළිබඳ ව ද තොරතුරු අභිලේඛනවල හා වංසකතාවල **කඩ, කණ්ඩ, කඩක** (*මව.* xxxiii:52) යන වචන හා බුදුගේහින්න ආශ්‍රිත ශිලා ලිපිවල උපරිකඩ හා මතුකඩ යනුවෙන් සඳහන් වේ (*Ic*.Vol.i No). මෙම **කඩ, කණ්ඩ, කඩක, කටක** යන වචන මඟින් සුළු වෙළඳපොල, හුවමාරුව සිදුවන ස්ථානය, ද්වැයෙ ගම්‍යවන බව සුදර්ශන් සෙනෙවිරත්න ප්‍රකාශ කර ඇත.(සෙනෙවිරත්න 1996-190-192). අර්ධද්වීපික ඉන්දියාවේ





පැරණි ශිලාලිපිවලට අනුව නිගම හා කඩ යන්න එක සමාන අර්ථ දැක් වූ වචනාර්ථ වන සෙනෙවිරත්න විග්‍රහ කර ඇත (එම). ලංකාවේ නිගමස්ථාන පිළිබඳ ව සඳහන් ශිලා ලිපි ප්‍රවෘත්තිවලින් වෙළඳපොළ අර්ථවත් වන බව පරණවිතාන පෙන්වා දී තිබේ (*Ez*.Vol.iii 172-188). නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන නිගම කේන්ද්‍රගත ව වර්ධනය වීම සමඟ එ වැනි වෙළඳ මධ්‍යස්ථානය හරහා ගමන්ගත් මාර්ග ජාලයක් ද බිහි වී තිබේ. මෙ වැනි මාර්ග පද්ධතියක් අනුරාධපුරය තුළින් ද හඳුනාගත හැකි අතර එයින් අනුරාධපුර නගරයේ දකුණුට දිව ගිය මාර්ගය ඉසුරුමුණිය හා වෙස්සගිරිය හරහා මලය රටට ප්‍රවිෂ්ට වන බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ (සද්ලං.531). නැගෙ නහිරට ගිය මාර්ගය නගරයේ නැගෙනහිර දෙසින් මල්වතු ඔය එතෙර කොට මිහින්තලය පසු කොට සේරුනුවරට ගමන් ගත් බව මහාවංසයේ සඳහන් වේ (*මව*.xvii 29-30). ධාතුවංසයේ සඳහන් වන මහාචාරිකාමග්ග සේරුවිල සිට අනුරාධපුරයට ගමන් කිරීමට තිබූ මාර්ගය බව හඳුනාගත හැකි ය. එසේ ම උතුරු දෙසටගමන් ගත් මාර්ගය මල්වතු ඔය සහ කනදරා ඔය එතෙර කොට අනුරාධපුර නගරයට සම්බන්ධ වීමෙන් අනුරාධපුරය ප්‍රධාන ආර්ථික මර්මස්ථානයක් ලෙස වර්ධනයට වූ බව උපකල්පනය කළ හැකි ය. ඒ අනුව කේන්ද්‍රීය ලෙස අනුරාධපුර භූ දර්ශනය වර්ධනය වීමට ඉහත කාරණා ඍජු ව හා වක්‍ර ව බලපා ඇති බව පෙනේ.




සිතියම් අංක 3.8

පූර්ව හා මුල් ඓතිහාසික සමය වන විට අනුරාධපුර නගරය හා සම්බන්ධ වූ පුරාණ මාර්ග ජාලය දැක්වෙන සිතියම





අනුරාධපුර කේන්ද්‍රීය සංස්කෘතික විකාශනයේ හා භූ දර්ශනයේ මීළඟ අදියර වශයෙන් ඉහළ මුල් ඓතිහාසික අවධිය (Upper Early Historic). ක්‍රි.ව. 100 ක්‍රි.ව.300 අතර කාලය තුළින් හඳුනාගත හැකි ය (Deraniyagala 1992:713). ASW 2 කැණීම් සාධකවල දී මෙම අවධිය ක්‍රි.පූ. 200 - ක්‍රි.ව.130 ට අයත් වේ. ගොඩනැඟිලි අවධි ය හා ඨ වලට අයත්බ ව මෙම අවධිය විග්‍රහ කර ඇත (Coningham 1999:128). මෙම කාල වකවානුව තුළින් බ්‍රාහ්මී අක්ෂර සහිත මුද්‍රා, රූලේටඩ් වර්ගයේ මැටි මෙවලම් හෙලනිස්ටික් වර්ගයේ මැටි මෙවලම්, පුළුස්සන ලද ගඩොළු භාවිතය, දීප්තිමත් රතු බඳුන්, ගස සහ ස්වස්තික කාසි, ඉන්දු රෝම හා රෝම කාසි, ලා නිල් පැහැති වීදුරු සහ තද නිල් වීදුරු වර්ගවලින් තැනූ බඳුන් වර්ග ඇතුළුපුරයේ භාවිත කළ බව වාර්තා වී ඇත. AG 69 කැණීමට අනුව 35 a (i) වර්ගයට අයත් මැටි උළු මෙම කාලයට අයත් ව භාවිත වී තිබේ (Deraniyagala 1992:713). එසේ ම රූලේටඩ් බඳුන්වල භාවිතය මේ කාලය වන විට හඳුනාගත හැකි අතර කාල රක්ත වර්ණ මැටි මෙවලම්වල (BRW) අවසන් සීමාව එළඹීම මෙම කාලයේ දී සිදු වී තිබේ (එම).

ASW 2 කැණීමෙන් ක්‍රි.ව.200 - ක්‍රි.ව.100 අතර කාලයට අයත් පිළිස්සූ මැටි බඳුනක තිස පුත මහ පරුමක යන පාඨය සඳහන් වේ. පරුමක පදවිය සහිත නාම ක්‍රි.පූ. 300 න් පසු ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති අභිලේඛන තුළින් හඳුනාගත හැකි බැවින් ඇතුළුපුර ජනාවාසය තුළ පරුමක ජන කණ්ඩායමේ ඉස්මතු වීමක් ඉන් පෙන්නුම් කරයි. කනිංහැම්ගේ වාර්තා කිරීම් අනුව ගොඩනැගිලි අවධි H වලට හා G වලට අයත් ව මෙම මැටිමුවා අභිලේඛනය වාර්තා වී ඇත (*Ic*.Vol.i(02; Coningham 2006:table 1; Deraniyagala 1992:73). මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව මෙම කාලය අනුරාධපුර විහාරාම ආරම්භ වී විකාශනය වන අවධිය වේ (*මව*. xv:1-30). පුරාවිද්‍යා සාධකවලට අනුව මෙම කාලය තුළ දී අනුරාධපුර පැරණි නගරයේ ලෙන් විහාර හා මහා විහාර මුල් බැස ගැනීම සිදු විය (Bandaranayake 1974:27-52)..

අනුරාධපුර ඇතුළුපුර සංස්කෘතික විකාශනයේ හා භූ දර්ශනයේ මී ළඟ සංස්කෘතික අවධිය වශයෙන් මධ්‍ය

ඓතිහාසික අවධිය වේ. (Middle Historic). මෙම කාලය ක්‍රි.ව. 300-1250 කාලයට අයත් වන බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:715). අනුරාධපුර රාජධානි කාලය අවසන් වී පොළොන්නරු රාජධානි සමය එළඹෙන තෙක් ම මධ්‍ය ඓතිහාසික අවධිය අනුරාධපුරය ඇසුරෙන් ක්‍රියාත්මක වී ඇත (එම). මෙම කාලය තුළ පෙර අපර දෙදිග වෙළඳාම සම්බන්ධ බොහෝ සාධක ඇතුළුපුරයෙන් වාර්තා වී තිබේ (Deraniyagala 1992:714 ; Carsewel and Prickett 1984:57). ASW 2 කැණීමට අනුව ගොඩනැගිලි අවධි F (Structurul period F) ක්‍රි.ව. 300-600 කාලයට අයත් ව මෙම සංස්කෘතික අවධිය හඳුනාගෙන ඇත (කෑබසබටය්ප 1999:129). සිංහ කාසි, ලක්ෂ්මී කාසි, හස්ළුඹු කාසි, ගස හා ස්වස්තික කාසි මෙන් ම රෝම කාසි මෙම කාලය තුළ වාර්තා වී තිබේ (එම). 10 F වර්ගයේ විදේශීය බඳුන් මෙම කාලය තුළ අනුරාධපුරයේ භාවිත වීම නිසා ජාත්‍යන්තර වෙළඳාම ප්‍රචලිත ව තිබූ බව හේම රත්නායක විසින් පෙන්වා දී ඇත (Ratnayake 1984 110). දැරණියගලගේ යුග බෙදීම අනුව තනි අවධියක් තුළට මධ්‍ය ඓතිහාසික අවධිය අයත් වුවද කනිංන්හැම් විසින් එය Early Medival Period වශයෙන් උප අවධියකට බෙදා ගොඩනැගිලි අවධි E,D,C,B වශයෙන් ක්‍රි.ව. 750-1000 අතර කාලයට අයත් කර ඇත (Coningham 1999:129). ඇතුළුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය සම්බන්ධ දැරණියගල හා රොබින් කනිංන්හැම්ගේ අර්ථ නිරූපණයන්ට අනුව සකසා ඇති කාලනිර්ණ තුළින් සංස්කෘතික අවධි විකාශනය පහත සඳහන් ආකාරයට හඳුනාගත හැකි ය.





| සිරාන් දැරණියගලට අනුව ඇතුළුපුර ජනාවාස තුළ සංස්කෘතික අවධි විකාශනය | රොබින් කනිංන්හැම්ට අනුව ඇතුළුපුර ජනාවාස තුළ සංස්කෘතික අවධි විකාශනය |
|---|---|
| Period I – Mesolithoc 3900-1800 BC | Structural period K 840-460 BC |
| Period II- Mesolithic Iron Age transition | Structural period, J 510-340 BC |
| Period III- Early Iron Age 900-600 BC | Structural period , I 360-190 BC |
| Period IV- Basal Early Historic 600-500 BC | |
| Period V Lower Early Historic 500-250 BC | Structural period H, 2 00-130AC |
| Period VI Mid – Early Historic 250BC 100 AC | Structural period G 100-300 AC |
| Period VII Upper Early Historic 100-300 AC | Structural period F 300-600 AC |
| Period VIII Middle Historic 300-1250 AC | Structural period E,D,C,B 750-1000 AC |

(Deraniyagala 1992:709-719; Coningham 1999 : 125-130)

වගු අංක 3.2

විද්‍යාත්මක කාල නිගමන එළඹුම් අනුව ඇතුළුපුරයේ සංස්කෘතික අවධි විකාශනය සම්බන්ධ තොරතුරු අන්තර්ගත වගුව

මේ අනුව අනුරාධපුර ඇතුළුපුර කේන්ද්‍රීය භූ දර්ශනය ගොඩනැංවීමේ දී යම් යම් සම අසමතාවයන් කනිංන්හැම් හා දැරණියගලගේ කාල නිගමන අතර තිබුණ ද සමස්තයක් ලෙස ගත් කළ යම් යම් සමානතා ද දැකගත හැකි බැවින් ඇතුළුපුර

ජනාවාසය ආශ්‍රයෙන් වර්ධනය වූ කේන්ද්‍රීය භූ දර්ශනය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සමයෙන් ආරම්භ වී ප්‍රාථමික යකඩ යුගය, මුල් ඓතිහාසික අවධිය, මධ්‍ය ඓතිහාසික අවධිය ආදී ලෙස විකාශනය වී ඇති ආකාරය භෞතික සංස්කෘතික තොරතුරු හා විද්‍යාත්මක කාල නිගමන එළඹුම තුළින් මෙන් ම මූලාශ්‍රය කරුණුවලින් හෙළිවන බව හඳුනාගත හැකි ය.

### 3.2.3 අනුරාධපුර නාගකරීකරණය

ශ්‍රී ලංකාවේ පුරාණ නාගරීකරණ ක්‍රියාවලිය පිළිබඳ ව අධ්‍යයනය තුළ දී ප්‍රධාන වශයෙන් ම නාගරීකරණයට පත් වූ ස්ථාන කිහිපයක් මේ වන විටත් පුරාවිද්‍යාඥයන් විසින් හඳුනාගෙන තිබේ. ඒ අතුරින් පුරාණ යුගවල දී නාගරීකරණයට පත් වැදගත් ස්ථාන වශයෙන් අනුරාධපුරය, තිස්සමහාරාමය, හා සීගිරිය මන්නාරම හා කන්නරෝදය පෙන්වාදිය හැකි ය. ශ්‍රී ලංකාවේ පුරාණ සමාජය තුළ නාගරික ක්‍රියාවලිය ඇතිවීම සඳහා ප්‍රාග් නාගරික තත්ත්වයන් බලපා ඇති බව පෙනේ. ප්‍රාග් නාගරික තත්ත්වයන්ගේ සමාජ ක්‍රියාවලිය නාගරීකරණය සඳහා ඉහළ දායකත්වයන් ලබා දෙයි. මෙහි දී නාගරික ක්‍රියාවලිය සඳහා සමාජය තුළින් ඉස්මතු වන පෙළපත් ප්‍රධානීන් හෝ ආගම මුල් කර ගත් නායකයන් තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි (Wheatley 1972:601-638).

නාගරීකරණය (Urbanisam) යන්න මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව උරුමයෙන් ලැබෙන්නා වූ විශිෂ්ට භාවයක් ලෙස හඳුනාගත හැකි ය. නමුත් නාගරීකරණ ක්‍රියාවලිය දෙස පුරාවිද්‍යා දෘෂ්ටියකින් බැලීමේ දී එය ප්‍රාග් නූතන අවධියේ සමාජයේ ක්‍රියාත්මක වූ එකිනෙකට වෙනස් සමාජ තුළ ඇතිවන්නා වූ ප්‍රගමනය ඔස්සේ වර්ධනය වන විශේෂ ප්‍රාගුණ්‍යතාවය තුළින් ඇතිවන ආර්ථික කළමනාකරණ ක්‍රියාවලිය බව පෙනේ (Renfrew 1998:1-18). මේ තත්ත්වය කාලය හා අවකාශය මත ගොඩනැගෙන්නා වූ තත්ත්වයක් වන අතර එය ලොව කිසි රටක රේඛීය ලෙස වර්ධනය වන බව නොපෙනේ. විශේෂයෙන් ම ප්‍රාග් නාගරික තත්ත්වයන්ගේ සිට නාගරික තත්ත්ව ඇතිවීම සඳහා සම්භාව්‍ය





යුගය තුළ මෙම කාර්යයන් කැපීපෙනන අතර මිනිසා සහ පරිසරය අතර ගොඩනැගෙන්නා වූ සුවිශේෂත්වය එයට බලපා ඇත.

නාගරික ක්‍රියාවලිය අධ්‍යයනයේ දී මිනිස් සමාජය හා පරිසරය එකිනෙකට වෙනත් දේ ලෙස තේරුම් ගනු ලබන්නේ නම් එහි එ තරම් තේරුමක් නොමැත. සම්පත් පරිහරණය විශේෂයෙන් ම ඛනිජ ද්‍රව්‍ය භාවිතය, සමාජ පසුබිම් හා සම්බන්ධ නොකරන්නේ නම් එහි තේරුමක් හෝ වැදගත්කමක් නොමැත (සෙනෙවිරත්න 1996:10). මෙය වඩාත් සත්‍ය වන්නේ අප කිසියම් සමාජයක හැඩගැසීම් යුගයේ කෙරෙන සම්පත් පරිහරණය ගැන කතා කරන විට ය. බොහෝ විට මෙ බඳු සමාජයන්ට සම්පත් වෙත ළඟා වීමට, ඒවා සොයා ගැනීමට, ඒවා අත්පත් කර නිෂ්කරණය කර ගැනීමට හා රැගෙන යාම කළ යුතුවූයේ කළින් තිබුණු දැනුමක් හෝ යටිතල පහසුකම්වල සහායක් නොමැති ව ය (එම). නාගරීකරණයට ප්‍රවිෂ්ට වීමට ප්‍රථම මුල් කාලීන සමාජයන් හා ඒවායේ ප්‍රකෘති ස්වභාවික පරිසරය අතර වූ අන්‍යෝන්‍ය පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වූ සහජීවන සම්බන්ධතාවය, මාධ්‍යයන් ගණනාවක් තුළින් කළ එළි බස්වන ලදි. එ නම් තාක්ෂණ ශිල්පය යැපුම් රටාව, සම්පත් පරිහරණය හා පදිංචි වීමේ මෝස්තරය තුළිනි (එම). මෙහි ප්‍රතිඵලය වශයෙන් ද්‍රව්‍යමය අන්තර් ක්‍රියාකාරිත්ව ක්‍රියාදාමය වූ මානසික ප්‍රතිචාරය මුදුන් පැමිණෙන්නේ පුළුල් වශයෙන් සමාජමය, ආර්ථික, දේශපාලනමය හා ආගමික යනුවෙන් හැඳින්විය හැකි ආයතන හැඩ ගැසීමෙනි (සෙනෙවිරත්න 1996:11;Renfrew 1986:1-8). ඒ අනුව ඉතිහාසයේ කිසියම් නියමිත කාලයක හෝ ස්ථානයක පැවති සමාජ සංස්කෘතික පරිසරය මෙම ජවනිකාව මඟින් ඉහළ තලයකට ඔසවනු ලබන්නේ නාගරික ක්‍රියාවලිය තුළිනි. විශේෂයෙන් ම හැඩ ගැසීම්වල එක සමාන නොවන සංවර්ධන මෙහි දී සැලකිල්ලට ගත යුතු අතර සරල සමාජයේ සිට සංකීර්ණ සමාජයක් කරා වු ගුණාත්මක වූත් ප්‍රමාණාත්මක වූත් පරිවර්තනයන් තුළින් ආයතන හැඩගැසීම් කරා වූ ගමන අවසානයෙහි දී දීර්ඝ කාලීන ඓතිහාසික උරුමයෙන් ලැබෙන්නා වූ විශිෂ්ට භාවයන් ලෙස නාගරික ක්‍රියාවලිය බිහිවීමට බලපානු ලැබේ.

ප්‍රාග් නාගරික ක්‍රියාවලිය තුළ දී හැඩගැසෙමින් ඇති සමාජ ඒ හා සම්බන්ධ තාක්ෂණ ශිල්පමය ක්‍රියාදාමවල ගම්‍යතාවය බොහෝ වශයෙන් රඳා පවත්වා ගනු ලැබුවේ ප්‍රායෝගික අන්දමින් ඛනිජ සම්පත් හා අනෙකුත් බහුවිධ සම්පත් උපයෝගී කර ගැනීමට මඟ පෑදූ යම් කිසි පූර්ව කොන්දේසි මත ය (සෙනෙවිරත්න 1996:11). සුඛෝපභෝගී හෝ අපයෝජ්‍ය හා පුද පූජා සඳහා වෙන් වූ භාණ්ඩයක නිෂ්පාදනය සහ අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම ඉල්ලුමෙන් ඇති වූ වෙනස්කම් අනුව තීරණය විය. මේ වෙනස්කම් සාධක ගණනාවක් මත රඳා පවතී (එම). ඒ සාධක අතර භාණ්ඩයක් කාර්ය බද්ධ වටිනාකම, එම සමාජයේ ද්‍රව්‍යයමය මට්ටමේ සංවර්ධනය - තීරණාත්මක සම්පත් ඍජු ව හෝ වක්‍ර ව ලබාගැනීමේ හැකියාව, සම්පත් නිෂ්කරණය හා නිෂ්පාදනය සඳහා යෝග්‍ය තාක්ෂණ ක්‍රමයක් තිබීම, අමුද්‍රව්‍යය හා නිමි භාණ්ඩ ප්‍රවාහනයට පහසු කරන හුවමාරු යාන්ත්‍රණයක් හා මාර්ග ජාලයක් තිබීම, නාගරික සමාජයක් දක්වා පරිවර්තනය විමට මූලික වශයෙන් ඉවහල් වේ (එම).

ඉහතින් විස්තර කරන ලද තත්ත්වයන් ඔස්සේ නාගරීකරණය ක්‍රියාවලිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ලොව විවිධ රටවල පුරාවිද්‍යාඥයින් පෙළඹෙනු ලබන්නේ විසි වැනි සියවස තුළ දී බව පෙනේ. විශේෂයෙන් ම බොහෝ උගතුන් පෙන්වා දී ඇති කාරණයක් වන්නේ ප්‍රාග් ජනාවාස පද්ධතියන් තුළ ඇති වන්නා වූ ක්‍රියාවලීන් එහි සාමූහික තත්ත්වයන් මත නාගරීකරණයට පත්වන බව ය (Kenyon 1956 :184-186). ගෝඩන් චයිල්ඩ් (Gordon Childe) පෙන්වා දී ඇති ආකාරයට ලොව නාගරීකරණ ක්‍රියාවලිය බිහි වන්නේ ක්‍රි.පු. 6000 - 3000 අතර කාලයේ දී ය(ඍසසකාැ 1950:105). මෙම සමයේ දී මිනිසා ලෝහ භාවිතය ඇරඹීම, රෝදය භාවිතය, ජීවිතයට අවශ්‍ය විවිධ උපකරණ නිර්මාණය, ඊජිප්තුවේ, චීනයේ, මෙසොපොතේමියාවේ මෙන් ම ඉන්දු නිම්නයේ ආරම්භ කිරීම ඔස්සේ එම ස්ථානවල නාගරික ක්‍රියාවලිය ඇරඹෙන බව පෙන්වා දී ඇත (එම:105-139). නාගරික ක්‍රියාවලියක් ඕනෑම සමාජයක ඇරඹීම සඳහා ප්‍රධාන වශයෙන් ම කරුණු 10 ක් බලපාන බව චයිල්ඩ් පෙන්වා දී තිබේ. ඒවා අතර,





i. ජන රේඛනයේ ප්‍රසාරණය
ii. මූල ධනය මධ්‍යගත වීම
iii. ස්මාරක හා සෙසු ගොඩනැගිලි බිහිවීම
iv. දුරකතර වෙළඳාම
v. ලේඛනය ඇරඹීම හා අක්ෂර භාවිතය
vi. විද්‍යාවන් බිහිවීම
vii. පන්ති සමාජයක් බිහිවීම
viii. විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් සහිත ශිල්ප ශ්‍රේණි බිහිවීම
ix. රාජ්‍ය පිළිබඳ ආකල්ප ඇතිවීම
x. සෞන්දර්යාත්මක හා කලා රසිකත්වය ඇතිවීම යන කාරණා ප්‍රධාන වී තිබේ (එම:142-178).

චයිල්ඩ්ගේ ජනප්‍රිය නාගරීකරණ මතවාදය සඳහා ඉදිරිපත් කරණු ලැබූ නිර්ණායකයන්ට (Criteria) විරුද්ධ මතවාද ද ඉදිරිපත් වී තිබේ (Clark 1979:438). සමහර උගතුන්ගේ මතය වන්නේ නාගරීකරණ ක්‍රියාවලිය මිනිසා හා ස්වභාවික පරිසරය අතර වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව ය (Butzer 1994). ඒ අනුව මානවයා විසින් පරිසරය තුළ පවතින්නා වූ භෞතික සම්පත් උපයෝගී කර ගැනීමේ රටාවේ වර්ධනය සමඟ ප්‍රාග් සමාජ ක්‍රමානුකූල ව දියුණු සමාජ දක්වා වූ ක්‍රියාවලියකට පරිවර්තනය වී ඇත. එහි දී තාක්ෂණ ශිල්පය යැපුම් රටාව, සම්පත් පරිහරණය මෙන්ම පදිංචි වීමේ මෝස්තරය වැදගත් වී තිබේ (සෙනෙවිරත්න 1996:10-11).

මෙම මූලික කාරණා මානවයා විසින් ආරම්භ කිරීම සමඟ එහි ඊළඟ අදියර තළ නාගරික ක්‍රියාවලියට අවශ්‍ය දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික යන ආයතන හැඩගැසෙන බව පෙනේ (සෙනෙවිරත්න 1996:11 ; Butzer 1994 ; Steward 1995). 1960 න් පසු ගෝඩන් චයිල්ඩ්ගේ නාගරීකරණය සම්බන්ධ ක්‍රියාවලිය විවේචනයට බඳුන් වුව ද ඔහු ඉදිරිපත් කර ඇති නිර්නායකයන් ඊජිප්තුව, මෙසොපොතේමියාව හා

ඉන්දු නිම්නය ආශ්‍රයෙන් වූ නාගරික ක්‍රියාවලිය සඳහා වූ යම් තරමක් දුරට වැදගත් වේ (Childe 1950:105-178). චයිල්ඩ්ට පසු ව නාගරීකරණ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබූ උගතුන් පෙන්වා දී ඇත්තේ එකිනෙකට වෙනස් භූ කලාප තුළ විවිධ සමාජ විසින් ඒ ඒ කාලවල බල පවත්වනු ලැබූ බහුවිධ කාරණා පදනම් කර ගනිමින් කාලය හා අවකාශය තුළ නාගරීකරණයට පත් වී ඇති බව ය (Wheatly 1972:601-638).

ශ්‍රී ලංකාවේ නාගරීකරණය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී එයට පූර්වයෙන් දකුණු ආසියානු නාගරීකරණ තත්ත්වයන් විමසා බැලීම ද වැදගත් වේ. දකුණු ආසියානු කලාපය ගත් කළ එහි සිදු වූ මුල් ම නාගරික ක්‍රියාවලිය ඉන්දු නිම්නය ආශ්‍රිත ව සිදු වී ඇත (Agrawal 1984 ; Possehl 1999). ඉන්දු නිම්නය සම්බන්ධ ව මෙතෙක් සිදු කළ පර්යේෂණවල දී එහි නාගරීකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතීන් මූලික පදනම සකස් කර ඇති බව හඳුනාගෙන තිබේ (Piggott 1950:72). ඉන්දු නිම්නයට වයඹ දෙසින් පිහිටන්නා වූ බලුකිස්ථාන් සානුව තුළ ස්ථානගත ව ඇති **ක්වේට්ටා, අම්රි, නාල්, කුල්ලි, ශෝබ් කිලේගුල් මොහොමඩ්** යන ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතීන් තුළ ඇතිවන්නා වූ ක්‍රියාකාරිත්වය ඉන්දු නිම්න නාගරික ශිෂ්ටාචාරය බිහිවීමට පදනම සකසා ඇත (එම). ඇෆ්ගනිස්ථානයේ මුන්ඩික් ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ කැණීම්වල දී ජනාවාස ස්තර 10 ක් හඳුනාගෙන ඇති අතර එහි හය වැනි ස්තරයේ කාල නිර්ණය ක්‍රි.පූ. 2625- 3000 ලෙස ලැබී තිබේ (Fairservis 1956:360). එසේ ම ක්වෙට්ටා ප්‍රදේශයේ කිලේගුල් මොහොමඩ් (Kilegul Mohomad) ස්ථානයේ නවශිලා යුගයේ සිට සංචාරක එඬේරුන් ජීවත් වූ බව හඳුනාගෙන ඇත. සත්ත්ව ගෘහකරණය හා දැකැති පාවිච්චි කළ මිනිසුන් ජීවත් වූ බවට සාධක එහි හමුවන අතර ඉන්පසු ක්‍රමානුකල ව දියුණුවට පත් වූ සංස්කෘතිය තුළ පැසක වේළන ලද මැටි මෙවලම්වල සිට පුළුස්සනු ලැබූ වළං දක්වා පරිවර්තනය හඳුනාගෙන ඇත (එම). මෙයට අමතර ව උතුරු බලුකිස්ථාන් රානාඝුන්ඩායී (Ranagundai) ස්ථානය ආශ්‍රිත ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ පර්යේෂණවලින් සෝබ් නිම්න ශිෂ්ටාචාරයට





අයත් ලෝහ භාවිතය හා අර්ධ සංචාරක ජන කණ්ඩායම් කලින් කලට එහි පදිංචි වී සිටි බවට සාධක හඳුනාගෙන ඇත (Piggott 1950:119-131 ; Faioservis.op cit). එසේ ම මෙම සංස්කෘතික අවධිය තුළින් මොල්ලිය සහිත ගවයා (Bos indicas), බැටලුවා (Ovis Vignei), බූරුවා (Equus Asinus), අශ්වයා (Equas aballus) ආදී ගෘහකරණය කරන ලද සතුන් පිළිබඳ ව සාධක හමු වී තිබේ. ඒ අනුව හරප්පා නගර ප්‍රභවයට බොහෝ කලකට පෙර අශ්වයා භාවිතයට ගෙන තිබුණ බවට ද සාධක එහි දී හමුවීම අතිශයින් ම වැදගත් ය (එම). මෙම ශිෂ්ටාචාර ආශ්‍රිත ව දියුණු වූ මැටි මෙවලම් කර්මාන්තය හා මූර්ති නිර්මාණය පිළිබඳ ව සාධක හමු වේ (Piggott 1961:128).

අම්රි ශිෂ්ටාචාරය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ පර්යේෂණවලින් ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතියක් එහි පැවතුණ බව හඳුනාගෙන ඇත. එසේ ම මුහුදු ආශ්‍රිත බෙල්ලන් විශාල ප්‍රමාණයක් මෙම ස්ථානයේ හමුවන බැවින් ප්‍රාග් හරප්පානු යුගයේ දී මෙම ස්ථානය මෝයකට ආසන්න වූ ස්ථානයක් වශයෙන් හඳුනාගෙන තිබේ. අම්රි ශිෂ්ටාචාරය පිළිබඳ ව අදහස් දක්වා ඇති මජුම්දාර් ප්‍රාකාශ කර ඇත්තේ අම්රිය හරප්පාවට වඩා නිසැක ව ම පැරණි ස්ථානයක් වශයෙනි (Majumdar :1934). සමස්තයක් ලෙස අම්රි, නාල්, කුල්ලි, ශෝබ්, කිලේගුල් මොහොමඩ් ආදී ග්‍රාමීය සංස්කෘතීන් ක්‍රමානුකූල ව පරිණාමය වී එහි නාගරික අවස්ථාව වූ හරප්පානු නාගරීකරණය සම්බන්ධ වී ඇති ආකාරය එහි මැටි බඳුන් හා මූර්ති පිළිබඳ ව අධ්‍යයනයන්ට අනුව පැහැදිලි වේ. මෙම තත්ත්වය නිසා හරප්පා ශිෂ්ටාචාරය මුල දී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය වශයෙන් ද පසු ව සින්දු නිම්න ශිෂ්ටාචාරය වශයෙන් විද්වත්හු හැඳින්වූහ (Majumdar 1964:20). නමුත් මෙම මතයට අභියෝග කළ හෙයින්ස්මොඩ් (Heinezmod) වැනි උගතුන් මෙම ශිෂ්ටාචාරය ඉන්දු නිම්නයට පමණක් නොව ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයට ව්‍යාප්ත වන බැවින් එය ආදිත ම ඉන්දීය සභ්‍යත්වය වශයෙන් නම් කරන ලදි (Heinezmod 1961:01). පසු කාලීන උගතුන් විසින් මෙම ශිෂ්ටාචාරය මුලින් ම හරප්පාවෙන් සොයා ගත් නිසා හරප්පා සභ්‍යත්වය වශයෙන් නම් කරනු ලැබී ය. හරප්පා ශිෂ්ටාචාරය සම්බන්ධ පර්යේෂණ කළ අය අතර ජෝන් මාෂල්

ප්‍රමුඛයකු වේ. ඔහු විසින් ***Mohenjodaro and Indus Civilization*** නම් මාහැඟි කෘතියක් රචනා කර ඇත (Marshall:1931). මීට අමතර ව දයාරාම්ෂානි, මජුම්දාර්, වීලර් ආදී උගතුන් විසින් ද පර්යේෂණ සිදු කර එහි නාගකරීකරණ ක්‍රියාවලියේ පදනම පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. ෆෙයාර් සර්විස් ඉන්දු නිම්නයේ සින්දු ගඟබඩ ආරම්භ වූ ශිෂ්ටාචාරය ආගම හා වෙළඳාම ප්‍රමුඛ කොට වෙළඳ මධ්‍යස්ථාන බවට පත් වූ නාගරික ස්ථානයක් බව පෙන්වා දී ඇත (Fairserivis 1956:153-156). නමුත් ජෝන් මාර්ෂල් පෙන්වා දී ඇති පරිදි සින්දු නිම්න නාගරීකරණය සඳහා තඹ මෙවලම් සමඟ ශිලා මෙවලම් භාවිතය, කුඹල් සක භාවිතය සුළු කර්මාන්ත හා කලා නිර්මාණ, රූපාක්ෂර, රෝද සහිත වාහන භාවිතය සින්දු නිම්නයේ නාගකරීකරණයට බලපා ඇත (Maßhall 1931). එසේ ම මිසරය හා මෙසෙපොතේමියාව ආදී ශිෂ්ටාචාර අතර යම් යම් සබඳතා ද එහි නාගරීකරණයට බලපා තිබේ (Dikshit 1909:696). මේ අකාරයට ක්‍රි.පූ. 2500 තරම් ඈත කාලයක දී හරප්පා නාගරික ශිෂ්ටාචාරය ආරම්භ ව (Ghosh 1964:121) ක්‍රි.පූ. 1750 දී පමණ එය විනාශ වූ බව කාබන් කාල නිර්ණ මඟින් හඳුනාගෙන තිබේ (එම).

ඉන්දීය අර්ධද්වීපය තුළ සිදු වූ මුල් ම නාගරීකරණ ක්‍රියාවලියට පසු ව එහි දෙ වැනි නාගරික ක්‍රියාවලිය ගංගා නිම්නය ආශ්‍රිත ව කළ එළි බසිනු දැකගත හැකි ය (Coningham 1995:54-72 ; Allchin 1995:26-40 ; Erdosy 1994:123-151). ගංගා නිම්නයේ ඇතිවන්නා වූ දෙ වැනි නාගරික අවස්ථාවට පදනම දමා තිබෙනුයේ ද හරප්පා ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් ඇති වූ සංග්‍රාමීය සංස්කෘතීන් බව පෙනේ. මෙම ග්‍රාමීය සංස්කෘතින්ගෙන් ද තඹ අයුධ භාවිත කළ සංස්කෘතීන් ගංගා නිම්න නාගරීකරණයට මුල් වී ඇති බව එම ප්‍රදේශවලින් සොයා ගත් සාක්ෂි අනුව තහවුරු වේ (Lal 1951:32-35). ගංගා නිම්නයෙන් හමු වී ඇති සමහර තඹ ආයුධ බටහිර ආසියාතික ආයුධ හා මෙවලම් සමඟ සමානතා ඇති බව ප්‍රිගොට් ප්‍රකාශ කර ඇත (Piggott 1944:173-182). නමුත් ගංගා නිම්න තඹ ආයුධ හා බටහිර ආයුධ අතර නිෂ්පාදනය, අමුද්‍රව්‍ය, හා තාක්ෂණය අතින් වෙනස්කම් රාශියක් පවතින බව බී.බී.ලාල් පෙන්වා දී තිබේ (Lal 1951:32-35).





මේ පිළිබඳ ව වැඩි දුරටත් අදහස් දක්වන ලාල් විසින් රාජ්පූර් පර්සු (ඍ්වඡමර ඡ්රිම) ස්ථානයේ සිදු කළ කැණීම්වල දී තඹ භාජන සමඟ පඬුවන් පැහැ මැටි බඳුන් (ocher – Coloured Ware) හමුවන බැවින් මෙම භෞතික සංස්කෘතික තොරතුරු අතර සමානතාවයක් ඇති බව පෙන්වා දෙයි (Lal 1954-55:10-11). එසේ ම මෙම භාජන කැබලි හස්ථිනාපුරයේ කැණීම්වලින් ද සොයා ගෙන ඇත (එම). පඬුවන් පැහැ මෙවලම් සංස්කෘතිය ක්‍රි.පූ. 1200 පෙර පැවතුණ ග්‍රාමීය සංස්කෘතියක් බව බී.බී. ලාල් පෙන්වා දී ඇත (එම). ඔහු වැඩිදුරටත් දක්වා ඇති අදහස් අනුව පඬුවන් පැහැ මැටි මෙවලම් සංස්කෘතියට පසු ව ගංගා නිම්නයේ විචිත්‍ර ආශුක්ල (අළු පැහැ බඳුන්) (Painted Gray Ware) මැටි භාජන සංස්කෘතිය ක්‍රියාත්මක ව තිබේ. නොමඳ ව පුළුස්සා ඇති මෙම බඳුන් තුළ රේඛීය රටා හා තිත් රටා දැකගත හැකි ය (Lal 1951:39 ; Lal 1954-55:11). හස්තිනාපුරයේ විචිත්‍ර ආශුක්ල මෙවලම් (RLW) භාවිත සංස්කෘතිය ක්‍රි.පූ. 1100 දී ප්‍රභවය වූ බව කාබන් කාලනිර්ණ මඟින් තහවුරු කර ඇත (එම). මෙම බඳුන් වර්ගයේ ඉහළ කාල පරාසය එසේ වුව ද පහළ සීමාව ක්‍රි.පූ. 500-450 අතර කාලයට අයත් බව පිළිගනු ලැබේ (එම:1954:225-23;51-52).

හස්තිනාපුරයේ මෙම මැටි භාජන සංස්කෘතිය ක්‍රි.පූ. 800 දී අවසන් වන බව ලාල් පෙන්වාදෙන අතර ඒ සඳහා ජල ගැලීම් බලපා ඇති බව ප්‍රකාශ කර තිබේ (එම:1964:20). මින් පසු අහිච්ඡත්‍ර, පනීපත්, ඉන්දුපත්, තිල්පත්, සෝන්පත්, භාගපත් යන ස්ථානවලින් විචිත්‍ර ආශුක්ල මැටි බඳුන් (Painted gray Ware) හා උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (Northern Black Polish ware) හඳුනාගනු ලැබූ අතර එයින් NBPW මැටි මෙවලම්, PGW මැටි මෙවලම්වලට පසු අවධියකට එ නම් ක්‍රි.පූ.300-200 කාලයට අයත් ලෙස කාලනිර්ණය වී ඇත (Goosh 1946:55-56). හස්තිනාපුරයෙන් ද මෙම භාජන පිළිබඳ ව සාධක හමු වූ බැවින් එ මඟින් පැහැදිලි වූයේ PGW සංස්කෘතියට පසු කාලයට NBPW අයත් බවයි (Banerjee 1965 :240). PGW සංස්කෘතිය සමඟ ලැබෙන්නා වූ තවත් වැදගත් සාධකයක් වන්නේ අශ්වයා පිළිබඳ සාධක හමු වීමයි. හස්ථිනාපුරයෙන් අශ්ව අස්ථිප (Equus Cabullus) වාර්තා

වී තිබේ (Lal 1954-55:109). විචිත්‍ර ආශුක්ල මැටි මෙවලම් සමඟ යකඩ භාවිතය පිළිබඳ සාධක අත්රන්ජි බේරාවෙන් ක්‍රි.පූ. 1025 අයත් ස්තරවලින් ද (Lal 1964:19) උජ්ජෙයින්හි ක්‍රි.පූ. 750-500 අතර ස්තරවලින් යකඩ හා ලෝහ උණු කළ උඳුන් සොයා ගෙන තිබේ (Banerjee 1965:240). කෞසම්බියෙන් ද අලගම්ගීර්පුරයෙන් ද හස්තිනාපුරයෙන් ද විචිත්‍ර ආශුක්ල මැටි මෙවලම් භාවිතය හා යකඩ අතර සම්බන්ධයක් ඇති බව ඉන් පැහැදිලි වී තිබේ (Banerjee 1965:5-6 ; Lal 1954-55:97).

මේ අනුව ක්‍රි.පූ. 1100 සිට ක්‍රි.පූ. 500 දක්වා කාලය තුළ ගංගා නිම්නය ආශ්‍රිත ව තඹ හා යකඩ මෙන් ම OCP (Ocher Coloured Ware), PGW (Painted Gray Ware), N.B.P.W.(Northern Black Polish Ware) මැටි මෙවලම් ආශ්‍රිත ප්‍රාග් ග්‍රාමීය සංස්කෘතීන් තුළින් දෙ වැනි නාගරීකරණ අවධිය මුල් බැසගෙන තිබුණ බව පැහැදිලි වී ඇත. එසේ ම මෙම කාලයට වන විට ක්‍රි.පූ. 600-500 ශ්‍රී ලංකාවේ අනුරාධපුර හා තිස්සමහාරාමය ද නාගරීකරණය වීම හඳුනාගෙන ඇත (Erdosy 1995:123-154 ; Deraniyagala 1992:711 ත Somadeva 2006:100-106). දකුණු ආසියාවේ දෙ වැනි නාගරික අවධිය තුළ හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ වශයෙන් යකඩ තාක්ෂණය, දුර කතර වෙළඳාම, දියුණු සන්නිවේදන ක්‍රම ආදිය භාවිතය පෙන්වාදිය හැකි ය (Erdosy 1995:123-751 ; Chakrabarti 1973:72-73). අනුරාධපුර නගරයේ ආරම්භය පිළිබඳ සඳහන් කරන මහාවංසය එය ග්‍රාමීය මට්ටමේ සිට දියුණු වූ ආකාරය විස්තර කර තිබේ. විශේෂයෙන් ක්‍රි.පූ. පස් වැනි සියවස පමණ දී අනුරාධග්‍රාම නමින් හැඳින් වූ ග්‍රාමය ක්‍රි.පූ. හතර වැනි සියවස පමණ විට අනුරාධපුරය බවට පත් වී ඇත (Mv. x:75-76). මහාවංසයේ ලේඛනගත කොට ඇති විස්තරවලට අනුව අනුරාධපුර නගරය බවට පත් කරනු ලබන්නේ පණ්ඩුකාභය රජු විසිනි (එම :81-104). අනුරාධපුරයේ නාගරිකරණ සැලසුම් කටයුතු ශ්‍රී ලංකාවේ පුරාණ සාම්ප්‍රදායික නගරයක සැලසුම් පිළිබඳ ව මනඃකල්පිත චිත්‍රයක් අප වෙත ලබා දෙයි (බලන්න 3.1 පරිච්ඡේදය)

අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය දෙස බැලීමේ දී විශේෂයෙන් ම එය ප්‍රාග් ඓතිහාසික අනුරාධපුර ග්‍රාමීය





තත්ත්වයන්ගේ සිට හැඩ ගැසී වර්ධනය වූ බව පුරාවිද්‍යා සාධක අනුව හඳුනාගත හැකි ය. මෙහිදී අප අවධානය යොමු කළ යුතු වන්නේ අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රාග් නාගරික ග්‍රාමීය තත්ත්වයන්හි වර්ධනය කෙරෙහි ය. යාන් ඔය හා කලා ඔය ආශ්‍රිත ව බිහි වන්නා වූ පූර්ව ඓතිහාසික ග්‍රාමීය සංස්කෘතීන්ගේ වර්ධනය විශේෂයෙන් ම අනුරාධපුර නාගරීකරණය සඳහා ඍජු ව බලපා ඇත. පූර්ව ඓතිහාසික සමයේ දී එහි සංස්කෘතික කලාපත්, භෞමික කලාපයන් අතර සමපාතය ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙනුයේ ක්ෂුද්‍ර-ජීවි පරිසර කලාප සමග ය (සෙනෙවිරත්න 1996:12).

මෙම යුගයේ දී කලා ඔය, යාන් ඔය හා මල්වතු ඔය ආශ්‍රිත ව පිහිටුවා ගනු ලබන ප්‍රාග් නාගරික ජනාවාස එම භෞමික කලාපවල ස්ථාන ගත වන්නේ අදාළ ප්‍රදේශ ආශ්‍රිත පවතින්නා වූ තීරණාත්මක සම්පත් කරණ කොට ගෙන බව පෙනේ. පූර්ව ඓතිහාසික යුගයේ වාසභූමිවල ජීවි පරිසර පදනම ගැන ප්‍රශ්න කරන විට පැහැදිලි වන්නේ ඒ ඒ භෞමික ක්ෂේත්‍රවල දැකගත හැකි සුවිශේෂ සම්පත්වල පිහිටීමයි. යාන් ඔය මධ්‍ය නිම්නයේ ස්ථානගත ව ඇති කොක්එබෑ, ගුරුගල්හින්න, වඩිගවැව, තම්මැන්නා ගොඩැල්ල, දිවුල් වැව, රඹෑව ආදී පූර්ව ඓතිහාසික ස්ථාන (Seneviratne 1984:248-254) පිහිටුවා ඇත්තේ වියළි කලාපයේ කෘෂි කාර්මික පරිසරයට අයත් වැව් රටේ මධ්‍යයේ නොවන බව පෙනේ (Seneviratne 1984:274 ; Coningham 1994:*fig* 120) (බලන්න සිතියම් අංක 7.1). එසේ ම මේ ප්‍රදේශය සළකන කල ප්‍රධාන වශයෙන් ම මැග්නටයිට් යපස් නිධිගත වී ඇති සම්පත් ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි ය (Herath 1975:28). සේරුනුවර පිහිටන ස්වභාවික ලෝහ පස් මෙම ප්‍රාථමික ග්‍රාමීය සංස්කෘතීන් යථෝක්ත ප්‍රදේශවල ස්ථානගතවීමට බලපා ඇත (Seneviratne 1995:118). එයට අමතර ව කැබිතිගොල්ලෑව ආශ්‍රිත ප්‍රදේශයේ මයිකා නිධිගත වී තිබීම ද සැළකිය යුතු ය (Cooray 1984:*fig* 11-13). ඉහළ කලා ඔය පද්ධතිය ගත් කළ ඒ ආශ්‍රිත ව ජනාවාස පිහිටුවා ගැනීම පහත් කඳුකර ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි ය (සෙනෙවිරත්න 1996:12-15). මෙම ප්‍රදේශ

ආශ්‍රයෙන් ජනාවාස පිහිටුවා ගනු ලබන පූර්ව ඓතිහාසික ජනතාව එහි ස්ථානගතවීමේ දී ඉහළ කඳුකර කලාපයේ ඇති සම්පත්වල උපයෝගීතාවය කෙරෙහි සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ. භූ විද්‍යා පර්යේෂණ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ සිට ඉහළ කලා ඔය තෙක් දකුණේ සිට උතුර බලා දිවෙන උස්භූමි වැටිය තුළ රඹස්, තිරුවානා, ෆෙල්ඩ්ස්ෆාර්, මාබල්, නයිස්, මිනිරන් පිහිටා ඇත (Cooray 1984:81-89).

ඛනිජ සම්පත් පිහිටා තිබෙන මෙම ප්‍රදේශය හා ඉහළ කලා ඔය නිම්නයේ දඹුල්ල ආශ්‍රිත ප්‍රදේශය නිරන්තරයෙන් ම ජලය ගලන ඇළ දොළවල ජල ප්‍රවාහනය රටා නිර්මාණය වූ ප්‍රදේශ විය (සෙනෙවිරත්න1996:14). අවානක් මෙන් පැතිරෙන කඳුකරය තුළ වන නිම්න ආශ්‍රිත සරු පස පූර්ව ඓතිහාසික සමයේ දී එ නම් ක්‍රි.පූ. 7-4 කාලයේ දී ජනයා පදිංචි වී මේ රටාවන් නිර්ණය කරන ප්‍රධාන සාධකයක් විය (එම). දඹුල්ල හා අවට ප්‍රදේශයට මුල් අයස් සමයේ තාක්ෂණ සංස්කෘතික පිරිස් ඇතුළුවීම ඉබ්බන්කටුව, ආනෙකටාව, කන්දලම, රොටවැව, ගලේවෙල ප්‍රදේශ ආශ්‍රයෙන් දැකගත හැකි පූර්ව ඓතිහාසික කුටීර වළලෑම්වලින් තහවුරු වේ (සෙනෙවිරත්න 1996:15 ; Bandaranayake 2000:08-09). මේ ආකාරයට ඉහළ කලා ඔය පද්ධතිය, මධ්‍ය යාන් ඔය, මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශ ඇසුරෙන් දැකගත හැකි පූර්ව ඓතිහාසික ග්‍රාමීය ජනාවාස ක්‍රමානුකූල ව අන්තර සම්පත් පරිහරණ ක්‍රියාවලිය ඔස්සේ හුවමාරුව ඇරඹීම සමඟ අනුරාධපුර ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය ලෙස ඉස්මතු වීම සිදු වේ.

මෙහිදී බහු සම්පත් යැපුම් රටාව ප්‍රධාන වන අතර අර්ථ - ස්ථාවර ජන කණ්ඩායම් මඟින් පර්යන්ත ප්‍රදේශවලින් ලබා දෙනු ලැබූ පදනම අනුරාධපුරය නගරයක් ලෙස ඉස්මතු වන්නට බලපෑ බව උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන් ම කේන්ද්‍රීය ලෙස අනුරාධපුරය වර්ධනය වීමේ දී පර්යන්ත ප්‍රදේශවල සිදු වූ සම්පත් අත්පත් කර ගැනීම, නිෂ්කරණය හා නිෂ්පාදන ක්‍රියාවලිය ඔස්සේ භාණ්ඩ හුවමාරුව සිදු වෙමින් ඒවා බෙදා හැරීමේ දී තීරණාත්මක ලෙස අනුරාධපුරය වැදගත් වී තිබේ. අනුරාධපුරය ප්‍රධාන බෙදා හැරීම් මධ්‍යස්ථානය බවට පූර්ව ඓතිහාසික අවධියේ පත් ව තිබූ





බව සේරුනුවර මුල්කර ගත් තඹ සම්පත් පරිහරණය ක්‍රියාවලිය තුළින් හා ඉන්ද්‍රගෝප පබළු බෙදා හැරීම ක්‍රියාවලිය තුළින් පැහැදිලි වී තිබේ. (ෆැර්බසහ්ට්ක් 1972 :145).

AG 69 3 *A* ස්තරයෙන් හමුවන (5*b*) වර්ගයේ කානීලියන් පබළු හා පබළු නිෂ්පාදන කාර්මික ශේෂ සොයා ගැනීමෙන් තහවුරු වන්නේ අනුරාධපුරයේ නිෂ්පාදනය කරනු ලැබූ කානීලියන් පබළු ඉබ්බන්කටුව දක්වා පරිවහනය වී ඇති බව ය (සෙනෙවිරත්න 1996:18 ; Deraniyagala 1972 :134-136). එසේ ම මධ්‍ය කඳුකරයේ සම්භවය ලබන ඇමතෙස්ත, තිරුවාණා ආදී පාෂාණ හා ඒවායින් නිර්මාණය කරන ලද පබළු වර්ග ද ඇතුළුපුරයේ පූර්ව ඓතිහාසික ජනාවාස ස්තරවලින් හමු වී තිබීමෙන් පැහැදිලි වන්නේ ඉතා සුවිශේෂී ලෙස භාණ්ඩ හුවමාරු ක්‍රියාවලිය අනුරාධපුරය කේන්ද්‍රගත කොට සිදු වී ඇති බව ය (Deraniyagala 1972:134-135). අනුරාධපුර හා පර්යන්ත ප්‍රදේශ අතර සිදු වන්නා වූ මෙම අන්තර් හුවමාරුව පදනම් මුල් ඓතිහාසික අවධිය මැද භාගයේ දී එ නම් ක්‍රි.පූ. 600-500 කාලයේ දී) අනුරාධපුරය නගරයක් දක්වා සංවර්ධනයට මඟ පාදා ඇති බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:711. දැරණියගලගේ විග්‍රහයන්ට අනුව මෙම කාලය  තුළ ඇතුළුපුර ජනාවාසය හෙක්ටයාර 50 ක වපසරියකින් යුක්ත වී තිබේ (එම). මෙම සමය වන විට බහු සම්පත් යැපුම් රටාව, ජන රේඛනයේ ප්‍රසාරණය හා අක්ෂර භාවිතය ඇතුළුපුරය තුළින් හඳුනාගෙන තිබේ (Coningham 1999-127 ; Coningham *et.al* 1996:79).

ඇතුළුපුර ජනාවාසාය ක්‍රමානුකූල ලෙස නගරයක් දක්වා වර්ධනය වීමේ දී එහි හමු වී ඇති පිඟන් භාණ්ඩවල වෙනස්කම් ද මනා සාක්ෂි සපයන බව විද්වතුන්ගේ මතය වී තිබේ. විශේෂයෙන් u AG 69 3A ස්තරය අයත් කාල පරිච්ඡේදයේ දී කාලරක්ත වර්ණ මැටි මෙවලම් (BRW) සරල රතු දුඹුරු භාණ්ඩ සමඟ හමු වී තිබේ (Deraniyagala 1972:85- 88,106-120). ඒවා ක්‍රි.පූ දහ වැනි, නව වැනි ශතවර්ෂයට අයත් බව සලකනු ලැබේ. අළු පැහැති බඳුන් මෙම ජනාවාස ස්තරවල හමු නොවන අතර කාල වර්ණ මැටි මෙවලම් හමුවේ. ක්‍රි.පූ. 700-500 අතර ASW

1 සංසිද්ධි අංක 89 හා AMP සංසිද්ධි අංක 75 මගින් මධ්‍යම ප්‍රමාණයේ මැටි මිශ්‍රණ සහිත ආනයනය කරන ලද බඳුන් හමු වී තිබේ (Deraniyagala 1990 257, 274, -275, 721-728). මෙම බඳුන් පශ්චාත් කාලයට අයත් රුලේටඩ් මැටි භාණ්ඩවලට සමානයැයි උපකල්පනය කර ඇත. AG 69 13 A(1) ශෛලීයේ කැපීපෙනන පිඟන් භාණ්ඩ හස්තිනාපුර් NBPW මට්ටම්වල 44 වන ශෛලියට සහසම්බන්ධතාවයක් පෙන්වන බව දැරණියගල ප්‍රකාශ කර ඇත (Deraniyagala 1972:106, 172;1999:711).එ මඟින් මෙම කාල පරාසය තුළ උතුරු ඉන්දීය සහ සම්බන්ධතාවය හා (එම) අන්තර් දේශීය සම්බන්ධතා පැහැදිලි වන බව AG 69 3 A (ii) පිඟන් භාණ්ඩ තුළින් තහවුරු වේ. මේ අනුව ක්‍රි.පූ. 700-500 දක්වා අනුරාධපුර සංස්කෘතියේ ප්‍රධාන වෙනස්වීමක් මෙ මඟින් පෙනෙන අතර උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (NBPW) ක්‍රි.පූ. හතර වැනි ශත වර්ෂයට අයත් බව AG 85 සංසිද්ධි අංක 15 තුළින් පැහැදිලි වේ. මෙම මැටි භාජන වර්ගය නිෂ්පාදනය උත්තර ඉන්දියාවේ ගංගා මිටියාවතේ සිදු වී ඇත (Deraniyagala 1992:711). මෙ වැනි භෞතික සංස්කෘතික තොරතුරු තුළින් ක්‍රි.පූ. හතර වැනි ශත වර්ෂයේ සිට ගංගා මිටියාවතේ නාගරික මධ්‍යස්ථාන සමඟ ශ්‍රී ලංකාව සහසම්බන්ධතා පවත්වා ඇති බව පැහැදිලි වේ.

ක්‍රි.පූ. හතර වැනි ශත වර්ෂයේ අශෝක අධිරාජ්‍යයට පෙර උතුරු ඉන්දියාවේ බුද්ධිමය සම්ප්‍රදායන්වල ව්‍යාප්තිය හඳුනාග ැනීමට NBPW පිඟන් භාණ්ඩ සහ දීප්තියෙන් අඩු අළු පැහැති පිඟන් භාණ්ඩ උපයෝගී වන බව පෙන්වාදෙන දැරණියගල එ මඟින් ඉන්දියානු ශ්‍රී ලංකා සහසබඳතාවයන් පැවති කාලයට පසු කාලයේ දී මධ්‍යධරණී පිඟන් භාණ්ඩවල හා රුලේටඩ් පිඟන් භාණ්ඩ වානිජ පරමාර්ථ පෙරදැරි ව දකුණු බෙංගාල නිෂ්පාදන මධ්‍යස්ථානයේ සිට ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති බව ඔහු පෙන්වා දී ඇත (Deraniyagala 1986:47). NBPW මැටි මෙවලම් ක්‍රි.පූ. හතර වැනි සියවසේ සිට මුල් ක්‍රිස්තු යුගය දක්වා පරිහරණය වී ඇත (සුදර්ශන් සෙනෙවිරත්න සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි). එසේ ම රුලේටඩ් වර්ගයේ බඳුන් ක්‍රි.පූ. දෙ





වැනි සියවසේ සිට ක්‍රි.ව. දෙ වැනි සියවසට අයත් සන්දර්භවලින් වර්තා වී තිබෙන අතර (Deraniyagala 1990:258,712,719) එ මඟින් අනුරාධපුර නගරය බටහිර රටවල් සමඟ සම්බන්ධතා පැවැත් වූ බව මෙම පිඟන් භාණ්ඩ මඟින් හඳුනාගත හැකි ය. ක්‍රි. ව. දෙ වැනි ශත වර්ෂයට අයත් ASW 1 සංසිද්ධි අංක 49 හමු වූ පිඟන් භාණ්ඩ බටහිර ආසියානු සම්බන්ධතාවය මැනවින් කියාපාන සාධකයක් බව දැරණියගල හා කනිංහැම් ප්‍රකාශ කර ඇත (Deraniyagal 1992:713 ත ක්‍ඵබසබටය්ප 1999:129). අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය අධ්‍යයනයේ දී ශිල්ප නිෂ්පාදන කටයුතු පිළිබඳ ව ලැබෙන සාධක ද බෙහෙවින් ම වැදගත් වේ. එම කටයුතු අතර ක්‍රි.පූ. 500ට පෙර යුගයන්හි දී නිර්මිත පබළු වර්ග ඇතුළුපුරයෙන් හමු වී ඇත. විනිවිද පෙනෙන රතු වීදුරු පබළු AG 85, 8a (iv), 8b (i) වර්ග යටතේ හඳුනාගෙන ඇත (Deraniyagala 1972:135). එසේ ම AG 69 Type 10b (i), 8 b (i) ක්‍රි.පූ. හය වැනි ශත වර්ෂයේ සිට ක්‍රි.පූ. තුන් වැනි ශත වර්ෂය දක්වා කාලය අතර පරිහරණය වූ පබළු බව දැරණියගල පෙන්වා දී ඇත (එම : 138,153). මේ අනුව අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය දේශීය හා විදේශීය වශයෙන් ඇති වී තිබූ විවිධ සමාජ දේශපාලන තත්ත්වයන් මත වූ සිද්ධි දාමයක් බව මෙම භෞතික සංස්කෘතික තොරතුරු අනුව හඳුනාගත හැකි ය.

අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලියේ වඩා වර්ධනාත්මක අවස්ථාව අපට හඳුනා ගත හැක්කේ ක්‍රි.පූ තුන් වැනි සියවසින් පසු ව බව පෙනේ. මූලාශ්‍රයගත තොරතුරු අනුව මෙම කාල වකවානුව මහින්දාගමනය සමඟ බෞද්ධාගම මුල් බැස ගන්නා කාලයට අයත් වේ (*මව.* xiv:42-52). මෙම කාල පරිච්ඡේදය තුළදී අනුරාධපුර පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව පැවති ප්‍රදේශගත බහුවිධ සම්පත් ප්‍රයෝජනයට ගැනීම පෙරට වඩා සැලසුම්ගත ව සිදු කර තිබෙන බව හඳුනාගත හැකි ය. බහු සම්පත් පරිහණය නිසා කේන්ද්‍රීය ලෙස අනුරාධපුරය නාගරීකරණයේ උච්චතම අවස්ථාවට පැමිණෙන අතර මේ සමය වන විට ක්ෂුද්‍ර හා සාර්ව ප්‍රදේශවල පරිසරය ගැන වඩා හොඳ අවබෝධයක් තිබූ බව පෙනේ.

මුල් ඓතිහාසික අවධිය (Early Historic) තුළින් හඳුනාගත හැකි ක්‍රියාදාමය ලෙස සම්පත් කෙළින් ම ලබාගැනීම, නිෂ්පාදනය, බෙදා හැරීම් කටයුතු ඇරඹීම පෙන්වාදිය හැකි ය. මේ සඳහා මාර්ග පද්ධතිය පුළුල් වීම ද බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. එසේ ම මෙම අවධියේ දී බිහිවන්නා වූ විශේෂ ප්‍රාගුණ්‍යතාව සහිත ශිල්ප කණ්ඩායම්හි ඉස්මතුවීම අනුරාධපුර නාගරීකරණයට දායකත්වය ලැබෙන තීරණාත්මක කරුණක් වේ. එහිදී පරුමක, ගහපති, බත, බරත, අශ ආදී ජන කණ්ඩායම් උතුරු මැද හා තදාශ්‍රිත ප්‍රදේශයේ පැලපදියම් වී කර්මාන්ත ශිල්පීන්, හා නිෂ්පාදන බෙදාහරින්නන් ලෙස ක්‍රියාකර ඇති ආකාරය මුල් බ්‍රාහ්මී අභිලේඛන අනුව හඳුනාගත හැකි ය. ස්වභාවික සම්පත්වල පිහිටීම හා පාලන ඒකකවල ආරම්භය සමඟ පුරාතන රාජ්‍යය හැඩගැසීම සම්බන්ධ ව සම්බන්ධතාවය ඉන් ගොඩනැගෙන බව පර්යේෂකයන් පෙන්වා දී ඇත (Claessen and Skalnik 1978 :549). විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වන මුතු, මැණික්, යකඩ, තඹ හා අනෙකුත් භූගත සම්පත්වල පිහිටීමත් මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්ථානගතවීමත් අතර යම් සම්බන්ධතාවයක් තිබේ (Gunawardena 1982:27- 29). මෙම ස්වභාවික සම්පත් මුල් ඓතිහාසික යුගයේ දී අනුරාධපුරයට කෙළින් ම හා වක්‍ර ආකාරයට ලැබුණ බව අනුරාධපුර වටා පිහිටි ස්ථාන අනුව පැහැදිලි වේ (බලන්න වගු අංක 3.3).

| ස්ථානය | පළාත | භෞතික සම්පත් |
|---|---|---|
| පෙරියපුලියන්කුලම, ඔච්චප්පුකල්ලු,මුතුගල, නුවරගමකන්ද | උතුරුමැද | මුතු,යකඩ, රත්තරං, මයිකා |
| නුවරකන්ද, රනගිරමඩ, තිත්තවෙල | වයඹ | මුතු,යකඩ,මයිකා |
| ගෝනවත්ත, බඹරගල | මධ්‍යම | යකඩ,මැණික් |
| බෝවත්තේගල, මොට්ටයාක්කල්ලු, කල්වුඩුපොතාන, කුසලාන්කන්ද, සේරුවිල | නැගෙනහිර | යකඩ, තඹ |





(Cooray 1984:178-224; Herath1975:25-30 ; Seneviratne 1995:114-137)

වගු අංක 3.3

අනුරාධපුරට ආසන්න ප්‍රදේශවල ස්වභාවික ඛනිජ සම්පත්වල පිහිටීම දැක්වෙන වගුව

අනුරාධපුරයට නැගෙනහිර පර්යන්ත ප්‍රදේශය තුළ සිදු වූ ලෝහ සම්පත් පරිහරණය මෙන් ම අනුරාධපුරයට දකුණින් ඉහළ කලා ඔය හා මධ්‍ය කලා ඔය නිම්නය ආශ්‍රිත ව මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ ප්‍රජාව කඳුකර දුර්ග තුළින් එක් පරිසර පද්ධතියක සිට තවත් පරිසර පද්ධතියකට භාණ්ඩ හා සම්පත් ප්‍රවාහනය සඳහා ප්‍රවේශ වීමේ මාර්ග යොදාගත් බව පර්යේෂණවලින් තහවුරු කර ගෙන ඇත. විශේෂයෙන් ම මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් වන්නා වූ **කඩ** යන වචනය මඟින් භූ රූපණ හෝ සම්පත් කලාප සමඟ සම්බන්ධ වන නිශ්චිත භූමි ප්‍රදේශය ක්ෂුද්‍ර තත්ත්වයකදී **කඩ** යන්නෙන් ව්‍යවහාර කර ඇත්තේ කන්දක් හෝ කඳු කපොල්ලක් යන ගම්‍ය අර්ථයෙනි (සෙනෙවිරත්න 1996:20). මුල් ඓතිහාසික යුගය වන විට එබඳු ස්ථාන සම්පත් එකතු කිරීමේ හෝ භාර ගන්නා මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කළ ජනපද බවට පරිණාමය වන්නට ඇත. මාතලේ සිට දඹුල්ල දක්වා වූ මුල් ඓතිහාසික යුගයේ එ වැනි **කඩ** ජනපද ගැන සඳහන් වී ඇත(එම). එක් පරිසර පද්ධතියක සිට තවත් පරිසර පද්ධතියකට භාණ්ඩ සැපයීම මඟින් කඳුකර ප්‍රදේශ තුළට ජනපද කලාප ව්‍යාප්ත වීම පමණක් එ මඟින් අදහස් නොවේ. එයට අමතර ව ආර්ථික වැඩ කටයුතු මඟින් මුල් ඓතිහාසික අවධියේ අළුත් තාක්ෂණික මූලිකාංග හා සමාජ සැකසුම්, අළුත් භූමි හා පරිසර කලාපවලට ඇතුළුකරනු ලැබී ය (එම). මෙම පරිසර කලාපවලට ඇතුළු වූ ප්‍රජාව මූලික වශයෙන් ම ස්වභාවික ඛනිජ සම්පත් සමඟ සම්බන්ධ වීම කැපීපෙනේ (එම). දේවානම්පියතිස්ස හා දුට්ඨගාමිණී රජු දවස තලාතු මිනිරන්, රිදී, මැණික් ගල් හා රත්තරං සපයා දුන් ගිරිකන්ද පිළිබඳ ව වංසකතාවල සඳහන්

වේ (*මව.* xxviii:14-40). විශේෂයෙන් ම වංසකතාකරුවන් එහිදී අනුරාධපුරයට නැගෙනහිර හා දකුණු ප්‍රදේශයේ තිබෙන සම්පත් පිළිබඳ ව සාකච්ඡා කර ඇති ආකාරය එයින් හඳුනාගත හැකි ය.

මුල් ඓතිහාසික අවධියේ දී පර්යන්ත ප්‍රදේශ තුළ පෙළපත් ප්‍රධානීන් සම්පත් පිහිටි ප්‍රදේශ මෙන් ම ඒවා ප්‍රවාහනය කෙරෙනු මාර්ගවල ද පාලන බලය සතු කර සිටි බව ද පෙනේ. නාලන්ද අසල දෙමැද ඔයෙන් සොයා ගනු ලැබූ මුල් බ්‍රාහ්මී අභිලේඛනයක මචුඩික නැමති ප්‍රධානියා පිළිබඳ සඳහන් වේ (*Ic*.Vol.i No.813). ඔහුගේ ප්‍රධාන කාර්යය මැණික් සම්පත් ආශ්‍රිත ක්‍රියාවලිය බව පෙනේ (සෙනෙවිරත්න 1996:21). මෙහි දී මොහු ප්‍රයෝජනයට ගනු ලැබුවේ මැණික් ගල් ද, ස්ඵටික හුණු ගල් ද තලාතු මිනිරන් ද කියා කිව නොහැකි ය (එම). මේ ආකාරයට ප්‍රාදේශීය පාලන ප්‍රදේශවල සිට ගම් (ගාම) පිහිටුවා ගත් මොවුන් නගර හා නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථානවලට මහා පරිමාණ ආකාරයෙන් සම්පත් ලබා දී ඇත. එම නිසා ම මුල් ඓතිහාසික අවධිය තුළ උතුරුමැද පළාත තුළ මෙම සම්පත් හැසිර වූ පරුමක, ගහපති, බත, බරත, අශ/අය කණ්ඩායම්හි පුළුල් ස්ථානගත වීමක් හඳුනාගත හැකි ය( බලන්න වගු අංක 3.4).

| | |
|---|---|
| පරුමක | 91 |
| ගමික | 14 |
| බත | 39 |
| ගහපති | 23 |
| බරත | 13 |
| අස/අය | 08 |

(*Ic*. Vol. i :1970)

වගු අංක 3.4

මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පළාත තුළ ජීවත් වූ විවිධ ජන කණ්ඩායම් පිහිටුවා ඇති ශිලා ලිපි ප්‍රමාණය දැක්වෙන වගුව

මෙම ජන කණ්ඩායම් පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී මොවුන් විශේෂ වාණිජ කටයුතුවල යෙදුනවූත්, දේශීය බඳු විශේෂඥයින්





නිෂ්පාදන ශිල්පීන්, තොටුපල පාලකයින් ය. කෘෂිකාර්මික කටයුතු හසුරවන්නන් හා විවිධ ශිල්ප නිෂ්පාදන කටයුතු හැසිරවීම සම්බන්ධ ක්‍රියාකරන්නන් ලෙස කටයුතු කර ඇති බව පැහැදිලි වේ (සෙනෙවිරත්න 1996:23-25). මෙම තත්ත්වයන්ට අනුව අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලියේ දී මුල් ඓතිහාසික අවධියේ ජන කණ්ඩායම් විවිධ ශිල්පීය කාර්යයන් සඳහා දායකත්වය උතුරු මැද කලාපය ආශ්‍රයෙන් ලබා දී ඇති අතර ඔවුන්ගේ සමාජ සැකස්ම එකිනෙකට බද්ධ වූ පරිසර කලාපවල ජීවත් වූ අනෙක් ජන කණ්ඩායම් සමඟ සම්බන්ධ ව තිබූ බව මැනවින් පැහැදිලි වේ. එසේ ම අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය ප්‍රාග් අනුරාධපුර ග්‍රාමීය තත්ත්වයන්ගේ සිට ක්‍රමානුකූලව ආරම්භ වී පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව ඇති වූ සම්පත් පරිහරණය හා විදේශීය ගනුදෙනු ක්‍රියාවලිය සමඟ වර්ධනයට පත් වූ බව භෞතික සංස්කෘතික තොරතුරු හා සාහිත්‍ය මූගාශ්‍රය ඇසුරෙන් හඳුනාගත හැකිය.

04

වැනි

පරිච්ඡේදය

# පුරා භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් ජේතවන හා වෙස්සගිරිය ආංශුක භූමිය ආශ්‍රිත ජනාවාස රටාව හඳුනාගැනීම

## 4.1 හැඳින්වීම

පුරාණ අනුරාධපුර ඇතුළුපුරයට දකුණු දිග් භාගයේ හා මහා විහාරයට නැගෙනහිරින් පිහිටි භූමි භාගය තුළ ජේතවන විහාරය ස්ථානගත ව තිබේ. ලොව විශාලත ම ගඩොළුමුවා ස්මාරකය ලෙස පිළිගැනෙන ජේතවනාරාම ස්තූපය හා මහා පරිමාණ සංඝාරාමය ක්‍රි.ව. 276-303 කාලයේ ලංකාවේ රජ පැමිණි ශ්‍රේෂ්ඨත ම වැව් තනන්නෙකු වූ මහසෙන් රජුගේ නිර්මාණයක් ලෙස මහාවංසයේ සඳහන් වේ (*මව* xxxvii :1-2 ත රත්නායක 1998:330). යථෝක්ත භූමි භාගය තුළ සංඝාරාමය ඉදිවීමට පෙර එහි ක්‍රියාත්මක වූ ප්‍රාග් ජනාවාස තත්ත්වයන් හඳුනාගැනීමට ජේතවන ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් අනතුරු ව මේ දක්වා සිදු කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණ තුළින් අනාවරණය කරගනු ලැබූ මානව කෘති හා ජීවි පරිසර දත්ත ඔස්සේ අවකාශ සැලසී ඇත. ඒ අනුව දශක දෙකක කාලයක් තිස්සේ මෙම භූමියේ විවිධ ප්‍රදේශ අළලා මව් පාෂාණය දක්වා සිදු කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් ඔස්සේ එහි පහළ ම ස්තරයේ සිට ඉහළ ම





ස්තරය දක්වා වන සංස්කෘතික අවධි සම්බන්ධ කාල රාමුවක් භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් ගොඩනගා ගැනීමට අවකාශ සැලසී තිබේ.

### 4.1.1 ජේතවන ආංශුක භූමියේ ස්තරායනය ඇසුරින් ජනාවාස රටාව

අධ්‍යයනය ජේතවනාරාම විහාරය ආශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණ 1982 වසරින් පසු සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය යටතේ ආරම්භ කිරීමෙන් අනතුරු ව නව පර්යේෂණ වැඩසටහන් දියත් කරන ලදි. එම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථයක් ලෙස සිරස් කැණීම් තුළින් (Vertical Excavation) ස්තරායනය අධ්‍යයනය කර පුරා ජනාවාස රටාව හඳුනාගැනීම හා ඉතිහාසය නිවැරදි ලෙස ගොඩනැංවීම ප්‍රධාන කාරණයක් විය (Ratnayake 1984 :04). ඒ අනුව

i. මැටි බඳුන් අනුපිළිවෙලක් ස්තරායනය ඇසුරෙන් ගොඩනැඟීම.
ii. පහළ ම ස්තරයේ සිට වාර්තා වන භෞතික සංස්කෘතික තොරතුරුවල පරිණාමය අධ්‍යයනය
iii. ජේතවන විහාර භූමිය ඇසුරෙන් අභ්‍යන්තර කාල රාමුවක් ගොඩනැගීම.

යන කාරණා කෙරෙහි සැලකිලිමත් වී ඇත (එම).

පරමාර්ථ සාධනය එසේ වුවත් ජේතවනාරාම ව්‍යාපෘතිය මඟින් මුල්කාලීන යුගවලදී එ නම් 80 හා 90 දශකයේ මුල් අර්ධය තුළ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැණීම් තුළින් යථෝක්ත කාරණය සාක්ෂාත් කර ගැනීමට අවකාශ සැලසී නැත. එයට ප්‍රධාන වශයෙන් එම කාල පරාසය තුළ ජේතවන ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැණීම් විද්‍යාත්මක ලෙස වාර්තා නොකිරීම බලපා ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් එවකට විෂයීය දැනුම සහිත මානව සම්පත්වල පැවති හිඟය ඍජුව බලපා තිබේ. නමුත් 90 දශකයේ අවසාන අර්ධය තුළ දී ව්‍යාපෘතිය තුළට ගලා ආ විෂයීය දැනුම සහිත මානව සම්පත්වල භාවිතාව සමඟ 2000

වසරින් පසු සිදු කරනු ලැබූ දෙ වැනි භාගයට අයත් පර්යේෂණ කැණීම් මඟින් ව්‍යාපෘතිය මුල දී බලාපොරොත්තු වූ පර්යේෂණ පරමාර්ථ සාධනය කර ගැනීමට අවකාශ සැලසිණ.

2000 වසරින් පසු ගැටලු අභිමුඛ (Problam Oriented) සහ තත්ත්ව මූලික (Issue related) ප්‍රවේශයකින් ජේතවන පුරාවිද්‍යාත්මක ස්ථානය අධ්‍යයනය කිරීම ඔස්සේ තිරස් කලාපය පහත දැක්වෙන අන්දමට හඳුනාගන්නා ලදි.

a) ජේතවන ආශ්‍රිත පරිශ්‍රය, ආංශුක කලාපය (Micro Region)

b) අනුරාධපුරය සහ තදාශ්‍රිත ප්‍රදේශය, විස්තෘත කලාපය (Macro Region)

c) ඉන් ඔබ්බට ඇති ප්‍රදේශ (Peripheral Region) (සෙනෙවිරත්න 2009:01).

මෙහි සිරස් සම්බන්ධීකරණය මුඛ්‍ය වශයෙන් අනුරාධපුරය ඇතුළුපුරය ස්තරායනය සමඟ හා අනෙකුත් අනුරාධපුර ස්තරයානය සමඟ කැණීම් ආශ්‍රිත භෞමික ඛණ්ඩ ඔස්සේ සම්බන්ධ කෙරිණි (එම). ජේතවනය තිරස්මානය තව දුරටත් වර්ධනය කිරීම සඳහා භෞතික භූ දර්ශනය සූක්ෂම ලෙස අධ්‍යයනයට භාජනය කෙරිණි. එය

a) ජල මාර්ග පද්ධතියට (හාල්පානු ඇළ හා මල්වතු ඔය සාපේක්ෂ පිහිටීම)

b) ඇතුළුපුරයට සාපේක්ෂ පිහිටීම

c) ඇතුළුපුරයට නැගෙනහිරින් හා දකුණින් දිව යන්නා වූ මාර්ග පද්ධතියට සාපේක්ෂ ව පිහිටීම

ඔස්සේ සංස්කෘතික භූ දර්ශනයේ පරිණාමයට පාදක වූ අන්දම අධ්‍යයනය කරන ලදි (එම).


ඒ අනුව මෙම අධ්‍යයන සිදු කරන ලේඛකයා විසින් පෞද්ගලික ව සහභාගී වී මෙහෙයවන ලද පහත සඳහන් කැණීම් මඟින් ජේතවන ව්‍යාපෘතියේ ස්තරායනය ඇසුරින් පුරා භෞතික සංස්කෘතික තොරතුරු උපයෝගී කර ගෙන සාපේක්ෂ කාලනිර්ණයක් (Relative dating) ඔස්සේ පුරාණ ජනාවාස රටාව





හඳුනාගැනීමට උත්සාහ ගෙන තිබේ. එම පුරාවිද්‍යා කැණීම් අතර JSP 2000, JSMP 2001 / 2002 JSWMP 2003/2004,JSOWP 2003,JBOP 2005,2007 යන කැණීම් අනුව පෙන්වාදිය හැකි ය (වගු අංක 5.1). මෙම කැණීම් භූමි තෝරා ගැනීමේ දී ජේතවන ස්තූපය මධ්‍ය ලෙස ගෙන එහි උතුර හා දකුණ නියෝජනය වන අයුරින් භූමිය පරීක්ෂා කිරීම එක් අතකින් ඇතුළු නුවරට ආසන්න වීම හා ඇතුළු නුවර සිට පර්යන්තයට ගමන් කිරීමක් ලෙස පෙන්වාදිය හැකි ය. ඒ අනුව මව් පාෂාණයේ සිට (Bed Rock) ජේතවන විහාර භූමියේ ස්තරායනයේ පෙළ ගැස්ම මතුපිට ස්තරය දක්වා ම හඳුනාගැනීමට හැකියාව ලැබුණි.

පුරාවිද්‍යා ක්ෂේත්‍රයන්හි ස්ථානගත වීම හා වර්ධනය සඳහා මව් පාෂාණයේ පිහිටීමේ ස්වරූපය ප්‍රබල බලපෑමක් ඇති කර ඇති බව අනුරාධපුර ඇතුළුපුර ජනාවාසයේ මව් පාෂාණයේ පිහිටීම තුළින් පැහැදිලි වේ. අධ්‍යයනයේ දී ඇතුළුපුරයට හාත්පස ප්‍රදේශය පවතින මව් පාෂාණය හා සැසැඳීමේ දී ඇතුළුපුරයේ මව් පාෂාණයේ පිහිටීම ඉහළ ස්ථානයක පිහිටා තිබේ (Deraniyagala 1992:Fig60). ජේතවන භූමිය ගත් කළ ද එහි මව් පාෂාණයේ පිහිටීම ප්‍රාග් ජේතවන අවධියේ දී බිහිවන්නා වූ ජනාවාස ඇතිවීමට හා ජේතවන අවධියේ දී ස්තූපය ස්ථානගතවීමට ඍජු ව බලපා ඇත. විශේෂයෙන් ම ජේතවන ස්තූපයෙන් උතුරට හා එයින් දකුණට මව් පාෂාණයේ පිහිටීම පහත සඳහන් කැණීම් ස්ථාන අනුව මෙසේ පෙන්වාදිය හැකි ය.




සැලසුම් අංක 4.1
අධ්‍යයනයට තෝරාගෙන ඇති ජේතවන ස්තූප භූමියේ කැණීම් පරිශ්‍රවල මව් පාෂාණයේ මුහුදු මට්ටම් උස දැක්වෙන සැලසුම

| ජේතවන ස්තූපයට දකුණින් පිහිටන කැණීම් ස්ථාන | මව් පාෂාණයේ මුහුදු මට්ටම් උස | ජේතවන ස්තූපයට උතුරින් පිහිටන කැණීම් ස්ථාන | මව් පාෂාණයේ මුහුදු මට්ටම් උස |
|---|---|---|---|
| JSMP II 2002 | 72.24 m | JSMP 2001 | 72.39 m |
| JSOWP 2003 | 72.38 m | JSWMP 2004 | 72.13 m |
| JSWMP 2003 | 72.67 m | JSP I 2000 | 69.53 m |
| JBOP 2005 | 71.65 m | JSP II 2000 | 69.50 m |

මෙම මුහුදු මට්ටම් උස ජේතවන ස්තූපය මධ්‍යයේ සිට දකුණු දෙසට මීටර්
වගු අංක 4.1
අධ්‍යයනයට තෝරාගෙන ඇති ජේතවන භූමියේ කැණීම් පරිශ්‍රවල මව් පාෂාණයේ මුහුදු මට්ටම්වල උස දැක්වෙන වගු සටහන


මෙම මුහුදු මට්ටම් උස ජේතවන ස්තූපය මධ්‍යයේ සිට දකුණු දෙසට මීටර් 210 ක් දක්වා දුරකට ද උතුරු දෙසට (ඇතුළුපුරය දෙසට) මීටර් 270 දක්වා ද අධ්‍යයනය කර ඇත. ඒ අනුව ස්තූපයේ දකුණේ සිට උතුරට මව් පාෂාණයේ පිහිටීම මීටර්





480ක් ඇතුළත විචලනය වීමේ විෂමතාවයන් හඳුනාගත හැකි අතර ජේතවන ස්තූප සීමාවේ දී JSMP 2001/2002, JSOWP 2003, JSWMP 2003/2004 කැණීම් සාධකවලට අනුව මව් පාෂාණයේ උච්ච භාවයකට පත්වන අතර ස්තූපයේ උතුරට ගමන් කිරීමේ දී නැවත මීටර් 3.12 ක පහළ බැසීමක් හඳුනාගත හැකි ය. නැවත ඇතුළුපුරය දෙසට ගමන් කිරීමේ දී ඇතුළුපුරය ආසන්නයේ දී මීටර් 5.19 ක උච්චත්වයකට පත්වන බව හඳුනාගත හැකි ය.

ජේතවන විහාර භූමියේ මව් පාෂාණයේ බටහිර නැගෙනහිර පිහිටීම දෙස බැලීමේ දී ස්තූපයේ බටහිර දෙසට එ නම් වර්තමාන හාල්පානු ඇළ දෙසට ගමන් කිරීමේ දී පොළොව මතුපිට මට්ටමට ළඟා වන බව $S_1 W_3$, $S_1 W_4$, $S_1 W_5$ යන ග්‍රිඩ් අංක තුළ සිදු කර ඇති පර්යේෂණ කැණීම්වලින් අනාවරණය වී ඇත. එමෙන් ම ස්තූපයෙන් නැගෙ නහිර පස දී මව් පාෂාණය මල්වතු ඔය දෙසට වන්නට තරමක් බෑස්මක පිහිටන බව JCP 1996, JRP 1996, JRP 2010 ස්ථාන නාම යටතේ සිදු කළ කැණීම්වල දී තහවුරු වී ඇත (ගුණරත්න 1996.21 හ සේනාරත්න හා පල්ලේතැන්න 2010). 1996 වසරේ භූ විද්‍යා දෙපාර්තමේන්තුව හා ජේතවන ව්‍යාපෘතිය ඒකාබද්ධ ව සිදු කරනු ලැබූ විද්‍යුත් ප්‍රතිරෝධක ගවේෂණය (Resitivity Survey) තුළින් ද මල්වතු ඔය දෙසට වන මව් පාෂාණයේ බෑස්ම හඳුනාගත හැකි විය (මැන්දිස් 2006:49). මෙම තොරතුරුවලට අනුව වඩාත් පැහැදිලි වන්නේ ජේතවන විහාර භූමියේ මව් පාෂාණය ස්තූපය මධ්‍ය ලෙස සළකා බැලීමේදී උතුරු දකුණු දිශානුගත ව හා බටහිර නැගෙනහිර දිශානුගත ව ස්තූප සීමාවේ දී අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂ ව උච්ච ව පිහිටන බව ය. ඒ අනුව මව් පාෂාණයේ පිහිටීම මත එහි මතුපිට භූමියේ පිහිටීම ද බටහිර නැගෙනහිර දිශානුගත ව නැගෙනහිර දෙසට පහත් ව පිහිටන ආකාරය පහත සඳහන් හරස්කඩ සැලසුම මඟින් අවබෝධ කරගත හැකි ය.




සැලසුම් අංක 4.2
අභයවැව සිට මල්වතු ඔය දක්වා ජේතවන ස්තූපය හරහා බටහිර නැගෙනහිර දිශානුගත ව ලබා ගන්නා ලද හරස්කඩ සැලසුම





ජේතවන විහාර භූමියේ ස්තරායනය අධ්‍යයනය කිරීමේ දී මව් පාෂාණය (Bed Rock) මත සිට අරඹෙන පාංශු ස්තරය වන්නේ මව් පාෂාණය දිරාපත් වීමෙන් සෑදුණු ඓන්ද්‍රීය ද්‍රව්‍යයන්ගෙන් යුත් පාංශු ස්තරයකි (Decomposed Bedrock). මෙම ස්තරය තුළ කිසිදු භෞතික සංස්කෘතික ද්‍රව්‍යයක් අන්තර්ගත නොවන අතර එය සෙ.මී. 10ක පමණ ඝණකමකින් යුතු ව සමහර අවස්ථාවල දැකගත හැකි වේ. ඓන්ද්‍රීය ද්‍රව්‍යවලින් සැකසුණු ස්තරය මතින් ආරම්භ වන්නේ රතු දුඹුරු පැහැ බොරළු (Reddish brown Earth basal gravel) පාංශු ස්තරයයි. ජේතවන භූමිය තුළ දී මෙම පාංශු ස්තරය සෙන්ටිමීටර් 50 සිට මීටර් 1ක් පමණ ඝණත්වය ගන්නා බව JSMP 2002, JSWMP 2003 කැණීම් සාධකවලට අනුව හඳුනාගත හැකි විය (මැන්දිස් 2003/2004:09). භූ විද්‍යා වර්ගීකරණයන්ට අනුව උතුරුමැද පළාත තුළ රතු දුඹුරු පාංශු කලාපය පිහිටා තිබෙන බව කුරේ පෙන්වා දී ඇත (Cooray 1984:140-142). ජේතවන භූ කලාපය තුළින් හඳුනාගත හැකි රතු දුඹුරු පාංශු කලාපය ඉතා ම වැදගත් වන්නේ ඒ තුළින් ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිත කළ බවට උපකල්පනය කළ හැකි ශිලා පතුරු (Flake) හා ශිලා මෙවලම් (Stone Implement) වාර්තා වී තිබෙන බැවින් එම භෞතික සංස්කෘතික තොරතුරු JSMP 2002 සංසිද්ධි අංක 67, JSWMP 2003 සංසිද්ධි අංක 18, JSOWP 2003 සංසිද්ධි අංක 26 යන සන්දර්භවලින් හඳුනාගෙන ඇත. කහඳ, විනිවිද පෙනෙන තිරුවානා, දුම්පැහැ තිරුවානා යන අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කර ඇති ශිලා මෙවලම් 34ක් පමණ ජේතවන විහාර භූමිය ආශ්‍රිත කැණීම්වල දී මෙම තැන්පතුව තුළින් හමු වී තිබේ (මැන්දිස් 2003ල2004:04).

මෙසේ හමු වී ඇති ශිලා මෙවලම්වලට අමතර ව කිලෝග්‍රෑම් 12 පමණ බරැති ශිලා මෙවලම් නිර්මාණයට භාවිත කරන ලද කහඳ පාෂාණ කුට්ටියක් හා එ තරම් විශාල නොවන විනිවිද පෙනෙන තිරුවාණා හා දුම්පැහැ තිරුවාණා වර්ග ද අමුද්‍රව්‍යය ලෙස ලැබී තිබේ. ඉහතින් විස්තර කරන ලද ශිලා මෙවලම් අතර සෙ.මී. 4.5 වඩා අඩු ශිලා මෙවලම් දැකගත හැකි ය. සෙ.මී.4.5 ට අඩු ශිලා මෙවලම් ක්ෂුද්‍ර ශිලා මෙවලම් වශයෙන් අර්ථ දැක්වේ

(Deraniyagala 1992:196). එමෙන් ම ඒවා සකස් කර ඇති ස්වරූපය හා භාවිත කිරීමේ උපයෝගීතාවය අනුව තල (blade), සීරුම් (scraper), තැලුම් (choping tool) මෙවලම් වශයෙන් හඳුනාගත හැකි ය. ජේතවනයෙන් හමු වී ඇති ශිලා මෙවලම් තුළින් ඒවා භාවිත කිරීම නිසා දැකගත හැකි භාවිත සාධක (used mark) හා ශිලා මෙවලම් නිර්මාණයේ දී දැකගත හැකි පීඩනය යොදා පතුරු ඉවත්කර ශිලා මෙවලම් නිර්මාණය (Pressure flaking) හා පතුරු ඉවත්කර පැති සකස් කිරීම (Trimming) යන ක්‍රමවේද හඳුනාගත හැකි ය. මෙම ශිලා මෙවලම් නිර්මාණය කර ඇති පාෂාණ හා අමුද්‍රව්‍ය අනුරාධපුර ප්‍රදේශය ඇසුරෙන් සුලභ ව දැකගත හැකි අමුද්‍රව්‍යය නොවේ. එ බැවින් මේවා බොහෝ විට බාහිර ප්‍රදේශයකින් මෙම ප්‍රදේශයට ආනයනය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට යථෝක්ත පාෂාණ වර්ග බහුල වශයෙන් දැකගත හැකි වන්නේ කඳුකර කලාප තුළිනි (සෙනෙවිරත්න 1996:188-190). ශිලා මෙවලම් නිෂ්පාදනය කිරීම සඳහා තියුණු මුවහත්භාවය ලබා ගැනීමට දැඩිතාවයකින් යුතු නම්‍ය කළ හැකි පාෂාණ අවශ්‍ය වේ. කහඳ හා තිරුවානා එම තත්ත්වයට උපරිම සුදුසු පාෂාණ වේ (මැන්දිස් 2009:14).

ජේතවන විහාර භූමියේ රතු දුඹුරු බොරළු පාංශු කලාපයෙන් හමු වූ ශිලා මෙවලම් පිළිබඳ විමර්ශනය කිරීමේ දී ප්‍රාග් ඓතිහාසික මානවයා සම්බන්ධ සංස්කෘතික තොරතුරු පිළිබඳ ව ඉඟි ඉන් ලබා දෙයි. විශේෂයෙන් ම අප මෙහි දී සැලකිල්ලට ගත යුත්තේ ජේතවනාරාම විහාර භූමියට ඉතා ආසන්න ව එහි උතුරු දෙසින් ඇතුළුපුරයේ පිහිටීමයි. අනුරාධපුර ඇතුළුපුරය තුළ සිරාන් දැරණියගල සිදු කරනු ලැබූ පර්යේෂණවල දී එම භූමියේ රතු දුඹුරු පාංශු කලාපය තුළ මධ්‍ය ශිලා (Mesolithic) සංස්කෘතිය ක්‍රි.පූ.3900 දී ක්‍රියාත්මක වූ බව හඳුනාගෙන ඇත (Deraniyagala 1992 :729). දැරණියගලගේ විග්‍රහ කිරීම්වලට අනුව AG 69 , AG 85 (ගෙඩිගේ) කැණීම තුළින් Cutter, Scraper, Chopper, Point, Hammer ආදී ශිලා මෙවලම් හා එ වැනි ශිලා මෙවලම් නිෂ්පාදනයෙන් අනතුරු ව ඉතිරි වන න්‍යෂ්ටි (Core) හා පතුරු (Waste) වාර්තා වී තිබේ (Deraniyagala 1972 61-64).





මෙම වාර්තාවීම් වැදගත් වන්නේ ඇතුළුපුරයට ඉතා ම ආසන්නත ම භූමියක් වන ජේතවන භූමිය තුළින් ද ශිලා මෙවලම් ලැබී තිබීම නිසා ය. ඒ අනුව අපට ඉතා විශ්වාසනීය ලෙස උපකල්පනය කළ හැක්කේ එක් අතකට ඇතුළුපුර ජනාවාසයට සමගාමී ව ක්‍රියාත්මක වූ මධ්‍ය ශිලා ජනාවාසයක් හෝ ශිලා මෙවලම් නිෂ්පාදිත ස්ථානයක් ජේතවනාරාම භූමිය ඇසුරෙන් මුල් බැස තිබීමට ඉඩ ඇති බවයි. ප්‍රාග් මානව ජනාවාසයක් එක් ස්ථානයක හුදෙකලාව වර්ධනය නොවේ. එය එසේ වීමට බලපානු ලබන්නේ ඔවුන්ගේ සරල ආර්ථික තත්ත්වයයි. සරල ආර්ථිකයක් ක්‍රියාත්මක කරන මානවයා අනිවාර්යයෙන් ම තම ජන කණ්ඩායමට අයත් ජන පිරිස් සමඟ සහජීවනයෙන් කටයුතු කරන අතර, ඔවුන් ඉතා විශාල පරිසර කලාපයක් තුළ හුදෙකලා ජන පිරිසක් බවට පත් නොවේ. එම නිසා ඔවුහු බොහෝ විට තම සංස්කෘතියේ සමගාමී ජන පිරිස් සමඟ හා ඉන්පසු ව මුල්බැස ගන්නා වෙනත් සංස්කෘතික කණ්ඩායම් සමඟ ද සබඳතා පවත්වා ඇති ආකාරය ඉබ්බන්කටුව හා රංචාමඩම පූර්ව ඓතිහාසික ජනාවාස තුළින් ද පැහැදිලි වී ඇත (සෙනෙවිරත්න 1996:188; Somadeva: 2006). ඉබ්බන්කටුවේ දී හඳුනාගෙන ඇති මධ්‍ය කඳුකරයේ සම්භවය ලබන ඇමතෙස්ත, තිරුවානා, කහඳ ආදී ඛනිජ ද්‍රව්‍යය තුළින් පිළිඹිඹු වන්නේ ජන කන්ඩායම් දෙකක් අතර සිදු වූ ද්‍රව්‍යය හුවමාරුව බව පුරාවිද්‍යාඥයන් හඳුනාගෙන තිබේ (එම)

ජේතවන ආංශුක භූමියේ ස්තරායනය අධයයනය තුළින් JSMP 2002 සංසිද්ධි අංක 67, JSWMP 2003 සංසිද්ධි අංක 18 හා JSOWP 2003 **සංසිද්ධි අංක 26** තුළින් ලැබෙන්නා වූ ශිලා මෙවලම් හා සත්ත්ව අස්ථි ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතියට අයත් ජීවනෝපාය හා තාක්ෂණික අවස්ථා බව ඇතුළුපුර භෞතික ද්‍රව්‍ය හා සැසඳීමේ දී වැඩිදුරටත් පැහැදිලි වේ. ජේතවන භූමිය වැනි ස්ථානයක ප්‍රාග් ඓතිහාසික ප්‍රථමික සංස්කෘතියක් ක්‍රියාත්මක වීමට පැරණි පරිසරය ද යම් ආකාරයකට බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. වත්මන් ජේතවන විහාර භූමියට ආසන්නව ම කොලොම්හොය (මල්වතු ඔය) ගලා බසින අතර ජේතවන විහාරය ඉදිවන සමයේ දී එම සීමාව තුළ

මල්වතු ඔය එ තරම් විචලනය වීමකට ලක් වී නැති බව 2000 වසරේ සිදු කරන ලද ගවේෂණ අනුව හඳුනාගෙන ඇත (බාලසූරිය 2000:25).

ජලය ප්‍රාග් මානව පැවැත්ම හා ජනාවාස ස්ථානගත වීමට ඍජු ව බලපාන සාධකයකි. ඒ අනුව මල්වතු ඔය ජල මූලාශ්‍රය ජේතවනාරාම භූමියේ ස්ථානගත ව තිබූ ප්‍රාග් ඓතිහාසික වාසස්ථානයේ හෝ අවි නිෂ්පාදන ස්ථානයේ ස්ථානගත වීමට මෙන් ම ඇතුළුපුර ප්‍රාග් ඓතිහාසික ජනාවාසය ස්ථානගත වීමට ඍජු ව බලපෑමක් ඇති කරන්නට ඇත. වර්ෂය පුරා ම නොසිඳී පවතින මෙම ජල මූලාශ්‍රය මඟින් ජල අවශ්‍යතාවය මෙන් ම දඩයම සඳහා අවශ්‍ය කරන අවි නිෂ්පාදනයට අවැසි තිරුවානා වැනි පාෂාණ ද සොයා ගැනීමට ප්‍රාග් මානවයාට පහසු වන්නට ඇත. අනෙක් අතට මෙ වැනි ගංගා නිම්න පරිසරයක් තුළින් බොහෝ විට දඩයම් තිප්පොළ නිර්මාණය සඳහා තෝතැන්නක් සැකසෙන අතර එහි දී සත්ත්ව දඩයම් හා මත්ස්‍ය දඩයම ද සිදු කිරීමට ද හැකියාව ලැබේ. මල්වතු ඔය ජල මූලාශ්‍රයට අමතර ව ජේතවන විහාරය භූමියට බටහිර පසින් පිහිටන භෞතික පරිසරය පිළිබඳ විමසීමේ දී ප්‍රාග් ඓතිහාසික මානව පැලපදියම් වීම්වලට සුදුසු භූමි නිර්මාණයක් හඳුනාගත හැකි ය. වෙස්සගිරියේ සිට අභයගිරිය දක්වා දිවෙන ස්වභාවික ගල්හින්න තුළ ඇති ස්වභාවික ගල්ගුහා එක් පැත්තකින් ප්‍රාග් ඓතිහාසික මානවයාගේ නිවාස සඳහා තෝතැන්නක් වීමට ඇත. විශේෂයෙන් ම වෙස්සගිරිය හා අභයගිරිය ආශ්‍රිත පාෂාණ උද්ගතවල පිහිටන ස්වභාවික ගල්ගුහා ප්‍රාග් ඓතිහාසික මානවයාට ඉතා පහසුවෙන් ආරක්ෂිත ලෙස වාසය කිරීමට හැකි වාසස්ථාන වශයෙන් භාවිත කළ හැකි ස්ථාන වේ. මෙම ස්ථාන දෙක ම ස්වභාවික උවදුරුවලින් ගහණ නොවන ස්ථානවල පිහිටා තිබීම ද සුවිශේෂ වේ. මෙම පාෂාණ උද්ගත දෙක අතරමැදි භූමිය තුළ වන කෙටි පාෂාණ උද්ගතය මඟින් නිම්න භූමියක් ඔසසේ සැකසෙන භූ රූපන මගින් භූ පතන (Hollow) නිර්මාණය වීමට සමත් ව ඇති බව පෙනේ.

වර්තමාන බසවක්කුලම (අභයවැව) පිහිටන භූමිය හා තිසාවැව පිහිටන භූමිය මෙම ස්වභාවික ගල්වැටිය නිසා





පුරාණයේ භූ පතන නිර්මාණය වූ තැන් වශයෙන් හඳුනාගැනීමට අවකාශ සැලසේ. ජේතවන හා ඇතුළුපුර ආදී ස්ථානවල විසූ ප්‍රාග් ඓතිහාසික ජනතාවගේ ආර්ථිකය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික දඩයම් තිප්පොළ නිර්මාණයට මෙ වැනි ස්ථාන වැදගත් වූවා මෙන් ම ජල අවශ්‍යතා සපිරූ ස්ථාන වශයෙන් මෙ වැනි භූ පතන ක්‍රියාත්මක වූ බව උපකල්පනය කළ හැකි ය. මෙම ස්වභාවික භූ පතන නිර්මාණය වී ඇති භූමිය හා මල්වතු ඔය අතර භූමිය කි.මී. 1ක් පමණ ආසන්න දුරකින් පිහිටීම නිසා ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ ජීවන චක්‍රය තුළ ජීවනෝපාය හා ජනාවාස පවත්වාගෙන යාමට බෙහෙවින් ම පහසු වීමට ඇති බැවින් ක්‍රි.පූ. 3900 පමණ වන විට එ වැනි පරිසර පද්ධතියක් සහිත ප්‍රදේශයක ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා ජනාවාස ස්ථානගත වීම ගැටලුවකින් තොර ව සිදු වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය (මැන්දිස් 2004:15). ඒ අනුව ජේතවන විහාර භූමිය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මනුෂ්‍ය පැවැත්ම ක්‍රියාත්මක වූ තවත් සුවිශේෂ ස්ථානයක් ලෙස අනුරාධපුර පුරාණ සංස්කෘතික භූ දර්ශනයට එක වී තිබූ බව කැණීම් තුළින් ලැබී ඇති භෞතික සංස්කෘතික තොරතුරු අනුව හඳුනාගැනීමට අවකාශ සැලසේ.

ජේතවන ආංශුක භූමියේ ස්තරායනය අධ්‍යයනය තුළ දී මීළඟට දැකගත හැකි පාංශු කලාපය වන්නේ දුඹුරු වර්ණ පාංශු කලාපයකි. මන්සල් වර්ණ සටහනට අනුව 10 YR 5/3 Brown පැහැ ගන්නා මෙම පාංශු කලාපය JSMP 2002 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 66, JSWMP 2003 කැණීම් සාධක අනුව **සංසිද්ධි අංක 17**, JSOWP 2003 කැණීම් සාධක අනුව **සංසිද්ධි අංක 25**, JBOP 2005 කැණීම් සාධක අනුව **සංසිද්ධි අංක 31**, JSP 2000 කැණීම් සාධක අනුව **සංසිද්ධි අංක 50**, JBOP 2007 කැණීම් සාධක අනුව **සංසිද්ධි අංක 41** යන සන්දර්භ තුළින් වාර්තා වී ඇත.[1]

1 මෙම ස්තරයේ සුවිශේෂතාවයන් වන්නේ දිගු කලක් වතුර දරාගෙන සිටීමේ හැකියාවයි. විශේෂයෙන් ම වතුර ප්‍රතිශතය අවම වූ සැනින් ඉක්මනින් මැලවීමකට ලක්වන මෙම ස්තරය තුළ ජලය අවශෝෂණය වී දිගු කලක් රැඳී තිබීම නිසා උතුරුමැද පළාතේ ජලයේ දැකගත හැකි ලවණතාවය හේතු කොට ගෙන නිර්මාණය වන කැල්සියම් කාබනේට් (CaCo3)හුණුගල් නිර්මාණය වී තිබීම දැකගත හැකි ය.

ජේතවන විහාර භූමියෙන් හමුවන මෙම පාංශු කලාපය තුළින් කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW), දුඹුරුවන් පැහැ මැටි මෙවලම් (Plain Ware) වාර්තා වීම හඳුනාගත හැකි අතර එම පාංශු කලාපය තුළ හමුවන මැටි මෙවලම්හි ප්‍රතිශතය අවම අගයක් ගන්නා බව පෙනේ. මෙ වැනි භෞතික සංස්කෘතික තොරතුරු තුළින් ජේතවන විහාරය අවධියට පූර්ව අවධීන්හි ක්‍රියාත්මක මුල් ජනාවාසකරණ ලක්‍ෂණ හඳුනාගත හැකි ය.

ජේතවන භූමියේ ස්තරායනය අධ්‍යයනය කිරීමේ දී මීළඟට වැදගත් වන පාංශු කලාපය ඉහතින් විස්තර කරන ලද පාංශු කලාපය මතින් ආරම්භ වේ. 10 YR 4/3 dark brown වර්ණයෙන් යුත් මෙම පාංශු කලාපය JSWMP 2003 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 16, JSOWP 2003 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 24, JSWMP 2002 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 64, 65, JSMP 2001 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 102, 103 ආදී සංසිද්ධි තුළින් ද JSP 2000 කැණීම් සාධක අනුව සංසිද්ධි 41,42තුළින් ද JBOP 2007 කැණීම් සාධක අනුව සංසිද්ධි අංක 34, 42 තුළින් ද හඳුනාගත හැකි ය. මෙම පාංශු කලාපයේ සුවිශේෂත්වය වන්නේ බහුල ලෙස භෞතික සංස්කෘතික තොරතුරු (Material Culture) අන්තර්ගත ව තිබීමයි. එම තැන්පතුව තුළින් කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW), රක්ත වර්ණ මැටි මෙවලම් (RW), රූලේටඩ් වර්ගයේ (RLW) මැටි මෙවලම් ලැබීම ද අතිශයින් ම වැදගත් වේ. එම මැටි මෙවලම්වලට අමතර ව විවිධ ඛනිජ පාෂාණ ආශ්‍රිත ව නිර්මාණය කරනු ලැබූ පබළු හා ලෝහ කාර්මික ශේෂ ලැබීම වැදගත් වේ. මෙම තැන්පතුව තුළින් වාර්තා වී ඇති මැටි මෙවලම් අතර 1969 ගෙඩිගේ කැණීමේ දී හමු වී ඇති 16 C (iv) වර්ගයේ කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW) හමුවීම වැදගත් වේ (Deraniyagal 1972 :111 -120). මෙම වර්ගයේ බඳුන් ඉන්දීය අර්ධද්වීපය තුළ උට්නූර් (Utnur) ක්‍රි.පූ.200 ක්‍රි.ව.200, බ්‍රහ්මගිරි (Brahmagiri) ක්‍රි.පූ. 800--100, චන්ද්‍රාවල්ලි (Chandrawalli) ක්‍රි.ව.50---100, අරිකමේඩු (Arikamedu) ආදී ස්ථානවල දී විවිධ කාල වකවානු නියෝජනය කරමින් ලැබී තිබේ (එම). දැරණියගලගේ නව අප්‍රකාශිත මැටි බඳුන් වර්ගීකරණය අනුව මෙ වැනි හැඩයේ





කාල රක්ත වර්ණ මැටි මෙවලම් 31/A/D/1 වර්ගයට අයත් වන බව දක්වා ඇත. මීට අමතර ව ඇතුළුපුරයත් හා ජේතවනයෙන් හමුවන 16 H වර්ගයට අයත් මැටි මෙවලම් අරිකමේඩුවල ක්‍රි.පූ. 200 ක්‍රි.ව.100 අතර කාලයේ දී ද හස්තිනාපූර්වල ක්‍රි.පූ 200 කාලයේ දී ද භාවිත වී ඇති බව දැරණියගල පෙන්වා දී ඇත (එම).

ප්‍රාග් ජේතවන පාංශු තැන්පතුව තුළින් ලැබී ඇති මැටි භාණ්ඩ අතර ඉන්දියානු සම්බන්ධතාවයන්ට සමානතා ඇතැයි සිතිය හැකි මටසිළුටු අළු පැහැති මැටි භාණ්ඩ දක්නට ලැබේ. මේවා රූලේටඩ් බඳුන් වශයෙන් අර්ථ දක්වනු ලැබේ (Deraniyagala 1992 : 712,721,728). මෙ වැනි මැටි භාජන වර්ග AG 69 කැණීමේ ප්‍රතිඵල අනුව ක්‍රි.පූ. දෙ වැනි ශත වර්ෂයට අයත් බව හරස් කාලනිර්ණ අනුව දින නිර්ණය කර ඇත (එම 1972 :120-160). නමුත් රූලේටඩ් භාණ්ඩ සඳහා වූ දීර්ඝ කාලීන කාලනිර්ණ බෙග්ලි විසින් අරිකමේඩුවලින් සොයා ගන්නා ලද දත්ත නැවත ඇගයීමකින් තහවුරු කර ගැනීමට උත්සාහ කර ඇත (Begley 1983:461-481). ජේතවනයෙන් හමු වී ඇති 16 H (ජේතවන නව මැටි මෙවලම් වර්ගීකරණයේ වර්ග අංක 03 F V සිට 3 F xiii වර්ගවලට සමාන වේ. ඒ අනුව රූලේටඩ් මැටි භාජන තුළින් ද යම්කිසි හරස් දින නිර්ණයන් එම භාජන වර්ගය හමුවන පාංශු කලාපයට ලබා දීමට හැකියාව තිබේ. දැරණියගලගේ විග්‍රහ කිරීම්වලට අනුව ඇතුළුපුරයේ ආශ්‍රයෙන් කාල රක්ත වර්ණ මැටි මෙවලම්වල සම්භවය ක්‍රි.පූ. 900 න් පසු සිදු වී ඇත (Deraniyagala 1992:709). ASW 2 කැණීම අනුව රොබින් කනින්හැම් විසින් ක්‍රි.පූ. 840න් පසු ඇතුළුපුරයේ කාල රක්ත වර්ණ මැටි භාණ්ඩ භාවිත වූ බව පෙන්වා දී ඇත (කැබසබටය්ප 1999 :126) දැරණියගලගේ මැටි මෙවලම් වර්ගීකරණයේ 16H, 16C වර්ගවලට අයත් භාජන ඔහුගේ අප්‍රකාශිත වර්ගීකරණයට අනුව 31/A/A/1 කාල රක්ත වර්ණ මැටි භාණ්ඩ, 31/A/2/1 රක්ත වර්ණ මැටි භාණ්ඩ හා 31/A/E/1 රූලේටඩ් වර්ගයේ මැටි භාණ්ඩ වර්ගවලට අයත් කර තිබේ. එම වර්ගවලට අයත් මැටි භාජන ක්‍රි.පූ. 400 න් පසු භාගයට අයත් ඒවා ලෙස සැලකෙන බැවින් ජේතවනයේ හමු වූ එ වැනි භාජන සඳහා හරස් කාල නිර්ණයන් ආදේශ කිරීම තුළින් එම පස්

තැන්පතුව ක්‍රි.පූ. 400ට පසු භාගයට අයත් ලෙස උපකල්පනය කළ හැකි ය. ඒ අනුව මෙම අවධිය පූර්ව ඓතිහාසික මුල් ඓතිහාසික පරිවර්තන අවධියකට අයත් තැන්පත්වීමක් වශයෙන් හඳුනාගැනීමට යම් ආකාරයකට හැකියාවක් ලැබේ.

ශ්‍රී ලංකාවේ හමුවන කාල රක්ත වර්ණ මැටි මෙවලම් අතර අනුරාධපුර ගෙඩිගේ මෙන් ම පොම්පරිප්පුවෙන් වාර්තා වී ඇති මැටි මෙවලම් ද සුවිශේෂ වේ. මෙම බඳුන් අතර Bowl සහ Dish (තැටි) වර්ගයේ මෙවලම් දකුණු ඉන්දීය මෙවලම් හා සමානාතාවයක් දක්වන බව හඳුනාගෙන ඇත (Begley 1981:85). අනුරාධපුර ගෙඩිගේ AG 69, 3A ස්තරයෙන් හමු වූ කාල රක්ත වර්ණ මෙවලම් මුල් යකඩ යුගයේ මිනිසුන් භාවිත කරන ලද ඒවා බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1972 :122). එසේ ම AG 69 BRW 3A පූර්ව ඓතිහාසික අවධියේ සිට 4B මුල් ඓතිහාසික අවධිය දක්වා තාක්ෂණික වශයෙන් වර්ධනය වෙමින් විකාශය වී ඇති ආකාරය ද හඳුනාගෙන තිබේ (එම 122). 4ඊ ස්තරයෙන් හමුවන මුල් ඓතිහාසික අවධියේ ඊසෘඋ නව තාක්ෂණික ක්‍රම අනුව වර්ධනය වී ඇති දියුණු දීප්තිමත් මෙවලම් (Fine paste) බව සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (Seneviratne 1984 :269). එසේ ම AG 69 4 A ස්තරයෙන් හමුවන BRW වලට සමානතා ඇති BRW මැටි මෙවලම් දකුණේ අම්බලන්තොටින් ද වාර්තා වන බව ඔහු ප්‍රකශ කර ඇත (එම : 271). දැරණියගලගේ නව අප්‍රකාශිත වර්ගීකරණය උපයෝගී කර විමර්ශනය කිරීමේ දී 31/A/A/1 පාත්‍ර වර්ගයට අයත් BRW මැටි මෙවලම් වර්ගය නිර්මාණය කර ඇත්තේ උසස් තාක්ෂණ ක්‍රම අනුව බැවින් ඒවා පූර්ව ඓතිහාසික සමයේ අග භාගයේ භාවිත වූ මැටි මෙවලම් වශයෙන් හඳුනාගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව පූර්ව ඓතිහාසික අවධියේ අවසාන අවධියට සමකාලීන ව හෝ ඊට මඳ කලකට පෙර ජේතවනාරාමය ආශ්‍රිත භූමිය ජනාවාස වන්නට ඇතැයි මෙම තොරතුරු අනුව උපකල්පනය කළ හැකි අතර එසේ වූයේ නම් අනුරාධපුර පුළුල් භූ දර්ශනය සැකසීමේ දී පූර්ව ඓතිහාසික අවධියට අයත් ග්‍රාමීය ජනාවාස ස්ථානගත වු ස්ථානයක් ලෙස ජේතවනය ද වැදගත් වන බව පෙන්වාදිය හැකි ය.





මේ තත්ත්වය තවදුරටත් සනාථ කළ හැකි සාධක අතර ජේතවන භූමියෙන් හමුවන රුලේටඩ් (RWL) වර්ගයේ මැටි මෙවලම් ද වැදගත් වේ. රුලේටඩ් වර්ගයේ මැටි මෙවලම් හමු වන්නේ ඉහත විස්තර කරන ලද කාල රක්ත වර්ණ මෙවලම් හමුවන පාංශු කලාපයෙන්ම ය. ඇතුළුපුර ජනාවාසය තුළ රුලේටඩ් වර්ගයේ මැටි මෙවලම් (RWL) භාවිතය පහළ මුල් ඓතිහාසික යුගයේ (Lower Early Historic 500-250 BC) සිදු වී ඇති බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:711). රුලේටඩ් මැටි මෙවලම්වල සම්භවය මධ්‍යධරණී ප්‍රදේශයේ සිදු වුව ද උතුරු ඉන්දීය ගංගා මිටියාවත ආශ්‍රිත ව ද භාවිත වී ඊටත් පසු භාගයේ දී ඒවා ශ්‍රී ලංකාවට ව්‍යාප්ත වන්නට ඇති බව විශ්වාස කරනු ලැබේ (එම :712). ඇතුළුපුර ජනාවාස තුළ මෙම මෙවලම්වල බහුල භාවිතය හඳුනාගත හැක්කේ මධ්‍ය මුල් ඓතිහාසික අවධිය තුළිනි (Mid Early Historic 250 BC -100 AC). දැරණියගලගේ අප්‍රකාශිත නව වර්ගීකරණයේ 31/A1/E/1 වර්ගයට අයත් රුලේටඩ් බඳුන් ජේතවනය ආශ්‍රිත කැණීම්වලදී ද වාර්තා වේ. ඒවා ප්‍රාග් ජේතවනාරාම ජනාවාස ස්තර ආශ්‍රිත ව වාර්තා වන බැවින් ඉහතින් විස්තර කර ඇති කාල රක්ත වරණ මෙවලම් හමුවන ස්තරවලින් ම වාර්තා වන බැවින් ක්‍රි.පූ. හතර වැනි සියවසට පසු භාගයේ ජනාවාස ආශ්‍රිත ව භාවිත වූ මෙවලම ලෙස උපකල්පනය කළ හැකි ය.

පූර්ව ඓතිහාසික අවධියේ අවසාන භාගයේ දී පැවති මෙම තත්ත්වය පිළිබඳ තොරතුරු මූලාශ්‍රය අශ්‍රයෙන් ද යම් මට්ටමකට උකහා ගත හැකි වේ. විශේෂයෙන් ම ක්‍රි.පූ.පස් වැනි සියවසින් පසු කාලය වංසකතාවල විස්තර වන්නේ පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කරන කාලයට සමගාමී ලෙස ය (*මව*. X: 83-105; *මවටී* X :73-105). මේ සමය වන විට අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශය යම් ආකාරයකට දියුණු ජනාවාසකරණයකට ලක් වී ඇති බව එම විස්තරවලින් පෙන්වා දී තිබේ (එම). ක්‍රි.පූ. හතර පහ කාලය වන විට ඇතුළුපුරය බටහිර ආසියාව සමඟ වානිජ සබඳතා ඇතිකර ගෙන තිබූ බව වංසකතාව යෝනක වෙළඳුන් පිළිබඳ ව සිදු කර ඇති විස්තරයේ ද පැහැදිලි වේ (එම).

මෙම තත්ත්වය අනුව පැහැදිලි වන්නේ දේශීය හා විදේශීය වානිජ කටයුතු ද අනුරාධපුරය ඇසුරෙන් සිදු වීම නිසා දේශීය භාණ්ඩ හා විදේශීය භාණ්ඩ මෙම ප්‍රදේශය ආශ්‍රිත ව හුවමාරු වී ඇති බවයි. එසේ ම අනුරාධපුරය, බටහිර ආසියාව, උතුරු ඉන්දියාව හා දකුණු ඉන්දියාව සමඟ වානිජ සබඳතා පැවැත් වූ බවට තොරතුරු රූලේටඩ් (සෘඋබ) හා උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (NBPW) ඇතුළු පුරයෙන් හමුවීමෙන් (Deraniyagala 1992 :711-712) පැහැදිලි වේ. ඒ අනුව ජේතවනාරාම භූමිය ආශ්‍රිත ජනාවාස තත්ත්වයන් පූර්ව ඓතිහාසික අවධියේ අවසාන භාගයේ දී ඇති වන්නට ඇතැයි සාපේක්ෂ ලෙස හඳුනාගත හැකි ය.


01


02


03


04






05



06


07


08


09


10


11


12

ඡායාරූප අංක 4.1
ජේතවනයෙන් හමු වී ඇති මධ්‍ය පූර්ව ඓතිහාසික අවධියට අයත් ලෙස උපකල්පනය කළ හැකි විවිධ මැටි බඳුන් වර්ග

01. කාල රක්ත වර්ණ මැටි බඳුන්

02. කාල රක්ත වර්ණ මැටි බඳුන්

03. දීප්තිමත් රක්ත වර්ණ මැටි බඳුන්

04. රක්ත වර්ණ මැටි බඳුන්

05. කාල වර්ණ මැටි බඳුන්

06 අළු පැහැ මැටි බඳුන්

07. අළු පැහැ මැටි බඳුන්

08. අළු පැහැ මැටි බඳුන්

09. චොක්ලට් පැහැ බඳුන්

10. සැරසිලි රටා සහිත රක්ත වර්ණ මැටි බඳුන්

11. සැරසිලි රටා සහිත රක්ත වර්ණ මැටි බඳුන්

අනුරාධපුර දැනට සිදු කර ඇති මැටි මෙවලම් අධ්‍යයනවල දී මැටි මෙවලම් ආශ්‍රිත කාල නිගමනයන් ලබාගත හැක්කේ ඇතුළුපුරය තුළිනි. ඇතුළුපුර AG 69 3A කාල පරිච්ඡේදය සඳහා කාල රක්ත වර්ණ මැටි භාණ්ඩ සරල රතු දුඹුරු භාණ්ඩ සමඟ හමුවන බව හඳුනාගෙන ඇත (Deraniyagala 1972 :85-88;106-120). ඒවා එසේ හමුවනුයේ ක්‍රි.පූ. දහ වැනි, නව වැනි, ශත වර්ෂවලට අයත් ස්තරවලිනි. ක්‍රි.පූ.700-500 අතර ASW 1 89 වැනි සන්දර්භය හා AMP 75 වැනි සන්දර්භ තුළින් මධ්‍ය ප්‍රමාණයේ අඩු දීප්තියකින් යුත් අළු පැහැ බඳුන් ද හමු වී ඇත. ඒවා උතුරු ඉන්දියාවේ සිට ආනයනය කරන්නට ඇති බව විශ්වාස කරන අතර (Deraniyagala 1990:257, 274-275) මෙම බඳුන් පශ්චාත් කාලයට අයත් රුලේටඩ් භාණ්ඩවලට සමාන යයි ද නිගමනය කර තිබේ. AG 69 13 A (i) ශෛලියට අයත් කැපීපෙනෙන පිඟන් භාණ්ඩ හස්තිනාපුර් උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (NBPW) 44 වැනි ශෛලියට සහසම්බන්ධතාවයක් පවතින බව දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1972 106-122). එම කාල පරිච්ඡේදය තුළ මධ්‍යම ගංගා නිම්නය ආශ්‍රිත NBPW පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කරන ප්‍රධාන ම න්‍යෂ්ටික මධ්‍යස්ථානය පිහිටා තිබී ඇත. මෙය ක්‍රි.පූ. හතර වැනි ශත





වර්ෂයට අයත් AG 85 සංසිද්ධි අංක 15 ට අයත් NBPW පිඟන් භාණ්ඩ ක්‍රි.පූ. දෙ වැනි ශත වර්ෂයේ ADB සංසිද්ධි අංක 54 රුලේටඩ් භාණ්ඩ සමඟ පරිහරණය වී ඇත. ඒ අනුව ක්‍රි.පූ. හතර වැනි ශත වර්ෂයේ සිට ගංගා මිටියාවතේ නාගරික සංස්කෘතික සංකීර්ණයන් සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධතා පැවත් වූ බව මෙයින් තහවුරු වන බව දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1992:711). දැරණියගල ප්‍රකාශ කර ඇති ආකාරයට ASW1 සංසිද්ධි අංක 79,78 ADB සංසිද්ධි අංක 57, AG 85 සංසිද්ධ අංක 14 ක්‍රි.පූ. පස් වැනි ශත වර්ෂයේ සිට හතර වැනි ශත වර්ෂය දක්වා කාලයට අයත් වන සංසිද්ධි බැවින් ඒවා ක්‍රි.පූ. දෙ වැනි හෝ ඊට ආදි කාලයට අයත් රුලේටඩ් භාණ්ඩවල දින නියම කිරීම සඳහා භාවිත කිරීම නිවැරදි බව පෙන්වා දී තිබේ (Deraniyagala 1990:258,712.719).

ප්‍රාග් ජේතවනාරාම අවධියට හා ජේතවන අවධියට අයත් ජනාවාස තොරතුරු අධ්‍යයනයේ දී එම ස්තර ආශ්‍රිත ව ලැබෙන්නා වූ පබළු පිළිබඳ අධ්‍යයනය කිරීම ද අතිශයින්ම වැදගත් වේ. විශේෂයෙන් ම මෙහි දී කානීලියන් පාෂාණය උපයෝගී කර නිර්මාණය කර ඇති පබළු වැඩි වශයෙන් වාර්තා වී තිබේ. කානීලියන් පබළු නිර්මාණය සම්බන්ධ පැරණිත ම තොරතුරු අනුරාධපුරය ඇසුරෙන් වාර්තා වනුයේ ගෙඩිගේ කැණීමේ (AG 69) 3 B ස්තරය තුළිනි (Deraniyagala 1972 :139). කානීලියන් පාෂාණය පබළු නිෂ්පාදනය සඳහා ඉන්දීය අර්ධද්වීපය තුළ ක්‍රි.පූ. 800-100 අතර කාලයේ භාවිත කර ඇති බව මාස්කි (Maski) සහ පෝර්කලම් (Porkalam) යන මෙගලිතික සන්දර්භවලින් හඳුනාගෙන ඇති බව රොමිලා තාපර් පෙන්වා දී ඇත (Thapar 1952 :15). මෙම කාලයට සමගාමී ව කානීලියන් පබළු ලංකාවේ පොම්පරිප්පුවල දී ද පරිහරණය කර ඇති බව පී.ඊ.පී. දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala, P.E.P 1958 :17). කානීලියන් පාෂාණය ශ්‍රී ලංකාවෙන් ස්වභාවික ලෙස සොයාගත නොහැකි බව පාකර්ගේ මතයයි (Parker 1885 :85). එම පාෂාණය ඉන්දියාවේ ගුජරාට් හා ගුන්තූර් අයිහෝල් ප්‍රදේශවලින් ආනයනය කරන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ (Wheeler 1946 :123). ගෙඩිගේ

කැණීමෙන් හමු වී ඇති පබළු තැනීමෙන් ඉතිරි වූ පාෂාණ පතුරු (ලීළු) මඟින් ඇතුළුපුරයේ කානීලියන් නිෂ්පාදන මධ්‍යස්ථානයන් තිබෙන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ (Deraniyagala 1972:13). මෙ වැනි නිෂ්පාදන මධ්‍යස්ථාන පොම්පරිප්පුවේ ද පැවති බව විශ්වාස කරන අතර (Seneviatne 1984:277) ඉබ්බන්කටුවේ භූමදාන කුටිවලින් කානීලියන් පබළු විශාල ප්‍රමාණයක් ලැබී තිබීම තුළින් (සෙනෙවිරත්න 1996 :18) ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ සංස්කෘතිය තුළ එම පාෂාණය නම්බුකාර වස්තුවක් ලෙස සලකන්නට ඇතැයි සෙනෙවිරත්න පෙන්වා දී ඇත (එම). අනුරාධපුරයේ ක්‍රි.පූ. හය වැනි සියවසේ යැයි කාලය නියම කළ හැකි ස්තරවලින් කානීලියන් පබළු නිෂ්පාදනය කළ බව හඳුනාගෙන ඇති බැවින් අනුරාධපුරයේ දී නිෂ්පාදිත පබළු ඉබ්බන්කට්ටුවට ගෙන එන්නට ඇතැයි සෙනෙවිරත්න විශ්වාස කරයි (එම). විශේෂයෙන් ම මෙම අර්ධ මාණික්‍ය ඛනිජ පාෂාණය පරිසර කලාප දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර හුවමාරු කෙරුණු ද්‍රව්‍යයක් වන බැවින් ශ්‍රී ලංකාවේ අනෙකුත් පූර්ව ඓතිහාසික ස්ථාන වෙත ඇදී ගිය බව මහාශිලා සුසාන තුළින් වාර්තා වන ද්‍රව්‍ය තුළින් පැහැදිලි වේ (එම). අනුරාධපුරයේ මෙන් ම තිස්සමහාරාමයේ අකුරුගොඩ ජනාවාසයෙන් ද කානීලියන් පබළු වාර්තා වී ඇත (Hannibal 2001:207). AG 69 ගෙඩිගේ කැණීම අනුව කානීලියන් අනුරාධපුරයෙන් බහුල ලෙස භාවිත කිරීම පදනම් මුල් ඓතිහාසික අවධිය (Basal Early Historic 600-500 BC) තුළ දී සිදු වී ඇත. එසේ හෙයින් පබළු භාවිතාව, ඒවා නිෂ්පාදනය කිරීම සම්බන්ධ ව තොරතුරු ඇතුළුපුරයෙන් හමුවීම ඔස්සේ එම ඛනිජ පාෂාණයේ උපයෝගීතාවය සම්බන්ධ වැදගත් උපකල්පනයන්ට පැමිණීමට අවකාශ සැලසේ.

ජේතවන විහාරය ආශ්‍රිත ව විශේෂයෙන් ම වැලිමළුව සලපතර මළුව හා ස්තූපයට උතුරින් පිහිටන බැස්ටියන් විශ්‍රාම ශාලාව අසළ කැණීම්වල දී මෙන් ම බෝධිඝරය අසළ කැණීම්වල දී කානීලියන් පාෂාණය උපයෝගී කර නිර්මාණය කරන ලද පබළු හා පබළු නිර්මාණයේ දී ඉතිරි වන්නා වූ ශේෂිත කොටස් විශාල ප්‍රමාණයක් හමු වී තිබේ. JSP I 2000 **සංසිද්ධි අංක 42,43,45,46**





යන සංසිද්ධිවලින් කානීලියන් මෙන් ම ඇමතෙස්ත පාෂණයට අයත් පතුරු කොටස් (Waste) හමු වී තිබේ. JBOP 2005, **සංසිද්ධි අංක 31** හා JSWMP 2003 **සංසිද්ධි අංක 14,15** යන සංසිද්ධිවලින් ද කානීලියන් හා ඇමතෙස්ත මෙන් ම ඇගේට් වර්ගයේ පබළු ද, රඹස් පබළු ද වාර්තා විම බෙහෙවින් ම වැදගත් වේ. මෙම ඛනිජ පාෂාණ ආශ්‍රිත පබළු ජේතවන භූමිය ආශ්‍රිත ව නිර්මාණය කිරීමේ දී දේශීය මෙන් ම විදේශීය සම්භවයක් ඇති ඛනිජ වර්ග අමුද්‍රව්‍ය ලෙස ඒවා අන්තර්ගත ස්වභාවික නිධි පිහිටි ප්‍රදේශවලින් ලබා ගන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. විදේශීය ඛනිජ පාෂාණ භාණ්ඩ හුවමාරු සම්බන්ධතා ඔස්සේ ඉන්දියාවේ බටහිර හා නිරිතදිග ප්‍රදේශවලින් ආනයනය කරන්නට ඇත (මල්කාන්ති 2008:14). සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ ස්වභාවික නිධි මගින් ඛනිජ අත්පත් කර ගැනීම නිෂ්කරණය හා ඒවා නිෂ්පාදනයට යොමු වීම පූර්ව ඓතිහාසික අවධියේ සිට සිදු වී තිබේ (සෙනෙවිරත්න 1996:18). විශේෂයෙන් මෙම ක්‍රියාදාමය ඉහළ කලා ඔය පද්ධතිය ආශ්‍රයෙන් නිත්‍ය ජනාවාස පිහිටුවීමේ ආරම්භක කාලය සිට දක්නට හැකි ය (එම). ඉහළ කලා ඔය පද්ධතියේ වාසභූමි අවශේෂ අනුව බලන කල මෙම කාල වකවානුවේ දී ප්‍රදේශගත සම්පත් ප්‍රයෝජනයට ගැනීම පෙරට වඩා සැලසුම් සහගත ලෙස සිදු කර තිබේ. ක්ෂුද්‍ර හා සාර්ව පරිසරය ගැන වඩා හොඳ අවබෝධයන් එ කල සිට පැවති බව ඉන් පෙන්නුම් කෙරේ (එම). විකිරණමාන කාලනියම කිරීම් මඟින් ඉබ්බන්කටුව වාසභූමිය ක්‍රි.පූ.හතර හා හත් වැනි සියවස් තරම් ඈතට දිව යන අතර තැනිතලාවල තිබූ අයස් සමයේ වාසභූමි ගණනාවකින් අමුද්‍රව්‍ය සඳහා නිතිපතා එළැඹි ඉල්ලුම හේතුකොට ගෙන එ වැනි ප්‍රදේශවල වඩා තැන්පත් ලෙස පදිංචි වීමට අවශ්‍ය වන්නට ඇත. අනුරාධපුර ඇතුළුපුරයේ කරන ලද කැණීම් තුළින් ක්‍රි.පූ. 500 පමණ කාලයේ දී එම ස්ථානයට ගෙනෙන ලද ඛනිජවල විවිධත්වය වැඩිවීමට එම කරුණු බලපා තිබේ (Deraniyagala 1972 :134-139).

ඇතුළුපුර පමණක් නොව ඒ අවට හාත්පස ප්‍රදේශවල ද නිමි පබළු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ක්‍රියාත්මක වීමට

ඇති බව පබළු නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධ කාර්මික ශේෂ ජේතවනාරාම භූමිය තුළින් හමුවීමෙන් ද පැහැදිලි වේ. පබළු නිර්මාණය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කැබැල්ලේ සිට අවසාන නිමැවුම වන නිමි පබළුව දක්වා ම වූ විවිධ තාක්ෂණික පියවර (Technology Stages) ජේතවන භූමිය ආශ්‍රිත කැණීම් තුළින් හඳුනාගෙන තිබීම නිසා ජේතවනය ඇසුරෙන් දෙස් විදෙස් ඛනිජ පාෂාණ හා වීදුරු උපයෝගී කර ගෙන පබළු නිෂ්පාදන කටයුතු සිදු කර ඇති බව මැනවින් පැහැදිලි වේ. එම ක්‍රියාවලියට අයත් පහත සඳහන් පියවරයන් ජේතවනයෙන් හඳුනාගත හැකි ය.

- පබළුවේ අවශ්‍ය මූලික හැඩය ලබාගත් අවස්ථා
- හැඩය ලබාගැනීමේ දී ඉවත් කළ කුඩා පතුරු
- ඔපකළ එහෙත් සිදුරු නොවිදින ලද පබළු
- හොඳ නිමාවක් සහිත සිදුරු විදින ලද පබළු
- එක් පසෙකින් පමණක් සිදුරු විඳ නිමකර නොමැති පබළු (මල්කාන්ති 2008:17).



කානීලියන් කැබලි








පතුරු ඉවත් කිරීමෙන් පබළුවේ මූලික හැඩය ලබා ගත් අවස්ථාවක්



හැඩය ලබාගැනීමට ඉවත් කරන ලද පතුරු කැබලි



ඔප කරන ලද එහෙත් සිදුරු  නොවිඳින ලද පබළු



නිර්මාණ කාර්යය පූර්ණත්වයට පත්
කරනු ලැබූ පබ

(මල්කාන්ති :2008)

ඡායාරූප අංක 4.2
ජේතවනයෙන් හමු වූ කානීලියන් පබළු නිෂ්පාදනයට සම්බන්ධ කාර්මික කටයුතුවලට අඳාළ පියවරයන්

ජේතවනාරාමය ආශ්‍රිත ප්‍රාග් ජේතවන තැන්පතුව තුළින් ලැබී ඇති පබළු අතර වීදුරු පබළු ද ප්‍රධාන වේ. ඒ අතර විවිධ හැඩයන්ගෙන් සමන්විත විදුරු පබළු රාශියක් හමු වී තිබේ. ඒවා නිල්, කොළ, දුඹුරු හා සුදු ආදී වර්ණවලින් නිර්මාණය කර ඇත (මල්කාන්ති 2008 :09). ඇතුළුපුරයේ AG 69 කැණීමේ 1 *a* (i), 1 *b* (i), 1 *c* (i), 2 *a* (ii), 2*b* 2*c* (i), 3 *a* (i), 3*b* (i), 4*a* (i), 4 *b* (i), 5 *a* (i), 5 *b* (i) , 5 *C* (i) ආදී වර්ගවලින් යුත් වීදුරු පබළු ක්‍රි.පූ. 350-100 අතර කාලයේ භාවිත වී ඇත (Deraniyagala 1972 :136). දැරණියගලගේ විග්‍රහ කිරීම් අනුව මෙම හැඩවලට සමාන හැඩ පබළු වර්ග, උජ්ජේන් (Ujjain), අහිඡත්‍ර (යසජයජය්චර්* හා හස්තිනාපුර් (Hastinapur) කැණීම්වල දී ද වාර්තා වී තිබෙන බව සෝෂ්, ඩික්සිත් හා ලාල් වැනි ඉන්දීය විද්වත්හු පෙන්වා දී ඇත (එම). දැරණියගලගේ 1972 පබළු වර්ගීකරණයට අනුව එහි සඳහන් හැඩවලට සමානතා ඇති පබළු වර්ග ජේතවන විහාර භූමිය ආශ්‍රිත ව ප්‍රාග් ජේතවන ස්තර තුළින් වාර්තා වි තිබේ.





ජේතවනයෙන් හඳුනාගත් ඇතුළුපුරයට සමාන හැඩ අතර *2a, 2b, 2c, 4a, 4b, 5a, 5b, 8a, 8b, 9a, 9b yd 10 a,10b* හැඩති පබළු තිබේ. මේ අතරින් දුඹුරු, නිල් හා කොළ පැහැති වීදුරු පබළු සුවිශේෂ වන අතර විශේෂයෙන් නිල් වීදුරු භාවිතය ඇතුළුපුර ජනාවාසය තුළ මධ්‍ය මුල් ඓතිහාසික අවධිය තුළ දී (Mid- Early Historic 250 BC – 100 AC) සිදු වී තිබේ (Deraniyagala 1992:712). ඉන්දීය පුරාවිද්‍යාඥයින් පෙන්වාදී ඇති ආකාරයට වීදුරු පබළු නිර්මාණයේ දී භාවිත කරන තාක්ෂණික අවස්ථා රැසක් ජේතවන වීදුරු පබළු එකතුව තුළින් ද හඳුනාගත හැකි ය (Lal 1958 :142).[2]

වීදුරු පබළු නිර්මාණය කිරීම සම්බන්ධ පියවරයන් ද ප්‍රාග් ජේතවන ස්තරයන්ට අදාළ ව වාර්තා වී තිබේ. එම පියවරයන්ට අදාළ ද්‍රව්‍යමය සාධක රැසක් වාර්තා වී තිබේ.

- වීදුරු උණු කිරීමෙන් අනතුරු ව සිසිල් වූ ශේෂ වූ කැබලි (Glass Pieces)
- වීදුරු උණු කිරීමේ දී හැළුනු වීදුරු කැටිති (Glass Noduls)
- උණු වීදුරුවලින් ඇඳගන්නා ලද නල ශේෂ (Glass tubes)
- අඳින ලද නල මගින් පබළුවේ අවශ්‍ය ප්‍රමාණයට කපා ගත් පෙති කැබලි (Glass Tube Slice)
- එම පෙති කැබලි නැවත යම් පමණක උෂ්ණත්වයකට භාජනය කර ඔප කර ගත් අවසාන නිමැවුම වන නිමි පබළු (Finished Beads) (එම : 09-10).

2 පබළු නිර්මාණය සඳහා වීදුරු සකස් කිරීම ඉතා සංකීර්ණ කාර්යයකි. ඒ සඳහා ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙස සිලිකා යොදා ගන්නා අතර එයට ශාක පිළිස්සූ අළු මිශ්‍රකර උණු කිරීම සිදු කරයි. වීදුරු වර්ණ ගැන්වීමේදී තඹ ඔක්සයිඩ (කැචචැර ධංසාැ) භාවිත කිරීම ද කැපීපෙනේ . විශේෂයෙන් ම විවිධ වර්ණයන් ලබා ගැනිමේ දී පහත සඳහන් ලෝහ ඔක්සයිඩ වර්ග මිශ්‍ර කිරීම සිදු කර ඇත.
- නිල් කහ කොළ - යකඩ ඔක්සයිඩ
- රතු තැඹිලි - තඹ, ඊයම් ඔක්සයිඩ, මැංගනීස්
- පැහැදිලි වීදුරු - මැග්නීසියම් ඔක්සයිඩ

(මල්කාන්ති 2008:09 ත ꞉සනියසළු 1952 :58 ත ත්බජසි 1987:12-17 ත ණමප්ර 2001:100-104).

මේ ආකාරයට වීදුරු පබලු නිර්මාණය සම්බන්ධ ව තොරතුරු ප්‍රාග් ජේතවනාරාම ජනාවාස ඇසුරෙන් JSWMP 2004 සංසිද්ධි අංක 13 හමු වේ. JSMP 2001 සංසිද්ධි අංක 102,103 JBOP 2005 සංසිද්ධි අංක 34,42, JSP 2000 සංසිද්ධි අංක 41,42 වාර්තා වී ඇත.



උණු වීදුරු සිසිල් වීමෙන් ශේෂ වූ කැබලි



උණු වීදුරුවලින් සැදි බින්දු කැටිති







පබළු නිෂ්පාදනයේ දී එකිනෙකට ඇලී ඇති පබළු



පබළු නිෂ්පාදනයට සකස් කර ගෙන ඇති නළ කොටස



විවිධ වර්ණවලින් යුතු වීදුරු නිමි පබළු

(මල්කාන්ති : 2008)

ඡායාරූප අංක 4.3

ජේතවනය හමුවුණු වීදුරු පබළු නිෂ්පාදන කටයුතු සම්බනධ කාර්මික සාධක සහ නිමි පබළු

ප්‍රාග් ජේතවන ජනාවාස ස්තර තුළින් හමුවන භෞතික සංස්කෘතික තොරතුරු අතරබ ලෝහ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ තොරතුරු වාර්තා වීම ද කැපීපෙනේ. ඒ අතර තඹ බොර, යබොර, ලෝහ උණු කිරීමට භාවිත කරන ලද උඳුන්, කෝව ආදී සාධක JSMP 2001/2002 JSWMP 2003/2004, JSOWP 2003 යන කැණීම්වල දී ඉහත සංසිද්ධිවලින් ම වාර්තා වී තිබේ (මැන්දිස් 2009:21). මෙම භෞතික සංස්කෘතික තොරතුරුවල තත්ත්වය වඩා නිවැරදි කරගනු වස් ඇතුළුපුර කාල නිර්ණ වෙත අවධානය යොමු කිරීමේ දි 'ඨ 69 ගෙඩිගේ කැණීමේ 3

ස්තරයෙන් තඹ බොර (Copper Slag), ඇණ (Nail), පිහිතල (Knife) ආදිය හමු වී තිබීම සැලකිල්ලට ගැනීමේ දී (Deraniyagala 1972 :145,152). අර්ධද්වීපික ඉන්දීය මෙගලතික සමූහයන් සමඟ සම්බන්ධතා තිබෙන බව දැරණියගල හා සෙනවිරත්න පෙන්වා දී ඇත (Deraniyagala 1972 : 155 ; Seneviratne 1984 :272). ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියේ භාවිත කර තිබෙන ලෝහ සම්පත් අතර හෙමටයිට් ($Fe_2O_3$) (Hematite) හා ලිමොනයිට් ($Fe_2O_3H_2O$) (Limonite) මෙන් ම මැග්නයිට් ($Fe_3O_4$) (Magnetite) ප්‍රධාන වේ (Seneviratne 1992:03). මෙම අමුද්‍රව්‍ය අතර හෙමටයිට් හා ලිමොනයිට් ශ්‍රී ලංකාවේ වයඹ ප්‍රදේශයේ දී පොළොව මතුපිටින් නිධිගත වී ඇති බව පර්යේෂණවලදී තහවුරු කර තිබේ (Seneviratne 1984 :272). ක්‍රි.පූ. 950 - 800 අතර කාලයේ විශේෂයෙන් ම අර්ධද්වීපික ඉන්දියාවෙන් හඳුන්වාදුන් තාක්ෂණික මාධ්‍යයක් වූ ලෝහ තාක්ෂණය යාපන අර්ධද්වීපයේ කන්තරෝදෙයි, අනුරාධපුර ඇතුළුපුර, කොක්විබේ, ගුරුගල්හින්න, තම්මැන්නා ගොඩැල්ල, ඉබ්බන්කටුව, තිස්සමහාරමය හා මහාතිත්ථ ආදී ප්‍රදේශවලින් පරිහරණය වූ බව හඳුනාගෙන ඇත (Seneviratne 1984 :273 ; 1995 :19). වඩා පුළුල් ලෙස ගත් කළ ශ්‍රී ලංකාව පුරා ම පූර්ව ඓතිහාසික අවධිය තුළ දී ලෝහ පරිහරණය ඉතා සීඝ්‍ර ලෙස සිදු වී තිබේ. අනුරාධපුර ඇතුළුපුරයේ මෙන් ම ප්‍රාග් ජේතවන අවධිය තුළ දී ද පැරණි නගරය ආශ්‍රිත ව ලෝහ සම්පත් පරහරණය වූ බවට සාධක හඳුනාගෙන ඇත. කේන්ද්‍රීය ප්‍රදේශය ලෙස ඇතුළුපුරයේ පැවති තත්ත්වයන්ට යම් ගාමක බලයක් ජේතවනය වැනි කාර්මික ස්ථානවලින් ලැබෙන්නට ඇති බව පෙන්වා දිය හැක.








ඡායාරූප අංක 4.4

ප්‍රාග් ජේතවන ස්තරවලින් හමු වූ ලෝකුරු කම්හලක් තුළ වන උදුන්



ඡායාරූප අංක 4.5

ප්‍රාග් ජේතවන ස්තවලින් හමු වූ ලෝහ උණු කිරීමට භාවිත කළ විවිධ හැඩයන්ට අයත් කෝව කොටස්



ඡායාරූප අංක 4.6

ප්‍රාග් ජේතවන ස්තර තුළින් හමු වූ ඊතල හිසක් සහ ලෝහ නිස්සාරණයෙන් අනතුරු ව ඉතිරි වූ ලෝහ බොර

ජේතවන ආංශුක භූමිය ආශ්‍රිත පුරා ජනාවාස රටාව අධ්‍යයනයේ දී ප්‍රාග් ජේතවන ස්තර තුළින් ලැබී ඇති සත්ත්ව අස්ථි පිළිබඳ සාධක ඉතා වැදගත් වේ. ප්‍රාග් ජේතවන අවධියට අයත් පාංශු ස්තරවලින් හමු වී ඇති සත්ත්ව අස්ථි විශ්ලේෂණ කටයුතු පසුගිය වසර කිහිපය තුළ දී පුරා සත්ත්ව අස්ථි විශ්ලේෂකයින් දෙනෙකු වන ආර්.එම්.එම්.චන්ද්‍රරත්න හා කැළුම් මනමේන්ද්‍ර ආරච්චි විසින් සිදු කරන ලදි. එම විශ්ලේෂකයන් විසින් සිදු කර ඇති අධ්‍යයනයන් උපයෝගී කර ගනිමින් එම අස්ථි පිළිබඳ විමර්ශනය කිරීම ඔස්සේ පුරාණ ජනාවස රටාව අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ.

අදින් වසර 5850කට පමණ පෙර අනුරාධපුරයේ ජීවත් වූ මධ්‍ය ශිලා මානවයින් එළිමහන් වාසස්ථාන (Deraniyagala 1992 :700). ප්‍රදේශය පුරා පැතිර ඇති මෝසම් වනාන්තර (Monasoonal forest) ආශ්‍රිත පරිසරයක ක්‍රියාත්මක කර ඇත (මනමේන්ද්‍රආරච්චි 2009:116). මෙ වැනි වන ආවරණ තුළ රංචු වශයෙන් ජීවත්වන කුර සහිත සතුන්ගේ අධික ගහණයක් ඇති බැවින් යැපීම් ධාරිතාව (Carring Capacity) ඉතා ඉහළ අගයක් ගනී (එම). වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර සහිත තත්ත්වයන් විශේෂයෙන් ම ප්‍රාග් ඓතිහාසික මානවයින්ගේ එළිමහන් වාසස්ථාන නිර්මාණයට බලපානු ලැබ තිබේ (Ashton at.el. 1997 :432). ජේතවනය ආශ්‍රිත ව JSMP 2002 සංසිද්ධි අංක 67 හා JSOWP 2003 සංසිද්ධි අංක 26 හා JSWMP 2003 සංසිද්ධි අංක 18 යන සංසිද්ධි තුළින් මධ්‍ය ශිලා අවධියට අයත් විය හැකි ශිලා මෙවලම් හමු වී තිබේ. එම සංසිද්ධි තුළින් ශ්‍රී ලංකා වළිකකුළා (*Galluslafuyettii*) හා මොණරාට (*Pavorcristatus*) අයත් අස්ථි සාධක ලැබී තිබේ (මනමේන්ද්‍රආරච්චි 2009 :117).

ශ්‍රී ලංකා වළි කුකුළා අප රටට ආවේනික පක්ෂියකු වන අතර ප්‍රාග් ඓතිහාසික සමයේ සිට ම එම සතා මිනිසාගේ ප්‍රියත ම ආහාරයක් වී තිබේ (එම 128). වළිකුකුළු දඩයම සම්බන්ධ තොරතුරු ලංකාවේ අනෙකුත් ප්‍රාග් ඓතිහාසික ස්ථානවලින් ද වාර්තා වී තිබෙන බැවින් (එම : 128) ජේතවන පරිශ්‍රයෙන් හමු වී ඇති වළිකුකුළු අස්ථි හා මොණරාට අයත් අස්ථි කොටස් සමහර





විට මෙම භූමිය තුළ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් විසින් දඩයම් කර ආහාරයට ලබා ගත් සතුන්ගේ අස්ථි කොටස් වීමට බෙහෙවින් ම ඉඩ පවතින බව මනමේන්ද්‍රආරච්චි විශ්වාස කරනු ලැබේ (එම). කෙසේ වෙතත් ජේතවන සෘජු පාංශු කලාපයෙන් එ තරම් ප්‍රමාණයක් සත්ත්ව අස්ථි වාර්තා වී නැත.

ජේතවන පරිශ්‍රය තුළින් සත්ත්ව අස්ථිවල බහුල හමුවීමක් JSWMP 2003 සංසිද්ධි අංක 16, JSWOP 2003 සංසිද්ධි අංක 24 JSMP 2001 සංසිද්ධි අංක 102,103 JSP 2000 සංසිද්ධි අංක 41, 46 තුළින් වාර්තා වේ. මෙම සංසිද්ධි තුළින් විශාල වශයෙන් විවිධ සත්ත්ව වර්ගවලට අයත් අස්ථි වාර්තා වී තිබේ. එම සත්ත්ව වර්ග අතර මත්ස්‍යයින්, උරගයින්, කුරුල්ලන් මෙන් ම ක්ෂීරපායීන්ට ද අයත් අස්ථි පවතින බව හඳුනාගෙන තිබේ. ප්‍රාග් ජේතවන අස්ථි ගොනුවේ ඇති මත්ස්‍ය සැකලි අතර ආඳ *(Anguillasp)*, මස්පෙතියා *(Puntiussarana)*, දම්කොළපෙතියා *(Puntiussinghala)*, අංකුට්ටා *(Mystussp)*, මහවලයා *(WallagoAtta)*, මගුරා (*Clariasbrachysoma)*, හුංගා *(Iteterop Hnustesfossilis)* ලූලා *(Channa Striata)* ආදී මත්ස්‍යයින්ට අයත් සැකිළි සාධක ලැබී තිබේ (එම). එසේ ම වාර්තා වී ඇති උරග වර්ග අතර කිඹුලා (*crocodylusp*) ගල්ඉබ්බා (*Melanochelys trijuga*), කිරිඉබ්බා (*Lissemys punctata*), තලගොයා (*Varanus bengalensis*) ආදී සතුන්ට අයත් අස්ථි වාර්තා වී ඇත (එම).

පක්ෂීන් අතර ශ්‍රී ලංකා වලිකුකුළා (*Galluslafuyeti*), මොණරා (*Pavocristatus*), ගෘහ අශ්‍රිත කුකුළා (*Gallussp*) ද ක්ෂීරපායීන් අතර කබල්ලෑවා (*Maniscrassicaudata*), ගෝනා (*Carvasunicolor*) ශ්‍රී ලංකා රිලවා (*Macacasinica*), හැලි වඳුරා (*Semnopithecus priam*), උගුඩුවා (*Paradoxcurussp*), තිත්මුවා (*Axis axis*), ගවයා (*Bos sp*), වල් ඌරා (*sus scrofa*), වල්මීමා (Vuvalas Arnee migona) බල්ලා (*Canis familiaris*), වැලිමුවා (*Mamtuntiacus muntjak*), ඉත්තෑවා (*Hgstrix indica*), වල් හාවා (*Lepus nigricoilis*) පෝනියා/අශ්වයා (*Equus caballas*) වාර්තා වී තිබේ (මනමේන්ද්‍ර ආරච්චි 2009:117-155).

JSMP 2001, JMLP 2007, JPL 2002, JSP II 2000 කැණීම් ආශ්‍රිත සත්ත්ව විශ්ලේෂණ කටයුතු චන්ද්‍රරත්න විසින් ද සිදු කර තිබෙන අතර ඔහු විසින් ප්‍රාග් ජේතවන ජනාවාස ස්තර ආශ්‍රිත ව තිත්මුවා, මීහරකා, වල්ඌරා, බල්ලා, ගෝනා, හාවා, කිරිඉබ්බා හා මත්ස්‍ය විශේෂවලට අයත් සතුන් වාර්තා වී ඇති බව පෙන්වා දී තිබේ (චන්ද්‍රරත්න 2008:12). JSMP 2002 කැණීමෙන් වාර්තා වී ඇති සත්ත්ව අස්ථි 263 ක් විශ්ලේෂණය කර තිබෙන චන්ද්‍රරත්න එහි II වැනි අවධිය (2nd phase) හා ෂෂෂ අවධිය (3rd phase) තුළින් බල්ලා*(Canis familiaris)*, ගවයා*(Bos sp)*, තිත්මුවා *(Axis axis)*, ගෝනා *(Cervus unicolor)*, වල් ඌරා *(sus scrofa)*, වල් හාවා *(Lepus nigricolis )*, කිරි ඉබ්බා *(Lissemys punctata)* ආදී සතුන්ට අයත් අස්ථි වාර්තා වී ඇති බව පෙන්වා දී තිබේ (එම :16).

සංසිද්ධි අංක 102 වල් ඌරකුගේ පුරාස්ථියක් (Radius) තිත් මුවකුගේ ජංඝාස්ථියක් (Tibia) හමුවීම ඉතා වැදගත් වේ. එම අස්ථි කොටස් දෙකෙහි ම කැපුම් සළකුණු දැකගත හැකි බැවින් මෙම ස්ථානයේ දී ආදී ජනපදිකයින්ගේ ජීවන රටාව තුළ එම සතුන් ආහාර වශයෙන් භාවිත කිරීමට ඇතැයි ඔහු පෙන්වා දී තිබේ (එම : 18). විශේෂයෙන් ම JSMP 2001 III වන අවධිය තුළින් සංසිද්ධි අංක 81 සිට 94 දක්වා වූ සංසිද්ධි තුළ දී සතුන්ගේ විවිධත්වය වැඩි වූ බව පෙන්වාදෙන චන්ද්‍රරත්න එය මෙම භූමියේ මානව ජනාවාසකරණය පුළුල් වූ බව පැහැදිලි ලක්ෂණයක් බව පෙන්වා දී ඇත (එම 18-20).

ජේතවන විහාර භූමිය ආශ්‍රිත කැණීම්වල දී JSWMP 2003 දකුණු වැලිමළුව කැණීමේ දී සංසිද්ධි අංක 14,15,16 සංසිද්ධි තුළින් ගවයා (*Bos.sp.*), කවච බෙලලන් (ගැස්ට්‍රොපෝඩාවන්), කිරිඉබ්බා (*Lissemys punceata*) යන සත්ත්ව විශේෂ ද JSWMP 2004 උතුරු වැලි මළුව කැණීමේ දී ගවයා (*Bos sp*), වල් ඌරා (*Sus scrofa*), ගල් ඉබ්බා (*Melanochelys trijug*), තිත්මුවා (*Axis axis*), මුගටියා (*Herpestes sp*) ආදී සතුන්ට අයත් අස්ථි වාර්තා වී තිබේ. මෙම සත්ත්ව විශේෂ බොහොමයක් අනුරාධපුරයේ ස්වභාවික පරිසරය තුළ ජීවත්වන අතර ජේතවනයෙන් හමුවන මෙම සත්ත්ව විශේෂ





අතරින් සමහර සත්ත්ව විශේෂ එ නම් බල්ලා, ගවයා, එළුවා, පෝනියා, මීහරකා ගෘහකරණයට (domastication) ලක් කරන ලද සතුන් බව මනමේන්ද්‍රආරච්චි පෙන්වා දී ඇත (මනමේන්ද්‍රආරච්චි 2009:148-152).

ජේතවන විහාර භූමිය ආශ්‍රිත හමු වී ඇති පැරණි ජනාවාසවලින් හමුවන සත්ත්ව විශේෂ අතර විශාලත ම අස්ථි ප්‍රමාණය වල් ඌරන්ට අයත් වේ. වල් ඌරාගේ මුළු ඇට සැකිළි පද්ධතිය ම නියෝජනය වන ආකාරයට දත්, දළ හා අනෙක් අස්ථි ශේෂ විශාල ප්‍රමාණයක් කැණීම්වලින් හමු වී තිබේ. ඉන් ඇතැම් ඒවා ඉතා සුළු වශයෙන් පුලුස්සා ඇති අතර තවත් සමහර ඒවා තුළ තියුණු ආයුධවලින් කරන ලද කැපුම් සලකුණු දැකගත හැකි ය (එම :120). විශේෂයෙන් ම මෙ මගින් පැහැදිලි වන්නේ ප්‍රාග් ජේතවන වැසියන් ඌරු මස් සිය ජීවනෝපාය පවත්වාගෙන යාමේ දී වැඩි උපයෝගීතාවයකින් භාවිත කර ඇති බවයි (එම). අනුරාධපුර ඇතුළුපුරයේ ද වල් ඌරන් පිළිබඳ ව සාධක හමුවන බැවින් ඔවුන් මෙම ප්‍රදේශයේ ගෘහකරණයට ලක් කරන්නට ඇතැයි මනමේන්ද්‍රආරච්චි පෙන්වාදෙයි (එම). එසේ ම මෙම සත්ත්ව අස්ථි ගොනුව අතර තිත් මුවන් ද සුලභ ව හමුවන බැවින් පුරාණ අනුරාධපුර පරිසරය ආශ්‍රිත ව එම සතුන් බහුල ව ජීවත් වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

ප්‍රාග් ජේතවන ජනාවාස ස්තර අතරින් හමු වී ඇති සුවිශේෂ අස්ථි අතර අශ්වයා සම්බන්ධ සාධක ද ඉතා වැදගත් වේ. අනුරාධපුර ඇතුළුපුර කැණීම්වලදී AG 85 ගෙඩිගේ කැණීමේ දී පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් ස්තර අතරින් අශ්වයා සම්බන්ධ සාධක හමු වී ඇත (Deraniyagala 1992 :709). කාබන් දින 14 කාල නිර්ණ ක්‍රමයට අනුව ඇතුළුපුරයෙන් හමු වී ඇති අශ්වයා පිළිබඳ සාධක ක්‍රි.පූ. 800-500 කාල පරිච්ඡේදයට අයත් වේ (එම :718). අශ්වයා ශ්‍රී ලංකාවට අනන්‍ය සත්ත්වයකු නොවන අතර ඉන්දියාවට ද අනන්‍ය සත්තවයකු නොවේ. කෙසේ වෙතත් පූර්ව ඓතිහාසික සමයේ දී අශ්වයා ක්‍රි.පූ. 800 න් පසු අනුරාධපුරයේ දී හඳුනාගෙන තිබෙන අතර අශ්වයා ගෘහකරණයට ලක්කරන ලද සතෙක් වශයෙන් පිළිගනු ලබයි. මෙසපොතේමියාවෙන් හා

චීනයෙන් ලැබෙන සාධක අනුව ක්‍රි.පූ. 2000 දී පමණ අශ්වයා එම කලාපවල ගෘහකරණයට ලක්කර තිබේ (Cevine at.el. 2005:5-22). ක්ලූටන් බොක් දක්වා ඇති අදහස්වලට අනුව මුලදී මස් පිණිස ඇතිකරන ලද අශ්වයා පසු කලෙක දී ගමනාගමනය සඳහා භාවිත කළ සතෙකි (Clutton Brock 1987:208). නිරිතදිග ආසියාවේ මුල් ඓතිහාසික සමයේ දී බූරුවෙකුට සමානතා ඇති සතෙකු ගෘහකරණයට ලක්කර ඇත. එම සතා *Equus hemionas* යන විද්‍යාත්මක නමින් හැඳින්වේ. මෙම විශේෂය ඉංග්‍රීසි බසින් Asia wild ass හෙවත් Kulan හෙවත් Onager යනුවෙන් ද හැඳින්වේ (මනමේන්ද්‍රආරච්චි 2009:123). ජේතවන විහාර පරිශ්‍රයේ JPL 2002 කැණීම මඟින් Equus ගණයට අයත් ඔනගර් සතෙකුගේ පුරශ්චාර්වක දතක් වාර්තා වූ බව චන්ද්‍රරත්න සඳහන් කර තිබේ (Chandraratne 2007:320-371). චන්ද්‍රරත්නගේ විග්‍රහ කිරීම් පිළිබඳ ගැටලුවක් පවතින බව පෙන්වාදෙන මනමේන්ද්‍රආරච්චි ඒ සඳහා විකල්ප අදහස් ඉදිරිපත් කරමින් ජේතවන විහාර පරිශ්‍රයෙන් හමු වූ සත්ත්ව අස්ථි අතර නිශ්චිත වශයෙන් අශ්වයින්ට අයත් අස්ථි තිබෙන බව පෙන්වා දී ඇත. ඒ අතර කෘන්තක දත් (incisor teeth), පුරස්චාර්වක දත් (Premmolar Teeth), චාර්වක දත් (molar Teeth) සහ එක් පුෂ්ඨ්‍රවය අස්ථියක් (astragalus bone) ආදී ලෙස අශ්වයා සම්බන්ධ නිදර්ශන 9 ක් ජේතවනයෙන් හමු වී ඇති බව පෙන්වා දී තිබේ. එම අස්ථි අතර ඔනගර් වර්ගයේ සතෙකුට අයත අස්ථි හමු නොවන බවත් හමු වී ඇති අස්ථි නිශ්චිත ලෙසට ම අශ්වයාට අයත් ඒවා බව ද මනමේන්ද්‍රආරච්චි පෙන්වා දී ඇත (මනමේන්ද්‍රආරච්චි 2009:126). අනුරාධපුර AG 85 කැණීමෙන් හමුවන (Deraniyagala 1992:218) අශ්ව දත පූර්ව ඓතිහාසික අවධියේ දී අනුරාධපුර ඇසුරෙන් අශ්වයා සම්බන්ධ ප්‍රබල සාක්ෂියක් වේ. ජේතවනාරාමයෙන් පූර්ව ඓතිහාසික අවධියේ අවසාන භාගයට අයත්යැයි උපකල්පනය කළ හැකි ස්තරවලින් අශ්වයා පිළිබඳ සාධක හමුවීම නිසා එම භූමිය ආශ්‍රිත ව මෙම සතා ජීවත් වී ඇති බව පැහැදිලි වේ.

එසේ ම ජේතවන පරිශ්‍රය තුළින් සමුද්‍රික සතුන්ට අයත් අස්ථි කොටස් හමුවීම ද වැදගත් වේ. ඒ අතර මෝර මත්ස්‍යයාට





අයත් කශේරුකාවක් සිදුරු කොට සකස් කරන ලද පබළු, මඩු මත්ස්‍යයාගේ වල්ගා කොටස් හා මුහුදු බෙල්ලන් හමු වීම තුළින් මන්නාරම හා පුත්තලම අතර වූ වයඹ දිග මුහුදු ක්ෂේත්‍රය ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ අන්තර් හුවමාරු රටා ප්‍රාග් ජේතවන වැසියන් ද ක්‍රියාත්මක කර තිබෙන බව එ මඟින් හඳුනාගැනීමට අවකාශ සැලෙස්.

ජේතවන විහාර භූමිය ආශ්‍රිත ස්තරායනය පිළිබඳ ව සිදු කරනු ලබන අධ්‍යයනයේ දී මීළඟට දැකගත හැකි පාංශු කලාපය තුළින් ප්‍රාථමික මට්ටමේ ගඩොළු ඉඳි කිරීම්, කාලරක්ත වර්ණ මැටි මෙවලම් (BRW) රක්ත වර්ණ මෙවලම් (RW), කාල වර්ණ මැටි මෙවලම් (BW), රුලේටඩ් වර්ගයේ මැටි මෙවලම් (RLW) හා විවිධ සංකේත අඩංගු මැටි මෙවලම්, නිල් වීදුරු පබළු ඇතුළු වීදුරු පබළු වර්ග, කානීලියන් හා ඇගේට්, රඹස් මෙන් ම තිරුවානා පාෂාණවලින් නිර්මාණය කර ඇති පබළු වර්ග, මුද්‍රා, ලක්ෂ්මී කාසි, ස්වස්තික කාසි හා හස් එබූ කාසි වර්ග වාර්තා වී තිබේ. ඇතුළුපුරයේ මෙම භෞතික සංස්කෘතික ද්‍රව්‍යය හමු වන්නා වූ සන්දර්භයන්ට AG 69, KTD 70 කැණීම් සාධක මගින් වාර්තා වී තිබේ. එම කැණීම්වලින් රුලේටඩ් වර්ගයේ මැටි මෙවලම්, බ්‍රහ්මී අක්ෂර සහිත මැටි මෙවලම්, මුද්‍රා, හස් එබූ කාසි, ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි, 10b (i) වර්ගයේ පබළු පුළුස්සන ලද ගඩොළු, 21*a (i)*, 23 *a (i)*, 24 *a (i)* වාර්තා වී තිබෙනුයේ මධ්‍ය මුල් ඓතිහාසික අවධිය තුළිනි (Mid–Early Historic 250B.C–100AC) (Deraniyagala 1992:712). ඉහත තොරතුරුවලට සමකාලීන තොරතුරූ තිස්සමහාරාමය, අම්බලන්තොට, මාතොට හා කන්තරොදේ යන ස්ථානවලින් ද වාර්තා වී තිබේ (Deraniyagala 1992:712- 713 ; Weisshar et.al.2001 205-277). ජේතවන භූමියෙන් ද හමුවන ලක්ෂ්මී කාසි, හස් එබූ කාසි හා ස්වස්තික කාසි උපයෝගී කර ගනිමින් සාපේක්ෂ වශයෙන් මෙම කාලය ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 100 මුල් ඓතිහාසික අවධියට අයත් කාල වකවානුව නියෝජනය කරන බව උපකල්පනය කළ හැකි ය. වංසකතා තොරතුරුවලට අනුව මෙම කාල පරාසය නගුල් කෘෂි කර්මාන්තයේ හා වාරි තාක්ෂණයේ කැපීපෙනෙන අවධිය හා

මහා දාගැබ් ඇතුළු දැවැන්ත බෞද්ධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ බිහිවන කාලය බව පෙනේ (*මව.*පරි,xv,xvi, xvii, xxviii ; *වංසපතා* xv,xvi,xvii,xviii). මූලාශ්‍රයගත තොරතුරු හා පුරාවිද්‍යා සාධක උපයෝගී කර ගෙන ජේතවන විහාර භූමිය ආශ්‍රිත ව වාර්තා වී ඇති ඉහත විස්තර කරන ලද භෞතික සංස්කෘතික තොරතුරු තුළින් මුල් ඓතිහාසික සමයේ දී ජේතවන විහාර භූමිය යම් ආකරයකට විස්තෘත වශයෙන් ජනාවාසකරණයකට ලක් වී ඇති බව උපකල්පනය කළ හැකි ය.

මහාවංසයට හා මහාවංස ටීකාවට අනුව එවකට වත්මන් ජේතවන භූමිය හඳුන්වා ඇත්තේ නන්දන උයන වශයෙනි (*මව* xv:05 *වංසපකා.* xv:202). නන්දන උයන පුරයේ දකුණු දිගින් පිහිටි බව දීපවංසයේ හා මහාවංසයේ මෙන් ම සමන්තපාසාදිකාවේ සඳහන් වේ.[3] නන්දන උයන එවකට රාජකීය උයනක් ව පැවති බව සඳහන් වේ. එසේ ම නන්දන උයනට දකුණු දිගින් **කුම්බකාරාග්‍රාමය** පිහිටි බව සද්ධර්මාලංකාරයේ හා මහාවංස ටීකාවේ සඳහන් වේ (*සද්ධර්මා.* 486 ; *වංසපකා.* 383). ඒ අනුව අනුරාධපුර නගරයේ දකුණු දිග භූමිය ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ වන විට යම් ආකාරයකට ග්‍රාම තත්ත්වයන් නිර්මාණය වී ජනාවාසකරණයට ලක් ව තිබූ භූමියක් බව මූලාශ්‍රය කරුණු අනුව ද උපකල්පනය කළ හැකි ය.

වංසකතා තොරතුරු අනුව අනුරාධපුර නගරයේ දකුණුපස මුල් ම ද්වාරග්‍රාම පණ්ඩුකාභය රජ දවස පිහිට වූ බව සඳහන් වේ (*මව.* x:88 ත *දීවසං*:36). ද්වාරග්‍රාම දීපවංසය විස්තර කර ඇත්තේ **අන්තරාපාන** ලෙස ය (*දීව.* ix : 36). පුරාණ ඉන්දියාවේ ද ප්‍රධාන නගරය ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ මෙ වැනි ග්‍රාම **නිගම** වශයෙන් අර්ථ දක්වා ඇති බව පරණවිතාන පෙන්වා දී තිබේ (*Ez,*vol. iii:181). අනුරාධපුරයේ ද පසුකාලීන ව මෙ වැනි නිගමස්ථාන ක්‍රියාත්මක වී ඇති බව ලබුඇටබැඳිගල හා තෝනිගල ශිලා ලේඛනවල සඳහන් වේ (*Ez.* vol. iii: 177 ; *Ez.*vol.iii : 547-253). එම ශිලා ලේඛන දෙකෙහි ම අනුරාධපුර නගරයෙහි නැගෙනහිර හා උතුරුපස වූ නිගමස්ථාන පිළිබඳ ව විස්තර කර ඇත. නියමතන, නිගම යන වචනවලින් වෙළඳපොළ (market town) ගම්‍ය වන බව පරණවිතාන පෙන්වා දී තිබේ (*Ez*,Vol. iii :181). පණ්ඩුකාභය රජ දවස අනුරාධපුර නගරයේ සතර දිසාවේ පිහිට වූ ද්වාරගාම (*මව.* x :88 ) රටේ ඇතිවන ආර්ථික හා දේශපාලන පුනරුදය අනුව වෙළඳපොළ දක්වා පරිවර්තනය වන බව ඉන් පැහැදිලි වේ.

3 මහා නඥන වන නාම උයනම දකඛින පුරෙ (*Dv* xiii : 110).
තෙ නඥන වනෙ රටෙට දක්ෂිණ දවාරතොබහි (*මව* xv 01) .
දකඛින දවාරෙ නඥන වන උයනෙ (සපා 83 : 71).





ක්‍රි.පූ. යුගයේ සිට ක්‍රි.ව.මුල් සියවස පමණ වන විට ද්වාරගාම වෙළඳපොළ දක්වා පරිවර්තනය වීමට සමාජ, දේශපාලන, ආර්ථික යන කාරණා මුල් වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. කුම්භකාර ග්‍රාමය වැනි නිෂ්පාදන ග්‍රාම නගරයේ දකුණු පස බිහි වීමට ද ඒ තත්ත්වය බලපාන්නට ඇති බව විශ්වාස කළ හැකි ය (*වංසපකා.* 383 ; මැන්දිස් 2003/2004:12). නගරයෙහි දකුණු දිග හා බටහිර දිග ක්‍රියාත්මක වූ වෙළඳ පොළක් සම්බන්ධ ලේඛනගත සාක්ෂි මේ දක්වා පැහැදිලි ලෙස හමු වී නොමැති වුව ද දකුණු දිග හා බටහිර දිග ප්‍රදේශය තුළ මුල් ඓතිහාසික සමය වන විට වෙළඳපොළ තත්ත්වයන් නිර්මාණය වී තිබූ බවට ඉඟි මූලාශ්‍රය කරුණු මඟින් අවබෝධ කරගත හැකි ය. ඒ අතර බුද්ධදාස රජුගේ පුත් උපතිස්ස විසින් බටහිර නගර ද්වාරය ඉදි කිරිම බොහෝ විට වානිජ ජාලයක නිසා සිදු වූ ක්‍රියාවක් වීමට ඉඩ තිබේ. ද්වාරය පිහිටීම නිසා එම ස්ථානය තුළින් ද නිගමස්ථානයන් බිහිවිමට අවශ්‍ය වටපිටාව නිර්මාණය වන බව උපකල්පනය කළ හැකි ය (*UCR*. vol.18:3-4). කෙසේ වෙතත් ලබුඇටබැඳිගල හා තෝනිගල ශිලා ලේඛන තොරතුරු විමර්ශනය කරන රත්නායක අනුරාධපුර නගරයේ සිව් දිශාවෙහි ම නිගමස්තානබ තිබෙන්නට ඇති බව පෙන්වා දී තිබේ (Rathnayake 1984:05). වංසකතා විස්තරවලට අනුව අනුරාධපුර නගරයේ දකුණු දෙස එ නම් මලය රට්ඨයේ සිට ගැල් මඟින් විවිධ කුළුබඩු හා වෙනත් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කළ බවට ඉඟි ලැබේ. අනුරාධපුර නගරයේ දකුණු ද්වාරය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැණීමක දී පාෂාණීභූත ව තිබූ පුවක් (Arecanauts), කොත්තමල්ලි (Corinder), ගම්මිරිස් (Black Pepper) ආදී කුළුබඩු හමුවීම තුළින් කඳුකරය ආශ්‍රිත ව පැවති

සම්පත්වල හුවමාරුව මැනවින් හඳුනාගත හැකි ය (Ratnayake 1984:05). එසේම ජේතවනය ආශ්‍රිත පර්යේෂණ කැණීම තුළින් මෙම කාලයට අදාළ ව කඳුකරයේ සම්භවය ලබන විවිධ ඛනිජ පාෂාණ වර්ගවල බහුල වාර්තාවීමක් පෙන්නුම් කරන අතර එම නිසා එම ද්‍රව්‍යය මෙම භූමිය ආශ්‍රිත ව පරිහරණය වන්නට ඇත. විනිමය මාධ්‍ය වන කාසි වර්ග ද එම ස්තරවලට අදාළ ව හමුවීම නිසා ජේතවන භූමිය මුල් ඓතිහාසික අවධියේ වානිජ කටයුතු හෝ හුවමාරුව සිදු වූ ස්ථානයක් වීමට බොහෝ සෙයින් ඉඩ පවතින බව පෙන්වාදිය හැකි ය.

පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය කරුණුවලට අනුව මුල් ඓතිහාසික සමයේ සිට මෙම භූමිය ජනාවාස ව පැවති බවට ඉඳි කිරීම් පිළිබඳ සාධක ගණනාවක් මඟින් සාක්ෂි සපයාගත හැකි ය. ජේතවන ස්තූපයේ දකුණු සලපතල මළුවේ 1992 වසරේ සිදු කරනු ලැබූ කැණීමක දී එහි සලපතල මළුවට යටින් ගඩොළුමුවා ගොඩනැගිල්ලක් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. මෙම ගඩොළුමුවා ස්මාරකය නිර්මාණය කිරීම සඳහා භාවිත ගඩොළු තාපසංදිප්තතා කාල නිර්ණයට බඳුන් කිරීමෙන් ක්‍රි.පූ.250 ට අයත් වූ බව හේම රත්නායක ප්‍රකාශ කර ඇත (Rathnayake 1993:60). මෙම ගොඩනැඟිල්ලේ ඉඳි කිරීම් ලක්ෂණ හා එහි උපයෝගීතාවය පිළිබඳ ව විමර්ශනය යෙදී ඇති හේම රත්නායක පෙන්වා දී ඇත්තේ මෙම ස්ථානය මහින්ද මහරහතන් වහන්සේගේ ආදාහනය සිදු කළ ආදාහන මළුව විය හැකි බව ය (එම). මහාවංසයේ මහරහතන් වහන්සේලා හා ඍෂීන්ගේ ශරීර මිහිදන් කළා වූ ස්ථානය ඉසිභූමංගන වශයෙන් දක්වා ඇත (*මව.* xx:47-78). ඉසිභූමංගන පිළිබඳ විස්තර මහා විහාර පිළිගැනිමේ කතාවේදී හෝ මහා සීමා සළකුණු කරන විස්තරයේ දී සඳහන් නොවන බව පෙන්වාදෙන රත්නායක එම ස්ථානය මහාථූපයට (ථූපාරාමයට) නැගෙනහිරින් පිහිටා තිබෙන වත්මන් ජේතවන ස්තූපය ඉඳි වූ ස්ථානය බව පෙන්වා දී ඇත (Rathnayake 1984:15 ; 1993:60 ; 1998:330-331). එසේ ම ජේතවන සලපතල මළුවෙන් හමුවන නටබුන් වූ ගඩොළුමුවා ගොඩනැඟිල්ල මිහිඳු මහරතන් වහන්සේ ආදාහනය කළ ස්ථානය විය හැකි බව ඔහු






ප්‍රකාශ කර තිබේ (එම) මූලාශ්‍රය තොරතුරු අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවස හා ඊට පසු භාගය වන විට ජේතවන භූමිය විවිධ කටයුතු සඳහා භාවිත කර තිබෙන බව පැහැදිලි වන අතර 2000 වසරින් පසු ව විහාර භූමිය ආශ්‍රිත ව සිදු කළ කැණීම්වල දී ද ප්‍රාග් ජේතවන අවධියට අයත් පස් තැන්පතු ව තුළ විවිධ ගඩොළු මුවා ප්‍රාථමික ඉඳි කිරීම් පිළිබඳ ව වාර්තා වී තිබේ. ඒ අතර JBOP 2005 සංසිද්ධි අංක 23 ප්‍රාථමික ගඩොළු ඉඳි කිරීම (මැන්දිස් 2005: 30), JSP I 2000 සංසිද්ධි අංක 23, 36 ප්‍රාථමික ඉඳි කිරීම (මැන්දිස් 2000: 32), JSMP 2001 සංසිද්ධි අංක 100 ගෙබිමක් ඉඳි කිරී (මැන්දිස් 201: 38), ජ්ධඡ 2007 සංසිද්ධි අංක 28 හා 29 මාර්ග යක ඉඳි කිරීම් (මැන්දිස් හ දිසානායක 2005:22-31), JSWMP 2004 සංසිද්ධි අංක 26, 27 ප්‍රාථමික ඉඳි කිරීම (මැන්දිස් 2004 : 22) තුළින් ප්‍රාග් ජේතවන ජනාවාසකරණ ලක්ෂණ මැනවින් හඳුනාගත හැකි ය. සමස්තයක් ලෙස සලකා බැලීමේ දී මෙම ජනාවාසකරණ තත්ත්වයන් සාපේක්ෂ ලෙස යොමු කළ හැක්කේ මුල් ඓතිහාසික අවධිය (Early historic) තුළ දී මෙම භූමියේ සිදු වි ඇති ක්‍රියාවලියකට අදාළව  බව භෞතික සංස්කෘතික තොරතුරුවලින් සනාථ වේ.

ජේතවන විහාර භූමියේ ස්තරායනය ඇසුරින් පුරා ජනාවාස රටාව අධ්‍යනයේ දී මින්පසු දැකගත හැක්කේ ජේතවන විහාරය ආශ්‍රිත ඉඳි කිරීම් සම්බන්ධ භෞතික සංස්කෘතික තොරතුරු වේ. අනුරාධපුර යුගකරණ අනුව මෙම කාලය මධ්‍ය ඓතිහාසික අවධිය (Middle historic period 300-1250 AD) වශයෙන් දැරණියගල විග්‍රහ කර ඇත (Deraniyagala 1992 :713). මධ්‍ය ඓතිහාසික අවධිය වන විට ජේතවන භූමිය ආශ්‍රයෙන් මහසෙන් රජ දවස ක්‍රි.ව. 276-303 බෞද්ධ විහාරයන් ඉඳි වන අතර (*Mv.* xxxvii: 32-37) බෞද්ධ විහාරය මුල් බැස ගැනීමෙන් අනතුරු ව අනුරාධපුර රාජධානි අවසාන සමය දක්වා විවිධ ආරාමීය අංග එක් වෙමින් සංවර්ධනය වූ ආකාරය මූලාශ්‍රය හා පුරාවිද්‍යා සාධක අනුව හඳුනාගත හැකි ය. ජේතවනය ආශ්‍රිත පුරාවිද්‍යා භූමිය තුළින් වාර්තා වී තිබෙන භෞතික සංස්කෘතික තොරතුරු අනුව එම ආංශුක භූමියේ මානව ජනාවාසකරණය ප්‍රාග් ඓතිාහසික

අවධිය, පූර්ව ඓතිහාසික අවධිය, මුල් ඓතිහාසික අවධිය, මධ්‍ය ඓතිහාසික අවධිය ආදී යුග තුළ සිදු වී ඇති බව ස්තරායනය ඇසුරෙන් සිදු කරනු ලැබූ අධ්‍යයන අනුව පෙන්වාදිය හැකි ය.



ක්‍රි. පූ. 250ට කාලය නියම වී ඇති ස්තූප සලපතර මළුවේ දකුණු පස ඇති ගඩොළුමුවා ස්මාරකයේ නටබුන්



ඊඑජ 2002 ස්තූප සලපතර මළුවේ ගිනිකොණ දිග කාර්තුවෙන් හමුවුණ ප්‍රාග් ජේතවන යුගයට සම්බන්ධ ඉදිකිරීමක්

ඡායාරූප අංක 4.7

මුල් ඓතිහාසික අවධියට අයත් ප්‍රාග් ජේතවන ගඩොළු ඉදිකිරීම්





### 4.1.2 ජේතවන ක්ෂුද්‍ර භූමිය ආශ්‍රිත පුරා භෞතික සංස්කෘතිය

අනුරාධපුර ඇතුළුපුරයට දක්ෂිණ දිග භාගයෙන් ස්ථානගත ව ඇති ජේතවන විහාර භූමිය ආශ්‍රිත ව පසුගිය වසර 37 ක කාලය තුළ විවිධ ස්ථාන අළලා සිදු කරනු ලැබූ ගවේෂණ හා පර්යේෂණ කැණීම්වල දී විශාල ප්‍රමාණයක් මානවකෘති (Artifact) සොයා ගෙන ඇත. විවිධ අමුද්‍රව්‍ය ආශ්‍රිත මානව කෘති සමූහය තුළින් යථෝක්ත භූමිය ආශ්‍රිත ක්‍රියාත්මක සංස්කෘතික අවස්ථාවන්ගේ පුනරාවලෝකනය පිළිබඳ හැදෑරීමට මහත් පිටුවහලක් ලැබේ. එහි දී පුරාණ සමාජ ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ සමාජ ඉතිහාසය (Social history), සමාජ හා සංස්කෘතික ක්‍රමවේද (Social and Cultural System), පුරාණ තාක්ෂණය හා සම්පත් පරිහරණය (Resource used puttern and Ancient Technology) ආදී විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ. එම අධ්‍යයනයන් තුළින් අතීතය හා වර්තමානය යා කිරීමට පවතින හිඩැස පියවීම සඳහා ජේතවන පුරා භෞතික සංස්කෘතික තොරතුරු අදාළ කර ගැනීමේ ඉහළ හැකියාවක් පවතී.

#### 4.1.2.1 ශිලාමය පුරාවස්තු (Stone artifacts)

ජේතවන භූමිය අශ්‍රිත ව සොයාගනු ලැබූ මහාර්ඝ සම්පත අතර කැපීපෙනෙන නිර්මාණ වශයෙන් ශිලාමය නිර්මාණ හැඳින්විය හැකි ය. මෙම ශිලාමය නිර්මාණ පිළිබඳ සාකච්ඡා කිරීමේ දී අදියර දෙකකින් සාකච්ඡා කළ හැකි ය

I. ප්‍රාග් ඓතිහාසික මානවකෘති (Pre historic artifacts)

II. ප්‍රාග් ජේතවන මානවකෘති (Pre Jetavana Artifacts)

ප්‍රාග් ඓතිහාසික අවධියට සම්බන්ධ ශිලාමය මානවකෘති වශයෙන් ජේතවන භූමිය ආශ්‍රයෙන් හඳුනාගත හැක්කේ ශිලා මෙවලම් (Stone Implement) වේ. කැණීම තුළින් වාර්තා වී ඇති ආකාරයට 1982 වසරේ දී සිදු කරනු ලැබූ S5 W8 F3 පර්යේෂණ කැණීමේ ද ස්තර අංක 7 තුළින් ශිලා මෙවලම් 7 ක් වාර්තා වී ඇත (Ratnayake 1984:30). එම ශිලා මෙවලම් නිෂ්පාදනය සඳහා

තිරුවාණා හා කහද උපයෝගි කර ගෙන තිබේ (එම). නිෂ්පාදන තාක්ෂණය අනුව එම ශිලා මෙවලම් සීරුම් මෙවලම් (Scraper), තල මෙවලම් (blade) හා තැලුම් මෙවලම් (chopper) වශයෙන් භාවිත කළ බව හඳුනාගෙන ඇත (එම fig :34). ජේතවන ස්තූප භූමියට පරිභාහිර සීමාවෙන් හඳුනාගනු ලැබූ මෙම මෙවලම්වලට අමතර ව ජේතවන ස්තූප සලපතර මළුව ආශ්‍රිත භූමිය තුළින් JSMP 2002 සංසිද්ධි අංක 66, JSWMP 2003 සංසිද්ධි අංක 18, ස්තූප වැලිමළුව ඊඩඋෂ 2003 සංසිද්ධි අංක 26 තුළින් ද තල මෙවලම් (blade), සීරුම් මෙවලම් (Scraper), මෙන් ම ශිලා මෙවලම් නිෂ්පාදනයේ දී ඉතිරු වූ න්‍යෂ්ටීන් (Core) හඳුනාගෙන ඇත (මැන්දිස් 2009:14-17). කහඳ හා විනිවිද පෙනන තිරුවානා පාෂාණවලින් නිර්මාණය කර ඇති මෙම මෙවලම් ක්ෂුද්‍ර ශිලා මෙවලම් (Microlithic) මෙවලම් වශයෙන් හැඳින්විය හැක්කේ සෙ.මී. 4.5 ට අඩු බැවිනි.

මයික්‍රොලිතික ශිලා මෙවලම් භාවිත කරන ලද සංස්කෘතිය මෙසොලිතික සංස්කෘතිය ලෙස හැඳින්වේ (Deraniyagala 1992 : 196, 709). ජේතවන භූමිය ආශ්‍රිත රතු දුඹුරු පාංශු කලාපයෙන් වාර්තා වූ මෙම ශිලා මෙවලම් තුළින් මොසොලිතික සංස්කෘතියට අයත් ජනාවසවීමක් සනිටුහන් කරන බව හඳුනාගැනීමට අවකාශ සැලසේ. ජේතවන ශිලාමය පුරාවස්තු අතර ප්‍රාග් ජේතවන පාංශු ස්තරවලින් හමුවන ඇඹරුම් උපකරණ (Stone Quern) හා ඇඹරුම්ගල් (Grind stone) සුවිශේෂ වේ. මෙම ඇඹරුම් උපකරණ හමුවන ස්තර ආශ්‍රයෙන් ලක්ෂ්මි කාසි, ස්වස්තික කාසි හා හස් එබූ කාසි වාර්තා වන බැවින් සාපේක්ෂ වශයෙන් මෙම ස්තර මුල් ඓතිහාසික අවධියට අයත් බව රත්නායකගේ පිළිග ැනීමයි (Rathnayake 1984:29). මෙම ඇඹරුම් උපකරණ හා ඇඹරුම්ගල් JSP I 2000 සංසිද්ධි අංක 35, JSP II 2000 සංසිද්ධි අංක 15 තුළින් ද ලැබී තිබේ. මෙ වැනි ඇඹරුම් උපකරණ හා ඇඹරුම් ගල් තිස්සමහාරාම යටාල ආශ්‍රයෙන් ද ලැබී තිබෙන අතර ඒවා ක්‍රි.පූ. 250-100 කාලයට අයත් බවට පිළිගනු ලබයි (Somadeva 2006:193). කාසි ආශ්‍රිත සාපේක්ෂ කාල නිගමන අනුව ජේතවනයෙන් හමුවන මෙම ඇඹරුම් උපකරණ මධ්‍ය මුල්





ඓතිහාසික අවධියට (Mid – Early Historic 250 BC- 100AD) අයත් බව උපකල්පනය කළ හැකි ය.



ඡායාරූප අංක 4.8

ප්‍රාග් ජේතවන ස්තරවලින් හමුවුණු ඇඹරුම් උපකරණ

## 4.1.2.2 මැටි පෙති (Clay Disk)

ජේතවනය ආශ්‍රිත පුරා භෞතික සංස්කෘතික තොරතුරු අතර ප්‍රාග් ජේතවන ස්තර තුළ තිබී මැටි පෙති විශාල ප්‍රමාණයක් හමු වී තිබේ. JSP I 2000, JSMP 2001, JMLP 2002, JPL 2000 යන කැණීම් මගින් මෙන් ම වෙනත් පර්යේෂණ කැණීම් රාශියක දී මැටි පෙති රාශියක් වාර්තා වී තිබේ. නිර්මාණ ලක්ෂණ දෙස බැලීමේ දී පුළුස්සන ලද මැටි නිර්මාණ වශයෙන් හඳුනාගත හැකි ය. සමහර මැටි පෙති මැටි බඳුන්වල බඳ කොටස් උපයෝගී කර ගෙන නිර්මාණය කර ඇති බව හඳුනාගත හැකි ය. මේවාහි උපයෝගීතාවය පිළිබඳ විමසීමේ දී එහි ස්වරූපය අනුව යම්කිසි ගනුදෙනු ක්‍රියාවලියක දී භාවිත කරන ලද බව උපකල්පනය කළ හැකි ය. විවිධ ප්‍රමාණවල විවිධ බර සහිත මැටි පෙති සමහර විට මිනුම් කටයුතුවලට හෝ වෙනත් ටෝකන් ක්‍රමයක් සඳහා භාවිත කරන්නට ඇතැයි ද උපකල්පනය කළ හැක්කේ ඒවා මත සංකේත දක්නට ලැබෙන බැවිනි.



ඡායාරූප අංක 4.9
ජේතවනයෙන් හමු වුණු විවිධ
හැඩයන්ගෙන් යුත් මැටි පෙති

### 4.1.2.3 මැටි බෝල (Clay Balls&

ජේතවන ආශ්‍රිත ව හමු වී ඇති භෞතික සංස්කෘතික තොරතුරු අතර මැටි බෝල (Clay balls) ද විශාල ප්‍රමාණයක් තිබේ. ප්‍රාග් ජේතවන ස්තර තුළින් බහුල ලෙස මේවා හමු වී තිබෙන අතර මෙ වැනි ආකාර මැටි බෝල දකුණු පළාතෙන් ක්‍රි.පූ. 350-250 කාල වකවානුවට අයත් ස්තර තුළින් හමු වී තිබෙන බව සෝමදේව පෙන්වාදී ඇත (Somadev් 2006: 193). කිරින්දගමින් හමු වී ඇති මෙ වැනි මැටි බෝල ක්‍රි.පූ. 240 - ක්‍රි.පූ 100 කාලයට අයත් බව ඔහුගේ පිළිගැනීමයි (එම). ජේතවනයෙන් හමු වී ඇති මැටි බෝල විවිධ ප්‍රමාණවලින් හා විවිධ බරින් යුක්ත වන බැවින් ඒවා යම්කිසි කිරුම් මිනුම් කාර්යයක ප්‍රභේද වශයෙන් භාවිත කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.







ඡායාරූප අංක 4.10
ජේතවනයෙන් හමු වුණු විවිධ හැඩයන්ගෙන් යුත් මැටි බෝල

### 4.1.2.4 ලෝහ කාර්මික කටයුතු හා ලෝහ ආශ්‍රිත නිර්මාණ (Metal Industry and Metal Object)

ලෝහ කාර්මික හා ලෝහ නිර්මාණ කටයුතුවලට අදාළ භෞතික සංස්කෘතික තොරතුරු රාශියක් ජේතවනයෙන් හමු වී තිබේ. මේ අතර කාර්මික කටයුතු පිළිබිඹු වන උඳුන්, කෝව හා ලෝහ බොර බහුල ලෙස ජේතවනයෙන් වාර්තා වී ඇත. ප්‍රාග් ජේතවන අවධියට අයත් ස්තර තුළින් ලෝහ උණු කිරීමට භාවිත කළ උඳුන් පෙළක් JSP 96 කැණීමෙන් වාර්තා වී තිබේ (රාජපක්ෂ 1996: 10). JSMP 2001 කැණීමේ දී උඳුනක් වාර්තා වී තිබෙන අතර JSWMP 2003 කැණීම තුළින් කෝව හා ලෝහ නිෂ්පාදනයේ දී ඉතිරි වන ලෝහ බොර කිලෝ ග්‍රෑම් 12 ක් වාර්තා වී ඇත (මැන්දිස් 2009:21), එසේ ම JSOWP 2003 කැණීම තුළින් ද ප්‍රාග් ජේතවන ස්තර තුළ තිබී කෝව හා කෝව කොටස් හමු වී ඇත. මෙම කෝව විවිධ හැඩයෙන් හා විවිධ නිර්මාණ ලක්ෂණවලින් යුක්ත වේ.

ලෝහ නිෂ්පාදනය මෙන් ම ලෝහ නිර්මාණ ආශ්‍රිත තොරතුරු විශාල ප්‍රමාණයක් ද ප්‍රාග් ජේතවන හා ජේතවන

අවධියට සම්බන්ධ ස්තරවල තිබී හමු වී තිබේ. එම නිර්මාණ අතර හෙල්ල, කැති, මුදු, ආදී විවිධ උපකරණ ප්‍රාග් ජේතවන අවධියෙන් ද ජේතවන අවධියට සම්බන්ධ ස්තරවලින් ඇණ, සරණේරු, මුදු, මාල, වළලු, කිල්ලෝට, ගෙජ්ජි, කොණ්ඩකූරු, කන්හැඳි, ආදී උපකරණ ද හමු වී තිබේ (ගුණරත්න 2008:6-18).



තඹ මිශ්‍ර ලෝහ පළඳනාවක්, ඇණ, වළල්ලක්

ඡායාරූප අංක 4.11

ජේතවනයෙන් හමු වී ඇති ලෝහ නිර්මාණ

## 4.1.2.5 අස්ථි නිර්මාණ (Bone Object)

ජේතවන විහාර භූමිය ආශ්‍රිත කැණීම්වල දී අස්ථි නිර්මාණ විශාල ප්‍රමාණයක් වාර්තා වී තිබේ. අස්ථි නිර්මාණ සඳහා යොදා ගැනීමේ දි භාවිත අමුද්‍රව්‍යය පිළිබඳ සාධක JSP I 2000 තුළින් ද JSP II 2000 තුළින් ද හඳුනාගෙන ඇත. විශේෂයෙන් ම ප්‍රාග් ජේතවන ස්තර තුළ සත්ත්ව අං, දළ හා මුහුදු බෙලිකටු ආශ්‍රිත අමුද්‍රව්‍ය භාවිත කිරීම පිළිබඳ සාධක හමු වීම අතිශයින් ම වැදගත්





වේ. ජේතවන අවධියට සම්බන්ධ ස්තරවලින් හමු වී ඇති අස්ථි නිර්මාණ අතර ක්‍රීඩා කටයුතු සඳහා භාවිත කර ඇති දාදු කැට, වළලු, මාල, කොණ්ඩා කූරු, පනා ආදී උපකරණ ද පොත් කම්බා ඇතුළු වෙනත් භාණ්ඩ විශාල ප්‍රමාණයක් ලැබී තිබේ (දිසානායක 2009: 66-72). හේම රත්නායකගේ මතය අනුව ජේතවනයේ හමු වී ඇති ඇත් දළ නිර්මාණ පාකිස්තානයේ හා ඇෆ්ගනිස්ථානයේ ඇති බෙග්‍රම් (Begrum) එකතුවට සමාන බව පෙන්වා දී තිබේ. එ මගින් වෙළඳ සම්බන්ධතා පිළිඹිබු වන බව ඔහුගේ මතයයි (හේම රත්නායක සමඟ සම්මුඛ සාකච්ඡාවක ඇසුරිනි).



ඡායාරූප අංක 4.12

ජේතවනයෙන් හමු වී ඇති අස්ථි නිර්මාණ සඳහා යොදා ගත් කාර්මික අවශේෂ හා අස්ථි නිර්මාණ

## 4.1.2.6 කාසි (Coins)

මෙතෙක් සිදු කරනු ලැබූ පර්යේෂණ කැණීම්වලදී මෙන් ම පුරාවිද්‍යා කයුතුවල ද ජේතවන භූමිය ආශ්‍රිත ව 3000 ක් පමණ දේශීය හා විදේශීය කාසි අනාවරණය කර ගෙන ඇත (බාලසූරිය 2008:10). එම කාසි අතර විදෙස් කාසි වශයෙන් හස් එබූ **කාසි, කුෂාණ කාසි, රෝම කාසි, ඉන්දු රෝම කාසි, පාණ්ඩ්‍ය කාසි** ද දේශිය කාසි වශයෙන් **ස්වස්තික කාසි, ලක්ෂ්මි කාසි, සිංහ කාසි, වෘෂභ කාසි හා මධ්‍ය ඓතිහාසික අවධියේ භාවිත වූ කාසි වාර්තා වී ඇත.**

මෙම කාසි අතරින් හස් එබූ කාසි 169 ක් වාර්තා වී තිබෙන අතර එම කාසි රිදී, තඹ සහ රන් ආලේපිත ලෝහයෙන් නිර්මාණය කරන ලද කාසි වේ (එම:12). හස් එබූ කාසි වර්ගය ක්‍රි.පූ. 200-100 අතර කාලයේ දී අනුරාධපුරයේ භාවිත වී ඇති බව දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1972:150 Plate 2,e-h). ජේතවනයෙන් හමු වී ඇති හස් එබූ කාසිවල **හිරු, ස්වස්තිකය, මල හා ජ්‍යාමිතික සටහන්** දක්නට ඇති බව අධ්‍යයනවල දී හඳුනාගෙන ඇත (බාලසූරිය 2008: 10). ප්‍රාග් ජේතවන ස්තර තුළින් හස් එබූ කාසි හමුවන බැවින් මෙම කාසි මුල් ඓතිහාසික අවධියේ සිට මෙම භූමිය තුළ සංසරණය වී ඇති බව හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ භාවිත පැරණිත ම කාසිය වශයෙන් හස් එබූ කාසිය පිළිගනු ලබයි (සිරිසෝම 1959 ඵ05). මෙම කාසි විශේෂය තිස්සමහාරාමය, අම්බලන්තොට හා ගොඩවාය යන ප්‍රදේශවලින් ද වාර්තා වී තිබෙනුයේ ක්‍රි.ව. පළමු වැනි හා දෙ වැනි සියවස් තුළිනි (Weisshaar at.el. 2001: 261-62).

ජේතවනයෙන් වාර්තා වි ඇති විදේශීය කාසි අතර පල්ලව, පාණ්ඩ්‍ය ආදී දකුණු ඉන්දීය රාජවංශිකයන් නිකුත් කරන ලද කාසි කිහිපයක් ද වේ. පල්ලව කාසිවල ඇති සංකේත අතර පනු ක් ලස හා ළැඟ සිටින සිංහ රුව සටහන් කොට තිබේ. මේවා ක්‍රි.ව. නව වැනි ශත වර්ෂයට පමණ අයත් කාසි බව කොඩ්රිංටන් පෙන්වා දී ඇත (Codrington 1924:83). එසේ ම පාණ්ඩ්‍ය රාජ්‍ය ලාංඡනය වූ මත්ස්‍ය සංකේතය සහිත කාසි කිහිපයක් ද ජේතවන භූමියෙන් හමු වී තිබේ. කොඩ්රිංටන් ප්‍රකාශ කර ඇති පරිදි මෙම කාසි මාතොටින් ද වාර්තා වී තිබෙන අතර රාජ රාජ 1 කාලයට ක්‍රි.ව. 985-1013 ඒවා අයත් ලෙස පිළිගනු ලැබේ (එම 83-86).

ඉන්දීය කාසි අතර කුෂාණ රාජ පෙළපතේ II වැනි කණිෂ්ක රජුගේ කාසියක් හා සාතවාහන කාසියක් ද ජේතවන භූමියෙන් වාර්තා වී ඇත (බාලසූරිය 2008:3). මේවා ක්‍රි.ව. 1-5 අතර භාවිතා වූ බව පිළිගනු ලබයි (Codrington 1924:49-50). අතීතයේ ශ්‍රී ලංකාව රෝමය සමඟ පැවති වෙළඳ සබඳතා මත රෝම කාසි මෙ රට භාවිත වීම සිදු විය. කොඩ්රිංටන් පෙන්වා දී ඇති ආකාරයට අනුරාධපුර, ත්‍රිකුණාමලය, මහනුවර, තිස්සමහාරාමය





ආදී ස්ථානවලින් රෝම කාසි බහුල වශයෙන් වාර්තා වී තිබේ (Codrington 1924: 31-32). රෝම කාසි හා ඉන්දු රෝම කාසි ජේතවනයෙන් හමු වී තිබුණ ද ඒවායේ සංකේත බොහොමයක් ගෙවී ඇත. කාසියේ එක් පැත්තක පාලකයාගේ හිස හා අනෙක් පැත්තේ සොල්දාදු රූප දෙකක් ක් හෝ තුනක් සටහන් කර තිබේ (බාලසූරිය 2008:21). මෙයට අමතර ව ලන්දේසි හා බ්‍රිතාන්‍ය කාසි රාශියක් ද මතුපිට පාංශු ස්තරවලට අදාළ ව වාර්තා වී තිබේ.[4]

ජේතවනයෙන් හමුවන දේශීය කාසි අතර ස්වස්තික කාසි ද විශේෂ වේ. එම කාසිවල ඇති සංකේත අනුව ගස සහ ස්වස්තික කාසි, ඇතා සහ සවස්තික කාසි හඳුනාගත හැකි ය. ගස සහ ස්වස්තික කාසියේ අභිමුඛය තුළ වේදිය සහිත ගස හා ප්‍රතිමුඛය තුළ ස්වස්තිකය දැකගත හැකි ය (Codrington 1924: 23 Plate 12,13). ඇතා සහ ස්වස්තික කාසිය තුළ අභිමුඛයෙහි ඇතා, චෛත්‍ය, ස්වස්තිකය, වේදිය සහිත ගස ද ප්‍රතිමුඛය තුළ විශාල ස්වස්තිකය, චෛත්‍ය, නන්දිපාදය වේ (එම :20 plate 08,09). මෙ වැනි කාසි තිස්සමහාරාමය, මාතොට, අනුරාධපුර, මිහින්තලය, ඉරණමඩු හා වල්ලිපුරම්වලින් වාර්තා වී ඇත (එම). ඇතුළුපුරයෙන් හමු වූ මෙම කාසි මධ්‍ය මුල් ඓතිහාසික අවධියට (එසා- ඊරකහ යසිඑදරසජ) අයත් බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992:712).

ජේතවනයෙන් හමු වූ කාසි අතර ලක්ෂ්මී තහඩු කාසි ද වේ. දිගු හතරැස් හැඩ ගන්නා මෙමෙ කාසියේ අභිමුඛයේ ලක්ෂ්මී රුව ද දෙපස නෙළුම් දඬු දෙකක් ද ඒ මත හස්තින් දෙදෙනෙකු දැකගත හැකි ය. ප්‍රතිමුඛයේ වේදිය සහිත යෂ්ටිය මත නැංවූ ස්වස්තිකය දක්නට ලැබේ. ලක්ෂ්මී කාසි හලාවත, තිස්සමහාරාමය,

4 ජේතවනයෙන් හමු වී ඇති කාසි එකතුවල ලන්දේසි කාසි විශාල ප්‍රමාණයක් හමු වී ඇත. ඒ අතර *VOC* (*Vereenigte Oost Indische Compagnie*) පෙරදිග ඉන්දීය ඕලන්ද වෙළඳ සමාගම යන්න කාසියේ සටහන් කර ඇත. අනෙක් පස ඕලන්ද රජ්‍ය ලාංඡනය දැකගත හැකි ය. 1640-1796 කාලයේ නිකුත් කරන ලද කාසි විශාල ප්‍රමාණයක් ජේතවනයෙන් හමු වී ඇත.
ක්‍රි.ව. 1796 - 1948 දක්වා ලංකාව පාලනය කළ ඉංග්‍රීසීන් නිකුත් කළ කාසි ද ජේතවනයෙන් හමු වී තිබේ. එහි පාලක රාජ්‍ය හා පාලන නාමය සටහන් කොට තිබෙන අතර වික්ටෝරියා, ජෝර්ජ් සහ එඩ්වඩ් රජවරු නිකුත් කළ කාසි ඒ අතර තිබේ(බාලසූරිය 2008:23).

කන්තරෝදය, වල්ලිපුරම්, මාතොට, මුලතිව් හා අනුරාධපුරයෙන් වර්තා වී තිබේ (එම :26-31 චක්‍රු 20,21,2,23,23,24,25).

ඇතුළුපුරයෙන් වාර්තා වී ඇති ලක්ෂ්මි තහඩු කාසි මධ්‍ය පූර්ව ඓතිහාසික අවධියට අයත් ස්තරවලින් වාර්තා වී ඇති බව දැරණියගල හා කනිංන්හැම් පෙන්වා දී තිබේ (Dearaniyagala 1992:712 ; Coningham 1999:129). තිස්සමහාරාමයෙන් හමුවන කාසි ක්‍රි.ව. පළමු වැනි හා දෙ වැනි ශතවර්ෂයට අයත් බව හඳුනාගෙන තිබේ (Wesshaar at el 2001: 262-64).

කේසර සහිත සිංහ රුව අනතර්ගත කාසි සිය ගණනක් ජේතවනයෙන් වාර්තා වී ඇත. එහි අභිමුඛයේ සිංහ රුව ද ප්‍රතිමුඛයේ රවුමක් මැද තිත් 04 ක් දැකගත හැකි ය. මෙම කාසි බොහොමයක් ජේතවන දාගැබේ පාදම ආශ්‍රිත කැණීම්වල දී වාර්තා වී තිබේ. කොඩ්රිංටන් පෙන්වා දී ඇති ආකාරයට සිංහ කාසි මහාසේන රාජ යුගයට අයත් වේ (Codrignton 1924 :25 plate 18,19) ඇතුළුපුරයේ ASW 2 period F අවධියට අයත් ව සිංහ කාසි වාර්තා වී තිබේ (Coningham 1999:129-130). කාස්වෙල් හා ප්‍රිකට් පෙන්වාදෙන ආකාරයට මෙම කාසි ක්‍රි.ව. 250 - 750 කාලයට අයත් ස්තරවලින් මාතොටින් ද වාර්තා වී තිබේ (Carswell and Prikett 1984 :57). දැරණියගල විසින් ද මෙම කාසි මධ්‍ය ඉතිහාසයට අයත් කාසි බව පෙන්වා දී ඇත (Middle historic 300-1250 AD) (Deraniyagala 1992:713). ජේතවනයේ ස්තූපය ආශ්‍රිත කැණීම්වලින් සිංහ කාසි බහුල වාර්තා වන නිසා මහසෙන් රාජ යුගයට ඒවා අයත් කාසි විය හැකි බව උපකල්පනය කළ හැකි ය. වංසකතාවල ජේතවන ස්තූපය හා සංඝාරාමය මහසෙන් ඉදි කල බව සඳහන් වේ (*Mv* xxxvii: 33).

එසේ ම සිංහ කාසියට සමකාලීන ව භාවිතා වූ වෘෂභ කාසිය වර්ගය ද ජේතවනයෙන් වාර්තා වන අතර එහි අභිමුඛයේ වෘෂභ රුව හා ප්‍රතිමුඛයේ රවුමක් මැද තිත් 3 ක් දැකගත හැක. මෙම කාසි කිරිබත් වෙහෙර ආදී ස්ථානවලින් ද වාර්තා වී තිබේ (Codrinigton 1924:24 plate 17).

මධ්‍ය ඓතිහාසික අවධියට අයත් කාසි අතර ජේතවන සලපතර මළුවෙන් රන් කහවණුව, දෙ අක, අක, මස්ස, අඩමස්ස,





ආදි කාසි වාර්තා වී ඇත (බාලසූරිය 2008 : 18). කහවණුව කාසියේ ශ්‍රී ලංකා විභූ ලෙස ද දෙ අක කාසියේ ලක්මා ලෙස ද අක කාසියේ දරක, උරක ලෙස ද පාඨ සඳහන් වන බව කොඩ්රිංටන් පෙන්වා දී තිබේ (Codrigton 1924 : 54-62 Plate 46-70). මධ්‍යකාලීන අවධියට අයත් පොළොන්නරු රාජධානියේ විසූ විජයබාහු, පරාක්‍රමබාහු ආදී රජවරු නිකුත් කරන ලද කාසි ද ජේතවනයෙන් හමු වී ඇත.



01 02 03
04 05 06

ඡායාරූප අංක 5.13
ජේතවනයෙන් හමු වී ඇති කාසි වර්ග

01. හස් එබූ කාසි
02. ස්වස්තික කාසි
03. ලක්ෂ්මී කාසි
04. සිංහ කාසි
05. වෘෂභ කාසි
06. රන් කහවණුව

### 4.1.2.7 මුද්‍රා (Intaglios)

ජේතවන පුරාබිමෙන් හමු වී ඇති ද්‍රව්‍යයමය සංස්කෘතික තොරතුරු අතර මුද්‍රා විශේෂ වේ. මෙම මුද්‍රා අර්ධ මාණික්‍ය හා විදුරු ආශ්‍රිත අමුද්‍රව්‍යවලින් නිර්මාණය කර තිබේ (Ratnakayake 1993:83). මුද්‍රා නිර්මාණයට භාවිත කර ඇති අමුද්‍රව්‍ය අතර කානීලියන්, රඹස්, ඇගේට් ආදී ඛනිජ පාෂාණ හඳුනාගත හැකි ය. ජේතවන ස්තූපයේ බටහිර හා උතුරු ආයක ඉදිරිපිට සලපතර මළුව කැණීමේ දී මෙම මුද්‍රා හමු වී ඇත. මුද්‍රාවල වෘෂභ රූප, මත්ස්‍ය රූප, මිනිස් රූප, කැටයම් කර තිබේ. මේවා විවිධ ප්‍රමාණවලින් යුක්ත වන අතර නිර්මාණ ලක්ෂණ අනුව බටහිර ආසියාතික රටවලට අයත් නිර්මාණ විය හැකි බව රත්නායක පෙන්වා දී ඇත (එම). ජේතවනයෙන් වාර්තා වී ඇති මුද්‍රා ගණන 18 ක් වේ (*ප්‍රපුලිලේ.* 1982). අනුරාධපුර ඇතුළුපුරයෙන් ASW 2 කැණීම තුළින් ද (Stratigraphic phase xcv)වලට අයත් ව කානීලියන්වලින් නිර්මාණ කළ වෘෂභ රුවක් සහිත මුද්‍රාවක් වාර්තා වී තිබේ (Coningham 2009: 383 Plate 83). තිස්සමහාරාමයෙන් වාර්තා වී ඇති මුද්‍රා මැටිවලින් නිර්මාණය කර තිබේ (Weishaar at.el 2001:243-252) ජේතවනයෙන් හමු වී ඇති මුද්‍රා වාර්තා වූ ස්තර අනුව ක්‍රි.ව. 2-3 අතර කාලයට ඒවා අයත් වන බව රත්නායක පෙන්වා දී තිබේ (Ratnayake 1993: 80).

### 4.1.2.8 පබළු (Beads)

විවිධ අමුද්‍රව්‍ය රැසක් භාවිත කරමින් නිර්මාණය කර ඇති තුන් ලක්ෂ පනස් දහසකට ආසන්න පබළු ප්‍රමාණයක් ජේතවන විහාර භූමිය ආශ්‍රයෙන් වාර්තා වී තිබේ. මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති විශාලත ම පබළු එකතුව ජේතවනය සතුවන අතර ප්‍රාග් ජේතවන හා ජේතවන අවධියට සම්බන්ධ ව වාර්තා වී ඇති මෙම පබළු හැඩයන් රැසක් නිරූපණය කරන බව දැනට සිදු කරන අධ්‍යයන අනුව පෙනී ගොස් ඇත. ජේතවන පබළු අධ්‍යයනය සඳහා මෙතෙක් ප්‍රධාන වශයෙන් වර්ගීකරණ සටහන් දෙකක් භාවිත කරන ලදි. ඉන් පළමු වැනි වර්ගීකරණ සටහන





බෙක් (Beck) 1928 හඳුන්වා දී ඇති වර්ගීකරණය වන අතර දෙ වනි වර්ගීකරණ සටහන ඇනී හැනිබල් දැරණියගල 2001 වර්ෂයේ දී තිස්සමහාරාම පබළු අධ්‍යයනය සඳහා හඳුන්වාදී ඇති වර්ගීකරණයයි.

බෙක් වර්ගීකරණ සටහනට අනුව පබළු වර්ගීකරණය කිරීමේ දී එහි හැඩ වර්ග ෆ සක් දක්නට ලැබුණ ද ජේතවන පබළුවලට අදාළ නොවන හැඩයන් රාශියක් එහි පවතින නිසා ජේතවන පබළු අධ්‍යයනයේ දි ගැටලු රාශියක් මතුවූ හෙයින් හැනිබල් දැරණියගල තිස්සමහාරාමයට හඳුන්වාදුන් වර්ගීකරණය අනුව ද ජේතවන පබළු වර්ගීකරණය සිදු කළ නොහැකි වී ඇත්තේ තිස්සමහාරාම පබළු වර්ගීකරණය සඳහා හැඩ 13 ක් යටතේ උප හැඩ 43 ක් පමණක් හඳුන්වාදී ඇති බැවිනි (Hannible 2001: 210-213).

මෙම කරුණු සලකා බැලීමේ දී ජේතවනය සඳහා නවත ම වර්ගීකරණයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන අතර එම වර්ගීකරණය සකස් කර ගැනීමට තිස්සමහාරාමඉ වර්ගීකරණයේ මූලික හැඩ හා බෙක් වර්ගීකරණයේ මූලික හැඩ උපයෝගී කර ගැනීමට සිදු වේ. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් ජේතවනය ආශ්‍රයෙන් හමු වී ඇති පබළු උපයෝගී කර ගෙන නව වර්ගීකරණ සටහනක් (New Typology) ඉදිරිපත් කරනු ලැබේ

#### 4.1.2.8.1 ජේතවන ආංශුක ක්ෂේත්‍රය ආශ්‍රිත ව වාර්තා වූ පබළු ඇසුරෙන් සිදු කෙරෙන වර්ගීකරණය

ජේතවන විහාරය ආශ්‍රිත ව වාර්තා වී ඇති පබළු එකතුව තුළ ජ්‍යාමිතික හැඩ පබළු (Geometrical Shape), මල් හා ඵල හැඩ පබළු (Flower and seeds shape), සත්ත්ව රූප හැඩ පබළු (Animal Figer Shape) හා වෙනත් සංකේත පබළු (Symbolic beads) යන මූලික හැඩ හතරට අයත් පබළු අතර පහත සඳහන් ප්‍රධාන හැඩ 10 හඳුනාගත හැකි ය.

I. රවුම් හැඩ පබළු (Circular Beads)

II. පැති සහිත පබළු (Sides Beads)

III. නැවුම් සහිත පබළු (Bend Beads)

IV. දෙපස කර සහිත පබළු (Lug Collar Beads)

V. දෙපස කපන ලද කර සහිත පබළු (Croove Collar beads)

VI. එක් කරක් සහිත පබළු (One Collar Beads)

VII. සත්ත්ව රූප හැඩ පබළු (Animal Figer Beads)

VIII. සංකේත නිරූපිත පබළු (Symbolic Beads)

IX. මල් හා ඵල හැඩ පබළු (Flower and Seed Shaped Beads)


X. මාල පෙති හැඩති පබළු (Pendent Beads)

## I රවුම් හැඩ පබළු (Circular Beads)

තිරස් හෝ සිරස් අතට රවුම් හැඩය ගන්නා පබළු මෙම වර්ගයට ඇතුළත් වේ. මෙම වර්ගයට අයත් උප හැඩයන් 18 ක් ජේතවන පබළු අතරින් හඳුනාගත හැකි ය. හැනිබල් දැරණියගලගේ I වැනි වර්ගය වන Rounded Beads, II වැනි වර්ගය වන Disk Beads, III වැනි වර්ගය වන Annular Beads හා IV වැනි වර්ගය Barrel Beads යන ප්‍රධාන වර්ග තුළ වන උප හැඩ 14 ට අයත් (Hannibal 2001: 210) පබළු හැඩ ජේතවන I වර්ගය (Type I), රවුම් හැඩ පබළු (Circular beads) යන වර්ගයට සමාන වර්ගයක් බව පෙන්වාදිය හැකි ය. එම වර්ග කිරීම් අනුව පහත සඳහන් උප වර්ගයන් ජේතවන විහාරය ඇසුරින් හඳුනාගත හැකි ය.








| | |
|---|---|
| 01 | රවුම් ආකාර පැතලි |
| 02 | ගෝලාකාර පැතලි රවුම් |
| 03 | පැතලි රවුම් පීප්ප ආකාර |
| 04 | පැතලි රවුම් ආකාර |
| 05 | දෙපස උත්තලාකාර පැතලි |
| 06 | දෙපස උත්තලාකාර රවුම් |
| 07 | රවුම් පැතලි ආකාර චතුරස්‍ර |
| 08 | ගෝලාකාර ඉලිප්ස |
| 09 | රවුම් ආකාර පැතලි |
| 10 | ගෝලාකාර රවුම් |
| 11 | ඉලිප්සාකාර රවුම් |
| 12 | උත්තලාකාර රවුම් |
| 13 | කෙටි බැරල් ආකාර රවුම් |
| 14 | විශාල බැරල් ආකාර රවුම් |
| 15 | සිලිණ්ඩාකාර රවුම් |
| 16 | දෙපස කැපූ උත්තලාකාර බැරල් |
| 17 | දිගු බැරල් ආකාර රවුම් |
| 18 | ඉලිප්සාකාර රවුම් |

Type I රවුම් හැඩ පබළු වර්ගීකරණ සටහන

## II. පැති සහිත පබළු (Sides Beads)

පැති කිහිපයක් සහිත පබළු මේ යටතට අයත් වේ. මෙහි දී මෙම වර්ගවලට අදාළ උප වර්ග 18 ක් ජේතවන පබළු ඇසුරෙන් හඳුනාගත හැකි අතර ඇනී දැරණියගලගේ ix (Faceted Beads) වර්ගයේ පබළු හැඩ 04 ට (Hanniel 2001:211) අයත් පබළු වර්ග ද මෙම වර්ගයට අයත් ව හඳුනාගත හැකි ය. දැරණියගලගේ වර්ගීකරණයට අයත් නොවන නව උප වර්ග 14ක් පැති සහිත පබළු වර්ගයට අයත් ව ජේතවන පබළු එකතුව තුළින් හඳුනාගත හැකි ය.



| | |
|---|---|
| 01 | ෂඩ්කොන් පැති සහිත නලා ආකාර |
| 02 | ෂඩ්කොන් පැති සහිත දෙපස උත්තලාකාර |
| 03 | දෙපස පැති සහිත අෂ්ටාස්‍රාකාර |
| 04 | ෂඩ්කොන් පැති සහිත නලාකාර |
| 05 | පංචාස්‍ර පැති සහිත නලාකාර |
| 06 | පංචාස්‍ර දෙපස පැති සහිත පීප්පාකාර |
| 07 | පංචාස්‍ර පීප්ප ආකාර |
| 08 | පංචාස්‍රකාර නලාකාර |
| 09 | හතරැස් පීප්පාකාර |
| 10 | කුඩා හතරැස් |
| 11 | පංචාස්‍රකාර පැති සහිත නලාකාර |
| 12 | පංචාස්‍රකාර පැති සහිත පීප්පාකාර |
| 13 | විශාල හතරැස් |
| 14 | දිගු හතරැස් |
| 15 | ඇතුළත සම සතරැස් දිගු ආකාර |
| 16 | අභ්‍යන්තරය හා පිටත හතරැස් ආකාර |
| 17 | පැතලි දිගු හතරැස් ආකාර |


Type 2 පැති සහිත පබළු වර්ගීකරණ සටහන





## III නැවුම් සහිත පබළු (Bend Beads)

මෙම පබළුවල ප්‍රධාන ම ලක්ෂණය ලෙස නැවුමක් දැකගත හැකි බැවින් නැවුම් සහිත පබළු ලෙස නම් කර ඇත. මෙම වර්ගයට අයත් ව විවිධාකාර නැවුම් සහිත ව නිර්මාණය කරන ලද පබළු රැසක් දක්නට ලැබේ. ඒවා රවුම්, දිගු හතරැස් හා උත්තල ආකාර හැඩ ගන්නා අතර උප වර්ග 11 ක් ජේතවනය ඇසුරෙන් හඳුනාගත හැකි ය. ඇනී දැරණියගලගේ වර්ග අංක VIII (Cone Beads) යන වර්ගයට අයත් ප්‍රධාන හැඩ තුනට (එම) අයත් පබළු වර්ග ද මෙම වර්ගයට අයත් ව ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය. මෙම නැවුම් සහිත පබළු තුළින් ෂඩස්‍රාකාර, පංචාස්‍රාකාර මෙන් ම චතුරස්‍රාකාර හැඩ සහිත පබළු ජේතවන පබළු එකතුව තුළින් හඳුනා ගත හැකි ය.




| | |
|---|---|
| 01 | පංචාස්‍රාකාර |
| 02 | දෙපස කැපූ ෂඩස්‍රාකාර |
| 03 | පැති කැපූ පංචාස්‍රාකාර |
| 04 | පැති කැපූ හතරැස් ආකාර |
| 05 | දෙපස කැපූ ෂඩ්කොන් ආකාර |
| 06 | දෙපස කැපූ පැතලි ෂඩ්කොන් උත්තලාකාර |
| 07 | ෂඩ්කොන් උත්තලාකාර |
| 08 | දෙපස කැපූ ෂඩ්කොන් උත්තලාකාර |
| 09 | දෙපස කැපූ දිගු ෂඩ්කොන් |
| 10 | පැති කැපූ හතරැස් ආකාර |
| 11 | දෙපස කැපූ පෙති හැඩ උත්තලාකාර |

Type 3 නැවුම් සහිත පබළු වර්ගීකරණ සටහන

## IV දෙපස කර සහිත පබළු (One Collar Beads)

මෙම වර්ගයේ සුවිශේෂත්වය වන්නේ නිර්මාණය කිරීමේ දී කර සහිත ව දෙපස හැඩ ගන්වා තිබීම වේ. ජේතවනය ආශ්‍රිත ව වාර්තා වී ඇති මෙම වර්ගයට අයත් පබළු උප වර්ග 14 ක් හඳුනාගත හැකි ය. ඈනී දැරණියගලගේ වර්ගීකරණයට අයත් වර්ග අංක XI (Collar Beads) යන වර්ගයට අයත් Croove Collar වර්ගයේ හැඩ දෙකක් හා Lug – Collar Beads වර්ගයේ හැඩ 05ට එම අයත් වර්ග ද (එම: 212) මෙම වර්ගය තුළින් හඳුනාගත හැකි ය.





Type 4 දෙපස කර සහිත පබළු වර්ගීකරණ සටහන





## V දෙපස කපන ලද කර සහිත පබළු (Croove collar beads)


මෙම වර්ගයේ පබළුවල මූලික හැඩය සකස් කිරීමෙන් (වට හැඩය) අනතුරු ව කර සිටින සේ සීරීමෙන් හෝ කැපීමෙන් මෙම පබළු ව නිෂ්පාදනය කර ඇත. මෙ වැනි හැඩ සහිත උප වර්ග 14 ක් ජේතවනයෙන් හඳුනාගත හැකි ය.




Type 5 එක් කරක් සහිත පබළු වර්ගීකරණ සටහන

## VI එක් කරක් සහිත පබළු (One Collar Beads)

මෙහි විශේෂත්වය වන්නේ තනි කරක් සහිත ව පබළු ව නිර්මාණය කර තිබීමයි. එ වැනි හැඩ සහිත උප වර්ග 06ක් ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය. මෙම වර්ගයේ පබළු සකස් කිරීමේ දී එහි කර සීරීමෙන් හෝ කැපීමෙන් නිර්මාණය කර තිබේ. ඇතැම් පබළු සඳහා කරක් වෙන ම අල්ලා නිර්මාණය කර ඇත.



| | |
|---|---|
| 01 | - |
| 02 | - |
| 03 | - |
| 04 | - |
| 05 | කැකිරි/කොමඩු හැඩ |
| 06 | කැකිරි/කොමඩු හැඩ |


Type 6 දෙපස කපන ලද කර සහිත පබළු වර්ගීකරණ සටහන

## VII සත්ත්ව රූප හැඩ පබළු ( Animal Figer Beads)

ජේතවනයෙන් හමු වූ පබළු එකතුව තුළ සත්ත්ව රූප හැඩ පබළු දැකගත හැකි ය. එ මඟින් විවිධාකාරයේ සතුන් නිරූපණය කර තිබේ. එම සතුන් අතර ඉබ්බා, මාළුවා වැනි ජලජ ජීවීන් විශේෂයෙන් දැකගත හැකි ය. මෙ වැනි හැඩ සහිත පබළු තිස්සමහාරාම පබළු වර්ගීකරණය තුළ දැකගත නොහැකි ය. එ බැවින් මෙම සත්ත්ව රූප හැඩ පබළු උප වර්ග 09 ක් ජේතවනයෙන් හඳුනාගත හැකි ය.








| | |
|---|---|
| 01 | ඉදිබුවෙකු ආකාර |
| 02 | ඉදිබුවෙකු ආකාර |
| 03 | ඉදිබුවෙකු ආකාර |
| 04 | ඉදිබුවෙකු ආකාර |
| 05 | මත්ස්‍ය ආකාර |
| 06 | මත්ස්‍ය ආකාර |
| 07 | මත්ස්‍ය ආකාර |
| 08 | මත්ස්‍ය ආකාර |
| 09 | සිංහ ආකාර |

Type 7 සත්ත්වරූප හැඩ පබළු වර්ගීකරණ සටහන

## VIII සංකේත නිරූපිත පබළු (Symbolic Beads)

මෙම පබළු තුළ විවිධ ආකාරයේ සංකේත දැකගත හැකි ය. ඒ අතර පූර්ණ සටය හා විවිධ ජ්‍යාමිතික හැඩවලට අයත් කැටයම් නිර්මාණය කර තිබේ. මෙම වර්ගයේ පබළු ජේතවනයෙන් ම පමණක් හමුවන සුවිශේෂ පබළු වශයෙන් පෙන්වාදිය හැකි ය. මේ වර්ගයට අදාළ ව උප වර්ග 10 ක් ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය. එම වර්ග 10ට අදාළ ව ඇති පබළු හැඩ හැනිබල් දැරණියගලගේ හෝ බෙක් වර්ගීකරණ සටහන තුළ හුඳුනාගත නොහැකි ය. එ බැවින් මෙම වර්ගය ජේතවනයෙන් හමුවන විශේෂ හැඩ සහිත වර්ගයක් වේ.





Type 8 සංකේත නිරූපිත පබළු වර්ගීකරණ සටහන

## IX මල් හා ඵල හඩැති පබළු (Flower and Seeds Shapes)

එක් පැත්තක මලක් ආකාරයෙන් ද අනෙක් පැත්තක ඵලයක ආකාරයෙන් පෙනෙනසේ නිර්මාණය කර ඇති පබළු මේ වර්ගයට අයත් ය. මෙ වැනි පබළු උප වර්ග 09 ක්පමණ ජේතවනයෙන් හඳුනාගෙන තිබෙන අතර ඇනී දැරණියගලගේ වර්ගීකරණයේ හෝබෙක් වර්ගීකරණයේ මෙ වැනි හැඩ සහිත පබළු නොමැත.









Type 9 මල් හා ඵල හැඩති පබළු වර්ගීකරණ සටහන

## X. මාල පෙති හැඩති පබළු (Pendent Beads)

සිදුරක් විද මාල සඳහා යොදන මාල පෙති ආකාරයට නිම වූ පබළු උප වර්ග 2 ක් ජේතවනයෙන් හමු වේ. මෙ වැනි හැඩ සහිත පබළු ඇනී දැරණියගලගේ පබළු වර්ගීකරණය තුළින් දැකගත නොහැකි ය. එම නිසා මෙම පබළු වර්ගය ජේතවනයෙන් හමුවන නවත ම පබළු වර්ගයක් වශයෙන් පෙන්වාදිය හැකි ය.

01

02



Type 10 මාල පෙති හැඩති පබළු වර්ගීකරණ සටහන

### 4.1.2.9 මැටි බඳුන් (Pottery)

ජේතවන පුරාබිම ආශ්‍රිත කැණීම්වලදී හමු වී ඇති භෞතික සංස්කෘතික තොරතුරු අතර බහුල ව වාර්තා වී ඇත්තේ මැටි බඳුන් හා මැටි බඳුන් ශේෂ වේ. ගණනය කිරීමට ලක් කළහොත් ඒවා ලක්ෂ ගණනාවක් වන බව පසුගිය වසර 28 තුළ එකතු වූ මැටි බඳුන් හා ඒවායේ ශේෂිත කොටස් අනුව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ හමුවන මැටි මෙවලම් පිළිබඳ ව හා එහි ඇති මානවවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ ව පෙන්වාදෙනු ලැබුවේ ආනන්ද කුමාරස්වාමි විසිනි (*Sz*.4(13) :1-18;(14,15): 135-41) මින් අනතුරු මැටි බඳුන් සම්බන්ධ වර්ගීකරණයක මුල් ම සංකල්පය පී.ඊ.පී. දැරණියගල විසින් බෙල්ලන්බැඳි පැලැස්සෙන් හමු වූ මැටි බඳුන් ඇසුරෙන් පෙන්වා දී ඇත (Deraniyagala P.E.P.1958:82). මේ ආකාරයට ආරම්භ වූ මැටි මෙවලම් පිළිබඳ ව අධ්‍යයනය එහි භාවිතාවේ උපයෝගිතාවය මත වර්ග කිරීම වැදගත් යැයි පෙන්වා දෙමින් ගුණසේකර, ප්‍රේමතිලක සහ සිල්වා විසින් මැටි බඳුන් වර්ග කිරීමක් ආරම්භ කරන ලදි (*Ac*.No. 01). එහි දී ඔවුන් විසින් වර්ග 9කට අයත් මැටි බඳුන් හඳුනාගෙන ඇත (එම). නමුත් ස්තරායනය අනුව හමුවන්නා වූ මැටි මෙවලම් යම්කිසි කාල අනුපිළිවෙලක් මත වර්ග කළ හැකි බව පෙන්වාදුන් සිරාන් දැරණියගල ඊට පෙර පර්යේෂකයන්ගේ අධ්‍යයනයන් ද සළකා බලා 1969 අනුරාධපුර ගෙඩිගේ කැණීමේ දී හමු වූ මැටි බඳුන් උපයෝගී කර ගෙන වර්ගිකරණයක් සිදු කරන ලදි. එහි දී ඔහු විසින් මූලික හැඩ 35ක්





හා ඒවායේ උප වර්ගවලට අයත් මැටි මෙවලම් වර්ග හඳුනාගෙන ඇත (Deraniyagala 1972:65-82). අදාළ වර්ගීකරණය සිදු කිරීමේ දී පහත සඳහන් අංශ කෙරෙහි දැරණියගල අවධානය යොමු කර තිබේ.

1. හැඩය (Form)
2. ආකෘතිය (texture of paste)
3. මතු වී පෙනෙන වර්ණය (Predominant colour)
4. මතුපිට දිප්තිය (Lusture or texture of surface)
5. විෂ්කම්භය (External diameter of Surface) (එම : 65).

දැරණියගල විසින් ම මින් අනතුරු ව 1984 දී මැටි මෙවලම් වර්ගිකරණය සම්බන්ධ ව නව යෝජනවාක් ඉදිරිපත් කර තිබෙන අතර එහි දී මැටි බඳුන්වල මූලික ස්වභාවය කෙරෙහි අවධානය යොමු කර මූලික බඳුන්, ද්විතියික බඳුන්, තෘතීය බඳුන් වශයෙන් වන හැඩ හා එහි උප වර්ග පිළිබඳ ව අදහස් ඉදිරිපත් කර ඇත (Deraniyagala 1984: 109-113).

දැරණියගල විසින් අනුරාධපුර ඇතුළුපුරය ඇසුරෙන් ඉදිරිපත් කරන මෙම මැටි මෙවලම් වර්ගීකරණය උපයෝගී කර ගෙන හේම රත්නායක හා රංජනී පෙරේරා විසින් ජේතවනාරාමය සඳහා නව මැටි මෙවලම් වර්ගීකරණයක් 1982 පුරාවිද්‍යා පර්යේෂණ වාර්තාව තුළින් ඉදිරිපත් කර ඇත (Rattnayake 1984:59).

1982 ජේතවන මැටි මෙවලම් වර්ගීකණය තුළින් රත්නායක හා පෙරේරා විසින් පහත සඳහන් වර්ගයන්ට අයත් බඳුන් ජේතවනයේ පවතින බව පෙන්වා දී ඇත.

i. කාල රක්ත වර්ණ මැටි මෙවලම් (Black and Red ware)
ii. කාල වර්ණ මැටි මෙවලම් (Black ware)
iii. රක්ත වර්ණ මැටි මෙවලම් (Red ware)
iv. පඬුපැහැ මැටි මෙවලම් (Buff ware)

v. අළු පැහැ මැටි මෙවලම් (Gray ware)

vi. උත්තර උද්දීප්ත මැටි මෙවලම් (Nothern Black ware)

vii. රූලේටඩ් මැටි මෙවලම් (Roulateed ware)

viii. දීප්තිමත් රතු පැහැ මැටි මෙවලම් (Red ware)

එසේ ම එම වර්ගීකරණය තුළ පහත සඳහන් මැටි මෙවලම් වර්ග පවතින බව පෙන්වා දී තිබේ.

1. කුසලාන (Kusalana)
2. පාත්‍රය (pathraya)
3. තැටිය (Tati or kabala)
4. බත් වළඳ (Batwalada)
5. නැඹිලිය (Nambiliya)
6. කොරහ (Koraha)
7. හැලිය (Heli)
8. ඇතිලිය (Atiliya)
9. මුට්ටිය (Mutti)
10. කළය (kala)
11. මූඩිය (Mudiya)
12. කොතල (Kothala)
13. කළස (Kalas)
14. මංජුසා (Manjusa) (එම)

රත්නායක හා පෙරේරා 1984 දී ප්‍රකාශයට පත්කර ඇති 1982 ජේතවන මැටි බඳුන් වර්ගීකරණය තුළ දැකගත හැකි ප්‍රධාන වර්ග 08ට වඩා වැඩි වර්ග ප්‍රමාණයක් මේ වන විට ජේතවන කැණීම තුළින් වාර්තා වී තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී නව වර්ගීකරණ සටහනක් (New Typology) ජේතවනයෙන් හමු





වූ මැටි මෙවලම් උපයෝගී කර ගෙන හඳුන්වා ලැබේ. ඒ අනුව ප්‍රධාන වර්ග 24 කට අයත් මැටි බඳුන් මෙහි දී හඳුනාගෙන ඇත

### 4.1.2.9.1 ජේතවන මැටි බඳුන් වර්ගීකරණය

මෙම පර්යේෂණයේදී ජේතවන ආංශු ක්ෂේත්‍රය ආශ්‍රිත ව වාර්තා වී ඇති මැටි බඳුන් වර්ගීකරණයෙන් ප්‍රධාන හැඩ 23ක් යටතේ උප හැඩ 637 හඳුනාගත හැකි විය. ඒ පිළිබඳ වර්ගීකරණය පහතින් දක්වා තිබේ.

1. කාල රක්ත වර්ණ මැටි බඳුන් (Black and Red ware)
2. ඔප දමන ලද කාල වර්ණ මැටි බඳුන් (Black polished ware)
3. කාල වර්ණ මැටි බඳුන් (Black ware)
4. සාමාන්‍ය දුඹුරු පැහැ මැටි බඳුන් (Buff ware/ Plain ware)
5. චීන මැටි බඳුන් (Chinese ware)
6. චොකලට් පැහැති මැටි බඳුන් (Chocolate ware)
7. මිනිරන් ආලේපිත මැටි බඳුන් (Graphite finished ware)
8. අළු පැහැති මැටි බඳුන් (Gray ware)
9. ආලේපිත ඉස්ලාමීය මැටි බඳුන් (Islamic Glassed ware)
10. තලාතු මිනිරන් මැටි බඳුන් (Mica finished wear)
11. උත්තර උද්දීප්ත කාල වර්ණ මැටි බඳුන් (Northern black Polished ware)
12. තැඹිලි පැහැති මැටි බඳුන් (Orange ware)
13. අළු පැහැ ආලේපිත මැටි බඳුන් (Painted gray ware)
14. පාතියන් වර්ගයේ මැටි බඳුන් (Parthian ware)
15. පෝසිලේන් වර්ගයේ මැටි බඳුන් (porcelain)
16. රතු දුඹුරු පැහැති මැටි බඳුන් (Red brown ware)
17. ඔප දමන ලද රතු පැහැති මැටි බඳුන් (Red polished ware)

18. රතු ආලේපිත මැටි බඳුන් (Red painted ware)
19. රතු පැහැය ඉවත් වන සුළු මැටි බඳුන් (Red Slipped ware)
20. රතු පැහැති මැටි බඳුන් (Red ware)
21. සැමන් මත්ස්‍ය පැහැ මැටි බඳුන් (Salman ware)
22. රූලේටඩ් වර්ගයේ මැටි බඳුන් (Rouleted ware)
23. සුදු ආලේපිත මැටි බඳුන් (White painted ware)
24. සුදු පැහැති මැටි බඳුන් (White ware)

ඉහත මැටි බඳුන් වර්ග තුළ පහත සඳහන් හැඩයන්ට අදාළ මැටි භාජන වර්ග හා මැටි මෙවලම් පවතින බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය.

1. කෝප්ප (kusalana)
2. පාත්‍රා (Pathra)
3. තැටි (Tati)
4. බත් වළඳ (Batwalanda)
5. නැඹිලිය (Nembiliya)
6. කොරහ (Koraha)
7. හැලි (hali)
8. ඇතිලිය (‘එසකසහ්)
9. මුට්ටි (Mutti)
10. කළ (Kala)
11. මූඩිය (Mudiya)
12. කෙම් (Spout)
13. කලස් (Vas)
14. මංජුසා (Casket)
15. පහන් (lamps)
16. පැන් ඉසින (Sprinkle)





17. අඩි (Base)
18. කෝව (Crucible)
19. වයින් භාජන (Wine vassals)
20. පුනීල (Funnel)
21. අඬු (Handle)
22. දරනු (Stand)
23. ගඩබා බඳුන් (Storage pots)

මැටිමය නිර්මාණ ලෙස,

1. කරාබු (Eye rings)
2. කොත් කැරලි (pinnacles)
3. මැටි නල (Clay pipe)
4. ලිප් (Oven)
5. මැටි බෝල (Clay Disk)
6. මැටි පෙති (Clay disk)
7. උළු (Tile)
8. ගඩොළු (Brisk)
9. පහන් කණු (Lamps holders) පෙන්වාදිය හැකි ය.

1982 සිට 2008 දක්වා කාලය තුළ ජේතවන ව්‍යාපෘතිය තුළ සිදු කරන ලද ස්තර විද්‍යානුකූල පුරාවිද්‍යා කැණීම් තුළින් (Stratified Scientific Excavation) අනුව ජේතවන අවධිය හා ප්‍රාග් ජේතවන අවධියට අයත් ස්තර තුළින් ඉහතින් විස්තර කර ඇති මැටි භාජන හා මැටි මෙවලම් හඳුනාගෙන ඇත. මෙම අධ්‍යයනය තුළ දී උත්සාහ ගනු ලබන්නේ ස්තරායානුකූල ව හමු වන්නා වූ මැටි බඳුන් එහි පැරණිත ම වර්ගයේ සිට නව වර්ගය දක්වා වන අනුපිළිවෙලකට හඳුනාගැනීමයි. ඒ සඳහා දැරණියගලගේ 1972 වර්ගීකරණයේ දී ප්‍රකාශයට පත්කර ඇති වර්ගීකරණය ද අධ්‍යයනය සඳහා භාවිත කරනු ලැබූ අතර හේම රත්නායකගේ ජේතවන මැටිබඳුන් වර්ගීකරණය කෙරෙහි

ද අවධානය යොමු කරමින් පහත සඳහන් අංශ ඔස්සේ මෙම වර්ගීකරණය සිදු කර ඇත.

1. හැඩය (Form)
2. උපයෝගීතාවය (Function)
3. නිෂ්පාදන තාක්ෂණය (Technology)
4. විශාලත්වය (Size)

ජේතවන පරිශ්‍රයෙන් හමු වී ඇති මැටි බඳුන් වර්ග 23ට අදාළ ව උප වර්ග 637 ක් පවතින බව මෙම අධ්‍යයනයේ දී හඳුනාග නු ලැබූ අතර එයට අමතර ව මැටිමය නිර්මාණ 9ක් පවතින බව හඳුනාගෙන ඇත. පහතින් විස්තර වන්නේ එම වර්ගවලින් විශේෂයෙන් කැපීපෙනෙන උප වර්ගයන් පිළිබඳ ව විස්තරයකි.

1 වන වර්ගය කෝප්ප (Kusalana)

ජේතවන විහාර භූමියෙන් හමු වී ඇති මැටි මෙවලම් අතර 1 වැනි වර්ගය ලෙස වර්ගීකරණයට අයත් වන්නේ කෝප්ප වශයෙන් හැඳින්වෙන හැඩයෙන් යුත් වර්ගයයි. මෙම වර්ගයට අදාළ ව උප වර්ග 24 ක් හඳුනාගත හැකි ය. එම බඳුන් අතර කාල රක්ත වර්ණ මැටි මෙවලම් (Black and Red Ware), රක්ත වර්ණ මැටි මෙවලම් (Red Ware), අළු පැහැ මැටි මෙවලම් (Gray ware) සාමාන්‍ය දුඹුරු පැහැ මැටි මෙවලම් (Buff Ware/ Plain Ware) හා රූලේටඩ් වර්ගයේ මැටි මෙවලම් (Roulated ware) පවතින බව හඳුනාගන්නා ලදී.

**උප වර්ග 1a** කාල රක්ත වර්ණ පැහැ කෝප්ප වර්ගයට අයත් බඳුනකි. එය 7.5 YR 6/4 Light Brown පැහැ වන අතර විෂ්කම්භය සෙ.මී. 07 ක් වේ. බඳුනේ රචනාව (Texture) මධ්‍යම වන අතර තුනී ස්වෑපයකින් යුත් බඳුන් වර්ගයකි.

**උප වර්ග 1b** රක්ත වර්ණ (Red ware) පැහැ කෝප්ප වර්ගයය අයත් 7.5 YR 5/3 Brown පැහැ බඳුන් වර්ගයකි. එහි විෂ්කම්භය සෙ.මී. 10 ක් පමණ වේ. රචනාව






(Texture) මධ්‍යම වන අතර තරමක් ඝනකමින් යුත් බඳුන් වර්ගයකි.

**උප වර්ග 1a iii** අළු පැහැ (Gray ware) කෝප්ප වර්ගයට අයත් බඳුනකි. 2.5 YR 4/0 Dark Gray පැහැයෙන් යුත් මෙම බඳුනේ රචනාව මධ්‍යම වන අතර විෂ්කම්භය සෙ.මී. 10ක් පමණ වේ. මෙම බඳුන් වර්ගය තුනී බඳුන් විශේෂයකි.

**උප වර්ග 1g** සරල රතු දුඹුරු (Plain ware) කෝප්ප වර්ගයට අයත් බඳුනකි. සෙ.මී. 6 ක පමණ විෂ්කම්භයකින් යුත් මෙම කෝප්ප වර්ගය 10 YR 3/7 Very Pale Brown පැහැයෙන් යුක්ත වන අතර මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් යුත් බඳුන් විශේෂයක් වේ.


**උප වර්ග 1a iv** රූලේටඩ් (Rouleted ware) වර්ගයට අයත් කෝප්ප විශේෂයකි. එහි පැහැය 2.5 YR 4/1 Dark Gray වන අතර විෂ්කම්භය සෙ.මී. 10 ක් පමණ වේ. මෙම බඳුන් තුනී බඳුන් විශේෂයක් වශයෙන් හඳුනාගත හැකි ය.

**උප වර්ග 1 a vi** කාල වර්ණ ඔප දැමූ කෝප්ප විශේෂයක් වේ. 10 YR 2/1 Black වර්ණයෙන් යුත් මෙම කෝප්ප සෙ.මී. 12 ක් පමණ විෂ්කම්භයෙන් යුක්ත ය. රචනාව මධ්‍යම වන අතර, තරමක් තුනී ස්වරූපයකින් යුත් කෝප්ප වර්ගයට අයත් බඳුන් විශේෂයකි.ඉහතින් විස්තර කර ඇති බඳුන් වර්ග ප්‍රාග් ජේතවන ස්තරවලින් $S_5W_8$, $N_6W_4$, $N_7E_8$, $N_9W_2$, $N_3W_3$ යන ප්‍රධාන සැලැස්මේ ග්‍රිඩ් අංක තුළ සිදු කර ඇති කැණීම්වලින් හා JSMP 2001, JPT 2000 ආදී කැණීම්වල දී වාර්තා වී තිබේ. ඉහත උප වර්ගවලට අමතර ව වර්ගීකරණයට ලක්කර ඇති උප වර්ග ජේතවන විහාරය ආශ්‍රිත ස්තරවලින් වාර්තා වී තිබේ.








## 2 වැනි වර්ගය පාත්‍රා (Pathra)

2 වැනි වර්ගයට අයත් මැටි බඳුන් විශේෂ එහි හැඩය අනුව පාත්‍ර වර්ගයට අයත් වේ. පාත්‍ර වර්ගයට අයත් මැටි මෙවලම් ආශ්‍රිත උප වර්ග 37ක් එහි මූලික හැඩ අනුව ජේතවන විහාරය ආශ්‍රිත කැණීම් තුළින් හඳුනාගත හැකි ය. මෙම බඳුන් බොහොමයක් ජේතවන විහාර අවධියට අයත් ස්තරවලින් JSP 2000, JSMP

2001, JPL 2002, JSWMP 2003/2004 ආදී පර්යේෂණ කැණීම්වලින් ද $S_5W_8$ ග්‍රිඩ් අංකයට අයත් පර්යේෂණ කැණීමෙන් ද වාර්තා වී ඇත. හමු වී ඇති උප වර්ග අතර කාලරක්ත වර්ණ පාත්‍රා (BRW) ඔප දමන ලද රක්ත වර්ණ පාත්‍රා (RPW) රක්ත වර්ණ පාත්‍රා (RW) ඔප දමන ලද කාල වර්ණ පාත්‍රා (BPW) හඳුනාගත හැකි ය.

**උප වර්ග 2 a** 7.5 YR 2/0 black වර්ණයෙන් යුත් පාත්‍රා වර්ගය සෙ.මී. 16 ක් විෂ්කම්භයකින් යුක්ත වේ. මෙම බඳුනෙහි රචනාව මධ්‍යම ප්‍රමාණය වන අතර කාල වර්ණ තුනී බඳුන් විශේෂයක් වේ.

**උප වර්ග 2 b** කාල වර්ණයෙන් යුක්ත පාත්‍ර වර්ගයකි. 2.5 YR 2/1 black වර්ණයෙන් යුත් මධ්‍යම ප්‍රමණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් මෙම බඳුන් වර්ගය යුක්ත වේ. එහි විෂ්කම්භය සෙ.මී.20 කි.

**2 c උප වර්ගය** කාල වර්ණ පාත්‍රා විශේෂයකි. 10 YR 2/1 Black වර්ණයෙන් යුක්ත මෙම බඳුන් මධ්‍යම ප්‍රමණයේ රචනාවකින් ද සෙ.මී. 22 ක විෂ්කම්භයකින් ද යුක්ත වේ.

**2 d උප වර්ගය** කාල රක්ත වර්ණ (BRW) පාත්‍ර වර්ගයකි. 5YR 3/4 Dark Reddish Brown පැහැ මෙම බඳුන් වර්ගය සෙ.මී. 20 ක විෂ්කම්භයකින් හා මධ්‍යම ප්‍රමණයේ රචනාවකින් යුක්ත වේ.

**උප වර්ග 2 e** 10 R 4/5 Red වර්ණයෙන් යුත් කාල රක්ත වර්ණ (BRW) පාත්‍රා වර්ගයකි. විෂ්කම්භය සෙ.මී. 28 ක් පමණ වන අතර මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හ මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුත් බඳුන් වර්ගයකි.


**උප වර්ග 2 e** 5YR 3/2 Dark Reddish Brown වර්ණයෙන් යුත් ඔප දමන ලද රක්ත වර්ණ (RBW) පාත්‍රා






විශේෂයෙකි. සෙ.මී. 20 ක් පමණ විෂ්කම්භයකින් හා උසස් රචනාවකින් සමන්විත මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත බඳුන් විශේෂයකි.

මෙම වර්ගයට අයත් බඳුන් වර්ගවලට අමතර ව රක්ත වර්ණ (RW) පාත්‍රා විශේෂ ගණනාවක් ද උප වර්ග තුළ අන්තර්ගත වේ.






## 3 වැනි වර්ගය තැටි (Thati)

ජේතවන විහාරය ආශ්‍රිත ව හමු වී ඇති මැටි මෙවලම් අතර මී ළඟ බඳුන් වර්ගය වන්නේ තැටි හැඩයේ මැටි බඳුන් වර්ගයයි. ප්‍රාග් ජේතවන හා ජේතවන අවධියට අයත් ස්තර ආශ්‍රිත ව මෙම මැටි වාර්තා වී තිබේ. මෙම මැටි බඳුන්වලට අයත් උප වර්ග 114ක් ජේතවනයෙන් හඳුනාගත හැකි ය. එම උප වර්ග අතර කාල රක්ත වර්ණ මැටි බඳුන් (BRW), රක්ත වර්ණ මැටි බඳුන් (RW), රුලේටඩ් මැටි බඳුන් (RLW) වේ.






**උප වර්ග 3 a** මෙම බඳුන් රක්ත වර්ණ මැටි බඳුන් වර්ගයකි. (RW) 2.5 YR 4/4 Reddish Brown වර්ණයෙන් යුත් මෙම බඳුන් සෙ.මී.30 - 20 අතර විෂ්කම්භයක් ගන්නා මෙම වර්ගයේ උප හැඩ රාශියකින් සමන්වත වේ. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් මෙම බඳුන් වර්ගය යුක්ත වේ.

**උප වර්ග 3 b** වර්ගයේ තැටි වර්ග ගණනාවකින් යුක්ත වේ. විවිධ විෂ්කම්භයන්ගෙන් යුක්ත ව හමුවන මෙම බඳුන් අතරින් සෙ.මී. 35 ක් සහිත විශාල බඳුන් 3 b iii වර්ගයට අයත් වේ. 2.5 YR 4/4 Red වර්ගයෙන් යුත් මෙමතැටි විශේෂය මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත වේ.


**උප වර්ග 3 C** වර්ගයට අයත් බඳුන් ද වර්ග කිහිපයකින් සමන්විත වේ. 2.5 YR 3/4 Dark Reddish Brown පැහැ රක්ත වර්ණ මෙම මැටි මෙවලම් (RW) අතරින් විශාලත ම තැටිය විෂ්කම්භය සෙ.මී. 21ක් පමණ වේ. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුත් භාජන විශේෂයකි.


**උප වර්ග 3 f** වර්ග ගණනාවක් තබේ. එම වර්ග අතර කාල රක්ත වර්ණ (BRW), රක්ත වර්ණ (RW) හා රුලේටඩ් වර්ගයේ බඳුන් දැකගත හැකි ය. විෂ්කම්භය සෙ.මී. 25, 20, 22 ආදි විවිධ ප්‍රමාණවලින් යුත් මෙම තැටි විශේෂය අතර 3 F v, vi, vii, viii, xi, x, xi, xii උප වර්ග ප්‍රාග් ජේතවන අවධියට අයත් ස්තරවලින් වාර්තා වී ඇත. අනෙකුත් බඳුන් වර්ග ජේතවන අවධියට අයත් ස්තරවලින් වාර්තා වී තිබේ.


3a
$3a_{i}$
$3a_{i}$
$3a_{ii}$
$3a_{iii}$
$3a_{iii}$
$3a_{iii}$
$3a_{iii}$
$3a_{iii}$
3b
$3b_{i}$
$3b_{iii}$
$3b_{iii}$








$3f_{v}$
$3f_{vi}$
$3f_{vii}$
$3f_{viii}$
$3f_{ix}$
$3f_{x}$
$3f_{xi}$
$3f_{xii}$
$3f_{xiii}$
$3c_{ii}$
$3c_{ii}$
3d
3e
3f
3f
$3f_{i}$
$3f_{i}$
$3f_{ii}$
$3f_{iii}$
$3f_{iv}$
3c
3c
3c
3c
3c
3c
3c
3c
3c
$3c_{i}$
$3c_{i}$


3g
3g
3g
3g
3g
3g
3g
3g
3g
3g
3g
$3g_{i}$
$3g_{ii}$
$3g_{ii}$
$3g_{ii}$
$3g_{ii}$






3g
3g
3g
3h
$3h_{i}$
$3h_{i}$
$3h_{ii}$
3h i
3j
$3j_{i}$
$3j_{i}$
$3j_{i}$
$3j_{i}$
$3j_{i}$
$3j_{ii}$
$3j_{ii}$








## 4 වැනි වර්ගය බත් වළඳ (BathWaland)

ජේතවන මැටි බඳුන් වර්ගීකරණයේ සිව් වැනි වර්ගය ලෙස බත් වළඳ පෙන්වාදිය හැකි ය. මෙම වර්ගයට අයත් උප වර්ගයන් 63 ක් වාර්තා වී තිබේ. මෙම බඳුන් වර්ගය බහුල වශයෙන් ජේතවන විහාර අවධියට අයත් ස්තරවලින් වාර්තාවන අතර රක්ත වර්ණ (RW) බඳුන් වශයෙන් හඳුනාගත හැකි ය.


**උප වර්ගය 4 a** 5 YR 3/4 Dark Reddish Brown වර්ණ ගන්නා විෂ්කම්භය සෙ.මී. 24 ක් පමණ වන බඳුන් වර්ගයකි. එහි රචනාව මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත වේ. ඝනකම ද මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙම වර්ගය අයත් උප වර්ගයන් අතර පහත සඳහන් වර්ග කැපීපෙනේ.

**උප වර්ගය 4 d** 5 YR 4/5 Yellowish Red වර්ණයෙන් යුක්ත විෂ්කම්භය සෙ.මී. 37 පමණ වන බඳුන් වේ. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් ද මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් ද මෙම බඳුන් යුක්ත වේ.

**උප වර්ගය 4 e** 5 YR 4/5 Yellowish Red වර්ණයෙන් යුක්ත සෙ.මී. 40 ක් පමණ විෂ්කම්භයක් ගන්නා බඳුන් වර්ගයකි. එම බඳුන් මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් යුක්ත වේ.


**උප වර්ගය 4 f ද** 5 YR 3/3 Dark Reddish Bbrown වර්ණයෙන් යුත් සෙ.මී. 40 ක් පමණ විෂ්කම්භයක් ගන්නා බඳුන් වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත වේ.


**උප වර්ග 4 O** 5 YR 3/3 Dark Reddish Brown රක්ත වර්ණයෙන් යුක්ත මැටි බඳුන් වර්ගයකි. සෙ.මී. 40 ක් පමණ විෂ්කම්භයකින් යුත් මෙම මැටි මෙවලම් මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත වේ.


4a
$4a_i$
$4a_{ii}$
$4a_{iii}$
4b
$4b_i$
4c
$4c_i$
$4c_{ii}$








4d
$4d_i$
$4d_{ii}$
$4d_{iii}$
4e
4f
$4f_i$
$4f_{ii}$
$4f_{iii}$
$4f_{vi}$
4g
$4g_i$
$4g_{ii}$


4h
4hi
4hii
4hiii
4hiv
4i
4ii
4j
4ji
4jii
4jiii
4k
4ki
4kii







4Niv
4Nv
4o
4oi
4oii
4oiii
4p
4pi
4q
4qi
4qii









## 5 වැනි වර්ගය නැඹිලිය (Nambiliya)

පස් වැනි වර්ගයට අයත් මැටි මෙවලම් විශේෂය නැඹිලිය වර්ගයට අයත් වේ. උප වර්ග 09 ක් ජේතවනයෙන් වාර්තා වී ඇත. මෙම හැඩයන්ගේ බඳුන් ජේතවන විහාර අවධියට අයත් ස්තරවලින් වාර්තා වී තිබේ. රක්ත වර්ණ භාජන (RW) සණයට අයත් බඳුන් වශයෙන් මේවා පෙන්වාදිය හැකි ය.

**උප වර්ගය 5 a** 2.5 YR 2.5 /2 Very Dusky Red වර්ගයෙන් යුක්ත සෙ.මී. 20 ක් පමණ විෂ්කම්භයක් ගන්නා බඳුන් වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත වේ.

**උප වර්ගය 5 C** සෙ.මී. 34 විෂ්කම්භයකින් යුක්ත 5 YR 3/4 Dark Reddish Brown වර්ණ මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් හා මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් යුක්ත බඳුන් විශේෂයකි.

**උප වර්ගය 5 g** සෙ.මී. 28 ක විෂ්කම්භයකින් යුක්ත 5 YR 3/4 Dark Reddish Brown පැහැ මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත බඳුන් විශේෂයක් වේ.








## 6 වැනි වර්ගය කොරහ (Koraha)


ජේතවන විහාරය ආශ්‍රිත ව හමු වී ඇති මැටි මෙවලම් අතර හය වැනි වර්ගය ලෙස කොරහ හැඳින්විය හැකි ය. මෙම වර්ගයට අදාළ ව උප වර්ග 14 ක් ජේතවනයෙන් හඳුනාගෙන තිබේ. රතු භාජන ඝනයට (RW) අයත් මෙම මැටි මෙවලම් විශේෂ ද බහුල වශයෙන් ජේතවන අවධියට අයත් ස්තර තුළින් වාර්තා වී තිබේ.

**උප වර්ගය 6 a** සෙ.මී. 40 ක් පමණ විෂ්කම්භයකින් යුක්ත 2.5 YR 4/4 Reddish Brown පැහැ රක්ත වර්ණ බඳුන් වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත භාජන විශේෂයක් වේ.

**උප වර්ගය 6 e** 5 YR 3/4 Dark Reddish Brown පැහැයෙන් යුක්ත සෙ.මී. 39 විෂ්කම්භයක් ගන්නා මෙම භාජන මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් හා මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් යුත් භාජන වර්ගයකි.

**උප වර්ගය 6 i** සෙ.මී. 26 ක විෂ්කම්භයකින් යුක්ත වේ. 5 YR 3/4 Dark Reddish Brown පැහැ මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් හා මධ්‍යම ප්‍රමාණ රචනාවකින් යුක්ත බඳුන් වර්ගයකි.

**උප වර්ගය 6 e** 5 YR 3/3 Dark Reddish Brown පැහැ සෙ.මී. 40 ක විෂ්කම්භයකින් යුත් මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් හා මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් යුත් බඳුන් විශේෂයකි.










## 7 වැනි වර්ගය හැලි (Hali)

ජේතවන මැටි බඳුන් වර්ගීකරණයට අදාළ ව හත් වැනි වර්ගයට අයත් මැටි මෙවලම් හැලි වර්ගයට අයත් වේ. මෙම බඳුන් වර්ගයට අදාළ උප වර්ග 54 ක් පමණ ජේතවන භූමිය ආශ්‍රිත කැණීම්වල දී ප්‍රාග් ජේතවන හා ජේතවන අවධියට සම්බන්ධ ස්තරවලින් සොයා ගෙන ඇත.

**උප වර්ගය 7 a** විෂ්කම්භය සෙ.මී. 36කින් සමන්විත වේ. 10 YR 4/4 Weak Red පැහැ රතු භාජන විශේෂයක්වන (RW) මෙම මෙවලම් මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුක්ත වේ.




7diii
7div
7e
7ei
7eii
7f
7fi
7fii
7g
7gi
7gii
7giii






7p
7q
7qi
7qii
7qiii
7r
7s
7t
7ti
7k
7ki
7kii
7ℓ
7ℓi
7m
7n
7o
7oi
7oii
7h
7hi
7hii
7hiii
7i
7ii
7j
7ji
7jii
7jiii
7jiv
7jv

## 8 වැනි වර්ගය ඇතිලිය (Athilitya)

අට වැනි වර්ගයට අයත් ඇතිලි වර්ගයේ උප වර්ග 27ක් පමණ ප්‍රාග් ජේතවන හා ජේතවන විහාර අවධියට අයත් ස්තර ආශ්‍රිත ව වාර්තා වී තිබේ. එම උප වර්ග අතර කාල රක්ත වරණ මෙවලම් (**BRW**), රක්ත වර්ණ මෙවලම් (**RW**) හා කාල වර්ණ මෙවලම්වලට (**BW**) අයත් භාජන වර්ග හඳුනාගත හැකි ය.


**උප වර්ගය 8 O** කාල රක්ත වර්ණ මැටි මෙවලම් සෙ.මී.22 ක විෂ්කම්භයෙන් යුක්ත වේ. 5 YR 5/4 Reddish Brown වර්ණයෙන් යුත් මෙම මෙවලම් මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් හා මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් සමන්විත වේ.


**උප වර්ගය 8 r** රක්ත වර්ණ භාජන (RW) ගණයට අයත් වේ. සෙ.මී. 20 ක විෂ්කම්භයෙන් යුක්ත මෙම බඳුන් 5 ශඍ 3/4 Dark Reddish Brown පැහැ වන අතර මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයක ඝනකමකින් යුක්ත වේ.

**උප වර්ගය 8 q** 5 YR 4/4 Reddish Brown පැහැයෙන් යුක්ත සෙ.මි. 26ක විෂ්කම්භයෙන් යුත් බඳුන් වර්ගයක් වේ. රචනාව හා ඝනකම මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත වේ.









8c
$8c_{i}$
$8c_{ii}$
$8c_{iii}$
$8c_{iv}$
$8c_{v}$
$8c_{vi}$
8d
$8d_{i}$
$8d_{ii}$
8e
8f
8g
$8g_{i}$
$8g_{ii}$
8h
$8h_{i}$
$8h_{ii}$
$8h_{iii}$
8i






8j
$8j_{i}$
$8j_{ii}$
$8j_{iii}$
$8j_{iv}$
$8j_{v}$
$8j_{vi}$
8k
8ℓ
$8ℓ_{i}$
8m
$8m_{i}$
8n
8o
8p
$8p_{i}$
8q
$8q_{i}$
8r
$8r_{i}$
$8r_{ii}$
8t
$8t_{i}$
8u
$8u_{i}$
8v
8x
8y

## 9 වැනි වර්ගය මුට්ටි (mutti)

නව වැනි මැටි භාජන වර්ගයට අයත් වන්නේ මුට්ටි වර්ගයේ බඳුන් ය. එම වර්ගයට අදාළ උප වර්ගයන් 62 ක් ජේතවන පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් හඳුනාගෙන තිබේ. රක්ත වර්ණ භාජන වර්ගයට (RW) අයත් බඳුන් ප්‍රාග් ජේතවන හා ජේතවන අවධියට අයත් ස්තරවලින් වාර්තා වී ඇත.


**උප වර්ගය 9 c** 5 YR 4/4 Reddish Brown වර්ණයෙන් යුක්ත සෙ.මී. 20 ක් විෂ්කම්භයක් ගන්නා භාජන වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් යුක්ත වේ.


**උප වර්ගය 9 g** සෙ.මී. 18 ක විෂ්කම්භයෙන් යුක්ත 7.5 YR 3/3 Dark Brown පැහැ මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුත් භාජන විශේෂයකි.

**උප වර්ගය 9 n i** සෙ.මී. 15 ක විෂ්කම්භයකින් යුක්ත 2.5 YR 4/4 Reddish Brown රක්ත වර්ණ භාජන වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා තුනී ඝනකමකින් යුත් භාජන විශේෂයකි.









9r
9r$_{i}$
9r$_{ii}$
9s
9t
9t$_{i}$
9v
9v
9n
9n$_{i}$
9q
9q$_{i}$
9q$_{ii}$
9p
9p$_{i}$
9g
9g$_{iii}$
9g$_{vi}$
9g$_{viii}$
9h
9i$_{i}$
9i
9j
9k
9ℓ
9m






9z
9z$_{i}$
9z$_{ii}$
9z$_{iii}$
9z$_{iv}$
9z$_{v}$
9z$_{vi}$
9z$_{vii}$
9x
9x$_{i}$
9x$_{ii}$
9x$_{iii}$
9x$_{iv}$
9y
9y$_{i}$
9y$_{ii}$
9o
9o$_{i}$
9o$_{ii}$
9u
9u$_{i}$
9u$_{ii}$
9u$_{iii}$
9u$_{iv}$
9$_{v}$
9w

## 10 වැනි වර්ගය කළ (Kala)

කළ වර්ගයට අයත් මැටි භාජන උප වර්ග 78 ක් ජේතවනයෙන් හඳුනාගෙන ඇත. එම උප වර්ගයට අයත් බඳුන් බහුල වශයෙන් ජේතවන විහාර අවධියට අයත් ස්තරවලින් වාර්තා වී තිබේ.


**උප වර්ගය** 10 a සෙ.මී. 15 ක විෂ්කම්භයෙන් යුක්ත 7.5 YR 5/2 Dark Brown පැහැ භාජන වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් යුක්ත වේ.


**උප වර්ගය** 10 f 7.5 YR 5/3 Brown වර්ණයෙන් යුක්ත සෙ.මී. 8 ක විෂ්කම්භයක ගන්නා භාජන වර්ගයකි. මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් මෙම භාජන වර්ගය යුක්ත වේ.

**උප වර්ගය** 10 q 7.5YR3/3DarkBrownකාලවර්ණබඳුන්වර්ගයකි. සෙ.මී. 18 ක විෂ්කම්භයකින් යුක්ත මෙම මැටි භාජන වර්ගය මධ්‍යම ප්‍රමාණයේරචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් යුක්ත වේ.










$10g_{iii}$
$10h_{vi}$
$10g_{iv}$
$10h_{vii}$
$10g_{v}$
$10g_{vi}$
$10h_{vviii}$
$10g_{vii}$
10h
$10i_{i}$
$10h_{i}$
$10i_{i}$
$10h_{ii}$
$10i_{ii}$
$10h_{iii}$
$10h_{iv}$
$10h_{v}$
$10i_{iii}$






10j
10m
$10j_{i}$
$10m_{i}$
$10j_{ii}$
$10m_{ii}$
$10j_{iii}$
$10m_{ii}$
$10j_{iv}$
10n
1ok
10o
$10k_{i}$
$10o_{i}$
$10o_{ii}$
10ℓ
$10o_{iii}$
$10o_{iv}$
$10ℓ_{i}$
$10o_{v}$









## 11 වැනි වර්ගය මූඩි (Mudi)


මූඩි වර්ගයට අයත් උප වර්ග 22 කට අයත් මැටි භාජන ජේතවනය ආශ්‍රිත ව හඳුනා ගෙන තිබේ. මේවා රක්ත වර්ණ මැටි භාජන වර්ගයට (RW) අයත් වේ.

**උප වර්ගය 11 a** සෙ.මී. 20 ක විෂ්කම්භයෙන් යුක්ත 2.5 YR 5/3 Reddish Brown පැහැ මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් යුත් භාජන විශේෂයකි.

**උප වර්ගය 11 b** සෙ.මී. 24 ක විෂ්කම්භයෙන් යුක්ත මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝණකමකින් යුක්ත 5 YR 5/4 Reddish Brown පැහැ ගන්නා භාජන විශේෂයකි.

**උප වර්ගය 11 c** සෙ.මී. 35 ක විෂ්කම්භයකින් යුත් 5 YR Reddish Brown පැහැ මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් හා මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් යුක්ත භාජන විශේෂයකි.












## 12 වැනි වර්ගය කෙම් (Spout)

මැටි භාජනවලට අයත් කෙම් වර්ග ද විශාල ප්‍රමාණයක් ජේතවනයෙන් හමු වී තිබෙන අතර ඒවා උප වර්ග 21කට අයත් ව හඳුනාගත හැකි ව තිබේ. මෙම කෙම් වර්ග ඔපදමන ලද රක්ත වර්ණ (RPW), ඔපදමන ලද කාල වර්ණ මෙවලම් (BPW) හා රක්ත වර්ණ (RW) බඳුන් වර්ගවලට අයත් වේ. මේවා බහුල ලෙස ජේතවන අවධියට සම්බන්ධ ස්තරවලින් වාර්තා වී තිබේ.

උප වර්ග 12 L සෙ.මී. 5.5 ක විෂ්කම්භයකින් යුක්ත 10 R 4/6 Red මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා තුනි ඝනකමක් සහිත කෙම් වර්ගයකි.

උප වර්ගය 12 K සෙ.මී. 5 ක විෂ්කම්භයකින් යුක්ත 10 R 4/6 Red වර්ණ මධ්‍යම ප්‍රමාණයේ රචනාවකින් හා මධ්‍යම ප්‍රමාණයේ ඝනකමකින් මෙම කෙම් වර්ගයකි.







## 13 වැනි වර්ගය කලස (Vas)

ජේතවන විහාරය ආශ්‍රිත කැණීම්වල දී හමු වූ මැටි භාජන අතර කලස වර්ගයට අයත් භාජන වර්ග හමු වී තිබේ. උප වර්ග 13 ක් ජේතවනයෙන් හඳුනාගෙන තිබෙන අතර මෙම බඳුන් බොහෝ විට Vass ලෙස භාවිත කර ඇති ආකාරය හඳුනාගත හැකි ය.








## 14 වැනි වර්ගය මංජුසා (Casket)

ජේතවන මැටි භාජන වර්ගීකරණය තුළ මංජුසා ද සුවිශේෂ වේ. උප වර්ග 04 කට අයත් මංජුසා ජේතවන අවධියට අයත් ව ස්තූපය ආශ්‍රිත ව කැණීම්වලදී හමු වී තිබේ. ඒවා අතර සාමාන්‍ය රක්ත වර්ණ භාජන වර්ගයට (RW) අයත් බඳුන් තිබේ.





## 15 වැනි වර්ගය පහන් (Lamps)

ජේතවන මැටි භාජන වර්ගීකරණය තුළ මී ළඟ වර්ගය වශයෙන් පහන් හඳුනාගත හැකි ය. විවිධ හැඩයන්ට අනුව නිර්මාණය කර ඇති කුඩා ප්‍රමාණයේ පහන් උප වර්ග 15 ක් හඳුනාගෙන තිබේ. එම පහන් සාමාන්‍ය රක්ත වර්ණ (RW) භාජන වර්ගයන්ට අයත් ය.










## 16 වැනි වර්ගය කෙමි සහිත භාජන


ජේතවනයෙන් හමු වූ කෙමි සහිත භාජනවලින් හැඩය හඳුනාගත හැක්කේ එක් භාජනයක පමණි. එය සෙ.මී. 7.0 විෂ්කම්භයකින් යුක්ත 2.5 YR Dark Reddish Brown පැහැ බඳුනක් වේ.



## 17 වැනි වර්ගය අඩි සහිත භාජන

17 වැනි වර්ගයට අදාළ ව හමු වී ඇති මැටි භාජන වර්ගය හැඩ 02කට අදාළ ව හමු වී ඇත. භාජනයේ හැඩය හඳුනාගත නොහැකි ලෙස ඉහළ කොටස විනාශ වී තිබේ. විෂ්කම්භය සෙ.මී. 10ක් පමණ වන මෙම මැටි භාජන වර්ගය ඔප දමන ලද රක්ත වර්ණ (RPW) වර්ගයට අයත් වේ.









## 18 වැනි වර්ගය කෝව (Crusible)

ප්‍රාග් ජේතවන ස්තර ආශ්‍රිත ව හමු වී ඇති කෝව වර්ග දෙකක අයත් වේ. එයින් 18 i කෝව 2.5 YR 2/0 Black වර්ණයෙන් යුක්ත වන අතර විෂ්කම්භය සෙ.මී. 08 ක් පමණ වේ. 18 ii වර්ගයට අයත් කෝව 25 YR 2/9 Black වර්ණයෙන් යුක්ත විෂ්කම්භය සෙ.මී. 10 ක් පමණ ගන්නා කෝව වේ.












## 19 වැනි වර්ගය වයින් භාජන

ජේතවන විහාරය ආශ්‍රිත ව ස්තරවලින් වාර්තා වී ඇති වයින් භාජන හැඩ අනුව වර්ග 9 කට අයත් වේ. සැමන් මත්ස්‍ය පැහැ බඳුන් මෙන් ම රක්ත වර්ණ බඳුන් (RW) මෙම භාජන සංණයට අයත් වේ.

**උප වර්ගය** 19 i 7.5 YR 7/6 Reddish Brown වර්ණයෙන් යුත් විෂ්කම්භය සෙ.මී. 7.5 ක් ද සෙ.මී. 15.5 ක් උස ඔප දමන ලද රක්ත වර්ණ (RPW) වර්ගයේ බඳුනකි. 19 ii උප වර්ගයට අයත් වයින් භාජනය 10 YR very pale brown වර්ණයෙන් යුක්ත ය. සෙ.මී. 39 ක් උස මෙම භාජනයේ විෂ්කම්භය සෙ.මී.5.5 ක් වේ. මෙම බඳුන ද ඔප දමන ලද රක්ත වර්ණ (RPW) පැහැ බඳුනකි.

**උප වර්ගය** 19 v වර්ගයට අයත් භාජන ද (RPW) ඔප දමන ලද රක්ත වර්ණ භාජනවලට අදාළ වේ. 2.5 YR 6/6 light red වර්ණ මෙ බඳුන් සෙ.මී. 44 ක් උසකින් යුක්ත වේ.




## 20 වැනි වර්ගය රැස් කිරීමේ භාජන (Storage)

විශාල ප්‍රමාණයේ ආහාර ද්‍රව්‍ය රැස් කිරීමට භාවිත කරන මැටි භාජන 04 ජේතවනයෙන් හමු වී තිබේ. මේවා රක්ත වර්ණ භාජන වන අතර (RW) ජේතවන අවධියට අයත් ස්තරවලින් වාර්තා වී තිබේ.


**උප වර්ගය** 20 i බඳ සෙ.මී. 260 ක විෂ්කම්භයෙන් යුත් සෙ.මී. 90ක් වන උස සෙ.මී. 64ක් වන මෙම බඳුන ද්‍රව්‍ය ගබඩා කිරීමේ භාජනයකි.


**උප වර්ගය** 20 ii බඳ සෙ.මී. 155 ක් වන විෂ්කම්භය සෙ.මී.120 ක් වන උස සෙ.මී. 48 යුත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ භාජනයකි.







**උප වර්ගය** 20 iii විෂ්කම්භය සෙ.මී.65 ක් වන බඳ සෙ.මී. 90 වන උස සෙ.මී 70 වන ද්‍රව්‍යගබඩා කිරීමේ බඳුනකි.



## 4.2 භෞතික සංස්කෘතික තොරතුරු ඇසුරෙන් වෙස්සගිරිය ආංශුක භූමිය ආශ්‍රිත පුරා ජනාවාස රටාව අධ්‍යයනය හා භූ දර්ශනය

### 4.2.1 හැඳින්වීම

මූලාශ්‍රයගත තොරතුරු අනුව වත්මනෙහි වෙස්සගිරිය වශයෙන් ව්‍යවහාර කරනු ලබන පුරාස්ථානය ක්‍රි.පූ. 247-207 දේවානම්පියතිස්ස රාජ යුගයේ දී අරිට්ඨකුමරු ඇතුළු වෛශ්‍ය කුලයෙහි පන්සියයක් දෙනා පැවිදි ව විසූ ස්ථානය බව සඳහන් වේ (*Mv*. xx : 15-20). අභිලේඛන ප්‍රභවයන්ට අනුව වෙස්සගිරිය ක්‍රි.පූ. තුන් වැනි සියවසෙහි පමණ කාලය වන විට සංඝාරාමයක් වූ බව පෙනේ. විශේෂයෙන් ම එහි ඇති මුල් බ්‍රාහ්මී අභිලේඛන මෙයට කදිම නිදසුන් ය (*Ez*.Vol. i:10-22). ක්‍රි.ව. පළමු වැනි හා දෙ වැනි සියවස්වලට අයත් අභිලේඛනවල මෙම ස්ථානය **ඉසිරමණ විහර** යනුවෙන් හඳුන්වා ඇත (Nicholas 1963:148). ක්‍රි.පූ. 67-111 වසභ රජු මෙහි උපෝසථාඝරයක් ද ක්‍රි.ව.209-331 වෝහාරිකතිස්ස රජු ප්‍රාකාරයක් තැන වූ බවත්, ක්‍රි.ව.473-491 සීගිරි කාශ්‍යප රජු මෙම විහාරය පුළුල් කොට ඊට ඉඩකඩම් දේපළ පූජා කර තමාගේ හා තම දූවරුන් දෙදෙනාගේ නම් අනුව යමින් **බෝ උපුල්වන් කසුප්ගිරි විහාර** ලෙස මෙම ස්ථානය නම් කළ බව ශිලා ලේඛනවනල සඳහන් වේ (*Ez*. vol.i 35,39,228). ක්‍රි.ව. 628 III වැනි ජෙට්ඨතිස්ස හා ක්‍රි.ව. 659-667 II වැනි දාඨෝපතිස්ස විහාර සංවර්ධන කටයුතු ද IV වැනි මහින්ද ක්‍රි.ව. 956-972 විසින් මහා ප්‍රාසාදය ඉදි කළ බව ද සඳහන් වේ (එම:219,227-228). නිකලස් පෙන්වා දී ඇති ආකාරයට මෙම විහාරය වර්තමාන වෙස්සගිරිය වශයෙන් හැඳින්වුව ද එය **ඉස්සරසමන විහාරය** විය යුතු බව ප්‍රකාශ කර ඇත (Nicholas 1963:148).

වෙස්සගිරිය වශයෙන් හඳුන්වන නිශ්චිත ස්ථානය පිළිබඳ ව දීර්ඝ විමර්ශනයක යෙදෙන සෙනරත් පරණවිතාන මහාවංසයේ සඳහන් විශ්වගිරි (*Mv*.xx:15-20) යන්නෙහි පාලි නමේ සංස්කෘත රූපය වෙස්සගිරි යනුවෙන් හඳුනාගෙන පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රභවයන් ඔස්සේ අධ්‍යයනයක යෙදෙමින් පෞරාණික වෙස්සගිරිය වත්මන් දඹුල්ල විහාරය විය හැකි බව පෙන්වා දී





ඇත (පරණවිතාන 1965: 01-05). ලෙන් විහාර පද්ධතියක් තුළින් ආරම්භ වූ ඉසුරුමුණි විහාරය ක්‍රි.ව. 5 - 7 සමය වන විට පංචාවාස සැලැස්මේ පබ්බත විහාරයක් දක්වා වර්ධනය ව තිබූ බව රෝලන්ඩ් සිල්වාගේ මතයයි (Silva 1995: 212-294). පබ්බතාරාමයක් බවට පත්වීමෙන් අනතුරු ව V වැනි දප්පුල ක්‍රි.ව. 940-952 හා IV වැනි මහින්ද ක්‍රි.ව. 956-972 රාජ්‍ය කාලයේ දී (*Ez*.vol.i.:23-38) මෙම විහාරය වඩා සංවර්ධනයට පත් වූ ආකාරය හඳුනාගත හැකි ය.

### 4.2.2 වෙස්සගිරියේ පූර්ව අධ්‍යයන

වෙස්සගිරිය භූමි ප්‍රදේශය අළලා මෙතෙක් සිදු කර ඇති පූර්ව පුරාවිද්‍යා අධ්‍යයනයන් කොටස් දෙකක් යටතේ සිදු කර ඇත.

I. පුරා අක්ෂර විද්‍යා අධ්‍යයන (Ephagraphical studies)
II. වාස්තුවිද්‍යා අධ්‍යයන (Architectural Studies) (Mendis 2008:16).

මෙම පර්යේෂණයන් සිදු කළ පර්යේෂකයන් අතර එච්.සී.බෙල් වාස්තුවිද්‍යාත්මක නෂ්ටාවශේෂ මතුකර ගැනීම හා ඒවා අධ්‍යයනය කිරීම සිදු කර තිබේ( (*ASCAR*. :1909). D.M.D.Z වික්‍රමසිංහ පුරා අක්ෂර විද්‍යා අධ්‍යයන සිදු කර ඇත (*Ez*.vol.i). සෙනරත් පරණවිතාන පුරා අක්ෂර විද්‍යා අධ්‍යයන තුළින් වෙස්සගිරිය ආශ්‍රිත ගුහා ලිපි වාර්තාගත කර තිබේ (*Ic*. Vol.i). එසේ ම මාලනී ඩයස් අභිලේඛන පිළිබඳ ව අධ්‍යයනයන් සිදු කර ඇත (*Ep*. Nots.1-18:22). මෙයට අමතර ව රෝලන්ඩ් සිල්වා විසින් වෙස්සගිරියේ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ පිළිබඳ ව හා එහි පබ්බතාරාමය පිළිබඳ අධ්‍යයනය කර ඇත (Silva 1995). සේනක බණ්ඩාරනායක විසින් අනුරාධපුර විහාර ආශ්‍රිත වාස්තුවිද්‍යාව සම්බන්ධ ව සිදු කරනු ලැබූ අධ්‍යයනයන් තුළ දී වෙසස්ගිරිය පිළිබඳ අවධානය යොමු කර ඇත (Bandaranayake 1974:194). මීට අමතර ව සුදර්ශන් සෙනෙවිරත්න හා පියතිස්ස සේනානායක විසින් ද වෙස්සගිරිය ආශ්‍රිත මානව යටගියාව හඳුනාගැනීම සඳහා සමාජ පුරාවිද්‍යා අධ්‍යයනයන් මෙන් ම පුරා භෞතික සංස්කෘතිය හඳුනාගැනීම සඳහා පර්යේෂණ කැණීම් සිදු කර ඇත (සෙනෙවිරත්න සහ සේනානායක 2008). මෙම සියලු ම පූර්ව පුරාවිද්‍යා අධ්‍යයන තුළින් යථෝක්ත භූමියේ ඉතිහාසය සහ එහි සන්දර්භගත වීම හඳුනාගැනීමට හැකියාව ලැබෙන අතර

එම තත්ත්වයන් මඟින් එහි පුරාණ භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ.

## 4.2.3 වෙස්සගිරියේ පුරා ජනාවාස රටාව පිළිබඳ අධ්‍යයනය

අනුරාධපුර පුරාණ නගරයේ ඇතුළුපුර සිට කි.මී. 2 ක් පමණ දකුණු දිගින් පිහිටන්නා වූ වත්මනෙහි දී වෙස්සගිරිය වශයෙන් හඳුන්වන භූමිය ස්වභාවික පාෂාණ උද්ගත තුනකින්, ස්වභාවික ලෙන් පද්ධතියකින් හා වාස්තුවිද්‍යාත්මක නිර්මිතයන්ගෙන් සුසැදි පුරා ක්ෂේත්‍රයකි. දළ වශයෙන් අක්කර 20 කට පමණ සීමා වූ මෙම භූමිය පුරාණයේ දි බටහිර පසින් තිසා වැව දක්වා ද උතුරින් වත්මන් ඉසුරුමුණිය දක්වා ද නැගනෙහිරින් මල්වතු ඔය ආසන්නය දක්වා ම ව්‍යාප්ත ව පැවති බවට පුරාවිද්‍යාත්මක ද්‍රව්‍යමය නෂ්ටාවශේෂ තුළින් පැහැදිලි වේ. පුරාවිද්‍යා පර්යේෂණ කටයුතුවල පහසුව සඳහා මෙම ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන පාෂාණ උද්ගත ත්‍රිත්ත්වය උතුරේ සිට දකුණට විහිදෙන පිළිවෙලට A,B,C වශයෙන් බෙල් නම් කර තිබේ (*ASCAR*. 1909)(බලන්න සිතියම් අංක 4.1).


වෙස්සගිරිය භූමිය ආශ්‍රිත පුරා ජනාවාස රටාව පිළිබඳ ව අධ්‍යයනයේ දී සාහිත්‍යමය ප්‍රභවයන්ට හා ලේඛනගත පුරාවිද්‍යාත්මක ප්‍රභවයන්ට අනුව එහි කාලවකවානු ව ක්‍රි.පූ. තුන් වැනි සියවස තරම් පැරණි බව සඳහන් වුව ද වර්තමානයේ සිදු කළ පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් මඟින් යථෝක්ත භූමියේ මානව ජනාවාසකරණය සම්මත සීමාවෙන් බොහෝ ඈතට ගමන් කරන බව පෙනේ. අනුරාධපුරයේ සුවිශේෂ පාරිසරික ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනාගත හැකි මෙම භූමියේ ඇති ඓතිහාසිකමය වැදගත්කම හඳුනාගැනීම සඳහා 2006 වසරින් පසු සිදු කරනු ලැබූ ගවේෂණ හා කැණීම් තුළින් යථෝක්ත භූමියේ සංස්කෘතික විකාශනය වීම හා භූ දර්ශනය හඳුනාගැනීමට අවකාශ සැලසිණි.

VG 1/2006/FR ක්ෂේත්‍ර නාමය යටතේ තිසා වැවේ වැව් බැම්මට නැගෙනහිරින් මටර් 100 ක පමණ දුරින් පිහිටන හා ප්‍රධාන පාෂාණ උද්ගත ත්‍රිත්වයට බටහිරින් මීටර් 300 ක් පමණ දුරකින් පිහිටන ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ ගවේෂණය තුළින් මෙම ක්ෂේත්‍රයේ පුරා ජනාවාස ස්ථානගත වීමට බලපානු ලැබූ උපයෝගීතාවය මැනවින් ග්‍රහණය කර ගැනීමට හැකියාව ලැබී තිබේ.





VG 1/2006/FR ක්ෂේත්‍ර නාමය යටතේ වෙස්සගිරිය පාෂාණ උද්ගතයට බටහිරින් පිහිටන ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ ගවේෂණයේදී ගොඩැල්ල පුරා විසිරී ඇති භෞතික සංස්කෘතික තොරතුරු හා මානව ක්‍රියාකාරකම් හඳුනාගැනීමට අවකාශ සැලසුණි. එසේ ම ගවේෂණයට සම්බන්ධ ප්‍රධාන පරිශ්‍ර 10 තුළ පරිශ්‍ර අංක 01 ($N_5W_7A_3$) හා පරිශ්‍ර අංක 06 ($S_1W_7B_1$) තුළ සිදු කරනු ලැබූ පැතිකඩ (profile) පරීක්ෂාව තුළ දී එම ස්ථානයන්හි ජනාවාස පැවති බවට මූලික ඉඟි ලබා ගත හැකි විය. ගවේෂණ මඟින් ලබා ගත් තොරතුරු මත පදනම් වෙමින් පරිශ්‍ර අංක 06($N_5W_7A_5$) තුළ VGHL EX 01 2006 හා VGHL EX 02 2006 ස්ථාන නාම යටතේ පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් සිදු කරනු ලැබීය. එම කැණීම් තුළින් අනාවරණය කරගනු ලැබූ භෞතික සංස්කෘතික තොරතුරු හා පාංශු පිළිබඳ සිදු කරනු ලැබූ අධ්‍යයනයන් (Soil Analysis) මඟින් යථෝක්ත භූමියේ මානව ජනාවාසකරණය සිදු වූ බව මැනවින් අවබෝධ කර ගැනීමට හැකි විය.




සිතියම් අංක 4.1
වෙස්සගිරිය නිර්මිත පරිසරය ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක සැලසුම දැක්වෙන සිතියම

VGHL Ex. 01 2006 පර්යේෂණ කැණීමෙහි 1 වැනි අවධිය (1st phase) සංසිද්ධි අංක 11 වශයෙන් මැට්රික්ස් වගුවේ වාර්තා වී ඇත. යථෝක්ත සංසිද්ධිය නියෝජනය කරනු ලබන්නේ රතු දුඹුරු පැහැ බොරළුවලින් සමන්විත පාංශු ස්තරයන් ය. එසේ ම VGHL Ex 02 2006 කැණීමේ 1 වන අවධියට අයත් සංසිද්ධි අංක 08 නියෝජනය කරනු ලබන්නේ ද ඉහතින් විස්තර කරනු ලැබූ බොරළු ස්තරයයි. භූ විද්‍යානුකූල මෙම පාංශු කලාපය හඳුන්වනු ලබන්නේ රතු දුඹුරු පාංශු කලාපය (Reddish Brown Earth) යනුවෙනි (කූදර්හ 1984:292). සමස්තයක් ලෙස ගත් කළ උතුරු මැද පළාතේ මෙම පාංශු කලාපය දැකගත හැකි වේ (එම). අනුරාධපුර ඇතුළුපුරයේ AG 69, AG 85 ආදී කැණීම්වල දී ද රතු දුඹුරු පාංශු කලාපය මව් පාෂාණයට මතුපිටින් වාර්තා වී ඇත. එම පාංශු කලාපය තුළ තිබී මධ්‍ය ශිලා අවධියට අයත් ශිලා මෙවලම් (Stone Implement) හමු වී තිබේ (Deraniyagala 1992: 700,718 ; එම 1972: 25-29). දැරණියගල විග්‍රහ කර ඇති ආකාරයට එම ශිලා මෙවලම් විකිරණමාන දින නියම කිරීම් මගින් ලබා ගත් කාල නිගමනයන්ට අනුව ක්‍රි.පූ. 3900 නැතහොත් අදින් වසර 5850 පමණ පෙර කාලයේ මධ්‍ය ශිලා සංස්කෘතියට අයත් බව හඳුනාගෙන ඇත (එම 720-725).

ඇතුළුපුරයේ මව් පාෂාණය මතින් ආරම්භ වන රතු දුඹුරු පාංශු කලාපය වෙස්සගිරිය භූ කලාපය තුළ දී එ තරම් ගැඹුරින් වාර්තා නොවූව ද ඇතුළුපුරයේ මෙන් ම මව් පාෂාණය මතින් මීටර් 1 පමණ ඝණකමින් යුක්ත ව පිහිටා තිබේ. VGHL Ex. 01 හා Ex. 02 යන කැණීම් දෙකෙහි ම සංසිද්ධි අංක 11 හා 08 තුළින් මේ තත්ත්වය හඳුනාගත හැකි ය. ඇතුළුපුරයේ මෙන් ම වෙස්සගිරිය තුළත් මෙම පාංශු කලාපය තුළින් සෙ.මී. 4.5 ට වඩා අඩු ගල් අවි වාර්තා වීම හා ශිලා මෙවලම් නිෂ්පාදනයට තිරුවානා, විනිවිද පෙනෙන තිරුවානා හා කහඳ ආදී පාෂාණ වර්ග භාවිත කර තිබේ. වෙස්සගිරිය තුළින් තල මෙවලම් (Blade), පතුරු (Flake), සීරුම් මෙවලම් (Scraper) හා ශිලා මෙවලම් නිර්මාණයේ දී ඉතිරිවන පතුරු (Waste) 6000 ක් පමණ හඳුනාගෙන ඇත. නිශ්චිත වශයෙන් ම මෙම භෞතික





සංස්කෘතික තොරතුරු තුළින් මධ්‍ය ශිලා අවධියට සම්බන්ධ ශිලා මෙවලම් සංස්කෘතියක් වෙස්සගිරිය ආංශුක ස්ථානයේ ක්‍රියාත්මක වී තිබෙන බව පැහැදිලි වේ. වෙස්සගිරියේ රතු දුඹුරු පාංශු කලාපය තුළින් හමු වූ ශිලා මෙවලම් සම්බන්ධව සිදු කළ මූලික විශ්ලේෂණ කටයුතු අනුව එම මෙවලම් සකස් කිරිමේ දි පීඩනය මගින් පතුරු ඉවත් කිරීමේ තාක්ෂණය (Pressure flaking) හා පැති සකස් කිරීමේ (Trimming) තාක්ෂණය භාවිත කර ඇති බව හඳුනාගෙන තිබේ. මෙම තාක්ෂණික ක්‍රමවේදය ඇතුළුපුරයෙන් ද හඳුනාගත හැකි බව දැරණියගල පෙන්වාදී ඇත (Deraniyagala 1972:36).

ඉහතින් පෙන්වාදුන් ආකාරයට ඇතුළුපුරයේ මෙන් වෙස්සගිරිය භූ කලාපයේ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතියක් ක්‍රියාත්මක වූයේ නම් එම සංස්කෘතිය ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික භෞතික ලක්ෂණ සපුරා තිබිය යුතු ය. විශේෂයෙන් ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතියක් වැනි ප්‍රාථමික ජන සමාජයක විසූ මානවයා සිය ජීවනෝපාය (Subsystem Pettern), ජනාවාස රටාව (Settlement Pattern), තාක්ෂණය (Technology), සම්පත් පරිහරණය (Resource Used) යන මූලික කාරණාවල දී ස්වභාවික පරසරය මත යැපීම අනිවාර්යයෙන් ම දැකගත හැකි කාරණයක් බව පෙනේ (Senaviratne 1996:273). එසේ නම් වෙස්සගිරිය වැනි වියළි, තැනිතලා භූමියක මෙ වැනි ජනාවාසයක් ස්ථානගත වීමට අවශ්‍ය කරන මූලික පසුබිම සැකසී තිබුණේදැයි යන්න පිළිබඳ ව කාරණා කිහිපයක් ඔස්සේ විමර්ශනය කළ හැකි ය.

මෙහි දී අපට ඉදිරිපත් කළ හැකි පළමු වැනි තර්කය වන්නේ වෙසස්ගිරියේ භෞතික පරිසරය (Physical Environement) තුළ ප්‍රාථමික ජන සමාජයක් ස්ථානගත වීමට අවශ්‍ය කරන මූලික කාරණා කිහිපයක් ම සපුරා ඇති බවට සාධක පවතින බව පෙන්වාදිය හැකි ය. ඉන් ප්‍රමුඛත්වය ස්වභාවික ගුහා ආවරණය (Natural Rock Shelter) පෙන්වාදිය හැකි ය. වෙසස්ගිරියේ පාෂාණ උද්ගතවල ස්වභාවික ගල්ගුහා 26 ක් පමණ පිහිටා තිබේ. ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා අවධිය සම්බන්ධ සිදුකෙරී ඇති පර්යේෂණවල දි මධ්‍ය ශිලා මානවයින් බොහෝ විට තම

වාසස්ථාන ලෙස ස්වභාවික ගල්ගුහා භාවිත කර ඇති බව ෆාහියන් ලෙන, බටදොඹලෙන, බටතොටලෙන, අළුලෙන ආදී ස්ථානවලින් ද පැහැදිලි වී ඇත (Deraniyagal 1992:685-692). ඒ අනුව මෙම මිනිසුන්ගේ ජීවිතය තුළ ප්‍රධාන වශයෙන් ම වාසස්ථාන ප්‍රමුඛ වන බැවින් ස්වභාවික ලෙස සැකසුණ වෙස්සගිරිය ගුහා පද්ධතිය මධ්‍ය ශිලා මානවයාට ස්වභාවික වාසස්ථානයක් සකසා දුන් ස්ථාන බව උපකල්පනය කළ හැකි ය. මුල් ඓතිහාසික සමයේ දී (Early historic) හා මධ්‍ය ඓතිහාසික අවධියේ දී (Middle Historic) බෞද්ධ ආරාමීය තත්ත්වයන් මෙම භූමියේ වර්ධනය විම සමඟ ගුහා අභ්‍යන්තරයේ වන ඉඳි කිරීම් කටයුතුවල දී ප්‍රාග් ඓතිහාසික පස් තැන්පතු එම ස්ථානවලින් එළියට ඇද දමන්නට ඇති බවට සාධක VG.Cave No 01 2006 කැණීමට අනුව හඳුනාගත හැකි විය (මැන්දිස් සහ තවත් අය 2008:18).

මධ්‍ය ශිලා වාසස්ථාන ප්‍රධාන වශයෙන් වියළි හා තෙත් කලාපවලට අයත් පරිසර පද්ධති තුළ ක්‍රියාත්මක වී තිබේ. දැරණියගලගේ පරිසර පද්ධති වර්ග කිරීම අනුව එය ප්‍රධාන වශයෙන් A,B,C,D,E කලාපවලට අයත් කොට වර්ග කර ඇත (Deraniyagala 1992:02,map 01). එම පරිසර වර්ග කිරීම්වලට අනුව උතුරුමැද පහත් වියළි තැනිතලා භූමිවලට අයත් පරිසර පද්ධතිය B පරිසර පද්ධතියට ඇතුළත් වේ (එම). උතුරුමැද පරිසර පද්ධතිය තුළ දැකගත හැකි පාෂාණ පස් හා ශාකායනය මෙන් ම සත්ත්ව ප්‍රජාව නිර්මාණය වීමට බෙහෙවින් ම එම ප්‍රදේශයට ලැබෙන ඊසාන දිග මෝසම් වර්ෂාවේ ස්වරූපය බලපා ඇත (Thambya 1965:22-27). අවුරුද්දේ එක් කාලයකට පමණක් ලැබෙන්නා වූ ඊසාන දිග මෝසම් වර්ෂාව සමඟ වියළි කාලගුණික තත්ත්වයන් මත නිර්මාණය වන්නා වු රතු දුඹුරු පාංශු (RBE) හා බොරළු (Basal gravels) නිර්මාණය වීම සිදු වේ (Panabokke 1972:19- 21). අනුරාධපුර පැරණි නගරයේ හා ඒ අවට භූ කලාපය තුළ රතු දුඹුරු පස් තැන්පතුව හා බොරළු භූමියේ පහළ මට්ටමින් දැකගත හැකි ය. මෙම පස් තැන්පතුව තුළ ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාසකරණය සිදු වීම වෙස්සගිරිය වැනි ස්ථාන තුළින් හමුවීම තුළින් මෙම ප්‍රදේශයේ මානව පැලපදියම්වීමට කාලගුණික





දේශගුණික තත්ත්වයන් යම් ආකාරයකට බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

වෙස්සගිරිය පරිසර පද්ධතිය පිළිබඳ ව අධ්‍යයනයේ දී යථෝක්ත ස්ථානයේ ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන ස්ථානගතවීම සඳහා ස්වභාවික ගුහා පද්ධතිය මෙන් ම ගුහා පද්ධතියට මීටර් 100 ක් පමණ දුරින් පීත්ත පටියක් ලෙස උතුරු දකුණු දිශානුගත ව දිවෙන ගල්හින්නේ පිහිටීම ද බලපා ඇති බව පෙනේ. ගල්හින්න නිසා වාර්ෂික ව ලැබෙන වර්ෂාව එම භූමිය ආශ්‍රිත ව ස්වභාවික භූ පතන (hollow) නිර්මාණය වන්නට ඇත. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික මනුෂ්‍ය පැවැත්මේ ප්‍රධාන සාධකයක් වූ ජලය ආකාර දෙකකින් උපයෝගී කර ගැනීමේ හැකියාව වෙස්සගිරිය ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ට තිබෙන්නට ඇති බව පෙන්වාදිය හැකි ය. එයින් එක් ජල මූලාශ්‍රයක් යථොක්ත භූමියෙන් නැගෙනහිරින් ගලන මල්වතු ඔය මඟින් ද අනෙක් ජල මූලාශ්‍රය භූ රූපණය ඔස්සේ නිරූපණය වන ස්වභාවික භූ පතන ඔස්සේ රැස්වන ජලය මඟින් ද සපුරා ගැනීමේ හැකියාව පැවතීම නිසා ප්‍රාග් ඓතිහාසික ජනාවාසයක් එහි ස්ථානගත වීමට වැඩි හැකියාවක් ලැබේ. ජල මූලාශ්‍ර දෙකක් වාසස්ථාන ප්‍රදේශයට දෙපසින් ස්ථානගත වීම නිසා එම ස්ථානයන්ට ජලය පානය කිරීමට පැමිණෙන වන සතුන් දඩයම් කිරිමේ දඩයම් තිප්පොළ සඳහා වැඩි උපයෝගීතාවයක් මෙ වැනි පරිසර කලාප තුළ පවතී. වෙස්සගිරියේ කැණීම්වලින් ප්‍රාග් ඓතිහාසික සන්දර්භයන්ගෙන් හමුවන අස්ථි ශේෂ අතර ශ්‍රී ලංකා වලිකුකුළා (*Gallus lafayetti*), මුගටියා (*Herpestes sp.*), තිත් මුවා (*Axis axis*), වඳුරා (*Trachypithecus vetulus*), දඬු ලේනා (*Ratufa macroura*), ගල් ඉබ්බා (*Melanochelys trijuga*), තලගොයා (*Varanus bengalensis*) (මනමේන්ද්‍රආරච්චි 2007:1-10) ආදී සතුන්ගේ අස්ථි අනුව එම සතුන් මානවයින් ආහාරයට ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මෙම සත්ත්ව විශේෂ අතර ක්ෂීරපායීන්, උරගයින්, බහුල වන අතර මෙම ආහාර ගොනුව ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියේ වෙස්සගිරියේ ජීවත් වූ මානවයාගේ ආහාර ගොනුවට අයත් සත්ත්ව ආහාර විය හැකි බව පෙන්වාදිය හැකි ය.

වාසස්ථාන ජලය මෙන් ම ප්‍රාග් මානවයාට අවශ්‍ය කරන අනෙක් ප්‍රධානත ම අවශ්‍යතාවය වන්නේ ශිලා මෙවලම් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය කරන සම්පත් සපයා ගැනීමයි. වෙස්සගිරියෙන් කහඳ, තිරුවාණා, විනිවිද පෙනෙන තිරුවාණා පාෂණ හා ශිලා මෙවලම් (Stone Implement) VGHL Ex 01 හා 02 යන කැණීම්වලදී හමු වී තිබේ. එම පාෂාණ අතරින් කහඳ හා විනිවිද පෙනෙන තිරුවනා මෙන් ම තිරුවාණා පාෂාණ වෙස්සගිරිය භූ කලාපය තුළ දැකගත නොහැකි පාෂාණ වේ. උතුරුමැද පළාත තුළ දැකගත හැකි ප්‍රධාන පාෂාණ වර්ගය වන්නේ නයිස් (Gneiss) වර්ගයේ පාෂාණයන් ය. එයින් වන්නි නයිස් (Vanni Gneisses) වශයෙන් හඳුන්වන පාෂාණය හා එහි ප්‍රභේද ලෙස streaky gneisses, grantic gneises, anyen gneisses, megmatites and granite පවතින බව භූ විද්‍යාඥයින් පෙන්වා දී ඇත (Cooray 1984:108). වෙසස්ගිරියෙන් හමුවන ඛනිජ පාෂාණ අතර කහඳ උතුරුමැද පළාතට ආසන්න වශයෙන් නිධිගත වීම දැකගත හැක්කේ විල්පත්තු ප්‍රදේශය තුළ ය (එම :167). නමුත් සමස්තයක් ලෙස බොරළු තන්පතු තුළ ද (Gravel deposits) මෙම පාෂාණය තිබීමේ ප්‍රවනතාවයක් පවතී (එම). ප්‍රාග් ඓතිහාසික අවධියේ දී මධ්‍ය ශිලා මානවයාගේ අවි නිර්මාණය කිරිමේ ප්‍රධාන මාධ්‍යයක් ලෙස කහඳ උපයෝගී කර ගෙන ඇති බව පෙනේ (Deraniyagala 1992:194). එම පාෂාණය තෝරා ගන්නට හේතු වන්නට ඇත්තේ විවිධ උපයෝගීතාවයන්ට සරිලන ලෙස මෙවලම් නිර්මාණය කිරීමේ හැකියාව මෙම පාෂාණයට තිබීම නිසා යැයි විශ්වාස කළ හැකි ය (එම 195). වෙස්සගිරියට ආසන්න ප්‍රදේශයකින් අමුද්‍රව්‍ය ලෙස කහඳ පාෂාණය සපයා ගත නොහැකි වුව ද මෙවලම් නිෂ්පාදනය සඳහා එම පාෂාණ පිහිටන ප්‍රදේශවල සිට අනුරාධපුරයට ආනයනය කිරීමට අවකාශයක් පවතී. ඒ තත්ත්වය මනාව පැහැදිලි වන්නේ ශිලා මෙවලම් නිෂ්පාදනයට රැගෙන ආ විවිධ ප්‍රභේදවලට අයත් කහඳ පාෂාණ වර්ග කැණීම් තුළින් හමු වීම නිසා ය. ඒ අතර දුඹුරු(brown), කොළවන් දුඹුරු (greenish brown), රතු (Red) යන වර්ග තුනට (*Cooray* 1984 : 167) අයත් කහඳ පාෂාණ ප්‍රභේද වෙස්සගිරියෙන් වාර්තා වී ඇත. එම නිසා ශිලා මෙවලම් නිෂ්පාදන ක්‍රියාවලියකට





අයත් කර්තව්‍යයක් වෙස්සගිරි භූමිය ඇසුරින් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

වෙස්සගිරිය භූමියේ ගල් අවි නිෂ්පාදනයට යොදාගත් අනෙක් අමුද්‍රව්‍ය තිරුවාණා පාෂාණ වර්ගයන් ය. ඒවා අතර විනිවිද පෙනෙන තිරුවාණා හා කිරිපැහැ තිරුවාණා වර්ගයන්ට අයත් අමුද්‍රව්‍යයන්වලින් නිර්මාණය කරන ලද ශිලා මෙවලම් කිහිපයක් වාර්තා වී ඇත. තිරුවාණා වර්ගයේ පාෂාණ ද වෙසස්ගිරිය ප්‍රදේශය ඇසුරින් හඳුනාගත නොහැකි ය. භූ විද්‍යාඥයින් පෙන්වාදෙන ආකාරයට තිරුවානා වර්ගයේ පාෂාණ බහුල වශයෙන් දැකිය හැකි වන්නේ කඳුකර කලපය තුළිනි (එම :97). විශේෂයෙන් ම නකල්ස් කඳු පන්තිය හා ලග්ගල කඳු පන්තිය මෙන් ම මාතලේ සානුව තුළ ක්වාට්සයිට් (Quartzite), මාබල් (Marble), ක්ලැක්නයිස් (Calcgneisses), චානොකයිට් (Chanokite), ක්වාට්ස්-ෆෙලස්ෆාර් (Quartz feldspar), ගානට් (Garnet) යන ඛනිජ පාෂාණ පිහිටා තිබේ (එම 81-88). පුරාණ අවධිවල මේ ප්‍රදේශ වංසකතා හැඳින්වූයේ මලය රට්ඨ, මලය, ගිරිමණ්ඩල ආදී නම්වලිනි (*Mv*.Viii 68; xl :3-5: ; *Dv*. xxxiii: 06). ගිරිදුර්ග හා වන දුර්ගවලින් ගහන මේ ප්‍රදේශයේ ජීවත් වූ ජනතාව පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයන් හි සඳහන් කරන්නේ පුලින්ද, ව්‍යාධ, මිලක්ඛ, මනුස්ස, උපචරක හා වනචරක ආදි මිනිසුන් එහි වාසය කළ බව ය (එම). ඉහළ කලා ඔය පද්ධතිය හා මාතලේ සානුව අති පුරාණයේ සිට ම ඛනිජ සම්පත් උතුරු මැද පළාතට ලබාදුන් ප්‍රදේශ වූ බව සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (Seneviratne 1996 : 285). ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ආකාරයට ඉහළ කලා ඔය නිම්නයේ නිවැසි ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මිනිසුන් එම ප්‍රදේශයේ ඇති කහඳ, තිරුවාණා, ආදි පාෂාණ වර්ග පහත් කඳුකර කලාප හා තැනිතලා ප්‍රදේශවල ජීවත් වු ජනතාවට ලබාදුන් බව ඉබ්බන්කටුව ආදී ස්ථානවලින් හමු වූ සාධක තුළින් තහවුරු වන පෙන්වා දී ඇත (සෙනෙවිරත්න 1996:189). මෙ වැනි අන්තර් සම්බන්ධතාවය මත අනුරාධපුර වැනි ප්‍රදේශවල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයන් ද සරල හුවමාරු රටා ඔස්සේ තමන්ට අමුද්‍රව්‍ය හුවමාරු මාධ්‍ය ඔස්සේ ලබා ගන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

ඉහතින් පෙන්වාදුන් කාරණයන්ට අනුව වෙස්සගිරිය භූ කලාපය තුළ විසූ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මානවයින් එහි ස්ථානගත වීමේ දී ජීවනෝපාය ක්‍රමය, තාක්ෂණය, සම්පත් පරිහරණය, ජනාවාස යන කාරණාවලට අවශ්‍ය කරන මූලික පසුබිම පිළිබඳ අවධානය යොමු කොට වෙස්සගිරිය භූ කලාපය ආශ්‍රිත ව ජීවත් වන්නට ඇතැයි පෙන්වා දිය හැකි අතර වෙස්සගිරිය පුරා ස්ථානයේ මුල් ම සංස්කෘතික භූ දර්ශනය ගොඩනැගීම ප්‍රාග් ඓතිහාසික අවධියේ සිදු වී ඇති බව මේ අනුව පෙන්වාදිය හැකි ය.

වෙස්සගිරිය ආංශුක ස්ථානය ආශ්‍රිත පුරා ජනාවාස රටාව පිළිබඳ අධ්‍යයනයේ දී ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික සන්දර්භගත වීමෙන් ඉක්බිති එම භූමියේ භූ දර්ශනය ගොඩනැගීම පූර්ව (proto) ඓතිහාසික සංස්කෘතික අවධියේ දී සිදු ව ඇති බව පෙනේ. VGHL Ex. 01 හි දෙ වැනි අවධියට (2nd phase) අයත් සංසිද්ධි අංක 10 හා 09 ද VGHL Ex. 02 දෙ වැනි අවධියට අයත් සංසිද්ධි අංක 7,6,5 යන සංසිද්ධි තුළින් මෙම සංස්කෘතික තත්ත්වයන් හඳුනාගත හැකි ය (මැන්දිස් 2008:35-58). යථෝක්ත කැණීම් පරිශ්‍ර දෙකෙහි ම රතු දුඹුරු පාංශු කලාපය මතින් 10 YR 6/12 Dark brown gray (අළුවන් අඳුරු අළු) පැහැ පාංශු කලාපය වාර්තා වේ. එම පාංශු කලාපය තුළින් කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW), කාල වර්ණ මැටි මෙවලම් (BW), හා ලෝහ උණු කිරීමට භාවිත කරන කෝව (Crucible) හා ලෝහ උණු කිරීමේ දී පිටවන අපද්‍රව්‍යය වන ලෝහ බොර (Slag) මෙන් ම යපස් ලබා ගැනීමට භාවිත කරන යකඩ කැටිති (Iron nodules) හා කානීලියන් මෙන් ම තිරුවාණා ආදී ඛනිජ පාෂාණ වාර්තා වීම ද අතිශයින් ම වැදගත් වේ (එම). දැරණියගල විග්‍රහ කර ඇති ආකාරයට අනුරාධපුරයේ ක්‍රි.පූ. 900- 600 කාලයේ දී ප්‍රොටෝ ඓතිහාසික යකඩ යුගයේ (Protohistoric Iron Age) සංස්කෘතිය මුල් බැස තිබූ බවට සාධක AG 85, **ASW 88, AMP 88, ASM 89** යන කැණීම්වල දී හඳුනාගෙන ඇත (Deraniyagala 1992:709,729). ඇතුළුපුරයේ AG 85, කැණීම් සාධක අනුව රතු දුඹුරු පාංශු කලාපය මතින් මුල් යකඩ යුගයේ සංස්කෘතියට සම්බන්ධ තොරතුරු වාර්තා වී තිබේ





(එම:718). අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය අධ්‍යයනයෙහි ලා ඇතුළුපුරය ඇසුරෙන් දැරණියගල ලබාදී ඇති කාලනිර්ණ මඟින් කේන්ද්‍රීය භූ දර්ශනය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය. ඒ අනුව එම කැණීම් දත්ත අනුව තදාශ්‍රිත ප්‍රදේශවල සංස්කෘතික භූ දර්ශනය ගොඩනැගීම සාපේක්ෂ වශයෙන් හැකියාව ලැබේ.

අනුරාධපුර ඇතුළුපුරයෙන් දකුණේ පිහිටි තදාශ්‍රිත ප්‍රදේශය වශයෙන් අධ්‍යයනයේ දී හඳුනාගත් වෙස්සගිරිය තුළින් පූර්ව ඓතිහාසික යුගයේ භූ දර්ශනය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී තද දුඹුරු දියළු පසකින් යුත් පස් තැන්පතුවක් තුළින් එම සංස්කෘතියට අදාළ දත්ත වාර්තා විය. මෙම පස් ස්තරය කෘෂිකාර්මික කටයුතුවලට වඩා හිතකර ස්වරූපයක් ගන්නා පාංශු කලාපයකි. VGHL Ex. 02 සංසිද්දි අංක 06 නියෝජනය කරන අළු පැහැති වැලි සහිත පස් ස්තරය තුළින් වාසස්ථාන සම්බන්ධ සාධක හමු වේ (මැන්දිස් 2008:48). VGHL Ex. 02 කැණීමේ සංසිද්ධි අංක 07 තුළින් මෙය තව දුරටත සනාත කරමින් කාල රක්ත වර්ණ මැටි මෙවලම් වාර්තා විය. එම සංසිද්ධියට අදාළ ව වාර්තා වූ මැටි බඳුන් දැරණියගල 1972 දී සිදු කරනු ලැබූ වර්ගීකරණයට අනුව 16 A වර්ගයට අයත් වේ (Deraniyagala 1972:76 Fig.12). 16 A තැටි වර්ගයට අයත් භාජන ක්‍රි.පූ.800-600 කාලයට අයත් ව ඇතුළුපුරයෙන් වාර්තා වී ඇත (එම :120). මෙම ස්තරය තුළින් ම VGHL Ex.02 කැණීමේ ලෝහ උණු කිරීමට භාවිත කර ඇති කෝව කොටස් හා ලෝහ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ ලෝහ බොර ද වාර්තා වී තිබීම වැදගත් වේ.

ඇතුළුපුරයට (කේන්ද්‍රයට) දකුණු දිග් භාගයේ තදාශ්‍රිත ප්‍රදේශ තුළින් පූර්ව ඓතිහාසික යුගයට සම්බන්ධ සංස්කෘතික සන්දර්භයන් වාර්තා වීම අප සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ ඇතුළුපුරයට සාපේක්ෂ ලෙස සළකා බලා ය. විශේෂයෙන් ම ක්‍රි.පූ. 900 - 800 කාලය වන විට ඇතුළුපුර මුල් යකඩ යුගයේ සංස්කෘතියට අයත් ජනාවාසය හෙක්ටයාර 10 ක් පමණ වපසරියකින් යුක්ත වී ඇත. එය ක්‍රි.පූ.700-600 කාලය වන විට හෙක්ටයාර 50 ක් දක්වා ව්‍යාප්ත ව තිබූ බවත් දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1992 :710). දැරණියගලගේ

මතය අනුව කේන්ද්‍රීය ජනාවාස වර්ධනය දෙස පුළුල් ආකාරයට බැලිමේ දී පැහැදිලි වන්නේ ක්‍රි.පූ. 900 - 600 කාලය වන විට ජනරේඛනයේ ප්‍රසාරණය සමඟ ඇතුළුපුර කේන්ද්‍රීය ජනාවාසය යම් ආකාරයකට ප්‍රසාරණය වී ඇති බව ය. තාක්ෂණ ශිල්පය (Technology), ජීවනෝපාය ක්‍රමය (subsystem pattern), සම්පත් පරිහරණය (Resource used) සහ ජනාවාස රටාව (settlement pattern) යන කාරණා ද ජනාවාසයක් ප්‍රසාරණය වීමට බලපාන බව පුරාවිද්‍යාඥයින් පෙන්වා දී ඇත (Seneviratne 1996:277). ජනාවාස ප්‍රසාරණය වීමේ ප්‍රතිඵලය තුළ ද්‍රව්‍යයමය අන්තර් ක්‍රියාකාරිත්ව ක්‍රියාදාමය මින් පසු මුදුන් පැමිණෙන්නේ පුළුල් වශයෙන් සමාජමය (Social), ආර්ථික (Economics), දේශපාලන (Political) සහ ආගමික (Religion) යනුවෙන් හැඳින්වෙන ආයතන හැඩ ගැසිමෙනි (එම). ඉතිහාසයේ කිසියම් නියමිත කාලයක හෝ ස්ථානයක පැවති සමාජයේ සංස්කෘතික පරිසරය මේ ජවනිකාව මඟින් වෙසස්ගිරියෙන් ද පෙන්නුම් කෙරෙයි. ඒ අනුව කේන්ද්‍රීය ලෙස එතෙක් වර්ධනය ව තිබූ ඇතුළුපුර ජනාවාසය එහි ආරම්භක අවස්ථාවෙන් සියවස් දෙකක් හෝ තුනක් ගත විමෙන් මව් ජනපදයෙන් ප්‍රසාරණය වී තදාශ්‍රිත ප්‍රදේශ ප්‍රදේශවල ස්ථානගත වීමට ඇති අවකාශය බෙහෙවින් ම වැඩි ය. වෙසස්ගිරිය වැනි භූ කලාපයක් තුළ පැළපදියම් වූ ජන පිරිස්, මව් ජනපදයෙන් භින්න ව පර්යන්තය කරා ඇදී යන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මුල් ජනාවාස මෙ වැනි භෞතික ක්ෂේත්‍රවල හැඩගැසීමේ දී එක හා සමාන සංවර්ධනයක් මෙ වැනි කුඩා ජනපද තුළ වූයේ යැයි විශ්වාස කළ නොහැකි ය. නමුත් අප සැළකිල්ලට ගත යුතු කාරණය වන්නේ සරල සමාජයේ සිට සංකීර්ණ සමාජයක් කරා වූ ගුණාත්මකවූත් ප්‍රමාණාත්මකවූත් පරිවර්තනය ආයතන හැඩග ැසීම කරා මග පාදන බව ය. මේ තත්ත්වය මැනවින් පැහැදිලි වන්නේ ප්‍රධාන ජනපදය වන ඇතුළුපුරය ක්‍රි.පූ. 700-600 කාලය වන විට හෙක්ටයාර 50 දක්වා ව්‍යාප්තවීමක් පෙන්නුම් කිරීම තුළිනි (Deraniyagala 1992:710). ඒ අනුව එම යුගයේ පැවති සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන් අපට ග්‍රහණය කර ගැනීමට අවකාශ සැලසෙනුයේ AMP 88(75), සංසද්ධි තුළින්





හමුවන්නා වූ මැටි බඳුන්වල මුල් බ්‍රාහ්මී අභිලේඛන තුළිනි (එම 739-747).

මෙම තත්ත්වය මත ඇතුළුපුර කේන්ද්‍රීය ජනාවාසය හුදෙකලා ලෙස වර්ධනය නොවේ. ඒ වන විට ඇතුළු පුරයට තදාශ්‍රිත ප්‍රදේශවල අඩු ම තරමින් ක්‍රි.පූ. 700-600 කාලය වන විට කුඩා පොකුරු ජනපද (Clauster Settlement) බිහිවීමට වැඩි අවකාශයක් පවතී. එ වැනි කුඩා ග්‍රාමීය ජනපද අතර අන්තර් සබඳතාවය ගොඩනැඟීම හා ද්‍රව්‍යයමය හුවමාරුව මෙන් ම නිෂ්පාදන ක්‍රියාවලියේ විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් ඇතිවීම තුළින් මහා ජනපදයක් නිර්මාණය කිරිමට අවකාශ සලසා දෙයි. ඇතුළුපුරය ක්‍රි.පූ. 600-500 පදනම් මුල් ඓතිහාසික (Basal Early historic) අවධියේ දී නාගරික තත්ත්වයන් කරා වර්ධනය වන්නේ (එම:711) එම ජනපදයට පර්යන්ත ප්‍රදේශවල වර්ධනය වන පොකුරු ජනපද සපයන ලද ගාමක බලවේගය නිසා යැයි උපකල්පනය කළ හැකි ය. මෙම තත්ත්වය අනුරාධපුරයට පමණක් පොදු කාරණායක් නොවූ අතර එය යාපන අර්ධද්වීපය (Ragupathy 1987: චසටග 162,163), තිස්සමහාරාමය (Somadeva 2006 Fig 45) යන ස්ථාන තුළින් ද පොකුරු ජනාවාස බිහිවිම මඟින් පැහැදිලි වන බව පර්යේෂකයින් පෙන්වා දී ඇත. උතුරු මැද හා වයඹ, යාපන අර්ධද්වීපය, බස්නාහිර, නැගෙනහිර, අග්නිදිග ලංකාව තුළ පූර්ව ඓතිහාසික සමයේ දී පොකුරු ජනපද බිහිවිම හා ව්‍යාප්තිය සිදුවන ආකාරය කතින්හැම් ද පෙන්වා දී ඇත (Coningham 1999: Fig 120).

මෙම කාරණා සැලකිල්ලට ගැනීමේ දී ප්‍රධාන ජනපදය මූලික කරගෙන පොකුරු ජනාවාස (බිහිවීම සඳහා විශේෂයෙන් ම හැඩගැසෙමින් ඇති සමාජ හා සම්බන්ධ තාක්ෂණ ශිල්පමය ක්‍රියාදාමවල ගම්‍යතාවය උපයෝගී වන බව පෙනේ. විශේෂයෙන් ම යම් භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යය ප්‍රයෝජනයට ගැනීම ඉල්ලුමෙහි ඇතිවන වෙනස්කම් අනුව තීරණය කරයි (Seneviratne 1996:277). මෙය වෙනස්වීම් සාධක ගණනාවක් මත රඳා පැවතිණ. එම සාධක අතර භාණ්ඩයේ කාර්ය බද්ධ වටිනාකම, සමාජයේ ද්‍රව්‍යයමය සංවර්ධනයේ මට්ටම, තීරණාත්මක වැදගත්කමකින් යුත්

සම්පත් කෙලින් ම හෝ අනියම් ලෙස ලබා ගැනීමේ හැකියාව නිෂ්කරණය සහ නිෂ්පාදනය සඳහා යෝග්‍ය තාක්ෂණ ක්‍රමයක් තිබීම, අමුද්‍රව්‍යය හා නිමි භාණ්ඩ ප්‍රවාහනයට පහසු කරන හුවමාරු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විම හා මාර්ග ජාලයක් පුළුල් විම යන කාරණා සෘජු ව බලපානු ලබයි (Seneviratne 1985:129-178). අනුරාධපුර ඇතුළුපුරය හා මධ්‍ය ප්‍රදේශය මෙන් ම තදාශ්‍රිත ප්‍රදේශ තුළ විශේෂයෙන් ම ජේතවනය හා වෙස්සගිරිය ආශ්‍රිත ව හමු වන පූර්ව ඓතිහාසික සංස්කෘතික දත්තයන් තුළින් එම භූමි ප්‍රදේශවල තිබූ සමාජයේ ද්‍රව්‍යයමය සංවර්ධනය හඳුනාගත හැකි ය. ඇතුළුපුරයේ ජේතවනයේ හා වෙස්සගිරියේ හමුවන දේශීය හා විදේශීය ඛනිජ වර්ග ද මේ පිළිබඳ ව ද්‍රව්‍යයමය සාධක සපයයි. එම ඛනිජ ද්‍රව්‍යය අතර ඇමතෙස්ත, කැල්සිඩෝනි, කහඳ, රඹස්, තිරුවානා, ඇගේට්, කානීලියන්, තෝරමල්ලී, ජැස්ෆර් පෙන්වාදිය හැකි ය (Seneviratne 1996:288-289;මැන්දිස් 2001, 2002, 2003, 2004, 2008). අමුද්‍රව්‍යය හා නිමි භාණ්ඩ වශයෙන් මෙම භෞතික සංස්කෘතික තොරතුරු අනුරධපුර කේන්ද්‍රිය හා තදාශ්‍රිත ප්‍රදේශ තුළින් හමු වීම තුළින් ගොඩනැගී තිබුණා වූ ජනාවාස රටාව පිළිබඳ අවබොධයක් ලබාගත හැකි ය. ප්‍රධාන ජනපදය වූ ඇතුළුපුරය බිහිවීමෙන් සියවස් කිහිපයක් ඉක්ම යාමෙන් තදාශ්‍රිත ප්‍රදේශවල පූර්ව ඓතිහාසික ජනවාස ස්ථානගත වීම සිදුවීම ඔස්සේ මෙම තත්ත්වය වර්ධනය වන්නට ඇති බව වාර්තා වී ඇති සංස්කෘතික තොරතුරු අනුව විශ්වාස කළ හැකි ය.

වෙස්සගිරිය ආශ්‍රිත පූර්ව ඓතිහාසික සමයේ ජනාවාස බිහිවිම උදෙසා එම භෞමික ක්ෂේත්‍රයේ භෞතික පරිසරයේ උපයෝගීතාවය පිළිබඳ ව විමසීම තුළින් සංස්කෘතික භූ දර්ශනයේ ගතිකත්වය හඳුනාගත හැකි ය. අප මෙම පරිච්ඡේද තුළ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියේ සන්දර්භගත වීම හඳුනාගැනීමේ දී ද වෙස්සගිරියේ භෞතික පරිසරයේ පිහිටීම ස්වභාවික ලෙස වැදගත් වූ ආකාරය සකච්ඡා කරන ලදි. එසේ ම පූර්ව ඓතිහාසික අවධිය තුළ දී ප්‍රාග් ඓතිහාසික අවධියට වඩා භූමියේ උපයෝගීතාවය බෙහෙවින් ම වැදගත් වූ බව පෙන්වාදිය යුතු ය. පරිසරය හා මිනිස් සමාජය එකිනෙකට වෙනස් දේ ලෙස දකිනු ලබන්නේ නම්





එහි එ තරම් තේරුමක් නොමැත (Seneviaratne 1996:276). මුල් කාලීන සමාජයන් හා ඒවායේ ප්‍රකෘති ස්වභාවික පරිසරය අතර වූ අනන්‍යෝන්‍ය පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සහජීවනය සම්බන්ධතාවය මාධ්‍ය ගණනාවක් තුළින් කළඑළි බස්වන ලදි. ඒවා අතර තාක්ෂණ ශිල්පය, යැපුම් රටාව, සම්පත් පරිහරණය හා පදිංචි වීමේ මෝස්තරය ප්‍රධාන වී තිබේ. විශේෂයෙන් ම වෙස්සගිරිය වැනි පරිසර පද්ධතියක් තුළ පූර්ව ඓතිහාසික මිනිසාගේ පදිංචිවීමේ රටාව සඳහා භූමියේ භෞතික පිහිටීම සෘජු ව බලපා ඇත. අප දන්නා පරිදි මේ සංස්කෘතියේ මිනිසුන් වී ගොවිතැන මෙන් ම එඬේර කටයුතු පවත්වා ගෙන යනු ලැබූ පිරිසක් වේ. එ බැවින් එ වැනි සමාජ තුළ තාක්ෂණ සංස්කෘතික කලාපත් භෞතික (භූමි) කලාපයත් අතර සමපාත ය, ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙනුයේ ක්ෂුද්‍ර ජීවී පරිසර කලාප සමඟ ය. එම නිසා පූර්ව ඓතිහාසික වාසභූමි පිහිටුවා ගනු ලැබ ඇත්තේ තීරණාත්මක වැදගත්කමකින් යුත් ප්‍රදේශ තුළ ය (එම: 280). අනුරාධපුරයෙහි කරන ලද පූර්ව ඓතහාසික මට්ටමේ පුරා සත්ත්ව (Archaeo Zoology) හා පුරා උද්භිදවිද්‍යා (Archaeo Botny) අධ්‍යයන මඟින් වී ගොවිතැන සමඟ දඩයම් කටයුතු, එඬේර කටයුතු ද පැවති බව මැනවින් ඔප්පු කර තිබේ (Deraniyagala 1972:48- 169 ; Seneviratne and Chandraratne 1992:12-16). තැනිතලා භූමි, දියළු පස් හා ඛනිජ අඩංගු ස්ථාන සහිත සරු බිම්වල පූර්ව ඓතිහාසික ක්ෂුද්‍ර (කුඩා) ජනපද ස්ථානගත ව තිබූ බව ක්ෂේත්‍ර විමර්ශනවල දී පැහැදිලි වී ඇත (Seneviratne 1996:280). විශේෂයෙන් ම ක්‍රි.පූ. 600 පමණ කාලයේ දී මුල් අයස් සමයේ දී ක්ෂුද්‍ර පරිසර කලාප කිහිපයක් ඒකබද්ධ ව සාර්ව පරිසර කලාප නිර්මාණය වන ආකාරය දැනට සිදු කර ඇති අධ්‍යයනවල දී තහවුරු කර ගෙන තිබේ (එම). මෙය වූකලී පූර්ව ඓතිහාසික මුල් ඓතිහාසික පරිවර්තන සමයේ දී දකුණු ඉන්දියාව ද පොදු වූ රටාවක් විය (එම 282).

වෙස්සගිරිය පරිසරය ගත් කළ ද එය ක්ෂුද්‍ර (කුඩා) ක්ෂේත්‍රයකි. එහි භූමියෙහි පිහිටීම එක් පැත්තකින් උතුරු දකුණු දිශානුගත ව දිවෙන පාෂාණ උද්ගතයකින් සිමාවන අතර පාෂාණ උද්ගතයේ සිට මීටර් 100 ක් පමණ බටහිර පසට වන්නට තැනිතලා

භූමියක් ද එතැන සිට උතුරු දකුණු දිශානුගත ව දිවෙන එ තරම් උස් නොවූ ගල්හින්නක් ද (ගොඩැල්ලක්) පිහිටා තිබේ. ප්‍රධාන පෂාණ උද්ගතයට නැගෙනහිරින් පිහිටි භූමිය එ තැන් සිට මීටර් 900 කට වඩා වැඩි ප්‍රමාණයක් මල්වතු ඔය දක්වා තැනිතලා භූමියක් ලෙස පිහිටා තිබේ. බටහිර පස ගොඩැල්ල නිර්මාණය වී ඇති ගල්හින්න ප්‍රාග් ඓතිහාසික අවධියේ දී එහි භූමියේ පිහිටීම අනුව භූ පතන (hollow) නිර්මාණය කිරිමට බලපාන ලද බව අප මෙම පරිච්ඡේදයේ මුල් කොටස තුළ පෙන්වා දී ඇත. ඒ සඳහා කි.මී. 1.5 දුරට ලබා ගනු ලැබූ බිම් මැනුම් හරස්කඩ (Cross Section) අනුව එය මැනවින් තහවුරු වේ. බඩවැටිය (ගොඩැල්ල) සිට තවත් මීටර් 100 ක් පමණ බටහිර පසට වන්නට වර්තමාන තිසා වැව පිහිටා තිබේ (මැන්දිස් සහ සෙනෙවිරත්න 2008:6-34) මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව මෙම වැව ක්‍රි.පූ. 3 වැනි සියවසේ ශ්‍රී ලංකාවේ රජ පැමිණි දේවානම්පියතිස්ස රජතුමාගේ නිර්මාණයක් ලෙස සඳහන් වේ (*Mv* xx:20).

තිසාවැවේ වැව් බැම්ම ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී නිර්මාණය කිරීමට එම භූමියේ පවතින බෑස්ම (Slope) හා ස්වභාවයෙන් ම ජලය එකතු වූ භූපතනයේ අග කොටස තෝරාගෙන තිබීම අප සිදු කළ මූලික ක්ෂේත්‍ර විමර්ශනයක් මඟින් හඳුනාගත හැකි විය. මෙම ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ කැණීම්වලට අනුව වැව නිර්මාණයට පෙර පූර්ව ඓතිහාසික සමයේ දී එම භූමියේ මානව පැළපදියම වීම් හඳුනාගත හැකි ය. වී ගොවිතැන හා සත්ත්ව ගෘහකණය මූලික කරගත් ආර්ථිකයක් ක්‍රියාත්මක කරන ලද පූර්ව ඓතිහාසික සංස්කෘතික පිරිස ක්‍රි.පූ. තුන් වැනි සියවසට පෙර එහි තිබූ මුල් භූ පතනය (hollow) උපයෝගී කර ගෙන අතින් සකස් කරනු ලැබූ කෙටි වේල්ලක් නිර්මාණය කර ගනිමින් මූලික වැවක් නිර්මාණය කර ගන්නට ඇතැයි භූමියේ පිහිටම අනුව උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන් ම ජලය හා පස මුල් අයස් සමයේ ජනයාගේ පදිංචිවීමේ රටා නිර්ණය කළ ප්‍රධාන සාධකයක් විය (Seneviratne 1996 :285). භූ පතන උපයෝගී කර ගනිමින් මුල් අයස් සමයේ වැව් නිර්මාණය කිරීම ඉබ්බන්කටුව ඉදමොරළුව වැව (එම: 286) තුළින් හා පොම්පරිප්පුව වාටිකා වළලැම් ස්ථානය,





යාන් ඔය නිම්නය මැද කුටීර වළලැම් ස්ථාන වන දිවුල් වැව, කොක්මඩ ආශ්‍රයෙන් ද හඳුනාගත තැම්මැන්න ගොඩැල්ල. ඒ අනුව වෙස්සගිරිය බටහිර දෙසින් පිහිටන්නා වූ ස්වභාවික භූ පතනය උපයෝගී කර ගෙන අතින් සාදනු ලැබූ කෙටි වේල්ලක් ඔස්සේ මුල් අයස් සමයේ දී කුඩා ග්‍රාමීය වැවක් ඉදි වීමට බෙහෙවින් ම ඉඩ පවතින අතර පූර්ව ඓතිහාසික සංස්කෘතිය එම භූමියේ ක්‍රියාත්මක ව පැවති බව වාර්තා වන භෞතික සංස්කෘතික තොරතුරු මගින් හඳුනාගත හැකි ය.

කෘෂිකර්මය මුල්කර ගත් ගැමි ජනපදයක් වෙස්සගිරිය ආශ්‍රයෙන් ක්‍රියාත්මක වූයේ නම් එම භූමියේ උපයෝගීතාවය අනුව එහි නැගෙනහිර ප්‍රදේශය වී ගොවිතැනට සුදුසු කුඹුරු සකස් කිරීමටත්, එඬේර කටයුතු සඳහාත් පුළුල් අවකාශය සහිත භූමියක් විය යුතු ය. මල්වතු ඔය වම් ඉවුර (බටහිර) නිම්නය වඩා සශ්‍රීක ප්‍රදේශයක් වේ. වර්තමානයේ ද මේ ප්‍රදේශයේ භූමිය පරිභෝජනය වන්නේ වී ගොවිතැන සඳහා ය. එ බැවින් මෙ වැනි පුළුල් නිම්න ප්‍රදේශ පුරාණයේ දී ද ගොවිතැන මෙන් ම එඬේර කටයුතුවලට පහසුව සපයන භූමි වී තිබේ. පූර්ව ඓතිහාසික සමයේදී මෙ වැනි භූමි ආශ්‍රිත ව ජනාවාස ස්ථානගත වීමට එම තත්ත්වයන් ද සෘජු ව බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

භූමියේ උපයෝගීතාවය ජනාවාසයක් ස්ථානගත වීමට බලපෑවා මෙන් ම පූර්ව ඓතිහාසික සමයේ තාක්ෂණික - සංස්කෘතික කලාපයත් භෞතික (භූමි) කලාපත් අතර සමපාතය ඇති කිරිමට ද යම් බලපෑමක් වු බව වෙස්සගිරියේ පිහිටීම අනුව පෙනේ. විශේෂයෙන් ම ක්ෂුද්‍ර (කුඩා) පරිසර කලාප කිහිපයක් ඒකාබද්ධ විමෙන් සෑදෙන්නා වු සාර්ව (මහා) පරිසර කලාප නිර්මාණය වීම ක්‍රි.පූ. 600 පමණ කාලයෙන් අනතුරු ව දැකගත හැකි සුවිශේෂ ලක්ෂණයකි. ක්‍රි.පූ. 600 පමණ කාලයේ දී පූර්ව ඓතිහාසික සමයේ තාක්ෂණසංස්කෘතික කණ්ඩායම් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර කලාපයේ කුඩා කඳු ප්‍රදේශවලට සංක්‍රමණය වීම හඳුනාගත හැකි ය. ඒ අනුව පූර්ව ඓතිහාසික සංස්කෘතිය පැතිර තිබූ භෞතික ප්‍රදේශ වූ වියළි කලාපයෙන් ඔබ්බට එ නම්, රට

අභ්‍යන්තරයට ව්‍යාප්ත වූ බව හඳුනාගැනීමට අවකාශ සැලසේ (එම : 828). අනුරාධපුර වියළි තැනිතලා භූමියකි. එම භූමියේ ප්‍රධාන පස වී ගොවිතැනට යෝග්‍ය රතු දුඹුරු පාංශු කලාපය නියෝජනය කරයි (ඤරරහ 1984:292). මෙ වැනි සශ්‍රීක භූමි පසු කොට සාපේක්ෂ වශයෙන් හිතකර නොවන කඳුකර පරිසරයකට පූර්ව ඓතිහාසික ජනතාව ඇදී යාමේ ප්‍රවනතාවය විමසීමේ දී ඒ සඳහා පුරාවිද්‍යා ද්‍රව්‍යයමය සාක්ෂි සමූහය මඟින් සපයා දී ඇත්තේ ඛනිජ සම්පත් අත්පත් කර ගැනිමේ පරමාර්ථයෙන් එම ප්‍රජාව පහත් කඳුකර කලාපවලට ව්‍යාප්ත වූ බව ය. ඒ අනුව පොකුරු ජනාවාස ක්‍රමය තුළ දී ජනාවාස අතර සම්පත් හුවමාරු කර ගැනීම සඳහා වූ ක්‍රමවේදයක් ඇතුළුපුරයෙන් දකුණට ගමන් කිරීමේ දී මලය රට දක්වා විහිදී තිබූ බව වෙසස්ගිරිය, එප්පාවල, සන්දනම්කුලම්, කලවැල්ලා උල්පත, ඉබ්බන්කටුව ආදී කුඩා ජනපද මඟින් හඳුනාගත හැකි ය. එම කුඩා ජනපදවල සිට අතරමැදි කලාපවල පිහිටි ජනපද ඔස්සේ වෙස්සගිරියට ඛනිජ සම්පත් පැමිණෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. කඳුකර කලාප තුළින් ලැබෙන ඛනිජ සම්පත් අතර ලෝහ, කුළුබඩු මෙන් ම ඛනිජ පාෂාණ ද ප්‍රමුඛ වේ. මාතලේ, නාලන්ද, දඹුල්ල. ආදී ප්‍රදේශ ආශ්‍රිත ව කහඳ, මිනිරන්, රෝස තිරුවානා ෆෙල්ස්ෆාර්, හෙමටයිට් , ලිමොනයිට්, රත්‍රං, බෙරිල්, ඇමතෙස්ත, තඹ, පළිඟු, තිරුවාණා, රිදී, චන්ද්‍රකාන්ත පාෂාණ, ග්‍රැනයිට්, ඩොලමයිට් ආදී ඛනිජ වර්ග බහුල ව දැකගත හැකි බව භූ විද්‍යාඥයින් ද පෙන්වා දී තිබේ (Cooray 1984:211-230 fig 11-13). වියළි තැනිතලා ප්‍රදේශවල සිට පහත් කඳුකර කලාපවල උතුරු බෑවුම වෙත පූර්ව ඓතිහාසික සමයේ ආදිත ම ඇතුළුවීම් ක්‍රි.පූ. හත් වැනි සියවසේ සිදු වන්නට ඇතැයි පර්යේෂකයින් පෙන්වා දී තිබේ. බහු සම්පත් යැපුම් රටාවක් අනුගමනය කළ අර්ධ - සංචාරක ජන කණ්ඩායම් විටින් විට මෙම ප්‍රදේශ වෙත සංක්‍රමණය වීම සිදු කර ඇත (Seneviratne 1996:285-286). පූර්ව ඓතිහාසික තාක්ෂණික - සංස්කෘතික කණ්ඩායම්වල මෙ වැනි ඇතුළුවීම් ඉබ්බන්කටුව, ආනේකටාව, කන්දලම, රොටවැව යනාදී ස්ථානවල පිහිටි පූර්ව ඓතිහාසික යුගයේ කුටීර වළලැම් මඟින් තහවුරු වේ (එම :286). ඉබ්බන්කටුවේ කරන ලද විකිරණමාන පරීක්ෂණවල කාල නියම කිරීම අනුව කුටීර වළලැම් ස්ථානය





ක්‍රි.පූ. හත් වැනි සියවස තරම් පැරණියැයි ද වාසභූමි ස්ථානය ක්‍රි.පූ. සිව් වැනි සියවස තරම් පැරණි යැයි ද නිගමනය කර ඇත (Deraniyagala 1992:734).

වියළි තැනිතලා ප්‍රදේශවල පිහිටන සශ්‍රීක දියළු පස් සහිත භූ කලාපය පසු කර මෙම ප්‍රදේශයට පූර්ව ඓතිහාසික සමයේ ප්‍රජාව ඇතුළු වූයේ ඛනිජ සම්පත් අත්පත් කර ගැනීමේ පරමාර්ථයෙන් බව පෙන්වාදිය හැකි ය (Seneviratnne 1996:287). මාතලේ කඳුවල සිට ඉහළ කලා ඔය පද්ධතිය දක්වා විහිදී ඇති මෙම මුළු ප්‍රදේශය පුරාවට ම පිහිටා ඇත්තේ ඇලුමිනා හා කිරිග රුඬ ගහන උස් භූමි වැටියයි (Cooray 1984:241-249 ; Herath 1975:60- 65). අධික උෂ්ණත්වයකින් යුත් තත්ත්වයන් මත පාෂාණ සෑදීම හා බොහෝ මැණික් ගල් සෑදීම මේ නිසා සිදු වී ඇත (එම). මැණික් ගල් හැරුණු විට ඉහළ කලා ඔය පද්ධතියේ හා මාතලේ කඳුවල සාරවත් තලාතු මිනිරන් නිධි ද රිදී, තඹ සහ යකඩ වැනි ලෝහ සම්පත් ද තිබේ (එම). කඳුකර ජෛව දේශගුණික කලාපය කුළුබඩු වර්ධනයට වශයෙන් ද එ ⌊නිසා ඇත් දළ ලබා ගැනීමට වඩා හිතකර ප්‍රදේශයක් වශයෙන් ද පැරණ සමාජය සලකා තිබේ (Seneviratne 1988:121-132 ; Herath 1975: 60-65).

ඉහතින් පෙන්වා දී ඇති අකාරයට ක්ෂුද්‍ර භූ කලාපවල ස්ථානගත වන පූර්ව ඓතිහාසික සමයේ සංස්කෘතීන් බහු සම්පත් යැපුම් රටාවේ වර්ධනය සමඟ එම ප්‍රදේශගත සම්පත්වලින් ප්‍රයෝජන ගැනීම පෙරට වඩා සැලසුම් කර කරන ලද බව පෙනේ. ක්ෂුද්‍ර හා සාර්ව පරිසරය තුළ ගොඩනැගෙන ක්‍රියාවලිය කෙරෙහි වඩා යහපත් අවබෝධයක් තිබුණු බව ඉන් පෙන්නුම් කෙරේ. වෙනත් ක්ෂුද්‍ර වාසභූමිවලින් අමුද්‍රව්‍යය සඳහා එළැඹි ඉල්ලුම හේතුකොට ගෙන වඩා තැන්පත් ලෙස එම ප්‍රදේශවල පදිංචි වීම තහවුරු වේ. අනුරාධපුර ඇතුළුපුර කරන ලද කැණීම්වලදී ක්‍රි.පූ.500 පමණ දී එම ස්ථානයට ගෙනෙන ලද ඛනිජ ද්‍රව්‍යවල විවිධත්වය වැඩි වූ බවට ලැබෙන සාධක දෙස විමර්ශනය කිරීමේ දී මැණික් කැපීමේ වැඩ, රත්‍රං,තඹ ආදී ද්‍රව්‍යයමය සාක්ෂි හමුවීමෙන් මේ බව අනාවරණය වී තිබේ (Deraniyagala 1986:42-43 ; Seneviratne 1996:291). ඇතුළුපුරයේ පමණක් නොව ප්‍රාග්

ජේතවන අවධියට අයත් ස්තර තුළින් හා වෙස්සගිරියේ පූර්ව ඓතිහාසික සංස්කෘතික සන්දර්භවලින් ලැබෙන ලෝහ හා ඛනිජ පාෂාණ සම්බන්ධ ද්‍රව්‍යයමය සාක්ෂි මඟින් ද ක්ෂුද්‍ර ජනාවාස ක්ෂේත්‍ර හා ඒ ඔස්සේ සාර්ව සංස්කෘතික පරිසරය නිර්මාණය වීම හඳුනාගත හැකි ය. ක්ෂුද්‍ර ජනාවාස අතර සිදු වන්නා වූ ද්‍රව්‍යයමය අන්තර් ක්‍රියාවලිය මඟින් සාර්ව ජනාවාස රටාවක් නිර්මාණය වී එක් අවධියක දී එහි සුවිශේෂ ජනාවාසය ප්‍රධාන ජනාවාසය බවට පත්වන ආකාරය අනුරාධපුරයේ පමණක් නොව යාපන අර්ධද්වීපයේ යකඩ යුගයේ සංස්කෘතිය තුළින් ද හඳුනාගත හැකි ය (Raghupathy 1987:171-176). වෙස්සගිරියේ සිදු කරන ලද VGHL Ex. 02 කැණීමට අදාළ ව එම ස්ථානයේ භූ විදුම් මගින් ලබාගත් නියැදි ආශ්‍රිත ව කරන ලද පාංශු විද්‍යා අධ්‍යයනයන් ඔස්සේ එම පස් විශ්ලේෂණය කිරීම තුළින් ප්‍රාග් ඓතිහාසික මට්ටමේ සිට ක්‍රමානුකූල ව වර්ධනය වූ සංස්කෘතික ක්‍රියාකාරකම්වල වර්ධනය හඳුනාගැනීමට හැකි වී තිබේ. පාංශු ස්තර 05 ක් තුළ එ නම් $D_1$, $D_2$, $D_3$, $D_4$, $D_5$ වශයෙන් ලබා ගත් නියැදි පරීක්ෂා කිරීමෙන් එම ස්තර තුළ අඩංගු පොස්පරස් ප්‍රතිශතය ගණනය කිරීම ඔස්සේ මානව ක්‍රියාකාරකම්වල වැඩිවීමේ ස්වරූපය ජනාවාස තත්ත්වය පුළුල් වීමේ දී හඳුනාගැනීමට හැකි වී තිබේ.[5]

$D_1$ හා $D_2$ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතිය ස්ථානගතවීම පෙන්නුම් කෙරෙන RBE පස් ස්තරය වන අතර $D_3$ හා $D_4$ පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධිය ස්ථානගතවීම පෙන්වන පස් ස්තර වේ. ඊට පසු අවධි තුළ එ නම් මුල් ඓතිහාසික සංස්කෘතික අවධිය ස්ථානගත වීම පෙන්වන පස් ස්තරවල පොස්පරස් ප්‍රතිශතය තව දුරටත් වැඩි වී ඇති ආකාරය එම අධයයන අනුව හඳුනාගත හැකි ය. මේ තත්ත්වයන්ට අනුව පූර්ව ඓතිහාසික සමයේ දී හා මුල් ඓතිහාසික සමයේ දී වෙස්සගිරිය ආශ්‍රිත ක්ෂුද්‍ර ජනාවාසයේ සන්දර්භගතවීමේ වැඩි උපයෝගීතාවයක් හඳුනාගත හැකි ය.

5 මෙම අධ්‍යයනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ පාංශු අධ්‍යයන අංශයේ මහාචාර්ය මාපා විසින් සිදු කරන ලදි. එම අධ්‍යයනයන්ට අනුව $D_3$ හා $D_4$ යන පාංශු ස්තර තුළ දී භූමි පරිභෝජනය සම්බන්ධ පොස්පරස් ප්‍රතිශතය හා ඏ5 පාංශු ස්තරය තුළ පොස්පරස් ප්‍රතිශතය ඊට පූර්ව ස්තරවලට වඩා අඩුවීමක් දැකගත හැකි බව පෙනනුම කෙරේ (*Mapa et.al* 2007:337-338).





වෙස්සගිරිය ක්ෂුද්‍ර පරිසර ක්ෂේත්‍රය අශ්‍රිත පුරා ජනාවාස රටාව අධ්‍යයනයේ දී මීළඟට සන්දර්භගත වන තාක්ෂණික සංස්කෘතික අවධිය වශයෙන් හඳුනාගත හැක්කේ මුල් ඓතිහාසික සංස්කෘතික අවධිය (Early historic period) බව පෙනේ. අනුරාධපුර ඇතුළුපුර සංස්කෘතික සන්දර්භගත වීමේ පෙළ ගැස්ම තුළ මෙම සමය හඳුන්වා දී ඇත්තේ ක්‍රි.පූ. 250 ක්‍රි.ව. 100 මධ්‍ය මුල් ඓතිහාසික අවධිය වශයෙනි (Mid – Early historic) (Deraniyagala 1992 : 712). නමුත් සෙනෙවිරත්න මෙම යුගය ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 100 මුල් ඓතිහාසික අවධිය වශයෙන් දක්වා ඇත (Seneviratne 1996:279). සාහිත්‍යමය ප්‍රභවයන්ට අනුව ක්‍රි.පූ.තුන් වැනි සියවස දේවානම්පියතිස්ස රාජ යුගයේ දී අරිට්ඨ කුමරු ඇතුළු වෛශ්‍ය කුලයේ පන්සියයක් සංඝයා වැඩ වාසය කළ ආරාමය වෙස්සගිරිය වශයෙන් හඳුන්වා ඇත (*Mv* xx 15-20).

වෙස්සගිරියේ අභිලේඛන උපයෝගී කර ගනිමින් D.M.D.Z. වික්‍රමසිංහ පෙන්වා දී ඇත්තේ වෙස්සගිරිය ගුහා තුළ දැකගත හැකි බ්‍රාහ්මී අභිලේඛන අක්ෂර පරිණාමය අනුව ක්‍රි.පූ. දෙ වැනි සියවස තරම් පැරණි බව ය (*Ez*. Vol.i : 13) ඔහු විසින් ගුහා ලිපි 15 ක් වාර්තා කර තිබෙන අතර එම ලිපි අතර පරුමක, ගහපති, බත, උපසක ආදී පදවි නාම සහිත ලිපි තිබෙන බව ද පෙන්වා දී ඇත (එම 18-20). මින්පසු වෙස්සගිරිය ආශ්‍රිත ගුහා ලිපි සම්බන්ධ අධ්‍යයනය සෙනරත් පරණවිතාන සිදු කර ඇත. ඔහු වෙස්සගිරිය ගුහා ලිපි මුල් බ්‍රාහ්මී අභිලේඛන වශයෙන් හඳුන්වා ලිපි 23 ක් වාර්තා කර අර්ථ නිරූපණයක යෙදෙමින් පරුමක, ගහපති, ගමික, බත, උපසක ආදී පදවි නාම දැරුවන් විසින් මෙම ගල්ගුහා මහා සංඝයාට පූජා කර ඇති බව පෙන්වා දී තිබේ (*Ic*.Vol.i 6-7). සාහිත්‍යමය ප්‍රභවයන්ට අනුව සහ ලිඛිත පුරාවිද්‍යාත්මක ප්‍රභවයන්ට අනුව බෞද්ධාගම අනුරාධපුරයේ මුල් බැස ගත් මුල් කාලයේ දී වෙස්සගිරිය ආශ්‍රිත බෞද්ධ විහාර ගොඩනැගීම ආරම්භ ව තිබේ.



01.කාල රක්ත වර්ණ මැටි බඳුන්



02 කාල රක්ත වර්ණ මැටි බඳුන්



03 කාල වර්ණ මැටි බඳුන්







04 කෝවක කොටස්

ඡායාරූප අංක 4.15
VGHL Ex 02 කැණීමෙන් හමු වූ මැටි බඳුන් සහ කෝවක කොටස්

මුල් ඓතිහාසික අවධියේ දී ඊට පෙර පැවති යුගයට සාපේක්ෂ ව සංස්කෘතියේ යම් දියුණුවක් සිදු වී තිබෙන බව පැහැදිලි වන අතර මේ සඳහා දියුණු ලෝහ ආයුධ බහුල වශයෙන් පාවිච්චි කිරීම, නගුල් කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය හා සංකීර්ණ සමාජ සැදුම බෙහෙවින් ම බලපා තිබේ (Seneviratne 1996 :276-297). මෙම යුගයේ දී අනුරාධපුරය හා මාගම සම්බන්ධ වියළි කලාපවල ප්‍රධාන පස වී ගොවිතැනට යෝග්‍ය රතු දුඹුරු පස ඵලදායක වූයේ සී සෑමෙන් හා වාරි ජලය සැපයීමෙන් පමණක් බව ද ප්‍රකට කරුණකි. ඒ අනුව අනුරාධපුරයේ වඩා සංකීර්ණ වාරිමාර්ග පද්ධති පිහිටුවීම නිසැක ව ම මුල් ඓතිහාසික සමයේ සිදු වේ (Seneviratne 1996:282 ; Somadeva 2006:100-114). වෙස්සගිරිය ආශ්‍රිත ක්ෂුද්‍ර ක්ෂේත්‍රයේ සංස්කෘතික භූ දර්ශනය අධ්‍යයනය කිරීමේ දී මුල් ඓතිහාසික අවධියේ දී එහි පැවති පරිසර තත්ත්වය හා භූමි පරිභෝජනය කෘෂිකර්මය හා වාරි කර්මාන්තය පදනම් ව සිදු වී යැයි විශ්වාස කළ හැකි ය. සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන විස්තරවලට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ වන විට වෙස්සගිරියට බටහිර පස භූමියේ මහා පරිමාණ වැවක් වන තිසා වැව ඉදි කර තිබූ බව පෙනේ. මෙය දේවානම් පියතිස්ස රජතුමාගේ නිර්මාණයක් ලෙස වංසකතා වැඩි දුරටත් පෙන්වා දී ඇත (*Mv*. xx :20). පූර්ව ඓතිහාසික සමයේ

ද්‍රව්‍යය හා සමාජ පදනම විකල්ප ප්‍රභවයන් කරා පැමිණි බව මෙහි දී හඳුනාගත හැකි අතර පූර්ව ඓතිහාසික අවධියේ දී කෙටි වේල්ලක් සහිත ව ඉදි ව තිබූ කුඩා ග්‍රාමීය වැව මුල් ඓතිහාසික අවධියේ දී දැවැන්ත වේල්ලක් දක්වා පරිවර්තනය වෙමින් විශාල වැවක් බවට පත් වූ ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව වැවේ වපසරිය මත එයින් නඩත්තු කළ හැකි වගා භූමි පුළුල් වන අතර ඒ ඔස්සේ එතෙක් පූර්ව ඓතිහාසික අවධියේ පැවති ජනාවාසය ජන රේඛනයේ ප්‍රසාරණය සමඟ අවට භූමිවලට ප්‍රසාරණය වීමට වැඩි ඉඩක් පවතී. ඒ සමඟ ම ස්වභාවික ගුහා පද්ධතිය සහිත ව පැවති වෙස්සගිරිය මුල් ඓතිහසික අවධියේ දී සංඝරාමයක් දක්වා පරිවර්තනය වෙමින් එ තෙක් පැවති භූ දර්ශනය වෙනස් භූ දර්ශන සන්දර්භයක් කරා පරිවර්තනය වී ඇති බව හඳුනාගත හැකි ය.

මුල් ඓතිහාසික අවධියේ දී කටාර සහිත සංඝාරාමයක් දක්වා වෙස්සගිරියේ ගල්ගුහා පරිවර්තනය විමේ දී ඒ සඳහා ලෝහ තාක්ෂණයේ වැඩි උපයෝගීතාවයක් අවශ්‍ය වේ. දැනට සිදු කර තිබෙන පුරාවිද්‍යා අධ්‍යයනවලට අනුව උතුරු ඉන්දියාවේ ක්‍රි.පූ. 900 පමණ ද දකුණු ඉන්දියාවේ ක්‍රි.පූ. 1200 පමණ ද ශ්‍රී ලංකාවේ ක්‍රි.පූ.1359 දී පමණ ද යකඩ හා අවශේෂ ලෝහ වර්ග පරිහරණය ආරම්භ ව තිබේ (Sundara 2004 242-246 ; Deraniyagala 1992:709 ; Seneviratne 1994:14 Somadeva:2006). ශ්‍රී ලංකාවට මෙසේ ඇතුළු වූ ලෝහ තාක්ෂණය ඉතා කෙටි කලකින් කඩිනම් වර්ධනයක් තාක්ෂණයක් තුළ හෝ එය පරිහරණය කළ සමාජ ව්‍යුහය තුළ ඇති නොකළේ ය (Seneviratne 1994:14). තාක්ෂණයේ එ වැනි රේඛීය වර්ධනයක් දැකගත නොහැකි ය. එහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය අප තක්සේරු කළ යුත්තේ සමාජ ව්‍යුහය ලබා ඇති සාපේක්ෂ වර්ධනය මත ය (එම). එසේ හෙයින් ක්‍රි.පූ. 900 දී ශ්‍රි ලංකාවට ඇතුළු වූ යකඩ හා අනෙකුත් ලෝහ තාක්ෂණ ක්‍රම විධි වඩා සුවිශේෂ අන්දමට කළඑළි බැසීමට තවත් ශත වර්ෂ 07 ක් පමණ ගත වේ (එම). ලෝහ තාක්ෂණයේ ප්‍රගමනයේ දෙ වැනි අවස්ථාව අපට හඳුනාගත හැක්කේ ක්‍රි.පූ.3-2 සියවස්වලිනි. වඩාත් ප්‍රගුණ කරන ලද ලෝහ මෙවලම් මෙම





යුගයේ කළඑළි බැස ඇති ආකාරය හඳුනාගත හැකි ය (එම 14-15). විශේෂයෙන් ම අනුරාධපුරයේ මුල් ඓතිහාසික අවධියේ ලෝහ තාක්ෂණයේ දියුණුව ඇතුළුපුරයේ 4 A ස්තරය තුළින් හඳුනාගෙන තිබේ (Deraniyagala 1972 :153-755).

යකඩ හෝ තඹ තාක්ෂණය පූර්ව ඓතිහාසික අවධියේ දී භාවිත වුව ද මහා පරිමාණ ශෛලමය නිර්මාණ ඉදි කිරීමේ දි ඒවා මෙල්ල කිරීමට යකඩ හෝ තඹ තාක්ෂණයට හැකයාව නොමැත (Seneviratne 1994:14). එ බැවින් එ වැනි අවස්ථාවක විකල්ප ලෝහයක් අවශ්‍ය වන අතර මුල් ඓතිහාසික අවධියේ දී වානේ භාවිතය අඩු ම තරමින් ගුහා කටාරයට (Drip-ledge) සකස් කිරීමේ දී භාවිත කළ යුතු ය. නයිස් හා ග්‍රැනයිට් වර්ගයේ පාෂාණ ඉතා දැඩි බවකින් යුත් පාෂාණ වේ. ඒවා මෙල්ල කිරීමට වානේ තාක්ෂණය භාවිත කිරීම මේ යුගයේ දී හඳුනාගත හැකි ය (Seneviratne 1984:15). ශ්‍රී ලංකාවේ හා අර්ධද්වීපික ඉන්දියාවේ වානේ නිෂ්පාදනයට භාවිත කරන ලද ක්‍රම විධිවල සමානතාවය පෙන්නුම් කිරීමෙන් මේ දෙ රටේ දී ම භාවිත කර ඇති තාක්ෂණයේ මූලය එකක් බව හඳුනාගත හැකි ය (එම). මුල් ඓතිහාසික අවධියේ දී අනුරාධපුර වෙස්සගිරිය හා අභයගිරියේ ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු ඉදි වන ලෙන් පද්ධතිය තුළ ආරාම සකස් කිරීමට ප්‍රගුණ කරන ලද වානේ මෙවලම් භාවිත කරන්නට ඇත. එතෙක් තිබූ ස්වභාවික ගල්ගුහා වෙනස් කොට නව භූ දර්ශනයක් සකස් කිරීමට මුල් ඓතිහාසික සමයේ දී වානේ තාක්ෂණයට හැකියාව ලැබී ඇති බව පෙන්වාදිය හැකි ය.

මේ ආකාරයට ස්මාරක හා සෙසු ගොඩනැඟිලි ඉදි කිරීමේ දී මුල් ඓතිහාසික යුගයේ දී පරිසරය වඩා සාර්ථක ලෙස හැසිරවීමටත් නගුල් කෘෂිකර්මාන්තය හා සුවිශේෂ වාරි ක්‍රම ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු වර්ධනය වීමටත්, සංවිධානය වූ මූලික රජය බිහිවීම, ලෝහ සම්පත් හා තාක්ෂණ හැසිරීමේ ලක්ෂණය ලෙස පෙන්වාදිය හැකි ය (එම 1994:15). ඒ අනුව අනුරාධපුර නගරයට දකුණු දිග් භාගයේ ස්ථානගත ව තිබූ වෙස්සගිරිය ආංශුක පුරාවිද්‍යා ක්ෂේත්‍රය මුල් ඓතිහාසික අවධියේ දී මුල් බෞද්ධ ආරාමීය තත්ත්වයන් දක්වා වර්ධනය වී ආගම පදනම්

කර ගත් අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය සඳහා එකතු වන්නට ඇති බව පෙන්වාදිය හැකි ය.



ඡායාරූප අංක 5416
වෙස්සගිරියේ කටාර කොටන ලද ලෙනක්

වෙස්සගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයේ දී මීළඟට හඳුනාගත හැකි අවධිය වන්නේ

i. ඉහළ මුල් ඓතිහාසික අවධිය (Upper Early Historic 100 - 300 AD))

ii. මධ්‍ය ඓතිහාසික අවධිය (Middle Historic 300-1250 AD) වශයෙන් හැඳින්විය හැකි අවධියෙන් ය (1992:713).

ඉහළ පූර්ව ඓතිහාසික අවධිය සම්බන්ධ වෙස්සගිරිය ආශ්‍රිත තොරතුරු හඳුනාගත හැක්කේ VG Cave No 1 2008 නාමය යටතේ සිදු කරනු ලැබූ කැණීම් මඟිනි (මැන්දිස් සහ තවත් අය 2008:59:71). යථෝක්ත කැණීමේ දෙ වැනි අවධියට අයත් සංසිද්ධි අංක 34, 35, 42, 48, 17, 18 යන සංසිද්ධි තුළින් අදාළ ගුහාවේ ඉදිරිපසින් ස්වභාවික ගුහාව සඳහා ලෙන් ආවරණ ඉදි කිරීම් සිදු කර ඇති බව හඳුනාගත හැකි ය (එම :70). මේ සඳහා කළුගල් හා ගඩොළු භාවිත කර ගුහා ආවරණ





ඉදි කර තිබේ (එම). අනුරාධපුරයේ ගොඩනැගිලි කර්මාන්තය සඳහා ගඩොළු භාවිත කිරීම ක්‍රි.පූ. 250 - ක්‍රි.ව. 100 මධ්‍ය පූර්ව ඓතිහාසික අවධියේ දී සිදු වී ඇති බව දැරණියගල පෙන්වා දී තිබේ (Deraniyagala 1992 :712). ASW 02 කැණීම් සාධක අනුව ඇතුළුපුරයේ ක්‍රි.පූ. මුල් සියවස්වල පුළුස්සනු ලැබූ ගඩොළු උපයෝගී කර ගොඩනැගිලි ඉදි කර තිබෙන බව කනිංහැම් ද පෙන්වා දී ඇත (Coningham 1991:128). සංඝයාගේ පරිහරණය සඳහා මුල් ඓතිහාසික අවධියේ සැකසෙන කටාර කෙටූ ලෙන් ඉහළ මුල් ඓතිහාසික අවධියේ දී (Upper Early historic 100-300 AD) යම් සංවර්ධනයකට ලක් වූ බව වෙස්සගිරියේ VG Cave No 01 2008 ස්ථාන නාම යටතේ සිදු කළ කැණීමේ දී හඳුනාගත හැකි විය. එම ගුහාවේ ඉදිරි බිත්තිය ඉදි කිරීම සඳහා සැකසූ අත්තිවාරම සංසිද්ධි අංක 36 හා 37 යන සංසිද්ධිවලින් වාර්ත වී තිබේ. ගුහා ආවරණය ඉදි කර ඇත්තේ සංසිද්ධි අංක 45 හා 47 යන සංසිද්ධි නියෝජනය කරන පාංශු ස්තරය තුළ ය. එම ස්තරය තුළින් ලක්ෂ්මී කාසි වාර්තා වීම නිසා එම සන්දර්භය හඳුනාගැනීමට මහෝපකාරී වේ. ශ්‍රී ලංකාවේ ලක්ෂ්මී කාසි භාවිතය ක්‍රි.පූ. දෙ වැනි සියවසින් පසු සිදු වූ බව විවිධ ප්‍රදේශවල සිදු කරන ලද පුරාවිද්‍යා කැණීම්වලින් ද තහවුරු වී ඇත. ඒ අතර ඇතුළුපුරය හා තිස්සමහාරාමය ප්‍රධාන වේ (Deraniayagala 1992:712 ; Weisshaar et.al 2001 ; 262-263; Coningham 1991 :129). වෙස්සගිරියේ සංස්කෘතික භූ දර්ශනය ක්‍රි.ව. 100 - ක්‍රි.ව 300 වන විට ස්වභාවික ගල්ගුහා සඳහා ඉදිරි ආවරණ සහිත ගොඩනැගිලිවලින් සමන්විත වී තිබෙන බව ගුහා කැණීමෙන් අනාවරණය වූ දත්තවලට අනුව පැහැදිලි වේ.

වෙස්සගිරිය සංස්කෘතික විකාශනය හා භූ දර්ශනයේ වඩා දියුණු කාල වකවානුව මීළඟට හඳුනාගත හැක්කේ මධ්‍ය ඉතිහාසය තුළිනි. අනුරාධපුරයේ සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලිය තුළ මේ කාලය ක්‍රි.ව. 300 - 1250 වශයෙන් දැරණියගල හඳුන්වාදී තිබේ (Deraniyagala 1992 :713). වෙස්සගිරිය ආශ්‍රිත මෙම අවධියට අයත් සංස්කෘතික විකාශනය හා භූ දර්ශන අධ්‍යයනයේ දී වංසකතා හා අභිලේඛන සාධක වැදගත් වේ. මූලාශ්‍රයගත

තොරතුරුවලට අනුව ක්‍රි.ව. 67-111 රජ වූ වසභ රජතුමා වෙසස්ගිරිය සඳහා උපෝසථඝරයක් ඉදි කර ඇත (*Mv* xxxv : 87). ක්‍රි.ව. 209-231 රජ වූ වෝහාරිකතිස්ස රජතුමා ඉසුරුමුණිය (වෙස්සගිරිය) විහාරය සඳහා ප්‍රකාරයක් ඉදි කර තිබේ (Nicholas 1963:148). 1 වැනි කාශ්‍යප ක්‍රි.ව. 473-491 මෙම විහාරය පුළුල් කොට ඊට ඉඩකඩම් දේපළ පූජා කර තමාගේ හා තම දියණියන් දෙදෙනාගේ නම් අනුව යටින් බෝ උපුල්වන් කසුබ්ගිරි විහාර යනුවෙන් වෙස්සගිරි (ඉසුරුමුණිය) නම් කර ඇත (*Ez*.Vol.i 35-39, 133). එසේ ම ක්‍රි.ව. හය වැනි ශත වර්ෂයේ දී දෙ වැනි ජෙට්ඨතිස්ස රජු ද ක්‍රි.ව. හත් වැනි සියවසේ දී දාඨෝපතිස්ස රජතුමා ද මෙම විහාර සංවර්ධන කටයුතුවලට දායක වී තිබේ (Nicholas 1963:149). ක්‍රි.ව. 940-955 රජ වූ V වැනි දප්පුල රජු ද මෙම විහාරය සංවර්ධනයට ලබා දුන් දායකත්වය ශිලා ලේඛනවල සඳහන් වේ (*Ez*.Vol.i 23-38). වෙස්සගිරිය ආංශුක ක්ෂේත්‍රයට අදාළ ව හමු වී ඇති ගිරිලිපි 11 මගින් ක්‍රි.ව. 6,7 සියවස්වල මෙම විහාරය සම්බන්ධ ව සිදු වූ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ ව තොරතුරු හඳුනාගත හැකි ය (සේනානායක 2008:93).

සාහිත්‍ය හා අභිලේඛන තොරතුරු අනුව මධ්‍ය ඓතිහාසික අවධියේ වෙස්සගිරියේ භූ දර්ශනය බොහෝ සෙයින් පරිවර්තනයට ලක් වූ ආකාරය හඳුනාගත හැකි අතර එය ක්‍රමානුකූල ව ගුහා ආරාමයක සිට පබ්බතාරාමයක් බවට පරිවර්තනය වූ බව පෙනේ (සිල්වා 1995:215-294). මේ අනුව අනුරාධපුර දකුණු දිග් භාගයේ ස්ථානගත වූ ආංශුක පුරාවිද්‍යා ස්ථානයක් වන වෙස්සගිරිය ඉතා ප්‍රාථමික මට්ටමේ සිට ජනාවාස ආරම්භ ව වර්ධිත තත්ත්වය දක්වා දියුණුවට පත්වන අකාරය පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍ර සාධක අනුව පෙන්වාදිය හැකි ය.



05
වැනි
පරිච්ඡේදය

## 5.1 අනුරාධපුර කේන්ද්‍රය හා පර්යන්තය අතර පුළුල් භූ දර්ශනයේ

### අවකාශය ගොඩනැඟීම

පුරාණ අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය (Mega Cultural landscape in Ancient Anuradhapura) පිළිබඳ අධ්‍යයනයේ දී කේන්ද්‍රය හා පර්යන්තය අතර සිදු වූ අවකාශීය තත්ත්වයන් හඳුනාගැනීම අතිශයින් ම වැදගත් වේ. මෙම අවකාශීය තත්ත්වයන් තේරුම් ගැනීමේ දී පුරාණයේ සිට යථෝක්ත පරිසරයේ විවිධ පාර්ශවයන් අතර අනාදිමත් කාලයක් තිස්සේ සිදු වූ අන්තර් ක්‍රියාකාරිත්වය ග්‍රහණය කර ගැනීම සඳහා පහත සඳහන් වන්නා වූ අංශ කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

i. කැපීපෙනන ලෙස දීර්ඝ කාලයක් තිස්සේ කාලය ඔස්සේ වන වෙනස්වීම හඳුනාගැනීම.
ii. භූ දර්ශනයේ නිර්මාණය සඳහා මානව සාධකයේ භූමිකාව හඳුනාගැනීම.
iii. අවකාශීය සංස්කෘතික රටාවන් හා එහි සහ සම්බන්ධතාවයන් හඳුනාගැනීම.

ඉහත පෙන්වාදී ඇති අවකාශීය තත්ත්වයන් ග්‍රහණය කර ගැනීම සඳහා ද්‍රව්‍යයාත්මක උරුමයේ අන්තර්ගත පුරාවිද්‍යාත්මක විශේෂීතාවයන් කාලමානය තුළ දීර්ඝ කාලීන ව ක්‍රියාත්මක වූ

අන්දම හා වෙනස්වීම ඔස්සේ ගොඩ නැඟුණු ආකාරය හඳුනාගැනීම තුළින් සාර්ව සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය ගොඩනැඟීමට අවකාශ සැලසේ. අධ්‍යයනට ලක්වන පූරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය යනු පරිසරය පමණක් නොවේ. සංස්කෘතික භූ දර්ශනය පුරාවිද්‍යාත්මක භාෂිතයන් තුළ දිගු ඉතිහාසයක් සහිත සංකීර්ණ ක්‍රියාවලියකි. එම ක්‍රියාවලියට අදාළ ද්‍රව්‍යයාත්මක තත්ත්වයන් හා පරිවර්තනයන් තේරු ගැනීම පුලුල් සංස්කෘතික විකාශනය හා භූ දර්ශනයේ අවකාශය ගොඩනැඟිමේ දී වැදගත් වේ (Fairclough and Rippon 2002:27-29).

පුරාණ අනුරාධපුර නාගරික ප්‍රදේශය තුළ මෙතෙක් සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයනයන්ට අනුව එහි කේන්ද්‍රය හා පර්යන්තය තුළ සිදු වූ භූ දර්ශනය පිළිබඳ ව අවකාශීය තත්ත්වයන් ග්‍රහණය කර ගෙන තිබුණ ද කේන්ද්‍රය හා පර්යන්තය අතර පුළුල් භූ දර්ශනයේ අවකාශය හඳුනාගෙන නොමැත. ඒ අනුව සාර්ව (මහා) භූ දර්ශනය තේරුම් ගැනීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ මෙම පරිසරයේ සිදු වූ තාක්ෂණික සංස්කෘතික අවධින්හි (Techno cultural Period) පරිවර්තන ක්‍රියාවලිය අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය කේන්ද්‍රයේ සිට පර්යන්තයට කේන්ද්‍රාපසාරී ලෙස ව්‍යාප්ත වීමට හෝ එසේත් නොමැති නම් පර්යන්තයේ සිට කේන්ද්‍රය දක්වා කේන්ද්‍රාභිසාරි ලෙස ව්‍යාප්ත වීමක් වූවා ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් වේ.

අනුරාධපුර කේන්ද්‍රය (ඇතුළුපුරය), මධ්‍ය (ජේතවනය) හා තදාශ්‍රිත ප්‍රදේශය, වෙස්සගිරිය හා ඉන් පිටත (පරියන්තය තුළ) මෙතෙක් සිදු කෙරී ඇති පුරාවිද්‍යා කැණීම් ගවේෂණ ආදිය මඟින් ඒ ඒ ක්ෂුද්‍ර භූමි තුළ මතුපිටින් හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක ද්‍රව්‍යයමය නෂ්ටාවශේෂවලට වඩා දිගු ඉතිහාසයක් පොළොව අභ්‍යන්තරයේ තැන්පත් ව පවතින බව භෞතික සංස්කෘතික තොරතුරුවලින් හඳුනාගත හැකි ය. ඇතුළුපුරය, ජේතවනය හා වෙස්සගිරිය භූමි ආශ්‍රිත ව සිදු කරනු ලැබූ ස්තර විද්‍යානුකූල පුරාවිද්‍යා කැණීම් ඇසුරින් යථෝක්ත භූ කලාපවල ප්‍රාරම්භක සංස්කෘතික සන්දර්භගත වීමේ අවස්ථාව ලෙස ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික අවධිය හඳුනාගෙන තිබේ. සිරාන් දැරණියගල





අනුරාධපුර ඇතුළුපුර (අධ්‍යයනයේ දී අප කේන්ද්‍රය වශයෙන් හඳුන්වන භූමි භාගය) සිදු කරනු ලැබූ කැණීම්වලදී අදින් වසර 5850 කට පූර්ව (ක්‍රි.පූ.3850) යේදී එම භූමි භාගය නූතන වැදි පරපුරේ මී මුත්තා වූ ඔස්ට්‍රොලොයිඩ් මානව වර්ගයට අයත් මධ්‍ය ශිලා යුගයේ (Mesolithic) බලන්ගොඩ මානවයා විසින් ජනාවාස කරනු ලැබූ බව තහවුරු කර ගෙන ඇත (Deraniyagala 1972 :50; එම 1992:700,729). ඔහු පෙන්වා දී ඇති ආකාරයට ඇතුළුපුර මධ්‍ය ශිලා යුගයේ සමාරම්භය රතු දුඹුරු පාංශු කලාපය (Reddish Brown Earth) තුළ සිදු වී ඇත (එම 1992 :700). කේන්ද්‍රයට පිටත මධ්‍ය ප්‍රදේශය තුළ ජේතවනය ආශ්‍රිත භූමියේ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැණීම් තුළින් රතු දුඹුරු පාංශු කලාපය (RBE) තුළින් මධ්‍ය ශිලා යුගයට අයත් මානව ජනාවාසකරණ ලක්ෂණ JSMP 2002, JSWMP 2003, JSOWP 2004 ස්ථාන නාම යටතේ සිදු කරනු ලැබූ කැණීම්වල දී හඳුනාගෙන ඇත (මැන්දිස් 2003/2004:09).


එසේ ම කේන්ද්‍රයට දක්ෂිණ දිග තදාශ්‍රිතයේ පිහිටන වෙසස්ගිරිය ක්ෂුද්‍ර භූමිය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ VGHL Ex. 01 හා 02 යන කැණීම්වල දී ද යථෝක්ත භූමියේ රතු දුඹුරු පාංශු කලාපය තුළින් මධ්‍ය ශිලා යුගයට අයත් මානව ජනාවාසකරණය පිළිබඳ සාධක හමු වි තිබේ (මැන්දිස් 2008:48-49). ඒ අනුව කේන්ද්‍රය, මධ්‍ය හා තදාශ්‍රිත ප්‍රදේශයවලට අයත් ක්ෂුද්‍ර ක්ෂේත්‍රයන්හි සිදු කරනු ලැබූ කැණීම්වල දී සමස්තයක් ලෙස මධ්‍ය ශිලා යුගයේ මානව ජනාවාසකරණය පිළිබඳ සාධක හමුවන්නේ රතු දුඹුරු පාංශු කලාපයෙනි. මධ්‍ය ශිලා යුගයේ දී යථෝක්ත ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ආශ්‍රිත මානව ජනාවාසකරණය සිදු වූයේ කේන්ද්‍රාපසාරී ලෙස ද එසේත් නැතහොත් කේන්ද්‍රාභිසාරී ලෙස ද යන්න පිළිබඳ විමසීම තුළින් ප්‍රාරම්භක අවධියේ දී අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය ගොඩනැඟීම සඳහා මානව සාධකයේ භූමිකාව හඳුනාගැනීමට ඉන් අවකාශ සැලසේ. අධ්‍යයනයට භාජනය වන අනුරාධපුර පැරණි නගරයට අයත් කේන්ද්‍රයේ සිට අරය කි.මී. 5 ක් වන සාර්ව භූමිය ගත් කළ එහි පවතින භෞතික පරසරය තුළ දැකගත හැක්කේ සමාන භෞමික සන්දර්භයකි. සමස්තයක

ලෙස වාර්ෂික උෂ්ණත්වය 80º F හා වර්ෂාපතනය අඟල් 50 - 70 දක්වා පවතින සදාහරිත වනාන්තරවලින් යුත් වියළි තැනිතලා භූමි ප්‍රදේශයක් වශයෙන් මෙම භූමි ප්‍රදේශය හඳුනාගත හැකි ය (Fernando 1967:43-68). මුහුදු මට්ටමේ සිට ගත් කළ අඩි 200-400 (මීටර් 65-130) ත් අතර උසකින් පිහිටි යථෝක්ත ප්‍රදේශය උස් භූමි ශ්‍රේණියට අයත් ප්‍රාග් කේම්බ්‍රීය හා විජයානු ශ්‍රේණියට අයත් පාෂාණ මණ්ඩලයකින් සමන්විත වේ (Cooray 1967:245). ප්‍රදේශයේ දැකගත හැකි සුවිශේෂ පාංශු කලාපය රතු දුඹුරු පාංශු කලාපය වේ (Panabokke 1967 :67-85). ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියේ ජනාවාස පිහිටුවා ගැනීමේ දි මෙම භෞතික පාරිසරික තත්ත්වයන්ගේ උපයෝගීතාවය විමසීම මඟින් අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනයේ ප්‍රාරම්භක අවධිය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය.

වත්මන් වෙස්සගිරිය වශයෙන් හඳුන්වන (පුරාණ ඉසුරුමුණිය) ප්‍රදේශයේ සිට අභයගිරිය උතුරු ප්‍රදේශය දක්වා භූමියේ තැනින් තැන මතුපිටට ප්‍රවිෂ්ට ව ඇති පාෂණ උද්ගත පිහිටා තිබේ. සාහිත්‍ය මූලාශ්‍රයවල මෙම ගල්හින්න (Rock Bolder) හඳුන්වා ඇත්තේ **දිගු පහණ** හෝ **දීඝ පාෂාණ** වශයෙනි (මව. 15:203). උතුරු දකුණු දිශානුගත ව දිවෙන දීඝ පාෂාණයේ සිට කි.මී. 1 පමණ නැගෙනහිරට වන්නට මල්වතු ඔය (පුරාණ කොලොම්හොය) පිහිටා තිබේ. ගල්හින්නත් මල්වතු ඔයත් අතර පිහිටන නිම්න ප්‍රදේශය සශ්‍රීක භූමි ප්‍රදේශයක් වේ. මෙම නිම්නය තුළ වෙස්සගිරිය, ජේතවනය හා ඇතුළුපුරය ස්ථානගත වන අතර පොදුවේ මේ ක්ෂේත්‍රයන්හි ම මව් පාෂණය (Bed Rock) මතින් (RBE) Basal Gravel පාංශු කලාපය හඳුනාගත හැකි ය. මෙම පාංශු කලාපයේ පිහිටීම එම ක්ෂුද්‍ර ක්ෂේත්‍රවල දී උච්චාවචනය වීම දැකගත හැකි ය. එය එසේ වී ඇත්තේ යථෝක්ත භූ කලාපවල මව් පාෂාණයේ පිහිටීමේ විචල්‍යතාවය නිසා බව හරස්කඩ පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වේ. ඒ අනුව වෙස්සගිරියේ සිට අභයගිරිය දක්වා භූමියේ මව් පාෂාණයේ පිහිටීම මුහුදු මට්ටම් උස අනුව පහත වගුවේ දැක්වෙන විචල්‍යතාවයන්ගෙන් යුක්ත බව හඳුනාගත හැකි ය (බලන්න වගු අංක 5.1 හා සැලසුම් අංක 5.1)








සැලසුම් අංක 5.1
වෙස්සගිරියේ සිට අභයගිරිය දක්වා භූමියේ උතුරු දකුණු දිශානුගත ව මව් පාෂාණයේ මුහුදු මට්ටම් උස දැක්වෙන දළ හරස්කඩ සැලසුම

| මව් පාෂාණයේ පිහිටීම වෙස්සගිරිය | මව් පාෂාණයේ පිහිටීම ජේතවනය | මව් පාෂාණයේ පිහිටීම ඇතුළුපුර | මව් පාෂාණයේ පිහිටීම අභයගිරිය |
|---|---|---|---|
| 83.50 m | 72.55 m | 78.96 m | 87.32 m |

වගු අංක 5.1

වෙස්සගිරිය, ජේතවනය ඇතුළුපුරය අභයගිරිය යන ආංශු ක පුරාවිද්‍යා ස්ථානවල මව් පාෂාණයේ මුහුදු මට්ටම් උස දැක්වෙන වගුව
(මැන්දිස් 2008:73; මැන්දිස් 2003:18 ; *Deraniyagala 1992:Fig* 62තකුලතුංග 1998:55)

මව් පාෂාණයේ දැකගත හැකි විචල්‍යතාවයන්ට අනුව පැහැදිලි වන කාරණය වන්නේ අධ්‍යයනයට ලක් වන ආංශුක ක්ෂේත්‍රයන්හි මව් පාෂාණය කේන්ද්‍රයට දකුණු දෙසින් වඩාත් පහත් වීමට ලක් වී නැවත උච්ච වීමකට ලක්වෙමින් දකුණු දෙසට ගමන් කරන අතර කේන්ද්‍රයෙන් උතුරු දෙසට ගමන් කිරීමේ දී උච්චත්වයෙන් යුතු ව විහිදෙන ආකාරය හඳුනාගත හැකි ය. මව් පාෂාණයේ විචල්‍යතාවයන් එසේ වුව ද වෙස්සගිරිය, ජේතවනය හා ඇතුළුපුරය තුළ දි මව් පාෂාණය මතින් දැකගත හැකි RBE පස් සැකැස්ම තුළ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා

යුගයේ සංස්කෘතිය මුල් බැස තිබේ. මෙම සංස්කෘතිය යථෝක්ත ක්ෂුද්‍ර ක්ෂේත්‍රවල මුල් බැස ගැනීමේ දී එහි භූමියේ උස් ස්ථාන දෙකක් වන වෙස්සගිරිය හා ඇතුළුපුරයේ මෙන් ම ද්‍රෝණියක් සහිත ස්ථානයක් වන ජේතවනය ආශ්‍රිත ව ස්ථානගත ව තිබීම සැලකිය යුතු ය.

මෙම ක්ෂුද්‍ර ක්ෂේත්‍රයන්හි භෞතික පරිසර පද්ධති ගත්කළ මඳ වශයෙන් එකිනෙකට වෙනස් ස්වභාවයන්ගෙන් යුක්ත වේ. නමුත් ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතිය ක්‍රියාත්මක වීමට අවශ්‍ය කරන මූලික කාරණා මෙම ක්ෂුද්‍ර භෞතික පරිසරය තුළ පැවතීම එම සංස්කෘතිය ක්‍රියාත්මක වීමට බලපා තිබේ. මධ්‍ය ශිලා සංස්කෘතිය අවශ්‍යයෙන් ම ක්‍රියාත්මක වූයේ දඩයම් කිරීම, එල වැල නෙළා ගැනීම හා මසුන් ඇල්ලීම මත පදනම් වූ ආර්ථිකය තුළ ය. එය පුද පූජා කටයුතු සහ ලෙන් චිත්‍ර කලාව සඳහා සායම් වශයෙන් හෙමටයිට්, ලයිමොනයිට්, මොලිවුඩෙනම්, තලාතු මිනිරන්, මිනිරන්, නිල් මැටි හා පිඟන් මැටි වැනි යම් යම් ඛනිජමය වූ ගල් අමුද්‍රව්‍යය වශයෙන් භාවිතයට ගනු ලැබී ය. ජීවන රටාවට අදාළ මේ සියල්ල ක්‍රියාත්මක වූයේ ස්වභාවික පරිසරය තුළ ය (Deraniyagala 1994:706-805). මෙවන් පසුබිමක් සහිත මධ්‍ය ශිලා මානවයා පුරාණ අනුරාධපුර සිය ජනාවාස බිහිකිරීමේ උපයෝගීතාවය දෙස බැලීමේ දී ඒ ඒ ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ආශ්‍රිත ව එම ක්ෂේත්‍රවලට සුවිශේෂ වූ භෞතික පාරිසරික තත්ත්වයන් උපයෝගී වූ බව විශ්වාස කළ හැකි ය.

දිවයිනේ කලාපීය වෙනස්වීම් පිළිබඳ ව අනුක්‍රමය අදාළ පරිසර කලාපයන්හි පැවති තත්ත්වයන් තුළ පිළිඹිබු වේ. ඒ අනුව අනුරාධපුරය වියළි තැනිතලා පහත් බිම් කලාපයකට අයත් වේ (Fernando 1967 : 43-44). දැරණියගලගේ පරිසර වර්ග කිරීම්වලට අනුව අනුරාධපුරය B කලාපය (Zone B) නියෝජනය කරනු ලබයි (Deraniyagala 1992 :02:*map* 01). අධ්‍යයනයට ලක්වන වෙස්සගිරිය ක්ෂුද්‍ර ක්ෂේත්‍රය ගත් කළ එහි ස්වභාවික පරිසරය සැකසී ඇත්තේ ස්වභාවික ලෙන් පද්ධතියකින් සමන්විතව ය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මධ්‍ය ගල් යුගයේ මානවයාගේ වාසස්ථාන ස්වභාවික ලෙන් ආශ්‍රිත ව ක්‍රියාත්මක ව පැවතුන





ආකාරය බුලත්සිංහල ෆාහියන්ලෙන, කුරුවිට බටදොඹලෙන, කිතුලගල බෙලිලෙන, තෙළුල්ල අළුගල්ගේ සීගිරිය අසල අලිගල ආදී ස්ථාන ඇසුරෙන් හඳුනාගෙන තිබේ (එම :*map* 06,07).

වෙස්සගිරිය ආශ්‍රිත ව ස්වභාවික ගල්ගුහා 26 ක් පිහිටා තිබෙන අතර මෙම ස්වභාවික ගල්ගුහා මුල් ඓතිහාසික සමයේ දී කටාර කෙටීමකට ලක් වී තිබේ. නමුත් ආදිත ම අවධිවල දී මෙම ගල්ගුහා 26 තුළ ප්‍රාග් මානවයින්ට සිය ස්වභාවික වාසස්ථාන සකසා ගැනීමට හැකි බොහෝ ලෙන් පිහිටා තිබූ බව හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයේ මානවයා එලදායී යැපීම් ඒකකයක් වශයෙන් න්‍යෂ්ටික පවුල තෝරා ගෙන ඒ වටා ඒකරාශී වූ බව ජනාවාස දත්තයන්ගෙන් පැහැදිලි වන බව පර්යේෂණවලින් තහවුරු වී තිබේ (එම:351). පශ්චාත් චාතුර්ථික අවධියේ දී අඩු වශයෙන් වියළි කලාපයේ ස්වභාවික පරිසරය තුළ වඩාත් පැහැදිලි ජන රේඛනයේ විචලනයන් අනුව එහි ජනගහන ඝණත්වය වර්ග කිලෝමීටර් එකට 0.8 සිට 0.25 දක්වා වූ බව අනුමාන කර තිබේ (එම :412). මධ්‍ය ශිලා යුගයේ මානවයාගේ ජීවන රටාව දෙස බැලීමේ දී වාසස්ථාන අතර ස්වභාවික ගල්ගුහා කේන්ද්‍රීය වී ඇති බැවින්, වෙස්සගිරිය වැනි ස්වභාවික වාසස්ථාන සහිත භෞතික පරිසරයක් තුළ එම ජනාවාස බිහිවීමට බොහෝ සෙයින් සුදුසු වන්නට ඇත. දැනට පිළිගැනී ඇති ආකාරයට අනුරාධපුර ඇතුළුපුරයේ මධ්‍ය ශිලා සංස්කෘතියට අයත් රතු දුඹුරු බොරළු පාංශු කලාපයේ තිබී සෙ.මී. 4.5 , සෙ.මී.4.5-8 ප්‍රමාණවලින් යුත් ගල් ආයුධ වාර්තා වී තිබේ (එම :57). මෙම ප්‍රමාණවල ශිලා මෙවලම් අවි කුඩා (small), මධ්‍යම, (mediuam), විශාල (large) (එම 1992:196) වශයෙන් දැරණියගල වර්ග කර තිබේ. ඒවා අතර AG 69 කැණීම තුළින් ශිලා මෙවලම් 25 ක් වාර්තා වී තිබෙන බව ඔහු පෙන්වා දී තිබේ (එම:1972:57).

ශ්‍රී ලංකාවේ චාතුර්තික අවධියේ අවසන් කාලයේ ජීවත් වූ පොදුවේ බලන්ගොඩ මානවයා වශයෙන් හැඳින්වෙන මධ්‍ය ශිලා යුගයේ මිනිසා ශ්‍රී ලංකාවේ මහවැලි ඩෙල්ටා ප්‍රදේශයේ සහ යාපන අර්ධද්වීපයේ හැර අන් සෑම භූගෝලීය කලාපයක

ම ජීවත් වී ඇත. ඒ අනුව නිත්‍ය වශයෙන් එම යුගයේ මානව ජනාවාසයන් ප්‍රමාණයෙන් කුඩා වන අතර ඒවා වර්ග මීටර් 50 කට වඩා වැඩි වන්නේ ඉතා ම කලාතුරකිනි. මෙයින් හැඟී යන්නේ ක්ෂුද්‍ර ප්‍රදේශයක ජීවත් වූ පවුල් සංඛ්‍යාව ප්‍රමාණයෙන් සීමිත බව ය (එම 351). මොවුන්ගේ ජීවනෝපාය ක්‍රමය ශ්‍රී ලංකාවේ ජීවත් වන වැදි ජනයාටත් ඉන්දියාවේ කදාර් හා චෙන්චු වැනි ආදී වාසීන්ටත් අන්දමන් දූපත් වාසීන් හා මැලේසියාවේ සෙමැන් වැනි ආදී වාසීන්ගේ ජීවන ක්‍රමයත් අතර දැකගත හැකි සමානකම්වලින් යුක්ත ව තිබෙන්නට ඇතැයි දැරණියගල පෙන්වා දී තිබේ (එම :412,421,451- 457). ඒ අනුව ඇතුළුපුරයේ මෙන් ම වෙස්සගිරිය ක්ෂේත්‍ර තුළින් මධ්‍ය ශිලා අවධියට අයත් මානවයින් භාවිත කළ ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමුවීම අනුව සමාන සංස්කෘතීන්ට අදාළ ජනාවාස වෙස්සගිරිය හා ඇතුළුපුරයේ ක්‍රියාත්මක වනන්ට ඇතැයි උපකල්පනය කළ හැකි ය.


(1)


(2)


(3)


(4)






(5)

ඡායාරූප අංක 5.1
වෙස්සගිරියෙන් හමු වූ අමුද්‍රව්‍ය හා ශිලා මෙවලම්

01. කහඳ අමුද්‍රව්‍ය
02 හා 03 කහඳ පාෂාණයෙන් කරන ලද ශිලා මෙවලම්
04, 05 තිරුවාණා පාෂාණයෙන් කරන ලද ශිලා මෙවලම්

මධ්‍ය ශිලා යුගයේ දී වෙස්සගිරිය ආශ්‍රිත ව මානව වාසස්ථාන ඇතිවීම උදෙසා මානව ජීවිකාව පවත්වා ගෙන යාමට අවශ්‍ය ජලය මෙන් ම ආහාර සපයා ගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී තිබූ බව ද හඳුනාගැනීමට අවකාශ සැලසේ. වෙස්සගිරිය පරිසර පද්ධතියට අයත් එහි බටහිර පස ප්‍රදේශය තුළ උතුරු දකුණු දිශානුගත ව දිවෙන බඩවැටිය නිර්මාණය වී ඇත්තේ කෙටි පාෂාණ ඛණ්ඩයකිනි. මෙම පාෂාණ ඛණ්ඩයේ නිර්මාණය දෙස බැලීමේ දී එහි සිට බටහිර දෙසට වර්තමාන තිසා වැව වැව් තාවුල්ල තෙක් භූමියේ පිහිටීම උස් ව පිහිටා තිබේ. ඒ අනුව වැව් තාවුල්ලේ සිට නැගෙනහිර දෙසට බෑස්මක් (Slope) දැකගත හැකි අතර එම බෑස්ම බඩවැටිය දක්වා ම තිබෙන බව භූමිය අශ්‍රිත ව සිදු කරනු ලැබූ බිම් මැනුම්වල දී පැහැදිලි විය. බඩවැටිය නිර්මාණය වී ඇති කෙටි පාෂාණ ඛණ්ඩය නිසා ඊසාන දිග මෝසමින් හා අන්තර් මෝසම් සමයන් තුළ දී උතුරුමැද පළාතට ඇද හැලෙන අදික වර්ෂාව තුළින් මෙ වැනි ස්ථාන ආශ්‍රිත ව අහස් ජලය එකතු ව සෑදෙන ස්වභාවික භූ පතනයන් නිර්මාණය වීම සිදු වේ. එ වැනි භූ පතන ආශ්‍රිත ව ජලය එක් රැ

ස්වීම මඟින් ප්‍රාථමික දඩයම් ජීවිතයක් ගතකළ මානවයාට සිය ජල අවශ්‍යතා සපුරා ගැනීම මෙන් ම ජලය සොයා පැමිණෙන සතුන් දඩයම් කිරීම හා මත්ස්‍ය දඩයම් සිදු කිරිමට ද උපයෝගී වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.


මධ්‍ය ගල් යුගයේ ජීවත් වූ මානවයාගේ ජීවනෝපාය ක්‍රමය සකස් වී තිබුණේ දඩයම් කිරීම, එල වැල නෙලා ගැනීම හා මසුන් ඇල්ලීම මත පදනම් වූ ආර්ථිකයක් තුළ ය (Deraniyagala 1994 :206-805). ශ්‍රී ලංකාවේ විවිධ පරිසර පද්ධති අළලා දැනට සිදු කර ඇති ප්‍රාග් ඓතිහාසික පර්යේෂණයන්ට අනුව පෙන්වා දී ඇති කාරණයක් වන්නේ මෙම මානවයින් වාර්ෂික ව වෙනස් වන ආහාර චක්‍රයේ රිද්මය අනුව සතුන් දඩයම් කිරීම හා එල වැල රැ ස්කිරීම පදනම් කර ගෙන සංක්‍රමණික රටා අනුගමනය කරන්නට ඇති බව ය. පසුගිය දශක කිහිපය තුළ දී කැණීම් සිදු කරනු ලැබූ ගල් ගුහා ආශ්‍රිත ව හා එළිමහන් වාසස්ථාන තුළින් මනාව ආරක්ෂා වී තිබූ මධ්‍ය ශිලා යුගයේ මානවයා පරිභෝජනයට ගනු ලැබූ ශාක හා සත්ත්ව ආහාර හඳුනාගත හැකි වී තිබේ (එම 1992:451-456). මේ අනුව තෙත් හා වියළි පරිසර පද්ධත තුළ දී සිය ජීවනෝපාය ක්‍රමය භෞමික පරිසර මත පදනම වෙමින් මෙම මානවයා තෝරාගෙන ඇති බව පෙනේ. වෙස්සගිරිය වැනි ස්වභාවික පරිසරයක් තුළ දී ඔවුන්ගේ ජීවන රටාවට ක්‍රියාත්මක කිරීමට කැපීපෙනෙන ලෙස දීර්ඝ කාලයක් තිස්සේ කාලය හරහා වූ වෙනස්කම් ඔස්සේ ප්‍රාග් ඓතිහාසික මානව සාධකයේ භූමිකාව නිර්මාණය සඳහා වෙසස්ගිරිය පරිසර පද්ධතිය ස්වභාවික ව සැකසී තිබුණ බව පෙනේ. මෙම තත්ත්වයන් මත කේන්ද්‍රය හා පර්යන්තය අතර පුළුල් භූ දර්ශනය ප්‍රාග් ඓතිහාසික අවධිය තුළ දී එක් එක් ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ආශ්‍රිත ව පැවති ස්වභාවික පරිසරය මත පදනම වෙමින් න්‍යෂ්ටික පවුල පදනම් කරගත් කුඩා කුඩා කණ්ඩායම් වශයෙන් මෙම වාසස්ථානවල ජීවත් වනන්ට ඇතැයි පෙන්වාදිය හැකි ය.

කේන්ද්‍රය, මධ්‍ය ප්‍රදේශය හා පර්යන්තය අතර ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියේ භූ දර්ශනය සම්බන්ධ ව සාකච්ඡා කිරීමේ දී ඇතුළුපුරයට ඉතා ම ආසන්න ව පිහිටි ජේතවනය භූමිය





ද වැදගත් වේ. ජේතවන විහාරය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ JSMP 2002, JSWMP 2003, JSOWP 2003 යන පර්යේෂණ කැණීම්වල දී රතු දුඹුරු පාංශු කලාපය තුළින් ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියට අයත් ජ්‍යාමිතික ස්වරූපි ක්ෂුද්‍ර ශිලා මෙන් ම ක්ෂුද්‍ර ශිලා නොවන ගල් අවි වාර්තා වී තිබේ (මැන්දිස් 2009 :14). ඒ අනුව කේන්ද්‍රයට හාත්පස ප්‍රදේශය තුළින් ක්‍රියාත්මක ව තිබීම ද හමු වී ඇති ශිලා මෙවලම් ප්‍රමාණය 34 ක් පමණ වේ. ඒවා අතර විනිවිද පෙනෙන තිරුවානා, කහඳ හා හා දුම්පැහැ තිරුවානාවලින් නිර්මාණය කරනු ලැබූ ශිලා මෙවලම් වාර්තා වී තිබේ.



(1) (2) (3)

(4) (5) (6)

ඡායාරූප අංක 5.2
ජේතවනයෙන් හමු වූ අමුද්‍රව්‍ය හා ශිලා මෙවලම්
1. කිලෝ ග්‍රෑම් 12 ක් බරැති කහඳ පාෂාණ කුට්ටියක්
02 සිට 06 දක්වා කහඳ පාෂාණයෙන් නිර්මාණය කර ඇති ශිලා මෙවලම්



(7)



(8)



(9)



(10)



(11)



(12)



(13)



(14)

ඡායාරූප අංක 5.2
ජේතවනයෙන් හමු වූ අමුද්‍රව්‍ය හා ශිලා මෙවලම්
07 සිට 09 දක්වා කහඳ පාෂාණයෙන් නිර්මාණය කර ඇති ශිලා මෙවලම්
10 සිට 14 දක්වා තිරුවාණාවලින් නිර්මාණය කර ඇති ශිලා මෙවලම්

ඉහත විස්තර කර ඇති කැණීම්වලට අදාළ ව හමු වූ ශිලා මෙවලම්වලට අමතර ව 1982 - 1984 කාල වකවානු තුළ දී සිදු කරන ලද කැණීම් ආශ්‍රිත ව තිරුවානා හා කහඳවලින් නිෂ්පාදිත සීරුම් මෙවලම් (Scraper) හා තැළුම් මෙවලම් (well rounded small pebble), පතුරු (flake) ආදි ශිලා මෙවලම් හතක් වාර්තා වී තිබේ (Ratnayake 1984 :*fig* 34). එසේ ම ශිලා මෙවලම් නිෂ්පාදනයට භාවිත කරනු ලැබූ තිරුවානා හා කහඳ අමුද්‍රව්‍යය





ද සැළකිය යුතු ප්‍රමාණයක් ලැබී තිබේ. ඒ අතර කි.ග්‍රෑම් 12 ක බරින් යුත් කහඳ පාෂාණ කුට්ටිය (මැන්දිස් 2009 :14) අතිශයින් ම වැදගත් වේ.

කේන්ද්‍රය හා මධ්‍ය ප්‍රදේශ වන ජේතවන භූමියේ මධ්‍ය ශිලා යුගයේ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියක් ක්‍රියාත්මක වීමට බලපානු ලැබූ භෞතික පරිසර තත්ත්වය විමසීම ද ඉතා ම වැදගත් වේ. ඇතුළුපුර මව් පාෂණයේ පිහිටීම මීටර් 78.96 කින් යුත් මුහුදු මට්ටම උසකින් හා ජේතවන මව් පාෂාණයේ පිහිටීම මීටර් 72 .55 ක මුහුදු මට්ටම් උසකින් යුක්ත ය. ජේතවන භූමිය හා ඇතුළුපුරය සැසඳීමේ දී ඇතුළුපුරයට වඩා මීටර් 6.41 බැස්මකින් යුත් ද්‍රෝණියක ජේතවනය පිහිටා තිබේ. පැරණි නගර සීමාව තුළ මල්වතු ඔය නිම්නයේ මධ්‍ය ප්‍රදේශයේ පිහිටන ජේතවනයට ආසන්න ව අභයවැව ප්‍රදේශයේ භූ පතනය (hollow) නිර්මාණය වී තිබුණ බව මීට පෙර සාකච්ඡා කර ඇත. ස්වභාවික භූ පතනයක් අභය වැව ප්‍රදේශයේ නිර්මාණය වීම උදෙසා සෘජු ලෙස වෙස්සගිරියේ සිට අභයගිරිය දක්වා දිවෙන දීඝ පාෂාණය බලපා ඇත. මල්වතු ඔය හා මෙම භූ පතනය අතරමැදි ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික මානවයාගේ දඩයම් තිත්පොළ නිර්මාණයට බෙහෙවින් ම උපයෝගී වන භූමියක් වේ (Mendis 2006:70). ජේතවන භූමියේ ක්‍රියාත්මක වූ බව විශ්වාස කළ හැකි එළිමහන් ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන සඳහා අභයගිරියේ දීඝ පාෂාණය ආශ්‍රිත ස්වභාවික ගල් ලෙන් තුළින් මෙම මානවයින් වාසස්ථාන සකසා ගන්නට ඇති අතර පුළුල් නිම්න භූමිය තුළ එල වැල නෙළා ගැනීමට හා සත්ත්ව දඩයම සඳහා සුදුසු පරිසරය නිර්මාණය වීම තිබූ නිසා චාතුර්ථික අවධියේ අවසන් කාලයේ දී අනුරාධපුරය ඇසුරින් ක්‍රියාත්මක මධ්‍ය ශිලා යුගයේ ජනාවාස ඒවා ක්‍රියාත්මක ව ඇති වෙස්සගිරිය, ජේතවනය, ඇතුළුපුරය, අභයගිරිය වැනි ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ඇසුරින් මුල් බැස ගනු ලැබ ඇත්තේ සුවිශේෂ ස්වභාවික පරිසර පද්ධතිය නිසා බව පෙන්වාදිය හැකි ය.

### 5.1.1 ශිලා මෙවලම් වර්ගීකරණය

ජේතවන හා වෙස්සගිරිය ආංශුක පුරාවිද්‍යා ස්ථානවලින් හමු වූ ශිලා මෙවලම් පිළිබඳ වර්ගීකරණයට අදාළ විස්තරය පහතින් දැක්වේ. ශ්‍රී ලංකාවේ ශිලා මෙවලම් නිර්මාණයේ අතීතය පිළිබඳ ව විමසා බැලීමේ දී එය ප්‍රාග් ඓතිහාසික මධ්‍යය පුරා ශිලා අවධියේ (Middle Palaeolithic) සිට ආරම්භ ව ඇති බව පෙනේ. සිරාන් දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට අදින් අවුරුදු 125000 - 74000 අතර කාලයේ දී මෙම තාක්‍ෂණික සංස්කෘතික අවධිය නියෝජනය කරනු ලබන ශිලා මෙවලම් දකුණු ලංකාවේ බූන්දල, පතිරාජවෙල යන ස්ථානවලින් ලැබී තිබේ (Deraniyagala 1992 :431-432 ; *ibid* 2007: 3 - 4). ඉන් අනතුරු ව තාක්‍ෂණික වශයෙන් දියුණු කරන ලද ශිලා මෙවලම් ශ්‍රී ලංකාව තුළින් හඳුනාගත හැක්කේ මධ්‍ය ශිලා යුගය (Mesolithic) තුළිනි. එම යුගයේ දී බලංගොඩ මානවයා විසින් නිර්මාණය කරනු ලැබූ ජ්‍යාමිතික ස්වරූපී ක්‍ෂුද්‍රශිලා මෙමවලම් කුරුවිට බටදොඹ ලෙන ල බෙලි ලෙන ල ෆාහියන් ලෙන, දොරවක ලෙන ,අලිගල, අනුරාධපුරය ඇතුළු ලංකාවේ තවත් ස්ථාන රාශියකින් ලැබී තිබේ (Deraniyagala 1972 : 159 ; *ibid* 1992696- 702 ; ibid 2004 :6 -10 ; *ibid* 2007 : 45 - 62). ඒ අතරින් අනුරාධපුරය තුළින් මධ්‍ය ශිලා යුගයට අයත් ව ශිලා මෙවලම් හමුවන ස්ථාන වන්නේ ඇතුළුපුරය, ජේතවනය, වෙස්සගිරිය යන ස්ථානයන්ය. අනුරාධපුර ඇතුළුපුරයෙන් හමු වූ ශිලා මෙවලම් මධ්‍ය ශිලා යුගය නියෝජනය කරන බව සිරාන් දැරණියගල ප්‍රකාශ කර තිබේ (Deraniyagala 1972 :159 ibid 1992 :700). එම මෙවලම් අදින් අවුරුදු 5900 ක් පැරණි බව ද ඔහු ප්‍රකාශ කර තිබේ (*ibid* 1992 :740) අනුරාධපුර ඇතුළුපුරයට අමතර ව ජේතවන විහාරයේ ප්‍රාග් ජේතවන ජනාවාස ස්තර ආශ්‍රිත ව ද ශිලා මෙවලම් ලැබී තිබේ. ජේතවන ස්තූප සලපතර මළුවේ හා වැලි මළුවේ සිදු කරන ලද කැණීම්වල දී මෙම ශිලා මෙවලම් හමු වී තිබේ (මැන්දිස් 2008 :23- 37 ; එම. 2009 :13-25). එම ශිලා මෙවලම් අතර ක්‍ෂුද්‍රශිලා මෙවලම් (Microlithic Impliment) වන බැවින් ඒවා ඇතුළුපුරය හා සසඳන විට මධ්‍ය ශිලා යුගයට අයත් වන බව උපකල්පනය





කළ හැකි ය. මෙය ට අමතර ව වෙස්සගිරි විහාරය තුළ සිදු කරන ලද කැණීම්වලදී ද ක්‍ෂුද්‍ර ශිලා මෙවලම් ලැබී තිබේ (Mendis 2008 : 16- 20).

ඒ අනුව ජේතවන හා වෙස්සගිරියෙන් හමු වූ ශිලා මෙවලම්වලින් පැහැදිලි වන්නේ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියක් මෙම භූ කලාපවල ක්‍රියාත්මක වී ඇති බව ය. මෙසේ හමු වී ඇති ශිලා මෙවලම් ආශ්‍රය කර ගනිමින් මූලික වර්ගීකරණයක් සිදු කිරීම මෙම අධ්‍යයනයේ දී බලාපොරොත්තු වේ. මෙම අධ්‍යයනයේ දී ශිලා මෙවලම් වර්ගීකරණය සඳහා සිරාන් දැරනියගල හඳුන්වා දී ඇති වර්ගීකරණය උපයෝගී කර ගෙන ඊට අමතර ව ශිලා මෙවලම් නිර්මාණය සඳහා භාවිත තාක්‍ෂණය ද හඳුනාගනිමින් මෙම වර්ගීකරණය සිදු කර තිබෙන අතර අදාළ ශිලා මෙවලම්වල සැලසුමක් ද මෙහි දී දක්වා තිබේ.

### 5.1.2 වෙස්සගිරියෙන් වාර්තා වූ ශිලා මෙවලම් වර්ගීකරණය

ලි. ප. අංක 245 සෙ. මී. 4.5ක් දිග සෙ. මී. 3ක් පළල කහ පැහැති කහඳ පාෂාණයෙන් නිර්මිත ශිලා මෙවලමකි. එය නැවත හැඩ ගැස්වීම් කරන ලද මෙවලමක් වන අතර එහි ප්‍රහාර වේදිකාව (Striking platform) දක්නට ලැබේ. ඇතුළු පැත්තේ ප්‍රහාර බුබුල (Bulb of percussion), කැපුම් දාර (Lateral margins), නාරටි (Ridge) දක්නට ලැබේ. තාක්‍ෂණික වශයෙන් **හක්බෙලි පැල්මක** ලක්‍ෂණ සහිත (**Conchoidal Fracture**) ගල් පතුරකි. මෙම ශිලා මෙවලම භාවිත කළ බවට සලකුණු (Used Mark) දක්නට ලැබේ.

ලි. ප. අංක 248 අර්ධ චන්ද්‍රාකාර හැඩ Semi Lunette වර්ගයට අයත් සෙ. මී. 1. 5ක් දිග මි. මී. 8 ක් පළල විනිවිද පෙනෙන තිරුවානා වලින් (Clear Quartz) නිර්මිත ක්‍ෂුද්‍ර ශිලා මෙවලමකි. මෙහි මොට කරන ලද සලකුණු (Backing) දක්නට ලැබේ. නමුත් එය අසම්පූර්ණ ය. නිම කිරීමට අපොහොසත් වී ඇති මෙවලමකි. කැපුම් තලය තුළ භාවිත සලකුණු දක්නට ලැබේ. මෙය ඕස්ට්‍රේලියාවේ බොන්ඩායි ආයුධයකට සමානතා ඇති බව ද පෙනේ.

ලි. ප. අංක 241 රතු දුඹුරු පැහැ කහඳවලින් (Red Brown Cheart) නිර්මිත සෙ. මී. 5. 3ක් දිග සෙ. මී. 3.4 ක් පළල සම්පූර්ණ ගල් පතුරකි. එහි ප්‍රහාර වේදිකාව (Striking platform) දක්නට හැකි අතර ඇතුල් පැත්තේ ප්‍රහාර බුබුල හෙවත් බල්බ සළකුණු (Bulb of percussion), නාරටි වලින් (Ridge) යුක්ත ය. එහි ඇතුල් පැත්ත (Vental surface) හොඳින් දිස්වන අතර භාවිත නොකරන ලද පතුරකි පතුරේ අවසානය (Feather termination) දැකගත හැකි ය. කලින් ඉවත් කළ පතුරු දෙකක සලකුණු ද දක්නට ඇත. තාක්‍ෂණික වශයෙන් වංගු පැල්ම **Bending Fracture** සහිත ගල් පතුරකි. කැපුම් දාරයේ කඩතොළු දක්නට ඇති අතර ඒවා ප්‍රවාහනයේ දී සිදු වී ඇති ඒවා වශයෙන් හැඳිනගත හැකි ය මෙය කැපුම් උපකරණයක් (Cutter) වශයෙන් හඳුනාගත හැකි ය.

ලි. ප. අංක 294 සෙ. මී. 4 ක් දිග සෙ. මී. 3 ක් පළල Shouldred Semi Lunate වර්ගයට අයත් සම්පූර්ණ ගල් පතුරකි. භාවිත ලකුණු (Used Marks) හා බල්බ සළකුණු (Bulb of Percussion) දක්නට ලැබේ. නැවත හැඩ ගැසීම් සලකුණු දක්නට නොලැබේ. මොට කිරීම් (Backing) හඳුනාගත හැකි ය. Hexarian වර්ගයට අයත් මෙවලමකි. කොටස් හරස් අතට කැඩී ඇත. තාක්‍ෂණික වශයෙන් වංගු පැල්ම **Bending Fracture** ගල් පතුරක් වශයෙන් හඳුනාගත හැකි ය. මේ අනුව වෙස්සගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රය ඇසුරින් හඳුනාගත් ශිලා මෙවලම් VGHL Ex.02 කැණීමේ රතු දුඹුරු පාංශු කලාපයේ (Reddish Brown Earth) තිබී හමු වූ අතර එම ඉහතින් විස්තර කරන ලද ශිලා මෙවලම් එම තැන්පතුව තුළ තිබි හඳුනාගත් ශිලා පතුරු 6000ක් අතරින් තෝරාගත හැකි වීම ද විශේෂ ය.

### 5.1.3 ජේතවනයෙන් වාර්තා වී ඇති ශිලා මෙවලම් වර්ගීකරණය

ලි. ප. අංක 7545 සෙ. මී. 6.6ක් දිග සෙ. මී. 4.6ක් පළල ඈකකසච්ි වර්ගයට අයත් දුඹුරු පැහැ කහඳවලින් (Brown Cheart) නිර්මාණය කරන ලද සම්පූර්ණ ගල් ආයුධයකි. ප්‍රහාර වේදිකාව (Striking Platform) දක්නට ලැබෙන කෝණික හැඩයක් ගන්නා වංගු පැල්ම (Bending Fracture) වර්ගයට අයත් පතුරක් වේ.





ප්‍රහාර වේදිකාවට පහළින් ඉදිරියට තෙරපුමක් ලෙස බල්බ මුදුව (Ring Crack) දක්නට ලැබේ. උතුරු පැත්තේ කැපුම් තලය පීඩන ක්‍රමය උපයෝගී කර ගනිමින් පතුරු ඉවත් කිරීම සිදු කර ඇත. පිට පැත්තේ පිට පොතු (Cortex 25%)ක් පමණ දක්නට ලැබේ. කලින් ඉවත් කරන ලද පතුරු (Flake scar ridge) 6 ක් පමණ දක්නට ඇත. භාවිත සලකුණු මෙන් ම නැවත හැඩගස්වන ලද සලකුණු ද දක්නට ලැබේ. සීරුම් මෙවලමක් Scraper වර්ගයේ ආයුධයක් ලෙස භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

ලි. ප. අංක 27718 සෙ. මී. 1.8 ක් දිග මි. මී. 5ක් පළල දුඹුරු පැහැ කහඳවලින් (Brown Cheart) නිර්මිත එසජරද ඉක්ාැ න්‍යෂ්ටියකින් ලබාගත් පතුරකි. තල (Blade) වර්ගයට අයත් ආයුධයකි. පළල මෙන් දෙගුණයක් දිග වන අතර නාරටි (Ridge) තුනක් පිට පැත්තේ (Dosal Surface) හි දක්නට ලැබේ. එය කලින් ඉවත් කළ පතුරු 3කි. ඇතුල් පැත්ත (Vental Surface) **හක්බෙලි පැල්ම** (Conchoidael) ආකාරයෙන් දිස්වේ. තාක්‍ෂණික වශයෙන් Hexarian වර්ගයේ කැඩුණු ගල් ආයුධයකි. ප්‍රහාර බුබුල (Bulb Percussion) හා රැළි ලකුණු (Ripple Marks) හතරක් පමණ දක්නට ලැබේ. Fether Termination වර්ගයට අයත් ශිලා මෙවලමක් වේ.

ලි. ප. අංක 11081 දුඹුරු පැහැ කහඳවලින් (Brown Cheart) නිර්මිත සෙ. මී. 4.5 ක් දිග සෙ. මී. 3.1 ක් පළල Crescent වර්ගයේ සම්පූර්ණ ගල් පතුරකි. තාක්‍ෂණික වශයෙන් Bending Fracture වර්ගයට අයත් ධඩැරඡ්ජැ වර්ගය වේ. බාහිර පැත්තේ නාරටි (Ridge) සලකුණු හතරක් දක්නට ලැබේ. කලින් පතුරු ගැලවූ ලක්‍ෂණ හඳුනාගත හැකි ය. භාවිත සලකුණු දක්නට නොලැබේ.

ලි. ප. අංක 17876 Crescent වර්ගයට අයත් සෙ. මී. 3.8ක් දිග සෙ. මී. 2.5ක් පළල දුඹුරු පැහැ කහඳ (Brown Cheart) පාෂාණයෙන් නිර්මාණය කර ඇති සම්පූර්ණ ගල් පතුරකි. එහි මොට කිරීම් (Backing) දක්නට ඇත. වංගු පැල්ම Bending fracture වර්ගයට අයත් ශිලා මෙවලමක් වේ. Fether Termination වර්ගයට අයත් මෙහි පිට පැත්තේ නාරටි (Ridge) 8ක සලකුණු දක්නට ලැබේ. එම දාර කඩතොළු වී ඇත. අනෙක් පැත්තේ

පරණ කැඩීම් දක්නට ලැබේ. භාවිත සලකුණු (Used Markes) දක්නට නොලැබේ.

ලි. ප. අංක 6591 දුඹුරු පැහැ කහඳ පාෂාණයෙන් නිර්මිත සෙ. මී. 3.4ක් දිග සෙ. මී. 2.7 ක් පළල Hexarian වර්ගයට අයත් ගල් පතුරකි. ඇතුල් පැත්තේ (Vental Surface) හි බල්බය (Bulb of percussion) හරහා සිදු කරන ලද නැවත හැඩ ගැසීම් දක්නට ලැබේ. මුලින් තිබූ බල්බය ම කඩතොළු වී ඇත. බල්බයට පහළින් ඇති රැළි සලකුණු (Ripple marks) පැහැදිලි ව දක්නට ලැබේ. (Fether termination) වර්ගයට අයත් වේ. උඩු පැත්තේ පිට පොතු (Cotex) 20%ක් පමණ දක්නට ලැබේ. සෑම දාරයක් ම පීඩනය උපයෝගී කර ගෙන (Pressure flaking) ඉවත් කර ඇති බව පෙනේ. නැවත හැඩ ගැසීමක් කර ඇති නැවත භාවිත ශිලා මෙවලම් වශයෙන් හැඳින්විය හැකි වේ.

ලි. ප. අංක 8072 Elonguate semi - Lunate වර්ගයට අයත් සෙ. මී. 2.2ක් දිග මි. මී. .09 ක් පළල දුඹුරු පැහැ කහඳ (Brown Cheart) පාෂාණයෙන් නිර්මාණය කර ඇති තල (Blade) ආයුධයකි. ඇතුල් පැත්තේ ප්‍රහාර වේදිකාවට පහළින් ප්‍රහාර බුබුල (Bulb of percussion) ලක්ෂණ දක්නට ලැබේ. පහළින් රැළි ලකුණු (Repple marks) දක්නට ලැබෙන අතර Fether termination වර්ගයට අයත් වේ. කැඩී ගිය කොටස් පරණ ඉවත් කළ ඒවා ය. නාරටි (Ridges) තුනක් දක්නට ලැබෙන අතර ඒවායින් දෙකක විශාල ප්‍රමාණයේ පතුරු ඉවත් කර ඇත. අග කොටසේ පතුරක් ඉවත් කර ඇති අතර ප්‍රහාර වේදිකාවේ (Striking platform) Over Removel හැඩයක් ගන්නා හක්බෙලි පැල්මක ලක්ෂණ සහිත (ඍබජයදසාක රේජඑමරා) ශිලා මෙවලමකි.

ලි. ප. අංක 25404 Ellipse වර්ගයට අයත් දුඹුරු පැහැ කහඳවලින් (Brown Cheart) නිර්මාණය කර ඇති සෙ. මී. 3.1 ක් දිග සෙ. මී. 1.9ක් පළල අවසානය මදක් කැඩී ඇති ගල් ආයුධයකි. ඇතුල් පැත්තේ බල්බ සලකුණු (Bulb scar) දක්නට ලැබේ. පීඩන ක්‍රමය (Pressure flaking) ක්‍රමය උපයෝගී කර ගෙන පතුරු ඉවත් කර ඇත. පිට පැත්තේ පැහැදිලි ව පෙනෙන දාරයක් (Ridges) දක්නට ලැබේ. එයින් කලින් ඉවත් කළ පතුරේ සලකුණු දක්නට ලැබේ. දාරයේ භාවිත සලකුණු නිසා (Used marks) භාවිත ශිලා මෙවලමක් වශයෙන් හඳුනාගත හැකි ය.





ලි. ප. අංක 20646 Lunate - Segment වර්ගයට අයත් සෙ. මී. 2.6 ක් දිග සෙ. මී. 1.7 ක් පළල කහඳ පාෂාණයෙන් නිර්මිත අවසානය කැඩුණු ගල් පතුරකි. ඇතුල් පැත්ත කැඩී ඇත. Hexarian වර්ගයට අයත් වේ. මෙහි ද (Bulb of percuson) පැහැදිලි ව දක්නට ලැබේ.

අනු අංකය 756 - තිරුවානා/පළිඟු Bipolar Core එකකි. කැපුම් දාර නොමැති නිසා න්‍යෂ්ටි (Core tool) එකක් වශයෙන් සැලකේ. කැපුම් තලය මනාව සකස් කර ඇත.

ලි. ප. අංක 4065 B රතු දුඹුරු කහඳ (Red Brown Cheart) පාෂාණයෙන් නිර්මිත මෙම ශිලා මෙවලම (Equilateral - triangle) වර්ගයට අයත් වේ. සෙ. මී. 2.7ක් දිග සෙ. මී. 2.4ක් පළල හරස් අතට මෙන් ම දික් අතට කැඩුණු ගල් පතුරකි. ආරම්භයේ Surface එක නොමැත. පිට පැත්තේ නාරටි (Ridge) හයක් සලකුණු දක්නට ඇත. වංගු පැල්මක ලක්ෂණ (Bending Fracture) සහිත ශිලා මෙවලමකි.

ලි. ප. අංක 338 B කහ පැහැති කහඳවලින් (Yellow Cheart) නිර්මිත සෙ. මී. 3.2ක් දිග සෙ. මී. 1.9ක් පළල Semi - Lunette yevfha Hexarian වර්ගයට අයත් ගල් පතුරකි. ඇතුල් පැත්තේ බල්බය Bulb of Percussion (ප්‍රහාර බුබුල) දක්නට ලැබේ. Feather Termination වර්ගයට අයත් ය. පිට පැත්තේ නාරටි (Ridge) තුනක සලකුණු දක්නට ඇති අතර ඒවා කලින් ඉවත් කරගත් පතුරුවල දාර වේ. න්‍යෂ්ටියකින් ඉවත් කළ පතුරුක් වශයෙන් හඳුනාගත හැකි ය.

ලි. ප. අංක 2654 දුඹුරු පැහැ කහඳ (Brown Cheart) පාෂාණයෙන් නිර්මිත සෙ. මී. 2.6ක් දිග සෙ. මී. 2.1ක් පළල Ellipse හැඩ සම්පූර්ණ පතුරකි. වංගු පැල්මකට Bending fracture අයත් Hench termination වර්ගයට අයත් ය. ඇතුල් පැත්තේ රැළි සලකුණු (Ripple marks) දක්නට ලැබේ. පිට පැත්තේ නාරටි (Ridge) එකක් දක්නට ලැබේ. කැපුම් දාර නිරුපද්‍රිත ව ඇත. භාවිත සලකුණු (Used mark) දක්නට ලැබේ. විනිවිද පෙනෙන කහඳ පතුරක් වන අතර Used එදදක එකක් ලෙස හඳුනාගත හැකි ය.

ලි. ප. අංක 14904 Lunette - segment හැඩයේ කහ පැහැති කහඳ (Yellow Cheart) වලින් නිර්මිත සෙ. මී. 4.4ක් දිග සෙ.

මී. 2.9ක් පළල නැවත හැඩ ගසන ලද භාවිත ගල් ආයුධයකි. දාර දෙකෙන් එකක එක් පැත්තක නැවත සකස් කළ (Retouch) සලකුණු ඇත. තවත් පැත්තක Retouch සඳහා උත්සාහ දරා ඇත. කළින් ඉවත් කළ පතුරු කැබැල්ලකින් සකස් කළ එකක් වන අතර සම්පූර්ණ කර නැත. පිට පැත්තේ දාර සලකුණු ඇති අතර මෙය න්‍යෂ්ඨී (Core) වර්ගයේ ශිලා මෙවලමකි.

ලි. ප. අංක 27808 සෙ. මී. 3.7ක් දිග සෙ. මී. 2ක් පළල දුඹුරු පැහැ කහඳ (Brown Cheart) පාෂාණයෙන් නිර්මිත සම්පූර්ණ ගල් පතුරකි. භාවිත කර නැත. ඇතුල් පැත්තේ බල්බ සලකුණු (Buld of percussion) දක්නට ඇත. පිට පැත්තේ මද වශයෙන් පිට පොතු (Cotext) සලකුණු දක්නට ඇත.

ලි. ප. අංක 27818 විනිවිද පෙනෙන තිරුවානා (Clear Quartz) වලින් නිර්මිත සෙ. මී. 2ක් දිග සෙ. මී. 1.4ක් පළල Hexarian වර්ගයට අයත් ගල් පතුරකි. ඇතුල් පැත්තේ ප්‍රහාර බුබුල හෙවත් බල්බය සළකුණ (Bulb of percussion) දක්නට ඇත. නැවත සකස් කළ (Retuch) සලකුණු ඇති ගල් පතුරකි. නාරටි (Ridge) හතර කට වඩා ඇත. මෙය Micro blade Core ලෙස ඉවත් කළ පතුරක් වශයෙන් හඳුනාගත හැකි ය.

ලි. ප. අංක 23809 සෙ. මී. 2ක් දිග සෙ. මී. 1.1ක් පළල Crescent වර්ගයේ විනිවිද පෙනෙන තිරුවානාවලින් නිර්මිත හරස් අතට කැඩුණු ගල් පතුරකි (භාගයකි). භාවිත ලක්ෂණ දක්නට ලැබේ.

ලි. ප. අංක 29939 දුඹුරු පැහැ කහඳ (Brown Cheart) වර්ගයට අයත් සෙ. මී. 3ක් දිග සෙ. මී. 2ක් පළල Crescent වර්ගයේ සම්පූර්ණ ගල් පතුරකි. පිට පොතු (Cotex) සලකුණු දක්නට ලැබේ. මෙය න්‍යෂ්ඨියක (Core) මුල් පතුරක් ලෙස හඳුනාගත හැකි ය. නාරටි දෙකකින් ඉවත් කළ සලකුණු දක්නට ඇත. භාවිත සලකුණු (Used marks) ඇති නිසා භාවිත කරන ලද ශිලා මෙවලමක් ලෙස හඳුනාගත හැකි ය.

ලි. ප. අංක නොමැති කහ පැහැති කහඳ (Yellow Cheart) පාෂාණ වර්ගයට අයත් (Discoidal) වර්ගයට අයත් සෙ. මී. 2.8ක් දිග සෙ. මී. 2.7ක් පළල සම්පූර්ණ ගල් පතුරකි. වංගු පැල්ම Bending fracture සහිත ශිලා මෙවලමකි. පිටපැත්තේ සෑම දාරයක ම පතුරු ඉවත් කර ඇත. පිට දාර නැවත තැනීම





(Retouch) සළකුණු දක්නට ඇති අතර භාවිත සලකුණු (Used marks) දැකගත හැකි ය.

ලි. ප.අංක 26301 කහ පැහැති කහඳ (Yellow Cheart) වර්ගයට අයත් සෙ. මී. 3ක් දිග සෙ. මී. 1.6ක් පළල හරස් අතට කැඩුණු පතුරකි. ප්‍රහාර බුබුල (Bulb of percussion) දක්නට ලැබේ. පිට පැත්තේ (Dosal surface) දාරයක පිට පොතු (Cotex) සලකුණු 10%ක් පමණ ඇත. කලින් ඉවත් කළ පතුරු දෙකක සලකුණු තිබේ. නාරටි (Ridge) තුනක් හඳුනාගත හැකි නිසා භාවිත කරන ලද ශිලා මෙවලමකි.


ලි. ප. අංක නොමැති සෙ. මී. 2.4ක් දිග සෙ. මී. 1.4ක් පළල විනිවිද පෙනෙන තිරුවානා වලින් නිර්මිත Lunate - Segment වර්ගයට අයත් ශිලා මෙවලමකි. මෙම ශිලා මෙවලම නැවත හැඩ ගස්වන ලද සම්පූර්ණ ගල් පතුරකි. පිට දාර නැවත සැකසීම (Retouch) සලකුණු දක්නට ඇත. පිට පැත්තේ පිට පොතු (Cotext) 25%ක් පමණ ඇත. Micro blade වර්ගයට අයත් ශිලා මෙවලමකි. එහි ඇතුල් පැත්තේ (Vental surface) නාරටි සලකුණු (Ridge) තුනක් දක්නට ඇත. ඒවා කලින් න්‍යෂ්ටියෙන් ඉවත් කළ සලකුණු වේ.

ලි. ප. අංක නොමැති සෙ. මී. 1.4ක් දිග සෙ. මී. 1.2ක් පළල Lunate Segment වර්ගයට අයත් විනිවිද පෙනෙන තිරුවානා වලින් (Clear Quartz) නිර්මිත සම්පූර්ණ ගල් පතුරක් වේ. එහි පිට දාර නැවත සැකසීම සළකුණු (Retouch) සිදු කර ඇත. (Fether Termination) වර්ගයේ වංගු පැල්ම (Bending fracture) වර්ගයට අයත් ශිලා මෙවලමක් වේ.

ලි. ප. අංක නොමැති සෙ. මී. 4.7 ක් දිග සෙ. මී. 3.2ක් පළල දුම් පැහැ තිරුවානා (Smokey cheart) වලින් නිර්මිත සම්පූර්ණ ගල් පතුරකි. Retuch කර ඇත. Ferther termination වර්ගයට අයත් ය.

ලි. ප. අංක 27807 සෙ. මී. 1.9ක් දිග මී. මී. 5ක් පළල කහ පැහති කහඳ (Yellow Cheart) මෙවලමකි. දැරණියගලගේ වර්ග අංක 21 Elongate semi - Lunate වර්ගයට අයත් Micro blade න්‍යෂ්ටියකින් ලබාගත් පතුරකි. පළල මෙන් දෙගුණයක් දික් වන Concarian වර්ගයට අයත් කැඩුණු ගල් ආයුධයකි.


ඉහත විස්තර කරන ලද ශිලා මෙවලම් JSMP 2002, JSWMP 2003, JSOWP 2003 යන ජේතවන ස්තූපය ආශ්‍රිත පර්යේෂණ කැනීම්වලින් සොයා ගන්නා ලද ඒවා අතර යථෝක්ත භූමියේ පහළම පාංශු ස්තරවලින් වාර්තා වී ඇති ශිලා මෙවලම් ද වේ.





සැලසුම් අංක 5..1
වෙස්සගිරියෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්









සැලසුම් අංක 5.2
ජේතවනයෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්





සැලසුම් අංක 5.2
ජේතවනයෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්





සැලසුම් අංක 5.2
ජේතවනයෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්








සැලසුම් අංක 5.2
ජේතවනයෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්



සැලසුම් අංක 5.2
ජේතවනයෙන් හමු වූ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්හි සැලසුම්

## 5.2 පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීම

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධිය සම්භවන (හැඩගැසීමේ) යුගය වශයෙන් හැඳින්විය හැකි ය (Seneviratne 1996:265). මෙම සංස්කෘතික අවධිය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ මානව ආයතනවල ඉස්මතුවීම සම්බන්ධ ද්‍රව්‍යයාත්මක සංස්කෘතික තොරතුරු ප්‍රාග් ඓතිහාසික යුගය හා සසඳන විට සාපේක්ෂ වශයෙන් වැඩි ප්‍රමාණයක් හඳුනාගැනීමට හැකි ව තිබේ. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධිය සම්බන්ධ ව සාකච්ඡා කිරීමේ දී එම සංස්කෘතිය විවිධ කාල පරාසයන් තුළ ශ්‍රී ලංකාව පුරා ම ව්‍යාප්ත ව තිබූ බව විකිරණමාන දින නියම කිරීම් මඟින් ලබාගත් කාලානුක්‍රම තුළින් තහවුරු කර ඇත. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට මෙම තාක්ෂණික සංස්කෘතියේ ව්‍යාප්තිය උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ දිග, උත්තර මලය රට, බස්නාහිර මෙන් ම අග්නිදිග ශ්‍රී ලංකාව ආදී ප්‍රදේශ ඇසුරෙන් හඳුනාගත හැකි ය (Seneviratne 1984:237-265). සෙනෙවිරත්නගේ හා ජයරත්නගේ පර්යේෂණ තොරතුරුවලට අනුව මෙම සංස්කෘතියට අයත් ජනාවාස හා සුසාන ස්ථාන 44 ක් පමණ හඳුනාගෙන ඇත (Seneviratne and Jayaratne 2006:10). නමුත් රංජිත් දිසානායක සිදු කර තිබෙන නව අධ්‍යයන අනුව පූර්ව ඉතිහාසයට අයත් ජනාවාස හා සුසාන ස්ථාන 170 පමණ වන බව පෙන්වා දී ඇත (රංජිත් දිසානායක සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි) සෙනෙවිරත්න වැඩි දුරටත් විස්තර කර ඇති අකාරයට ශ්‍රී ලංකාව තුළින් හමුවන පූර්ව ඓතිහාසික අවධියට අයත් සුසාන වර්ග අතර urn /pot, pit with capstone, Cairn with tamules, Cairn circle extended , Cist with Capstone, Twin cist, Delmenoid cist වශයෙන් වර්ග කළ හැකි බව පෙන්වා දී තිබේ (Seneviratne 1984:265).

ශ්‍රී ලංකාවේ මුල් යකඩ යුගයට අයත් ජනාවාස ස්ථාන හා සුසාන ආශ්‍රිත ව සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණවලදී ඒවායේ දින වකවානු ලැබී ඇත්තේ මේ ආකාරයට ය.





| ස්ථානය | දින වකවානු | ආශ්‍රිත ග්‍රන්ථ |
|---|---|---|
| අනුරාධපුර | ක්‍රි.පූ.900 | (Deraniyagala 1992:709) |
| සීගිරිය අසළ අලිගල | ක්‍රි.පූ. 1000 | (Karunaratne and Adikari 1994:58) |
| ඉබ්බන්කටුව | ක්‍රි.පූ. 500-400 | (Bandaranayake and Kilian in Deraniyagala 1992:734) |
| රංචාමඩම | ක්‍රි.පූ.1359 | (Somadeva ; Ranjith Disanayake and Resa Fernando 2006:13) |
| පිංවැව ගල්සොහොන් කනත්ත | ක්‍රි.පූ. 112 | (Deraniayagala 2007:69) |
| කලටුවාව | ක්‍රි.පූ. 130 | (Deraniayagala 2007:69) |
| මාන්තායි | ක්‍රි.පූ. 200 | (Carswell and pricket 1984:62) |
| කන්තරෝදේ | ක්‍රි.පූ. 500 | (Deraniayagala 1993:356; Ragupathy 1987:181) |
| පහළ කිරිඳි ඔය නිම්නය (LKB 13) | ක්‍රි.පූ. 900 | (Somadeva 2006:100) |
| තිස්සමහාරාමය<br>තම්මැන්නාගොඩැල්ල | ක්‍රි.පූ. 360-290<br>ක්‍රි.පූ. 490 | (Weissar and Wijeyapala 2001 :279)<br>(Disanayaka: 2013) |
| කොක්එබේ | ක්‍රි.පූ. 790-540 | (Mendis at. el. 2016) |

පූර්ව ඓතිහාසික අවධියට අයත් සංස්කෘතිය ක්‍රි.පූ. 1200 කලක සිට දකුණු දිග ඉන්දියාවේ ස්ථානගත ව තිබූ බව දැනට සිදු කර ඇති පර්යේෂණ අනුව තහවුරු වේ (PÈshel 1990 in Deraniyagala 1992:734). නමුත් ආදිච්චනල්ලූර්හි 2005 වසරේ සිට සිදු කළ පර්යේෂණවල දී දකුණු ඉන්දියාවේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය ක්‍රි.පූ. 1800 දක්වා ඈතට දිව යන බව සොයාගෙන ඇත (www Archealogy online netartifactsironore. html. docx:1-8). මේ දක්වා විවිධ පර්යේෂණයකයන්


සිදු කර ඇති පර්යේෂණ තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය පුළුල් ඉන්දීය තාක්ෂණ සංස්කෘතික අවධියක ප්‍රභිව්ජින්න පැතිකඩක් බව ය. ඒ අනුව විවිධාකාර මෙගලතික සුසාන සංකීර්ණයන්ගේ විශේෂත්වය දෙස බැලීමේ දී ඒවා විවිධාකාර ප්‍රාදේශීය විෂමතාවයන්ගෙන් යුක්ත ව ගංගා නම් මීටියාවතේ සිට ශ්‍රී ලංකාව දක්වා ව්‍යාප්තව ඇති සංස්කෘතිකයක් බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala 1992 :734). ශ්‍රී ලංකාව ගත් විට දිගු කලක සිට විවිධ සංස්කෘතික ව්‍යාප්තීන්ට නතු ව ඇති භූමියක් නිසා ශ්‍රී ලංකාවේ මෙම යුගය සම්බන්ධ ව ඇති පුරාවිද්‍යාත්මක දත්ත අර්ථකථනය කළ යුත්තේ අර්ධද්වීපයේ මුල් යකඩ යුගය ආශ්‍රිත කරුණු සැලකිල්ලට ගෙන ය (එම).

අධ්‍යයනයට ලක් කරනු ලබන ප්‍රදේශය කේන්ද්‍රය, මධ්‍ය හා තදාශ්‍රිත ප්‍රදේශය වශයෙන් වෙන් කොට ඇත්තේ අනුරාධපුර පුරාණ නාගරික භූමියේ භූ දර්ශනයේ ව්‍යාප්තිය හඳුනාගැනීම උදෙසා ය. කේන්ද්‍රය හා පර්යන්තය අතර පුළුල් භූ දර්ශනයේ අවකාශ ගොඩනැඟීමේ දී අධ්‍යයන ප්‍රදේශයට පිටත පර්යන්ත ප්‍රදේශවල පැවති පූර්ව ඓතිහාසික අවධියේ සන්දර්භයන් සමඟ ද සාපේක්ෂ අධ්‍යනයන් සිදු කිරීම මඟින් තර්කානුකූල පිළිතුරක් ඒ සඳහා ලබාගැනීමට අවකාශ සැලසේ. පූර්ව ඓතිහාසික අවධියේ පුරාවිද්‍යාව හා ජීවනෝපාය ආශ්‍රිත පරිසරය වඩාත් සමීප වන්නේ වියළි හා ශුෂ්ක කලාපවලට ය. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ඛනිජ ආශ්‍රිත සිතියමක් අනුව මේ ප්‍රදේශවල පහසුවෙන් නිධිගත වී ඇති ඛනිජ වර්ග පුළුල් ව්‍යාප්තියක් දක්වන බව හඳුනාගත හැකි ය (Seneviratne 1995:15).


ජලය පස හා ඛනිජ සම්පත් පදනම් කර ගෙන උතුරු මැද පළාතේ වාස භූමි ඇතිකර ගන්නා පූර්ව ඓතිහාසික ජනතාව ප්‍රධාන වශයෙන් ම කලා ඔය, මල්වතු ඔය හා යාන් ඔය නිම්න ආශ්‍රය කර ගනිමින් ජනාවාස පිහිටුවා ගන්නා බව පැහැදිලි වේ. වියළි කලාපය හරහා ගලා බසින ප්‍රධාන ගංගා ආශ්‍රිත එහි පුළුල් නිම්න ප්‍රදේශය තුළ පූර්ව ඓතිහාසික අවධියට අයත් ජනාවාස හා සුසාන 40 කට වඩා වැඩි ප්‍රමාණයක් ස්ථානගත ව තිබීම සැළකිය යුතු ය (බලන්න සිතියම් අංක 5.1 හා 5.2).








සිතියම් අංක 5.2
ශ්‍රී ලංකාවේ හා උතුරු මැද පළාතේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස හා සුසානවල ස්ථානගත වීම දැක්වෙන සිතියම




සිතියම් අංක 5.2
උතුරු මැද පළාතේ පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාසවල ස්ථානගත වීම දැක්වෙන සිතියම





1. මාමඩුව
2. කරම්බන්කුලම
3. අනුරාධපුර ඇතුළුපුර
4. තම්මැන්නාගොඩැල්ල
5. වඩිගවැව
6. ගුරුගල්හින්න
7. කොක්එබේ
8. දිවුල්වැව
9. රබෑව (තිබ්රිවැව)
10. පරංගියාවාඩිය (නිකවැව)
11. මරදන්මඩුව
12. වාහල්කඩ
13. මාවතවැව
14. ගල්ඇදකටුව
15. මාච්චාගම
16. ඉබ්බන්කටුව
17. ගලේවෙල
18. දිගම්පතහ
19. වට්ටක්කාවාඩිය
20. රාජාංගනේ
21. කැලේගම
22. ආනකටාව
23. රොටවැව
24. බටුයාය
25. අලිගල
26. උනළුගල
27. කලවැල්ලාඋල්පත
28. සියබලාගස්වැව

මෙම ජනාවාස හා සුසානවල ව්‍යාප්තිය දෙස බැලීමේ දී අධ්‍යයනයට ලක් කරන ප්‍රදේශයට නැගෙනහිර පර්යන්ත ප්‍රදේශය ආශ්‍රයෙන් මෙම සංස්කෘතියේ වැඩි ව්‍යාප්තියක් පෙන්වන අතර උතුරු හා බටහිර කලාපවලින් අඩු ව්‍යාප්තියක් ගෙන හැර දක්වයි. ඒ අනුව කේන්ද්‍රයට පිටතින් නැගෙනහිර පර්යන්ත ප්‍රදේශයේ පිහිටන තම්මැන්නා ගොඩැල්ල, වඩිගවැව, කොක්එබේ, ගුරුගල්හින්න, දිවුල්වැව හා රබෑව පරංගියාවාඩිය, මරදන්මඩුව,වාහල්කඩ, මාවතවැව, ගල්ඇදකටුව ආදී ක්ෂුද්‍ර ක්ෂේත්‍රවල මෙම ජනතාව පොකුරක් ආකාරයට (Cluster) ස්ථානගත වීම සැළකිය යුතු කරුණකි. උතුරුමැද පළාත ආශ්‍රිත පූර්ව ඓතිහාසික අවධිය සම්බන්ධ වඩා පැරණිත ම සාධක ලැබෙන්නේ අනුරාධපුර ඇතුළුපුරයෙනි. එහි කාල නිර්ණ ක්‍රි.පූ. 900 දක්වා ඈතට ම දිවයයි (Deraniayagala 1992 :709). ඉන් පසු

කාලනීර්ණ ලැබෙන්නේ කොක්එබේ මෙගලිතික සුසානය තුළිනි එය ක්‍රි.පූ 800 වේ. එසේ නම් අනුරාධපුරය ඇසුරින් මුල් යකඩ යුගයේ ජනාවාසයක් ආරම්භ ව එය කේන්ද්‍රාභිසාරී ලෙස හෝ කේන්ද්‍රාපසාරී ලෙස ව්‍යාප්ත වෙමින් කේන්ද්‍රය වටා භූ දර්ශනය ව්‍යාප්ත කළා ද එසේ නොවන්නේ නම් පර්යන්තය සමඟ ඇති වූ තත්ත්වයන් මත භූ දර්ශනය කේන්ද්‍රාපසාරී ලෙස ව්‍යාප්ත කළා ද යන්න සාකච්ඡා කිරීමේ දී පර්යන්තයේ පිහිටි යාන් ඔය ආශ්‍රිත තොරතුරු සම්බන්ධ ව විමසීම වඩාත් කාලෝචිත ය. යාන් ඔය මධ්‍ය නිම්නය තුළ පූර්ව ඓතිහාසික අවධියේ ස්ථානගත ව ඇති ජනාවාසයන්හි සන්දර්භය පිළිබඳ ව විමසීමේ දී එම ජනපදවල ජීවී පරිසර පදනම පිළිබඳ ව සාකච්ඡා කිරීම මඟින් මේ සඳහා විමර්ශනාත්මක පිළිතුරක් ලබා ගත හැකි ය.

මධ්‍ය යාන් ඔය නිම්නය තීරණාත්මක වැදගත්කමකින් යුත් සම්පත් තිබුණු ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකි ය. අධ්‍යයනයට අදාළ ව සිදු කළ ක්ෂේත්‍ර විමර්ශන කටයුතුවල දී මෙම සාර්ව ප්‍රදේශය ආශ්‍රිත දැකගත හැකි පාරිසරික තත්ත්වයන්ට අනුව එහි පාරිසරික පදනම පූර්ව ඓතිහාසික ජනාවාස ස්ථානගත වීමට ඍජු ව බලපා ඇති බව පෙනේ. මධ්‍ය යාන් ඔය ආශ්‍රිත ප්‍රදේශය විජයානු සංකීර්ණයට හා උස්භූමි ශ්‍රේණියට අයත් අන්තර් භූ කලාපයේ පිහිටා තිබේ (Corray 1984:381). මෙම ප්‍රදේශවල භූ තලය මත වූ ප්‍රධාන පස් වර්ගය වනුයේ රතු දුඹුරු පස් සහ ඒවායේ දියබස්නා සබැඳියෝ ය (Reddish brown earths and their drainaige associates) (එම:292). විශේෂයෙන් ම මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත ව පූර්ව ඓතිහාසික අවධියේ පුළුල් පරිසරය සැකසී ඇත්තේ හුදෙකලා කඳු කිහිපයකින් යුතු සරු පස සහිත පරිසර පද්ධතියක් තුළ ය. මෙම හුදෙකලා කඳු ආශ්‍රිත පරිසර පද්ධතිය තුළ පූර්ව ඓතිහාසික ජනාවාස ගණනාවක් ස්ථානගත වන බව ගුරුගල්හින්න, තම්මැන්නාගොඩැල්ල, දිවුල්වැව, තිබ්බිරිවැව, වඩිගවැව, වළහාවිද්දවැව, පරංගියාවාඩිය, මරදන්මඩුව, මාවතවැව, වාහල්කඩ, ගල්ඇදකටුව ආශ්‍රිත ප්‍රදේශවලින් හඳුනාගත හැකි ය. හුදෙකලා කඳු ස්ථානගත වීම නිසා බොහෝ විට එම භූමිවල





සමෝච්ඡ විවිධත්වයක් නිර්මාණය වී තිබේ. භෞතික ලක්ෂණ අනුව මෙ වැනි ස්ථානවල ස්වභාවික භූ පතනයන් (Hollow) නිර්මාණයට එම සමෝච්ඡ විවිධත්වය උපයෝගී වේ. එම නිසා මෝසම් වර්ෂාව සක්‍රීය වීමෙන් ලැබෙන අහස් ජලය හා අන්තර් මෝසම් කාලවල දී ලැබෙන අහස් ජලය මඟින් මෙම ස්වභාවික භූ පතන ජලය රැස්වෙන ස්ථාන බව උපකල්පනය කළ හැකි ය. ප්‍රදේශයේ පහත් නිම්නය අශ්‍රිත ව යාන් ඔය ගලා බසින අතර එයට තරමක් උස් සරුබිම්වල මෙම හුදෙකලා කඳු ආශ්‍රය කර ගනිමින් පූර්ව ඓතිහාසික ජනාවාස ස්ථානගත වන්නේ මෙ වැනි භූ පතන හා සරු පස උපයෝගී කර ගනිමිනි (Seneviratne 1996 :285). මධ්‍ය යාන් ඔය නිම්නය තුළ පූර්ව ඓතිහාසික සුසාන බහුතරයක් මුල් බැස තිබෙනුයේ මෙ වැනි භූ පතන ලක්ෂණ ප්‍රදේශ ආශ්‍රිත ව බැවින් ජනාවාස ද එම ප්‍රදේශය ආසන්නයේ පවතින්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

මධ්‍ය යාන් ඔය නිම්නයේ පරිසර පද්ධතිය ආශ්‍රිත ජලයෙහි උපයෝගීතාවය දෙස බැලීමේ දී සෑම ක්ෂුද්‍ර ක්ෂේත්‍රයක් ආශ්‍රිත ව කුඩා ජලාශයක් (වැවක්) වර්තමානයේ ස්ථානගත ව තිබෙන බව හඳුනාගත හැකි ය. දැනට මෙම ප්‍රදේශය ආශ්‍රිත වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1000 - 1500 (අඟල් 75) ප්‍රමාණයක් ගන්නා බැවින් ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වියළි කාලගුණික තත්ත්වයන් බල පැවැත්වේ (Corray 1984:292). ඊසානදිග මෝසම් සක්‍රීය වීමෙන් හා අන්තර් මෝසම් සක්‍රීය වීමෙන් ලැබෙන අහස් ජලය තුළින් මෙමස්වභාවික භූ පතන හා කුඩා වාපි ජලයෙන් පිරී යයි. එ මඟින් ප්‍රදේශයේ වැසියන්ට ජලය පරිභෝජනය කිරීම මෙන් ම ජලය ආශ්‍රිත ව ඇති ජල සම්පත් පරිභේජනයට ද අවකාශ සැලෙස්.

මෙම නිම්න ප්‍රදේශය ආශ්‍රිත ව දැකගත හැකි පුළුල් භූමිය තුළ පුරාණයේ දී අනගි තණබිම් නිර්මාණය වි තිබූ බව කොක්එබෑ, ප්‍රදේශය ආශ්‍රිත ව අප සිදු කළ මූලික ක්ෂේත්‍ර ගවේෂණයේ දී හඳුනාගත හැකි විය. විල්ලු පරිසරය පූර්ව ඓතිහාසික ජනයාගේ එඬේර කටයුතු සඳහා මුල් වූ භූමි වේ. මුල් යකඩ යුගයේ ජනයා ගොවිතැන්, එඬේර කටයුතු හා සත්ත්ව දඩයම සිදු කළ

බව අනුරාධපුර ඇතුළුපුරයේ සිදු කරන ලද පූර්ව ඓතිහාසික මට්ටමේ පුරා සත්ත්වවිද්‍යා හා පුරා උද්භිදවිද්‍යා අධ්‍යයන මඟින් ඔප්පු වී තිබේ (Seneviratne and Chandaratne 1992 :12-16).

විශේෂයෙන් ම මධ්‍ය යාන් ඔය නිම්නයේ ඊසාන දිග මෝසම් වර්ෂාව සක්‍රීය වීමෙන් හේන් ගොවිතැන හා තෙත් ගොවිතැන ද වර්තමාන ජන සමාජය සිදු කරනු දැකගත හැකි ය. මුල් යකඩ යුගයේ දී හේන් ගොවිතැන (වියළි), තෙත් ගොවිතැන (මඩ) මෙම ප්‍රදේශයේ සිදු වන්නට ඇතැයි විශ්වාස කළ හැක්කේ තෙත් හා වියළි ගොවිතැනට සුදුසු පස් සැකැස්ම පුළුල් නිම්න ප්‍රදේශ ආශ්‍රිත ව පිහිටන බැවිනි. දියළු පස් (Aluvial soils) කෘෂිකාර්මික කටයුතුවලට යහපත් වන අතර යාන් ඔය නිම්න ප්‍රදේශය ආශ්‍රිත ව ද පිහිටා තිබීම (Cooray 1984 :293) මුල් යකඩ යුගයේ ජනතාවගේ ආකර්ෂණයට ග්‍රහණය වන්නට ඇත. ඒ අනුව මුල් යකඩ යුගයේ මධ්‍ය ප්‍රදේශය (කේන්ද්‍රය) හා පර්යන්තය ආශ්‍රිත වාස භූමිවල ජීවි පරිසර පදනම අනිවාර්යයෙන් ම කෘෂිකාර්මාන්තය, එඬේර කටයුතු හා දඩයම මුල්කරගත් ආර්ථිකයක් මත සැකසෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

කේන්ද්‍රයට නැගෙනහිර පර්යන්තය ආශ්‍රිත මුල් යකඩ යුගයේ පොකුරු ජනාවාස (Cluster Settlement) ඇතිවීම සඳහා පස හා ජලය පමණක් මුල් වූ බව විශ්වාස කළ නොහැකි ය. විශේෂයෙන් ම මධ්‍ය යාන් ඔය නිම්නයට ආසන්න ම භූ කලාප ආශ්‍රයෙන් ධනවත් ඛනිජ වර්ග හා පාෂාණවල පිහිටීම ද ඒ සඳහා බලපාන්නට ඇතැයි පෙන්වාදිය හැකි ය. ශ්‍රී ලංකාවේ මූලික වශයෙන් යකඩ භාවිත කළ යුගය හා සමාකාලීන ව තඹ ආශ්‍රිත ඛනිජ සම්පත් පරිහරණය කළ බවට සාක්ෂි ලැබී තිබේ (Seneviratne 1994 :16). ශ්‍රී ලංකාවේ සුවිශේෂ ලෙස තඹ නිධිගත වී ඇති ප්‍රදේශයක් ලෙස වර්තමාන සේරුවිල හඳුනාගෙන ඇත. 1971 ශ්‍රී ලංකා භූ සමීක්ෂණ දෙපොර්තමේන්තුව විසින් සේරුවිල කේන්ද්‍රගත වී ඇති ඛනිජ සම්පත් පිළිබඳ ව විද්‍යානුකූල අධ්‍යයනයන් මුල් වරට සිදු කරන ලදි (එම 1995:116). 1821 දී බ්‍රිතාන්‍ය ජාතික ඩේවි (Davy) විසින් මේ ප්‍රදේශයේ රාශිභූත ව පැවති මැග්නටයිට් යපස් (Magnatite ore), ටෙනන්ට්(Tenant) විසින් රසදිය (Mercary) පිළිබඳ ව සඳහන් කර





ඇත (එම). භූ විද්‍යා පර්යේෂණ අනුව සේරුවිල මැග්නටයිට් තඹ (Copper magnatite) නිධි සම්භවය ලබා ඇත්තේ නැගෙනහිර විජයානු සංකීර්ණය හා උස්භූමි ශ්‍රේණිය හමු වන්නා වූ අන්තර් භූ කලාපයේ ය (එම 1992:04). ත්‍රිකුණාමල ප්‍රදේශයේ සිට දකුණේ අම්බලන්තොට වෙරළ දක්වා වූ සැතපුම් 250 ක් දිගැති අන්තර් කලාපයේ සේරුවිල දී වඩාත් පොළොව මට්ටමට ප්‍රවිෂ්ට ව ඇති විපරිත පාෂාණ ඛණ්ඩය ඉතා ම ධනවත් ඛනිජ සම්පත්වලින් යුක්ත ය (එම). එහි තඹ (***Copper***), මැග්නටයිට් (***magnatite***), රිදී (***Silver***), බිස්මත් (***Bismath***), සින්ක් (***Zinc***), මයිකා (***Mica***), ක්‍රෝමියම් (***Cromiaum***), නිකල් (***Nickel***) යන වටිනා ඛනිජ ද්‍රව්‍යය ද ඉතා ගැඹුරු කොටස්වල රත්තරන් ද පිහිටා ඇත (එම). එසේ ම ප්‍රදේශය ආශ්‍රයෙන් පිහිටන පාෂාණ අතර චානොකයිට් නයිස් (Charnokite gneisses) තිරුවානා (Quartz) හා යකඩ ගල් ද (Iron nodules) පිහිටා තිබේ (Cooray 1984 :212; Seneviratne 1995 :116). භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සේරුවිල තඹ නිධිය ආශ්‍රිත ව සිදු කරණු ලැබූ පර්යේෂණවල දී එහි ටොන් මිලියන 7 ක මැග්නටයිට් තඹ මතුපිට පොළොව මට්ටමේ සිට අඩි 200 ක් පමණ ගැඹුරින් පිහිටා ඇති බව හඳුනාගෙන තිබේ (Seneviratne 1995 :117). ඛනිජ හා පාෂණ මුල් යකඩ යුගයේ ජනතාවගේ ජීවන පැවැත්මට අදාළ සම්පත් පරිභෝජන රටාවේ මූලික අංගයන් වී ඇත. එ බැවින් මධ්‍ය යාන් ඔය නිම්නය හා ඒ ආශ්‍රිත නැගෙනහිර සීමාව තුළ එ නම් කදිරවේලි ප්‍රදේශයෙන් ද මුල් යකඩ යුගයේ ජනාවාස ස්ථානගත වීම සඳහා මෙම ඛනිජ සම්පත්වල පිහිටීම ද ඍජු ව බලපා ඇති බව පෙනේ.

සේරුවිල පිහිටි භූ විෂමතාව අනුව පොළෙව මතුපිටින් ඉතා පහසුවෙන් තඹ ලබාගත හැකි ආකාරයට ඒවා නිධිගත වී ඇත. (එම :118). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන අකාරයට මහාවංසයේ තම්බපිට්ඨ යනුවෙන් සඳහන් වන්නේ මතුපිටට නෙරා ඇති තඹ නිධි බව පෙන්වා දී ඇත (එම). සේරුවිල ප්‍රදේශයෙන් ලැබෙන පුරාවිද්‍යාත්මක දත්ත අනුව එහි ජනාවාසය ක්‍රි.පූ අට වැනි සියවසට පෙර යුගයට දක්වා දිවයන බව විශ්වාස කෙරේ (Seneviratne 1992:04). විශේෂයෙන් ම අනුරාධපුර ඇතුළුපුරයේ

ක්‍රි.පූ. හය වැනි සියවසට පෙර ජනාවාසවලින් මූලික ලෙස ලෝහ භාවිත කළ බව හඳුනාගෙන ඇත (එම). ග්‍රාමීය සමාජ තමන්ට අවශ්‍ය තඹ අමුද්‍රව්‍යයක් වශයෙන් සේරුවිල ප්‍රදේශයෙන් ලබාගත් බව විශ්වාස කෙරේ (එම 1994:17). 1987 වර්ෂයේ දී අනුරාධපුර පූර්ව ඓතිහාසික අවධියට අයත් ලෝහ මෙවලම් ආශ්‍රිත ව සිදු කළ රසායනික හා සූක්ෂ්ම මූල ද්‍රව්‍යය විශ්ලේෂණයන්ට අනුව එම මෙවලම්වල අඩංගු ලෝහ සංයුතිය ඉතා ම සමීප වන්නේ සේරුවිල ලෝපස් නිධියේ සංයුතියට බව සොයාගෙන ඇත (එම 1995:123).

මෙම තත්ත්වය අනුව සේරුවිලින් මතුපිටින් ලබාගත හැකි තඹ පාරිශුද්ධ භාවයෙන් ඉතා උසස් නිසා පෞරාණික සමාජය ඒවා ඉතා වැදගත් කොට සළකනු ලැබ ඇත (එම 1994 :17). ඒ අනුව ක්‍රි.පූ. අට වැනි සියවසට පෙර සිට මෙම නිධිය ආශ්‍රිත ලෝහ සම්පත් භාවිත කළ බව හඳුනාගෙන තිබේ. ඒ අනුව ක්‍රි.පූ. අට වැනි සහ හත් වැනි සියවසට පෙර සිට නැගෙනහිර ප්‍රදේශය ආශ්‍රිත ව පදිංචි වන ජනයා ඒ සඳහා මූලය කරගන්නට ඇත්තේ සේරුවිල නිධියේ ලෝහ සම්පත් බව පැහැදිලි වේ. එම තත්ත්වයන් මත මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත පොකුරු ජනාවාස බිහිවීම අරුමයක් නොවන අතර, මෙම ප්‍රදේශය ආශ්‍රිත ලෝහ සම්පත් පරිභෝජන ක්‍රියාවලිය පූර්ව ඓතිහාසික අවධියේ සිට මුල් ඓතිහාසික හා මධ්‍ය ඓතිහාසික අවධිය දක්වා ම අඛණ්ඩ සිදු වූ ආකාරය සාහිත්‍ය මූලාශ්‍රය හා අභිලේඛන තොරතුරුවලින් ද හඳුනාගත හැකි ය.

අනුරාධපුර කේන්ද්‍රීය ප්‍රදේශය හා නැගෙනිර පර්යන්ත ප්‍රදේශ අතර පැවති සම්පත් අතර මැටි මෙවලම් නිෂ්පාදනයට අවශ්‍ය කරන්නා වූ මැටි වර්ග වන kaolinitemontmorillonite clay (building clay) ද ස්ථානගත ව තිබේ (Corray 1984 : 222). මෙම Kaolin වර්ගයට අයත් (Building Clay) වශයෙන් හඳුන්වන මැටි විශේෂය මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත ව හඳුනාගත හැකි ය. (එම : 224 *fig* 11-10) . ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියේ දී මැටි මෙවලම් නිෂ්පාදනයට හිමි වන්නේ වැදගත් තැනකි. විශේෂයෙන් ම සකපෝරුව උපයෝගී කර ගනිමින් විවිධ





හැඩයන්ට අනුව නිර්මාණය කරන ලද සුවිශේෂ මැටි මෙවලම් අතර කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW), රක්ත වර්ණ මැටි මෙවලම් (RW) හා කාල වර්ණ මැට මෙවලම් (BW) මෙම අවධියේ දී නිෂ්පාදනය කර ඇත (Seneviratne 1996:276-279). අනුරධපුරය හා ඊට ආසන්න ම පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව ස්ථානගත වන මැටි මෙවලම් නිෂ්පාදනයට අවැසි සම්පත්වල පිහිටීම අතින් මධ්‍ය යාන් ඔය නිම්නය පොහොසත් වන බව පෙන්වාදිය හැකි ය. වර්තමානයේ පවා මේ ප්‍රදේශය ඇසුරෙන් සාම්ප්‍රදායික ව පවත්වා ගෙන එන මැටි බඳුන් නිෂ්පාදන කටයුතු ප්‍රදේශයෙ ස්ථාන කිහිපයක පවත්වා ගෙන යනු දැකගත හැකි ය. මානවවංශ පුරාවිද්‍යා (Ethno Archaerology) අධ්‍යයනයක් ලෙස ඒ පිළිබඳ අවධානය යොමු කර මධ්‍ය යාන් ඔය නිම්න ප්‍රදේශයේ පිහිටි **කුඩා කැලෑගම** සාම්ප්‍රදායික මැටි මෙවලම් නිෂ්පාදන ග්‍රාමය ආශ්‍රිත ව සිදු කරන ලද ගවේශණය අනුව එම ශිල්පයේ අතීත තත්ත්වයන් පිළිබඳ අවබෝධක් ලබාගත හැකි ය. මෙම විමර්ශනය තුළින් මැටි භාජන නිපදවීමේ කුඹල් කර්මාන්තයේ ආදිතමයන් සොයා යන ගමනේ දී මානවවංස දත්ත අර්ථ නිරූපණය කිරීමේ දී කුඩා ජන කණ්ඩායම් හා ඔවුන්ගේ වටපිටාව නිරීක්ෂණය කිරීම ද බෙහෙවින් ම වැදගත් වේ. මානව විද්‍යාඥයින් පෙන්වාදෙන ආකාරයට ප්‍රාථමික ජන කණ්ඩායම් අරුත් ගැන්වීමේ දී ඔවුන් මහා සංස්කෘතියෙන් හුදෙකලා වී වෙන ම අනන්‍යතාවයක් පෙන්නුම් කරමින් ජීවත් වන කුඩා ජන කොට්ඨාසයක් වශයෙන් අර්ථ දක්වනු ලබයි කුඩා කණ්ඩායම් නිශ්චිත භූමි ප්‍රදේශයක වෙසෙමින් ඔවුන්ට ආවේණික භාෂාවක් ව්‍යවහාර කරමින් සංස්කෘතික සමජාතීත්වයෙන් යුතු ව ජීවත්වීම සුවිශේෂ ලක්‍ෂණයකි. (Chattopadhya 1978:01). ඒ අනුව කුඩා කැලෑගම ගත්කළ ද ඔවුන්ගේ ජීවන චර්යාව හුදෙකලා සමාජයකට සමග බද්ධ වී පවතී. භාෂාව, සිරිත් විරිත් ආදිය මහා සංස්කෘතියේ වෙනස් වන අතර ඔවුන් තමන්ට රිසි වෙනම අනන්‍යතාවයක් ගොඩනඟා ගනිමින් ජීවත් වේ. මධ්‍ය යාන් ඔය නිම්නය ඇසුරින් මෙම ජන කණ්ඩයම් නිෂ්පාදනය කරන මැටි මෙවලම් සාම්ප්‍රදායානුකූල තාක්‍ෂණික ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කිරීම කැපීපෙනේ.


කුඩා කැලෑගම කුඹල් කර්මාන්තයේ නියැලි කේ. සෝමපාල විසින් නිෂ්පාදනය කරන විවිධ මැටි බඳුන් වර්ග අතර කාල රක්ත වර්ණ මැටි මෙවලම් නිෂ්පාදනය සම්බන්ධ තාක්‍ෂණික අංශ කෙරෙහි ද ඔවුන් සතුව පාරම්පරික ඥානය පවතින බව ඔහු පළ කළ අදහස් අනුව තේරුම්ගත හැකි ය.[1] කාල රක්ත වර්ණ මැටි බඳුන් නිෂ්පාදනය සම්බන්ධ ඔහු විසින් පළ කරනු ලැබූ අදහස් අනුව එම බඳුන් ද්විත්ව වර්ණ ගැනීමට අභ්‍යන්තරයේ අර්ධ දහනයක් හා පිටත පූර්ණ දහනයක් සිදුවන බව විද්‍යාත්මක සිද්ධාන්තයකි. එම විද්‍යාත්මක සිද්ධාන්තය ඔවුන් ලබාගනු ලැබුවේ අත්දැකීමෙන් පාරම්පරික ඥාණය තුළිනි. කාල රක්ත වර්න මැටි බඳුන් මේ වන විට ඔවුන් නිර්මාණය නොකරන අතර ඒවා තනා ඇත්තේ මීට පෙර පරම්පරාවේ රා මදින්නන්ට, අච්චාරු, විනාකිරි හා කිරි මුදවන්නට බව ද ඔහු ප්‍රකාශ කරන ලදි. සෝමපාල දක්වන අදහස් අනුව එම බඳුන්වල තැන්පත් කරන ද්‍රව්‍යය නරක් නොවී දිගු කල් පවතින නිසා පැරණි ගැමි ගෙවල්වල එම බඳුන්වලට හොඳ ඉල්ලුමක් තිබූ බව ප්‍රකාශ කරන ලදි. මෙම තත්ත්වයන්ට අනුව ඉතා පැහැදිලි ලෙස මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත ව අදටත් නොනැසී පවතින සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තය අනාදිමත් කාලයක සිට එම ප්‍රදේශය ආශ්‍රයෙන් ක්‍රියාත්මක ව පවතින පාරම්පරික ශිල්පීය අංශයක් වශයෙන් හඳුනාගත හැකි ය. එ මඟින් පුරාණ ජනාවාස ව්‍යාප්තිය හා එ වැනි ප්‍රදේශවල පුරාණ ශිල්ප කටයුතු පිළිබඳ ව අධ්‍යයනයට ද මැනවින් ඉවහල් වන බව මානවවංශවිද්‍යා දෘෂ්ඨී කෝණයකින් බැලීමේ දී අවබෝධ කරගත හැකි ය. එය එසේ අදාළ කර ගැනීම වැදගත් වන්නේ ක්‍රි.පූ.950 න් පසු අනුරාධපුරායේ මැටි මෙවලම් භාවිත වූ බවට සාක්ෂි ලැබීම නිසා ය (Deraniyagala 1972:104 ; 1992:709). එසේ ම සාහිත්‍ය මූලාශ්‍රයන්හි ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ

1. ඇතුළත කළු හා පිටත රතු මැටි භාණ්ඩ (*BRW*) නර්මාණය කිරීමේ තාක්ෂණය පිලිබඳ සෝමපාල මෙසේ අදහස් පල කරන ලදි. ''මේ භාජන හදන්නේ අතින් ඒවගේ ම තමයි පුළුස්සන කොට බඳුනේ කට මට්ටමට එනකම් දහයියා පුරවපලා පෝරනේ අහුරන කොට මුනින් නමන්නේ නැති ව මීට මොලපු අතේ උස තියෙ-න්න ඇල කරලා රදවනවා ඊට පස්සේ ගින්දර තබන කොට ඇතුළෙ තියෙන දහ-යියාවලට හරියට හුළං ලැබෙන්නේ නැති නිසා බඳුන් හරිමැදට වෙනකම් ඇතුළත කළුපාට වෙනවා පිට පැත්ත හොඳට පිච්චුන නිසා රතුපාට වනවා මම පෝරෙ-න් ගහලා පෙන්නන්නම්''(සෝමපාල මහතා සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවකි 2009).





වන විට අනුරාධපුර නගරයේ දකුණු පස කුම්භකාර ග්‍රාමය ස්ථානගත ව තිබූ බව සඳහන් වේ. (*මව.*xv:200-205) සෝමපාල ප්‍රකාශ කරන පරිදි රජ දවස රජතුමා විසින් ඔවුන්ගේ සනුහරේ මී මුත්තන්ට නින්දගම් ලබාදුන් බව වයියා නැමැති මී මුත්තා ප්‍රකාශ කර තිබෙන බව සඳහන් කිරීම තළින් මධ්‍ය යාන් ඔය තුළ පවතින මෙම ශිල්ප කර්මාන්තයේ අතීතය පිළිබඳ ව හා සාර්ව සංස්කෘතික භූ දර්ශන අධ්‍යයනයට එය අදාකර ගත හැකි ය (බාලසූරිය 2001 /2002 19-25).



1 2 3

ඡායාරූප අංක 6.3
කුඩා කැලෑගම සාම්ප්‍රදායික මැටි මෙවලම් නිෂ්පාදනය කරන ශිල්පීන්ගේ නිෂ්පාදන ආශ්‍රිත ක්‍රියාවලිය දැක්වෙන ඡායාරූප
1. මැටි පදම් කිරීම
2. පත්තෙන් ගසා බඳුන සකස් කිරීම
3. පුළුස්සන ලද මැටි බඳුන්

කුඩාකැලෑගම, වටපිටාවේ දැකගත හැකි තවත් සාම්ප්‍රදායික ගම්මානයක් වන්නේ හිඹුටුගොල්ලෑවයි. හිඹුටුගොල්ලෑව ආශ්‍රිත ව සාම්ප්‍රදායික ලෝහ කාර්මික ශිල්පීන් විසූ බවට තොරතුරු වයස අවුරුදු 80 ක් ඉක් ම වූ ගැමියකු වන වන්නිහාමි ප්‍රකාශ කරයි. ඔහු හිඹටුගොල්ලෑවේ පැවති පැරණි සාම්ප්‍රදායික ලෝහ කාර්මික ශිල්පය පිළිබඳ ව අදහස් පළ කරන ලදි.[2]

2 '' ඕං ආයුබෝවන්ඩ හොඳ විශ්වාසෙට ගන්ඩ හිඹුටු ගොල්ලෑවේ රජමහා විහාරෙ ළඟ ඉදල මිනිත්තු 10 කින් කුඩා කැලෑගමට ගියැකි, මිනිට්ටුවක් යන්ඩ කලියෙන් ගල්වඩුවා ගමට යා හැකි තෝඩාමුවා තියෙන්නේ ගල්වඩුවාගම වැවේ ඉස්මත්තේ

මධ්‍ය යාන් ඔය ආශ්‍රිත ව තවමත් නොනැසී පවතින සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම අතර සත්ත්ව ගෘහකරණය ද විශේෂ වේ. සිවලාකුලම, නොච්චිකුල තෝඩාමඩුව හා වඩිගවැව ආශ්‍රිත ව **මරිකාරකම** (කුළුමීමන් මෙල්ල කරන්නන්) කරන සාම්ප්‍රදායික ගැමියන් ජීවත් වේ. ඒ අතර අවුරුදු 80 ක් ඉක් ම වූ ගැමියකු වන කේ.බී.හේරත්හාමි මේ සම්බන්ධ ව අපූරු අත්දැකීම් ඇති මිනිසෙකි. මෙම මිනිසුන් සාම්ප්‍රදායික ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර සත්ත්ව ගෘහකරණය සිදු කිරීම මඟින් පිළිබිඹු වන්නේ අතීතය සමඟ සම්බන්ධ වන මානවවංස කතා පුවතක් එයින් එළිදැක්වෙන බව ය. ශ්‍රී ලංකාවේ සත්ත්ව ගෘහකරණය සම්බන්ධ ආදිත ම සාධක අපට හමුවන්නේ පූර්ව ඓතිහාසික අවධියෙනි. අනුරාධපුරයේ සිදු කරන ලද පූර්ව ඓතිහාසික මට්ටමේ පුරා සත්ත්වවිද්‍යා අධ්‍යයන මඟින් මෙය මැනවින් ඔප්පු වී ඇත (Seneviratne and Chandraratne 1992:12-16). එම අවධියේ ඇතුළුපුරයේ ගෘහස්ථකරණය කරන ලද සතුන් අතර ගවයා සුවිශේෂ වී ඇත. මධ්‍ය යාන් ඔය නිම්නයේ වෙසෙන සාම්ප්‍රදායික මරිකරුවන් අදටත් ගවයා ගෘහකරණය කිරීම සිදු කරනු ලබයි. ගවයා ගෘහකරණය සඳහා කැලෑ වදින්නා මධ්‍ය යාන් ඔය ගැමියන් හඳුන්වන්නේ **මරිකරුවා** යනුවෙනි (හේරත්හාමි සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව 2009). මරිකරුවා යන්න ව්‍යවහාරයට පැමිණියේ කවදාදැයි ගැමියන් නොදන්නා අතර, එය පාරම්පරික ව පටබැඳුන නමක් බව ඔවුන් ප්‍රකාශ කරයි. හේරත්හාමිගේ අදහස්වලට අනුව මුව දෙනුන්ගේ පදම් කළ සමෙන් තනා ගන්නා **වරමද්ද** (තොණ්ඩුව) ගවයින් ඇල්ලීමට තනා ගන්නා උපකරණයකි. කුළු මීමාගේ පාදයට දමන මද්ද **පාමද්ද** වේ. **ඉස්මද්ද** යනු කුළුමීමාගේ අං තට්ටුවේ දමන තොණ්ඩුවයි. (බාලසූරිය 1999 ඵ 18 - 20) මරිකරුවා විසින් ගෝන අගක් එක් කොණක ගැට ගසා සකස් කරන වරමද්ද ගවයාට දැමූ පසු එම සතාට ගමන් කිරීමට හරි එසේ ගමන් කිරීමේ දී ගෝන දෙබල ගසක හෝ මුලක හිරවීම නිසා එතනින් එහාට ගමන් කිරීමට කුළුමීමාට නොහැකි වේ. එසේ සිටින කුළුමීමා අල්ලා ගැනීම සඳහා **දඩමීමා** නැමති

සිවලාකුලමට අල්ලපුගම. මෙහෙ ඉස්සර දුනු, ඊතල, කැති, පිහි, කඩු එහෙ ම හදපු කම්හල් කාරයෝ හිටියා මේ ගමේ සේරෝම ඉඩම් රජ්ජුවෝ දුන්නු නින්දගම් අත්ත මුත්තා කාලෙ ඉඳලා අපි මේ ගම්වල ඉන්නේ ඊයේ පෙරේදා වෙනකම් අපට ඕනෙ හැමදේ ම ගමේ හැදුවා වැඩි ඒවා කද බැඳගෙන ගමක් ගමක් ගානෙ ගෙනිච්චා (වන්නිහාමි සමඟ 2009 වසරේ සිදු කළ සාකච්ඡාවක් ඇසුරිනි).





කුළු හරක් මෙල්ල කිරීමට පුරුදු පුහුණු කළ මී ගවයකු යොදා ගන්නා මරිකරුවා උගේ යටි බඩ ප්‍රදේශයේ සැඟවී ගමන් කර කුළු හරකා දක්කාගෙන ගමට ගෙනවිත් හීලෑ කිරීම සිදු කරයි. එසේ හීලෑ කිරීමේ දී ඔවුන් භාවිත කරන විවිධ මන්ත්‍රාදිය තිබෙන අතර ඒවා ද්‍රවිඩ හෝ මලයාලම් භාෂාවෙන් නිර්මාණය වූ ඒවා බව ඔවුන් ප්‍රකාශ කරයි (එම). මෙම මන්ත්‍ර ඔවුන් මතක ශක්තියෙන් කටපාඩම් කර ගායනා කරන අතර මෙම සම්ප්‍රදායන් ආදි කාලීන සම්ප්‍රදායන් මඟින් පරම්පරාවෙන් ලැබුණු බව ඔවුන් ප්‍රකාශ කරයි. ඒ අනුව එම ජන සංස්කෘතිය ආශ්‍රිත සමාජය බොහෝවිට ඉතා ඈත අතීතයේ එම ප්‍රදේශයේ බිහි ව තිබූ ප්‍රාග් සංස්කෘතියකට අයත් වියහැකි බව මානවවංස විද්‍යාත්මක කරුණුවලට අනුව පෙන්වාදිය හැකි ය.

කේන්ද්‍රීය ප්‍රදේශයට දකුණින් පිහිටන පර්යන්ත ප්‍රදේශය ආශ්‍රිත භූ දර්ශනයේ අවකාශය ගොඩනැඟීම සඳහා ද භෞතික සංස්කෘතික තොරතුරු පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පූර්ව ඓතිහාසික සමයේ අනුරාධපුර පුළුල් භූ දර්ශනය පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි ය. කේන්ද්‍රයට දකුණු දිගින් පූර්ව ඓතිහාසික සංස්කෘතීන්ගේ සන්දර්භගත වීම ආශ්‍රිත භෞතික තොරතුරු වාර්තාවන ස්ථාන වශයෙන් ජේතවනය, වෙස්සගිරිය, තිරප්පනේ, සන්දනම්කුලම, කලවැල්ලා උල්පත ඉබ්බන්කට්ටුව, ගලේවෙල, කන්දලම හා රොටවැව ආශ්‍රිත ප්‍රදේශ පෙන්වාදිය හැකි ය (Bandaranayake) Kilian in Deraniyagala 1992 : 734 ; Seneviratne 1984: 257). මෙම ස්ථාන අතරින් විකිරණමාන දිනනිර්ණ ලබා දී ඇති ස්ථානයක් වන්නේ ඉබ්බන්කටුවයි. එම ස්ථාන සම්බන්ධ ව ලබාගෙන ඇති දින නියම කිරීම්වලට අනුව එම ප්‍රදේශයේ පූර්ව ඓතිහාසික සංස්කෘතික සන්දර්භගත වීම ක්‍රි. පූ. 700-400 කාලයේ සිදුවී ඇත (Seneviratne 1996 : 286 ; විතානාච්චි 2009:1-5).

වෙස්සගිරිය (පුරාණ ඉසුරුමුණිය) ආශ්‍රිත ව 2006 වර්ෂයේ දී සිදු කරනු ලැබූ ස්තර විද්‍යානුකූල පුරවිද්‍යා කැණීම්වලට අනුව VGHL Ex 02 කැණීම් අනුව 10 YR 6$12 Dark Brown පාංශු ස්තරය ආශ්‍රිත ව කාල රක්ත වර්ණ (BRW), මැටි මෙවලම් හා ලෝහ උණු කිරීමට භාවිත කරනු ලබන කෝව (Crucible) වාර්තාවී තිබේ. (මැන්දිස් 2008 ඵ 46 - 58). ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික

සංස්කෘතිය හඳුනාගැනීමේ මූලික ලක්ෂණයක් වන්නේ කාල රක්ත වර්ණ (BRW) මැටි මෙවලම් ය (Seneviratne 1996:278).

VGHL Ex 02 කැණීම් සාධක අනුව පූර්ව ඓතිහාසික සංස්කෘතික සන්දර්භයන් තුළින් හමුවන මැටි මෙවලම් විශේෂ වන අතර තැටි වර්ගයට අයත් පතුල සමතල ආකාර කාල රක්ත වර්ණ මැටි මෙවලම් හා පතුල අවතලාකාර කාල රක්ත වර්ණ මෙවලම් වැදගත් ය. මෙම තැටි වර්ගයට අයත් බඳුන් ඇතුළුපුරයේ බඳුන් සමඟ සාපේක්ෂ ලෙස සසඳා බැලීමේ දී වෙස්සගිරියෙන් හමු වී ඇති පතුල සමතල තැටි වර්ගයට අයත් මැටි මෙවලම් ඇතුළුපුරයේ 16 b ii වර්ගයට ද පතුල අවතලාකාර බඳුන් 16 a v වර්ගයට අයත් බව හඳුනාගත හැකි ය. (Deraniayagla 1972:*fig* 127). ඇතුළුපුරයේ 16 b ii කාලරක්ත වර්ණ මැටි බඳුන් වර්ගය ඉන්දීය බ්‍රහ්මගිරි ප්‍රදේශය ආශ්‍රයෙන් හමුවන මැටි මෙවලම් සමඟ සාපේක්ෂ වශයෙන් සමාන වන අතර දරණියගල පෙන්වා දී ඇත්තේ එහි උපරිම කාලය ක්‍රි.පූ. 800 අයත් බව ය. (එම : 111). එසේ ම වෙසස්ගිරියෙන් හමුන 16 a v වර්ගයට අයත් පතුළ අවතලාකාර හැඩ ගන්නා BRW තැටි වර්ගයට අයත් බඳුන් වර්ගයට සමාන තැටි වර්ගයේ බඳුන් ඇතුළුපුරය, අරිකමේඩු, හස්තිනාපූර්, මාස්කි, නාසික්, රූපාර් ආදී ලංකාවේ හා ඉන්දියාවේ පූර්ව ඓතිහාසික ස්ථාන ආශ්‍රිතව හමු වී තිබේ. මේ වර්ගයේ මැටි මෙවලම්වල උපරිම කාල සීමාව ක්‍රි.පූ 800-500 දක්වා කලයට අයත් බව දැරණියගල පෙන්වා දී ඇත (එම). මෙම මැටි මෙවලම් සාපේක්ෂ ලෙස අධ්‍යයනය කිරීමෙන් දක්ෂිණ තදාශ්‍රිත ප්‍රදේශය ආශ්‍රිත ක්ෂුද්‍ර ක්ෂේත්‍රයක් වූ වෙස්සගිරිය භූමියේ පූර්ව ඓතිහාසික සංස්කෘතික සන්දර්භගත වීම අවම වශයෙන් ක්‍රි.පූ. 800 - 500 කාලය අතරතුර සිදු වී ඇති බව ඇතුළුපුරය හා සාපේක්ෂ ලෙස විමර්ශනය කිරීමේ දී පෙන්වාදිය හැකි ය. මේ තත්ත්වය අප තේරුම්ගත යුත්තේ පූර්ව ඓතිහාසික භූ දර්ශනයේ අවකාශීය රටාවන් හා එහි සහසම්බන්ධතාවය කේන්ද්‍රීය භූ දර්ශනය හා සැසඳීමේ දී කැපීපෙනෙන ලෙස දීර්ඝ කාලයක් තිස්සේ කාලය හරහා වූ වෙනස්වීම් ඔස්සේ කේන්ද්‍රාභිසාරී ලෙස මානව සාධකයේ භූමිකාව මත සිදු වී තිබෙන ක්‍රියාවලියක් ලෙස ය.

විශේෂයෙන් ම මෙහි දී කේන්ද්‍රීය භූ දර්ශනය ආරම්භ වී හැඩ ගැසී වර්ධනය වීමත් සමඟ ඇතිවන්නා වූ තත්ත්වයන්





කරණකොට ගෙන කේන්ද්‍රීය ජනාවාසයේ ජන ප්‍රසාරණයන් ඔස්සේ ආකර්ෂණීය ක්ෂුද්‍ර ක්ෂේත්‍ර කරා ජනතාව ඇදී ඒම සිදු වේ. ජන රේඛනයේ ප්‍රසාරණය, සමාජ ආයෝජනය වර්ධනය, විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් සහිත ශිල්ප ශ්‍රේණිවල බිහිවීම සමඟ සමාජ ආයතන හැඩ ගැසීම නිසා ඇතිවන තත්ත්වයන් මත ප්‍රධාන ජනාවාසය ප්‍රසාරණයට ලක් වීම සිදුවේ. විශේෂයෙන් ම අනුරාධපුර ඇතුළුපුරයේ ක්‍රි.පූ. 700 - 600 කාලය වන විට මේ තත්ත්වය ඉස්මතු වීම එම ජනාවාසය හෙක්ටයාර 50 ක් දක්වා ව්‍යාප්ත වීමක් පෙන්නුම් කිරීමෙන් පැහැදිලි වේ (එම : 719). එ වැනි ප්‍රසාරණයන් පදනම් කර ගනිමින් කේන්ද්‍රය වටා එක්තරා ආකාරයට නව කුඩා පොකුරු ජනාවාස ස්ථානගතවීමක් සිදු වීමට ඉඩ තිබේ. මෙම නව ජනාවාස කේන්ද්‍රයෙන් පිටත ස්ථානගත වීම මඟින් සපයන්නා වූ ගාමක බලය කේන්ද්‍රීය ජනාවාසය ප්‍රධාන ජනාවාසය ලෙස ඉස්මතු වීමට බලපාන බව පෙන්වාදිය හැකි ය.

වෙස්සගිරිය ආශ්‍රිත පූර්ව ඓතිහාසික අවධියේ සංස්කෘතික සන්දර්භයන් පිළිබඳ විමර්ශනය කිරීමේ දී ක්ෂුද්‍ර පාරිසරික ක්ෂේත්‍ර ආශ්‍රිත ව පැවති භූ දර්ශනයේ රටාවන් හඳුනාගැනීමට ඉවහල් වේ. වෙස්සගිරිය පරිසර පද්ධතිය ගත්විට එහි ස්වභාවික පාෂාණ උද්ගතය නිසා බටහිර ඛණ්ඩයේ ස්වභාවික භූ පතනයක් නිර්මාණය වූවා මෙන් ම නැගෙනහිර පුළුල් නිම්න ප්‍රදේශය කෘෂිකර්මාන්තයට හා සත්ත්ව ගෘහකරණයට අවශ්‍ය පුළුල් භූමිය නිර්මාණය වී තිබූ ප්‍රදේශයක් විය. පූර්ව ඓතිහාසික සමයේ දී භූ පතනය මුල්කර ගනිමින් මූලික වැවක් නිර්මාණය වීමට ඇත. ඉබ්බන්කටුව ප්‍රදේශයේ ද මෙ වැනි ආකාරයට ඉදමොරළුව වැව ද පොම්පරිප්පුව ආසන්නයේ හා කෝඑබේ මෙන් ම දිවුල්වැව ආශ්‍රිතව ද මූලික වැව් ස්ථානගත ව තිබෙන බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne 1996 : 286). ඉබ්බන්කටුවේ පිහිටා ඇති ඉදමොරළුව වැව පුංචි දඹුල්ල කන්දෙන් ගලා එන වතුර රඳවා ගැනීම සඳහා පූර්ව ඓතිහාසික මිනිසුන් නිර්මාණය කරනු ලැබූ මූලික වැවක් බව සෙනෙවිරත්නගේ මතයයි (එම). වෙස්සගිරිය පරිසර පද්ධතිය තුළ ද වැව මෙන් ම වී ගොවිතැනට සුදුසු රතු දුඹුරු පස් (Cooray 1984 :292) ස්ථනගත වේ. රතු දුඹුරු පස ඵලදායක වන්නේ වාරි ජලය සැපයීම මඟින් හී හැමෙන් භූමි සැකසිය යුතු ගොවිතැන සඳහා ය. අදටත් මෙම ප්‍රදේශයේ

වාරි ජලය සපයන ගොවිතැන් කටයුතු වඩා ඵලදායක වී ඇති බැවින් පූර්ව ඓතිහාසික අවධියේ දී හා මුල් ක්‍රිස්තු යුගයේ දී වාරි ජලය සැපයූ කෘෂිකාර්මාන්තයට හිතකර පාරිසරික තත්ත්වයන් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

මෙම තත්ත්වයන්ව අනුව අනුරාධපුරයේ දකුණු දෙසට පූර්ව ඓතිහාසික සංස්කෘතික භූ දර්ශනයේ විහිදීම කේන්ද්‍රයේ සිට ජන රේඛනයේ ප්‍රසාරණය අනුව සිදු වන්නට ඇති අතර ඉන් තව තවත් දකුණු දිගට ක්‍රි.පූ. 700-400 සමය වන විට ගමන් කරන්නට ඇතැයි ඉබ්බන්කටුව වැනි ස්ථාන ඇසුරින් හඳුනාගෙන තිබීම තුළින් තහවුරු වේ (Bandaranayake and Kilian in Deraniyagala 1992 :734). ඉන් පසු ඉහළ කලා ඔය පද්ධතිය කේන්ද්‍රගත කර ගනිමින් ගලේවෙල, රොටවැව හා ආනෙකටාව, කන්දලම ආදී ප්‍රදේශවල පූර්ව ඓතිහාසික බඅවධියට අයත් ජනවාසවල ව්‍යාප්තිය සිදු වී තිබේ (Seneviratne and Jayaratne 2006 :1- 11; විතානච්චි 2009:1-5). කේන්ද්‍රයේ සිට පර්යන්තය දක්වා කේන්ද්‍රාභිසාරී ලෙස ගමන් කරන්නා වූ මේ තත්ත්වය සඳහා බහු සම්පත් යැපුම් රටාව බලපාන්නට ඇති බව විශ්වාස කළ හැකි ය (Seneviratne 1996 :286-289).

කේන්ද්‍රයට දකුණු දිග ප්‍රදේශයේ ප්‍රාග් ජේතවන ජනාවාස තුළින් මෙම බහු සම්පත් යැපුම් රටාවට අදාළ භෞතික තොරතුරු හඳුනාගත හැකි ය. (මැන්දිස් 2009:21).දේශීය හා විදේශීය ඛනිජ වර්ග ගණනාවක් අතරින් කානීලියන් හා ඇගේට්, ප්‍රාග් ජේතවන ජනාවාස තුළින් වාර්තා වී තිබේ. (එම). කානීලියන් සහ ඇගේට් යන ඛණිජ වර්ග අර්ධද්වීපික ඉන්දියාවේ නිරිතදිග හා බටහිර ප්‍රදේශවල සම්භවය ලබන ඛනිජ වේ. අමුද්‍රව්‍යය ලෙස අනුරාධපුරයට ආනයනය කර ඇති මෙම ඛනිජ ශිල්ප කටයුතු සඳහා අනුරාධපුරයේ දී භාවිත කර තිබේ (සෙනෙවිරත්න 1996:188-190). ජේතවනයෙන් හමුවන ඛනිජ ආශ්‍රිත ක්‍රියාවලිය නිමි භාණ්ඩ හා අමුද්‍රව්‍ය වශයෙන් හඳුනාගත හැකි අතර, එම අමුද්‍රව්‍යය බොහොමයක් පබළු නිෂ්පාදන කර්මාන්තයට යෙදාගෙන ඇති බව හඳුනාගත හැකි ය. (මල්කාන්ති 2008:14-18). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට ඉබ්බන්කටුවේ භූමදාන කුටිවල කානීලියන් පබළු විශාල ප්‍රමාණයක් වාර්තා වී තිබේ. මෙම පාෂාණය ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ආනයනයකර





උතුරුමැද තැනිතලා ප්‍රදේශවල දී පබළු බවට පරිවර්තනය කර ඉබ්බන්කටුව වැනි පූර්ව ඓතිහාසික ස්ථාන වෙතට පරිවහනය කොට තිබේ (Seneviratne 1996:290). ඒ බව අනුරාධපුර ඇතුළුපුර සිදු කරනු ලැබූ කැණීම්වල දී ක්‍රි.පූ. 500 පමණ කාලයට අයත් ස්තරවලින් කානීලියන් පබළු නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ කාර්මික ශේෂ ලැබීම මඟින් ද තහවුරු වී තිබේ (එම). කානීලියන් පාෂාණය භාවිත කර පබළු නිෂ්පාදනය පිළිබඳ සාධක ප්‍රාග් ජේතවන ජනාවාස ස්තර ආශ්‍රිත ව JSMP 2001,2002 JSWMP 2003,2004 හා JSP 2000 ආදී කැණීම් තුළින් හඳුනාගෙන ඇත. (මැන්දිස් 2009:21- 22) එම සාධකවලට අනුව කේන්ද්‍රයෙන් පිටත ප්‍රදේශ තුළ ද කානීලියන් පබළු නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වූ බව පැහැදිලි වේ.

අධ්‍යයන ප්‍රදේශයට අදාළ කේන්ද්‍රයෙන් දකුණු තදාශ්‍රිත ප්‍රදේශය එ නම් කඳුකර කලාපය ආශ්‍රිත ව පිහිටන්නා වූ පූර්ව ඓතිහාසික ජනාවාස ස්ථානගත වීම සිදු වී ඇත්තේ ඛනිජ සම්පත් ආකර්ෂණය ප්‍රමුඛ වූ නිසා බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න 1996:18). ඔහු විග්‍රහ කර ඇති ආකාරයට එය අදියර කිහිපයකින් සිදු වී තිබේ.

i. පළමු වැනි අවස්ථාව පහළ කඳුකර තැනිතලා ප්‍රදේශයෙන් ස්වභාවික සම්පත් ඍජු ව ලබාගැනීම.
ii. දෙ වැනි අවස්ථාව දඹුල්ල ආශ්‍රිත පහත් කඳුකර තැනිතලා ප්‍රදේශ සම්පත් හුවමාරු කර ගන්නා පුළුල් නිෂ්පාදන බෙදාහැරිම් සංකීර්ණයන් ලෙස ක්‍රියා කිරීම.
iii. තෙ වැනි අවස්ථාව ගම, නගර, මහාගාම හා මහා නගර වශයෙන් ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයට සම්පත් ලබාදීම (Seneviatne 1996:289-299)


මධ්‍යම කඳුකරය හා එහි උතුරු පහත් බිම් ආශ්‍රිත ව සිදු වූ මෙම ක්‍රියාවලිය හඳුනාගැනීමට උපකාරී වනුයේ 1980 දශකයේ අනුරාධපුර ඇතුළුපුරයේ ජනාවාස ආශ්‍රිත ව සිදු කරනු ලැබූ කැණීම්වලින් ලැබුණ භෞතික සංස්කෘතික තොරතුරු හා ඇතුළු පුරයට තදාශ්‍රිත ප්‍රදේශවලින් වාර්තා වන භෞතික සංස්කෘතික තොරතුරු ය. ඇතුළුපුරයේ ක්‍රි.පූ. 500 ට පසු ව ඇති ජනාවස ස්තරවලින් එයට පෙර පැවති යුගයට වඩා පුළුල් තේරීමක් ඇති

මැණික් ගල් වර්ග ද මැණික් කර්මාන්ත ආශ්‍රිත ශේෂ ද වාර්තා වී තිබේ. ඒ අතර ඇමතෙස්ත, කහඳ, රඹස්, චන්ද්‍රකාන්ත පාෂාණ, තිරුවානා ෆෙල්ඩ්ස්පාර්, තලාතු මිනිරන් හා තඹ වැනි ඛනිජ වර්ග ඉබ්බන්කටුව ආශ්‍රිත ව වාර්තාවී ඇත. එ මඟින් මාතලේ කඳුවල සිට පහත් තැනිතලා ප්‍රදේශවලට එම සම්පත් ඇදී ආ ආකාරය හඳුනාගත හැකි ය (එම :288-291). මෙම තත්ත්වයන් ප්‍රාග් ජේතවනය ස්තර ආශ්‍රයෙන් ද හඳුනාගෙන ඇත. එම ස්තරවලින් වාර්තා වී ඇති රඹස්, ඇමතෙස්ත, ෆෙල්ඩ්ස්ෆාර්, චන්ද්‍රකාන්ත පාෂාණ , විනිවිද පෙනෙන තිරුවාණා, රෝස තිරුවානා, දුම්පැහැ තිරුවානා, කහඳ, හුණුගල් හා මාබල් ආදී ඛනිජ පාෂාණ (Seneviratne 2009:1-67). ලැබීම මඟින් කඳුකර කලාප ආශ්‍රිත ගනුදෙනු ක්‍රියාවලිය ප්‍රාග් ජේතවන අවධියේ දී සිදු වූ බවට සාධක සපයයි.


මෙම කරුණු මඟින් පිළිඹිබු වන්නේ කඳුකර කලාපය හා අනුරාධපුරය අතර පැවති පූර්ව ඓතිහාසික ජනාවාස අතර ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ ව්‍යවසාය ක්‍රමයෙන් සංකීර්ණ වී ඇති බවත් මෙ වැනි ද්‍රව්‍යයමය කරුණුවලට අනුව අනුරාධපුර පුළුල් භූ දර්ශනය ගොඩනැඟීමේ දී එහි අවකාශීය තත්ත්වයන් වඩා සාර්ව ආකාරයට නැගෙනහිර පර්යන්ත ප්‍රදේශයවන මධ්‍ය යාන් ඔය නිම්නය හා කේන්ද්‍රය වූ අනුරාධපුර ඇතුළුපුර අතරත් ඉන්පසු අනුරාධපුරයේ සිට කඳුකර කලාපය දක්වා ක්‍රි.පූ. 900 සිට ක්‍රි.පූ. 400 දක්වා කාල පරාසයක් තුළ විචලනය වීමක් කේන්ද්‍රාභිසාරී ලෙස හඳුනාගත හැකි ය.










රූප සටහන් අංක 5.1
පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුරයට ගාම, අන්තර් නගර, නිගම සහ මහ නගර අතර සිදු වූ අන්තර් සම්පත් හුවමාරුව දැක්වෙන රූප සටහන




රූප සටහන් අංක 5.2
ක්‍රි.පූ.900-600 කාලයේ පූර්ව ඓතිහාසික ජනාවාස උතුරුමැද කලාපයේ ස්ථානගතවීම හා සම්පත් හුවමාරු කර ගැනීමේ රටාව




රූප සටහන් අංක 5.3
ක්‍රි.පූ.400-300 අතර කාලයේ පූර්ව ඓතිහාසික ජනාවස උතුරුමැද පහත් වියළි තැනිතලාවල සිට ඉහළ කඳුකර කලාපය දක්වා විචලනය වීම හ සම්පත් හුවමාරුව




රූප සටහන් අංක 5.4
ක්‍රි.පූ.600-400 කාලයේ පූර්ව ඓතිහාසික ජනාවාස උතුරුමැද පහත් වියළි තැනිතලාවල පහළ කඳුකර කලාපයට විචලනය හා සම්පත් හුවමාරුව
*(Seneviratne 1996 fig 06)*





## 5.3 මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීම

අනුරාධපුර යුගකරණය අනුව මුල් ඓතිහාසික අවධිය (Early historic Period) ක්‍රි.පූ. 250 - ක්‍රි.ව. 100 අතර කාලයට අයත් වේ(ඤැර්බසන්ට්ක් 1992 : 712). නමුත් පොදුවේ ගත්කළ ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 100 අතර කාල පරාසයට ලෙස පිළිගනු ලබයි (Seneviratne 1996:279). මෙම අවධිය සම්බන්ධ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීමේ දී ඒ හා සම්බන්ධ සමාජ පුරාවිද්‍යාව (Social Archaeology) බෙහෙවින් ම වැදගත් වේ. මුල් ඓතිහාසික අවධියේ දී අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ මෙන් ම පර්යන්ත ප්‍රදේශය තුළ ඇති වූ සමාජ පසුබිම හඳුනාගැනීමේ දී එම සමාජ සැකැස්ම දේශපාලන, සමාජ, ආගමික, ආර්ථික යන ආයතන තුළින් හඳුනාගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය සම්බන්ධ සමාජ පුරාවිද්‍යා අධ්‍යයන සිදු කර ඇති පූර්ව පර්යේෂකයන් එම අධ්‍යයන සඳහා අභිලේඛන පාර්ශවය කෙරෙහි නැඹුරුතාවකින් මෙන් ම අභිලේඛන හා පුරාවිද්‍යාත්මක පාර්ශවය කෙරෙහි නැඹුරුතාවයක් සහිත ව අධ්‍යයන සිදු කර ඇති බව පෙනේ. එම විද්වතුන් අතර සෙනරත් පරණවිතාන, ඩී.එම්. නිකලස්, හේම එල්ලාවල, එස්.කේ.සිත්‍රම්පලම්, ලක්ෂ්මන් එස් පෙරේරා, ආර්.මහින්ද කරුණානායක, සුදර්ශන් සෙනෙවිරත්න,මාලනී ඩයස්. රාජ් සෝමදේව යන වියත්හු ප්‍රමුඛ වේ. ඔවුන්ගේ අධ්‍යයනයන් තුළින් ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධියේ දී සමාජ නායකත්වය, පාලන සංවිධාන, සම්පත් පරිහරණය, විශේෂ ප්‍රාගුණ්‍යතාවය, වාණිජ කටයුතු ආදී වූ විවිධ විෂය පරාස දක්වා ජන සමාජයේ විහිදීම හඳුනාගෙන තිබීම අතිශයින් ම වැදගත් වේ.

මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය, අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රයෙන් පමණක් ලැබෙන්නා වූ දත්ත පදනම් කර ගෙන සාකච්ඡා කිරීම ප්‍රමාණවත් නොවේ. එම නිසා අධ්‍යයන ප්‍රදේශයෙන් පිටත පර්යන්තය ප්‍රදේශය ඇසුරින්

විශේෂයෙන් ම උතුරු මැද පළාත ආශ්‍රයෙන් පවතින අභිලේඛන තොරතුරු උපයෝගී කර ගැනීම තුළින් අනුරාධපුරයේ පුළුල් භූ දර්ශනයේ අවකාශය වඩා සාර්ථක ලෙස ගොඩනගා ගත හැකි ය. මූලික ලෙස මුල් ඓතිහාසික සමයේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ ව සාකච්ඡා කිරීම තුළින් එවකට පැවති සමාජ සැකැස්ම, හා ඔවුන්ගේ කාර්ය භාරය පිළිබඳ ව වැදගත් තොරතුරු සමුදායක් ග්‍රහණය කර ගැනීමට අවකාශ සැලසේ. ඒ අතරින් ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය සාහිත්‍ය ලේඛනවල අඩංගු නොවන ගමණි, ගමික, පරුමක, ගහපති, බත, බරත, අශ/අය ආදී විවිධ පදවි නාම දැරූ ජන කණ්ඩායම් ද විවිධ ශිල්ප කටයුතුවල දී විශේෂ ප්‍රාගුණ්‍යතාවය දැක් වූ ජන කණ්ඩයාම් පිළිබඳ ව පූර්ව බ්‍රාහ්මී අභිලේඛනවල කරුණු අන්තර්ගත බව පරණවිතාන හා ලක්ෂ්මන් පෙරේරා විසින් සඳහන් කර ඇත.(*Ic*. Vol. i xvi – cxxix; Perera 1962:241-248 ).

බ්‍රාහ්මී අභිලේඛනවල ස්ථානගතවීම සිතියමක් ආශ්‍රයෙන් විමර්ශනය කළහොත් දළ වශයෙන් 1298 ක් ශ්‍රී ලංකාවේ පවතින බව හඳුනාගෙන තිබේ (*Ic*. Vol. i xvi - 1970). එම ලිපි ප්‍රමාණය පළාත් අනුව වර්ග කිරීමේ දී උතුරුමැද පළාත තුළින් මුල් බ්‍රාහ්මී ලිපි 402 ක් පවතින බව හඳුනාගත හැකි ය (එම 1-25, 79-93). උතුරුමැද පළාතේ අනුරාධපුරය දිස්ත්‍රික්කය ගත්කළ පවතින ලිපි ප්‍රමාණය දළ වශයෙන් 335 වේ (එම). ශ්‍රී ලංකාවේ පළාත් අනුව මුල් බ්‍රාහ්මී ලිපි ගණනය කළහොත් උතුරුමැද පළාතේ වැඩි ම ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකි ය. (බලන්න වගු අංක 5.2)

| පළාත | අභිලේඛන ප්‍රමාණය |
|---|---|
| උතුරුමැද | 402 |
| උතුර | 56 |
| නැගෙනහිර | 202 |
| දකුණ | 163 |
| ඌව | 63 |
| සබරගමුව | 44 |
| මධ්‍යම | 84 |
| වයඹ | 278 |
| බස්නාහිර | 05 |
| එකතුව | 1298 |





වගු අංක 5.2
පළාත් අනුව පූර්ව බ්‍රාහ්මී ලිපිවල ස්ථානගත වීම
(*Ic*. Vol. i:1970)

මුල් බ්‍රාහ්මී ලිපි ආශ්‍රිත පළාත් වර්ගීකරණය අනුව පූර්ව ඓතිහාසික අවධියේ ජන කණ්ඩායම් සඳහා උතුරුමැද පළාත ආකර්ශනය වූවා මෙන් ම මුල් ඓතිහාසික අවධිය තුළ දී ද උතුරුමැද පළාත ආකර්ශනය වී ඇති බව පැහැදිලි වේ. පූර්ව බ්‍රාහ්මී ලිපි 402 ක් උතුරුමැද පළාත තුළ ස්ථානගත වුවද අධ්‍යයනයට ලක් කරනු ලැබූ පුරාණ අනුරාධපුර නාගරික ව්‍යුහයට අදාළ ව අරය කි.මී. 5 ක වර්ග කිලෝ මීටර් 40 ක භූමි කලාපය තුළින් හඳුනාගත හැක්කේ පූර්ව බ්‍රාහ්මී ලිපි 47 ක් පමණි (එම 6-8). එම ලිපි වෙස්සගිරිය, අභයගිරිය, රුවන්වැලි සෑ මළුව ආදි ස්ථානවල ස්ථානගත ව තිබේ. එයින් වෙස්සගිරිය තුළ ලිපි 23 ක් (Ic. vol. i 6-7). පවතින පරණවිතාන වාර්තා කර තිබේ. නමුත් 2006 වර්ෂයේ නව ලිපි 04 ක් පියතිස්ස සේනානායක වාර්තා කර ඇත (සේනානායක 2008: 90-96). ඒ අනුව වෙස්සගිරියේ මුළු ලිපි ප්‍රමාණය 27 ක් ලෙස සැලකිය යුතු ය. මෙයට අමතර ව අභයගිරියේ ලිපි 04 ක් හා රුවන්වැලි සෑ දාගැබ් මළුවේ ලිපි 14 ක් වශයෙන් මුළු ලිපි ප්‍රමාණය 47 ක් ලෙස අධ්‍යයන ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි ය.

අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත ව ස්ථානගත වන මුල් බ්‍රාහ්මී ලිපිවලින් හඳුනාගත හැකි පදවි නාම, සමාජ නාම, ආර්ථික නාම හා ආගමික නාම අතර **පරුමක, සෝනුත්තර කුලහ, ගහපති, ගන, උපසික, බරත, බත, ගමික, චුඩ, තලදර,** රජ ආදී වශයෙන් යුත් කණ්ඩායම් හඳුනාගත හැකි ය. මෙම අභිලේඛන තුළින් සමාජ, ආර්ථික දේශපාලන හා ආගම යන සමාජ සැකැස්මට අයත් ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු අධ්‍යයන ප්‍රදේශයෙන් වාර්තා වන නිසා ඔවුන්ගේ කාර්යභාරය අනුරාධපුර පුළුල් භූ දර්ශනය සඳහා

වැදගත් වී ඇත්තේ කෙසේදැයි විමර්ශනය කිරීමට අවකාශ සැලසේ. මුල් බ්‍රාහ්මී ලිපිවල වර්ධනය අතින් මුල් ඓතිහාසික අවධිය තුළ උතුරුමැද පළාත අනෙක් පළාත්වලට වඩා ප්‍රමුඛත්වයට පත් වී ඇති බව 5.2 වගුවට අනුව පැහැදිලි වන බැවින් පුරාණයේ දී උතුරු මැද පළාත තුළ වැඩි ජන ඝණත්වයක් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ජනගහන වර්ධනය හා ජනඝනත්වය රාජ්‍ය බිහිවීම සඳහා බලපානු ලබන කාරණයක් මෙන් ම සමාජීය හා ආර්ථික කටයුතු වර්ධනය කෙරෙහි ද බලපාන කරුණක් බව ගුණවර්ධන පෙන්වා දී තිබේ (Gunawardana 1981 : 133-134). විශේෂයෙන් ම උතුරු මැද පළාතේ මුල් බ්‍රාහ්මී ලිපිවල ස්ථානගත වීමේ ඝණත්වයක් පුරාණයේ දී පෙන්නුම් කරන ලද නිසා එම පළාත පුරාණයේ වැඩි ජනගහණයක් විසූ පළාත වීමට ඇතැයි ද පෙන්වාදිය හැකි ය. උතුරු මැද පළාත තුළ මුල් ඓතිහාසික අවධියේ සමාජ සැකැස්ම හඳුනාගැනීමට ද මුල් හා අපර බ්‍රාහ්මී ලිපි උපකාර කරගත හැකි වේ. එහි දී එක් එක් ජන කණ්ඩායම්හි ඝණත්වය හඳුනාගැනීමට ද හැකියාව ලැබේ. (බලන්න වගු අංක 5.3)

| පදවි නාම අනුව ජන කණ්ඩායම් | පූර්ව බ්‍රාහ්මී ලිපි ප්‍රමාණය |
|---|---|
| රජ/මහරජ | 26 |
| පරුමක | 114 |
| ගහපති | 23 |
| බත | 29 |
| බරත | 37 |
| අය /අස ඌ අශ | 07 |
| ගමික | 25 |

වගු අංක 5.3

මුල් ඓතිහාසික යුගයේ උතුරුමැද පළාතේ ජන කණ්ඩායම්හි ඝණත්වය දැක්වෙන වගුව

(*Ic.* Vol:1970)





ඉහත වගුවේ සඳහන් දත්තවලට අනුව උතුරුමැද පළාත ආශ්‍රිත මුල් බ්‍රාහ්මී අභිලේඛනවල ස්ථානගතවීම මිහින්තලය, වෙස්සගිරිය, අභයගිරිය, රුවන්වැලිසෑය, රදාගම, බිල්ලෑවෙලගල, ආඬියාගල, ඔක්කප්පුකලු, තන්තිරිමලය, රස්නකවැව, විහාරහමිල්ලෑව, හඳගල විහාර, මහාකපුගොල්ලෑව, වලස්කුණුවැව, කුඩා අඹගස්වැව, අලියාකඩ, වේගොල්ලකඩ, බෙරවාගම, මඩගමකන්ද, බ්‍රහ්මණයාගම, වදකහගල හින්න, පුලියංකඩ, දියතිත්ත වැව, නැට්ටුක්කන්ද, ගල්කන්දේගල, කොටකන්ද, දෙබලගල, බඹරහෙල, මහකනදරාව, දුනුමඬලාකන්ද, තලගුරු විහාර, කුට්ටිකුලම, තෝනිගල, කෝසවකන්ද, මානකන්ද, මරදන්කඩවල, වනසිංහ විහාර, පෙරුමාමඩුකන්ද, බුද්ගේහින්න, යාන්ගල, පනික්කාන්කුලම, මුරුනගනිම්කන්ද, මහඇලගමුව, හිත්තරගමහින්න, රිටිගල, ගල්කන්ද, දිඹුලාගල, කොනත්තේගෙ ාඩගල, දේවගල්ලේගල, මුතුගල, කන්ඩකාඩු, කුරුනෑකල්ලු, ලුනුවරනගල, ආඬියාගල, ගල්ගේ, හඳගල, කෝසවකන්ද, අවුකන ආදී ස්ථාන ඇසුරෙන් හඳුනාගත හැකි ය (Ic. vol. i: 1-25).

උතුරුමැද පළාතේ පුළුල් භෞමික ක්ෂේත්‍රය තුළට පූර්ව ඓතිහාසික (proto) අවධියේ ආදිත ම ජන ඇතුළුවීම් ක්‍රි.පූ. 950 තරම් ඈත කාලයක සිදු වී තිබේ. (Deraniayagala 1992:709). මෙම ජන කණ්ඩායම් බහු සම්පත් යැපුම් රටාට අනුගමනය කරන ලද අර්ථ - ස්ථාවර කණ්ඩායම් විය. ඔවුන්ගේ ජනාවාස ව්‍යාප්ත වීම හා සංස්කෘතියේ වර්ධනය ක්‍රි.පූ. 950 සිට ක්‍රි.පූ. 300 දක්වා කාලයක් තුළ සිදු වී ඇත (Seneviratne 1996:279). ක්‍රි.පූ,300 න් අනතුරු ව ශ්‍රී ලංකාවේ මුල් බැස ගනු ලැබූ මුල් ඓතිහාසික සංස්කෘතිය පූර්ව ඓතිහාසික සංස්කෘතියේ ප්‍රතිච්ඡින්න පැතිකඩක් බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (එම). මුල් ඓතිහාසික සංස්කෘතික පිරිස උතුරුමැද පළාත තුළ පූර්ව ඓතිහාසික ජනාවාස හා සුසාන පිහිටි ස්ථානවල මෙන් ම ඊටත් වඩා සාර්ව වූ භූ කලාපයක ව්‍යාප්ත ව සිටී බව අභිලේඛන සාධක ඔස්සේ හඳුනාගත හැකි ය (එම).

මුල් ඓතිහාසික අවධියේ සමාජ පුරාවිද්‍යාව මඟින් හඳුනාගත හැකි තොරතුරු අතර ක්ෂුද්‍ර හා සාර්ව ආකාරයට සිදු කරනු ලැබූ සම්පත් අත්පත්කර ගැනීම, නිෂ්පාදන බෙදාහැරීම් ඇතුළු විශේෂ වානිජ කටයුතු, ගබඩා හා කාසි සංසරණය, ශ්‍රම

විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍ය, තොටුපළ හා කෘෂිකාර්මික කටයුතු සිදු කර ඇති බව හඳුනාගත හැකි ය. එම කාර්යයන් අනුරාධපුර පුළුල් භූ දර්ශනය සඳහා ලබා දී ඇති දායකත්වය පිළිබඳ ව කරුණු විමර්ශනය කිරීමේ දී එක් එක් ජන කණ්ඩායම් හි කාර්යභාරය හඳුනාගැනීම අතිශයින් ම වැදගත් වේ. මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පළාතේ ජීවත් වූ ජන කණ්ඩායම් අතර වැඩි ම ජන ඝනත්වයක් පෙන්නුම් කරන ජන කණ්ඩායම ලෙස පරුමක ජන කණ්ඩායම හඳුනාගත හැකි ය. මොවුන්ගේ කාර්යභාරය යථෝක්ත කාල පරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික කටයුතු, වාණිජ කටයුතු, පාලන කටයුතු හා විවිධ ශිල්ප කටයුතු ඇතුළු විශාල ක්ෂේත්‍රයක් පුරා විහිදී තිබූ බව මුල් බ්‍රාහ්මී අභිලේඛන තොරතුරු අනුව පැහැදිලි වේ. ඒ අනුව අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීමේ දී අනෙකුත් ජන කණ්ඩායම්වලට වඩා පුළුල් දායකත්වය ඔවුන් දක්වා තිබේ.

පරුමකවරු හා ඔවුන්ගේ කාර්යාවලිය පිළිබඳ සමාජ පුරාවිද්‍යා අධ්‍යයනයට පසුබිම සැකසෙනුයේ විවිධ විද්වතුන් විසින් ඒ සම්බන්ධ ව සිදු කර ඇති අධ්‍යයන් තුළින් ය. පරුමකවරු සම්බන්ධ මුල් ම අධ්‍යයනයන් පී.ගෝල්ඩ් ස්මිත් විසින් සිදු කර තිබෙන අතර ඔහු විසින් රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට ලියන ලද ලිපියක් මගින් පරුමකවරු යනු බ්‍රාහ්මණයන් විය හැකි යැයි අදහස් පළ කර ඇත (*JCBRAS. No.* 20 1879 :02) එසේ ම H.C.P. බෙල් විසින් පරුමක යනු ප්‍රධාන (Chief) යන අරුත ගැබ් වූ පදවි නාමයක් බව පෙන්වා දී එය සංස්කෘත (**ප්‍රමුඛ**) සිංහල (**පාමොක්**), දෙමළ (**පෙරුමකන්**) යනුවෙන් භාවිත වන බව විග්‍රහ කර ඇත (*ASCAR* 1892:69). මෙය අතිශයින් වැදගත් විග්‍රහ කිරීමක් වන අතර මෙම අර්ථ විවරණය සමාජ පුරාවිද්‍යා අධ්‍යයනයන් සඳහා පූර්වාදර්ශයක් සපයා ඇත. පරුමකවරු සම්බන්ධ ව විග්‍රහ කර ඇති පරණවිතාන ඉන්දීය - ආර්යය පුරෝගාමී පරපුරකට අයත් විශේෂ කණ්ඩායමක් වශයෙන් අර්ථ දක්වා ඇත (*Ic.*Vol. i 1970 : lxxxiv). පරුමක ජන කණ්ඩායම පිළිබඳ ව විග්‍රහ කරන සුදර්ශන් සෙනෙවිරත්න ඔවුන් දකුණු ඉන්දීය ජන සම්භවයක් සහිත ජන කණ්ඩායමක් බව පැහැදිලි කර ඇත (Seneviratnෑ 1989:105). ඔහුගේ විග්‍රහයට අනුව **පෙරු** (Peru) යන්නෙන් "**මහා**" හෝ "**විශිෂ්ට**" යන්න ගම්‍ය වන බවත්, **මකන්** (Makan)





යන්නෙන් **මහා පුරුෂයා** හෝ **පැවතෙන්නා** (Great Man) ගම්‍යවන බවත් පෙන්වාදෙන සෙනෙවිරත්න ඔවුන් ප්‍රාග් නාගරික සමාජයක ප්‍රධාන කණ්ඩායමක් වී ඇති බව ද විස්තර කර ඇත (එම). මෙම ජන කණ්ඩායමේ සම්භවය සම්බන්ධ ව විග්‍රහ කර ඇති සෙනෙවිරත්න පරුමකවරුන්ට අයත් ශිලා ලිපිවල දැකගත හැකි බ්‍රාහ්මී නොවන සංකේත අනුව පරුමකවරුන්ගේ මූලය පූර්ව ඓතිහාසික අවධියට සම්බන්ධ වීමට පවතින ඉඩකඩ වැඩි බව ප්‍රකාශ කර ඇත (එම: 103-110). පරුමක ජන කණ්ඩායම පිළිබඳ විග්‍රහ කරන පරණවිතාන "රජ" හා මහරජ යන පදවි නාම සම්බන්ධ කරමින් ''**මපරුමක**'', ''**මපුරුමුකා**'', ''**මපුරුමු**'' යන නාම සමග සම්බන්ධ වන බව පෙන්වා දී ඇත (ෂජගඪකගස 1970 ඨ කංංසඩ). පරණවිතාන එ මගින් උත්සාහ දරා ඇත්තේ පරුමකවරු ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ආදිත ම ජන කණ්ඩායමේ නායකයන් වන බව පෙන්වීමට ය (එම).

එසේ ම පරුමකවරු සම්බන්ධ විමර්ශනයක් සිදු කර ඇති ආර්.ඒ.එල්.එච්. ගුණවර්ධන බ්‍රාහ්මී අභිලේඛන පරීක්ෂා කර බලා ශ්‍රී ලංකාවේ දැකගත හැකි ගමණි, පරුමක, ගපති වැනි තනතුරු තුළින් සමාජ ශ්‍රේණිගත වීමක් පෙන්නුම් කරන අතර එම තනතුරුවලින් සමාජ දේශපලන තත්ත්වය (Socio– Political Status) හඳුනාගත හැකි බව පෙන්වා දී ඇත (Gunawardena 1981:70-88). පරුමකවරුන්ගේ සමාජ දේශපාලන ශ්‍රේණි ගතවීම භික්ෂූන්ට පිදූ ලෙන් ලිපිවල සඳහන් නාමයන්ගෙන් තහවුරු වන අතර එයින් 28 % ක් පමණ ප්‍රදාන පරුමකවරුන්ට අයත් වන බැවින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රබල ස්ථානයක පැවති බව හඳුනාගැනීමට හැකි ය. ඒ අනුව පරුමකවරු වංශ ප්‍රධානීන් (Head of the clan group) හෝ ප්‍රධානීන් (Chief) ලෙස මුල් ඓතිහාසික අවධියේ කටයුතු කරන්නට ඇතැයි ඔහු පෙන්වා දී ඇත (එම:27).

ශ්‍රී ලංකාවේ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් වන පරුමකවරු සම්බන්ධ ව විග්‍රහ කර ඇති එස්.කේ. සිත්‍රම්පලම් පරුමකවරු සමකාලීන සමාජයේ ප්‍රමුඛත්වයක් හිමිකර ගත් පිරිසක් බව පෙන්වා දී තිබේ (Sitrampalam 1982 : 13). ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික දේශපාලන ඉතිහාසය හැදෑරීමේ ද පරුමක පදවි නාමය හඳුනාගැනීමට දමිළ සංගම් සාහිත්‍ය උපයෝගී කර

ගන්නා සිත්‍රම්පලම් බෙල් දක්වන **ප්‍රමුඛ** හෝ **පාමොක්ඛ** යන්නෙන් **පරුමක** යන්න ව්‍යවහාරයට පැමිණ ඇතැයි යන අදහස් බැහැර කරයි (එම). ඔහු විග්‍රහ කර ඇති ආකාරයට පරුමක යන්න සංගම් සාහිත්‍යයේ එන **පෙරුමකන්** හෝ **පරුමකන්** යන්නට සමාන බව පෙන්වාදෙයි. ඔහුගේ මතයට අනුව පරුමක පදවි නාමය සඳහන් ලිපිවලට අයත් සංකේත පූර්ව ඓතිහාසික අවධියේ මැටි බඳුන් මත ඇති සංකේතවලට සමානකමක් පවතින බැවින් , එ මඟින් දකුණු ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පුරාණයේ සිට පැවති සම්බන්ධතා පුරාවිද්‍යාත්මක වශයෙන් තහවුරු වන බව පෙන්වා දී ඇත. එම නිසා පරුමක නාමයට ද්‍රවිඩ භාෂා මූලයක් පවතින බව පෙන්වාදීමට ඔහු උත්සාහ ගෙන ඇත (එම :16-18).

සුදර්ශන් සෙනෙවිරත්න හා සිත්‍රම්පලම් ඉදිරිපත් කර ඇති ප්‍රබල මත අතර පරුමකවරු සම්බන්ධ අඛණ්ඩ ඉතිහාසය පූර්ව ඓතිහාසික අවධිය දක්වා දිවයන බව පුරාවිද්‍යාත්මක කැරණුවලින් ද යම් මට්ටමකට තහවුරු වී ඇත. සෙනෙවිරත්නගේ මතය අනුව පරුමක කණ්ඩායමේ ඉස්මතුවීම පූර්ව ඓතිහාසික අවධියේ දකුණු ඉන්දියාවේ ඇති වූ දේශපාලන නායකත්වය හා අධිකාරීත්වය පිළිබිඹු කරන බවත් එ මඟින් ශ්‍රී ලංකාවේ පූර්ව රාජ්‍ය කෙරෙහි **වේලීර්** ප්‍රධානීන්ගේ නායකත්වය යටතේ බලපෑමක් කරන්නට පරුමකවරු ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නට ඇතැයි පෙන්වා දී ඇත (Seneviratne 1994:164). මෙය වඩාත් තාර්කික මතයක් ලෙස සමාජ පුරාවිද්‍යාව දෙස අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ.

පරුමකවරුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව වැඩිදුරටත් අදහස් දක්වා ඇති සෙනෙවිරත්න පූර්ව රාජ්‍ය සමයේ දී යුධකාමී වතාවරණයක් සමාජය තුළ ඇති වූයෙන් පරුමකවරු සමාජයේ ප්‍රධාන පුද්ගලයින් (Bigman) බවට පත්වන්නට ඇති බව පෙන්වාදෙයි (Seneviratne 1989:108). මෙහි දී ඔවුන් වංශ කණ්ඩායම් තුළ අධිකාරීත්වයක් පිහිටුවා ගනිමින් ඉතා ම සීමිත ප්‍රදේශවල දේශපාලන බලයක් ද අත්පත් කර ගෙන සිටින්නට ඇතැයි ප්‍රකාශ කර ඇත (එම). එසේ ම ක්‍රි.පූ. තුන් වැනි සියවස වන විට නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් ද වාසිදායක තත්ත්වයන් පරුමකවරු අත්පත් කර ගෙන සිටි බව භික්ෂූන්ට පූජාකර ඇති පරිත්‍යාගවලින් පෙනෙන බැවින් (එම :116). වංශ






නායකයන්ගේ දේශපාලන තත්ත්වය හා සම්පත්වල අයිතිය අනෙක් නායකත්වයන්ට වඩා පෙන්නුම් කිරීමක් රජ හා අය වැනි පදවි ඔවුන් භාවිත කිරීමෙන් පැහැදිලි වන බව සෙනෙවිරත්න ගේ මතයයි (එම).

උතුරුමැද පළාතේ පරුමක ශිලා ලිපි ස්ථානගත වීමේ රටාව දෙස බැලීමේදී එම ලිපි පූර්ව ඓතිහාසික (Proto) ජනාවාස හා සුසාන ආශ්‍රිත බහුල ව්‍යාප්තියක් ගෙනහැර දක්වන බව පෙනේ (එම :114).

**Brhmi Inscription of Rajarata**




සිතියම් අංක 5.2
උතුරුමැද පළාතේ පරුමකවරුන්ගේ ශිලා ලිපි හා පූර්ව ඓතිහාසික ජනාවාසවල ස්ථානගතවීම දැක්වෙන සිතියම

පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස උතුරුමැද වියළි තැනිතලා ආශ්‍රිත ස්ථානගතවීම සඳහා එහි ඇති ස්වභාවික පරිසරය හා ස්වභාවික ඛනිජ වර්ගවල උපයෝගීතාවය බලපා ඇති සේම එම කාරණාම මුල් ඓතිහාසික අවධියේ දී උතුරුමැද ආකර්ෂනීය භූමි වීමට බලපා ඇත.විශේෂයෙන් ම මෙහිදී ජන රේඛනය හා කලාපීය වර්ධනය හඳුනාගැනීමේ දී ආකර්ෂනීය ප්‍රදේශ ආශ්‍රයෙන්

මුල් ඓතිහාසික ප්‍රජාවගෙන් වැඩි ව්‍යාප්තියක් හඳුනාගත හැකි ය. උතුරු මැද විස්තෘත කලාපයේ ආකර්ෂනීය භූමි වශයෙන් අනුරාධපුරයට නැගෙ නහිර පර්යන්ත ප්‍රදේශය හා අනුරාධපුරයට දකුණු දිගින් පිහිටි පර්යන්ත ප්‍රදේශය වැදගත් වූ බව මුල් බ්‍රාහ්මී අභිලේඛනවල බහුල ව්‍යාප්තිය අනුව ද හඳුනාගත හැකි ය. එම භූමි ආකර්ෂනය වී ඇත්තේ ඛනිජ, ලෝහ හා කුළුබඩු ආශ්‍රිත ද්‍රව්‍යයන්ගේ ස්ථානගතවීම නිසා බව පෙනේ. මුල් ඓතිහාසික අවධියේ නගුල් කෘෂිකර්මාන්තය ඇතුළු වාරි කටයුතු සඳහා ඇති වූ සුවිශේෂ තත්ත්වය මත පරුමකවරු ඒ සඳහා දැක් වූ දායකත්වය කැපීපෙනේ. උතුරුමැද පළාතේ කෘෂිකර්මාන්තයට වඩා හිතකර රතු දුඹුරු පාංශු කලාපයේ යෝග්‍යතාවය මත වැව් භාරකරුවන්, තොටුපළ පාලනය කරන්නන්, නගුල මෙහෙයවන්නන්, ඇළ වේලි පාලකයන් ආදී වශයෙන් විවිධ කෘෂි කටයුතුවල ඔවුන් නියැලී ඇති බව මුල් බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී අභිලේඛන අනුව හඳුනාගත හැකි ය. (බලන්න වගු අංක 5.4)

| මුල් හා අපර බ්‍රාහ්මී ශිලා ලිපි පවතින ස්ථානය | වාර්තා ගත වූ යොමු අංකය | කෘෂිකර්ම කටයුත්ත හා පරුමකවරයාගේ දායකත්වය |
|---|---|---|
| රිටිගල මරක්කල උල්පත | *Ic* : vo. i. 1970: No. 260 | පරුමක නගුලි (මු.බ්‍රා) (නගුල මෙහෙයවන්නා) |
| සීගිරිය | *ibid* : No. 869 | පරුමක නගුලි (මු.බ්‍රා.) (නගුල මෙහෙයවන්නා) |
| හදගල | *ibid* : No. 1130,1132 | පරුමක වපි හමික (අ.බ්‍ර.) (වැව් භාරකරු) |
| අවුකන | *ibid* : No. 1149 | පරුමක තණ භුමික හොජික (අ.බ්‍රා.) (තණ භූමි පාලකයා) |
| අවුකන | ibid : No. 1150 | පැරමක භුමික හොජික(අ.බ්‍රා.) (භූමි පාලක) |
| අවුකන | *ibid* : No. 1151 | පරුමක කඩපි වපි හමික (අ.බ්‍රා.) (වැව් භාරකරු) |
| අවුකන | *ibid* : No. 1153 | පරුමක ගජ ද බුනක වපිහමි (අ.බ්‍රා.) (වැව් භාරකරු) |
| තෝරවමයිලෑව | *ibid* : No. 1217 | පරුමක වව් හමික(අ.බ්‍රා.) (වැව් භාරකැර) |
| තෝරවමයිලෑව | *ibid* : No 1218 | පරුමක වැව් හමික(අ.බ්‍රා.) (වැව් භාරකරු) |
| බෙරවාගම | *ibid* : No 142 | පරුමක වියගහ (මු.බ්‍රා.) (සීසෑම කටයුතු භාරකරු) |
| කන්දලම | *ibid* : No 860 | පරුමක තොට බොජික (මු.බ්‍රා.) (තොටුපළ පාලනය කරන්නා) |





වගු අංක 5.4
උතුරුමැද පළාතේ පරුමක වරුන්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු දැක්වෙන වගුව

කෘෂි කටයුතුවලට අමතර ව පාලන කටයුතු මෙන් ම නගර කර්මාන්ත ශිල්ප හා වෙළඳම සඳහා ද උතුරුමැද පළාත ඇසුරෙන්

කෘෂි කටයුතුවලට අමතර ව පාලන කටයුතු මෙන් ම නගර කර්මාන්ත ශිල්ප හා වෙළඳාම සඳහා ද උතුරු මැද පළාත ඇසුරෙන් පරුමකවරුන්ගේ මැදිහත්වීම පහත සඳහන් වගුව මඟින් පෙන්වාදිය හැකි ය. (බලන්න වගු අංක 5.5)

| මුල් බ්‍රාහ්මී ශිලා ලිපිය වාර්තා වන ස්ථානය | ලිපිය වාර්තා වූ යොමු අංකය | නගර කර්මාන්තය, ශිල්ප හා වෙළඳම ඇතුළු කාර්යයන් |
|---|---|---|
| මිහින්තලය | (*Ic*. Vol. i 1970): No. 22 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය | *ibid*:No. 44 | පරුමක වුඩ (මැණික්කරු) |
| මිහින්තලය රාජගිරි කන්ද | *ibid* :No.59 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය රාජගිරි කන්ද | *ibid*:No.63 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |

| | | |
|---|---|---|
| මිහින්තලය රාජගිරි කන්ද | *ibid* :No.64 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| හදගල විහාරය | *ibid* :No.125 | පරුමක චුඩ (මැණික්කරු) |
| බුදුගේහින්න | *ibid* :No.203 | පරුමක චුඩ (මැණික්කරු) |
| රිටිගල | *ibid*:No.251 | පරුමක මහාසේනාපති (මහසෙන්පති) |
| රිටිගල | *ibid*:No.266 | පරුමක චුඩ නගහ (චුඩ නාග) |
| කුරුනෑකල්ලු | *ibid* :No.319 | පරුමක තබර (තඹකරු) |
| කුරුනෑකල්ලු | *ibid*:No.320 | පරුමක පුකියන (වෙළඳ කුලය) |
| තෝරවමයිලෑව | *ibid*:No.1037 | පරුමක නගර බොජක (නගරයේ අයබදු එකතු කරන්නා) |
| තෝරවමයිලෑව | *ibid* :No.1219 | පරුමක නගර ගුත (නගර පාලක) |
| ගල්කන්දේගම | *ibid* :No.171 | පරුමක බොජික (ගම් පාලකයා හා අයබදුඑකතු කරන්නා) |
| ගල්කන්දේගම | *ibid* :No.172 | පරුමක බොජික (ගම් පාලකයා හා අයබදුඑකතු කරන්නා) |
| මහඅලගමුව | *ibid*:No.217 | පරුමක ගනක (ගණන් තබන්නා) |
| මහඅලගමුව | *ibid* :No.230 | පරුමක නගර ගුත (නගර පාලක) |

වගු අංක 5.5
උතුරුමැද පළාතේ පරුමකවරුන්ගේ නගර, කර්මාන්ත, ශිල්ප හා වෙළඳ කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් වගුව

උතුරුමැද පළාතේ පරුමක පදවි නාමය දැරූ ජන කණ්ඩායම් මෙන් ම ගමික හා ගහපති පදවි දැරූ ජන කණ්ඩායම් ද මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනය ගොඩනැගීම සඳහා දායකත්වය දක්වා තිබේ. ඔවුන් පරුමකවරුන් මෙන් ම පාලන වෙළඳ ශිල්ප හා කර්මාන්ත සම්බන්ධ කටයුතුවල නියැලී ඇති අකාරයට පහත සඳහන් වගුව මඟින් හඳුනාගත හැකි ය (බලන්න වගු අංක 5.6).





| ශිලා ලිපිය වාර්තාවන ස්ථානය | ලිපිය වාර්තා වූ යොමු අංකය | උතුරුමැද පළාතේ ගමික, ගහපති, කණ්ඩායම්වල කාර්යභාරය |
|---|---|---|
| මිහින්තලය | *Ic*.Vol .i 1970. No. 39 | ගමික බඩගරික (භාණ්ඩාගාරික) |
| මුතුගල | *ibid.* No.309 | ගමික තොඩික (තොටුපල පාලක) |
| කන්දේගම කන්ද | *ibid.* No.295 | ගහපති දූතක (දූතසේවාව) |
| කන්දේගම කන්ද | *ibid.*No.297 | ගහපති චුඩික (මැණික්කරු) |
| මුතුගල | *ibid.* No.301 | ගහපති කබර (යකඩකරු) |

වගු අංක 5.6
උතුරුමැද පළාත තුළ ගහපති හා ගමිකවරුන් ගේ පාලන, කෘෂිකර්ම හා ශිල්ප කර්මාන්ත සම්බන්ධ දැක්වෙන වගුව

මේ අනුව මුල් ඓතිහාසික සමයේ උතුරුමැද පළාතේ ජන සමාජය පිළිබඳ ව අධ්‍යයනයේ දී සමාජ ස්තරගත වීම හා ශ්‍රේණිගත වීම හඳුනාගත හැකි ය. සමාජ ස්තරගතවීමක් යනු පාලන සංවිධානයක් බිහිවීමේ සාධකයන් බව ක්ලැසන් පෙන්වා දී ඇත (Clereassen and Skalnik 1978 :545-546). ජන සමාජයක ජන කොටස් අතර ඇතිවන්නා වූ මෙම ස්තරගතවීම ආර්ථික හා සමාජ කරුණු රැසක බලපෑම මත සිදුවන බව ද ඔහු පෙන්වා දී ඇත (එම). ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය තුළ දී මෙම සමාජ ස්තරගතවීම ඉතා පැහැදිලි ලෙස හඳුනාගත හැකි අතර එහි දී **මහරජ, රජ, පරුමක, ගමණි, ගමික, ගහපති, බරත, බත, අය, අශ, උපසක, කුටුබික** ආදී වශයෙන් වන්නා වූ පදවි ප්‍රමුඛ කර ගෙන ඇති වූ ස්තරගත වීම මුල් හා අපර බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් පැහැදිලි ව ම හඳුනාගත හැකි ය (Ic. Vol. i 1970: xivi- cxxix).

මුල් ඓතිහාසික අවධියට අයත් උතුරුමැද පළාත තුළින් හඳුනාගත හැකි සමාජ ස්තරායනය තුළින් සංස්කෘතික භූ දර්ශනය අධ්‍යයනයෙහි ලා ප්‍රධාන වන ජන කණ්ඩායම් කිහිපයක් හඳුනාගත හැකි ය. එම ජන කණ්ඩායම් අතර ප්‍රමුඛත්වයෙහිලා පරුමකවරුන්ගේ කාර්යභාරය වැදගත් වේ. එය එසේ වන්නේ උතුරුමැද පළාත් තුළින් පරුමකවරුන්ට අයත් වැඩි ම මුල් හා

අපර බ්‍රාහ්මී ශිලා ලිපි වාර්තා වීම නිසා ය (බලන්න වගු අංක 5.5). අභිලේඛනවල ව්‍යාප්තිය අනුව අනෙක් ජන කණ්ඩායම්වලට වඩා වැඩි ව්‍යාප්තියක් පරුමක කණ්ඩායම තුළින් දැකගත හැකි ය. එ බැවින් ජන ඝණත්වය අනුව ද ඔවුන්ගේ වැඩිවීමක් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පරුමකවරු කවුරුන් ද? ඔවුන්ගේ සමාජ පසුබිම කෙබඳු ද ? ඔවුන් දේශපාලන සංස්ථාව හා සමාජ සංස්ථාව තුළ කිනම් කටයුතු සිදු කර තිබේ ද? යන කරුණු පිළිබඳ ව විමර්ශනය කිරීමෙන් ඔවුන් ගේ කාර්යය හඳුනාගත හැකි ය. පරුමකවරු සම්බන්ධ ව අධ්‍යයනය සිදු කරන ලද උගතුන් අතර ගෝල්ඩ් ස්මිත් (Goldschmidt 1879 : 02), බෙල් (Bell 1890 : 08), පරණවිතාන (Paranavitane 1936 : 447; *Ic*.Vol. i 1970), පෙරේරා (Perera 1951 : 79-86) එල්ලාවල (එල්ලාවල 1967:25), හෙට්ටිආරච්චි (Hettiarachchi 1972 : 69-70), ගුණවර්ධන (Gunawardana 1971:24), වේලුපිල්ලෙයි (Vellupillai 1980 : 8-18), එස්. කේ. සිත්‍රම්පලම් (Sitramppalam 1978 : 89 - 98), කරුණාතිලක (Karunathilak 1983 : 125-128), සුදර්ශන් සෙනෙවිරත්න (Seneviratne 1989 : 99-132) ප්‍රධාන වේ.

පරුමකවරුන්ගේ කාර්යය පිළිබඳ මුල් බ්‍රාහ්මී ශිලාලිපිවල සඳහන් කරණු සැලකිල්ලට ගැනීමේදී ඔවුන් පුරාතන ජන සමාජය තුළ කෘෂි ක්ෂේත්‍ර ඇසුරින් පමණක් නොව විවිධ ක්ෂේත්‍ර සඳහා නායකත්වය සපයා ඇති බව හඳුනාගත හැකි ය. ඒ අතර පරිපාලන, ආර්ථික, ශිල්ප හා කර්මාන්ත කටයුතු ප්‍රමුඛ වේ. උතුරුමැද පළාත තුළින් හඳුනාගත හැකි සමාජ සංවිධාන කටයුතු අතර නගර හා ගම් පාලන කටයුතු විශේෂ වේ. ඔවුන් (**නගර බොජික**), නගර පාලක මෙන් ම (**බොජික**) ගම් පාලනය සම්බන්ධ ව කටයුතු කළ බව කුරුනෑකල්ලු, තෝරවමයිලෑව, ගල්කන්දේගම හා මහා ඇලග මුව ආදී උතුරුමැද පළාත පුරා විසිරී පවතින මුල් ඓතිහාසික අභිලේඛන තුළින් හඳුනාගත හැකි ය (*Ic*.Vol. i 1970 No.171, No. 172, No. 217, No. 230, No. 1037). නගර හා ගම් පාලනය මෙන් ම යුධ හමුදා නායකත්වය ද යුධ හමුදා පාලන කටයුතු ද ඔවුන් දරා ඇති බව රිටිගලින් හමුවන මහාසෙනපති (මහාසේනාපති) තනතුර දැරීම තුළින් පැහැදිලි වේ (එම : No. 251).

මුල් ඓතිහාසික සමය කෘෂිකර්ම කටයුතු සම්බන්ධ ව උතුරුමැද පළාතේ පරුමකවරුන්ගේ කාර්යභාරය තීරණාත්මක





වී ඇති බව 5.4 වගුව අනුව පෙන්වා දී ඇත. විශේෂයෙන් ම පරුමකවරු එහි දී වැඩි ම දායකත්වයක් සපයා ඇත. ඔවුන් වැව් පාලකයන්, තොටුපල පාලකයන්, කෘෂි ඉඩම් පාලකයන්, කෘෂි උපකරණ භාර ව ක්‍රියාකරන්නන් ලෙස කටයුතු කර ඇති බව ශිලා ලිපිවල සඳහන් වේ. (එම No. 140,No. 260, No. 860, No. 1130, No. 1149, No. 1150, No. 1151, No. 1153, No. 1217, No. 1278).

සමාජ ස්තරගතවීම මුල් ඓතිහාසික අවධියේ දී වඩාත් ක්‍රමවත් වීම සමඟ උතුරුමැද පළාත තුළින් පරුමකවරු වෙළඳාම, ශිල්ප කටයුතු, කර්මාන්ත ආදී විෂය ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වී ඇති ආකාරය මිහින්තලය, හඳගල විහාරය, බුදුගේහින්න, රිටිගල, කුරුනෑකල්ලු, තෝරවමයිලෑව, ගල්කන්දේගම, මහඇලගමුව ආදී ස්ථානවලින් හමුවන ශිලා ලිපිවලින් පැහැදිලි වේ. ඒ අතර භාණ්ඩාගාරික කටයුතු සිදු කළ බවට හා ගණන් තබන්නා කටයුතු සිදු කළ බවට සාධක භාණ්ඩාගාරික (**බඩගරික**), (**ගනක**) (*ibid.* No. .22, No.59, No. 63, No. 64 , No. 212) ආදී තනතුරුවලින් පැහැදිලි වේ. එසේ ම විවිධ ශිල්ප කටයුතුවලට අදාළ ව පරුමකවරුන්ගේ දායකත්වය ලැබී ඇති අයුරු ශිලා ලේඛන තොරතුරු මගින් හඳුනාගත හැකි ය. ඒ අතර මැණික් කර්මාන්තය (**චුඩ**), යකඩ කර්මාන්තය (**කබර**) හා වෙළඳාම ආශ්‍රිත විශේෂ ශ්‍රේණි (**පුකියන**) (tu.No. 44, No. 27, No. 266,No 330) පිළිබඳ ව මිහින්තලය, හදගල විහාර, බුදුගේහින්න, රිටිගල, කුරුණෑකල්ලු, ආදී ස්ථානවලින් හමුවන මුල් බ්‍රාහ්මී ශිලා ලිපිවලින් පැහැදිලි වේ.

උතුරුමැද පළාතේ පරුමකවරුන්ට අයත් මුල් හා අපර බ්‍රාහ්මී ශිලා ලිපිවල ස්ථානගතවීම දෙස බැලීමේ දී ඒවා බොහෝ විට පූර්ව ඓතිහාසික (මෙගලතික) ජනාවාස හා සුසාන ආසන්නයේ ස්ථානගත වන බව හඳුනාගෙන තිබේ(Seneviratne 1989 : 114. Map 04). මෙම ලිපි ස්ථානගත වීමේ රටාව හා එහි පාරිසරික පදනම දෙස බැලීමේ දී ඒවා රතු දුඹුරු පාංශු කලාපයේ (Red and brown earth) පිහිටා තිබේ (එම 114). මෙහි වඩා සිත්ගන්නා කාරණය වන්නේ පරුමක ශිලා ලිපි බොහොමයක් උතුරුමැද පළාතේ ස්වභාවික ඛනිජ සම්පත් ගණනාවක් ආසන්නයේ ස්ථානගත වී තිබීමයි. ඒ අතර කරබන්කුලම හා මාච්චාගම ඇපටයිට් (Apatite) නිධිය ආසන්න ස්ථානයේ පූර්ව ඓතිහාසික අවධියට අයත් ශිලා මංජුසා සුසාන (Cist Burial) දැකගත හැකි

ය. එසේ ම මධ්‍ය යාන් ඔය අශ්‍රිත පූර්ව ඓතිහාසික ස්ථාන හා මුල් බ්‍රාහ්මී ශිලා ලිපි ස්ථානගත වන ප්‍රදේශවලට ආසන්න ව විශාල ලෙස තලාතු මිනිරන් (mica) හා තිරුවානා (Quartz) නිධිගත වී තිබේ (එම). මෙම අවධියට අයත් මහාවංස විස්තරවල ද අනුරාධපුර නගරය වටා වූ සම්පත්වල පිහිටීම දක්වා තිබේ.[3] පුරාවිද්‍යාත්මක සාධක හා සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරු විමර්ශනය කිරීමේ දී ද අනුරාධපුර ඊසාන දිගින්, නැගෙනහිරින් හා දකුණු දිගින් නගරය වටා සම්පත් පිහිටි බව පැහැදිලි වන අතර, එහිදී විශේෂ ප්‍රාගුණ්‍යතාවය සඳහා පරුමකරුන්ගේ දායකත්වය අනුරාධපුර නගරයේ සාර්ව භූ දර්ශනය ගොඩනැගීමට ලැබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

අනුරාධපුර පැරණි නගරයෙන් නැගෙනහිර පර්යන්තය තුළ ස්වභාවික ඛනිජ සම්පත් ස්ථානගත ව තිබේ. ඒ අතරින් සේරුනුවර පිහිටන ස්වභාවික ලෝහ නිධිය ප්‍රධාන වේ (Seneviratne 1995 :117). මුල් ඓතිහාසික අවධියේ දී එම ලෝහ සම්පත් අත්පත්කර ගැනීමේ කාර්යයේ දී පූර්ණ බලය සහිත පරුමකවරුන්ගේ කාර්ය (Powerfull parumuka families) තීරණාත්මක වී ඇති ආකාරය කුරුණෑකල්ලු පූර්ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් හඳුනාගත හැකි ය (*Ic*.Vol.i 1970 : No.319). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට එම ලිපියේ සඳහන් වන **පරුමක තබර** යන්න මඟින් තඹ කර්මාන්තයේ පාලනය එහි දී පරුමකවරු අතෙහි තබා ගත් බව පැහැදිලි කර ඇත (Seneviratne 1989 : 115). එසේ ම ලෝහ ආශ්‍රිත කටයුතුවල පාලන බලය පරුමකවරු අත තබා ගැනීම නඟුල් කෘෂිකර්මාන්තය සඳහා ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීමක් ද විය. කෘෂිකාර්මික කටයුතුවල දී ලෝහ සම්බන්ධ ක්‍රියාවලියේ දි නගුල් කටයුතු පාලනය පරුමකවරු රඳවා ගෙන සිටි ආකාරය **පරුමක නගුලි, පරුමක නගුලිය** යන්නෙන් පැහැදිලි වේ (*Ic*.vol. i 1970: 260, 869). සුදර්ශන් සෙනෙවිරත්නගේ විග්‍රහයන්ට අනුව රිටිගලින් හමුවන **අරිට්ඨ**

3 පුරයෙන් ඊසාන දෙස තුන් යොදුනකින් මත්තෙහි ආචාරිවිට්ටිගම සොළොස් කිරියක් පමණ වූ භූමි ප්‍රදේශයේ ප්‍රමාණයෙන් නා නා ප්‍රකාර වූ ස්වර්ණ බීජයෙන් උපනහ. පුරයෙන් පැඳුම් දෙස සත් යොදුන් මත්තෙහි ගඟ එතෙර තඹ විටිනම් ගම තඹලෝ උපත, පුරයෙන් ගිනිකොණ පෙදෙස සතර යොදුනක් දුර සමන් වැව් නම් ගම බොහෝ මැණික් උපන්හ. නුවරින් දකුණු පස අටයොදුන් මත්තෙහි අම්බට්ඨ කොළ නම් දනව්වෙහි රිදී උපන (*මව*.xxviii :13-23).





**මහාගාම පරුමක** සහෝදර හතර දෙනෙකුගේ සම්බන්ධතාවය කෘෂිකාර්මික ක්‍රියාකාරිත්වයට සැපයීම පිළිබඳ හොඳ ම නිදසුනක් වේ. (Seneviratne 1989 : 115) මේ ආකාරයට ලෝහ හා කෘෂිකාර්මික කටයුතුවල පාලනය උතුරු මැද පළාත තුළ ව්‍යාප්ත කර තිබීම තුළින් පරුමකවරු පවුල්මය වශයෙන් යම්කිසි ස්ථාවරත්වයක් ස්වභාවික සම්පත් පාලනය තුළින් ලබා තිබූ බව හඳුනාගත හැකි ය.

අනුරාධපුර නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි ලෝහ සම්පත් අත්පත් කර ගැනීම ප්‍රාවාහනය හා නිමි භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ ක්‍රියාවලිය විශේෂ ප්‍රාගුණ්‍යතාවය සහිත ව පවත්වා ගෙන ගිය බව මුල් බ්‍රාහ්මි අභිලේඛන ඇසුරෙන් හඳුනාගත හැකි ය. සෙනෙවිරත්න පෙන්වා දී තිබෙන ආකාරයට ධාතුවංසයේ සඳහන් වන **මහාවාරිකා මග්ග, තම්බතිත්ථ** (තඹ හුවමාරු තොටුපළ) සේරු නුවර සිට උතුරුමැද පළාතට හා අනුරාධපුරයට නිෂ්පාදන බෙදා හැරීම සඳහා පැවති ප්‍රධාන මාර්ග වේ (Seneviratne 1995 : 130). මෙම නිෂ්පාදන බෙදාහැරීම් ක්‍රියවලියට දායත්වය දැක් වූ ගමිකවරු හා ගහපති කණ්ඩායම් පිළිබඳ ව අභිලේඛනවල සඳහන් වේ. ඒ අතර මුතුගල ලිපියේ **ගහපති කබර** (යකඩකරු) හා තවත් ලිපියක **ගමික තොඩික** (තොටුපල පාලක) (*Ic*.Vol i. 1970:301,309) යන්නෙන් නිෂ්පාදන හා බෙදාහැරීම් පිළිබඳ ව හඳුනාගත හැකි ය. (Seneviratne 1995 : 131).

පරුමකවරු සතු ව තිබූ ලෝහ සම්පත්වල පූර්ණ පාලන බලය නිසා අනුරාධපුරය වඩා දියුණු නගරයක් දක්වා වර්ධනය වීම ඔස්සේ එහි සංස්කෘතික භූ දර්ශනයේ හැඩගැසීම සඳහා මුල් ඓතිහාසික යුගයේ සිදුවූ කාර්යභාරය වැදගත් වේ. එහි දී පරුමකවරුන්ගේ පාලන බලය සේරුවිල සිට අනුරාධපුරය දක්වා විහිදුණු නිෂ්පාදන බෙදාහැරීම් ජාලය ඔස්සේ හඳුනාගත හැකි අතර ඒ ඒ ශිල්ප කටයුතුවල දී විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් ඇති ව මධ්‍ය යාන් ඔය නිම්නයේ පෙරියපුලියංකුලම, කැබිතිගොල්ලෑව, බ්‍රාහ්මණයාගම, නැට්ටුක්කන්ද, කහටගස්දිගිලිය ආදී ස්ථාන ඇසුරෙන් ක්‍රියාත්මක වී තිබේ. මුල් බ්‍රාහ්මී අභිලේඛනවල ලෝහ කර්මාන්තය ආශ්‍රිත විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් එම ප්‍රදේශවල පවත්වා ඇත්තේ පරුමක නොවන ජන කණ්ඩායම් විසිනි. පෙරියපුලියන්කුලමේ මුල් බ්‍රාහ්මි ලිපිවලින් **තබකර** (තඹකරු),

**තොපශ** (බෙලෙක්කරු) ආදි කර්මාන්ත පිළිබඳ ව සඳහන් වේ (*Ic*. Vol. i; 1970 : No. 350, No. 351, No. 370). පෙරියපුලියන්කුලම ප්‍රදේශයේ වාණිජ කටයුතු (**වණිජ**) සම්බන්ධ ක්‍රියාවලියේ නිරත පිරිස් පිළිබඳ ව සඳහන් වේ (එම : No. 356, No. 357) එ මඟින් නිෂ්පාදන බෙදාහැරීම් සම්බන්ධ ක්‍රියාවලිය මහා වාරිකා මග්ග ඔස්සේ අනුරාධපුරය දක්වා සිදු කර ඇති බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne ; 1995 : 132). **මහා වාරිකා මග්ග** වශයෙන් අනුරාධපුරය දක්වා විහිදුණු නැගෙනහිර පර්යන්තයට සම්බන්ධ වූ මාර්ගය ආශ්‍රිත ව ලෝහ කර්මාන්තයට සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් දැක්වූ පිරිස් පිළිබඳ ව බ්‍රහ්මණයාගම කබර (යකඩකරු) (*Ic*. Vol. i ; 1970 : No.161). නැට්ටුක්කන්ද **කබරගම** (යකඩකරුවන්ගේ ග්‍රාමය) (Nicholas Vol. ii 80. No. 6). lyg.iaos.s,sh lnrjú (Uduwara 1991 : 211) කැබිතිගොල්ලෑව **ආචාරියාගම** (නිෂ්පාදකයින්ගේ ගම) (Seneviratne : 1995 : 132) සඳහන්වීම තුළින් ලෝහ කර්මාන්තය සඳහා සුවිශේෂ වූ හැඩගැසීමක් මෙම ප්‍රදේශ ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. මේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් අනුරාධපුරය හා බද්ධ වූ ක්‍රියාවලියක් බව ක්‍රි. ව. 350 පමණ කාලයට අයත් කැබිතිගොල්ලෑව ආසන්නයේ පිහිටා ඇති ලබුඇටබැඳිගල ශිලා ලිපිය මඟින් සනාථ වේ. එම ශිලා ලිපියේ අනුරාධපුර නගරයේ නැගෙනහිර ක්‍රියාත්මක වූ වෙළඳපොළ හඳුන්වා ඇත්තේ **මහා තබක නිගම** (තඹකරුවන්ගේ වෙළඳපොළ) ලෙස ය (*Ez*.Vol. iii : 1928 : 33 ; 247 - 253). මුල් ඓතිහාසික අවධිය තුළ දමනු ලැබූ විශේෂ ප්‍රාගුණ්‍යතාවයේ උච්චත ම අවස්ථාව අපට එ මඟින් හඳුනාගත හැකි අතර සුවිශේෂීකරණය වූ ලෝහ වෙළඳපොළක් අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයට එකතු වී තිබූ බව පැහැදිලි වේ. එම සුවිශේෂීකරණය වූ වෙළඳපොළෙහි උපයෝගීතාවය ඇතුළුපුරයේ සිදු කරනු ලැබූ කැණීම් තුළින් ද තහවුරු වී තිබේ. **AG 69** ගෙඩිගේ කැණීමේ **4B** පස් තට්ටුවෙන් ලැබී ඇති තද නිල් පැහැති පාරදෘශ්‍ය වීදුරු පබළු සඳහා (Dark Blue Transparent Beads) ඒවා නිෂ්පාදනය සඳහා කොබෝල්ට් (Cobalt) නැමති ඛනිජ වර්ගය අවශ්‍ය වේ. සිරාන් දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට කොබෝල්ට් බහුල වශයෙන් සේරුවිල තඹවල අඩංගු වේ (Deraniyagala 1986 : 44). වීදුරු ආලේප උළු (Glazed tiles) නිෂ්පාදනයට අවශ්‍ය කොපර් ඔක්සයිඩ (Cooper Oxide) ලබා ගැනීමට ද සේරුවිල





තඹ වැදගත් වී ඇත (එම: 42) අනුරාධපුර නැගෙනහිර පස ක්‍රියාත්මක වූ වෙළඳපොළ සඳහා වඩා සුවිශේෂ ආකාරයට තඹ නිෂ්පාදනය සඳහා ඉඩකඩ ලබාදීම අනුව නැගෙනහිර පර්යන්තය හා කේන්ද්‍රීය ප්‍රදේශය ආශ්‍රිත ගනුදෙනුව වඩා සාර්ථක භූ දර්ශනයක් ගොඩනැගීමට බලපා ඇති බව පෙනේ. මේ තත්ත්වයේ වර්ධනය අපට හඳුනාගත හැක්කේ මධ්‍ය ඓතිහාසික අවධියේ මුල් කාල පරිච්ඡේද තුළිණි.

මේ ආකාරයට මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර භූ දර්ශනය ගොඩනැගීම සඳහා එවකට පැවති සමාජ සැකැස්ම වැදගත් වී තිබෙන අතර එම සමාජ සැකැස්ම තුළ පරුමකවරුන්ගේ කාර්යභාරය වශයෙන් සම්පත් අත්පත් කර ගැනීම හා පාලනය කිරීම ඔස්සේ ඔවුන් ලබාගෙන තිබූ සමාජ දේශපාලන (Socio - Political) තත්ත්වය අනුරාධපුර පුළුල් භූ දර්ශනය ගොඩනැගීමට සුවිශේෂ වී ඇති අන්දම සමාජ පුරාවිද්‍යාත්මක වශයෙන් හඳුනාගත හැකි ය. මේ තත්ත්වය මත අනුරාධපුරය වඩා පුළුල් ආකාරයට නැගෙනහිර ප්‍රදේශයේ පැවති ලෝහ සම්පත් අත්පත් කර ගෙන එහි තීරණාත්මක බලය පාලනය කිරීම මුල් ඓතිහාසික අවධිය තුළ කැපීපෙනෙන අතර එම තත්ත්වය ඇතුළුපුරයේ පමණක් නොව ජේතවනය හා වෙස්සගිරිය තුළින් ද හඳුනාගත හැකි ය. ජේතවන විහාර භූමිය ආශ්‍රිත ප්‍රාග් ජේතවන ස්තර ඇසුරින් බහුල වශයෙන් ම තඹ බොර මෙන් ම යකඩ බොර ද ලෝහ උණු කිරීමට භාවිත කරනු ලැබූ කෝව හා උදුන් ද හඳුනාගෙන තිබේ (මැන්දිස් :2009 20 - 22). එසේ ම වෙස්සගිරිය ආශ්‍රයෙන් ද ලෝහ බොර, කෝව කොටස් මුල් ඓතිහාසික අවධියට අයත් පස් ස්තරවල තිබී හමු වී ඇත (Mendis 2007 : 16 - 18). මෙය තවදුරටත් තහවුරු කළ හැකි සාධක අතර වෙස්සගිරියේ මුල් බ්‍රහ්මී ලිපියක් අනුව ද පැහැදිලි වේ. එහි එක් ලිපියක රන් කර්මාන්තය හා සම්බන්ධ පුද්ගලයෙකු **තලදර** යනුවෙන් සඳහන් වේ (Ic.Vol.i. 1970 : No. 80). **තලදර** යන්න පිළිබඳ ව විග්‍රහයක යෙදෙන පරණවිතාන එය සංස්කෘත **තුලාධර** හා සිංහල **තරහල්** යන්නට පරිවර්තනය කිරීමෙන් එ මඟින් රන් ආශ්‍රිත ශිල්ප කටයුත්තක නියුක්ත වූවකු ගම්‍යවන බව පෙන්වා දී ඇත (එම XCVIL) එසේ ම තලදර යනු රන්කාසි හුවමාරු කළ හෝ රන් මිණුම් කළ පුද්ගලයෙකු වියහැකි බව

සෙනෙවිරත්නගේ මතයයි. (සුදර්ශන් සෙනෙවිරත්න සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙනි.) තලදර යන්නෙන් රන් ආශ්‍රිත ශිල්ප කටයුතු පිළිබිඹු වන බව තහවුරු කළ හැකි තවත් ලිපි කිහිපයක් තිබේ. ඒ අතර මණ්ඩාගලින් ලැබුණු ලිපියක ද **තුලාධර** යන්න ගැන සඳහන් වේ (එම : No. 593). එ මඟින් කිරුම් මිනුම් උපකරණ දරන්නා යන්න අර්ථවත් වන බව පරණවිතාන පෙන්වා දී ඇත. එසේ ම කෝන්ගල ලිපියක සඳහන් **තලදරපුත** යන්න විමර්ශනය කරන ඔහු එයින්. රන්කරුවාගේ පුතා. යන්න ගම්‍යවන බව පෙන්වා දී ඇත. එම නිසා වෙස්සගිරියේ හමුවන **තලදර** නැමැත්තා රන් කර්මාන්තය ආශ්‍රිත කටයුතු කළ පුද්ගලයකු හෝ රන්කාසි හුවමාරු කළ හෝ රන් කිරුම් මිණුම් කළ පුද්ගලයෙකු විය හැකි බව මෙම අර්ථ නිරූපණය අනුව පෙන්වාදිය හැකි ය.


මෙම පුරාවිද්‍යාත්මක කරුණු සැලකිල්ලට ගැනීමේ දී අනුරාධපුර ඇතුළුපුරයෙන් නැගෙනහිර පර්යන්තය තුළ පිහිටි ස්වභාවික සම්පත් මුල් ඓතිහාසික අවධියෙ දී පරිහරණය සම්බන්ධයෙන් එහි වැඩිම උපයෝගීතාවය අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශ තුළින් සිදුවී ඇති බව පෙනේ. එහී දී විශේෂයෙන් ම සේරුවිල සිට අනුරාධපුරය දක්වා තඹකරුවන්, යකඩකරුවන්, බෙලෙක්කරුවන් හා රන්කරුවන් ආශ්‍රිත සුවිශේෂ ශිල්පීය හා වානිජ ක්‍රියාවලිය සිදුවූ නිසා අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය ගොඩනැගීම සඳහා එම සම්පත්වල උපයෝගීතාවය වැදගත් වූ අන්දම අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් කරුණු අනුව පෙන්වාදිය හැකි ය. (සේරුවිල සිට අනුරාධපුරය දක්වා විහිදුණු ලෝහ නිෂ්පාදන ක්‍රියාවලිය 5.5 රූප සටහන් මගින් පෙන්වා දී ඇත.)

අනුරාධපුරයෙන් නැගෙනහිරට මෙන් ම දකුණු දෙසට පරුමකවරුන්ගේ ස්ථානගත වීම සම්බන්ධව විමර්ශනය කරන විට ක්‍රමානුකූල ව කඳුකර කලාප දක්වා ව්‍යාප්ත වීමේ ස්වරූපය හඳුනාගත හැකි ය. අනුරාධපුර නගරයට දකුණුදිග ප්‍රදේශයේ වූ සම්පත් අත්පත් කරගෙන පරිහරණය සම්බන්ධ ව තොරතුරු ඉහළ කලා ඔය තැනිතලා අසල පිහිටි කුඩා කඳු ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි ය. එම ප්‍රදේශ නතුකර ගෙන සිටි පෙළපත් කණ්ඩායමක් පරම්පරා කිහිපයකට පසු මධ්‍ය කඳුකරයේ සම්පත් අඩංගු ප්‍රදේශ දක්වා සිය ආධිපත්‍යය පරුමකවරු ව්‍යාප්ත කර ඇති බව සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (Seneviratne 1996 :





295). ඔවුන් **පොචුනි රාජ** පරපුර වශයෙන් හැඳිනගත හැකි වුව ද පොචි රාජ පරපුර පරුමක කණ්ඩායමකින් සම්භවය ලැබූවන් වීමට බොහෝ ඉඩකඩ පවතින බව ඔහු පෙන්වාදී ඇත (එම 1996 : 295). මෙම කණ්ඩායම නිෂ්පාදන බෙදාහැරීම් කෙරේ කිසියම් පාලනයක් අදාළ ප්‍රදේශ ඇසුරෙන් සිදු කරන්නට ඇති බව පෙන්වාදෙන සෙනෙවිරත්න (එම) ඒ ඔස්සේ නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන පෙළපත් කණ්ඩායම් විසින් පාලනය කරන්නට ඇතැයි ද පෙන්වාදෙයි. එය එසේ නම් කඳුකර ප්‍රදේශයේ සිට පහළට විහිදෙන්නා වූ ප්‍රදේශ ආශ්‍රයෙන් හමුවන චූඩ (මැණික්) කර්මාන්තය හෝ ඒ ආශ්‍රිත ඛනිජ සම්පත් භාවිත කිරීමේ පුරෝගාමීන් ලෙස පරුමකවරුන් කටයුතු කර ඇති බව ද මැනවින් පැහැදිලි වන අතර එම කටයුතු ඔවුන් විසින් ඒකාබද්ධ මණ්ඩල හෝ ශ්‍රේණි වශයෙන් සිදු කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පරුමකවරු වෙළඳ කුල වශයෙන් සේවය කළ බව කුරුණෑකල්ලු පූර්ව බ්‍රාහ්මී ශිලා ලිපියේ පරුමක පුගියන යන්නෙන් පැහැදිලි වේ (*Ic*. Vol. i : 1970 : No. 319). එ වැනි වෙළඳ ශ්‍රේණී හෝ කුල විසින් කඳුකර ආශ්‍රිත ප්‍රදේශවල සම්භවය ලබන ඛනිජ සම්පත් රට මැද පිහිටි අනුරාධපුරය දක්වා රැගෙන ඒමේ දී අර්ධ නිමි ද්‍රව්‍යය වශයෙන් රැගෙන එන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට මෙ වැනි ද්‍රව්‍යය ප්‍රවාහනයේ දී අතරමැදි වාපිග ාම ජනපදවල පිහිටි නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන ඔස්සේ බෙදාහැර තිබේ (Seneviratne 1996 : 300). (බලන්න රූප සටහන් අංක 5.5)




| | | | |
|---|---|---|---|
| IV | - Iron Village | IS | - Iron - Smith |
| KD | - Kahatagasdigiliya | AG | - Achariyagama |
| KG | - Kebithigollewa | EMK | - Eastern Market |
| MCM | - Maha Charica Magha | NMK | - Nothern Merket |
| SW | - Seruwila | SMK | - Sourthern Market |
| PT | - Parumaka tabura | WMK | - Westerm Market |
| MYO | - Middle Yan Oya Basin | | |
| PP | - Periya Puliyankulama | MT | - Mantota |
| TS | - Tin – Smith | CS | - Coppe Smith |
| JPS | - Jetavana Production Site | | |
| APC | - Anuradhapura Citadel | | |

රූප සටහන් අංක 5.5
මුල් ඓතිහාසික අවධියේ සේරුවිල සිට අනුරාධපුරය දක්වා ලෝහ සම්පත් බෙදාහැරීමේ ස්වරූපය දැක්වෙන රූප සටහන





දක්ෂිණ පර්යන්තයේ එ වැනි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීමේ දී පරුමකවරුන්ගේ කාර්යභාරය තීරණාත්මක වී ඇති බව සීගිරියේ පමණක් පරුමක පුද්ගලයින් 34 දෙනෙකුට අයත් මුල් බ්‍රාහ්මී අභිලේඛන හමුවීමෙන් පහැදිලි වේ (එම) පොදු රටාවට අනුව මේ ප්‍රදේශයේ පරුමකයින් ඉතා ම ධනවත් සමාජ ආර්ථික කණ්ඩායමක් වූ අතර ඒ නිසා ම එම ප්‍රදේශවල ශ්‍රමය, ජනාවාස ඒකක, තොටුපල පාලනය, කෘෂිකාර්මික නිෂ්පාදන හා ඛනිජ සම්පත් කෙරේ බලපෑම් සිදු කර ඇති ආකාරය පරුමක **බුජික, පරුමක නගුලි, පරුමක තොට බොජක, පරුමක නගරගුත, පරුමක වපිහමික, පරුමක චූඩ, පරුමක ගණිත** යන තනතුරු අනුව පෙනේ (*Ic*. Vol. i. 1970 : No. 869, No. 860, No. 1219, No. 217, No. 203). පරුමක කණ්ඩායම සමාජ, දේශපාලන හා ආර්ථික වශයෙන් ඉස්මතු වීම සමඟ ඔවුන් වෙනත් ජන කණ්ඩායම් සමඟ විවාහ සම්බන්ධතා හා ඥාති සම්බන්ධතා පවත්වා තිබේ. ඒ අතර **ගහපති, ගමික, අෂ** ආදී ජන කණ්ඩායම් ප්‍රධාන වන අතර එ වැනි සම්බන්ධතා මහඇලගමුවෙන් වාර්තා වේ. **ගහපති පදවිය** දැරූවකු ගහපති චූඩ වශයෙන් හැඳින්වීමත් කන්දේගම කන්ද ලිපියක ගහපති චූඩික වශයෙන් ද, මුතුගල මුල් බ්‍රාහ්මී අභිලේඛනයක ගහපති කබර වශයෙන් ද ඥාති සම්බන්ධතා ඇති කර ගැනීම තුළින් පැහැදිලි වේ (එම, No. 215, No. 297, No. 301). ගහපතිවරුන් මෙන් ම ගමිකවරු ද පරුමක පදවිය දැරූවන් සිදු කළ කාර්යයන්ට සම්බන්ධ වී කටයුතු කර ඇති ආකාරය මිහින්තලය හා මුතුගලින් හඳුනාගත හැකි ය. එම කාර්යයන් අතර **ගමික බඩගරික** හා **ගමික තොඩික** ලෙස, භාණ්ඩාගාරික හා තොටුපල පාලනය සම්බන්ධ කටයුතුවලට ඔවුන් සම්බන්ධ වී ඇත (*ibid*, No. 39, No. 309).

මේ ආකාරයට සමාජ සබඳතා ඔස්සේ ඇතිවන්නා වූ සම්පත් අත්පත් කර ගැනීම්, බෙදාහැරීම් කඳුකර කලාපය හා පහළ තැනිතලා අතර සිදු වූ ක්‍රියාවලිය ඉන් පසු නිෂ්පාදන බෙදා හැරීම් මධ්‍යස්ථාන හරහා ප්‍රධාන නගරය වූ අනුරාධපුරය දක්වා ඇදී ඒම හඳුනාගත හැකි ය. 1980 දශකයේ අනුරාධපුර ඇතුළුපුරයේ ජනාවාස ආශ්‍රිත ව සිදු කරන ලද කැණීම්වල දී ක්‍රි. පූ. යුගයේ ජනාවාස ස්තරවලින් එයට පෙර පැවති යුගයට වඩා

පුළුල් තේරීමක් ඇති මැණික් ගල් වර්ග ද, මැණික් කර්මාන්ත ආශ්‍රිත ශේෂ ද රත්තුං හා තඹ වැනි ඛනිජ වර්ග ද සාපේක්ෂ ලෙස බහුල වශයෙන් හමුවන බව හඳුනාගෙන ඇත (සෙනෙවිරත්න 1996 ඵ 190). එම තොරතුරු අනුව මුල් ඓතිහාසික අවධිය තුළ දී ඛනිජ සම්පත් ඇතුළු ස්වභාවික සම්පත් කඳුකර කලාපයෙන් ඍජු ව ලබාගැනීමේ ප්‍රවණතාවය හඳුනාගත හැකි ය (එම). කඳුකර කලාපයේ සම්භවය ලබන ඛනිජ ද්‍රව්‍ය නිෂ්කරණය, නිෂ්පාදනය හා ඒවා වියළි තැනිතලා භූමිය දක්වා ප්‍රවාහනය කිරීම දඹුල්ලේ සිට නුවර සානුව දක්වා විහිදෙන්නා වූ මාර්ගයේ ස්ථානගත ව ඇති පූර්ව බ්‍රහ්මී ශිලා ලිපි තුළින් හඳුනාගත හැකි ය. එම නිෂ්පාදන මධ්‍යස්ථාන, හුවමාරු මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු අවුකන, කලා වැව, කන්දලම, දඹුල්ල ප්‍රදේශ ආශ්‍රයෙන් ඇති මුල් බ්‍රාහ්මී අභිලේඛන තුළින් පුළුල් නිෂ්පාදන මධ්‍යස්ථාන හා බෙදාහැරීමේ සංකීර්ණයන් පැවති බවට කදිම සාක්ෂි සපයා දෙයි (එම). මෙසේ ඇති වූ අන්තර් සම්බන්ධතාවන්හි අභ්‍යන්තර ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මුල් බ්‍රහ්මී ශිලා ලිපි හා වංසකතා ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රය තුළ මෙම ප්‍රදේශ ඇසුරින් ක්‍රියාත්මක වූ නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන **කටක, කඩ, කඩක, කණ්ඩ** වැනි පදවලින් හඳුන්වා ඇත. ඒ පිළිබඳ ව විග්‍රහයක යෙදෙන සුදර්ශන් සෙනෙවිරත්න මහාවංසයේ පණ්ඩුකාභයගේ සංග්‍රාම ආශ්‍රිත ව **ගිරිකණ්ඩ**, වට්ටගාමිණීගේ ගමන් මාර්ග ආශ්‍රිත ව **සිලාසොබ්බකටක**, දඹුල්ල හා බුදුගේහින්න ආශ්‍රිත බ්‍රහ්මී ලිපිවල සඳහන් **උපරිකඩ** හා **මතුකඩ** යන වචනවල එන කඩ, කටක වචනවලින් සීමාව, ප්‍රවිෂ්ටය, සුළු වෙළඳපොල අර්ථවත් වන බව පෙන්වා දෙයි (එම : 192). බුදුගේහින්න හා දඹුල්ල ශිලා ලිපිවල සඳහන් වන උපරිකඩ හා මතුකඩ යන වචනවලින් **උපරිකඩ** යන්නෙන් ඉහළින් පිහිටි වෙළඳපොල හෝ කඩඉම අර්ථවත් වන බව ඔහු පෙන්වා දී තිබේ (එම : 193). ඒ අනුව උපරිකඩ පහළ කඳුකර කලාපයේ පිහිටි ජනාවාසයක් ලෙස හඳුනාගත හැකි බව සෙනෙවිරත්නගේ මතයයි. මෙම ජනාවාසය කඳුකර කලාපයෙන් ඛනිජ සම්පත් ලබා ගත් ස්ථානයක් වීමට ඉඩ ඇතැයි ඔහු විශ්වාස කරනු ලැබේ (එම).





පහත් කඳුකර කලාපය හා අනුරාධපුර පුරාණ නගරය ආශ්‍රිත ඛනිජ සම්පත් හුවමාරුව පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී නාලන්ද හා මහනුවර තදාශ්‍රිත ප්‍රදේශයේ හමුවන ඛනිජ සම්පත් පරිහරණය සම්බන්ධ මුල් ඓතිහාසික අවධියේ කාර්යභාරය තීරණාත්මක වී තිබේ. විශේෂයෙන් ම වෑගිරි දේවාලය, ගෝනවත්ත, බඹරගල යන ස්ථානවලින් මණිකර, **මහාචූඩික, පොචුනි** රජ යන පදවි පිළිබඳ ව සඳහන් වේ (*Ic.* Vol. i. 1970 : No. 807, No. 813, No. 814). මෙම ලිපිවල සඳහන් **මහාචූඩ** යන්නෙන් **මහාමැණික භාරකරුවා** යන්න ගම්‍යය වන බවත්, ඒ අනුව මහාචූඩ රජුගේ **මණිකරුවන්** (මැණික්කරුවන්) පාෂාණ කුට්ටි ලබාගැනීම සඳහා මෙම ස්ථානයට සැපත් වන්නට ඇතැයි සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (සෙනෙවිරත්න 1996 ඵ 193). ඔහු ප්‍රකාශ කරන ආකාරයට මෙම පාෂාණ කැබලි මැණික් ගල් හෝ තලාතු මිනිරන් විය හැකි ය. එය එසේ උපකල්පනය කළ හැක්කේ ක්‍රිස්තු වර්ෂ 1 වැනි සියවසේ තම්බපණ්ණියෙන් කැස්බෑ ලෙළිවන් පාෂාණ වර්ගයක් නිර්යාත කළ බව ප්ලිනි වාර්තා කර තිබෙන බැවිනි. කැස්බෑ ලෙළිවන් පාෂාණය වශයෙන් ප්ලිනි හඳුන්වන්නේ තලාතු මිනිරන් බව සෙනෙවිරත්නගේ මතය වේ (සෙනෙවිරත්න 1996 ඵ 193).

මුල් ඓතිහාසික අවධිය වනවිට අනුරාධපුර ඇතුළුපුර ජනාවාසයේ වාණිජ කටයුතු සම්බන්ධ ව උපයෝගීතාවය බහුල වී තිබූ බව දැරණියගල හා කනිංහැම් ද පෙන්වා දී ඇත. දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට මධ්‍ය මුල් ඓතිහාසික අවධිය (Mid - Early Historic) තුළ දෙස් විදෙස් ඛනිජ පාෂාණ බහුල ව භාවිත වී තිබේ (Deraniyagala 1992 : 712). **AG 69** ගෙඩිගේ කැණීම තුළින් දේශීය ඛනිජ පාෂාණ වන ඇමතෙස්තල තිරුවානාල හා රබහල ආදී ඛනිජ පාෂාණවලින් නිර්මිත පබළු හඳුනාගෙන ඇත (එම 1972 : 134 - 135). රොබින් කනිංහැම් දක්වා ඇති අදහස්වලට අනුව ද දෙස් විදෙස් වෙළදාම සම්බන්ධ ද්‍රව්‍යමය සාධක රැසක් $ASW_2$ කැණීමෙන් අනාවරණය වී තිබේ (Coningham 1999 : 127 - 128). ගොඩනැගිලි අවධි H (Structural Period H) තුළින් හමුවන ද්‍රව්‍යමය සාධක අතර ක්‍රිස්තු වර්ෂ පළමු වැනි ශත වර්ෂයට අයත් අක්ෂරයෙන් පෙළ සටහන් වූ පරුමකවරයෙකුට

අයත් මැටි මුද්‍රාවක් හමු වී තිබේ. එම මැටි මුද්‍රාව තුළ අන්තර්ගත පාඨය ලෙස තිසපුත **පරුමක** යන්න සඳහන් වේ (එම : 128). රොබින් කනිංහැම් පෙන්වා දී ඇති ආකාරයට මෙම නාමයට සමාන නමක් මිහින්තලයේ ගුහා ප්‍රදානයක් තුළින් හඳුනාගත හැකි ය (එම). පරණවිතාන විසින් මෙම ලිපිය වාර්තා කර තිබෙන (*Ic*. Vol. i. 1970 : No. 22). අතර එම ලිපිය අයත් වී ඇත්තේ (**බඩගරික පරුමක**) භාණ්ඩාගාරික පරුමකවරයෙකුට බව පැහැදිලි වේ (එම). එසේ නම් ඇතුළුපුරයෙන් හමුවන පරුමක මුද්‍රාව මිහින්තලය අවට ක්‍රියාත්මක වූ වානිජ කටයුතුවලට අදාළ ශ්‍රේණියකට සම්බන්ධ වීමට ඉඩ ඇති බව පෙන්වාදිය හැකි හැකි අතර ක්‍රි.පූ.2-1 වැනි සියවස්වල දී උතුරු ප්‍රදේශයෙන් ද මෙ වැනි ආකාර මැටි හා ලෝහ මුද්‍රා වානිජ කටයුතුවලට අදාළ ව හමූ වී තිබෙන බව සුදර්ශන් සෙනෙවිරත්න ප්‍රකාශ කර ඇත (සෙනෙවිරත්න සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි).

මේ අනුව මුල් ඓතිහාසික සමය තුළ දී ඇතුළුපුරය තුළින් කඳුකරයේ ප්‍රභවය ලැබූ මැණික් ගල් වර්ග සුලභ ලෙස වාර්තාවීම තුළින් පැහැදිලි වන්නේ මෙම හුවමාරු යාන්ත්‍රනය පහත් තැනිතලා කලාපවල සිට අනුරාධපුය දක්වා සිදු කර ඇති බව ය. ක්‍රි. පූ. තුන් වැනි සියවසින් පසු දුට්ඨගාමිණී රාජ යුගය සම්බන්ධ මහාවංස විස්තරවල ද නගරයේ දකුණු පසින් පිහිටන ස්වභාවික සම්පත් පිළිබඳ විස්තර දක්වා තිබීමන් පැහැදිලි වේ.[4] අනුරාධපුරය ඍජු ආකාරයට කඳුකර හා පහත් කඳුකර කලාපවල තිබූ ඛනිජ හා ඛනිජ පාෂාණ ලබාගැනීමට උත්සුක වී ඇති බව ඉහළ කලා ඔය පද්ධතිය අළලා සිදු කර ඇති සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයන තුළ දී හඳුනාගෙන ඇත (සෙනෙවිරත්න 1996:194). දඹුල්ලේ සිට මහනුවර සානුව දක්වා දිවගිය පුරාණ මාර්ගය ආශ්‍රිත අධ්‍යයනයක් සිදු කර ඇති සෙනෙවිරත්න එම මාර්ගය ඔස්සේ ස්ථානගත ව ඇති ශිලා ලිපිවල පුද්ගලික නාමයන් වශයෙන් චූඩ, චූඩි යනුවෙන් සඳහන් වන බවත් (එම), මෙම පදවලින් මැණික් කර්මාන්තය ආශ්‍රිත කටයුතු හඳුනාගත හැකි බැවින් ගහපති පිරිස් මෙම නාමය

4 පුරයෙන් ගිණිකොන් දිග සතර යොදුනක් දුර සමන් වැව් නම් ගම බොහෝ මැණික් උපනහ. නුවරින් දකුණු දිග අට යොදුන් මත්තෙහි අම්බට්ඨ කොළ නම් දනව්වහි ලෙනක රිදී උපනහ (*මව*. XXVIII : 18 - 23)





ගැනීම තුළින් මැණික් හෝ වටිනා ඛනිජ පාෂාණයක් ආශ්‍රිත වාණිජ කටයුතු සංකේතවත් කරන බව ඔහුගේ මතය වේ (එම). ඒ සඳහා උදාහරණ රුසිගම පිහිටි ගහපතිවරයෙකුගේ නාමය **චූඩධර** ලෙසත් (*Ic*. Vol. i. 1970 : No. 828). මහඇලගමුවේ ශිලා ලිපියක **චූඩ** ලෙසත් ඛනිජ පාෂාණ ආශ්‍රිත ක්‍රියාවලියේ නිරත වූ පුද්ගලයින් ගැන හඳුන්වා තිබේ (සෙනෙවිරත්න 1996 ፡ 194).

ඉහතින් විස්තර කරනු ලැබූ මාර්ගය ආශ්‍රිත සමාජ පුරාවිද්‍යාව කඳුකර ප්‍රදේශයේ එ කල පැවති සමාජ ආර්ථික ව්‍යුහය පිළිබඳ ව ඉඟි අප වෙත ලබා දේ. විශේෂයෙන් ම ඛනිජ හා ඒ ආශ්‍රිත කටයුතුවල දී මෙම මාර්ගය ඔස්සේ පිහිටා තිබූ ජනාවාස පමණක් නොව නිෂ්පාදන මධ්‍යස්ථාන පිළිබඳ ව ද සාක්ෂි බඹරගල ශිලා ලිපියේ **චිත නගර** කුඩාගල ශිලා ලිපියේ පුග (ශ්‍රේණිය) බඹරගල හා ඇඹුල්අඹේ **පොච් රාජ පරම්පරාව** (**පොචනික**) (*Ic*. Vol. i. 1970 : No. 841, No. 830, No. 831, No. 832, No. 833) පිළිබඳ ව සඳහන් වීමෙන් මෙම කණ්ඩායම මහනුවර සානුව දක්වා ම ඛනිජ සම්පත් හසුරුවා ඇති බව පැහැදිලි වී ඇත (සෙනෙවිරත්න 1996 ፡ 195). ක්‍රි. පූ. පළමු වැනි සියවස පමණ සිට මෙම ප්‍රභූ පිරිස් හුවමාරු මධ්‍යස්ථාන වඩා පුළුල් ආකාරයට හසුරුවමින් අන්තර් වාණිජ ප්‍රදේශ ඔස්සේ නිෂ්පාදන සහ වාණිජ සංකීර්ණ වෙතට ලෝහ වර්ග හා මැණික් ගල් ආදිය පරිවහනය කර ඇත (එම). දඹුල්ලේ සිට උතුරට දිවෙන මාර්ගය අනුරාධපුරය ඔස්සේ **මහාතීර්ථයටත්**, උතුරු දිගින් **ජම්බුකෝලපට්ඨනයටත්** ද්‍රව්‍යය පරිවහනය කරන ලද මාර්ගය ලෙස සෙනෙවිරත්න හඳුනාගෙන ඇත (එම). ඒ අනුව මුල් ඓතිහාසික අවධියේ කඳුකර කලාපය ආශ්‍රිත ව ජීවත් වූ ජන පිරිස් අනුරාධපුරය වෙත ආයාත කළ ඛනිජ ද්‍රව්‍යය එක්රැස් වූ ස්ථානය නගරය ආසන්නයේ ක්‍රියාත්මක වෙළඳපොළ (නිගම) තුළට පැමිණිය යුතු ය. එ වැනි නිගමක් පිළිබඳ සාධක වෙස්සගිරියේ B පර්වත මස්තකයේ පිහිටි ක්‍රිස්තු වර්ෂ අද වැනි සියවසට අයත් ශිලා ලිපිය අනුව හඳුනාගත හැකි ය.[5] අනුරාධපුර නගරයේ නැගෙනහිරින් හා උතුරින්


5 (i) සිධ මුජිතගම නකරක නිගමෙ තලවිකව කුටුබික
(ii) වචිච (පර) වචිච ගමිණි අයහ පුති
(iii) දෘත ..................

පිහිටන වෙළඳපොලවල් පිළිබඳ සාධක ලබුඇටබැඳිගල හා තෝනිගල ආදී ශිලා ලිපිවල ද සඳහන් වේ. වෙස්සගිරියේ ඇති ලිපියේ සඳහන් වන **මුජිතගම නකරක නිගම** අනුරාධපුරයේ නගරයට දකුණින් ස්ථානගත ව තිබූ වෙළඳපොල වීමට ඉඩ පවතින බව උපකල්පනය කළ හැකි අතර අනුරාධපුරයට දකුණු ප්‍රදේශයෙන් පැමිණි ඛනිජ සම්පත් ඇතුළු සෙසු සම්පත් මෙ වැනි නිගමස්ථානයක් (වෙළඳපොලක්) තුළ හුවමරු වන්නට ඇත. එය නගරයේ දකුණු ප්‍රදේශයේ මුල් ඓතිහාසික අවධියේ භූ දර්ශනය ගොඩනැගීමේ දී බෙහෙවින් ම වැදගත් වන්නට ඇත. මේ අනුව අනුරාධපුර සාර්ව භූ දර්ශනයේ අවකාශය ගොඩනැගීමේ දී ඛනිජ සම්පත් කළමනාකරණය තුළ දී සම්පත් අත්පත් කර ගැනීම, නිෂ්පාදනය හා බෙදාහැරීම සම්බන්ධ යාන්ත්‍රනයට අදාළ ක්‍රියාදාමය ඉහළ කලා ඔය පද්ධතියේ සිට අනුරාධපුරය දක්වා සිදු වී ඇති ආකාරය අනුව ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරයේ ඉස්මතු වීම හඳුනාගත හැකි ය. (බලන්න රූප සටහන් අංක 5.6)

මෙම ලිපිය තුළින් නගරයෙහි වෙළඳ සංවිධානයක් ඉසුරුමුණි විහාරයට ලබාදුන් වැව් පිදීමක් පිළිබඳ ව සඳහන් වේ (සේනානායක 2008 : 93).








රූප සටහන් අංක 5.6

ඉහළ කලා ඔය පද්ධතියේ සිට අනුරාධපුරය දක්වා මුල් ඓතිහසික අවධියේ සම්පත් පරිවහනය වීම සම්බන්ධ ක්‍රියාවලියට අදාළ රූප සටහන

ඉහතින් විස්තර කර ඇති සම්පත් හුවමාරු ජාලය ඉහළ කලා ඔය පද්ධතියේ සිට පහළට අනුරාධපුරය දක්වා පැමිණීමේ දී අන්තර් හුවමාරු මධ්‍යස්ථාන කඩ හා වැව් ගම් (වාපිගාම) නගර ඔස්සේ මහා නගරයට පැමිණ ඇති බව රණගිරිමඩ, දඹුල්ල, අවුකන, තෝනිගල යන ස්ථාන ඇසුරින් හඳුනාගත හැකි ය. එම ස්ථානවල ඇති මුල් ඓතිහාසික අවධියේ ශිලා ලිපිවල **අබනගර** (Ic. Vol. i. 1970 : No. 959, 962) **මතුකගම** (එම: No. 837) **කඩපිවපි** (එම: No. 1151) **රකිතගම** (එම : No. 840) **උපරිකඩ**

(එම : No. 841) **අක නගර** හා **පඩගම** (එම : No. 1051 - 1052) යන ස්ථාන ඇසුරින් එ වැනි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වී තිබේ. අනුර මනතුංග පෙන්වාදෙන ආකාරයට පූර්ව නාගරික මට්ටමේ සිට උපරිම නාගරික අවධිය වන විට අනුරාධපුර නගරයට පර්යන්ත ප්‍රදේශවල **නකනගර, ලබුනගර, ලෙහෙක නගර** ආදී වශයෙන් උප නගර බිහි ව තිබූ බව පෙන්වා දී තිබේ (Manatunga 1987 : Fig. 01).

මේ ආකාරයට ග්‍රාම නගර හා මහ නගර යන සංකල්පය තුළ මහ නගරයක් ලෙස අනුරාධපුරය ඉස්මතු වීම උදෙසා බහුවිධ සම්පත් හුවමාරු යාන්ත්‍රණයේ දී වාණිජ කටයුතු ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ ශ්‍රේණි වැදගත් වී ඇත. මුල් ඓතිහාසික අවධියට අයත් මුල් බ්‍රහ්මී අභිලේඛන තුළින් එ වැනි ශ්‍රේණි හා වාණිජ කටයුතු පිළිබඳ ව තොරතුරු ශ්‍රී ලංකාව ඇසුරින් හඳුනාගත හැකි බව පරණවිතාන පෙන්වා දී තිබේ (*Ic*. Vol. i.: xcviii - xcix). ඔහු විස්තර කර ඇති ආකාරයට එම කාල වකවානුව තුළ වාණිජ කටයුතුවල නියැලුණු ජන පිරිස් **වනිජ, පුය, පුක, පුගිය, පුගියන** ආදී නාමයන්ගෙන් හඳුන්වා තිබේ (එම). විශේෂයෙන් ම උතුරුමැද පලාත තුළ හා ඊට යාබද ප්‍රදේශ තුළ මේ ආකාරයේ වාණිජ කටයුතු පිළිබඳ ව සඳහන් වේ. පුලියන්කුලමේ මුල් බ්‍රහ්මී අභිලේඛනවල **දමෙඩ වනිජවරුන්** පිළිබඳ ව සඳහන් වේ (එම : No. 356, 357). පරණවිතාන පෙන්වාදෙන ආකාරයට මොවුන් දමිළ වෙළෙන්දන් වේ (එම : xcviii). මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පලාත තුළ වාණිජ කටයුතුවල නියැලි කණ්ඩායම් අතර වෙළඳකුල හා සමාගම් වශයෙන් කටයුතු කළ පිරිස් ද හඳුනාගත හැකි ය. ඒ අතර මහාකපුගොල්ලෑව මුල් බ්‍රහ්මී ශිලා ලිපියේ එන **පුගියන** (එම : No. 135), අලියකඩ ලිපියේ **පුගියන** (එම : 138) යන නම්වලින් වෙළඳ සමාගම් (Corporation) හැඳින්වෙන බව පරණවිතාන අර්ථ නිරූපණය කර ඇත (එම : xcix).පුග හා ශ්‍රේණි පිළිබඳ විග්‍රහ කරන මහින්ද කරුණානායක එ මඟින් යම් ප්‍රදේශයක මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා සැකසුන ප්‍රාදේශිය සංස්ථාවක් ශ්‍රේණි වශයෙන් නිර්මාණය වූ බව පෙන්වා දී ඇත (කරුණානායක 1967:63-76) එසේ ම **ගන** වශයෙන් මුල් බ්‍රහ්මී





ලිපිවල හැඳින්වෙන කණ්ඩායම් ද වෙළඳ සමාගම් විය හැකි බව වෙස්සගිරියේ ඇති ශිලා ලිපියකින් හඳුනාගත හැකි ය (*Ic*. Vol. i.: No. 86).

ශ්‍රී ලංකාවේ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල වාණිජ කටයුතුවල නියැලි ජන පිරිස අතර බරතවරුන් ද කැපීපෙනෙන ජන කණ්ඩයමකි (සෙනෙවිරත්න 1987 : 73). මුල් ඓතිහාසික අවධියට අයත් බරත ශිලා ලිපි 07ක් උතුරුමැද පලාත ඇසුරෙන් හඳුනාගත හැකි ය (*Ic*. Vol. i. :1 - 25). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට ශ්‍රී ලංකාව තුළින් බරත ලිපි 22ක් හඳුනාගගෙන තිබේ (සෙනෙවිරත්න 1987 : 01). විද්වතුන් කිහිප දෙනෙකුගේ යෝජනාවලට අනුව **බරත** යන පදය අදහස් රාශියකින් යුක්ත වේ. පාකර් දක්වා ඇති අදහස්වලට අනුව මෙම පදය සංස්කෘත **භෘට** යන්නෙන් බිඳී එන බැවින් එයින් **කම්කරුවා** යන්න ගම්‍ය වන බව ප්‍රකාශ කර තිබේ (Parker 1909 : 436. No. 05). වික්‍රමසිංහ මෙම පදය මඟින් සංස්කෘත **භ්‍රාතෘ** හෙවත් **ස්වාමියා** යන අරුත ඇති පදයෙන් ප්‍රභවය වී ඇති බව පෙන්වා දී තිබේ (Wickramasinghe 1912 : 140 - 141). බෙල් ප්‍රකාශ කර ඇති පරිදි ඉන්දියාවෙන් පැමිණි ජන කණ්ඩායමක් මෙයින් ගම්‍යය වන බව දක්වා තිබේ (Bell 1917 : 18 - 201). පරණවිතානගේ මතය වන්නේ **බරත** යන්නෙන් ස්වාමියා යන්න ගම්‍ය වන බවයි (*Ic*. Vol. i. 1970 : cv). ඔහු පෙන්වාදෙන ආකාරයට **බරත** යන පදයෙන් බත යන්න බිඳී ආ බව පෙන්වා දී ඇත (එම). මෙම අදහසට එල්ලාවල ද එකඟ වී තිබේ (Ellawala 1969 : 41).

**බරත** යන පදය වෙනස් ම සන්දර්භයක ලා අර්ථ දක්වා ඇත්තේ මෙලෝනි විසිනි. ඔහු විසින් මෙම ජන කණ්ඩායම වයඹදිග ලංකාවේ හා අග්නිදිග තමිල්නාඩුවේ වෙරළබඩ ප්‍රදේශවල ජීවත්වන **පරවර** ජනයා සමඟ සම්බන්ධතාවයක් පවතින බව පෙන්වා දී ඇත (සෙනෙවිරත්න 1987 : 68). ඔහුගේ විග්‍රහයට අනුව සංගම් සාහිත්‍යයේ පරතවර් ජනයා පිළිබඳ ව කර ඇති විස්තර හා **පරවර ජන කොටස** පිළිබඳ ව දැක්වෙන මානවවංස සටහන් ද අනුව මෙම ගෝත්‍රයේ මූලාරම්භය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා යුගය දක්වා දිවයන බව පෙන්වා දී ඇත (එම). **පරවර**


ජනයාගේ මූලික සංස්කෘතික අනන්‍යතාවය සාගර සම්පත් මත රඳා පැවැත් වූ එකක් බැවින් ඔවුන්ගේ විශේෂ ප්‍රාගුණ්‍යතාවය හක් බෙල්ලන් හා මුතු ලබාගැනීමේ කාර්යය හා බද්ධ ව පවතින බව ද පෙන්වා දී ඇත (එම : 69). ඒ අනුව පරවර ජනයා මුල් ඓතිහාසික අවධියේ දී අන්තර් වෙරළ ප්‍රදේශ අතර හක් බෙල්ලන්, මුතු, මැණික් හා අශ්වයින් ඇතුළු වෙළඳ කටයුතුවල යෙදුණු බවට සාධක තිබෙන බව ද පෙන්වා දී ඇත (එම : 73). මහාවංසයේ මේ කාලපරිච්ඡේදය තුළ මදුරාපුරය සමඟ ශ්‍රී ලංකාවේ විජය රජු සිදු කළ ගනුදෙනු පිළිබඳ ව සඳහන් වේ (*මව.* vii : 49 - 52).

**බරතයන්** යනු කවුරුන්දැයි පිළිබඳ විග්‍රහය එසේ වුව ද ශ්‍රී ලංකාවේ බරතයන් ආශ්‍රිත වාණිජ සම්බන්ධතා රාශියක් පැවති බව හඳුනාගත හැකි ය. ඒ අතරින් උතුරුමැද පළාතට අයත් පොළොන්නරු දිස්ත්‍රික්කයේ දූවේගලින් හමුවන බරත ශිලා ලිපියේ (*Ic*. Vol. i.No. 270) පසෙක නෞකාවක් හා එහි මුදුනේ නන්දිපාදයක් දැකගත හැකි ය (එම. P-1. xxv). එසේ ම පෙරියපුලියන්කුලමේ ලිපි දෙකකින් එකක නන්දිපාදයක්, ස්වස්තිකයක්, ත්‍රිකෝණයක් හා දරණුවක් දැකගත හැකි ය (එම: No. 368, sim. No. 16a, 12 I; 11a, xxvi). මෙයින් මුලින් විස්තර කළ No. 270 ලිපියේ නන්දිපාදය සහිත සංකේත තමිල්නාඩුවේ සාතවාහන කාසිවල ද දැකගත හැකි බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න 1987 : 74). No. 270, No. 368 ලිපිවල අඩංගු යාත්‍රා සංකේත මඟින් මොවුන් සමුද්‍ර ආශ්‍රිත වෙළඳාමේ නියුතු ජන කණ්ඩායමක් බව විශ්වාස කළ හැකි ය (එම). එසේ ම කුරුණෑගල මිල්ලෑව විහාරයෙන් හමුවන No. 1049 ලිපිය මගින් **බරතදූතක** යන්න පිළිබඳ සඳහන් වේ (*Ic*. Vol. i. No. 1049). එ මඟින් බරතවරුන් දූත කටයුතු සිදු කළ බව ද හඳුනාගත හැකි ය. මේ තත්ත්වයන්ට අනුව බරතවරු වෙළඳාම ආශ්‍රිත කටයුතුවල හා දූත කටයුතුවල නියැලුණු ජන කණ්ඩායමක් බව සෙනෙවිරත්නගේ මතයයි (සෙනෙවිරත්න 1987:74). අනුරාධපුරයට බරතවරුන්ගෙන් ලැබී ඇති දායකත්වය අභයගිරි විහාරයෙන් හමුවන **දමෙඩ ගහපති** ලිපියෙන් පැහැදිලි වේ. එම ලිපියේ සඳහන් වන **ඉළබරත** යන නම දකුණු ඉන්දියාවේ ක්‍රියාත්මක වරාය නගරයක් බව






සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න 1987 : 75). මෙම කාරණාවලට අනුව මුල් ඓතිහාසික අවධියේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරින් කරුණු විග්‍රහ කිරීමෙන් පරුමකවරු, ගහපතිවරු, බරතවරු හා විවිධ ශිල්පීය කණ්ඩායම් අනුරාධපුර නාගරික ව්‍යුහය වඩා පුළුල් ආකාරයෙන් ගොඩනැගීම සඳහා විශාල දායකත්වයක් දක්වා ඇති බව හඳුනාගත හැකි ය.




(Seneviratne 1996 : Fig. 09)

රූප සටහන් අංක 5.7
මුල් ඓතිහාසික යුගයේ ඉහළ කලා ඔය පද්ධතියේ සිට වියළි තැනිතලා ප්‍රදේශ හරහා අනුරාධපුරයට ඛනිජ සම්පත් ඇදී ඒමට පිහිටුවා ගත් කඩ, ග්‍රාම, ශ්‍රේණි කුලවල විහිදීම දැක්වෙන රූප සටහන




(Seneviratne 1996 : Fig. 09)

රූප සටහන් අංක 5.8
මුල් ඓතිහාසික යුගයේ ඉහළ කලා ඔය පද්ධතියේ නිෂ්පාදිත බෙදාහැරීම් සංකීර්ණය සම්බන්ධ සංකීර්ණ ව්‍යුහය දැක්වෙන රූප සටහන

අනුරාධපුර පුළුල් භූ දර්ශනය ගොඩනැගීමේ දී සමාජ පුරාවිද්‍යාත්මක කරුණු දෙස බැලීමේදී සම්පත් ඇති ප්‍රදේශ මුල් ඓතිහාසික අවධියේ ප්‍රජාව විසින් මැනවින් ග්‍රහණය කර





ගෙන තිබේ. ඒ තත්ත්වය මත මධ්‍යගත සැලසුම් නගරයක් ලෙස අනුරාධපුරය ඉස්මතු වීමට රට අභ්‍යන්තරයේ සිට අනුරාධපුරයට දකුණින් හා නැගෙනහිර ප්‍රදේශවලින් ලබාදුන් තල්ලුව අඛණ්ඩව බලපා ඇති බව පෙනේ.

මුල් ඓතිහාසික අවධියේ දී භූ දර්ශනය ගොඩනැංවීමේ දී අනුරාධපුරයට සිව් දෙසින් ම සම්බන්ධ වූ මාර්ග ජාලය ද අතිශයින් ම වැදගත් වේ. මූලාශ්‍රයගත හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව නගරය හා සම්බන්ධ වූ මාර්ග ජාලය පිළිබඳ ව අධ්‍යයනය කළ හැකි ය. සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට අනුරාධපුර නගරයෙන් දකුණු දෙසට දිවයන මාර්ගය මහාමේඝවනයේ නැගෙනහිර දොරටුව ඉදිරිපසින් තිසා වැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය හරහා කඳුරටට දිව ගොස් තිබේ (*සද්ලං* : 539). මහාවංසයේ මෙම මාර්ගය හඳුන්වා ඇත්තේ රජවීදිය ලෙසට ය (*මව.* xx : 37-38) ඉතා මෑතදී මධ්‍යම සංස්කෘතික අරමුදල මහාවිහාර ව්‍යාපෘතිය සිදු කළ කැණීම්වල දී රත්නමාලි දාගැබට යන මාර්ගයත් ඇතුළුපුරයේ දකුණු දොරටුවත් අතර ප්‍රදේශයේ අනාවරණය කර ගෙන තිබේ. මුල් ඓතිහාසික අවධියේ ආර්ථික හා දේශපාලන වශයෙන් සුවිශේෂ කාර්යභාරයක් මෙම මාර්ගය ඔස්සේ සිදු වී ඇති බව අප මීට පෙරදී ද පෙන්වා දී ඇත. විශේෂයෙන් ම ඛනිජ සම්පත් පරිවහනය සම්බන්ධ තොරතුරු ඇතුළත් අභිලේඛන රාශියක් රුසිගම, දෙමදඹය, දඹුල්ල, තෝනිගල ආදී ස්ථානවලින් ලැබෙන බැවින් එම ප්‍රදේශ ඔස්සේ මෙම මාර්ගය පිහිටා ඇති බව සිතියමක් අධ්‍යයනය කිරීමෙන් දත හැකි ය (*Ic*. Vol. i. 1970 : Map. 01). විශේෂයෙන් ම නගරයට දකුණින් ස්ථානගත වූ මේ මාර්ගය ආසන්නයේ විවිධ නිෂ්පාදන කටයුතු සිදු වූ ග්‍රාම ස්ථානගත ව තිබූ බව මූලාශ්‍රයගත තොරතුරුවල සඳහන් වේ. පණ්ඩුකාභය රාජ යුගයේ දී පිහිටුවනු ලැබූ **ද්වාරගාම** (*මව.* x:88). මුල් ඓතිහාසික අවධියේ ඇතිවන සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වය මත වෙළඳපොලක් දක්වා වර්ධනය වන්නට ඇති බව අපට උපකල්පනය කළ හැකි සාක්ෂි ගණනාවක් තිබේ. ඒ සඳහා වන කාරණා අතරින් නුවරින් දකුණු ප්‍රදේශය (වර්තමාන ජේතවන භූමිය) ආශ්‍රිත භෞතික සංස්කෘතිය අධ්‍යයනය වැදගත්

වේ. ජේතවන භූමිය මල්වතු ඔයේ වම් ඉවුරේ උස් බිම් කඩක පිහිටා ඇත. විශේෂයෙන් ම බාහිර දුරකතර ප්‍රදේශවලින් ඇදී එන භාණ්ඩ හුවමාරු කර ගැනීමේ දී මුලින් **ද්වාරගාම** වශයෙන් පිහිට වූ මෙ වැනි ගම් පසු ව **නිගම** එසේත් නැතහොත් **වෙළඳපොල** දක්වා වර්ධනය වූ බව ලබුඇටබැඳිගල ශිලා ලිපියේ, (*Ez*. Vol. iii. 1928 - 33 : 247 - 255), තෝනිගල ශිලා ලිපියේ (එම : No. 17) හා වෙස්සගිරි පර්වත ලිපියේ සඳහන් නිගම (සේනානායක 2008 : 93) පිළිබඳ විස්තරවලින් පැහැදිලි වේ. දීපවංසයේ මෙ වැනි භාණ්ඩ හුවමාරු වන ස්ථාන හඳුන්වා ඇත්තේ **අන්තරාපන** ලෙස ය (*දීව*. ix : 36). නගරයෙන් දකුණු දෙසින් වූ භාණ්ඩ හුවමාරු කරගත යුතු වෙළඳපොලක් (නිගම) දකුණු ගමන් මාර්ගය හා සම්බන්ධ වී තිබිය යුතු ය. එ වැනි ස්ථානයක් ලෙස අපට අද හඳුනාගත හැක්කේ වත්මන් ජේතවන භූමියයි. මුල් ඓතිහාසික අවධියේ ජේතවන භූමිය හඳුන්වා ඇත්තේ නන්දන උයන ලෙස ය (*මව*. xvv; *දීව*. xiii. 02; *සපා*. xxxiii: 71). නන්දන උයන එක්තරා ආකාරයකට මාර්ගවලින් වට වූ භූමියක් ලෙස එවකට පිහිටා තිබූ බව මූලාශ්‍රය තොරතුරුවලින් පැහැදිලි වේ. මහාවංසයේ එක් සඳහනක මල්වතු ඔය බටහිර ඉවුරට සමාන්තර ව දිවගිය මාර්ගයක් පිළිබඳ විස්තර කර ඇත. මහා සීමාව සලකුණු කරන විස්තරයේ ද මෙම මාර්ගය පිළිබඳ ව සඳහන් වේ (*මව*. xv : 209 - 211). එසේ ම නන්දන වනයේ දකුණු දිගින් පැමිණි මිහිඳු මහ රහතන් වහන්සේ මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව තුළින් මහමෙව්නා උයනට ඇතුළුවී ඇත (එම : 03). නන්දන උයන වටා වූ මාර්ගය හා දකුණු දිග ප්‍රධාන මාර්ගය එකිනෙකට සම්බන්ධ වූ බව ඉන් පැහැදිලි වන අතර මෙම මාර්ගය දුටුගැමුණු එළාර යුද්ධයේ දී ද භාවිත වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ (එම xxv. 68 - 70). නගරය හා සම්බන්ධ වූ දක්ෂිණ ප්‍රධාන මාර්ගය නන්දන උයන වටා වූ මල්වතු ඔය බටහිර ඉවුර දිගේ ගිය මාර්ගයට සම්බන්ධ ව තිබූ බව සුමන සාමණේර හිමි දකුණු අකු ධාතුව රැගෙන ඒමට භාවිත කිරීමෙන් පැහැදිලි වේ (එම. xvii : 29 - 30). මෙම මාර්ග පද්ධතියේ පිහිටීම අනුව අනුරාධපුර නගරයේ දක්ෂිණ දිග ප්‍රදේශය එක් පසෙකින් දකුණු ප්‍රධාන මාර්ගය සම්බන්ධ වූ අතර එම මාර්ගය හා බද්ධ වූ





උප මාර්ග පද්ධතියකින් ද සම්බන්ධ ව තිබූ බව මූලාශ්‍රය කරුණු අනුව වටහාගත හැකි ය. 1960 වසරේ දී ඇතුළුපුරයේ දකුණු ප්‍රාකාරයේ සිදු කළ කැණීමක දී අඩි 58ක් පළල උතුරු දකුණු දිශානුගත ව දිවෙන මාර්ගයක් හඳුනාගෙන ඇත (*ASCAR*. 1960 : 69). එම මාර්ගයේ විහිදීම දකුණු දොරටුවෙන් දකුණු දෙසට වන මාර්ගයක් බව මාර්ගයේ විහිදීම අනුව හඳුනාගත හැකි ය. දක්ෂිණ ස්තූපය ආසන්න ස්ථානයක සිදු කළ කැණීමක දී දකුණු මාර්ගය සම්බන්ධ තවත් තොරතුරු හඳුනාගෙන තිබේ (*ASCAR*. 1978 : 07). එසේම මහාවංසයේ විස්තර වන ආකාරයට නගරයේ දකුණු දෙසට විහිදෙන මාර්ගය **රජවීථිය** වශයෙන් හඳුන්වා ඇත (*මව*. xx : 40 - 41). හේම රත්නායකගේ මතය වන්නේ ද මහාවංසයේ සඳහන් රජ වීදිය 1960 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කැණීමකින් අනාවරණය කරගත් මාර්ගය විය හැකි බව ය (Ratnayake 1984: 08).

මහාවංසයේ විස්තර වන ආකාරයට දකුණු දිග මාර්ගය විවිධ කටයුතු සඳහා උපයෝගී කර ගෙන ඇත. ඒ අතරින් දුටුගැමුණු රජු සාම්ප්‍රදායික ජල උත්සවයකට සහභාගි වීම සඳහා තිසා වැවට ගමන් කිරීමට මෙම මාර්ගය භාවිත කර තිබේ (*මව*. xxvi :7-8). මහාවංසයට පසුකාලීන මූලාශ්‍රයක් වන සද්ධර්මාලංකාරයේ ද අනුරාධපුර නගරයේ දකුණු ගමන් මාර්ගය තිසා වැව, ඉසුරුමුණිය හා වෙස්සගිරිය පසුකොට මලය රට දක්වා ඇදී ගිය බව සඳහන් කර තිබේ (*සද්ලං*. 539). මූලාශ්‍රයවල සඳහන් මෙම මාර්ගය පිළිබඳ පුරාවිද්‍යාත්මක තොරතුරු කඳුකර කලාපයට ආසන්න ම කලා ඔය හරහා ඉදිකර ඇති පාලම් මඟින් ද තහවුරු වේ. එම පාලම් අතර පාලන්කඩවල ගල් පාලම, කිරිබාව දැව පාලම, දෙහිල්ගමුව අසළ ගල් පාලම, කටියාව අසළ රඳා තොට පාලම, මහඉලුප්පල්ලම දැව පාලම දකුණු දිග ගමන් මාර්ගය මලය රට දක්වා විහිදී ගිය බවට ලැබෙන පුරාවිද්‍යාත්මක සාධක ලෙස පෙන්වාදිය හැකි ය (Vidanapathirana 2007:167).

අනුරාධපුර නගරයට දකුණින් කඳුකර කලාපය දක්වා දිවගිය මෙම ගමන් මාර්ගය නිසා තදාශ්‍රිත ප්‍රදේශවල විවිධ කාර්යයන් පෙරදැරි කරගත් නිෂ්පාදන ක්‍රියාවලීන් සිදු වී ඇති

බව සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධකවලින් හඳුනාගත හැකි ය. මහාවංසයේ සඳහන් වන ආකාරයට නගරයට දකුණු දෙසින් දැකගත හැකි වූ මාර්ගය ආසන්නයේ කුම්බකාර ග්‍රාමය ස්ථානගත ව තිබේ (*MvT*. 48; *ථූව* : 213). අනුරාධපුර නගරයේ දක්ෂිණ මාර්ගය ආසන්නයේ ක්‍රියාත්මක වූ කුම්බකාර ග්‍රාමය පිළිබඳ විස්තර දුට්ඨගාමිණී රාජ යුගයට අදාළ කත පුවත්වල ද අන්තර්ගත වී තිබේ. එයින් එක් විස්තරයක දුටුගැමුණු රජුගේ වේළුසුමන යෝධයා මැටි බඳුනක් ලබාගැනීම සඳහා කුම්බකාර වීදිය දිගේ ගිය බව සඳහන් වේ (*Mv*. xxvii : 525). එසේ ම දුටුගැමුණු එළාර යුද්ධයේ දී දුටුගැමුණු රජු විසින් එළාර රජු දක්ෂිණද්වාරයට ආසන්න ස්ථානයක දී අල්ලා ගත් බව විස්තර කර ඇතඃඑමග ංංඩ ඵ 68*. එම ස්ථානය අනුරාධපුර දකුණුදිග භාගයේ කුම්බකාර ග්‍රාමයට බටහිර පසින් වූ එළාර සොහොනට (වත්මන් දක්ෂිණ ථූපයට) නැගෙනහිරින් වූ ස්ථානයක් බව සඳහන් වේ (*MvT* : 487).

දුට්ඨගාමිණී රාජ්‍ය කාලය තුළ දකුණුදිග ගමන් මාර්ගය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු අතර පුරයෙන් දකුණු දිග අට යොදුන් ගිය තැන වූ ලෙනක තිබූ රිදී ලබාගැනීම හා එම රිදී ගැල් මඟින් අනුරාධපුරයට ප්‍රවාහනය කිරීම පිළිබඳ ව සඳහන් වේ (*Mv*. xxviii : 20 - 23). මෙම ගමන් මාර්ගය මලය දේශයට සම්බන්ධ වූ බව මූලාශ්‍රය තොරතුරු අනුව හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම දකුණු මාර්ගය ඔස්සේ අනුරාධපුරයට ආයාත කළ වටිනා ඛනිජ ද්‍රව්‍යය හා ලෝහයන් පිළිබඳ ව තොරතුරු සඳහන් වේ. ඒ අතර අම්බට්ඨකෝලයෙන් රිදී ලැබීමේ පුවත ඉත වැදගත් වේ. මූලාශ්‍රයන්හි අම්බට්ඨ කෝලය වශයෙන් හඳුන්වා ඇත්තේ වර්තමාන නාලන්ද ප්‍රදේශයයි. නාලන්ද ප්‍රදේශය ආශ්‍රිත ව ඉතා මෑත දී සිදු කරනු ලැබූ භූ සමීක්ෂණ මඟින් රිදී සහ රත්‍රන් පවතින බව සොයාගෙන තිබීමෙන් පුරාණයේ සිට මේ ප්‍රදේශය ලෝහ සම්පත් ලබාගැනීමට ආකර්ෂණය වූ ප්‍රදේශයක් වශයෙන් හඳුනාගෙන තිබේ (සෙනෙවිරත්න 1996 ඃ 194). මෙම කරුණු සනාත වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතර බඹරගලින් ලැබෙන ක්‍රිස්තු පූර්ව යුගයේ බ්‍රහ්මී ලිපියක කොළගම පිළිබඳ





ව සඳහන් වීම පෙන්වාදිය හැකි ය (*Ic*. Vol. i. 1970 : 815). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට කොල් යන ද්‍රවිඩ වචනයෙන් ලෝහ කර්මාන්තයේ යෙදෙන ශිල්පීන් හඳුන්වා තිබේ. එ බැවින් මුල් බ්‍රාහ්මී ශිලා ලිපිවල කොළගම පිළිබඳ සඳමන් වීමෙන් පෙන්නුම් කරන්නේ එය ලෝකුරුවන් නිවැසි ගමක් බව ය. එ වැනි ශිල්ප ගම්මාන ආශ්‍රයෙන් සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයන අනුව ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදන ඔවුන් ඒ ප්‍රදේශ ඇසුරෙන් සිදු කර තිබෙන බව හඳුනාගෙන ඇත (සෙනෙවිරත්න 1996 ඃ 195). අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රය කරුණුවලින් පෙනෙන ආකාරයට අනුරාධපුර නගරයෙන් දකුණු ප්‍රදේශයේ පිහිටි ඛනිජ හා ලෝහ සම්පත් පරිහරණය දකුණු ගමන් මාර්ගය ඇසුරෙන් සිදු වී තිබෙන බව 2000 වර්ෂයෙන් පසු ජේතවන භූමියේ ස්තරායනය අධ්‍යයනය සඳහා සිදු කරනු ලැබූ පර්යේෂණ කැණීම් රාශියක දී මුල් ඓතිහාසික අවධියට සම්බන්ධ ජනාවාස ස්තරවල ලෝහ හා ඛනිජ පාෂාණ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ බොහෝ සාධක හඳුනාගෙන තිබේ (මැන්දිස් 2009 ඃ 19 - 21). එම පුරාවිද්‍යා සාධකවලට අනුව ජේතවන භූමිය ඇසුරින් යම් නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවී ඇති බව ග්‍රහණය කර ගත හැකි ය.

මලය රට සමඟ මුල් ඓතිහාසික අවධියේ දී අනුරාධපුර නගරය සිදු කරනු ලැබූ ගනුදෙනු හා හුවමාරු ක්‍රියාවලියේ දී ඛනිජ හා ලෝහ සම්පත් පමණක් නොව කුළුබඩු ආශ්‍රිත ක්‍රියාවලිය සිදු වූ බව ද හඳුනාගත හැකි ය. ඇතුළුපුරයේ දකුණු දොරටුව ආසන්නයේ සිදු කරනු ලැබූ පුරාවිද්‍යාත්මක කැණීමක දී එම දොරටුව ආශ්‍රිත ව තිබූ වෙළඳ සල්පිල් වශයෙන් අනුමාන කළ හැකි ස්ථාන තුළ තිබී පුවක්, කොත්තමල්ලි, ගම්මිරිස් යන පාෂාණීභූත වූ කුළුබඩු හඳුනාගෙන තිබේ (Ratnayake 1984 : 05). හේම රත්නායක ප්‍රකාශ කර ඇත්තේ මෙම කුළුබඩු වර්ග අනුරාධපුර දකුණු මාර්ගය ඔස්සේ පැමිණි ද්‍රව්‍යය වන බව ය (එම). අනුරාධපුර නගරයේ පැවති වෙළඳපොළ ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රි.ව.10 වැනි සියවස දක්වා ම අඛණ්ඩ වෙළඳ කටයුතු සිදු වූ ස්ථානයක් බව සස වැනි උදය (ක්‍රි.ව.952) රජුගේ ශිලා ලිපියක සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට නැගෙනහිර වෙළඳපොලේ ආදායම

මැදිරිගිරිය රෝහලට ලබා දී තිබේ (*Ez*.Vol. v : 327). මෙම කාරණා දෙස විමර්ශනාත්මක ව බැලීමේ දී නගරයේ දකුණින් වූ ගමන් මාර්ගය නගරයේ නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ව මුල් ඓතිහාසික අවධියේ සිට සක්‍රීය දායකත්වයක් පසයා ඇති බව මෙම තොරතුරු අනුව හඳුනාගැනීමට අවකාශ සැලසේ.

අනුරාධපුරයේ මුල් ඓතිහාසික අවධියේ භූ දර්ශනය ගොඩනැගීම සඳහා නගරයේ නැගෙනහිර දෙසින් ක්‍රියාත්මක වූ මාර්ගය ද වැදගත් වී ඇත. මෙම මාර්ගය භාතිකාභය රජු දවස මල්වතු ඔය සිට මිහින්තලය දක්වා අලංකාර ව සකසා තිබූ බව මහාවංසයේ සඳහන් වේ (මව. xxxiv : 78 – 79). අනුරාධපුරයේ සිට විහිදුණු නැගෙනහිර ගමන් මාර්ගය මහාවාරිකා මග්ග වශයෙන් හඳුන්වා ඇති බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne 1995 : 130).ඒ අනුව අනුරාධපුරය හා සම්බන්ධ වූ වඩා කාර්ය බහුල වෙළඳ මාර්ගය ලෙස නැගෙනහිර මාර්ගය හැඳින්විය හැකි ය. අනුරාධපුර මහාතඹක නිගම (Ez. Vol. iii. 1928 - 247 : 253) සිට සේරුවිල දක්වා ගමන්ගත් මේ මාර්ගය සේරුනුවර දී ගන ද්වාර ග්‍රාම නැමති ලෝහ නිෂ්පාදිත ගමකට සම්බන්ධ වූ බව සෙනෙවිරත්නගේ මතය වී ඇත (Seneviratne 1995 : 130). මෙම මාර්ගය සම්බන්ධ පුරාවිද්‍යාත්මක සාධක වශයෙන් ඉපැරණි ගල්පාලම් කිහිපයක් මල්වතු ඔය, කනදරා ඔය හා යාන් ඔය ඇසුරින් හඳුනාගත හැකි ය.ඉන් නගරයට ආසන්න මාර්ගය මල්වතු ඔය නැගෙනහිර ඉවුර ආසන්නයේ ද දෙ වැන්න හා තුන් වැන්න කනදරා ඔය හා හූන් කනදරා ඔය ආසන්නයේ ද අනෙකුත් ගල් පාලම් යාන් ඔය හරහා රත්මලේ හා බ්‍රහ්මනයාගම ප්‍රදේශවලද අවසන් වශයෙන් යාන් ඔය අතු ගංගාවක් වන කෝන්ගොල්ලෑව හරහා ගෝකණ්ණ දක්වා ගමන් කරන ආකාරය දැකගත හැකි ය. මෙම මාර්ගයේ සිදු වූ සම්පත් පරිවහන ක්‍රියාවලිය සිව් වැනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කර තිබේ. එම සම්පත් පරිහරණ ක්‍රියාවලිය ඉතා ඍජු ලෙස මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර නාගරික භූ දර්ශනය ගොඩනැගීමට බලපා තිබේ.







ඡායාරූප අංක 5.4
අනුරාධපුර නගරයෙහි නැගෙනහිර දිශාවෙහි මල්වතු ඔය ආශ්‍රිත ව දැකගත හැකි පැරණි ගල් පාලම



ඡායාරූප අංක 5.5
අනුරාධපුර නැගෙනහිර ගමන් මාර්ගය ආශ්‍රිත මහකනදරා ඔය හරහා මිහින්තලය ආසන්නයෙහි ඉදි කර ඇති ගල් පාලම



ඡායාරූප අංක 5.6
අනුරාධපුර නැගෙනහිර ගමන් මාර්ගය
ආශ්‍රිත ව යාන් ඔය හරහා බ්‍රහ්ක්මනයාගම
ඉදිකර ඇති ගල් පාලම



ඡායාරූප අංක 5.7
අනුරාධපුර උතුරු ගමන්මාර්ගය ආශ්‍රිත
කනදරා ඔය ආශ්‍රිත ව තුලාවෙල්ලිය
ප්‍රදේශයේ ඉදි කර ඇති ගල් පාලම







ඡායාරූප අංක 5.8
අනුරාධපුර උතුරු ගමන් මාර්ගය හා
සම්බන්ධ වන මල්වතු ඔය හරහා ඉදි කර
ඇති ගල් පාලම

අනුරාධපුර නගරයේ සිට උතුරු ප්‍රදේශයට සම්බන්ධ වූ ප්‍රධාන ගමන් මාර්ගය නගරයේ උතුරුපස පිහිටි වෙළඳපොලට සම්බන්ධ වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. ඇතුළුපුරයෙන් උතුරු දිගින් මල්වතු ඔය හරහා සහ හාල්පානු ඇළ හරහා ඉදිකර ඇති පැරණි ගල්පාලම් කිහිපයක් අනුරාධපුර පැරණි නගර සීමාවේ දක්නට තිබේ (*ASCAR* 1907:77). එම ගල් පාලම් මතින් ගමන් ගත් උතුරු මාර්ගය කනදරා ඔය එතෙර කොට ගමන් කළ තිබෙන බව කනදරා ඔය හරහා ඉදිකර ඇති නටබුන් වූ ගල් පාලමෙන් ද පැහැදිලි වේ. උතුරින් පිහිටි මෙම මාර්ගය ඉතා පහසුවෙන් ම ප්‍රධාන වරායයන් දෙකක් වූ මාතොට වරායට හා ජම්බුකෝල පට්ටන වරායට සම්බන්ධ වීමට පුළුල් අවකාශයක් තිබේ. අනුරාධපුරයේ සිට උතුරට සම්බන්ධ වූ ප්‍රධාන මාර්ගයක් සන්ගිලිකනදරාවෙන් උතුරට ගමන් කර තිබේ. සන්ගිලිකනදරාවට දකුණින් කුඩාහතු ඔය හරහා වූ පාලමක් ද තිබේ. මෙය Mac Dunhill 1890 දී වාර්තා කර ඇත. වත්මන් තුලාවෙල්ලියේ සිට මන්නාරම දක්වා ගමන් ගන්නා මාර්ගය වූ කලී මාතොට වෙත ලඟා විය හැකි ආසන්නත ම ගමන් මාර්ගයයි. එය මැදවච්චියට බටහිර දෙසින් මාතොට දක්වා ගමන් ගනී. තුලාවෙල්ලියේ

දැකගත හැකි නටබුන් අනුව එම ස්ථානය පුරාණයේ දී යම් ගනුදෙනු ක්‍රියාවලියක් සිදු වූ ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි ය. වර්තමාන තුලාවෙල්ලිය වශයෙන් ව්‍යවහාර වන ගමේ නාමය සකස් වූ ආකාරය පිළිබඳ ව එහි ගැමියන් අතර පවතින ජනප්‍රවාදය වන්නේ රජ දවස අනුරාධපුරයට මල් පරිවහනය කිරීමේ දී තම ගමේ මල් කිරන ලද නිසා එම නම තම ගමට ලැබී ඇති බව ය. ජනප්‍රවාදය කුමක් වුවත් එහි ඇති වැදගත්කම වන්නේ මෙම භූමිය ආශ්‍රයෙන් යම්කිසි වාණිජ ක්‍රියාවලියක් සිදු වී ඇති බව එ මඟින් පැහැදිලි වන බැවිනි. තුලාවෙල්ලිය ගමෙහි පිහිටීම අනුව එම ස්ථානය යාපනයට හා මන්නාරමට ගමන් කළ හැකි ප්‍රධාන සන්දිස්ථානයක් ලෙස භාවිත කළ හැකි ය. මෙම මාර්ගය ඔස්සේ වානිජ කටයුතුවලට සම්බන්ධ වූ ක්‍රියාවලියක් පුරාණයේ දී සිදු වන්නට ඇති බව විශ්වාස කළ හැකි ය.

තුලාවෙල්ලිය ප්‍රදේශයේ සිට මාන්තායි දක්වා ගමන් ගත් මාර්ගයට අමතර ව අනුරාධපුර ඇතුළුපුර බටහිර ද්වාරයේ සිට මහකනදරා ඔය පසු කොට ගම්බිරිස්ගස්වැව, දිවුල් වැව හරහා මහාතිත්ථ වරායට ගමන් කොට ඇති තව මාර්ගයක් පැවති බව විදානපතිරණ පෙන්වා දී ඇත (Vidanapathirana 2007:152-153). බටහිර ද්වාරයේ සිට මහාතීත්ථයට සම්බන්ධ වූ මෙම ගමන් මාර්ගය පිළිබඳ තොරතුරු පුරාවිද්‍යා දෙපොර්තමේන්තුව මඟින් මාන්තායි වරාය නගරයේ නැගෙනහිර ද්වාරයේ සිදු කරන ලද කැණීම්වල දී හඳුනාගෙන ඇත (*ASCAR*. 1950:115). මෙම මාර්ගය පුල්ලිඅඩි තෙක්කම් අමුණ පසුකොට යෝධ වැවට දකුණු දෙසින් මහාතීර්ථයට ගමන් කර ඇති බව 1924 පුරාවිද්‍යා පාලන වාර්තාවේ සඳහන් වේ (*ASCAR*. 1924:8).

මහාතිත්ථ හා ජම්බුකෝල පට්ටන වරායන් සමඟ අනුරාධපුර නගරය කටයුතු කිරීම නිසා වානිජ පරමාර්ථ පෙරදැරි ව සිදු වී ඇති ක්‍රියාවලිය හඳුනාගැනීමට හැකි භෞතික සංස්කෘතික තොරතුරු විශාල ප්‍රමාණයක් අනුරාධපුර ඇතුළුපුරයේ මධ්‍ය මුල් ඓතිහාසික අවධිය තුළින් (Mid - Early Historic 250 - 100 AD) (Deraniyagala 1992 : 712) හඳුනාගෙන තිබේ (එම :712;Allchin 1989. 5 : 1 - 16). දැරණියගලගේ හා ඕල්චින්ගේ






මතය අනුව මෙම කාල වකවානුව තුළ අනුරාධපුර නගරය දකුණු ආසියාවේ පැවති විශාලත ම නගර පහෙන් එකක් වී තිබේ (එම). $ASW_2$ කැණීම් සාධක අනුව මෙම කාල පරාසය ගොඩනැගිලි අවධි (Structural Period) I හා H යන අවධිවලට අයත් වී ඇත (Coningham 1999 : 127 - 128). $ASW_2$ කැණීම තුළින් හක් බෙල්ලන් මුහුදු ආශ්‍රිත ද්‍රව්‍යයවලින් තැනූ මුද්‍රාල රූලේටඩ් මැටි මෙවලම් (RLW), උත්තර උද්දීප්ත කාල වර්ණ මැටි බඳුන් (NBPW), බ්‍රහ්මී අක්ෂර සහිත මැටි මෙවලම්, අස්ථිවලින් තැනූ පන්හිඳ, හස්එබු කාසි, ගස සහ ස්වස්තික කාසි, ඇතා සහ ස්වස්තික කාසි ආදී වර්ග මෙම කාල වකවානුවට අදාළ වාර්තා වී තිබේ (Coningham 1999 : 127 - 128).

ඇතුළුපුරයෙන් වාර්තා වී ඇති රූලේටඩ් (RLW) බඳුන් උතුරු ඉන්දියාවෙන් ආනයනය කරන ලද ඒවා බව දැරණියගල ප්‍රකාශ කර ඇත. AG 69 13 a (i) ශෛලියෙහි මැටි භාණ්ඩ හස්ථිනාපුර් හර්ෂඋ මට්ටම්වල 44 වන සන්දර්භය හා සහසම්බන්ධ වන බව ඔහුගේ මතයයි (Deraniyagala 1972 : 106). මෙම කාල පරිච්ඡේදය තුළ උතුරු ඉන්දියානු සම්බන්ධතාවය තව දුරටත් තහවුරු වෙමින් (එම : 120). NBPW පිඟන් භාණ්ඩ හමු වී තිබේ. NBPW නිෂ්පාදන මධ්‍යස්ථාන ගංගා මිටියාවතේ පිහිටි බව ප්‍රකශ කරන දැරණියගල ක්‍රි.පූ. හතර වැනි ශත වර්ෂයට අයත් ඇතුළුපුර **AG 85** සන්දර්භ 15 ට අයත් ව සහ ADB සන්දර්භ 54 ට අයත් ව රූලේටඩ් භාණ්ඩ සමඟ හමුවීම නිසා ක්‍රි. පූ. දෙ වැනි ශත වර්ෂවල සිට ඇතුළුපුරයේ පරිහරණය වීම හඳුනාගත හැකි බව පෙන්වා දී තිබේ. එ බැවින් ක්‍රි. පූ. හතර වැනි ශත වර්ෂයේ සිට ගංගා මිටියාවතේ නාගරික සංකීර්ණ සමඟ අනුරාධපුරය සහසම්බන්ධතා පවත්වා ඇති බව පැහැදිලි වන්නේයැයි දැරණියගලගේ මතය වී ඇත (Deraniyagala 1972 : 120; 160). රූලේටඩ් භාණ්ඩ නිෂ්පාදනය කිරීම ක්‍රි. පූ. හතර වැනි ශත වර්ෂයේ සිට ක්‍රි. පූ. පළමු වැනි ශත වර්ෂය දක්වා කාලයට අදාළ ව හඳුනාගත හැකි බව නාගස්වාමි විසින් ද පෙන්වා දී ඇත (Nagaswamy 1995 : 78). අරිකමේඩු රූලේටඩ් බඳුන්වල ඇති අභිලේඛන පිළිබඳ ව අධ්‍යයනය කර ඇති සුබ්‍රමනියම් එම බඳුන් ක්‍රි. පූ. දෙ වැනි ශත

වර්ෂයට අයත් බව පෙන්වා දී තිබේ (Subrahmanyam 1964 : 8 ; 43). අරිකමේඩු රුලේටඩ් බඳුන් පිළිබඳ විස්තර කර ඇති බෙග්ලි ඒවා ක්‍රි. පූ. තුන් වැනි ශත වර්ෂයට අයත් බව පෙන්වා දී ඇත (Begly 1996 : 8 ; 43). ගංගා නිම්නයේ සිට පහළට ශ්‍රී ලංකාව දක්වා මෙම බඳුන් වර්ගය වෙළඳ යාන්ත්‍රනය සමග පැමිණෙන ආකාරය ස්චෙන්ක් (Schenk) ද පෙන්වා දී තිබේ (Schenk 2006 : Fig. 01) (බලන්න සිතියම් අංක 5.3).



*Schenk 2006 Fig 3*

සිතියම් අංක 5.3
ඉන්දියාව හා ශ්‍රී ලංකාව දක්වා මුල් ඓතිහාසික අවධියේ රුලේටඩ් බඳුන්වල ව්‍යාප්තිය දැක්වෙන සිතියම

ස්චෙන්ක්ගේ පෙන්වා දීම් අනුව රුලේටඩ් බඳුන් වර්ගය අනුරාධපුරයට පමණක් නොව දකුණින් තිස්සමහාරාමය දක්වා ම ව්‍යාප්ත ව ඇත (එම). වෙළඳ සම්බන්ධතා අනුව මාන්තායි





හා ජම්බුකෝලපට්ටන යන වරායන් ඔස්සේ රුලේටඩ් භාණ්ඩ පමණක් නොව හෙලනිස්ටික් පිඟන් භාණ්ඩ මෙන් ම මුහුදු සම්පත් ද රට අභ්‍යන්තරයේ වූ අනුරාධපුරයට මුල් ඓතිහාසික අවධියේ දී පැමිණ ඇති බව මේ අනුව පෙන්වාදිය හැකි ය. එම තත්ත්වයන් අනුරාධපුර වාණිජ නගරයක් වීමට බලපා ඇති අතර වෙළඳපොල මුල්කරගත් භූ දර්ශනයක් එම අවධියේ ගොඩනැගී තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. එම වාණිජ ක්‍රියාවලිය හඳුනාගැනීමේ දී එ සමයෙහි භාවිත වූ විනිමය මාධ්‍යය ද හඳුනාගත හැකි ය. ඇතුළුපුරයේ පමණක් නොව ජේතවනය, වෙස්සගිරිය, අභයගිරිය ආදී ස්ථානවලින් ආරාමීය අවධි එම භූමිවල ස්ථානගත වීමට පෙර පුළුල් විනිමය සංසරණය සිදු වී ඇති ආකාරය කැණීම්වලින් හමු වී ඇති හස්එබු කාසි, ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි, රෝම කාසි ඇතුළු විදේශීය කාසි අනුව පෙන්වාදිය හැකි ය (Deraniyagala 1992 : 712 ; Coningham 1999 : 127 - 128 ; බාලසූරිය 2008 : 6 - 21 ; බාලසූරිය 2009 : 55 - 64).

ප්‍රාග් ජේතවන අවධියට අයත් මුල් ඓතිහාසික ජනාවාස නියෝජනය කරන ස්තර තුළ තිබී හමු වූ හස්එබු කාසිවල ප්‍රමාණය 176ක් පමණ වේ. එම කාසි රිදී සහ තඹ ලෝහවලින් නිර්මාණය කර තිබේ (බාලසූරිය 2008 : 12). ප්‍රාග් ජේතවන ස්තරවලින් හමු වී ඇති ස්වස්තික කාසි ප්‍රමාණය 40 කි. එම කාසි අතර ගස සහ ස්වස්ථික කාසි, ඇතා සහ ස්වස්තික කාසි යන වර්ග දෙකට අයත් කාසි වාර්තා වී තිබේ. ඇතුළුපුරයේ ද මධ්‍ය මුල් ඓතිහාසික අවධියට අයත් ස්තර තුළින් ගස සහ ස්වස්තික කාසි හා ඇතා සහ ස්වස්තික කාසි වාර්තා වී තිබෙන බව දැරණියගල හා රොබින් කනින්හැම් පෙන්වා දී ඇත (Deraniyagala 1992 : 712 ; Coningham 1999 : 128). කොඩ්රින්ටන් විග්‍රහ කර ඇති ආකාරයට ශ්‍රී ලංකාව තුළ ගස සහ ස්වස්තික, ඇතා සහ ස්වස්තික, අශ්වයා සහ ස්වස්තික, සිංහයා සහ ස්වස්ථික යන කාසි වර්ග 04ක් භාවිතා වී ඇත (Codrington 1924 : 20 - 22). අනුරාධපුරයෙන් හමු වී ඇති ඇතා සහ ස්වස්ථික කාසි අනුරාධපුර, පුලියන්කුලම හා මිහින්තලයෙන් වාර්තා වී තිබේ (එම : 21). ප්‍රාග් ජේතවන අවධිවලට අයත් ස්තර තුළ තිබී හමු වී ඇති අනෙක් කාසි විශේෂය වන්නේ ලක්ෂ්මී තහඩු කාසියයි. එම කාසි 41ක්

පමණ පැරණි ජනාවාස ස්තරයන්ට අදාළ ව වාර්තා වී තිබේ. මේ ආකාරයට මුල් ඓතිහාසික අවධියට අයත් ජනාවාස ස්තර තුළින් ඇතුළුපුරයෙන් හා ජේතවනයෙන් හස් එබූ, ස්වස්තික හා ලක්ෂ්මී තහඩු කාසි වාර්තා වීම තුළින් පිළිඹිබු කරනු ලබන්නේ වාණිජ අරමුණු පෙරදැරි කරගත් ක්‍රියාවලියක් යථෝක්ත භූමිවල මුල් ඓතිහාසික අවධියේ දී සිදු වී ඇති බව ය.

මුල් ඓතිහාසික අවධියට සම්බන්ධ ශ්‍රී ලංකාවේ වාණිජ ක්‍රියාවලිය දෙස බැලීමේ දී එය දේශීය හා අන්තර් දේශීය ක්‍රියාවලියක් වශයෙන් පැවති බව ද හඳුනාගත හැකි ය. දේශීය වශයෙන් රට අභ්‍යන්තරයේ වූ බහුවිධ සම්පත් මධ්‍යගත සැලසුම් මධ්‍යස්ථානයක් වූ අනුරාධපුරයට ආයාත කොට අනුරාධපුරයේ සිට රටේ විවිධ ප්‍රදේශවලට එම සම්පත් නැවත පරිවහනය වීම එක් අවස්ථාවක් ලෙසට හඳුනාගත හැකි ය. මෙහි අනෙක් අවස්ථාව වශයෙන් ජාත්‍යන්තර වාණිජ කටයුතු ජාලය ක්‍රියාත්මක වීම හඳුනාගත හැකි ය. ඒ සඳහා වයඹදිග ලංකාවේ ස්වභාවික වරායන් මෙන් ම උතුරුදිග හා නැගෙනහිර පිහිටන ස්වභාවික වරායන් වැදගත් වී තිබේ. එම වරායන් ඔස්සේ ග්‍රීසිය, පර්සියාව, අරාබිය, චීනය වැනි රටවල් සමඟ ගනුදෙනු ක්‍රියාවලියක් වූ ආකාරය සාහිත්‍ය ප්‍රභවයන් හා පුරාවිද්‍යා ප්‍රභවයන්ට අනුව පෙන්වාදිය හැකි ය. සාහිත්‍ය ප්‍රභවයන් හා පුරාවිද්‍යා ප්‍රභවයන්ට අනුව මෙම අවකාශීය තත්ත්වය පිළිබඳ ව කරුණු සෙවීමේ දී මහා ඇලෙක්සැන්ඩර්ගේ යුධ සෙන්පතියෙකු වූ ඕනිසික්‍රිටස්ගේ වාර්තාවේ ද, චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ යුධ සෙන්පතියෙකු වූ මෙගස්තීන්ගේ වාර්තාවේ මෙන් ම ප්ලිනි, ටොලමි හා ස්ට්‍රබෝගේ වාර්තා මගින් ද ශ්‍රී ලංකාව අන්තර්ජාතික ව පැවැත් වූ වාණිජ සම්බන්ධතා පිළිබඳ විස්තර ඇතුළත් ව තිබේ (NH Vol. vi : 81 - 91).

අනුරාධපුරය සමඟ ක්‍රියාත්මක අන්තර් ජාතික වාණිජ කටයුතු පිළිබඳ ව විමර්ශනයේ දී පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් වශයෙන් පිඟන් භාණ්ඩ, විදේශීය හා දේශීය ඛනිජ පාෂාණ, හා නිමි පබළු, දෙස් විදෙස් මුද්‍රා හා කාසි වර්ග ප්‍රධාන වන බව පෙන්වාදිය හැකි ය. ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික වාණිජ කටයුතුවල සම්බන්ධතාවය හඳුනාගැනීම උදෙසා දෙස් විදෙස් පුරාවිද්‍යාඥයින් විසින් ලංකාවේ වයඹ දිග, උතුර, ඊසාන, උතුරුමැද ආදී ප්‍රදේශ





ඇසුරින් විවිධ පර්යේෂණ සිදු කර ඇත. ඒ අතරින් ස්වභාවික වරායන් හා ගොඩබිම් ආශ්‍රිත ව හමුවූ ද්‍රව්‍යයමය සාධක සමූහය අධ්‍යයනයට බඳුන්කිරීමේ දී ඉන්දීය සාගරයේ මධ්‍යස්ථානයක ශ්‍රී ලංකාව පිහිටීම නිසා අන්තර් ජාතික වෙළඳ කටයුතු අග්නිදිග ආසියාවට මෙන් ම රතු මුහුද දක්වා ව්‍යාප්ත කිරීමට හැකි වී ඇති බව මාන්තායි, කන්තරෝදේ, කුච්චවේලි, අනුරාධපුර ආදී ස්ථානවල සිදු කළ කැණීම්වලින් පැහැදිලි වී තිබේ (Prickett : 1990 ; Cars well : 1984 ; Begly : 1967 ; Deraniyagala 1972, 1992 ; Coningham : 1999). ඒ අතරින් වැඩි වශයෙන් ම අන්තර් ජාතික වෙළඳ කටයුතු සඳහා මාන්තායි වරායේ වැඩි උපයෝගීතාවයක් පැවතී ඇති බව ප්‍රිකට්ගේ මතය වේ (Prickett 1990 : 171).

පුරාවිද්‍යාත්මක දත්ත හා සාහිත්‍ය මූලාශ්‍රය සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ හා දක්ෂිණ ඉන්දියාවේ වාණිජ කටයුතු පිළිබඳ ව අර්ථකථනයක යෙදෙන රාජන් ප්‍රකාශ කර ඇත්තේ සංගම් යුගය තුළ මේ හා සමාන ලක්ෂණ සහිත බෙදාහැරීම් ක්‍රියාවලියක් දකුණු ආසියාවේ මුහුදු ආශ්‍රිත වරායන් තුළ සිදු වී ඇති බව ය (Rajan 1996 : Fig . 284). මෙම ඒකාබද්ධ ක්‍රියාවලියට සම්බන්ධ වූ වරායන් ලෙස පොන්නානි (Ponnani), මුසිරිස් (Muziris), පොරකාඩ් (Porakad), කොල්කායි (Kollcai), කරිකාල් (Karikal), පෝඩුකේ (Poduke), අරිකමේඩු හා අලගන්කුලම් (Schoff 1912 : 204 - 212) වැදගත් වී ඇති බව පෙන්වා දී ඇත (එම).

ශ්‍රී ලංකාව දකුණු ආසියානු වෙළඳ ජාලයට සම්බන්ධ වීමේ දී ප්‍රධාන වරාය වශයෙන් මාන්තායි වරාය වැදගත් වී ඇත. විවිධ පරිවහන මාර්ග ඔස්සේ අනුරාධපුරයට පැමිණෙන සම්පත් ඒ ඔස්සේ මාන්තායි සිට අනුරාධපුරයට ද එ තැනින් රට අභ්‍යන්තරයට ද පරිවහනය වී තිබේ. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට විවිධ දෙස් විදෙස් ඛනිජ ද්‍රව්‍යය අනුරාධපුරය කේන්ද්‍ර කර මාන්තායි සිට ඉහළ කලා ඔය දක්වා පරිවහනය වීම හා ඉහළ කලා ඔය සිට අනුරාධපුරය හරහා මාන්තායි දක්වා පරිවහනය වීම ක්‍රි.පූ. මුල් කාලයේ සිට සිදු වී ඇත (Seneviratne 1996 : 287 - 288). අනුරාධපුරය ඇසුරෙන් සිදු වූ මෙම සාර්ව ගනුදෙනු ක්‍රියාවලිය නිසා ජේතවනය, ඇතුළුපුර හා

මාන්තායි ආශ්‍රයෙන් සිදු කර ඇති කැණීම්වලින් හමු වී ඇති දෙස් විදෙස් ඛනිජ ද්‍රව්‍යය අනුව අන්තර් භුවමාරු මාධ්‍ය ඔස්සේ වානිජ කටයුතු මුල් ඓතිහාසික සමයේ සිදු වී ඇති බව පැහැදිලි වන අතර එය අනුරාධපුර සාර්ව භූ දර්ශනය ගොඩනැගීමට බලපා තිබේ (බලන්න 5.7 වගුව).

| දෙස්/ විදෙස් ඛනිජ සම්පත් | අනුරාධපුර ජේතවනය, අභයගිරිය, ඇතුළුපුර | මාන්තායි |
|---|---|---|
| ඇමතෙස්ත | ✓ | ✓ |
| කැල්සිඩෝනි | ✓ | ✓ |
| කහඳ | ✓ | ✓ |
| රූබි | - | |
| බෙරිල් | ✓ | - |
| ගානට් | ✓ | - |
| ජැස්පර් | ✓ | ✓ |
| චන්ද්‍රකාන්ත පාෂාණ | ✓ | ✓ |
| තිරුවානා | ✓ | ✓ |
| තෝරමල් | ✓ | ✓ |
| ඇගේට් | ✓ | ✓ |
| කානීලියන් | ✓ | ✓ |
| ජෙට් | ✓ | ✓ |
| ලැපිස් ලැසුලි | ✓ | ✓ |
| ඔනෙක්ස් | ✓ | ✓ |
| ඇමසෝනයිට් | ✓ | ✓ |
| රතු කොරල් | ✓ | ✓ |

වගු සටහන් අංක 5.7
අන්තර් භාණ්ඩ හුවමාරුව ඔස්සේ මාන්තායි හා අනුරාධපුරයෙන් ලැබී ඇති දෙස් විදෙස් ඛනිජ වර්ග
*(Seneviratne 1996 Tab.1)*





ඉහත වගු සටහන අනුව ඉහළට හා පහළට ගමන්ගත් සම්පත් හුවමාරුව ප්‍රධාන වශයෙන් ම අනුරාධපුරය කේන්ද්‍රගත කරමින් මුල් ඓතිහාසික අවධිය තුළ දී ක්‍රියාත්මක වීම නිසා ශ්‍රී ලංකාවේ සම්භවය නොලබන කානීලියන්, කැල්සිඩෝනි, රෙඩ්කොරල්, ඇගේට්, ලැපිස් ලැසුලි ආදී ඛනිජ ද්‍රව්‍යය ජේතවනයෙන් හා ඇතුළුපුරයෙන් හමුවීමෙන් පැහැදිලි වේ. එම නිසා අන්තර්ජාතික වානිජ කටයුතු සඳහා අනුරාධපුරය විශේෂ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකර ඇත (එම).

ඉන්දීය විද්වතකු වන මහාදේවන් පෙන්වාදෙන ආකාරයට අරිකමේඩු අලගංකුලම්, කොඩුමනල් ආදී දකුණු ඉන්දීය වරායන් ආශ්‍රිත ව හමු වූ ප්‍රාකෘත අභිලේඛන ශ්‍රී ලංකා බ්‍රහ්මීවලට සමාන බැවින් ඒවා වානිජ ක්‍රියාවලිය ඔස්සේ දකුණු ඉන්දියාවට පැමිණෙන්නට ඇතැයි විශ්වාස කරයි (Mahadevan 1995 : 55 - 56)' liskd;ka (Kasinathan) හා රාජවේලු (Rajavelu) විසින් ද කාවේරිපට්ටනම් වරායෙන් හමුවන මැටි බඳුන්වල සටහන් වූ ප්‍රාකෘත ලිපියක ඇති **අභිමහතොට** යන වදන සංගම් සාහිත්‍යයේ එන **පට්ටිනප්පාලයි** (Pattinappalai) යන වචනය සමඟ සැසඳීම මඟින් ශ්‍රී ලංකාව හා පැවති සමුද්‍රාශ්‍රිත වෙළඳාම පිළිබඳ ව තතු ඉන් පැහැදිලි වන බව පෙන්වා දී තිබේ (Kasinathan 1998 : 154 ; Rajavelu 1999 : 154). මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ හමුවන මුල් බ්‍රහ්මී ශිලා ලිපි ගණනාවක් තුළින් ද පිළිඹිබු වන බව ද හඳුනාගත හැකි ය. එම ලිපිවල සඳහන් වන සමුද්‍ර යාත්‍රා **නව්** හා **පටක** වශයෙන් සඳහන් වේ (Ic. Vol. i. 1970 : No. 127, 149, 786, 792, 796, 1174). එම තොරතුරු අනුව රාජන් පෙන්වාදෙන්නේ සංගම් සාහිත්‍යයේ ද **නවායි** (navai), **තෝනි** (toni), **පටකු** (pataku) යනුවෙන් මුහුදු යාත්‍රා පිළිබඳ ව සඳහන් වන බැවින් (Rajan 2001 : 03) මෙම යාත්‍රා රටවල් දෙක අතර මුල් ඓතිහාසික යුගයේ සමුද්‍රාශ්‍රිත වානිජ කටයුතු සඳහා භාවිත කරනු ලැබූ යාත්‍රා විය හැකි බව ය (එම). පොළොන්නරුවේ දූවේගලින් හමුවන බරත ශිලා ලිපියක පසෙකින් වන නැවක සංකේතය (*Ic. Vol.* i. 1970 : 270) මගින් හා අනුරාධපුර ඇතුළුපුරයේ අළු පැහැ මැටි මෙවලමක් ආශ්‍රයෙන් හමුවන නැවක සංකේතය (Coningham

2006 : Fig. 6. 1) තුළින් සමුද්‍රාශ්‍රිත යාත්‍රා විශේෂයක් හඳුනාගත හැකි ය. බරත ලිපිවල මුහුදු යාත්‍රා සටහන් කිරීම මඟින් බරතවරු මුහුදු ආශ්‍රිත වෙළඳාම් කටයුතුවල නියැලුණු බව විශ්වාස කළ හැකි ය. බොපේආරච්චි හා වික්‍රමසිංහ පෙන්වා දී ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ දකුණු පලාතෙන් හමු වී ඇති **බරත තිස්ස** වශයෙන් හඳුන්වන කාසිය මඟින් ශ්‍රී ලංකාවේ නාවික කටයුතු හැසිර වූ නැවියන් හඳුනාගත හැකි බව ප්‍රකාශ කර තිබේ (Bopearachchi and Wickramasinghe 1999 : 53). පරණවිතාන පෙන්වා දී ඇති ආකාරයට ගල්ලෑව විහාරයේ මුල් බ්‍රහ්මී ලිපියක එන **බරත මහා තිස්ස**, කුඩුවිල් ලිපියේ එන **දෙමඩතිස්ස වනිජ**, අනුරාධපුරයේ අභයගිරියේ හමුවන **ඉලුබරත** (*Ic*. *Vol*. i. 1970 : No. 1049, 1054, No. 94) ද්‍රවිඩ වෙළෙන්දන් වශයෙන් විස්තර කර ඇත. එසේ ම ආඬියාගලින් හමුවන පූර්ව බ්‍රහ්මී ලිපියක නවික බොජික (එම : No. 105) පිළිබඳ ව සඳහන් වීම මඟින් නැව් අයිතිකාරයකු ඉන් ගම්‍යය වන බව විග්‍රහ කරන රාජන් තමිල්නාඩුවේ වෙළඳ ගෝත්‍ර නවිකන් නමින් හැඳින්වූ බව පෙන්වා දී ඇත (Rajan 2001 : 04). මෙයට අමතර ව පෙරිය පුලියන්කුලමෙන් හමුවන බ්‍රහ්මී ශිලා ලිපිවල දමෙඩ වනිජ (*Ic*. *Vol*. i. : No. 356, No. 357) පිළිබඳ සඳහන්වීම තුළින් මෙම වෙළෙඳුන් ලංකාව හා ඉන්දියාව අතර වෙළඳාම් කටයුතුවල නියැලි පිරිස් ලෙස ද හඳුනාගත හැකි ය.

ඉහතින් පෙන්වාදුන් කරුණුවලට අනුව අනුරාධපුරය ඇසුරින් මුල් ඓතිහාසික සමය වනවිට දකුණු ආසියානු කලාපය ආශ්‍රිත දියුණු නාගරික මට්ටමක් නිර්මාණය වීම සඳහා වෙළඳ ආර්ථිකයක් පදනම් වූ බව හඳුනාගත හැකි ය. නාගරීකරණ ක්‍රියාවලියක දී එ වැනි කාරණා මූලික ලක්‍ෂණ වන බව චයිල්ඩ් පෙන්වා දී ඇත (Child 1950:142-178). ඒ අනුව මූලික රාජ්‍යයේ හැඩ ගැසීම සඳහා අවශ්‍ය සමාජ ස්තරගතවීම් **මහරජ, රජ, පරුමක, ගමික, ගහපති,** ආදී ජන කණ්ඩායම් තුළින් ද වානිජ හා කාර්මික කටයුතුවලට අදාළ කාර්යයන් සඳහා සමාජ ස්තරගතවීම බරත, බත පිරිස් ඇසුරෙන් සිදු වූ බව හඳුනාගත හැකි ය. එයට අමතර ව විශේෂ ප්‍රාගුණ්‍යතාව සහිත ශිල්ප ශ්‍රේණි, **චූඩ, කබර, තොපෂ, තබර, නගුලි, තොටබොජක** ආදී වශයෙන් මුල්





බ්‍රාහ්මීය අභිලේඛන ඇසුරෙන් හඳුනාගැනීමට අවකාශ සැලසේ. ස්මාරක හා සෙසු ගොඩනැගිලි ඇතුළු කලා කෘති සම්බන්ධ ව විශාල කරුණු රාශියක් මෙම අවධියේ දී බිහිවන බැවින් මෙම කාර්යයන් සිදු කිරීම සඳහා ඉතා පැහැදිලි සමාජ ආයතන හැඩගැසීම (දේශපාලන, ආර්ථික, ආගමික) වශයෙන් අනුරාධපුරයේ හා තදාශ්‍රිත ප්‍රදේශයේ සිදුවීම නිසා පුළුල් භූ දර්ශනය ගොඩනැගීම ඒ සඳහා බලපා තිබේ. ඉන් පසු ව **ලෙන්විහාර, මහා විහාර, පබ්බත විහාර, පධානඝර** ආදී බෞද්ධ විහාර පද්ධතියක් අනුරාධපුර පුරාණ නගර සීමාවේ ස්ථානගතවීම සමඟ පශ්චාත් ඓතිහාසික අවධියේ දී අනුරාධපුර නගරය ආශ්‍රයෙන් සාර්ව සංස්කෘතික භූ දර්ශනය සඳහා ආගම පදනම්කර ගත් භූ දර්ශනයක් එක් වීමෙන් නගර සැලසුම පරිපූර්ණත්වයට පත් වූ අන්දම සාහිත්‍ය හා පුරාවිද්‍යා ද්‍රව්‍යයමය නෂ්ටාවශේෂ ඇසුරෙන් හඳුනාගත හැකි ය.

06

වැනි

පරිච්ඡේදය

# සමාලෝචනය

## 6.1 ප්‍රාරම්භක අවධියේ සිට වර්ධිත අවධිය දක්වා පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ අවකාශය ගොඩනැංවීම සම්බන්ධ සංකල්පීය

### ආකෘතිය

ලේඛනගත ප්‍රභවයන් හා භෞතික සංස්කෘතික තොරතුරු උපයෝගී කර ගනිමින් පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනයේ ගතිකත්වය හඳුනාගැනීම උදෙසා සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය තුළ දී තාක්ෂණික සංස්කෘතික අවධි (Techno Cultural phase) හඳුනාගැනීමේ දී කේන්ද්‍රය මධ්‍ය ප්‍රදේශය මෙන් ම තදාශ්‍රිත ප්‍රදේශවල සිදු කරනු ලැබූ ගවේෂණ හා කැණීම් උපයෝගී කර ගනු ලැබී ය. ආංශුක පුරාවිද්‍යා ක්ෂේත්‍ර ඇසුරින් සිදු වූ භූ දර්ශනයේ ගොඩනැඟීම සාර්ව අවාකාශයක් දක්වා ව්‍යාප්ත කිරීමට හමු වී ඇති ද්‍රව්‍යයමය තොරතුරු උපයෝගී කර ගන්නා ලදි. ජේතවනය හා වෙස්සගිරිය යන ආංශුක පුරාවිද්‍යා ස්ථානවල සිදු කරනු ලැබූ කැණීම්, ගවේෂණ හා සමාජ පුරාවිද්‍යා අධ්‍යයන මඟින් යථෝක්ත භූ කලාප තුළ විවිධ තාක්ෂණික සංස්කෘතික අවධිවල දී සිදු වූ භූමි පරිභෝජන රටාව අධ්‍යයන කිරිම තුළින් භූ දර්ශනයේ අවකාශය ගොඩනැංවීමට මෙම අධ්‍යයනයේ දී හැකි විය. එහි දී සාර්ව සංස්කෘතික භූ දර්ශනය ගොඩනැංවීම සඳහා






සංකල්පීය ආකෘතියක් පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍ර කරුණු උපයෝගී කර ගෙන ගොඩනැඟීමට හැකි විය.

### 6.1.1 ආකෘති අංක 1 ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික භූ දර්ශනය

මෙතෙක් සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණවලට අනුව අනුරාධපුර මූලාරම්භක මානව පැළපදියම්වීම ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධිය තුළ සිදු වී ඇත (Deraniyagala 1992:709). ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියට සම්බන්ධ ජනාවාස තොරතුරු ඇතුළුපුරයෙන් (එම:729), ජේතවනයෙන් හා වෙස්සගිරියෙන් (ඉසුරුමුණිය) වාර්තා වී තිබේ (මැන්දිස් 2009:14-16). එම ස්ථානවලින් හමු වී ඇති ද්‍රව්‍යයමය සාධක වන්නේ ශිලා මෙවලම් ය. මෙම ශිලා මෙවලම් රතු දුඹුරු පාංශු කලාපයෙන් (RBE) වාර්තා වී ඇති බව හඳුනාගෙන තිබේ. ඒ අනුව මෙම ස්ථානවලින් ඇතුළුපුර හා ජේතවනය එළිමහන් වාසස්ථාන සහිත ස්ථාන පැවති අතර, වෙස්සගිරිය ස්වභාවික ගල් ගුහා සහිත වාසස්ථාන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකි ය. ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියට අදාළ ව ඇතුළුපුර භූ දර්ශනය ගොඩනැංවීමෙහිලා විශේෂයෙන් ම එම ආංශුක භූමිවල දැකගත හැකි භූ ලක්ෂණ එම ස්ථානවල මෙම සංස්කෘතිය ස්ථානගතවීම සඳහා උපයෝගී වී ඇති ආකාරය පෙර පරිච්ඡේදයක දී විග්‍රහ කර ඇත. වෙස්සගිරිය, ජේතවනය, ඇතුළුපුරය හා අභයගිරිය යන ආංශුක භූමි ගත් කළ ප්‍රාග් ඓතිහාසික අවධිය තුළ ද වැදගත් වන්නේ අනුරාධපුර කේන්ද්‍රය වශයෙන් සැලකුණු ස්ථානයේ (ඇතුළුපුරයේ) මෙන් ම තදාශ්‍රිත භූමිවල ක්‍රියාත්මක වීම එක් අවකාශයක් තුළ සිදු වී ඇති නිසා ය. එම නිසා ලැබී ඇති භෞතික සංස්කෘතික කොරතුරුවලට අනුව ආකෘතිමය වශයෙන් එළඹිය හැකි සංකල්පමය තත්ත්වය වන්නේ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා සංස්කෘතිය අනුරාධපුරයේ ක්ෂුද්‍ර ක්ෂේත්‍ර ආශ්‍රයෙන් කේන්ද්‍රාපසාරි හෝ කේන්ද්‍රාභිසාරි ක්‍රමයක් පදනම් ව සිදු වී නොමැති අතර ඒ ස්ථානවල පැවති භූමි ස්වරූපය, වාසස්ථාන හා ආහාර රටාව අනුව කුඩා කුඩා ජන පැළපදියම්වීම වශයෙන් උපකල්පනය කළ හැකි ය. ඒ අනුව පුරාණ අනුරාධපුර ප්‍රාග් ඓතිහාසික සංස්කෘතිය

සන්දර්භගත වීමේ ආකෘතිය පහත සඳහන් ලෙස පෙන්වාදිය හැකි ය.




සිතියම් 6.1

ප්‍රාග් ඓතිහාසික අවධියේ අනුරාධපුර සංස්කෘතියේ භූ දර්ශනයේ සන්දර්භගත වීමේ උපකල්පිත ආකෘතිමය සැලැස්ම


### 6.1.2 ආකෘති අංක 2 පූර්ව ඓතිහාසික අවධියේ සංස්කෘතික භූ දර්ශනය

ආකෘති අංක 2 යටතේ අනුරාධුපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය ගොඩනැඟෙනුයේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය පදනම් කර ගනිමිනි. පූර්ව ඓතිහාසික සංස්කෘතික සන්දර්භය තුළ ඇතුළුපුරය ප්‍රධාන ජනාවාසය ලෙස ඉස්මතු වන අතර ඒ සඳහා තාක්ෂණ ශිල්පය, යැපුම් රටාව හා සම්පත් පරිහරණය හා පදිංචි වීමේ රටාව යන කාරණාවල උපයෝගීතාවය වැදගත් වූ බව හඳුනාගත හැකි ය. ඇතුළුපුරය ප්‍රධාන පූර්ව ඓතිහාසික ජනාවාස ලෙස අනුරාධපුරය ඇසුරෙන් ඉස්මතුවීමේ දී එයට පිටත භූ කලාපවල එ නම්, අධ්‍යයනයේ දී මධ්‍ය ප්‍රදේශ්‍ය හා තදාශ්‍රිත ප්‍රදේශය තුළින් පූර්ව ඓතිහාසක අවධියේ ග්‍රාම





ස්ථානගතවීම සිදුවීම පිළිබඳ ව සාධක හමුවේ. ඒ අතර ජේතවනය, වෙස්සගිරිය හා මල්වතු ඔය බටහිර නිම්නය තුළ පූර්ව ඓතිහාසික අවධියට සම්බන්ධ ද්‍රව්‍යමය සාධක හමු වීම පරිච්ඡේද අංක 5 තුළ විස්තර කර ඇත. එම තත්ත්වයන් මත ප්‍රධාන ජනාවාසයේ නැඟීම සඳහා ගාමක බලය සැපයූ කුඩා පොකුරු ජනාවාස පද්ධතියක් කේන්ද්‍රයෙන් පිටත මධ්‍ය හා තදාශ්‍රිත ප්‍රදේශවල ස්ථානගත වී තිබීම මගින් කේන්ද්‍රාභිසාරී ලෙස ජනාවාස ව්‍යාප්ත වීමක් හඳුනාගත හැකි ය. එම ජනාවාස ව්‍යාප්තවීම පහත සඳහන් උපකල්පිත ආකෘතිය අනුව පෙන්වා දිය හැකි ය.





සත්‍යම අංක 6.2

පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුර භූ දර්ශනයේ සන්දර්භයන් පොකුරු ජනාවස රටාව අනුව ස්ථානගතවීමේ උපකල්පිත ආකෘතිමය සැලැස්ම

### 6.1.3 ආකෘති අංක 3 මුල් ඓතිහාසික අවධියේ භූ දර්ශනය

ආකෘති අංක 3 යටතේ අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය ගොඩනැංවීමේ දී මුල් ඓතිහාසික අවධිය ඉතා ම වැදගත් වේ. අධ්‍යයන ප්‍රදේශයට අයත් සීමාව තුළ මෙම යුගයේ දී

පර්යන්ත ප්‍රදේශය ආශ්‍රිත ව පවතින ස්වභාවික සම්පත් වඩා බහුල වශයෙන් පරිහරණය කිරීම සිදුවන බැවින් නාගරීකරණයේ උච්චත ම ස්ථානයටත්, නගුල් කෘෂිකර්මාන්තයේ දියුණුවටත් අනුරාධපුරය පත්වීම හඳුනාගත හැකි ය. මෙම සමයේ දී අනුරාධපුර පුළුල් භූ දර්ශනයට වාරි පද්ධතිය වඩා දියුණු ආකාරයට නගරය වටා ස්ථානගත වන අතර සිව් දිශාවෙන් ශිල්ප ග්‍රාම හා වෙළඳ ස්ථාන බද්ධ වී විවිධ නිෂ්පාදන ක්‍රියාවලීන්ට සම්බන්ධ ග්‍රාම ස්ථානගතවීම සාහිත්‍යමය හා පුරාවිද්‍යා ප්‍රභවයන් ඇසුරෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව මහා විහාර වර්ගයේ විහාර කිහිපයක් වර්ධනය වීම මෙන් ම නාගරික ව්‍යුහයේ උපරිමත්වයට මෙම කාල පරාසය තුළ අනුරාධපුරය පත්වීම පහත සඳහන් උපකල්පිත සංකල්පීය ආකෘතිය අනුව පෙන්වාදිය හැකි ය.





සිතියම් අංක 6.3
මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ ස්ථානගත වීමේ උපකල්පිත ආකෘතිමය සැලැස්ම





## 6.1.4 ආකෘති අංක 4 මධ්‍ය ඓතිහාසික භූ දර්ශනය


ආකෘති අංක 4 අනුරාධපුර මධ්‍ය ඓතිහාසික භූ දර්ශනය සම්බන්ධ අවස්ථාව නියෝජනය වේ. නගරය වටා එක්තරා ආකාරයට ඉදිවන මහා විහාර සැලසුම් ආරට අයත් විහාර ස්ථානගත වීම මඟින් එතෙක් පැවති භූ දර්ශනය වෙනස් කිරීමට තීරණාත්මක ව බලපෑ බව පෙනේ. නගරයෙන් පිටත ස්ථානවල තිබූ විවිධ ශිල්ප නිෂ්පාදන කටයුතු සිදු කළ ජනාවාසයන් බෞද්ධ ආරාම ස්ථානගතවීමේ අවකාශය තුළ එතෙක් තිබූ ප්‍රදේශයෙන් පර්යන්තයට තල්ලු වීම සිදු වන අතර විහාර ස්ථානගත වීම සිදුවීම සමඟ එතෙක් පැවති ජනාවස වර්ධිත ආරාම භූමි තුළින් වාපිග ාම දක්වා පරිවර්තනය වීම සිදු වේ. ඒ අනුව මධ්‍ය ඓතිහාසික අවධියේ භූ දර්ශනය පහත සඳහන් උපකල්පිත ආකෘතිය අනුව හඳුනා ගත හැක.




සිතියම් අංක 6.4
මධ්‍ය ඓතිහාසික අවධියේ පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ උපකල්පිත ආකෘතිමය සැලැස්ම

### 6.1.5 ආකෘති අංක 5 පශ්චාත් ඓතිහාසික අවධියේ භූ දර්ශනය

පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ පුළුල්ත ම හා වර්ධිත ම අවධිය වන්නේ පශ්චාද් අනුරාධපුර අවධියයි. මෙම සමය තුළ එතෙක් වර්ධනය වූ මහා විහාර ආකෘතියට පිටතින් පබ්බතාරාම ආකෘතිය හා පධානඝර සැලසුම් ආකෘතියට අයත් විහාර පද්ධතියක් ප්‍රධාන වාපි පද්ධතියට ඇතුළතින් ස්ථානගත වේ. ඒ සමඟ ම අනුරාධපුරය පූර්ණ වශයෙන් ආගමික නගරයක් (Religious Urban) බවට පත්වන අතර, වාරි පද්ධතිය ද යම් ආකාරයට සංකීර්ණ වේ. එය පහත සඳහන් උපකල්පිත ආකෘතිය මඟින් පෙන්වාදිය හැකි ය.




සිතියම් අංක 6.5
පශ්චාත් ඓතිහාසික අවධියේ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනයේ උපකල්පිත ආකෘතිමය සැලැස්ම



## පරිශීලනය කරන ලද ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රයෝ


- **ථූපවංසය.** 1996.,සංස්.එච්.එම්.මොරටුවගම, පිටකෝට්ටේ, රත්න මුද්‍රණ ශිල්පියෝ.
- **දීපවංසය.** 1959.,සංස්.කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
- **නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය.** 1984.,සංස්.බන්දුසේන ගුණසේන, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- **මහාබෝධිවංසය.** 1891., සංස්. පී.සාරානන්ද හිමි, කොළඹ, ශාස්ත්‍රාලෝක මුද්‍රණාලය.
- **සද්ධර්මරත්නාකරය.** 1955.,සංස්.කළපළුවාවේ ස්ථවිර, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **සමන්තපාසාදිකා.** 1900., සංස්. යූ.එස්.ඩබ්. ධර්මකීර්ති, කොළඹ, ග්‍රන්ථාලෝක මුද්‍රණාලය.
- **සද්ධර්මාලංකාරය.** 1954., සංස්.මකුළුදූවේ පියරතන හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
- **සිංහල බෝධිවංසය.** 1951 ., සංස්. වී.අමරමෝලි, කොළඹ, වැලම්පිටිය, ශ්‍රී ලංකා ප්‍රකාශන.
- **බෝධිවංස ගැටපදය.** 1957., සංස්. රත්මලානේ ධර්මාරාම හිමි, ලංකා බෞදධ මණ්ඩලය.
- **මහාවංසය.** (සිංහල),1996., සංස්.හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිත දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, නුගේගොඩ, ගංගොඩවිල, සීමාසහිත දීපානි ප්‍රකාශන පෞද්ගලික සමාගම.
- **මහාවංසය.** (පාලි), 1959., සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
- **රසවාහිනී.** 1896., සංස්.සරණතිස්ස හිමි, කොළඹ, විද්‍යාසාර මුද්‍රණාලය.
- **වංසත්ථප්පකාසිනී.** (මහාවංස ටීකාව).1994., සිංහල අනුවාදය අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ත කැළණිය විශ්වවිද්‍යාලය.

- **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය**. 1999., ඩබ්. සෝරත හිමි, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ***Chulavamsa***.1929., (eds) .W.Geiger, London, Pali Text Society.
- ***Depavamsa***.1879., tr. H. Oldenburg: Edinburgh
- Fa- Hsien.1957., ***A Record of Buddhist Countries*** ,tr. Liyang-his: Oxford
- Hiuen Tsang .1885., ***si- yu -lci Buddhist Records of the Western World translated from the Chinese of Hiuen Tsang*** ,AD 629 &, tr. S. Beal 2 , Vol. 2,
- ITisisng.1896.,***A Record of Buddhist Religion as Practiced in India and the Malay*** Archipelago (AD 671-695).tr. Jakusu ,Oxford.
- ***Mahavamsa***.1912., tr. W. Giger, London, Oxford Univeßity Press.
- ***Ancient Inscription of Ceylon***. 1883., ed. E. Muller, Trubber: London.
- ***Archaeological Survey of Ceylon.***
- 1892 - (Annual Report) by H.C.P. Bell, Government Printer: Ceylon.
- 1893 - (Annual Report) By H.C.P. Bell, Government Printer: Ceylon.
- 1907 - (Annual Report) By H.C.P. Bell, Government Printer: Ceylon.
- 1909 - (Annual Report) by H.C. P. Bell, Government Printer: Ceylon.
- 1924 - (Annual Report) By A.M. Horcart, Government Printer: Ceylon.
- 1950 - (Annual Report) By S. Paranavitana, Government Printer: Ceylon.
- 1960 - (Annual Report) by C.E. Godakubura, Government Printer: Ceylon.
- 1978 - (Annual Report)by Raja De Silva, Government Printer: Ceylon.
- ***Ancient Ceylon No 1***.1972., eds. and published by the commissioner of Archaeology Department, Colombo.
- ***Ancient Ceylon No 2***.1972., eds. and published by the commissioner of Archaeology Department, Colombo.
- ***Ancient Ceylon No 5***.1985., eds. and published by the commissioner of Archaeology Department, Colombo







- ***Ancient Ceylon No 6***.1986., eds. and published by the commissioner of Archaeology Department, Colombo
- ***Epigraphia Zeylanica vol. I***.1912.,London, Oxford Univeßity Press.
- ***Epigraphia Zeylanica vol. II***.1928., London, Oxford Univeßity Press.
- ***Epigraphia Zeylanica vol. III***.1933., London, Oxford Univeßity Press.
- ***Epigraphia Zeylanica vol. IV***.1944., London, Oxford Univeßity Press.
- ***Epigraphia Zeylanica vol. V***.1955., London, Oxford Univeßity Press.
- ***Epigraphia Zeylanica vol. VI***.1991.,Colombo, Archeological Survey Department.
- ***Inscription of Ceylon Vol. I***.1970.,Colombo, Department of Archaeology.
- ***Inscription of Ceylon Vol. II***.1983.,Colombo, Department of Archaeology.
- ***Epigraphical Notes No. 13***.1991.,Colombo , Department of Archaeology.
- ***Epigraphical Notes No. 1-18***.1991.,Colombo, Department of Archaeology.


## ද්විතීයික මූලාශ්‍රයෝ


- අබේවර්ධ,නුවන්. 2005/2006., **සංස්කෘතික භූ දර්ශනය හා පුරාවිද්‍යාව, වැලිපිළ පුරාවිද්‍යාව සඟරාව (හත්වන කලාපය)**, ඩී. තුසිත මැන්දිස් සහ චන්දිම අඹන්වල, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය : මධ්‍යම සංස්කෘතික අරමුදලඃ143-148.
- එල්ලාවල, හේම.1968., **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**, කොළඹ, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.
- කරුණානායක, ආර්.එම්. 1967., **පුග ශ්‍රේණිය හා මුදල්, ගයිගර් සමරු කලාපය, සංස්**. ලබුහේන්ගොඩ චන්ද්‍රරතන, ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය,90/21, ඇවෙන්ඩැල් පාර, කොළඹ, 10, 67-76.
- කුලතුංග, ටී.ජී. 1998., **25 වන හය මාසික පුරාවිද්‍යා කැණීම් වාර්තාව**, අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

- 1998., අභයගිරි ස්තූපය හා ආරාම සංකීර්ණය, **අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය : 313-219.
- 2001., **අනුරපුර මහා විහාරය**, කර්තෘ ප්‍රකාශනයකි, නාවින්න,තරංජි ප්‍රින්ටර්ස්.
- 2001., **අනුරපුර ජේතවන විහාරය**, කර්තෘ ප්‍රකාශනයකි, නාවින්න, තරංජි ප්‍රින්ටර්ස්.
- ගුණරත්න, ආර්. 2008., **ලෝහමය පුරාවස්තු, සංස්.** සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ.
- චන්ද්‍රරත්න, ආර්,එම්.එම්. 2008., **සත්ත්ව පුරාවිද්‍යාව, ජේතවන පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 18, සංස්.** සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල.
- තම්බයියා,පී. 1963., **ලංකාවේ වර්ෂාපතනය**, කොළඹ, සමන් ප්‍රකාශකයෝ.
- දැරණියගල, සිරාන් උපේන්ද්‍ර 1990., **පුරාවිද්‍යා කැණීම් 18901990 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය (ශත සංවත්සරය)**, පළමු වෙළුම, පරි. කේ.බී. ඒ. එඩ්මන්, කොළඹ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.
- 2000., ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ජනාවාස, **චිරන්තන ඓතිහාසික අධ්‍යයන සඟරාව අංක 04, සංස්.** ධම්මිකා මනතුංග සහ වෙනත් අය, ර්.එම්.අයි.ජී. ඒකනායක, 74 ඒ/ 51, රද්දොළුවඃ සෙන්ට්‍රල් ගාර්ඩින්ස්ඃ76,95.
- දිසානායක, සිසිර, 2009., **ජේතවන ස්තූප නැගෙනහිර ද්වාරය අසළ පර්යේෂණ කැණීම (අප්‍රකාශිතයි)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජේතවන ව්‍යාපෘතිය.
- පරණවිතාන, සෙනරත්. 1969., පුරාතන දඹුල්ල, රුවන්දෝ (දෙ වැනි කලාපය), සංස්. පොළොම්මාරුවේ ධම්මසිරි හිමි, සිරි රතන ජෝති පරිවේනික ශිෂ්‍ය සංගමය, ඌරාපොළ තිහගොඩ, කඹුරුපිටියඃ1-5.
- ප්‍රනාන්දු, ඩබ්.බී.එම්. 1997., **ලංකා ලෝක සිතියම් පොත**, කොළඹ, ලේක්හවුස් ප්‍රකාශන.
- බාලසූරිය,විරාජ්. 1999., ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියන බැද්දේ කුළු හරකුන් ගමට ගෙනෙනා අපේ ඇත්තෝ, **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව (තුන් වැනි කලාපය)**, සංස්. ගොඩමුණේ පඤ්ඤාසීහ හිමි සහ පත්බේරියේ ඥාණාලෝක හිමි, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල,17-21.







- 2000., කුලාට කුළුනින් කුළුපග වූ මරිකාර ඇත්තෝ, **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව (සිව් වැනි කලාපය)** සංස්. අරුණ රාජපක්ෂ සහ පී.පී. සමින්ද කුමාර, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල,8-19.
- 2001/2002., කැලෑවට යන කලාවට බර කුඩා කැලෑගම ඇත්තන් ගැන වචනයක්, **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව**, තුන් වැනි කලාපය, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල,19-25.
- 2008., මල්වතු ඔය වම් ඉවුර ගවේෂණය, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2000**, සංස්.සුදර්ශන් සෙනෙවිරත්නත පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයඃ 5-17.
- බාලසූරිය, ඉනෝකා. 2008., **පැරණි මුදල්**, ජේතවනාරාම පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 01, සංස්.සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
- 2009., ජේතවන බිමෙන් හමු වූ පැරණි කාසි, **ජේතවන ස්තූප පුරාණය (සමරු කලාපය) සංස්.** පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
- මනමේන්ද්‍රආරච්චි, කැළුම් නලින්ද. 2007., **වෙස්සගිරියේ කැණීම්වලින් හමු වූ සත්ත්ව අස්ථි පිළිබඳ මූලික වර්ගීකරණයක්**, (අප්‍රකාශිතයි), මධ්‍යම සංස්කෘතික අරමුදල, ජේතවන ව්‍යාපෘතිය.
- 2008., වෙස්සගිරිය ඓතිහාසික පුරාවිද්‍යා ස්ථානය ආශ්‍රිත ව පරිසර විද්‍යාත්මක ඇගයීමක්, **වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව වෙස්සගිරිය වැඩබිම 2006**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයඃ106-165.
- 2009., ජේතවනාරාම කැණීම්වලින් ලද සත්ත්ව ශේෂ තුළින් මතුවන ඉතිහාසය, **ජේතවන ස්තූප පුරාණය (සමරු කලාපය) සංස්.** පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයඃ114-159.
- මල්කාන්ති, නාලනී. 2008., **පබළු නිර්මාණයේ අතීත විත්ති**, ජේතවනාරාම පුරාවිද්‍යා ග්‍රන්ථමාලා අංක 03, සංස්.සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
- මාරසිංහ, වෝල්ටර්. 1993., **මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර**, නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.

- මැන්දිස්, තුසිත. 2008., ජේතවන සුද්දගේ වත්ත පරයේෂණ පුරාවිද්‍යා කැණීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2000**, සංස්. සුදර්ශන්සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය : 37-51.
- 2008., ජේතවන ස්තූප සලපතල මළුව පර්යේෂණ පුරාවිද්‍යා කැණීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2001**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:58-74.
- 2008., ජේතවන ස්තූප සලපතල මළුව පර්යේෂණ හා පුරාවිද්‍යා කැණීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2002**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:20-42.
- 2008., ජේතවන ස්තූප දකුණු වැලිමළුව පර්යේෂණ පුරාවිද්‍යා කැණීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2003**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක,කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:23-37.
- 2008., ජේතවන ස්තූප උතුරු වැලි මළුව පර්යේෂණ පුරාවිද්‍යා කැණීම, **ජේතවන ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2004**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:22-28.
- 2008., ජේතවන බෝධිසරය අසල පර්යේෂණ පුරාවිද්‍යා කැණීම, **ජේතවනාරාම පුරාවිද්‍යා වාර්තාව 2005**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය: 26-32.
- 2008., වෙස්සගිරිය බඩවැටි පර්යේෂණ කැණීම අංක 01-2006, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2006**, වෙස්සගිරිය වැඩබිම, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:35-45.
- 2008., වෙස්ගිරිය බඩවැටි පර්යේෂණ කැණීම් අංක 02-2006, **ජේතවනාරාම වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2006** වෙස්සගිරි වැඩබිම:සංස්.සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය : 46-58.







- 2005/2006., ඉතිහාසයෙන් සැඟවුණු ප්‍රාග් ජේතවන අවධිය, **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව (හය වැනි කලාපය)**, සංස්.ඩී.තුසිත මැන්දිස් සහ ආර්.පී. ජයතිලක, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල:8-12.
- 2009., ජේතවන ස්තූප සලපතල මළුව හා වැලිමළුව ආශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් ඇසුරෙන් හෙළිවන පූර්ව ජනාවාස තොරතුරු, **ජේතවන ස්තූප පුරාණය (සමරු කලාපය) සංස්.** පියතිස්ස සේනානායක, කොළඹ,මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:13-25.
- මැන්දිස්,තුසිත සහ සිසිර දිසානායක. 2008., ජේතවන බෝධිසරය අසළ පර්යේෂණ කැණීම 2007, **ජේතවන වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2007**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:14-30.
- මැන්දිස්,තුසිත හා වෙනත් අය. 2008., වෙස්සගිරිය ගුහා කැණීම අංක 1- 2006, **ජේතවනාරාම වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2006**, වෙසස්ගිරිය වැඩබිම, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:59-71.
- රත්නායක, හේම. 1998., ජේතවන ස්තූපය හා ආරාම සංකීර්ණය, **අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය)**, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ආගමික කටයුතු අමාත්‍යාංශය.
- රාහුල හිමි, වල්පොළ. 1985., **ලක්දිව බුදු සමයේ ඉතිහාසය**, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- ලබ්රෝයි, ජේ.එෆ් සහ තවත් අය. 1964., **ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය**, 1.1, කැළණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය
- ලියනගමගේ, අමරදාස සහ රණවීර ගුණවර්ධණ. 1965., **අනුරාධපුර යුගය**, කැළණිය, කැළණිය විශ්වවිද්‍යාලය.
- ලියනගේ, සමීරා. 2003., **පුරාවිද්‍යාවේ ඉතිහාසය**, සීවලී පොත්හල, කෙලින් වීදිය කෑගල්ල.
- වික්‍රමගමගේ, චන්ද්‍රා. 1995., අභයගිරි සම්ප්‍රදාය, **අපේ සංස්කෘතික උරුමය (ප්‍රථම කාණ්ඩය)**, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල: 111-144.
- වික්‍රමසිංහ, සුගත්. 1999., මහාවිහාරය හා මහා සීමාව, **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව** (තුන් වැනි කලාපය), සංස්.ගොඩමුණේ පඤ්ඤාසිහ හිමි සහ පත්බේරියේ ඥාණාලෝක හිමි, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

- විජයසූරිය, විමල. 1995., මහාවිහාර සම්ප්‍රදාය, **අපේ සංස්කෘතික උරුමය**, ප්‍රථම භාගය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා අගමික කටයුතු අමාත්‍යාංශය:69-83.
- විතානච්චි, චන්දන. 2009., සන්දනම්කුලම ඉට්ටිකට්ටිය මෙගලතික සුසාන භූමිය ආශ්‍රිත මූලික ගවේෂණය, **ජාතික පුරාවිද්‍යා සමුළුව සඳහා ඉදිරිපත් කරනු ලැබූ පත්‍රිකාව**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව:1-5
- සිරිවීර,ඉන්ද්‍රකිර්ති. 2001., **රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රජධානිය**, මරදාන, දයාවංශ ජයකොඩි සහ සමාගම.
- සිල්වා, රෝලන්ඩ්. 1998., අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ආගමික සිද්ධස්ථානවල වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ, **අපේ සංස්කෘතික උරුමය (ද්වීතය භාගය)**, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය:295-312.
- සෙනෙවිරත්න, සුදර්ශන්. 1987., ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජන සම්මිශ්‍රණය පිළිබඳව අධ්‍යයනයක්, බරතවරු", **යාත්‍රා (කලාප අංක 1)**, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ලංකා සමාජ ගවේෂණ සංගමය: 67-84.
- 1996., උත්තර මලය රට්ඨයේ ප්‍රාථමික යකඩ යුගයේ ඛනිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව, **ඓතිහාසික මහනුවර**, මහනුවර, ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමය:184-199.
- 1996., **පර්යන්ත ප්‍රදේශය හා ආන්තික ප්‍රජාවෝ, ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍ය හා සමාජ සැදුම් පිලිබඳ විකල්ප තේරුම් කිරීමක් කරා**, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය.
- 2009., ජේතවනාරාමයේ පුරාවිද්‍යා ක්‍රියාවලිය, **ජේතවන ස්තූප පුරාණය**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, 1-5.
- සේනානායක, පියතිස්ස. 2002., ශ්‍රී ලංකාවේ පැරණිම ලේඛණ සහ ඒවායේ ආරම්භය පිළිබඳ ව අදහසක්, **ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය**, සංස්.දයා අමරසේකර සහ රෝහිත දිසානයක, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ :35-75.
- 2008., වෙස්සගිරිය අභිලේඛන, **ජේතවනාරාමය ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව වෙසස්ගිරිය වැඩබිම**, සංස්.සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය:90-96.
- හැලෝගම, විමලසේන. 2003., **ශ්‍රී ලාංකික බ්‍රාහ්මී අක්ෂර මාලවෙහි ආරම්භය, අනුරාධපුර ඇතුළුනුවර දී හමු වූ මැටි බඳුන් ආශ්‍රිත ව කෙරෙන විග්‍රහයක්**, වරකාපොළ,ආරිය ප්‍රකශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත.







- හෙට්ටිආරච්චි, ඒ.එස්. 1986., අනුරාධපුර මහා සීමාව, ***Ancient Ceylon No 6***, Journal of the Archaeological Survey Department of Sri Lanka (eds) , Colombo, pub. by the Commissioner of Archaeology Department:19-38.
- Agrawal, D.P. 1984 ., ***The Archaeology of India***, New Delhi: Select Book Service Syndicate.
- Allchin,B.1995.,The end of the Harappan Urbanism and It's Legancy. ***In Archaeology of Early Historic South Asia: The Emergence of Cities and States***,eds. Allchin, F.R & R.A.E Conningham, 26-40,Cambridge: Cambridge University Press.
- Allchin,F.R.1989.,City and State Formation in Early historic South Asia, ***South Asian Studies***,5:1-16
- Ashton, M.S; S. Gunathilake; N.de Zoysa. M.D.D, Fassanayake; N. Gunathilake; S. Wijesundara,1997., ***A Field guide to the common trees and shrubs of Sri Lanka***, Colombo, Wildlife Heritage Trust Publication (pvt) Limited:432.
- Bandaranayake, S.1974., ***Sinhalese Monastic Architecture : The Viharas of Anuradhapura,*** Leiden: E. J. Brill.
- 1979., The Peopling of Sri Lanka: The National and some problems of history and ethnicity. ***In Ethnicity and Social Change in Sri Lanka. Proceeding of the Seminar Organized by the Social Scientist Association 1979*** (published in 1984), Colombo:1-19.
- 2000., The settlement of the Proto historic -Early historic Interface Sri Lanka ***Reflections on a Heritage*** Central Cultural Fund: Ministry of Cultural Affairs :1-14.
- Bandaranayake, S; M. Mogren & S. Epitawatta (eds),1990., ***The Settlement Archaeology of the Sigiriya Dambulla Region***, Colombo: Postgraduate Institute of Archaeology.
- Banarjee, N.R.1965.,***The Iron Age in India***, New Delhi: Munshiram Manoharalal.
- Basham,A.L.1952., Prince Vijaya and the Aryanization of Ceylon, ***The Historical Journal Vol. I*** No 3 :163-171.
- Begly, V. 1967., ***Archaeological Exploration in Northern Ceylon***, Expedition ix/4:20-29.
- 1981., Excavation of Iron Age burials at Pomparippu ,1970, ***Ancient Ceylon*** 4 : 49-142.

- 1983., Arikamadu reconsidered, ***American Journal of Archaeology*** Lxxxvii (4) (Oct, 1983)461-81.
- 1996., ***The Ancient Port of Arikamadu***: New Excavation and researches 1989 - 1992. Memories Archaeologiques 22: Pondicherry.
- Beck, H.C. 1928., Classification and Nomenclature of Beads and Pendants ***In Archaeologia or Miscellaneous tr. acts relating to Antiquary***. Second series, Vol .28, Oxford.
- Bossyt, F., M. Meegaskumbura; N. Baenerts; D. J. Gower; R. Pethiyagoda;K.Roelants; a.Mannert; M. Wilkinson; M.M.Bahir; K. Manamendra, Arachchi; P. K. L. Ng. C.J. Schneider; O.Vanoomen & M.C.Milinkovitch,2004.,Local endemism Within the Western Ghats-Sri Lanka Biodiveßity Hotspot. ***Science***.306: 479-481.
- Bopearachchi, O ; R.M. Wikremesinhe,1999., ***Ruhuna-An Ancient Civilization Re- Visited*** : Nugegoda.
- Brohier,R.L.1934 ., ***Ancient Irrigation Works in Ceylon***.3 Vols. Colombo, Survey Department.
- Butzer,1990., ***Archaeology as Human Ecology***, Cambridge.
- Carswell, J., 1991 - The Port at Mantai, Sri Lanka. ***In Rome and India***, Begley, V.& R.D.D. Puma(eds),197-203 Madison: The University of Wisconsin
- Carswell,J.& M.E. Pricktt.1984., Mantai 1980:A Preliminary Investigation. ***In Ancient Ceylon*** 5,3-80.
- Cave,H.W.1928., ***The Ruined Cities of Ceylon***, London, Hutchinson & Co. Ltd.
- Chttopadhyay,K.1978., ***Tribalism in India***, New Delhi, Vikas publication.
- Chandraratne,R.M.M.1997., Some reptiles bones from the Gedige Excavation 1985,The Citadel of Anuradhapura. Sri Lanka, ***Lyriocephalas***,3(2):7-15.
- 2003., ***Archaeo-Zoologycal Remains From the Jethavana Excavation, Central Cultural Fund***, Anuradhapura. Unpublished article, Department of Archaeology: University of Peradeniya.
- 2007., Identification of Mule(Equas nemiomas) as Asvataraya in ancient Sri Lanka by unearthed bones and literature, Proceedings: Peradeniya ***University Research Session Purse***,12(5),370-371.
- Chakrabarti, D.K.1973., Concept of urban Revolution and the Indian Context, ***In Puratattva 6***,2732.







- Child,V.G,.1950., The urban Revolution. ***In Town Planning Revew21***,3-17.
- 1965., ***Man Makes Himself (Forth Edition)***, London ,Watts & co.
- Claessen, H.J.M.& P.Skalnik,1978., ***The Early State***, The Hugue: Mouton Publication.
- Clark,D.L.1979., Towns in the Developments of Early Civilizations, ***In Analytical Archaeologist Collected purpers of David Clarke edited by Colleages***,435-444, Newyork: Academic Press.
- Clutton, Brock. 1987., ***A natural History of Domesticated Mammals***, Cambridge University Press, British Museum.
- Codrington,H.W.1924., ***Ceylon Coins and Currency***, Colombo: Government Printers.
- Codrington, K. de B.1969., Excavation at the Gedige Site, ***Ceylon today***, xviii/a: 32-34
- Coningham,R.A.E.1991.,Anuradhapura Citadel Archaeological Project: Preliminary report of the second season of Sri Lankan British Excavations at Salgaha Watta, June-August 1990; ***South Asia Studies 7***:167-75.
- 1992., Anuradhapura Citadel Archaeological Project: Preliminary report of Geophysical Survey at the citadel ***South Asia Studies*** :179-188
- 1994., Notes on the Construction and the Destruction of Buildings in Ancient Sri Lanka B. Allchin (eds), ***Living tradition; Studies in the Ethno archaeology of South Asia***:69-82, New Delhi, Oxford and IBH Publishing Co. pvt. Ltd.
- 1999.,***Anuradhapura. The British-Sri Lanka excavations at Anuradhapura Salgaha Watta 2***.vol, England, Hadrian Books. Ltd. Oxford.
- 2006.,***Anuradhapura. The British-Sri Lanka excavations at Anuradhapura Salgaha Watta2***.vol-ii,The Artifact, BAR International Series 1508.
- Coningham, R. A.E.& F.R. Allchin. 1992., Anuradhapura Citadel Archaeological Project: preliminary report of the third season of Sri Lankan British Excavation at Salgaha Watta, June- September 1991,***South Asian Studies 8*** :155-167.
- 1995., ***The rise of cities in Sri Lanka. in the Archaeology of Early historic South Asia***, Allchin, F.R.(eds)152-184 Cambridge: Cambridge Univeßity Press.

- Coningham, R.A.E., Allchin., C.M. Butt & D Lucy.1996., Passage to India Anuradhapura and the Early use of the Brahmi Script, ***Cambridge Archaeological Journal*** vi/i;73-97.
- Cooray, P.G.1984., ***An Introduction to the Geology of Sri Lanka (Ceylon)***, Colombo, National Museums of Sri Lanka.
- Dahanayaka,K & S.K. Jayawardane. 1979., Study of Red and Brown Earth deposits of North West Sri Lanka ***Geological Society of India Bangalore***.vol 120.
- Deraniyagala,P.E.P.1950., ***Administration report of the Director of National Museum for 1949***,Sri Lanka Government.
- 1952., ***Administration report of the Director of National Museum for 1951***, Sri Lanka Government.
- 1957.,***Administration report of the Director of National Museum for 1956***, Sri Lanka Government.
- 1958.,***The Pleistocene of Ceylon*** .Sri Lanka, Colombo, National Museums.
- Deraniyagala,S.U.1972., The Citadel of Anuradhapura: Excavation in the Gedige area, ***Ancient Ceylon*** 2;48-165
- 1972., Archaeological Survey to Investigate South east Asian Prehistoric Presence in Ceylon Occasional paper No.1 (eds).W.G. Solhaeim & S.U. Deraniyagala, ***Ancient Ceylon***, August 1972.
- 1984., Classification System for Ceramics in Sri Lanka. ***Ancient Ceylon***. ***No 5*** :109-114.
- 1986., Excavation in the Citadel of Anuradhapura: Gedige 1984 Preliminary report ; ***Ancient Ceylon. No 6***:39-48.
- 1990., Radiocarbon dating of Early Historic Radio Carbon Chronology of Sri Lanka, ***Ancient Ceylon. No 12***:251-292.
- 1992., ***The Prehistory of Sri Lanka***; An Ecological Perspective, Colombo, Archaeological Survey Department.
- 2004., ***Pre historic basis for the rise of Civilization in Sri Lanka and Southern India***, Second Vesak Commemoration Lecture. Chennai: Tamil Nadu.
- 2007., The Pre history and Proto history of Sri Lanka. ***The Art and Archaeology of Sri Lanka***, Central Cultural Fund: Ministry of Cultural Affairs.







- Deraniyagala,S.U. & M. Abeyratne.1997., Rediocarbon Chronology of Anuradhapura,Sri Lanka:A Revised Age Estimate, ***South Asian Archaeology***, vol. ii, Stituto Italiano Per Africa Luriente, 2000.
- Dikshit,M.G,1952 ., Beads from Ahichchtra U.P, ***in: Ancient India 8***,33-63.
- Ellawala,H.1969., ***Social History of Early Ceylon***, Colombo: Department of Cultural Affairs.
- Erdosy., G. 1995., Early Cities and States Beyond the Ganges Valley, ***In the Archaeology of Early Historic South Asia***: The Emergency of Cities and States, Allching, F.R. & R.E.A, Coningham (eds),123-151. Cambridge : Cambridge University Press.
- Fairclough,G,2002., ***Archaeologist and the European landscape Convention***, eds. Fairclough & Rippon.
- Fairclough,G; Reppon. 2002., ***Europe's Cultural landscape Convention***, eds. Fairclough & Rippon.
- Fairservis, W.A.1956., ***Excavation in the quettavalley***, West Pakistan: New York.
- Fernando, S.N.V. 1967., ***Ceylon Soils***: Colombo.
- Francis,P.1987., ***Bead Emporiam***, (a guide ti the beads from Arikamedu in the Pondicherry Museum), The Pondicherry Museum, Pondicherry.
- Fernando, S.N.V.1967., **Ceylon Soils**: Colombo.
- Ghosh, A. 1964., ***Indian Archaeology 1963 - 64 : a Review*** (eds). Ghosh Archaeological Survey, India.
- Ghosh, A & K.C. Panigrahi. 1946., The Pottery of Ahichchatra , ***Ancient India*** ,No 1.
- Goldschmidt, P.1879., Notes on Ancient Sinhalese Inscription , ***The Journal of the Ceylon Branch of the Royal Asiatic Society***. Vol. XX: Colombo, 1-45.
- Goonathilake, S. de. A.2007., ***Fresh water fishes of Sri Lanka, Ministry of Environment and Natural Resources***, Battaramulla, 134 (25 plts.)
- Godakumbura, C.E. 1965., Decorative Tiles, ***Archaeological Department Art series***: Colombo.
- Gunawardana, R.A.L.H.1971., Irrigation and Hydraulic society in Early Medieval Ceylon, ***Past and present***, No.53:3-27.

- 1975., The Analysis of Pre - Colonial Social Formations in Asia in the writings of Karl Max, ***The Sri Lanka Journal of the Humanities***, Vol. I. No .I : 8-30.
- 1981., Social Function and political power: A case study of sate formation in Irrigation Society, ***The study of the state***, eds. Henri, J. M. Claessen and peter Skalnik, Hugue: Mouton: 133-154.
- 1982., Prelude to the state An Early phase in the Evolution of Political Institutions in Ancient Sri Lanka, ***The Sri Lanka Journal of the Humanities***, Vol. VIII, No .1&2: 1-39
- Hadi,G.1974., The Austrian - Ceylonese Hydro biological Mission 1970(18) freshwater musses: ***Bullet ion of the Fisheries Research station***, Sri Lanka (Ceylon) 25(1,2) :183-190.
- Hettiaratchy, S.B. 1988 ., Abayagiri Vihara Project Anuradhapura. ***Eleventh Report of the Archeological Excavation at the Abyagiri Vihara Complex***. (January 1987- June 1987). Central Cultural Fund, Colombo.
- Hettiaratchy, Tilak.1972., ***History of Kingship in Ceylon up to the Fourth Century A.D***. Colombo. lake House Investment Limited.
- Herath, J.M. 1975., ***Mineral Resources of Sri Lanka***, Colombo: geological Survey Department.
- Horcart, A.M. 1924., ***Anuradhapura Memories of the Archaeological Survey of Ceylon***, Vol. I, Colombo, Repr. New Delhi/ Madras 1996
- 1928., Town planning, ***In Ceylon Journal of Science section G***, vol. I.No.4:150- 156
- 1930., Town planning, ***In Ceylon Journal of Science***, G II 2 : 86-87.
- Hanibal, A.S.D. 2001., Beads from Tissamaharama; A Typology of Sri Lankan Glass and semi - Precious stone Beads , ***Ancient Ruhuna*** vol.I, Sri Lankan- German Archaeological Project in southern province (eds) weisshar, H.J; H. Rothi, W. Wijayapala: 203-294.
- Indrapala, K. 2005., ***The Evolution of an Ethnic Identity The Tamils in Sri Lanka C. 300 BC to C 1200 C***. The South Asian Studies Center "Sydney.
- Jayasuriya,M.H.F.,L.Premathilake.,R.Silva.1995., ***Manjusri Vastuvidyasastra***, Bibliotheca Zeylanica series, The Archaeological Survey of Sri Lanka and The central Cultural Fund.







- Jayawardena, D.E.de. S.1982., The Geology and Tectonic setting of Copper ironore Prospect at Seruwila, North East Sri Lanka, ***Journal of National Science Council of Sri Lanka 10 (i)*** :129-142
- Juleff,G.1998 ., ***Early Iron and steel in Sri Lanka***: A Study of the samanala wewa area Vol .I Von Zabern: Mainz am Rheim.
- Karanarathne,P.1994., ***A brief report on the excavation at Ibbankatuwa, A proto - and Early historic Settlement site***. In Banadaranayake and Morgren (1994: 105 - 112)
- Karunaratne , P & G. Adikari .1994., ***Excavation at Aligala Pre historic site***. (1994:55-64)
- Karunathilake, P.V.B.1986., Early Sri Lankan Society - some Reflections on caste Social Groups and Ranking. ***The Sri Lanka Journal of the humanities***. Vol 1 x. No 1 & 2 : 108-143
- Kotagama S.W& A. Wijayasingha.1998., ***Birds of Sri Lanka***, Wild life Heritage Trust of Sri Lanka, Colombo. Cxviii + 334(32 plts.).
- Kotagama, S.W., R.C.de Silva,. A.S. Wijayasinha & V.Abeygunawardane.2006., Avifaunal list of Sri Lanka in: C.N. Bambarendeniya (eds), ***The Fauna of Sri Lanka Status of Taxonomy***, research and Conservation. IUCN - The Conservation Union :164-203.
- Kenyon,K.M. 1956.,Jericho and Its setting in near Eastern History ***In Antiquity*** Vol. 30, 184-187.
- Kenady, K.A.R.& S.U. Deraniyagala. 1989.,Fossil remains of 28,000 years old hominids from Sri Lanka. ***Current Anthropology 30***(3):394-399.
- Kumar,A.2001.,Glass Beads in India ***; Lamp Winding and Molding Techniques***, Abstract, Department of Archaeology, Deccan College.
- Lal,B.B.1995.,Excavation at Hastinapura and other explorations in the upper Ganga and Sutlej basins 1950-2 : New light on the Harappa Culture and the early historical period, ***Ancient India*** 10, 11:5-151.
- 1958., Examination of Rod of Glass - like Material from Arikamedu ***Ancient India***. No. 14.
- Majumdar, N.C. 1934., ***Exploration in Sind***, London.
- Majumdar,R.C.1964., Indus valley Civilization, ***Ancient India***, Delhi,20-37.
- Manatanga, A.1987.,Sri Lankave mul aithihasika purvana Nagara kihipayak (Some proto Urban sites of the Early Historic period in

Sri Lanka), ***Paper presented at the second National Archaeological Congress***, Colombo: November.

- Mahadeven, I. 1995.,Old Sinhalese Inscription from Indian ports: New evidence for Ancient India Sri Lanka contacts, ***journal of Institute of the Asian Studies*** 114(1) :55-65.
- Mapa , R.B.,A.M.C.P.K. Attanayake & S.Seneviratne .2007.,Characterization of soils at the Vessagiriya Archaeological site in Relation to past Settlement site,***Peradeniya University Research Sessions Pause*** - 2007, Vol. 12- Part II, Univeßity of Peradeniya.
- Maoshall, S.J. 1931., ***Mohenjo-Daro and the Indus Civilization***, London.
- Maloney,C. 1969.,The Paratavar: 2000 Years of Culture dynamics of a Tamil caste, ***Man in India***.49 (1) : 224-240.
- Mcilntosh.J.R.1999., Dating the south Indian Megalithic In J. Schosmrs and M. Taddes (eds) ***South Asian Archaeology*** 1983: 467-493, Istitoto University Orientale Naples.
- Mendis,T.2008., A New Cultural Road Map to Anuradhapura A Material cultural at Vessagiriya, ***Heritage Achievement***, Central Cultural Fund:16-20.
- Mogren, M.1994., ***Objectives, Methods, Constrains and perspectives***, In Bandaranayake and Mogren (1994:23-42).
- Munsell Soil Color Chart.1975., Macbeth a division of, Kollmorgen Corporation, Baltimor, Margland.
- Munsell book of Color Chart.1976., Macbeth a division of, Kollmorgen Corporation, Baltimor, Margland.
- Nagaswamy, K. 1991., Alagankulamn: an Indo- Roman Trading port, In : Marga bundha, C ramachandran, Ks Sagar, A.P Sinha, D.K. (eds), ***Indian Archaeological Heritage***.
- Panabokke,C.R.1979., The Natural Soil as a Governing factor in the Regional pattern in Ancient Ceylon, ***Ancient Ceylon*** 231-236.
- Shri K.V. 1995., Soundura Festschrift Delhi: 254-244, ***Roman Karur A peep intoTamil past***, Madras.
- Nicholas,C.W.1963., ***Historical Topography of Ancient and Medieval Ceylon***, Royal Asiatic Society (Ceylon Branch)
- Undated ***Brahmi Inscription*** (Hand written mss) University of Peradeniya , Central Library





- Parker,H. 1884., Report on Archaeological Discoveries at Tissamaharama, ***In Journal of the Ceylon Branch of the Royal Asiatic Society***, Vol. viii 1883-1884,1- 97, reprint 1998 Ancient Ceylon (Delhi), reprint New Delhi 1984
- 1909- ***Ancient Ceylon***, London Lucca & co.
- Paranavitane,S.1936., ***The Excavation in the Citadel of Anuradhapura***, Memories of the Archaeological Survey of Ceylon, Colombo.
- 1940., Tamil householders terrace, Anuradhapura, ***The Journal of the Royal Asiatic Society***, Ceylon Branch, Vol. xxv.
- 1970., ***Inscription of Ceylon***, Vol. I , Colombo, Department of Archaeology.
- 1983., ***Inscription of Ceylon***, Vol. II , Colombo, Department of Archaeology.
- Panabokke,C.R.1967., ***Soils of Ceylon and Fertilizer use***, The Ceylon Association for the Advancement of Science.
- Pethiyagoda,R.1991., ***Fresh Water fishes of Sri Lanka***, Wild Life Heritage Trust, Colombo.xiv 362.
- 2006., Conservation of Sri Lankan freshwater fishes in C.N.B. Bambarandeniya (eds ) ***The Fauna of Sri Lanka, Status of Taxonomy***, Research and Conservation, IUCN- The Conservation Union.103-112
- 1944 - Prehistoric copper hoards In the Ganges Basin. ***Antiquity***,No.72.
- Perera,L.S.1951., The Brhami Inscription as a Source for the Study of the Early history of Ceylon, ***The historical Journal***, Vol. I . No.02, 79-96.
- 1967., The Social Economic Foundation of the Early Anuradhapura Kingdom, ***Young Socialist,*** Colombo.241-248.
- Piggott, S. 1961., ***Pre historic India***, London.
- Posshel, G.1990., ***Scientific dates for South Asian Archaeology***, University of Pennsylvania, Asian Section, University Museum, Occ. Publ 1
- Prickett, F.M. 1990 ., Mantai - Mahatitha The Great port and entre pot in the Indian Ocean trade In ***Sri Lanka and the Silk Road*** of the S. Bandaranayake, L. Dewaraj, K.D.G. Wimalaratne and R.Silva

(eds) UNESCO, National Commission and the Central Cultural Fund, Colombo:115-121.

- Premathilake,T.R. and Epitawatta.2001., ***Late quaternary Vegetation, Climate and Land - Use History of the Horton plains***, Central Sri Lanka, Abstract, Department of quaternary Research, Stockholm University.
- Queyroz, F. De .1930., ***The Temporal and Spiritual Conquest of Ceylon*** tr. S.G. Perera. Vol. 3, Colombo.
- Ragupathy, P.1987., ***Early Settlements in Jaffna***: An Archaeological Survey. Mrs. T. Ragupathy. Madras.
- Rajan, K.1990., New light on the Megalithic Cultural of the Kongn Region, Thamilnadu, ***Man and Environment*** 15(1) : 93-102
- 1993., Report on Under water Archaeological operation of Poompuhar cost, ***Are port Submitted to the Thamilnadu Archaeology Department***, Madras.
- 1994., ***Archaeology of Thamilnadu***, Indian publishing co, Delhi.
- 2001.,Role of Technology in the Development of Trade, ***Seminar on Indo - Sri Lankan***, Relations (26-27 Dec. 2001) department of history, University of Peradeniya.
- Rajavelu, S.1999., Sinhala - Brahmi Inscription of Thamilnadu and Historical Assessment, T***he Sri Lanka Journal Of South Asian Studies***(1):64-75
- Rao,B.K.1972., T***he Megalithic Culture in South India***, University of Mysore,258-261
- Rao, M.S.1971., ***Proto History Culture of the Tungabhadra valley***, Dharwar.
- Rathnayake, H.1984., Jetavanaramaya Project Anuradhapura: ***First Archaeological Excavation and Research Report***. Ministry of Cultural affairs. Central Cultural Fund, Colombo.
- 1994., ***Jetavana Stupa and Monastery Complex***: The Cultural Triangle UNISCO CCF :64-85.
- Rathnayake, H & R . Perera.1984., Classification of Pottery. In Jetavanaramaya Project-Anuradhapura, ***First Archaeological Excavation and Research report*** (January - June 1982 Ministry of Cultural Affairs, Central Cultural Fund, Colombo:59-111.





- Renfrew, C. 1979., Trance formation. ***In Transformation : Mathematical Approaches to Cultural Change***. C. Renfrew (eds), New York: Academic.1-44.
- Renfrew. C.& P.Bhan.1991., ***Archaeology Theories, Methods and Practice*** Thames and Hudson Ltd. London.
- Schoff, W.H. 1912., Perilous of the Eritrean sea, New Delhi, Manshiran (1974)
- 1915., The Eastern Iron Trade of the Roman Empire, ***Journal American Oriental Society*** Vol. 35:224-1239
- Schenk, H.2006., The Dating and Historical Value of the Rouletted Ware. ***Zeitshref Fue Archaeology Asussereuropaischer Kalutaren***. Reichert veria , Wiesbaiden : 123-152.
- Senaviratne, A.1994., ***Ancient Anuradhapura***, Archaeological Survey Department, Colombo.
- Seneviratne , S.1984.,The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, ***Ancient Ceylon*** No . 5 : 237-305.
- 1985., The Baratas: A case of Community Integration in Early Historic Sri Lanka. ***In James Ratnum Festscrift***, Amarasingha A.R.B.& S.J. Sumanasekara Bandara (eds) UNESCO Sri Lanka Colombo.49-53
- 1989., Pre State Chieftain and Servants of the State : A case study of the parumuka. ***In the Sri Lanka Journal of Humanities***. Vol. XV.No.1 & 2 99-131
- 1990., The Location Significations' of Early Iron Age Site in Intermediary Transitional Eco - Systems. ***The settlement Archaeology of the Sigiriya Dambulla region*** (eds)Senaka Bandaranayake et.al. Colombo: Gunaratne, Offset et. al :123- 140.
- 1992., Resource use in Antiquity: The Utilization of Minerals, Water Flora and funa in Pre Modern Sri Lanka ***School Science program***, Institute of Fundamental Studies (Dec. 1992).
- 1994., The Ecology and Archaeology of the Seruwila: Copper Magnetite prospect North- East Sri Lanka In ***Sri Lanka Journal of Humanities***. Vol. xxi (1&2):114- 146.
- 1996., Peripheral Regions and Marginal Communities : Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka ***Tradition Dissent and Ideology : Essay***

***in Honor of Romila Thapar,*** ed. K. Campakalakshmi and S. Gopal, Oxford University Press. Delhi: 265-312.

- 2004., Problems of Ceylon History and the Fear of History. ***G. C. Mendis Memorial Lecture***. Colombo.
- Seneviratne, S., R.M.M.Chandraratne.1992., Flora and Funa Resources in Antiquity The Study of the Archaeology and Archaeozoology in Sri Lanka, IFS: ***Kandy School Science course Norte***, Kandy.
- Senevirane, S., D.K.Jayaratn.2006., A Shared Ritual Cultural Symbol: The Megalithic Memorials of South India and Sri Lanka විකල්ප පුරා තත්ත්ව, (Alternative Archaeology) පුරාවිද්‍යා සංගමය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය:01-14.
- Sestieri, P.C.1958., ***Administrative Report for The Archaeological Commissioner for 1958***. Government of Ceylon, Colombo.
- Silva, R.1979., A Proposal for the Layout of the Ancient City of Anuradhapura Ceylon, ***In Ancient Ceylon*** No. 3, 315-319.
- 1982., Lessons of town planning from Ancient Ceylon, ***Ceylon Institute of Architects Journal***, Vol. I, Colombo :8.
- 1988., ***Religious Architecture in Early and Medieval Sri Lanka, A Study of the Stupa, Bodhigara, Uposathagara and Patimaghara***, Bruk: Krips Repro Meppel.
- 2000., Development of Ancient cities in Sri Lanka with special Reference to Anuradhapura. ***Reflection on A Heritage***, Central Cultural Fund, Ministry of Cultural and Religious Affairs: 36-49.
- Sithrampam, S.K.1980., The Brahmi Inscriptions of Sri Lanka. The need for a Fresh Analysis, ***James Thevathasan Ratnum Felicitation*** vol. K. Indrapala ed. Jaffna Archaeological Society, Jaffna.92.
- 1986/1987- The title Parumaka found in Sri Lanka Brahmi Inscription:A Reapprasial, ***The Sri Lanka Journal of South Asian Studies***, No 1 New Series, Jaffna, 13-25.
- Smither, J.G.1984., ***Architectural Remains Anuradhapura, Sri Lanka The Dagabas and certain other Ancient Ruined structures Measured, Drawn and Described*** (Riv.eds), C. Wicramasinghe 1992- archaeology of Sri Lanka Culture.
- Somadeva, R.2006., ***Urban Origins in Southern Sri Lank***a, Postgraduate Institute of Archaeology, Department of African and Comparative Archaeology, Department of Archaeology and Ancient History, Uppsala Univeßity.





- Somadeva, R., R. Disanayake and Fernando. 2006., ***The Galpaya Survey Report of the first field season 2006***. (eds) N.Silva , R.Somadeva, Postgraduate Institute of Archaeology Colombo 07.
- Sundra, A.2004., ***Indian, Prehistory and Proto History***, (eds). A. Soundara, Director of Archaeology and Museum Govt. Karnataka.
- 1975., ***The Early Chamber Tombs of South India***, University Publishers, Delhi.
- Subramanyam,R.1964., Salihundam : A Buddhist site in Andhra Pradesh. ***Andrapradesh Government Archaeological Series***. No 17, Hyderabad.
- Thaper, B.K. 1957.,Maski, A Calcolithic site of the Southern Deccan. ***In Ancient India***13,4-142.
- Thaper, R. 1952., ***Asoka and Decline of the Mauryas***, Oxford : University Press
- Uduwara, J. 1991., Kahatagasdigiliya Rock Inscription ***Epigraphy Zeylanica*** Vol. vi (pt 2): 211-214.
- Veliuippillai, A.1980., Tamil Influence In Ancient Sri Lanka with special Reference to Early Brahmi Inscriptions, ***Journal of the Thamil Studies***, Vol . XVII, Jaffna: 8-18.
- Vidanapathirana,P.2007., ***Settlement pattern of the Malwathu Oya and Kala Wewa Basic, Study for the perspective of historical Geography***, Unpublished Thesis for the Doctoral degree, Postgraduate Institute of Archaeology, Univeßity of Kelaniya.
- Wadia,D.N.1939.,***Geology of India***, 2nd ed. (London) rep .London.1949.
- Wijesuriya, G. 1998., ***Buddhist Meditation Monasteries of Ancient Sri Lanka***, Memories of the Archaeological Survey of Sri Lanka Vol .10, Department of Archaeology, Government of Sri Lanka, Colombo.
- Weisshaar, H.J., H.Roth, W.Wijayapala (eds).2001., ***Ancient Ruhuna***, Sri Lankan German Archeological Project in Southern Province vol.I (Materalien Zur Allgemeinen and vergleichenden Archaeologies 58) Mainzam
- Wiliams, A.1964., Sanskrit- English Dictionary, Oxford.
- Wheeler;M.A.Ghosh,; A.D. Krishna .1946., An Indo- Roman Trading station on the east coast of India ***Ancient India*** 2 : 17-124

- Whearley,P.1972.,The Concept of Urbanism in ***The man Settlement and Urbanism***, Ucko, P.J and , R.Tringnam eds.601-638,London, Duckwoth.
- www. Archaeology online net natartifa ctsiron- cveihtml:docx: 1-8.
- Yoshihika, V& S.Nozaki.1993., ***The excavation report of JOCV (Japan Overseas Cooperation Volunteers) Project in the citadel Anuradhapura*** (1991-1992) Japan International Cooperation Agency (JICA) Colombo) Colombo, Sri Lanka.